තුන්වැනි කොටස

තුන්වැනි කොටස

මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන

මෙහෙයුම් උපදෙස්, චක්‍රලේඛ, නියෝග සහ නිවේදන

		යොමු අංකය	පිටුව
බැංකු අධීක්ෂණ			
1	චක්‍රලේඛය 2020 අංක 01: ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම		1
2	චක්‍රලේඛය 2020 අංක 02: ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම		4
3	චක්‍රලේඛය 2020 අංක 03: අපනයනකරුවන් වෙත ලබා දෙනු ලබන ණය අත්තිකාරම් පියවා ගැනීම		8
4	බැංකු පනත් විධාන 2020 අංක 01: 2020 අංක 01 දරණ ආනයන හා විදේශ මුදල් ආයෝජන සීමා කිරීම පිලිබඳ බැංකු පනත් විධානය		8
5	චක්‍රලේඛය 2020 අංක 04: කොවිඩ්-19 මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැළසීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග		9
6	චක්‍රලේඛය 2020 අංක 05: කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං-රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50ක සය-මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම		10
7	කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට පත් පුද්ගලයන් හා ව්‍යාපාර වෙත සහය වීම සඳහා අවශ්‍ය නම්‍යශීලීත්වය බලපතුලාභී බැංකු වෙත ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග		14
8	මුදල් නීති පනත් විධානය 2020 අංක 01: බලපත්‍රලාභී බැංකු මගින් ලබා දෙන රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා උපරිම පොලී අනුපාත		15
9	චක්‍රලේඛය 2020 අංක 06: 2020 චක්‍රලේඛ අංක 04 සහ 05 සඳහා සංශෝධන		16
10	කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ බැංකු වෙත ද්‍රවශීලතාව ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවට නංවනු ලබන සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග		16
11	බැංකු පනත් විධාන 2020 අංක 02: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ද්‍රවශීල වත්කම්		17
12	බැංකු පනත් විධාන 2020 අංක 03: බලපත්‍රලාභී බැංකු වල අභිමතානුසාරී ගෙවීම් පිළිබඳ සීමා කිරීම්		18
13	බැංකු පනත් විධාන 2020 අංක 04: මෝටර් රථ වාහන සම්බන්ධ ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය අනුපාතය		19
14	බැංකු පනත් විධාන 2020 අංක 05: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය		20
15	බැංකු පනත් විධාන 2020 අංක 06: කොවිඩ්-19 මධ්‍යයේ ගනු ලබන සුවිශේෂි නියාමන ක්‍රියාමාර්ග		20
16	චක්‍රලේඛය 2020 අංක 07: කොවිඩ්-19 මගින් බලපෑමට පත් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන සැලසීම		21
17	බැංකු පනත් විධාන 2020 අංක 07: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ඇති ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා ඇති බැංකු පනත් විධාන 2016 අංක 01 සඳහා සංශෝධනය		22
18	මුදල් නීති පනත් විධානය 2020 අංක 02: බලපත්‍රලාභී බැංකු විසින් පිරිනමනු ලබන ණය පහසුකම් සඳහා උපරිම පොළි අනුපාතය		22
19	චක්‍රලේඛය 2020 අංක 08: කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන කාලය දීර්ඝ කිරීම		24

		යොමු අංකය	පිටුව
20	බැංකු පනත් විධාන 2020 අංක 08: බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ඡන්ද හිමි නිකුත් කළ ප්‍රාග්ධනයේ හිමිකම සම්බන්ධයෙන් වන විධානයන්ගේ සංශෝධනය		26
21	බැංකු පනත් විධාන 2020 අංක 09: බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ඡන්ද හිමි නිකුත් කළ ප්‍රාග්ධනයේ හිමිකම සම්බන්ධයෙන් වන විධානයන්ගේ සංශෝධනය		27
22	බැංකු පනත් විධාන 2020 අංක 10: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල මූල්‍යමය ව්‍යුත්පන්න ගනුදෙනු පිළිබඳ විධානයන් සඳහා වන සංශෝධනයන්		27
23	චක්‍රලේඛය 2020 අංක 09: SLFRS - 9 මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය භාවිතා කිරීමට අදාළව නිකුත් කරන ලද 2018 අංක 04 දරන මාර්ගෝපදේශයට කරන ලද සංශෝධන		28
24	චක්‍රලේඛය 2020 අංක 10: කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ණය සහන කාලයක් ලබාදීම		29
25	බැංකු පනත් නිර්ණය 2020 අංක 01: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු		31
26	මුදල් නීති පනත් විධානය 2020 අංක 03: උකස්කර මත ලබා දෙන නිවාස ණය සඳහා අයකල හැකි උපරිම පොලී අනුපාත		32
27	බැංකු පනත් විධාන 2020 අංක 11: 2020 අංක 05 දරණ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය		33
28	බැංකු පනත් විධාන 2020 අංක 12: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය		34
29	බැංකු පනත් විධාන 2020 අංක 13: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල නිශ්චල දේපළ තක්සේරුකරණය පිළිබඳ නියාමන රාමුව සඳහා සංශෝධන		34
ව්‍යවහාර මුදල්			
30	චක්‍රලේඛ අංක: 2020-01: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු සඳහා අයකරනු ලබන සේවා ගාස්තුව තාවකාලිකව අත්හැරීම	12/02/004/0007/001	36
දේශීය මෙහෙයුම් කටයුතු			
31	චක්‍රලේඛ අංක: 35/03/016/007/005: විවට වෙළඳ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි		37
32	මෙහෙයුම් උපදෙස් අංක: 35/01/005/0007/15: සංචිත අවශ්‍යතා		37
33	මෙහෙයුම් උපදෙස් අංක: 35/01/005/0007/16 සංචිත අවශ්‍යතා: අවම දෛනික තැන්පතු		39
34	මෙහෙයුම් උපදෙස් අංක: 35/01/005/0007/17 සංචිත අවශ්‍යතා		39
35	මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/001: රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා දෙනු ලබන ද්‍රවශීලතා පහසුකම		41
36	මෙහෙයුම් උපදෙස් අංක: 35/03/016/007/006: විවට වෙළඳ කටයුතු යටතේ නිත්‍ය පහසුකම සඳහා පවතින පද්ධතිය තුළ හඳුන්වා දෙන ලද නවීකරණ		44
37	මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/002: 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම		45
38	මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/003: කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම සඳහා වන මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම		49

		යොමු අංකය	පිටුව
විදේශ විනිමය			
39	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 01 දරන විධානය සංචරණ අරමුණු සඳහා විදේශ විනිමය නිදහස් කිරීම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානය		49
40	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 02 දරන විධානය ගෙවීම් මත ලේඛන (DOCUMENTS AGAINST PAYMENTS) සහ විවෘත ගිණුම් (OPEN ACCOUNT PAYMENTS) ක්‍රම යටතේ වූ ආනයනයන් සඳහා සිදු කරන ගෙවීම්වලට අදාළව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානය.		50
41	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2169/3 - 2020 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා 2017 අංක 12 දරන විදේශ විනිමය පනත 22 වන වගන්තිය යටතේ වූ නියමය	2169/3	50
42	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 03 දරන විධානයන් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		51
43	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2170/4 - 2020 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2170/4	52
44	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 04 දරන විධානයන් විශේෂ තැන්පතු ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		52
45	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 05 දරන විධානයන් ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවේ නියුතු (විගාමිකයන් නොවන) පුද්ගලයන් සඳහා ණය සහ අත්තිකාරම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානය		54
46	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2182/32 - 2020 ජූලි මස 01 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2182/32	55
47	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2182/33 - 2020 ජූලි මස 01 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත 8 වන වගන්තිය යටතේ වූ නියමය	2182/33	56
48	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2182/37 - 2020 ජූලි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත 22 වන වගන්තිය යටතේ වූ නියමය	2182/37	58
49	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 06 දරන විධානයන් - විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳ බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන විධානයන්		59
50	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2196/22 - 2020 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග	2196/22	63
51	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 07 දරන විධානයන් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		63
52	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 08 දරන විධානයන් ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		64
53	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 09 දරන විධානයන් විශේෂ තැන්පතු ගිණුම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		64
54	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2202/7 - 2020 නොවැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2202/7	66
55	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 10 දරන විධානයන් විශේෂ තැන්පතු ගිණුම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		66

		යොමු අංකය	පිටුව
56	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 11 දරන විධානයන් විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සිදුකරන, තම මූලික ව්‍යාපාරය ලෙස මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතව සිටින පරිසීමිත වෙළඳුන් (මුදල් හුවමාරුකරන්නන්) වෙත නිකුත් කරනු ලබන විධානයන්		70
57	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2206/25 - 2020 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත 22 වන වගන්තිය යටතේ වූ නියමය	2206/25	82
මූල්‍ය බුද්ධි ඒකකය			
58	මාර්ගෝපදේශ-01/2020: සිදුවීම් පදනම් කරගත් LankaFIN වාර්තාකරණ මාර්ගෝපදේශය	037/04/002/0004/019	83
59	චක්‍රලේඛ : 01/2020: සීමා ඉක්මවූ ගනුදෙනු වාර්තා කිරීමේ අවසාන දිනය දික් කිරීමේ අති විශේෂ ක්‍රියාපටිපාටිය	37/04/002/0004/019	88
60	චක්‍රලේඛ: 02/2020 සීමා ඉක්මවූ ගනුදෙනු වාර්තා කිරීමේ අවසාන දිනය දික් කිරීමේ අති විශේෂ ක්‍රියාපටිපාටිය - දෙවන දිගුව	37/04/002/0004/019	89
61	මාර්ගෝපදේශ- 02/2020 2020 අංක 02 දරන ගණකාධිකාරීවරුන් සහ භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා බැඳීම් සඳහා වන මාර්ගෝපදේශය	037/08/001/0027/018	90
62	චක්‍රලේඛ අංක: 03/2020 නැගී එන මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවදානම් පිළිබඳව සුපරීක්ෂාකාරී වන ලෙස මූල්‍ය ආයතනවලට උපදෙස් ලබා දීම	037/02/008/0010/016	110
63	විධාන අංක 01/2020: පොදු සහ බැංකු නිවාඩු/සති අන්ත වලදී අනුකූලතා නිලධාරීන් සමඟ සම්බන්ධ වීම	037/05/03/0005/016	110
64	මාර්ගෝපදේශ අංක 03/2020: 2020 අංක 3 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ තහවුරු කිරීම සඳහා වූ සංශෝධිත මාර්ගෝපදේශය	037/05/006/0009/020	111
ජාත්‍යන්තර මෙහෙයුම්			
65	ආනයන වෙළඳ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/002	117
66	''අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම් ක්‍රමය - IIS, පිළිබඳ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/002	119
67	''අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම්'' ක්‍රමය පිළිබඳ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම	33/04/012/0011/003	121
68	ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂකය (Central Integrated Market Monitor - CIMM) හරහා දෛනික ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණ වාර්තාව (NOP) ඉදිරිපත් කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/002	121
69	අභ්‍යන්තර සේවක ප්‍රේෂණ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/004	122
රාජ්‍ය ණය			
70	මාර්ගෝපදේශ අංකය : SSSS/02/2020: ද්විතීයික වෙළඳ පොළ ගනුදෙනු තොරතුරු වාර්තා කිරීම සහ නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතියට සුරැකුම්පත් පියවීමේ උපදෙස් එවීම සඳහා වන මාර්ගෝපදේශයන්	08/25/001/0005/001	124
ගෙවීම් සහ පියවීම්			
71	2020 අංක 01 දරන පොදු විධිවිධානය: ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මඟින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධානය		131

		යොමු අංකය	පිටුව
72	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 01/2020: 2020 මාර්තු 16-20 දක්වා දිනයන්හි දී ලංකාසෙට්ල් පද්ධතියේ සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම	34/01/024/0106/07	132
73	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2020: 2020 මාර්තු 16 සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික කාලසටහන	34/07/029/0001/002	133
74	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 03/2020: 2020 මාර්තු 20 දින සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික කාලසටහන	34/07/029/0001/002	134
75	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 04/2020: 2020 මාර්තු 24 දින සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික කාලසටහන	34/07/029/0001/002	136
76	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 05/2020: 2020 මාර්තු 27 දින සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික කාලසටහන	34/07/029/0001/002	138
77	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 06/2020: ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන	34/07/029/0001/002	140
78	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 07/2020: ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන	34/07/029/0001/002	142
79	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 08/2020: ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන	34/07/029/0001/002	144
80	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 09/2020: ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාලසටහන සංශෝධනය කිරීම	34/07/029/0001/002	147
81	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 10/2020: ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන	34/07/029/0001/002	149
82	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 11/2020: ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන	34/07/029/0001/002	151
83	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 12/2020: විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව		154
84	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 13/2020: ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් හට LANKAQR හා සම්බන්ධ වීම අනිවාර්ය කිරීම.	34/01/025/0038/002	155
85	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 14/2020: ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාලසටහන සංශෝධනය කිරීම	34/07/029/0001/002	155
86	මාර්ගෝපදේශ අංක 01/2020: ගෙවීම් පහසුකම් ලබාදෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ මාර්ගෝපදේශය		158
87	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 15/2020: 2020 ජූනි 04 සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන	34/07/029/0001/002	165
88	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 16/2020: විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව		167
89	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 17/2020: ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාලසටහන සංශෝධනය කිරීම	34/07/029/0001/002	168
90	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 17/2020: 2020 අගෝස්තු 05 වන දින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙ හි විශේෂිත දෛනික කාලසටහන	34/07/029/0001/002	170
91	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 18/2020: ලංකාසෙට්ල් පද්ධති ගාස්තු සංශෝධනය කිරීම සහ පාරිභෝගික ගනුදෙනු භාරගන්නා අවසන් වේලාව දීර්ඝ කිරීම.		172
92	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2019 - දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම - අතිරේක 2	34/01/025/0038/001	173
93	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 19/2020: ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි වගකීම් කළමනාකරණ සීමාවන්		174
94	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 20/2020: විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව		176

ප්‍රාදේශීය සංවර්ධන

95	ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය අදියර II හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම.	RDD/SEPI/2016/01(A.03)	177
96	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා වන ණය ඇපකර යෝජනා ක්‍රම	RDD/CSS/WCL CG/2020/01	179
97	COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම හඳුන්වා දීම සඳහා වූ මෙහෙයුම් උපදෙස් හා සබැඳි පරිශිෂ්ඨය.	RDD/PR-COVID19/2020/01	184
98	COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම හඳුන්වා දීම සඳහා වූ මෙහෙයුම් උපදෙස් ('සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම)	RDD/PR-COVID19/2020/02	188
99	නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වූ සංශෝධනය	RDD/NCRCS/2011	192
100	"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකමට අදාල මෙහෙයුම් උපදෙස් සංශෝධනය	RDD/PR-COVID19/ 2020/01 (A-01)	193
101	සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ, COVID-19 ව්‍යාප්තිය මගින් අහිතකර බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යාපාර (MSMEs) සඳහා හඳුන්වා දෙන 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' නව ප්‍රතිමූල්‍ය පහසුකම සඳහා වූ මෙහෙයුම් උපදෙස් සංශෝධනය	RDD/PR-COVID19/ 2020/02 (A-01)	194
102	මෙහෙයුම් මාර්ගෝපදේශනය 01 : 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන'	32/04/011/0001/002	195
103	"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකමට අදාල මෙහෙයුම් උපදෙස් සංශෝධනය	RDD/PR-COVID19/ 2020/03	196
104	"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය	RDD/PR-COVID19/2020/01 - (A-02) සහ RDD/PR-COVID19/2020/02 – (A-02)	198
105	COVID-19 ව්‍යවසනය නිසා බලපෑමට පත් ව්‍යාපාර සඳහා හඳුන්වා දෙන ණය ඇප ආවරණ සහ පොලී සහන යෝජනා ක්‍රමය සඳහා වන මෙහෙයුම් උපදෙස් මාලාව	RDD/CGIS/WCL/2020/01	199
106	"සෞභාග්‍යා" ණය යොජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය උප ණය සඳහා වන පොලී අනුපාත අඩු කිරීම	RDD/PR/2010/03 (A-05)	205
107	"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යෝජනා ක්‍රමය		205
108	"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය	RDD/PR-COVID19/2020/03 සහ 04 (A-01)	206
109	"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සඳහා වූ පරිශිෂ්ඨය	RDD/PR-COVID19/2020/03 - 04 (A-02)	208
110	ස්වශක්ති-රැකියා දශ ලක්ෂයක් කාරක ණය යෝජනා ක්‍රමය මෙහෙයුම් උපදෙස් සංශෝධනය	RDD/SWASHAKTHI/ 2017/01 (A-02)	209
111	පොදු මගී ප්‍රවාහන සේවයේ නියුතු පුද්ගලික බස් රථ හිමියන්ගේ නඩත්තු වියදම් පූරණය කිරීම සඳහා 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම අදියර III (ණය ඇප ආවරණ හා පොලී සහන ණය යෝජනා ක්‍රමය) යටතේ ණය සහන ලබා දීම.	32/04/011/0001/002	211
112	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම	RDD/PR-COVID19/ 2020/01-02 (A-03)	211
113	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම	RDD/PR-COVID19/ 2020/03-04 (A-03)	212
114	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක 4P ණය යෝජනා ක්‍රමයන් හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය	RDD/SAPP/4P/2019/01 (සංශෝධනය 1)	213
115	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක චක්‍රීය ණය යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම	RDD/SAPP/RF/2019/01 (සංශෝධනය 1)	224

		යොමු අංකය	පිටුව
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ			
116	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 01 දරන විධානය: ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය		234
117	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 01 දරන විධානය: ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය		237
118	2020 අංක 01 දරන චක්‍රලේඛය: ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම		240
119	2020 අංක 04 දරන චක්‍රලේඛය: කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග		242
120	2020 අංක 01 දරන විස්තර සටහන: කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යන මැයෙන් නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්වීම		242
121	2020 අංක 05 දරන චක්‍රලේඛය: කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50 ක සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම		243
122	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 02 දරන විධානය: ද්‍රවශීලතා වත්කම් විධානය සංශෝධනය කිරීම		246
123	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 02 දරන විධානය: ද්‍රවශීලතා වත්කම් විධානය සංශෝධනය කිරීම		246
124	2020 අංක 02 දරන විස්තර සටහන: කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යන මැයෙන් නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සහ කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50 ක සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්වීම		247
125	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 03 දරන විධානය: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම		247
126	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 03 දරන විධානය: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම		248
127	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 04 දරන විධානය: තැන්පතු හා ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානය සංශෝධනය කිරීම		249
128	2020 අංක 03 දරන විස්තර සටහන: කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැපයීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග දැක්වෙන 2020 අංක 04 දරන චක්‍රලේඛය සහ කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහයවීමට රුපියල් බිලියන 50 ක සයමාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛයේ අර්ථ දැක්වීම		250
129	ණය සහන කාලසීමාවට අදාළ උපචිත පොලිය සංශෝධනය සඳහා වන 2020 අංක 04 දරන විස්තර සටහන: කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැපයීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග දැක්වෙන 2020 අංක 04 දරන චක්‍රලේඛය සහ කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහයවීමට රුපියල් බිලියන 50 ක සයමාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම දැක්වෙන 2020 අංක 05 දරන චක්‍රලේඛය සඳහා නිකුත් කරන ලද 2020 අංක 03 දරන විස්තර සටහන සඳහා වන සංශෝධන		256
130	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 05 දරන විධානය: ආයතනික යහපාලන විධානය සංශෝධනය කිරීම		257
131	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 04 දරන විධානය: ආයතනික යහපාලන විධානය සංශෝධනය කිරීම		260

		යොමු අංකය	පිටුව
132	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 06 දරන විධානය: ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු		264
133	2020 අංක 07 දරන චක්‍රලේඛය: කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග		274
134	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 05 දරන විධානය: ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු		275
135	2020 අංක 09 දරන චක්‍රලේඛය: කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන කාලය දීර්ඝ කිරීම		284
136	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 06 දරන විධානය: ද්‍රවශීලතා වත්කම් විධානය සංශෝධනය කිරීම		288
137	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 07 දරන විධානය: ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම		288
138	2020 අංක 11 දරන චක්‍රලේඛය: කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම		289
139	2020 අංක 12 දරන චක්‍රලේඛය: කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම සඳහා නිකුත් කළ 2020 අංක 11 දරන චක්‍රලේඛය සඳහා වන සංශෝධන		291
140	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ 2020 අංක 01: බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වන කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව		291
141	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 08 දරන විධානය: බලපත්‍රලාභී මුදල් සමාගම්වල කොටස් හිමිකම සඳහා වන උපරිම ප්‍රතිශත සීමාවන්		303

චක්‍රලේඛය 2020 අංක 01 2020 ජනවාරි 13

ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම

රටෙහි ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් සහ ගරු අග්‍රාමාත්‍යතුමා සහ මුදල් ඇමතිතුමා, ජනාධිපති කාර්යාලයේ නිලධාරීන්, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ මුදල් අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡා පදනම් කරගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) සුදුසුකම්ලත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැනුම්කරුවන් සඳහා 2020.01.01 සිට 2020.12.31 දක්වා කාලය සඳහා රජය විසින් දැනටමත් නිවේදනය කර ඇති සහන සහ දිරිගැන්වීම් වලට අනුපූරක ලෙස, විශේෂ ණය සහන යෝජනාක්‍රමයක් ලබාදීමට බලපත්‍රලාභී බැංකු එකඟවී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සමඟ පැවති සාකච්ඡා වලට අනුව මෙම යෝජිත ණය සහන යෝජනාක්‍රමය හේතුවෙන් බැංකු පද්ධතියෙහි ස්ථායීතාවයට අනිසි පීඩනයක් හෝ තර්ජනයක් ඇති නොවනු ඇතැයි නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, මෙම යෝජනාක්‍රමය බලපත්‍රලාභී බැංකු අතර ඒකාකාරී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා මාර්ගෝපදේශයන් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කරනු ලැබේ.

1. පොදු කොන්දේසි සහ නියමයන්

(i) සුදුසුකම්ලත් සහභාගීවන්නන්: බලපත්‍රලාභී බැංකු වලින් ණය පහසුකම් ලබා තිබෙන, පහත (ii) ඡේදයෙහි සඳහන් කර ඇති ව්‍යාපාර අංශ වල නිරත වන, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මේ සඳහා සුදුසුකම් ලබයි. මෙම යෝජනාක්‍රමයෙහි කරුණු සඳහා, 2019.12.31 දිනෙන් අවසන් වසර සඳහා රුපියල් මිලියන 16 සිට 750 දක්වා වාර්ෂික පිරිවැටුමක් සහිත ණය ගැනුම්කරුවන් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ලෙස සැලකේ.

(ii) නිෂ්පාදන, සේවා, කෘෂිකර්ම (සැකසුම් ව්‍යාපාරද ඇතුලත්ව) සහ ඉදිකිරීම් අංශ මෙම යෝජනාක්‍රමය මගින් සහන සැලසෙන ව්‍යාපාරික අංශ වේ. සැකයකට තුඩු නොදීම සඳහා, යන්ත්‍ර සහ උපකරණ ආනයනය හැර අනෙකුත් ආනයන සඳහා ලබාදී ඇති ආනයන ණය පහසුකම් මෙම යෝජනාක්‍රමයට ඇතුලත් නොවේ. වාහන ආනයනය සඳහා ලබාදුන් ණය පහසුකම් සඳහාද මෙමගින් අවසර ලබාදී නොමැත.

(iii) පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට යටත්ව, ශ්‍රී ලංකා රුපියල් වලින් ලබාදී ඇති, ව්‍යාපාර ආශ්‍රිත කාලීන ණය, කල්බදු පහසුකම්, අයිරා ණය පහසුකම් සහ වෙළඳ ණය පහසුකම් මෙම යෝජනාක්‍රමය යටතේ සහන ලබාදෙන ණය පහසුකම් වේ.

(iv) ණය ගැනුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් 2020.01.31 දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හිදී, බලපත්‍රලාභී බැංකු විසින් සියළුම සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ට මෙම ණය සහන යෝජනාක්‍රමය යෝජනා කළ යුතු අතර, 2020.03.31 දින වනවිට යෝජනාක්‍රමය ක්‍රියාත්මක මට්ටමට ගෙන ආ යුතුය.

(v) ණය සහන යෝජනාක්‍රමයෙහි කාලය තුළ, යෝජනාක්‍රමයට සැලකිල්ලට ගනු ලබන ණය පහසුකම් සඳහා ගෙවිය යුතු ණය පොලිය ණය ගැනුම්කරුවන් විසින්, මෙම යෝජනාක්‍රමයට අදාළ වන කොන්දේසි වලට අනුකූලව අඛණ්ඩව ගෙවිය යුතුය.

(vi) ඉහත (v) ඡේදයෙහි සඳහන් පරිදි ණය පොලිය ආපසු ගෙවීමට අපොහොසත් වන ණය ගැනුම්කරුවන්හට තවදුරටත් මෙම යෝජනාක්‍රමයෙහි ප්‍රතිලාභ භුක්ති විඳීමට නොහැකි වන අතර, ඔවුන් මෙම යෝජනාක්‍රමයට සහභාගිවන්නන් ලෙසද නොසැලකේ.

(vii) මෙම යෝජනාක්‍රමයෙහි මෙහෙයුම් තොරතුරු මෙම චක්‍රලේඛයෙහි 2 සිට 6 අංශ වල දක්වා ඇත.

2. සක්‍රීය ණය

(i) කිසියම් බලපත්‍රලාභී බැංකුවකින් 2019.12.31 දින වනවිට, රුපියල් මිලියන 300ක සීමාව දක්වා අරමුදල් පාදක කරගත් මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණයක් ලබාගෙන ඇති, සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් අදාල බැංකුවෙන් මෙම යෝජනාක්‍රමය යටතේ ලබා දෙන ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(iii) 2020.01.31 දින හෝ ඊට ප්‍රථම ණය ගැනුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විට, බලපත්‍රලාභී බැංකු විසින් සියලු සුදුසුකම් ලත් කාලීන රුපියල් ණය සඳහා, 2020.01.01 - 2020.12.31 කාලය සඳහා ප්‍රාග්ධන සහන කාලයක් යෝජනා කළ යුතුය.

(iii) ප්‍රාග්ධන සහන කාලය සඳහා සුදුසුකම්ලත් ණයවල කාලය, ඒවායෙහි ණය වාරිකයෙහි වටිනාකම වෙනස් නොවන අයුරින්, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රාග්ධන සහන කාලයෙහි ප්‍රමාණයෙන් දීර්ඝ කරනු ඇත.

(iv) ණය කල්දමන කාල සීමාව තුළදී, ණය පොලිය, දඩ පොලී කොටසක් නොමැතිව, ගිවිසුම්ගත පරිදි අයකළ යුතුය.

(v) 2020.03.31 දක්වා කාලය තුළ ගෙවා දැමීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන, ස්ථාවර අයිරා ණය පහසුකම් 2020.06.30 දක්වා දීර්ඝ කරනු ලැබේ.

(vi) 2020.03.31 දක්වා කාලය තුළ ගෙවා දැමීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන, සුදුසුකම්ලත් වෙළඳ ණය පහසුකම් දින 30කින් දීර්ඝ කරනු ලැබේ.

(vii) ණය ගැනුම්කරුවන් විසින් පිලිගතහැකි ව්‍යාපාර සැලසුමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවන්හිදී, බලපත්‍රලාභී බැංකු විසින්, එක් ණය ගැනුම්කරුවෙකුට, එක් බැංකුවකට රුපියල් මිලියන 300ක උපරිමයකට යටත්ව සහ පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව අතිරේක ණයක් හෝ නව ණය පහසුකමක් හෝ ප්‍රදානය කළ හැක:

(අ) ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා ලබාදෙන, ආයෝජන අවශ්‍යතා ණය මුදල, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතයට සමාන පොළී අනුපාතයක් යටතේ වසර 05ක් තුළ ආපසු ගෙවා දැමිය යුතුය.

(ආ) මෙවැනි ණය සඳහා උපරිම වශයෙන් වසරක පමා සහන කාලයක් ලබා දීමට බැංකු වලට සලකා බැලිය හැක.

(ඇ) මෙම යෝජනාක්‍රමය යටතේ ලබාදෙන අතිරේක ණය පහසුකම් වලින් පැනනැගිය හැකි අවදානම් අවම කිරීම සඳහා සුදුසු සුරැකුම් ලබාගැනීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව ඇත.

(viii) 2020.12.31 දින වනවිට කල්පිරෙන වෙනත් සහන යෝජනාක්‍රම යටතේ ලබාදී ඇති සහන ඇත්නම්, එවැනි සහන 2020.12.31 දක්වා දීර්ඝ කරනු ලැබේ. එසේ වුවද එවැනි ණය ගැනුම්කරුවන් මෙම යෝජනාක්‍රමය යටතේ පනවා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කල යුතුය.

(ix) ලබාගෙන ඇති මුළු ණය පහසුකම්වල වටිනාකම රුපියල් මිලියන 300 ඉක්මවන ණය ගැනුම්කරුවන් මෙම යෝජනාක්‍රමයට ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන්, එවැනි ණය ගැනුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හිදී බලපත්‍රලාභී බැංකු විසින් අවස්ථානුකූලව තීරණය කරනු ඇත.

3. **අක්‍රීය ණය**

(i) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැංකු විසින් ණය නැවත අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති සහ නිවේදන නිකුත් කර ඇති ණයද ඇතුලත්ව, 2019.12.31 දින වන විට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුදුසුකම් ලත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, 2020.01.31 දින හෝ ඊට ප්‍රථම ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් පහත දක්වා ඇති සහන ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) ඉහත සඳහන් කර ඇති අක්‍රීය ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් එකතු වී, ආපසු නොගෙවා ඇති, ණය පොලියෙහි අඩංගු දඩ පොලී ප්‍රමාණය, බලපත්‍රලාභී බැංකු විසින් සිය වියදමින් කපා හැරිය යුතුය.

(iii) ණය අත්තිකාරම් ප්‍රතිලේඛණගත කිරීමේ යෝජනා පහත පරිදි වේ.

(අ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් 50%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය සඳහා සලකා බලනු ලබන දිනය වන විට ගෙවීම පැහැර හැර ඇති වාරික වල එකතු වී ඇති, නොගෙවූ පොළියෙන් (ඉහත සඳහන් කර ඇති දඩ පොලී කපා හැරීමෙන් පසු) 50%ක් ආපසු ගෙවීම කල් දැමීමට අවස්ථාව ලබා දිය හැකි අතර, ඉතිරි ප්‍රාග්ධන හා පොළී ප්‍රතිව්‍යුහගත කල යුතුය. ණය ගැනුම්කරු විසින් පහත (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව ප්‍රතිව්‍යුහගත කල ණය ගෙවා අවසන් කල පසු කල් දැමූ පොළී කපාහැරීමට බලපත්‍රලාභී බැංකුව විසින් කටයුතු කළ යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් 50%කට අඩු ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය සඳහා සලකා බලනු ලබන දිනය වන විට ගෙවීම පැහැර හැර ඇති වාරික වල එකතු වී ඇති, නොගෙවූ පොළියෙන් (ඉහත සඳහන් කර ඇති දඩ පොලී කපා හැරීමෙන් පසු) 25%ක් ආපසු ගෙවීම කල් දැමීමට අවස්ථාව ලබා දිය හැකි අතර, ඉතිරි ප්‍රාග්ධන හා පොළී ප්‍රතිව්‍යුහගත කල යුතුය. ණය ගැනුම්කරු විසින් පහත (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව ප්‍රතිව්‍යුහගත කල ණය ගෙවා අවසන් කල පසු කල් දැමූ පොළී කපාහැරීමට බලපත්‍රලාභී බැංකුව විසින් කටයුතු කල යුතුය.

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේද වල සඳහන් කර ඇති ප්‍රතිව්‍යුහගත කල ණය මුදල, මූලික ණය මුදලේ ගෙවීමට ඉතිරි වී ඇති වාරික ප්‍රමාණයට දෙගුණයකට නොවැඩි කාල සීමාවක් තුල ගෙවා අවසන් කල යුතුය.

(ඈ) ඉහත ඡේද (ඇ) හි සඳහන් ණය මුදල් හි ප්‍රාග්ධන කොටස පියවීම සඳහා වසරක සහන කාලයක් ලබා දෙන අතර, පොලිය ණය ගැනුම්කරු විසින් නිසි කලට ගෙවිය යුතුය.

(iv) බලපත්‍රලාභී බැංකු විසින් පහත ඡේද (ඈ) ට යටත්ව, අක්‍රමික ණය කාණ්ඩයේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්හට ව්‍යාපාර යලි පණ ගැන්වීම සඳහා නව කාරක ප්‍රාග්ධන ණය (හෝ තාවකාලික කෙමෙන් හීන වන අයිරා පහසුකම්) ලබා දිය යුතුය.

(අ) උපරිම ණය සීමාව මාස තුනක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වන අතර උපරිම ණය කාල සීමාව මාස හයකි.

(ආ) මෙම ණය හෝ අයිරා වල ප්‍රාග්ධන කොටස ගෙවීම සඳහා මාස තුනක සහන කාලයක් හිමිවන අතර, පොලිය ණය ගැනුම්කරු විසින් නිසි කලට ගෙවිය යුතුය.

(ඇ) මෙම ණය පහසුකම් සඳහා පොළී අනුපාතය පවතින නිත්‍ය ණය පහසුකම් අනුපාතය + 2% නොඉක්මවිය යුතුය.

(ඈ) මෙම නව කාරක ප්‍රාග්ධන ණය පහසුකම් පහත ඡේද 5 හි සඳහන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පරිපාලනය කරනු ලබන ණය ඇප ආවරන යෝජනා ක්‍රමයට ඇතුලත් වේ.

(v) බලපත්‍රලාභී බැංකු විසින් 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) යටතේ මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ වන ණය ගැනුම්කරුවන්ගේ ණය සහ අත්තිකාරම් අයකර ගැනීම සඳහා අභියෝජනා සම්මත කරගැනීම 2020.12.31 දක්වා කල් දැමිය යුතුය. ඉහත යෝජනා ක්‍රමයට සහභාගීවන හා අවශ්‍යතා සපුරා ඇති ණය ගැනුම් කරුවන් සම්බන්ධයෙන් මේ වන විටත් ණය අයකර ගැනීම සඳහා අභියෝජනා සම්මත කර ඇති නම්, දේපල වෙන්දේසි කිරීම් 2020.12.31 දක්වා කල් දැමිය යුතුය. අවශ්‍යතා සැපිරීමට අපොහොසත්වන්නන් මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ නොවන්නන් ලෙස බැංකු විසින් සලකනු ඇත.

(vi) ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින ගනුදෙනුකරුවන් හට මෙම යෝජනා ක්‍රමයේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අධිකරණයේදී ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීමට අවසර ඇත.

(vii) මෙම යෝජනා ක්‍රමය යටතේ පිලිගෙන ඇති අක්‍රමික ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් නෛතික ක්‍රියාමාර්ග ගැනීම අත්හිටුවිය යුතුය.

4. බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිමූල්‍යන යෝජනා ක්‍රමයන්හි ප්‍රාග්ධනය ආපසු ගෙවීම

(i) බලපත්‍රලාභී බැංකු වෙත ලබා දී ඇති ප්‍රතිමූල්‍යන යෝජනා ක්‍රමයන්හි 2020.01.01 සිට 2020.12.31 දක්වා සිදුකිරීමට පවතින ගෙවීම් හි ප්‍රාග්ධන ආපසු ගෙවීම් කල් දැමීමටත් අවසාන ගෙවීම් දිනය මාස 12කින් දීර්ඝ කිරීමටත් රජය විසින් කැමැත්ත දක්වා ඇත. කෙසේ වෙතත්, අවශ්‍ය බැංකු විසින් මේ සම්බන්ධයෙන් බැංකු අදාළ රජයේ ආයතනයන්ගෙන් දිගුවන් ඉල්ලා සිටිය යුතු අතර ඒ සම්බන්ධ පරිපූරක ගිවිසුමකට එළඹිය යුතුය.

5. ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

(i) යම් අමතර ණය හා අත්තිකාරම් ලබා දීම නිසා ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීම සඳහා මෙම චක්‍රලේඛයේ ඡේද 3(iv) යටතේ බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරන ණය වල ප්‍රාග්ධන මුදලෙන් 75%ක් දක්වා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් රජය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කරනු ඇත.

(ii) බලපත්‍රලාභී බැංකු විසින් ඇප ක්‍රමය ලබා ගැනීමට බලාපොරොත්තු වේ නම් ඒ සඳහා වාර්ෂිකව 1%ක ඇපකර ගාස්තුවක් බැංකුව විසින් දැරිය යුතුය.

6. ණය තොරතුරු කාර්යංශයට වාර්තා කිරීම්

(i) බලපත්‍රලාභී බැංකු විසින් හුදෙක්ම අසතුටුදායක ණය තොරතුරු කාර්යංශ වාර්තා පමණක් සැලකිල්ලට ගෙන ණය ලබාදීම් ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් පවත්වාගත යුතුය.

(ii) බලපත්‍රලාභී බැංකු විසින් ණය තොරතුරු කාර්යංශය වෙතින් අදහස් විමසීමෙන් පසුව, මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රාග්ධන ගෙවීම් සිදු කිරීම් කල් දමීම සම්බන්ධව වාර්තා කිරීමට සුදුසු ක්‍රමයක් සකස්කර ගත යුතු අතර, එමගින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන සක්‍රීය ණය ගැනුම් කරුවන්ට ඉදිරියේ කාලයේදී ඔවුන්ගේ ණය ශ්‍රේණිය හෝ ණය තොරතුරු කාර්යංශ වාර්තාවන් මත මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ වීම අයහපත් ලෙස බලපෑමක් සිදු නොවිය යුතුය.

අත්සන් කළේ
වී ඒ ඒ එන් ද සිල්වා මිය
බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

චක්‍රලේඛය 2020 අංක 02 2020 ජනවාරි 30

ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම

රටෙහි ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් සහ ගරු අග්‍රාමාත්‍යතුමා සහ මුදල් ඇමතිතුමා, ජනාධිපති කාර්යාලයේ නිලධාරීන්, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ මුදල් අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡා පදනම් කරගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) සුදුසුකම්ලත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැනුම්කරුවන් සඳහා 2020.01.01 සිට 2020.12.31 දක්වා කාලය සඳහා රජය විසින් දැනටමත් නිවේදනය කර ඇති සහන සහ දිරිගැන්වීම් වලට අනුපූරක ලෙස, විශේෂ ණය සහන යෝජනාක්‍රමයක් ලබාදීමට බලපත්‍රලාභී බැංකු එකඟවී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සමඟ පැවති සාකච්ඡා වලට අනුව මෙම යෝජිත ණය සහන යෝජනාක්‍රමය හේතුවෙන් බැංකු පද්ධතියෙහි ස්ථායීතාවයට අනිසි පීඩනයක් හෝ තර්ජනයක් ඇති නොවනු ඇතැයි නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, මෙම යෝජනාක්‍රමය බලපත්‍රලාභී බැංකු අතර ඒකාකාරී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා මාර්ගෝපදේශයන් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කරනු ලැබේ.

1. **පොදු කොන්දේසි සහ නියමයන්**

(i) සුදුසුකම්ලත් සහභාගීවන්නන්: බලපත්‍රලාභී බැංකු වලින් ණය පහසුකම් ලබා තිබෙන, පහත (ii) ඡේදයෙහි සඳහන් කර ඇති ව්‍යාපාර අංශ වල නිරත වන, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මේ සඳහා සුදුසුකම් ලබයි. මෙම යෝජනාක්‍රමයෙහි කරුණු සඳහා, 2019.12.31 දිනෙන් අවසන් වසර සඳහා රුපියල් මිලියන 16 සිට 750 දක්වා වාර්ෂික පිරිවැටුමක් සහිත ණය ගැනුම්කරුවන් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ලෙස සැලකේ. එසේ වුවද, වාර්ෂික පිරිවැටුම සම්බන්ධයෙන් දක්වා ඇති පහළ සීමාව, එනම් රුපියල් මිලියන 16ක සීමාව, 2019.12.31 දිනට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අදාළ නොවේ.

(ii) නිෂ්පාදන, සේවා, කෘෂිකර්ම (සැකසුම් ව්‍යාපාරද ඇතුලත්ව) සහ ඉදිකිරීම් අංශ මෙම යෝජනාක්‍රමය මගින් සහන සැලසෙන ව්‍යාපාරික අංශ වේ. සැකයකට තුඩු නොදීම සඳහා, යන්ත්‍ර සහ උපකරණ ආනයනය හැර අනෙකුත් ආනයන සඳහා ලබාදී ඇති ආනයන ණය පහසුකම් මෙම යෝජනාක්‍රමයට ඇතුලත් නොවේ. වාහන ආනයනය සඳහා ලබාදුන් ණය පහසුකම් සඳහාද මෙමගින් අවසර ලබාදී නොමැත. එසේ වුවද, 2019.12.31 දිනට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් යෝජනාක්‍රමයට සම්බන්ධ කර ගැනීමේදී පමණක්, යෝජනාක්‍රමය යටතට ගැනෙන ව්‍යාපාර අංශ වලට අගය එකතු කල ව්‍යාපාර සහ වෙළඳාම්ද ඇතුලත් වේ.

(iii) පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට යටත්ව, ශ්‍රී ලංකා රුපියල් වලින් ලබාදී ඇති, ව්‍යාපාර ආශ්‍රිත කාලීන ණය, කල්බදු පහසුකම්, අයිරා ණය පහසුකම් සහ වෙළඳ ණය පහසුකම් මෙම යෝජනාක්‍රමය යටතේ සහන ලබාදෙන ණය පහසුකම් වේ.

(iv) ණය ගැනුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් 2020.02.10 දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හිදී, බලපත්‍රලාභී බැංකු විසින් සියළුම සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ට මෙම ණය සහන යෝජනාක්‍රමය යෝජනා කළ යුතු අතර, 2020.03.31 දින වනවිට යෝජනාක්‍රමය ක්‍රියාත්මක මට්ටමට ගෙන ආ යුතුය.

(v) ණය සහන යෝජනාක්‍රමයෙහි කාලය තුළ, යෝජනාක්‍රමයට සැලකිල්ලට ගනු ලබන ණය පහසුකම් සඳහා ගෙවිය යුතු ණය පොලිය ණය ගැනුම්කරුවන් විසින්, මෙම යෝජනාක්‍රමයට අදාළ වන කොන්දේසි වලට අනුකූලව අඛණ්ඩව ගෙවිය යුතුය.

(vi) ඉහත (v) ඡේදයෙහි සඳහන් පරිදි ණය පොලිය ආපසු ගෙවීමට අපොහොසත් වන ණය ගැනුම්කරුවන්හට තවදුරටත් මෙම යෝජනාක්‍රමයෙහි ප්‍රතිලාභ භුක්ති විඳීමට නොහැකි වන අතර, ඔවුන් මෙම යෝජනාක්‍රමයට සහභාගිවන්නන් ලෙසද නොසැලකේ. ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවලට සුදුසු අවදානම් අවම කරගැනීමේ ක්‍රියාපටිපාටීන් අනුගමනය කල හැක.

(vii) මෙම යෝජනාක්‍රමයෙහි මෙහෙයුම් තොරතුරු මෙම චක්‍රලේඛයෙහි 2 සිට 6 අංශ වල දක්වා ඇත.

2. **සක්‍රීය ණය**

(i) කිසියම් බලපත්‍රලාභී බැංකුවකින් 2019.12.31 දින වනවිට, රුපියල් මිලියන 300ක සීමාව දක්වා අරමුදල් පාදක කරගත් මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණයක් ලබාගෙන ඇති, සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් අදාල බැංකුවෙන් මෙම යෝජනාක්‍රමය යටතේ ලබා දෙන ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) 2020.02.10 දින හෝ ඊට ප්‍රථම ණය ගැනුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විට, බලපත්‍රලාභී බැංකු විසින් සියලු සුදුසුකම් ලත් කාලීන රුපියල් ණය සඳහා, 2020.01.01 2020.12.31 කාලය සඳහා ප්‍රාග්ධන සහන කාලයක් යෝජනා කළ යුතුය.

(iii) ප්‍රාග්ධන සහන කාලය සඳහා සුදුසුකම්ලත් ණයවල කාලය, ඒවායෙහි ණය වාරිකයෙහි වටිනාකම වෙනස් නොවන අයුරින්, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රාග්ධන සහන කාලයෙහි ප්‍රමාණයෙන් දීර්ඝ කරනු ඇත.

(iv) ණය කල්දමන කාල සීමාව තුළදී, ණය පොලිය, දඩ පොලී කොටසක් නොමැතිව, ගිවිසුම්ගත පරිදි අයකළ යුතුය.

(v) 2020.03.31 දක්වා කාලය තුළ ගෙවා දැමීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන, ස්ථාවර අයිරා ණය පහසුකම් 2020.06.30 දක්වා දීර්ඝ කරනු ලැබේ. එසේ වුවද, 2019.12.31 දිනට පැවති තාවකාලික අයිරා ණය පහසුකම් සම්බන්ධයෙන්, එම තාවකාලික අයිරා ණය සීමාවන් කල්පිරීම මාස 2කින් දිගුකෙරේ.

(vi) 2020.03.31 දක්වා කාලය තුළ ගෙවා දැමීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන, සුදුසුකම්ලත් වෙළඳ ණය පහසුකම් දින 30කින් දීර්ඝ කරනු ලැබේ.

(vii) ණය ගැනුම්කරුවන් විසින් විශ්වසනීය ව්‍යාපාර සැලසුමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවන්හිදී, බලපත්‍රලාභී බැංකු විසින්, එක් ණය ගැනුම්කරුවෙකුට, එක් බැංකුවකට රුපියල් මිලියන 300ක උපරිමයකට යටත්ව සහ පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව, ආයෝජන හෝ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අතිරේක ණයක් හෝ නව ණය පහසුකමක් හෝ ප්‍රදානය කළ හැක:

(අ) ව්‍යාපාර කටයුතු ප්‍රසාරණය කිරීම සඳහා ලබාදෙන, ආයෝජන අවශ්‍යතා ණය මුදල, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය + 1.5%ට සමාන පොලී අනුපාතයක් යටතේ වසර 05ක් තුළ ආපසු ගෙවා දැමිය යුතුය.

(ආ) කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පිරිනමන ණය මුදල, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතයට සමාන පොලී අනුපාතයක් යටතේ වසර 02ක් තුළ ආපසු ගෙවා දැමිය යුතුය.

(ඇ) වසරක උපරිම පමා සහන කාලයක් මෙවැනි ණය සඳහා ලබා දීමට බැංකු වලට සලකා බැලිය හැක.

(ඈ) මෙම යෝජනාක්‍රමය යටතේ ලබාදෙන අතිරේක ණය පහසුකම් වලින් පැනනැගිය හැකි අවදානම් අවම කිරීම සඳහා සුදුසු සුරැකුම් ලබාගැනීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව ඇත.

(viii) 2020.12.31 දින වනවිට කල්පිරෙන වෙනත් සහන යෝජනාක්‍රම යටතේ ලබාදී ඇති සහන ඇත්නම්, එවැනි සහන 2020.12.31 දක්වා දීර්ඝ කරනු ලැබේ. එසේ වුවද එවැනි ණය ගැනුම්කරුවන් මෙම යෝජනාක්‍රමය යටතේ පනවා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කල යුතුය.

(ix) ලබාගෙන ඇති මුළු ණය පහසුකම්වල වටිනාකම රුපියල් මිලියන 300 ඉක්මවන ණය ගැනුම්කරුවන් මෙම යෝජනාක්‍රමයට ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන්, එවැනි ණය ගැනුම්කරුවන් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හිදී බලපත්‍රලාභී බැංකු විසින් අවස්ථානුකූලව තීරණය කරනු ඇත.

3. **අක්‍රීය ණය**

(i) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැංකු විසින් ණය නැවත අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති සහ නිවේදන නිකුත් කර ඇති ණයද ඇතුලත්ව, 2019.12.31 දින වන විට අක්‍රීය ණය කාණ්ඩයෙහි සිටින සුදුසුකම් ලත් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, 2020.02.10 දින හෝ ඊට ප්‍රථම ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් පහත දක්වා ඇති සහන ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) ඉහත සඳහන් කර ඇති අක්‍රීය ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් එකතු වී, ආපසු නොගෙවා ඇති ණය පොලියෙහි අඩංගු දඩ පොලී ප්‍රමාණය, බලපත්‍රලාභී බැංකු විසින් කපා හරිනු ඇත.

(iii) ණය අත්තිකාරම් ප්‍රතිලේඛණගත කිරීමේ යෝජනා පහත පරිදි වේ.

(අ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් 50%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය සඳහා සලකා බලනු ලබන දිනය වන විට ගෙවීම පැහැර හැර ඇති වාරික වල එකතු වී ඇති, නොගෙවූ පොලියෙන් (ඉහත සඳහන් කර ඇති දඩ පොලී කපා හැරීමෙන් පසු) 50%ක් ආපසු ගෙවීම කල් දැමිය යුතුය. හිඟ ප්‍රාග්ධනය, ගෙවීම පැහැර හැර ඇති වාරිකවලට අදාළ නොගෙවූ පොලී ශේෂය සහ අනාගතයෙහි ගෙවිය යුතු පොලිය ප්‍රතිලේඛණගත කල යුතුය. ණය ගැනුම්කරු විසින් පහත (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව ප්‍රතිලේඛණගත කල ණය ගෙවා අවසන් කල පසු, කල් දැමූ පොලිය කපාහැරීමට බලපත්‍රලාභී බැංකුව විසින් කටයුතු කල යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් 50%කට අඩු ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය සඳහා සලකා බලනු ලබන දිනය වන විට ගෙවීම පැහැර හැර ඇති වාරික වල එකතු වී ඇති, නොගෙවූ පොලියෙන් (ඉහත සඳහන් කර ඇති දඩ පොලී කපා හැරීමෙන් පසු) 25%ක් ආපසු ගෙවීම කල් දැමිය යුතුය. හිඟ ප්‍රාග්ධනය, ගෙවීම පැහැර හැර ඇති වාරිකවලට අදාළ නොගෙවූ පොලී ශේෂය සහ අනාගතයෙහි ගෙවිය යුතු පොලිය ප්‍රතිලේඛණගත කල යුතුය. ණය ගැනුම්කරු විසින් පහත (ඇ) සහ (ඈ) ඡේද ප්‍රකාරව ප්‍රතිලේඛණගත කල ණය ගෙවා අවසන් කල පසු කල් දැමූ පොළී කපාහැරීමට බලපත්‍රලාභී බැංකුව විසින් කටයුතු කල යුතුය.

(ඇ) ඉහත (අ) හා (ආ) ඡේදවල සඳහන් කර ඇති හිඟ ප්‍රාග්ධන ශේෂය ප්‍රතිලේඛණගතකර, මූලික ණය මුදලේ ගෙවීමට ඉතිරිවී ඇති වාරික ප්‍රමාණයට දෙගුණයකට නොවැඩි කාල සීමාවක් තුල ගෙවා අවසන් කල යුතුය. මේ සඳහා උදහරණයක් ඇමුණුම 1හි දක්වා ඇත.

(ඈ) ඉහත (අ) හා (ආ) ඡේදවල සඳහන් කර ඇති, ගෙවීම පැහැර හැරඇති වාරිකවලට අදාළ නොගෙවූ පොලී ශේෂය සහ අනාගතයෙහි ගෙවිය යුතු පොලිය ප්‍රතිලේඛණගතකර, මූලික ණය මුදලේ ගෙවීමට ඉතිරිවී ඇති වාරික ප්‍රමාණයට දෙගුණයකට නොවැඩි කාල සීමාවක් තුල ගෙවා අවසන් කල යුතුය. මේ සඳහා උදහරණයක් ඇමුණුම 1හි දක්වා ඇත.

(ඉ) ඉහත (ඇ) ඡේදයෙහි සඳහන් කර ඇති, ණය මුදල්වල ප්‍රාග්ධන කොටස පියවීම සඳහා වසරක සහන කාලයක් ලබාදිය යුතුය. නමුත්, ණය ගැනුම්කරු විසින් ඉහත (ඈ) ඡේදයෙහි සඳහන් කර ඇති පොලිය නිසි කලට ගෙවිය යුතුය.

(iv) බලපත්‍රලාභී බැංකු විසින් පහත ඡේද (ඈ)ට යටත්ව, අක්‍රීය ණය කාණ්ඩයේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්හට ව්‍යාපාර යලි පණ ගැන්වීම සඳහා නව කාරක ප්‍රාග්ධන ණය (හෝ තාවකාලික, කෙමෙන් හීන වන අයිරා පහසුකම්) ලබා දිය යුතුය.

(අ) ව්‍යාපාරයෙහි මාස තුනක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය උපරිම ණය සීමාව වන අතර, එවැනි ණයවල උපරිම කාල සීමාව මාස හයකි.

(ආ) මෙම ණය හෝ අයිරා වල ප්‍රාග්ධන කොටස ගෙවීම සඳහා මාස තුනක සහන කාලයක් හිමිවන අතර, පොලිය ණය ගැනුම්කරු විසින් නිසි කලට ගෙවිය යුතුය.

(ඇ) මෙම ණය පහසුකම් සඳහා පොළී අනුපාතය පවතින නිත්‍ය ණය පහසුකම් අනුපාතය + 2% නොඉක්මවිය යුතුය.

(ඈ) මෙම නව කාරක ප්‍රාග්ධන ණය පහසුකම්, පහත ඡේද 5 හි සඳහන් පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පරිපාලනය කරනු ලබන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයට ඇතුලත් වේ.

(v) බලපත්‍රලාභී බැංකු විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ, මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ වන ණය ගැනුම්කරුවන්ගේ ණය සහ අත්තිකාරම් අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මත කරගැනීම 2020.12.31 දක්වා කල් දැමිය යුතුය. ඉහත යෝජනා ක්‍රමයට සහභාගීවන හා ඒ සඳහා අවශ්‍යතා සපුරා ඇති ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් මේ වන විටත් ණය අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මත කර ඇති නම්, දේපල වෙන්දේසි කිරීම් 2020.12.31 දක්වා කල් දැමිය යුතුය. මෙම යෝජනාක්‍රමය යටතේ පනවා ඇති අවශ්‍යතා සැපිරීමට අපොහොසත්වන ණය ගැනුම්කරුවන් තවදුරටත් යෝජනාක්‍රමයෙහි සාමාජිකයින් ලෙස නොසැලකේ.

(vi) ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින ගනුදෙනුකරුවන් හට මෙම යෝජනා ක්‍රමයේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අධිකරණයේදී ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, මෙම යෝජනාක්‍රමයට සහභාගීවීමට අවසර ඇත.

(vii) මෙම යෝජනා ක්‍රමය යටතේ පිළිගෙන ඇති, අක්‍රීය ණය කාණ්ඩයේ සිටින ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් නෛතික ක්‍රියාමාර්ග ගැනීම අත්හිටුවිය යුතුය.

4. බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිමූල්‍යන යෝජනා ක්‍රමයන්හි ප්‍රාග්ධනය ආපසු ගෙවීම

(i) බලපත්‍රලාභී බැංකු වෙත ලබා දී ඇති ප්‍රතිමූල්‍යන යෝජනාක්‍රමයන්හි 2020.01.01 සිට 2020.12.31 දක්වා සිදුකිරීමට පවතින ගෙවීම් හි ප්‍රාග්ධන ආපසු ගෙවීම් කල් දැමීමටත් අවසාන ගෙවීම් දිනය මාස 12කින් දීර්ඝ කිරීමටත් රජය විසින් කැමැත්ත පල කර ඇත. කෙසේ වෙතත්, එවැනි දීර්ඝකිරීම් අවශ්‍ය බැංකු මේ සම්බන්ධයෙන්, අදාළ රජයේ ආයතනයන්ගෙන් කාල දිගුවක් ඉල්ලා සිටිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පරිපූරක ගිවිසුමකට එළඹිය යුතුය.

5. ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

(i) මෙම චක්‍රලේඛයේ ඡේද 3(iv) යටතේ බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරන අමතර ණය හා අත්තිකාරම් ලබා දීම නිසා ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීම සඳහා ප්‍රාග්ධන මුදලෙන් 75%ක් දක්වා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් රජය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කරනු ඇත.

(ii) බලපත්‍රලාභී බැංකු විසින් ඇප ක්‍රමය ලබා ගැනීමට බලාපොරොත්තු වේ නම් ඒ සඳහා වාර්ෂිකව 1%ක ඇපකර ගාස්තුවක් බැංකුව විසින් දැරිය යුතුය.

6. ණය තොරතුරු කාර්යංශයට වාර්තා කිරීම්

(i) බලපත්‍රලාභී බැංකු විසින් හුදෙක්ම අසතුටුදායක ණය තොරතුරු කාර්යංශ වාර්තා පමණක් සැලකිල්ලට ගෙන ණය ලබාදීම් ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් පවත්වාගත යුතුය.

(ii) බලපත්‍රලාභී බැංකු විසින් ණය තොරතුරු කාර්යංශය වෙතින් අදහස් විමසීමෙන් පසුව, මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රාග්ධන ගෙවීම් සිදු කිරීම් කල් දැමීම සම්බන්ධව වාර්තා කිරීමට සුදුසු ක්‍රමයක් සකස්කර ගත යුතු අතර, එමඟින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන සක්‍රීය ණය ගැනුම් කරුවන්ට ඉදිරියේ කාලයේදී ඔවුන්ගේ ණය ශ්‍රේණිය හෝ ණය තොරතුරු කාර්යංශ වාර්ථාවන් මත මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ වීම අයහපත් ලෙස බලපෑමක් සිදු නොවිය යුතුය.

7. වාර්තාකරණ අවශ්‍යතාවය

2020.02.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි, සෑම මසකම 15 සහ 30 දිනවලට පවතින ණය ගැනුම්කරුවන් වෙත ලබාදී ඇති ණය සහන සම්බන්ධයෙන් තොරතුරු, එම දින වල සිට, වැඩකරන දින 05ක් ඇතුලත, බලපත්‍රලාභී බැංකු විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වාර්තාකල යුතුය.

8. පසුගිය චක්‍රලේඛය අවලංගු කිරීම

ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කල 2020 අංක 01 දරන චක්‍රලේඛය මෙමගින් අවලංගු කෙරේ.

අත්සන් කළේ
වී ඒ ඒ එන් ද සිල්වා මිය
බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

මෙහි ඇමුණුම I https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circular_no_02_of_2020_0.pdf ඔස්සේ ලබා ගත හැක.

චක්‍රලේඛය 2020 අංක 03 2020 මාර්තු 04

අපනයනකරුවන් වෙත ලබා දෙනු ලබන ණය අත්තිකාරම් පියවා ගැනීම

ඉහත කරුණ පිළිබඳව 2015 අගෝස්තු 03 දිනැති අපගේ චක්‍රලේඛයට අමතරව බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව දැනුම් දෙනු ලැබේ.

i. අපනයන ආදායමෙන් අපනයන ණය පහසුකම් පියවීම සඳහා ගතවන උපරිම කාලය නැවිගත කළ දින සිට දින 180 දක්වා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර තිබේ.

ii. මෙම චක්‍රලේඛය 2020 මාර්තු 01 දින සිට ක්‍රියාත්මකය.

අත්සන් කළේ
වී ඒ ඒ එන් ද සිල්වා මිය
බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

බැංකු පනත් විධාන 2020 අංක 01 2020 මාර්තු 19

2020 අංක 01 දරණ ආනයන හා විදේශ මුදල් ආයෝජන සීමා කිරීම පිලිබඳ බැංකු පනත් විධානය

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

බැංකු පද්ධතියේ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා, 1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව, පිළිවෙලින් සියලුම හෝ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවකට එම බැංකුවේ හෝ බැංකුවල ව්‍යාපාරයේ ඕනෑම අංශයක් පැවැත්විය යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් දීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

කොවිඩ් 19 ව්‍යාප්තියේ බලපෑම හේතුවෙන් විනිමය අනුපාතයට සහ මූල්‍ය වෙලඳපොලවලට ඇති පීඩනය ලිහිල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත මීළඟ මාස 3ක කාලය තුළ පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට නියම කරනු ලබයි.

1. පහත අයිතමයන් සඳහා ආනයනය පහසුකම් සැපයීම අත්හිටුවිය යුතුයි

   අ) ණයවර ලිපි පහසුකම් යටතේ ඇමුණුම I හි උපලේඛන A හි දක්වා ඇති අයිතම හැර අනෙකුත් මෝටර් වාහන

   ආ) ණය ලිපි, පිළිගැනීමට එරෙහි ලියකියවිලි සහ අත්තිකාරම් ගෙවීම් පහසුකම් යටතේ ඇමුණුම I හි උපලේඛන B හි දක්වා ඇති අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ

2. ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර මිලදී ගැනීම අත්හිටුවිය යුතුයි.

මෙම උපදෙස් වහාම ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාත්මක කෙරේ

මෙහි ඇමුනුම 1 http://www.cbsl.gov.lk/en/laws/directions-circulars-guidelines-for-banks ඔස්සේ ලබා ගත හැක.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2020 අංක 04 2020 මාර්තු 24

කොවිඩ්-19 මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැළසීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග

දැනට පැතිරයන කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා අගතියට පත් පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහය වීම සඳහා සහන සැපයීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස අති ගරු ජනාධිපතිතුමන් විසින් නිකුත් කරන ලද නියෝගයට අනුව, 2020.03.20 වන දින පැවැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී කැබිනට් ඇමතිවරුන් විසින් ගන්නා ලද තීරණයන්ට සමගාමීව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, මෙයින් මතුවට මූල්‍යායතන ලෙස සඳහන් කෙරෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලීසිං සමාගම් සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1. පෙර සඳහන් සියළු මූල්‍යායතන විසින් ප්‍රාග්ධනය හා පොලිය ඇතුලත් ව ණය ගෙවීම් සඳහා සහන කාලයක් පහත පරිදි ලබා දිය යුතු

   අ. ස්වයංරැකියා ලෙස සේවයේ නිරතු සියළු ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා කුඩා රථ සහ බස් රථ වල ලීසිං වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක්;

   ආ. පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින් විසින් ලබා ගත් පුද්ගල ණය සඳහා 2020.05.30 දක්වා සහන කාලයක්;

   ඇ. රුපියල් මිලියනයට අඩු මුළු ණය වටිනාකමකින් යුතු සියළුම පුද්ගල ණය සහ ලීසිං වාරික සඳහා මාස තුනක සහන කාලයක්; සහ

   ඈ. අගතියට පත් ව්‍යාපාරික අංශයන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට, සංචාරක, ඇඟළුම්, වැවිළි, තොරතුරු තාක්ෂණ සහ සහසම්බන්ධිත කාර්යය සම්පාදන සේවා සපයන්නන් (logistic service providers) සඳහා මාස හයක ණය සහන කාලයක්.

2. මූල්‍යායතන විසින් ඉහත 1 (ඈ.) හි සඳහන් ක්ෂේත්‍රයන් හට 4% පොළී අනුපාතිකයකට කාරක ප්‍රාග්ධන පහසුකම් සහ අවම වශයෙන් මාස හයක කාල සීමාවක් සඳහා පොළී ගෙවීම් කපා හැරීමක් ලබා දිය යුතු අතර ප්‍රතිමූල්‍යනයේදී පොළී සහනාධාරයක් හිමි වනු ඇත.

3. ඉහත 1 හා 2 සඳහන් කාරණා සඳහා ගනුදෙනු කරුවන් හට 2020.04.30 වන දින තෙක් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මූල්‍යායතන විසින් ඉඩ ලබා දිය යුතු අතර මූල්‍යායතන විසින් ඒ පිළිබඳ කටයුතු දින 45ක් තුල දී සිදුකර අවසන් කළ යුතුය.

4. මූල්‍යායතන විසින් රුපියල් 50,000 දක්වා දේශීය ණයපත් ගනුදෙනු සඳහා අයකරනු ලබන පොලිය 15% ක උපරිමයකට යටත් කල යුතු අතර ණයපත් සඳහා මාසිකව ගෙවිය යුතු අවම මුදල 50% කින් අඩු කළ යුතුය. එමෙන්ම, ණය සීමාව රුපියල් 50,000 දක්වා වන ණයපත් ආපසු ගෙවීමේ කාලය 2020.04.30 දක්වා දීර්ඝ කළ යුතුය.

5. බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් 500,000 ට අඩු වටිනාකමකින් යුතු චෙක්පත්වල වලංගු කාලය 2020.04.30 දක්වා දීර්ඝ කළ යුතුය.

6. බලපත්‍රලාභී බැංකු වල සියළුම ශාඛා ඇඳිරි නීතිය නොපවතිනා දිනයන් හිදී පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා අවම සේවක ප්‍රමාණයක් සහිතව විවෘතව තැබිය යුතු අතර ආහාර, ඖෂධ, සංචාරක සහ අනෙතුත් ගනුදෙනුකරුවන්ගේ අන්තර්ජාතික ගනු දෙනු සඳහා පහසුකම් සැපයීම සඳහා ආයතනික ශාඛාවන් ඇඳිරි නීතිය පවත්නා දිනයන් හිදී ද විවෘතව පැවතිය යුතුය.

7. ඉහත සඳහන් කරුණු පිළිබඳ විස්තරාත්මක උපදෙස් 2020.03.27 වැනි දින නිකුත් කරනු ඇත.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම චක්‍රලේඛය සම්බන්ධව නිති අසන පැන සඳහා පිලිතුරු පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_2_of_2020_s.pdf
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_3_of_2020_e1.pdf
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_4_of_2020_e.pdf

චක්‍රලේඛය 2020 අංක 05 2020 මාර්තු 27

කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං-රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50ක සය-මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම

1. හැඳින්වීම

(i) කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයංරැකියා ඇතුළු ව්‍යාපාර සඳහා පුළුල් ෆිස්කල් හා මූල්‍ය සහන සැපයීමේ අරමුණින් කැබිනට් මණ්ඩලය විසින් 2020.03.20 වැනි දින ගන්නා ලද තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත ප්‍රතිමූල්‍ය පහසුකම ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම සහන අතරට ණය සහන කාලයක් (ප්‍රාග්ධනය හා පොලිය) සහ සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සඳහා 4% වාර්ෂික පොලී අනුපාතයකට කාරක ප්‍රාග්ධන පහසුකම් සැපයීම අයත්වේ.

(ii) 2020.03.25 වැනි දින සිට ක්‍රියාත්මක වන මෙම කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයංරැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට ලබා දෙනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකමට සහභාගීවීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් (මින් ඉදිරියට මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) සුදුසුකම් ලබනු ඇත.

(iii) මෙම චක්‍රලේඛය, 2020.03.24 වන දින නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛයට අතිරේකයක් වන අතර මෙමගින් ඉහත ප්‍රතිමූල්‍ය පහසුකම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මෙහෙයුම් මාර්ගෝපදේශ සපයනු ලැබේ.

2. මූල්‍ය පහසුකම් සඳහා අදාළ පොදු කොන්දේසි හා නියමයන්

(i) සුදුසුකම් ලබන ව්‍යාපාර/ක්ෂේත්‍ර

(අ) සංචාරක, කොවිඩ්-19 නිසා වැඩ කටයුතු අඩාල වූ සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් (lockdowns) නිසා අගතියට පත් ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි හා මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) ඇතුළු අපනයන ආශ්‍රිත සෘජු හා වක්‍ර ව්‍යාපාර.

(ආ) රුපියල් බිලියනයට අඩු පිරිවැටුම් සහිත නිෂ්පාදන, සේවා, කෘෂිකාර්මික (සැකැසුම් කර්මාන්ත ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතුකිරීම් හා අවසරලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්

(ඇ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම රැකියා හෝ ආදායම් අහිමි වූ ස්වයංරැකියා ව්‍යාපාර හෝ පුද්ගලයන්.

(ඈ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම ආදායම හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බලපෑම් එල්ලවූ, විදේශ මුදලින් ණය ගෙවීමට ඇති විදේශ විනිමය උපයන පුද්ගලයින් හා ව්‍යාපාර.

(ii) මෙම ප්‍රතිමූල්‍ය පහසුකම ඖෂධ, වෛද්‍යෝපකරණ, ආහාර, පොහොර, අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ හැරුනු කොට වෙනත් කිසිදු ආනයන ණය පහසුකමක් සඳහා යොදගත නොහැකි බව සැක හැර දත යුතුය.

(iii) දී ඇති කොන්දේසි අවශ්‍යතාවයන්ට යටත් ව රුපියල් හා විදේශ මුදලින් ලබාගත් කාලීන ණය, කල් බදු, රන් භාණ්ඩ උකස් ණය පහසුකම් සහ වෙළඳ මූල්‍ය පහසුකම් සඳහා මෙම මූල්‍ය ක්‍රමය යටතේ පහසුකම් ලැබෙනු ඇත.

(iv) අන්තර්ජාල පහසුකම් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ සහන අපේක්ෂා කරන බවට 2020.04.30 දිනට ප්‍රථම ඉල්ලීම් කල, කොවිඩ්-19 ව්‍යසනය නිසා වැඩ කටයුතු අඩාල වූ සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් නිසා අගතියට පත්, සියළු ණය ගැනුම්කරුවන් සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ අදාළ සහන ලබාදීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කල යුතුය. ගනුදෙනුකරුවන් මෙවැනි ඉල්ලීමක් සිදුකල දින සිට දින 45ක් තුලදී අදාළ ඉල්ලීම ඇගයීමට ලක්කිරීම සම්පූර්ණ කිරීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කල යුතු අතර, එසේ ඇගයීම සිදුකර අවසන් කරන තෙක් අදාළ අයදුම්කරුවන්ගේ ණය පහසුකම් නැවත අයකර ගැනීම නැවැත්විය යුතුය.

3. 2020.03.25 දින වන විට සක්‍රියව පැවති ණය සඳහා ලැබෙන සහන

(i) 2020.04.30 වන දින හෝ ඊට ප්‍රථම මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ඉල්ලා සිටින ණය ගැනුම්කරුවන්ගේ සුදුසුකම් ලබන සියළු රුපියල් හා විදේශ මුදල් කාලීන ණය සඳහා පහත සඳහන් කාල සීමාවන් සඳහා ණය ගෙවීමේ සහන කාලයක් මූල්‍ය ආයතන විසින් ලබාදිය යුතුය.

(අ) ස්වයංරැකියා නියුක්තිකයන්/ හිමිකරුවන් විසින් ක්‍රියාත්මක කරන සියළු ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන වෑන් රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගන්නා කුඩා රථ, බස් රථ සහ අනෙකුත් වත්කම් වන යතුරුපැදි හා කුලී රථ වල කල්බදු වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක්.

(ආ) පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින් විසින් ලබා ගත් පුද්ගල ණය ගෙවීම සඳහා 2020.05.30 දක්වා සහන කාලයක්.

(ඇ) රුපියල් මිලියනයට අඩු වටිනාකමකින් ප්‍රදානය කල සියළුම පුද්ගල ණය සහ කල්බදු වාරික සඳහා මාස තුනක සහන කාලයක්.

(ඈ) අගතියට පත් ව්‍යාපාරික අංශයන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට, සංචාරක, ඇඟළුම්, වැවිළි, තොරතුරු තාක්ෂණ සහ සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) සඳහා මාස හයක ණය සහන කාලයක්.

(ඉ) ඉහත 2(i) යටතේ සඳහන් අනෙකුත් සියළුම සුදුසුකම් ලත් ව්‍යාපාර/ක්ෂේත්‍ර සඳහා මාස හයක ණය සහන කාලයක්.

(ii) මූල්‍ය ආයතන විසින් ණය සහන සඳහා සුදුසුකම් ලබන ණය පහසුකම්වල ආපසු ගෙවීමේ කාලසීමාව අදාළ ණය සහන කාලසීමාවෙන් දීර්ඝ කල යුතුය.

(iii) 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන ස්ථාවර අයිරා පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කරනු ඇත. කෙසේ නමුත්, සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන්ගේ, 2020.03.25 දින වන විට පැවැති තාවකාලික අයිරා පහසුකම් වල කල් පිරීම් මාස දෙකකින් දීර්ඝ කෙරෙන අතර එකී පහසුකම් සඳහා දීර්ඝ කරන ලද කාලසීමාව තුල අයකල හැකි පොළී අනුපාතය 13% ක උපරිමයකට සීමා කෙරේ.

(iv) 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන සුදුසුකම් ලත් වෙළඳ ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කෙරේ.

(v) 2020.03.25 දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන උකස් ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කෙරේ.

4. 2020.03.25 දින වන විට අක්‍රියව පැවති ණය සඳහා ලැබෙන සහන

(i) 2020.03.25 දක්වා අයවිය යුතු දඩ පොළී අදාළ මූල්‍ය ආයතනය විසින් අහෝසිකල යුතුය.

(ii) ණය සහ අත්තිකාරම් ප්‍රතිලේඛණගත කිරීම පහත පරිදි සිදුකල යුතුය:

(අ) මුල් ණය මුදලින් 50% ක් හෝ ඊට වැඩි මුදලක් ණය ගැනුම්කරු විසින් ආපසු ගෙවා ඇති අවස්ථාවකදී මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ අදාළ මූල්‍ය ආයතනය විසින් සලකා බලන දිනය දක්වා වන හිඟ පැවැති වාරික සඳහා අදාළ නොගෙවූ හා එකතු වූ පොලියෙන් (ඉහත සඳහන් කල පරිදි දඩ පොළී අහෝසි කිරීමෙන් පසු) 50% ක් කල් දැමීම කල හැක. ගෙවිය යුතු ප්‍රාග්ධන මුදලෙහි ශේෂය ද පැහැර හරින ලද වාරික සඳහා ගෙවිය යුතු පොළියේ ඉතිරිව ඇති ශේෂය සහ ඉදිරියට ගෙවීමට ඇති පොලිය වසර තුනක කාලයකින් දීර්ඝ කර ප්‍රතිලේඛණගත කළ යුතුය. එලෙස ප්‍රතිලේඛණගත කළ ණය මුදල් ණය ගැනුම්කරු විසින් පහත සඳහන් ඡේද (ඇ) සහ (ඈ) හි සඳහන් ආකාරයට ගෙවීමෙන් අනතුරුව මූල්‍ය ආයතනය මගින් කල් තබන ලද පොළී මුදල් අහෝසි කිරීමට කටයුතු කල යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මුළු ණය මුදලින් 50% කට අඩුවෙන් ආපසු ගෙවා ඇති අවස්ථාවකදී මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ අදාළ මූල්‍ය ආයතනය විසින් සලකා බලන දිනය දක්වා වන හිඟ පැවැති වාරික සඳහා අදාළ නොගෙවූ හා එකතු වූ පොළියෙන් (ඉහත සඳහන් කල පරිදි දඩ පොලී අහෝසි කිරීමෙන් පසු) 25% ක් කල් දැමීම කල හැක. ගෙවිය යුතු ප්‍රාග්ධන මුදලෙහි ශේෂය ද පැහැර හරින ලද වාරික සඳහා ගෙවිය යුතු පොළියේ ශේෂය සහ ඉදිරියට ගෙවීමට ඇති පොලිය වසර තුනක කාලයකින් දීර්ඝ කර ප්‍රතිලේඛණගත කළ යුතුය. එලෙස ප්‍රතිලේඛණගත කරන ලද ණය මුදල් ණය ගැනුම්කරු විසින් පහත සඳහන් ඡේද (ඇ) සහ (ඈ) හි සඳහන් ආකාරයට ගෙවීමෙන් අනතුරුව මූල්‍ය ආයතනය මගින් කල් තබන ලද පොලී මුදල් ද අහෝසි කිරීමට කටයුතු කල යුතුය.

(ඇ) ඉහත ඡේද (අ) සහ (ආ) සඳහන් ආකාරයට ගෙවිය යුතු ප්‍රාග්ධන ශේෂය යලි සකසා වසර තුනක් තුල දී ආපසු ගෙවිය යුතුය.

(ඈ) ඉහත (අ) හා (ආ) හි සඳහන් කල පැහැර හැරි ණය වාරික වලට අදාළ ඉතිරි පොලිය හා ඉදිරියට ගෙවිය යුතු පොලිය අවිනිශ්චිත ගිණුමකට මාරු කල යුතු අතර එය අවුරුදු 3ක් තුල ආපසු ගෙවිය යුතුය.

(ඉ) 2020.09.30 දින දක්වා ණය ආපසු ගෙවීමට සහන කාලයක් ලබාදිය යුතුය.

(ඊ) ණය ආපසු ගෙවීමේ සහන කාලය තුල ණය ගැනුම්කරු විසින් අඛණ්ඩව මාස 6ක් පොලිය ගෙවා ඇති විටෙක, අවශ්‍ය නම්, බලපත්‍රලාභී බැංකු හට මෙම යෝජනා ක්‍රමය යටතේ අක්‍රිය ලෙස සලකා ඇති ණය, සක්‍රිය ණය හා අත්තිකාරම් ලෙස නැවත වර්ගීකරණය කල හැක. කෙසේ වෙතත්, අදාළ අක්‍රිය ණය පහසුකම ප්‍රතිලේඛණගත කිරීමට සැලකීමට පෙර හිඟ පැවැති වාරික ගණන මාස හයට අඩු නම්, එම හිඟ පැවැති වාරික ගණනේ පොලියට සමාන ප්‍රමාණයක් ණය ගැනුම්කරු විසින් ගෙවූ පසු පමණක් අදාළ ණය පහසුකම සක්‍රිය කාණ්ඩයට වර්ගීකරණය කල හැක.

(iii) ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම

(අ) මෙම චක්‍රලේඛය නිකුත් වන දිනය වන විට අක්‍රිය කාණ්ඩයේ පැවැති, සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන විසින් 1990 අංක 4 දරණ බැංකු විසින් ණය ආපසු අය කරගැනීමේ (විශේෂ ප්‍රතිපාදන) පනත, 1949 අංක 6 දරණ සංශෝධිත උකස් පනත හෝ 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත යටතේ අත්පත් කරගැනීමේ ක්‍රියාමාර්ග අරඹා හෝ ඒ පිළිබඳ නිවේදන නිකුත් කර ඇතිනම්, එම අත්පත් කරගැනීමේ ක්‍රියාමාර්ග, එකී ගනුදෙනුකරු විසින් අදාළ මූල්‍ය ආයතනය හා ණය ආපසු ගෙවීම පිළිබඳ එකඟතාවයකට පැමිණීමේ කොන්දේසිය මත අත්හිටුවනු ඇත.

(ආ) මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනත් ප්‍රකාරව වත්කම් අත්පත් කරගැනීම සඳහා නව යෝජනා සම්මත කරගැනීම කල් දැමිය යුතුය. එසේ අත්පත් කරගැනීම් සඳහා මේ වන විටත් යෝජනා සම්මත වී ඇති, මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන ණය ගනුදෙනුකරුවන්ගේ වත්කම් වෙන්දේසි කිරීම 2020.09.30 දක්වා අත්හිටුවිය යුතුය.

(ඇ) ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින ණය ගැනුම්කරුවන් හට මෙම යෝජනා ක්‍රමයේ සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් එකඟවන බවට දිවුරුම් ප්‍රකාශයක් අධිකරණයට ඉදිරිපත් කර ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීමට අවසර ඇත.

(ඈ) මෙම යෝජනා ක්‍රමය යටතේ පිළිගෙන ඇති අක්‍රිය කාණ්ඩයේ සිටින ණය ගැනුම් කරුවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සියළුම මූල්‍ය ආයතන විසින් අත්හිටුවිය යුතුය.

5. **නව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන කටයුතු සඳහා ලබා දෙන ණය**

(i) ණය ගැනුම්කරුවන් විසින් පිළිගත හැකි ව්‍යාපාර සැලැස්මක් ලබා දෙන්නේ නම්, පහත කොන්දේසි වලට යටත්ව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන කටයුතු සඳහා දේශීය මුදලින් අමතර ණයක් හෝ නව ණය පහසුකමක් ලබාදීමට මූල්‍යායතන හට හැකියාව ඇත.

(අ) සුදුසුකම් ලබන සක්‍රීය හා අක්‍රීය කාණ්ඩයේ ගනුදෙනුකරුවන් හට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එක් ගනුදෙනුකරුවෙකු හට එක් බැංකුවකින් රුපියල් මිලියන 25 ක් හෝ අනෙකුත් මූල්‍ය ආයතන සඳහා එක් ගනුදෙනුකරුවෙකුට එක් ආයතනයකින් රුපියල් මිලියන 10 හෝ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය යන දෙකෙන් වැඩි අගය නොඉක්මවන වටිනාකමක රුපියල් ණය මුදලක්, ඒවායේ කාරක ප්‍රාග්ධන චක්‍රයන්ගේ අවශ්‍යතාව සලකා බලා ලබා දිය හැක. මෙකී ණය මුදල් 4% කට සමාන වාර්ෂික පොලී අනුපාතිකයකින් වසර දෙකක් තුල ගෙවෙන ලෙස ලබාදිය යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා 4% දක්වාත් අනෙකුත් මූල්‍ය ආයතන සඳහා 7% දක්වාත් පොලී පිරිවැය ප්‍රතිදානය (rebate) කරනු ඇත.

(අා) ආයෝජන කටයුතු සඳහා ණය පහසුකම් ලබා දිය හැක්කේ බලපත්‍රලාභී බැංකු මගින් පමණක් වන අතර සක්‍රීය කාණ්ඩයේ ගනුදෙනුකරුවන් සඳහා පමණක් එක් ගනුදෙනුකරුවෙකුට එක් බැංකුවකින් තම ව්‍යාපාර කටයුතු පුළුල් කරගැනීම සඳහා රුපියල් මිලියන 300කට නොවැඩි වටිනාකමක රුපියල් ණය මුදලක් ලබා දිය හැක. එවැනි ණය පහසුකම් වසර පහක කාලයක් තුලදී ගෙවීයන සේ ලබාදිය යුතු අතර අයකල හැකි උපරිම පොලී අනුපාතය බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය (AWPLR) + 1.5% නොඉක්මවිය යුතුය.

(ii) මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන්ගේ අරමුදල් අවශ්‍යතාව මනාව ඇගයීමෙන් අනතුරුව ප්‍රදානය කරන ණය මුදලේ ප්‍රමාණය පිළිබඳව එකඟතාවයකට පැමිණිය යුතුය.

(iii) කාරක ප්‍රාග්ධන හා ආයෝජන ණය යන දෙවර්ගයේම ණය සඳහා 2020.03.25 සිට 2020.09.30 දක්වා කාල සීමාව තුල ආපසු ගෙවීම් සඳහා සහන කාලයක් හිමිවේ.

(iv) මූල්‍ය ආයතන විසින් මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ ලබා දෙනු ලබන කිසියම් හෝ අමතර ණය පහසුකම් වලට අදාළ අවදානම මගහරවා ගැනීම සඳහා සුදුසු ඇපකරයක් ලබාගත හැක.

6. බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රමය යටතේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම

බලපත්‍රලාභී බැංකු වෙත ලබා දී ඇති ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රමයන්ගේ 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා අය වීමට නියමිත ප්‍රාග්ධන ආපසු ගෙවීම් කල් දැමීමට රජය විසින් කැමැත්ත පලකර ඇති අතර එවැනි දිගුවන් අවශ්‍ය බැංකු හට ඒ සඳහා ඉල්ලීමක් කල යුතු අතර අදාළ රාජ්‍ය ආයතන සමඟ අතිරේක ගිවිසුම් වලට එළඹීමට ද අවශ්‍ය වේ.

7. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්

(i) මූල්‍ය ආයතන විසින් හුදෙක් අසතුටුදායක ණය වාර්තා මත පමණක් පදනම්ව ණය අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් පවත්වාගත යුතුය.

(ii) මූල්‍ය ආයතන විසින් ණය තොරතුරු කාර්යාංශයේ උපදෙස් ද ලබා ගනිමින්, මෙම යෝජනා ක්‍රමය යටතේ සක්‍රිය ණය ගැනුම්කරුවන් විසින් ප්‍රාග්ධන ගෙවීම් කල්දැමීම සම්බන්ධව වාර්තා කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස්කල යුතු අතර, එමඟින් මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධවන සක්‍රිය ණය ගැනුම්කරුවන්ට ඉදිරියේදී ඔවුන්ගේ ණය ශ්‍රේණියේ හෝ ණය තොරතුරු කාර්යාංශ වාර්තාවන්ට අහිතකර ලෙස බලපෑමක් සිදුවීම වැලැක්විය යුතුය.

8. මූල්‍ය ආයතන විසින් චෙක්පත් අගරු වීම්, ගෙවීම් නැවැත්වීම් සඳහා අයකිරීම්, සියළු ණය කාඩ්පත් හා අනෙකුත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම් 2020.09.30 දක්වා කාලසීමාව තුල අත්හිටුවිය යුතුය.

9. වාර්තාකරණ අවශ්‍යතාවන්

මූල්‍ය ආයතන විසින් සිය ණය ගැනුම්කරුවන් විසින් ලබා ගන්නා ලද ණය සහන කාලයන් පිළිබඳ තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට/බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2020.05.01 දින සිට සෑම මසකම 15 සහ 30 වැනි දින වන විට පැවැති තත්ත්වය වැඩකරන දින 5ක් තුල දී වාර්තාකල යුතුය.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම චක්‍රලේඛය සම්බන්ධව නිති අසන පැන සඳහා පිලිතුරු පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_2_of_2020_s.pdf
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_3_of_2020_e1.pdf
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_4_of_2020_e.pdf

2020 මාර්තු 27

සියළු ම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ප්‍රධාන විධායක නිළධාරීන් වෙත,
හිතවත් ප්‍රධාන විධායක නිළධාරීවරුනි,

කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට පත් පුද්ගලයන් හා ව්‍යාපාර වෙත සහය වීම සඳහා අවශ්‍ය නම්‍යශීලීත්වය බලපත්‍රලාභී බැංකු වෙත ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග

පවතින සුවිශේෂී තත්ත්වය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ ශක්තිමත් බව තක්සේරු කිරීමෙන් අනතුරුව, කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට පත් පුද්ගලයන් හා ව්‍යාපාර වෙත සහය වීම සඳහා බලපත්‍රලාභී බැංකු හට අවශ්‍ය නම්‍යශීලීතාවය සැපයීමට ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී බැංකු වෙත පහත සඳහන් සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දීමට තීරණය කරන ලදී.

මේ අනුව, කොවිඩ්-19 මගින් බලපෑමට පත් ව්‍යාපාර හා පුද්ගලයන්ට සහන සැලසීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත තවදුරටත් ඉඩකඩ සපයාදීමේ අරමුණින් පහත සඳහන් සුවිශේෂ ක්‍රියාමාර්ග කඩිනමින් හඳුන්වාදීමට මුදල් මණ්ඩලය තීරණය කර ඇත. මෙකී සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ගයන් පිළිබඳ වැඩිදුර තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත.

1. දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු (D-SIBs) සහ එසේ නොවන බැංකු සඳහා පදනම් අංක (bps) 250ක්ව පැවති ප්‍රාග්ධන සංරක්ෂක ස්ථාරක්ෂයන් ගෙන් පිළිවෙලින් පදනම් අංක 100 සහ 50 බැගින් පහත දැමීමට අවසර ලබා දීම.

2. අක්‍රිය ණය වර්ගීකරණයට සහ විදේශ ණය පියවාගැනීම සම්බන්ධයෙන් පහත අවසරයන් ලබා දීම

(අ) වෙනත් කිසිදු ණය සහනයන් නොලබන ගනුදෙනුකරුවන්ගේ 2020 මාර්තු අවසානය වන විට ආපසු ගෙවීමේ කාලය පසුකර ඇති (past due) ණය සහ අත්තිකාරම් පියවීම සඳහා දින 60ක අමතර කාලයක් ලබා දීමට සහ එම ණය සහ අත්තිකාරම් එකී අමතර දින 60ක සහන කාලය පසුවන තෙක් ආපසු ගෙවීමේ කාලය පසුකර ඇති ණය ලෙස නොසැලකීමට බලපත්‍රලාභී බැංකු හට අවසර දීම.

(ආ) කොවිඩ් 19 නිසා ගනුදෙනුකරුවන් විසින් මුහුණපා ඇති ගැටළු හේතුකොට ගෙන 2020.03.16 සිට 2020.06.30 දක්වා ණය ආපසු ගෙවීමේ කාල සීමා සහ ණය ගිවිසුම් සඳහා සිදුකරනු ලබන සියළු වෙනස්කම් ණය සහ අත්තිකාරම් වර්ගීකරණයේදී සහ ණය හානිකරණ ගණනයේ දී "ප්‍රතිව්‍යුහගත" වෙනුවට "සංශෝධන" ලෙස සැලකීමට බලපත්‍රලාභී බැංකු වෙත අවසර දීම.

(ඇ) යම් ගනුදෙනුකරුවෙකුගේ මුළු අක්‍රිය ණය පහසුකම් ප්‍රතිශතය, ඔහුවෙත ලබා දී ඇති මුළු ණය පහසුකම් ප්‍රමාණයෙන් 30% ඉක්මවන විට එම ගනුදෙනුකරු වෙත ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය ම අක්‍රිය ගණයේ ලා සැලකීමට ඇති නියාමන අවශ්‍යතාවය ඉවත් කිරීම.

(ඈ) මෙරට විදේශ විදේශ විනිමය සංචිතයන්ට අහිතකර ලෙස බලපාමින් ගනුදෙනුකරුවාට අයුතු වාසියක් ඇති නොවන ලෙස සහ විදේශ විනිමය අනුපාතයන් මත අනවශ්‍ය පීඩනයක් ඇති නොවන ලෙස, නිසි ලේඛනගත කිරීම් වලට යටත්ව, විදේශ මුදලින් ඇති ණය ශ්‍රී ලංකා රුපියල් ණයකට හරවා පියවා ගැනීමට අවසර දීම.

3. 2020 අවසානය වන විට සැපිරීමට නියමිතව තිබූ ඉහළ දමන ලද ප්‍රාග්ධන අවශ්‍යතා මේ වන විටත් සැපිරීමට අපොහොසත්ව ඇති බැංකු වලට ඒ සඳහා 2022 වසර අවසානය වන තෙක් කල් ලබා දීම. එවැනි බැංකු තම ප්‍රාග්ධන මට්ටම් ආරක්ෂා කරගැනීමට සහ වර්ධනය කර ගැනීම සඳහා, 2019 සහ 2020 වසර සඳහා බෙදිය හැකි ලාභයෙන් සියයට 25කට සිය ලාභාංශ බෙදීම් සීමා කිරීමට කටයුතු කල යුතුය.

4. බලපත්‍රලාභී බැංකු වල ව්‍යවස්ථාපිත පරීක්ෂණයන් හිදී හඳුනාගත් සැලකිලිමත් විය යුතු කරුණු නිවැරදි කිරීම සඳහා බැංකු වෙත ලබා දී ඇති කාල සීමාවන් ඒවායේ වැදගත්කම / බැරෑරුම් කම සලකා බලමින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර යලි සැකසීමට (reset) අවසර දීම. නියාමනයේදී හඳුනාගත් කරුණු/නිරීක්ෂණයන් සඳහා ගතයුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා වන කාල සීමාව 2020 මැයි 30 දක්වා වන බැංකු සඳහා තවත් අමතර මාස 3 ක කාලයක් ලබා දීම.

5. යලි දැනුම් දෙන තුරු, බලපත්‍රලාභී බැංකු විසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කාලීනව සිදු කල යුතු ව්‍යවස්ථාපිත වාර්ථාකරණයන් සඳහා නියමිත කාලසීමාව සති දෙකකින් දීර්ඝ කිරීම සහ කාර්තුමය මූල්‍ය වාර්ථා ප්‍රකාශනය සඳහා නියමිත කාල සීමාව මසකින් දීර්ඝ කිරීම. ඉදිරියේදී පවතින තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අවශ්‍ය නම් මෙම කාල සීමාවන් තවදුරටත් දීර්ඝ කිරීමට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් කටයුතු කරනු ඇත.

කෙසේ වෙතත්, බලපත්‍රලාභී බැංකු විසින් මෙකී නිදහස් කරන ලද ප්‍රාග්ධන සහ වෙනත් ප්‍රාග්ධන සම්බන්ධව ලබා දී ඇති නියාමන ලිහිල් කිරීම් ලාභාංශ බෙදීමට හෝ කළමණාකාරිත්වය සහ සේවකයන් සඳහා ප්‍රසාද දීමනා ලබා දීම සඳහා යොදා නොගත යුතුය. මේ අනුව, බලපත්‍රලාභී බැංකු වෙත ලබාදුන් මෙම නියාමන ලිහිල් කිරීම්, තම ගනුදෙනුකරුවන්ගේ සහ සමස්ථ ආර්ථිකයේ යහපත උදෙසා යොදාගන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සියළුම බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින අතර, එමගින් බැංකු ක්ෂේත්‍රයට වඩාත් ශක්තිමත් ලෙස මෙම අභියෝගයන්ට මුහුණ දීමට හැකියාව සැලසෙනු ඇත.

බලපත්‍රලාභී බැංකු හට මෙකී ආතතිමය කාලයන් හිදී, සිය අවදානම් ව්‍යුහයන් සහ සම්පත් පිළිබඳව විචක්ෂණශීලීව නිරීක්ෂණය කරන මෙන් දන්වා සිටින අතර, බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාවය සහ සවිමත්භාවය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී

බැංකු වල ද්‍රවශීලතා මට්ටම්, ප්‍රාග්ධන මට්ටම් සහ යම් ආතතිමය තත්ත්වයක් ඇති වන්නේද යන්නට ඇති අවදානම් පෙරසලකුණු ද සමීපව නිරීක්ෂණය කරනු ඇත.

මෙයට විශ්වාසී

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම ලිපියේ ඇමිණුම පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_instructions_extraordinary_regulatory_measures_by_cbsl_to_support_businesses_and_individuals_affected_by-COVID19.pdf

මුදල් නීති පනත් විධානය 2020 අංක 01 2020 අප්‍රේල් 27

බලපත්‍රලාභී බැංකු මගින් ලබා දෙන රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා උපරිම පොළී අනුපාත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1)(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් ඇතිවී තිබෙන අහිතකර ආර්ථික තත්ත්වය හේතුවෙන් කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා රන් භාණ්ඩ උකස් කරනු ලබන අඩු ආදායම්ලාභීන්ට සහන සැලසීමේ අවශ්‍යතාවය සලකා බලා මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) විසින් ලබා දෙන උකස් අත්තිකාරම් සඳහා උපරිම පොළී අනුපාත පිළිබඳ නියෝගය නිකුත් කරනු ලබයි.

1. මුදල් නීති පනත යටතේ බලගැන්වීම

1.1. බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් විවිධ වර්ගයේ ණය හා අනෙකුත් ණය මෙහෙයුම් සඳහා අය කරන උපරිම පොළී අනුපාතයන් තීරණය කිරීමට මුදල් නීති පනතේ 104 (1) (ආ) වගන්තිය අනුව මුදල් මණ්ඩලයට හැකියාව ඇත.

2. මෙම විධානයේ අදාළත්වය

2.1. මෙම නියෝගය බලපත්‍රලාභී බැංකුවක් විසින් හෝ එම බැංකුවේ ඕනෑම ශාඛාවක් හෝ නියෝජිත ආයතනයක් විසින් සිදු කරන උකස් තැරැව්කාර ව්‍යාපාරයට (මෙතැන් සිට උකස් කිරීම ලෙස හැඳින්වේ) අදාළ වේ.

3. උකස් අත්තිකාරම් සඳහා උපරිම පොළී අනුපාත

3.1. ස්වර්ණාභරණ සුරැකුම් ලෙස තබා ගනිමින් උකස් අත්තිකාරම් පහසුකම් ලබාදීමේදී බලපත්‍රලාභී බැංකු විසින් අය කළ හැකි පොළී අනුපාතය වසරකට 12% හෝ වසරකට අඩු කාලයක් සඳහා ලබා දෙන උකස් අත්තිකාරම් සඳහා මසකට 1% ක් වේ.

3.2. ඉහත පොළී අනුපාත, මෙම නියෝගය ක්‍රියාත්මක වන දින සිට, අළුතින් ලබා දෙන උකස් අත්තිකාරම්වලට සහ දැනට පවතින උකස් අත්තිකාරම් නැවත අළුත් කිරීමේ දී අදාළ වේ

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2020 අංක 06 2020 අප්‍රේල් 28

2020 චක්‍රලේඛ අංක 04 සහ 05 සඳහා සංශෝධන

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් 2020 මාර්තු 24 දිනැති කොවිඩ්-19 මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා සහන සැලසීමට නිකුත් කළ 2020 චක්‍රලේඛ අංක 04 සහ 2020 මාර්තු 27 දිනැති කොවිඩ්-19 මගින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50 ක සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දුන් 2020 චක්‍රලේඛ අංක 05 සඳහා පහත සංශෝධන ඉදිරිපත් කෙරේ.

2020 චක්‍රලේඛ අංක 04 හි 5 වන ඡේදය සඳහා වූ සංශෝධන:

5 බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් 500,000 ට අඩු වටිනාකමින් යුත් චෙක්පත් වල වලංගු කාලය 2020.05.15 දක්වා දීර්ඝ කළ යුතුය.

2020 චක්‍රලේඛ අංක 05 හි 2(iv) ඡේදය සඳහා වූ සංශෝධන.

2. මෙම යෝජනා ක්‍රමය යටතේ සහන අපේක්ෂා කරන සුදුසුකම් ලත් ගැනුම්කරුවන් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි කාල සීමාව 2020.05.15 දක්වා දීර්ඝ කෙරේ. මෙම ඡේදයේ අඩංගු අනෙකුත් වගන්ති නොවෙනස්ව පවතී.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම චක්‍රලේඛය සම්බන්ධව නිති අසන පැන සඳහා පිලිතුරු පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_2_of_2020_s.pdf

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_3_of_2020_e1.pdf

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_4_of_2020_e.pdf

2020 මැයි 5

සියළු ම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ප්‍රධාන විධායක නිළධාරීන් වෙත,
හිතවත් ප්‍රධාන විධායක නිළධාරීවරුනි,

කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ බැංකු වෙත ද්‍රවශීලතාව ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවට නංවනු ලබන සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග

කොවිඩ්-19 මගින් බලපෑමට පත් ව්‍යාපාර සඳහා සහන සැලසීම වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද ණය සහන යෝජනා ක්‍රමය සහ බැංකුවල අනෙකුත් හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා හේතුවෙන් බලපත්‍රලාභී බැංකු වල ද්‍රවශීලතාවයට සහ අනෙකුත් ප්‍රධාන කාර්ය සාධක දර්ශකයන් හට සිදුවිය හැකි අහිතකර බලපෑම සලකමින්, බැංකු වල ද්‍රවශීලතා මට්ටම් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන ඇත. සියළුම මූල්‍ය ආයතන විසින් ආර්ථික කටයුතු යලි පණගැන්වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රවාහ, බාධාවකින් තොරව, විවක්ෂණශීලී ආකාරයකින් සැපයීමට කටයුතු කරනු ඇතැයි මුදල් මණ්ඩලය අපේක්ෂා කරන අතර, ඕන් මූල්‍ය ක්ෂේත්‍රය ඇතුළු සමස්ථ ආර්ථිකයම ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂිතය. මේ සඳහා, අවශ්‍ය ආධාරක සහිත පසුබිමක් සලසා දීම තුලින් බැංකු කළමණාකරීත්ව හට සිය තීරණ ගැනීම් පහසු කරනු ඇත.

මේ අනුව, මුදල් මණ්ඩලය විසින් මෙම සුවිශේෂී කාලයේදී බැංකුවල හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සහ අඛණ්ඩ ණය පහසුකම් සැලසීම තහවුරු කිරීම සඳහා බැංකු පනත සහ මුදල් නීති පනත ප්‍රකාරව, බැංකු වල ද්‍රවශීලතා මට්ටම් ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට තීරණය කර ඇත.

(i) ආර්ථිකය තුල ඉල්ලුම වැඩි කිරීම සඳහා බැංකු ක්ෂේත්‍රය විසින් සහනදායී පොළී අනුපාත යටතේ කාරක ප්‍රාග්ධන ණය සහ අනෙකුත් ණය පහසුකම් ලබාදීම තහවුරු කරනු පිණිස ප්‍රතිමූල්‍ය පහසුකම් සහ අනෙකුත් ණය පහසුකම් ඔස්සේ අමතර අරමුදල් සැපයීම.

(ii) 2021 ජූනි 30 දක්වා කාලයක් සඳහා බලපත්‍රලාභී බැංකු වල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාත ගණනය කිරීම සඳහා ආන්තික තැබීම් සහ අනෙකුත් කොන්දේසි වලට යටත්ව, ඇතැම් වත්කම් ද්‍රවශීල සේ සැලකීමට අවසර දීම. මෙහිදී අදාල වත්කම් කවරේද යන්න පිළිබඳව බලපත්‍රලාභී බැංකු නුදුරේදී දැනුවත් කරනු ඇත.

(iii) පවත්නා සුවිශේෂී තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, වැඩිදියුණු කරන ලද සුපරීක්ෂණය සහ නිරන්තර වාර්තාකරණයට යටත්ව, බලපත්‍රලාභී බැංකු වල ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය සඳහා වන අවම අගය 2020 ජූනි 30 දක්වා 90% දක්වා අඩු කිරීම.

(iv) බැංකු ක්ෂේත්‍රයට ද්‍රවශීලතා සැපයීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් අරමුදල් වෙන් කිරීම.

(v) මුදල් නීති පනත මගින් බැංකු වෙත ශ්‍රී ලංකා රුපියල් මගින් හදිසි ණය අත්තිකාරම් ලබාදීමට ඇති ප්‍රතිපාදන යටතේ බැංකු වෙත ද්‍රවශීලතා පිරිනැමීම. මෙම අරමුදල්, පිලිගත හැකි ඇප සුරැකුම් සහ ද්‍රවශීලතා පුරෝකතන මත පදනම්ව, බලපත්‍රලාභී බැංකු වෙත හදිසි ණය හා අත්තිකාරම් සැපයීමේ අනුමත රාමුව යටතේ ලබා දෙනු ඇත.

තම තමන්ගේ බැංකු වල ද්‍රවශීලතා මට්ටම් සමීපව නිරීක්ෂණය කිරීමට සහ ඉහත ක්‍රියා මාර්ග මගින් ලබා දෙනු ලබන ද්‍රවශීල අරමුදල් විවක්ෂණශීලීව අදාල කටයුතු වන, ආර්ථිකය වෙත අරමුදල් ප්‍රවාහ ශක්තිමත් කිරීම සහ ද්‍රවශීලතා කළමනාකරණය සඳහා පමණක් යොදාගන්නා ලෙසත් එකී අරමුදල්, අභිමතානුසාරී ගෙවීම් වන ලාභාංශ ගෙවීම්, ප්‍රසාද දීමනා, තම කොටස් යලි මිලදී ගැනීම් සහ අනෙකුත් අත්‍යාවශ්‍ය නොවන මෙහෙයුම් වියදම් සඳහා යොදාගැනීමෙන් වලකින ලෙසත් බලපත්‍රලාභී බැංකු වෙත මෙයින් තරයේ දන්වා සිටී.

මෙයට විශ්වාසී
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 02 2020 මැයි 5

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ද්‍රවශීල වත්කම්

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හඳුන්වනු ලැබේ). ද්‍රවශීලතා තත්ත්වයට ඇතිවිය හැකි අහිතකර බලපෑම සැලකිල්ලට ගනිමින් 1988 අංක 30 දරන බැංකු පනතේ සංශෝධිත 21 (1), 86, 46(1) සහ 76 (ඒ) (1) වගන්ති යටතේ පවරා දී ඇති බලතල ප්‍රකාරව මෙම අසාමාන්‍ය තත්ත්වය තුළ, 2020 ජූනි 30 වන දින දක්වා පහත සඳහන් වත්කම් ද්‍රවශීලතා වත්කම් ලෙස සැළකීමට මුදල් මණ්ඩලය තීරණය කර ඇත.

1. බැංකු පනත යටතේ වන බල ගැන්වීම්

1.1. බැංකු විසින් කරන්නා වූ ව්‍යාපාරයේ ස්වභාවය මත, බැංකු පනතේ 21(1) වගන්තියට අනුව සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම මුදල් මණ්ඩලය විසින් වරින් වර තීරණය කරන්නා වූ අගයක් ද්‍රවශීලතා වත්කම් ලෙස පවත්වා ගත යුතු අතර, එලෙස මුදල් මණ්ඩලය තීරණය කරන්නාවූ ප්‍රතිශතයන් සියයට 20 ට වඩා නොඅඩු විය යුතු අතර, සියයට 40 ට වඩා නොවැඩි විය යුතුය.

1.2. ද්‍රවශීලතා වත්කම් යටතේ 86 අයිතම (ඌ) වගන්තිය අනුව වෙනත් වත්කම්, ද්‍රවශීලතා වත්කම් ලෙස තීරණය කිරීමට මුදල් මණ්ඩලයට බලතල ඇත.

1.3. බැංකු පද්ධතියේ ශක්තිමත් බව තහවුරු කිරීමට බැංකුවක හෝ බැංකු වල ව්‍යාපාරයේ ඕනෑම අංශයක් පැවතිය යුතු ආකාරය පිළිබඳ සියලුම හෝ ඕනෑම බලපත්‍රලාභී බැංකුවකට නියෝග නිකුත් කිරීමට බැංකු පනතේ 46(1) සහ 76 (ඒ) (1) වගන්ති යටතේ මුදල් මණ්ඩලයට බලය ඇත.

2. ද්‍රවශීල වත්කම්

2.1 ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය ගණනය කිරීමේදී පහත සඳහන් වත්කම් ද්‍රවශීලතා වත්කම් ලෙස 2021 ජූනි 30 දක්වා සළකා බැලිය හැක.

(i) ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ තැන්පතු ක්‍රමය වෙනුවෙන් ලැබිය යුතු පොළී සහනාධාර

(ii) SLFRS 9 යටතේ අදියර 1 හි වර්ගීකරණය කර ඇති සහ ශ්‍රී ලංකා රජය විසින් ඇප වනු ලබන රජයට අයත් ආයතනයන්හි නිරාවරණයන්: වසරක් නොඉක්මවන කල් පිරීම් සහිත මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වන මූල්‍ය උපකරණ (සියයට 10 ක ආන්තිකයක් සහිතව)

(iii) බලපත්‍රලාභී බැංකු විසින් වෙනත් බලපත්‍රලාභී බැංකු වල තබා ඇති ස්ථාවර තැන්පතු

අ) කල්පිරීමේ ඉතිරි කාලය වසර 1 ක් ඉක්මවන නමුත් වසර 2 ට අඩු තැන්පතු සියයට 20 ක ආන්තිකයක් සහිතව

ආ) කල්පිරීමේ ඉතිරි කාලය වසර 2 ක් ඉක්මවන නමුත් වසර 3 ට අඩු හෝ සමාන වන තැන්පතු සඳහා සියයට 30 ක ආන්තිකයක් සහිතව

(iv) තැන්පතු ඇපයට තබා ණය ලබාගෙන ඇති විට තැන්පතු වලින් සියයට 20 ට සමාන අගයක්

(v) ණය පියවීමට සේවක අර්ථසාධක අරමුදලින් ලැබිය යුතු දෑ

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 03 2020 මැයි 13

බලපත්‍රලාභී බැංකු වල අභිමතානුසාරී ගෙවීම් පිළිබඳ සීමා කිරීම්

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සහ බලපත්‍රලාභී බැංකු වල සුදුසු ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගනිමින් මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීමේ වැදගත්කම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හඳුන්වනු ලැබේ) ද්‍රවශීලතාවය සහ අනෙකුත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය බලපත්‍රලාභී බැංකු වල අභිමතානුසාරී ගෙවීම් සීමා කිරීම පිළිබඳ මෙම විධාන නිකුත් කරයි.

1. බැංකු පනත යටතේ වන බල ගැන්වීම්

1.1. 1988 අංක 30 දරන බැංකු පනතේ සංශෝධිත 46(1) සහ 76(ඒ) (1) වගන්ති වලට අනුව බැංකු පද්ධතියේ ශක්තිමත් බව තහවුරු කිරීම සඳහා බැංකුවක් හෝ බැංකු වල ව්‍යාපාරයේ ඕනෑම අංශයක් පැවතිය යුතු ආකාරය පිළිබඳ නියෝග සියලු හෝ ඕනෑම බලපත්‍රලාභී බැංකුවකට නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

2. විෂය පථය

2.1. මෙම නියෝග

(i) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද හෝ ස්ථාපිත කරන ලද සහ

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද හෝ ස්ථාපිත කරන ලද බලපත්‍රලාභී බැංකු වලට අදාළ වේ.

2.2. මෙම විධාන වහාම ක්‍රියාත්මක වන අතර, 2020 දෙසැම්බර් 31 දක්වා අදාළ වේ.

3. අභිමතානුසාරී ගෙවීම් සඳහා සීමා කිරීම්

3.1. ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති හෝ ස්ථාපිත කර ඇති බලපත්‍රලාභී බැංකු, 2019 මූල්‍ය වර්ෂය සඳහා දැනටමත් ප්‍රකාශයට පත් කර නොමැති මුදල් ලාභාංශ ප්‍රකාශ කිරීමෙන් සහ 2020 මූල්‍ය වර්ෂය සඳහා වන ඕනෑම අතුරු ලාභාංශයක් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය යුතුය.

3.2. ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 2019 සහ 2020 මූල්‍ය වර්ෂ සඳහා දැනටමත් ප්‍රකාශයට පත්කර නොමැති ලාභ පෙරලා සිය මව් රට වෙත යැවීමෙන් වැළකිය යුතුය.

3.3 බලපත්‍රලාභී බැංකු තමන්ගේම කොටස් ආපසු මිලට ගැනීමෙන් වැළකී සිටිය යුතුය.

3.4. බලපත්‍රලාභී බැංකු කළමනාකරණ දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවීම් වැඩි කිරීමෙන් වැළකී සිටිය යුතුය.

3.5. බලපත්‍රලාභී බැංකු විචක්ෂණශීලි විය යුතු අතර වෙළඳ දැන්වීම්, ව්‍යාපාර ප්‍රවර්ධන, අනුග්‍රාහක, ගමනාගමන සහ පුහුණුවීම් වැනි අත්‍යාවශ්‍ය නොවන වියදම් වලින් හැකි පමණ වැළකී සිටිය යුතුය.

3.6 ප්‍රාග්ධන වියදම් තිබේනම් බලපත්‍රලාභී බැංකු නිසි සැළකිල්ලෙන් සහ විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 04 2020 මැයි 15

මෝටර් රථ වාහන සම්බන්ධ ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය අනුපාතය

1988 සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)1 වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී .

මෝටර් රථ වාහන මිලදී ගැනීම හෝ භාවිතය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු, මෙතැන් පටන් බලපත්‍රලාභී බැංකු ලෙස හඳුන්වන අතර ,එමගින් ලබාදෙන ණය පහසුකම් සම්බන්ධයෙන් වටිනාකම මත ණය අනුපාත ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව විසින් පහත විධානයන් නිකුත් කරන ලදී.

1. පහත විධානය මඟින් 2019 අංක 04 දරන බැංකු පනතේ විධානයේ මෝටර් රථ වාහන සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම් මත ණය අනුපාත තීරණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1(i) විධානය ආදේශනය කරනු ලැබේ.

   (i) මෝටර් වාහන මිලදී ගැනීම හෝ භාවිතය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ලබා දී ඇති ණය පහසුකම්, නැවත දැනුම් දෙන තුරු එම වාහන වල වෙළඳපොල වටිනාකමෙන් පහත සඳහන් ප්‍රතිශත නොඉක්මවිය යුතුය.

   (ii) ලියාපදංචි නොකළ සහ පළමු ලියාපදංචියෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ වසරකට අඩු කාලයක් භාවිතා කළ වාහන සම්බන්ධයෙන්:

වගුව 01 : වටිනාකම මත ණය අනුපාත

වාහන කාණ්ඩය	මොටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වාහන පන්ති	විදුලි වාහන	අනෙකුත්
ව්‍යාපාරික වාහන	C1, C, CE, DI, D, DE, GI, G, J	90%	90%
මොටර් කාර් ,ක්‍රීඩා උපයෝගීතා වාහන සහ වෑන් රථ	B (සැහැල්ලු ට්‍රක් රථ සහ තනි කැබ් රථ හැර)	90%	50%
දේශීයව එකතුකරන ලද මොටර් කාර් ,ක්‍රීඩා උපයෝගීතා වාහන සහ වෑන් රථ	B (සැහැල්ලු ට්‍රක් රථ සහ තනි කැබ් රථ හැර)	90%	70%
ත්‍රිරෝද රථ	B1	90%	25%
සැහැල්ලු ට්‍රක් රථ	B	90%	90%
අනෙකුත් වාහන	A1, A සහ B කාණ්ඩය යටතේ වර්ගීකරණය කළ එකල කැබ් රථ	90%	70%
දෙමුහුන් මොටර් කාර් ,වෑන් රථ සහ ක්‍රීඩා උපයෝගීතා වාහන	B (සැහැල්ලු ට්‍රක් රථ සහ තනි කැබ් රථ හැර)	50%	

(ආ) ප්‍රථම ලියාපදිංචියෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුල වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කරන ලද සියලුම වාහන සඳහා 70%.

2. සහන කොන්දේසි මත බලපත්‍ර යටතේ මෝටර් රථ ආනයනය කිරීම හෝ මිලදී ගැනීම සඳහා ලබාදී ඇති ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය අනුපාතික ගණනය කරනු ලබන්නේ මෝටර් රථයේ වෙළඳපොල වටිනාකම වෙනුවට නාම මාත්‍ර ඉන්වොයිසි වටිනාකම මත පදනම්ව වේ.

3. මෝටර් රථ වාහන ආනයනය සීමා කිරීමේ පියවර පිළිබඳ 2019.05.31 දින නිකුත් කරන ලද 2019 අංක 04 දරණ බැංකු පනත් විධානය මෙම විධානය නිකුත් කළ දින සිට අවලංගු කෙරේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 05 2020 ජුනි 19

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී

කොවිඩ් 19 ව්‍යාප්තියේ බලපෑම හේතුවෙන් විනිමය අනුපාතයට සහ මූල්‍ය වෙලඳපොලවලට ඇති පීඩනය ලිහිල් කිරීමේ අරමුණින්, බැංකුව වෙත ලැබෙන නව විදේශ මුදල් ගලා ඒම් භාවිතා කරමින් හැර මාස තුනක කාලයක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර මිලදී ගැනීම අත්හිටුවිය යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනුම් දෙනු ලබයි.

මෙම විධානයන් වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත්වේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 06 2020 ජුලි 16

කොවිඩ්-19 හමුවේ ගනු ලබන සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොවිඩ්-19 නිසා අහිතකර ලෙස බලපා ඇති ව්‍යාපාරික අංශ පුනර්ජීවනය කිරීමේ වැදගත්කම සහ කොවිඩ්-19 වසංගතයෙන් ආර්ථිකයට සිදුවූ බලපෑමේ සුවිශේෂී තත්වයන් සැලකිල්ලට ගනිමින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද පහසුකමේ 3 වන අදියර යටතේ ණය ඇපකර සහ පොලී සහනාධාර ක්‍රමයක් සහ ඉදිකිරීම් අංශයේ සිටින කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු හිඟ මුදල් පියවීම සඳහා රජය විසින් නිකුත් කරන ලද කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු බිල්පත් ගෙවීම් භාරගැනීමේ ලිපියට එරෙහිව ද්‍රවශීලතා පහසුකමක්ද ලබා දෙන ලදි.

මේ සම්බන්ධයෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 21(1), 86, 46(1) සහ 76 ඒ (1) යන වගන්ති මගින් සංශෝධනය කරන ලද බලතල අනුව මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් සුවිශේෂ වූ නියාමන පියවරයන් අනුමත කරන ලදි.

(1) බැංකු පනත යටතේ බලගැන්වීම්

1.1. බැංකු පනතේ 21(1) වගන්තිය ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් වරින් වර තීරණය කරනු ලබන ආකාරයට සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම එම බැංකු විසින් සපයනු ලබන සේවාවේ ස්වභාවය අනුව ද්‍රවශීල වත්කම් පවත්වා ගත යුතු අතර, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන එම ප්‍රතිශතය සියයට 20 නොඅඩු සහ සියයට 40 ට නොවැඩි විය යුතුය.

1.2. 86(ඉ) ද්‍රවශීල වත්කම් වගන්තිය යටතේ වෙනත් වත්කම් "ද්‍රවශීල වත්කම්" ලෙස තීරණය කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

1.3. බැංකු පනතේ 46 (1) සහ 76 ඒ (1) වගන්ති ප්‍රකාරව, බැංකු පද්ධතියේ ශක්තිමත් බව තහවුරු කිරීම සඳහා සියළුම හෝ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වලට (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හඳුන්වනු ලැබේ) එම බැංකුවේ හෝ බැංකු වල බැංකු ව්‍යාපාරයේ ඕනෑම අංශයක් පවත්වා ගත යුතු ආකාරය පිළිබඳ උපදෙස් නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

(2) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ගණනය කිරීම සඳහා සැලකෙන ද්‍රවශීල වත්කම්

2.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 35/03/023/0001/002 යන මෙහෙයුම් උපදෙස් හා පසු සංශෝධන වලට අනුව රජය විසින් නිකුත් කරන ලද කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු බිල්පත් ගෙවීමේ භාරගැනීමේ ලිපියට එරෙහිව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිකිරීම් අංශයට ලබා දී ඇති නව ණය පහසුකම් 2020 දෙසැම්බර් 31 වන දින දක්වා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ගණනය කිරීමේදී 10% ආන්තිකයක් සහිතව ද්‍රවශීල වත්කම් ලෙස සැලකිය හැකිය.

(3) ණය සහ අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම හා ප්‍රතිපාදන වෙන් කිරීම

3.1. ණය හා අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනා ගැනීම සහ ප්‍රතිපාදන වෙන්කිරීම පිළිබඳ 2008 අංක 03 දරන බැංකු පනතේ විධානයට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය විසින් නව ආර්ථික කටයුතු ලෙස සලකා ඉදිකිරීමේ අංශයට නිකුත් කරන ලද "කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු බිල්පත් ගෙවීම භාරගැනීමේ ලිපියට" එරෙහිව ලබා දුන් ණය පහසුකම් වල වර්තමාන වර්ගීකරණය නොසලකා සක්‍රීය ණය ලෙස පවත්වා ගත යුතු වේ.

3.2. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ණය ගැනුම්කරුවන්ගේ අවදානමක් තිබේ නම් හෝ පසුකාලීන පැහැර හැරීමක් ඇත්නම් ණය හා අත්තිකාරම් වර්ගීකරණයට අදාළ අනෙකුත් සියළුම අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහතික කළ යුතු වේ.

(4) ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ගණනය කිරීම

4.1 බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනතේ III (සී) කොටස අනුව, පහත සඳහන් දෑ වලට එරෙහිව ලබා දී ඇති ණය පහසුකම් අවධානම් අවම කරගත හැකි ලෙස සුදුසුකම් ලබන අතර අවධානම මත බර තැබීම සියයට 0 වේ.

(i) රජය විසින් නිකුත් කරන ලද "කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවිය යුතු බිල්පත් ගෙවීම් භාරගැනීමේ ලිපිය"

(ii) සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද පහසුකමෙහි 3 වන අදියර යටතේ ලබා දී ඇති ණය ඇපකර.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2020 අංක 7 2020 ජූලි 16

කොවිඩ්-19 මගින් බලපෑමට පත් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන සැලසීම

කොවිඩ්-19 ව්‍යසනයේ ව්‍යාප්තිය නිසා සංචාරක ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන් හා ව්‍යාපාර වෙත ඇතිවිය හැකි අහිතකර බලපෑම සැලකිල්ලට ගනිමින්, සුදුසු කම් ලබන ණය ගනුදෙනුකරුවන් වෙත පහත සඳහන් සහන සලසන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් (මින් ඉදිරියට මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙත දන්වා සිටී.

1. සංචාරක ක්ෂේත්‍රයේ නිරතු රථ වාහන සඳහා ලබා දී ඇති කල්බදු පහසුකම් වල දැනට ගෙවීමට ඇති මුල් ණය මුදල (capital outstanding) සඳහා මූල්‍ය ආයතන විසින්, 2020 මාර්තු 27 වන දින නිකුත් කරන ලද, 2020 අංක 05 දරන චක්‍රලේඛයේ ඡේද 2 සහ 3 යටතේ ප්‍රදානය කර ඇති, මාස 6ක ණය සහන කාල සීමාව, මාස 12 ක් දක්වා දීර්ඝ කිරීමට කටයුතු කල යුතුය.

2. මූල්‍ය ආයතන විසින් ඉහත ඡේද (1) මගින් දක්වා ඇති, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය සහන කාල සීමාවට අදාල පොලී, එකී ගනුදෙනුකරුවන් අපහසුතාවයකට ලක් නොවන ආකාරයකින් අයකරගත හැක.

3. සංචාරක ක්ෂේත්‍රයේ නියුතු රථ වාහන සඳහා ලබා දී ඇති කල්බදු පහසුකම් සම්බන්ධයෙන් එකතු වී ඇති දඩ පොලී කපා හැරීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කල යුතුය.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 07 2020 ජූලි 16

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ඇති ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා ඇති බැංකු පනත් විධාන 2016 අංක 01 සඳහා සංශෝධනය

1988 අංක 30 දරන බැංකු පනතේ 19(7)(අ) සහ 76(ඒ)(7) වගන්ති මගින් පවරා ඇති බලතල අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා (මින් මතු බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ). අවම ප්‍රාග්ධන අනුපාතය තීරණය කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

ඒ අනුව, බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනතේ නියමයන්හි III (අ) කොටසෙහි සඳහන් වෙබ් අඩවි පදනම් කරගත් විතැන් සුපරීක්ෂණ පද්ධතියෙහි වාර්තා කේත 20.3.1.8.1.0 පහත පරිදි සංශෝධනය කෙරේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියනය නොඉක්මවිය යුතුය.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් විධානය 2020 අංක 02 2020 අගෝස්තු 21

බලපත්‍රලාභී බැංකු විසින් පිරිනමනු ලබන ණය පහසුකම් සඳහා උපරිම පොළි අනුපාතය

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1)(අා) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල අරමුදල් පිරිවැය අඩු කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති පොලී අනුපාත, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ බැංකු අනුපාත අඩු කිරීම හා විශේෂ නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දීම වැනි විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑතකාලයේදී ක්‍රියාත්මක කරන ලදි. මෙම ක්‍රියාමාර්ග තුළින් කොවිඩ් 19 අර්බුදය

හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහන සැලසීමට බලපත්‍රලාභී බැංකු ආයතන වලට පහසුකම් සපයා දෙනු ලබයි. මේ අනුව මෑත සතිවල සමස්ථ වෙළඳපොල පොළී අනුපාතය පහළ ගොස් ඇති අතර, සමස්ථ වෙළඳපොළ ණය අනුපාතයද තවදුරටත් පහළ හැකි බවට මුදල් මණ්ඩලය අපේක්ෂා කරන අතර පාලනය කල උද්ධමන තත්ත්වයන් යටතේ නිෂ්පාදන ආර්ථික ක්‍රියාමාර්ග සඳහා ණය ලබා දීම ධෛර්යමත් කරන අතරම කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සඳහා සපයන පහසුකම් ශක්තිමත් කරනු ලබයි. ආන්තික ණයකරුවන්ට සහන සැලසීමේ අරමුණින් අධික බවට සැලකෙන විශේෂිත පොළි අනුපාත අඩු කිරීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ග ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කර ඇත.

ඒ අනුව, මුදල් මණ්ඩලය විසින් අරමුදල් ව්‍යුහයන් වල විවිධත්වය සැලකිල්ලට ගෙන බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ලබා දෙන ශ්‍රී ලංකා රුපියල් ණය හා අත්තිකාරම් සඳහා අදාළ වන උපරිම පොළී අනුපාතය සඳහා වන නියෝගයක් මෙමගින් පනවනු ලැබේ.

1. මුදල් නීති පනත යටතේ බලගැන්වීම

1.1 බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් විවිධ වර්ගයේ ණය හා අනෙකුත් ණය මෙහෙයුම් සඳහා අය කරන උපරිම පොළි අනුපාතයන් තීරණය කිරීමට මුදල් නීති පනතේ 104 (1) (ආ) වගන්තිය අනුව මුදල් මණ්ඩලයට හැකියාව ඇත.

2. රුපියල් හා ණය අත්තිකාරම් සඳහා පොළි අනුපාතය

2.1 සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්ම පහත සඳහන් ණය පහසුකම් වෙනුවෙන් වූ ණය පොළි අනුපාතයන් අවම වශයෙන් පහත මට්ටම් දක්වා අඩු කළ යුතුය.

(i) ණය කාඩ්පත් මගින් ලබා ගන්නා අත්තිකාරම්, සඳහා වන වාර්ෂික පොළී අනුපාතය සියයට 18 දක්වා ඊළඟ බිල්පත් වටයේ සිට ක්‍රියාත්මක වන පරිදි

(ii) පෙර ගිවිස ගත් තාවකාලික අයිරා සඳහා වන වාර්ෂික පොළී අනුපාතය සියයට 16

(iii) උකස් සඳහා භාර ගන්නා ලද පුද්ගලයාගේ භාණ්ඩ සඳහා වූ උකස් අත්තිකාරම් සඳහා වන වාර්ෂික පොළී අනුපාතය සියයට 10 මෙය සියළුම උකස් අත්තිකාරම් සහ පවතින උකස් පහසුකම් නැත අලුත් කිරීමේදී වලංගු වේ.

2.2. සියළුම අනෙකුත් ණය පහසුකම් අළුත් කිරීමේ දී හෝ එම පහසුකම නැවත මිල කිරීමේදී ඒ සඳහා අය කරනු ලබන පොළී අනුපාතය වන වෙළඳපොළ පොළී අනුපාතය අඛණ්ඩව පහත වැටීමක් පිළිඹිබු කරන අතර සෑම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සහතික කළ යුතුය.

2.3. සෑම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශ්ෂිත බැංකු විසින් මේ වනවිට ලබා දී ඇති ණය පහසුකම්ද ඇතුළුව සියලුම ණය හා අත්තිකාරම් සඳහා අය කරනු ලබන පොළි අනුපාතය අනුමත සීමාව ඉක්මවන හෝ හිඟවන වටිනාකම සඳහා වාර්ෂිකව පදනම් අංක 200 නොඉක්මවන මට්ටමකට අඩු කළ යුතුය.

2.4. අපනයනකරුවන්ට ලබා දුන් ණය පහසුකම් ආපසු අය කර ගැනීම යටතේ 2020 මාර්තු 04, 2005 මැයි 28 සහ 2001 පෙබරවාරි 16 දිනැති චක්‍ර ලේඛයන්ට අනුව ගනුදෙනුකරුවා විසින් නියමිත කාලය තුලදී ණය නොපියවා ඇත්නම් ඒවා ආපසු අය කර ගැනීමේදී අයකරන වැඩි කරන ලද ණය පොළි අනුපාත වාර්ෂිකව පදනම් අංක 200 දක්වා නැවත දැනුම් දෙන තුරු අඩු කළ යුතුය.

2.5. පහත සඳහන් චක්‍රලේඛ යටතේ පොළී අනුපාත හා දඩ පොළී අනුපාත අය කිරීම මෙම නියෝගය යටතේ ලබා දෙන සහන වලට වඩා වාසිදායක නම් සෑම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු පහත චක්‍රලේඛ යටතේ ලබාදී ඇති සහන අඛණ්ඩව ලබා දිය යුතුය.

(i) 2019 මැයි 08 දිනැති 2019 අංක 07 දරන සංචාරක කර්මාන්තය සඳහා ලබා දෙන සහන.

(ii) 2020 ජනවාරි 30 දිනැති 2020 අංක 02 දරන ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබා දීම.

(iii) 2020 මාර්තු 24 දිනැති 2020 අංක 04 දරන කොවිඩ් 19 මගින් බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීමට ගනු ලබන ක්‍රියාමාර්ග.

(iv) 2020 මාර්තු 27 දිනැති 2020 අංක 05 දරන කොවිඩ් 19 මගින් බලපෑමට පත් පුද්ගලයින්, ස්වයං රැකියාව ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රු. බිලියන 50 ක සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දීම.

(v) 2020 ජූලි 16 දිනැති 2020 අංක 07 දරන කොවිඩ් 19 මගින් බලපෑමට පත් ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීමට ගත් ක්‍රියාමාර්ග.

3. නියාමනය

3.1. මෙම නියෝගය සඳහා අදාළ වන එක් එක් වර්ගයේ ණය පහසුකම් සඳහා වන පොළී අනුපාත අඩු කිරීමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද පොළී අනුපාත දත්ත වල නිර්වද්‍යතාවය සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සහතික කළ යුතු අතර විද්‍යුත් ක්‍රමයට හෝ භෞතිකව අභ්‍යන්තර ලේඛනගත වාර්තා පවත්වා ගත යුතුය.

4. ක්‍රියාත්මක කිරීම

4.1. මෙම නියෝගය 2020 අගෝස්තු 24 සිට ක්‍රියාත්මක වේ.

5. මුදල් නීති පනතේ නියෝග අවලංගු කිරීම

5.1. පහත දැක්වෙන මුදල් පනත් නියෝග මෙතැන් සිට අවලංගු වේ

(i) 2019 සැප්තැම්බර් 24 දිනැති 2019 අංක 02 දරන මෑතකාලීන ප්‍රතිපත්ති තීරණ රුපියල් ණය සඳහා අදාළ වෙළඳපොල ණය පොළී අනුපාතික වෙත කාර්යක්ෂම සම්ප්‍රේෂණය වීම ඉහළ නැංවීම

(ii) 2020 අප්‍රේල් 27 දිනැති 2020 අංක 01 දරන බලපත්‍රලාභී බැංකු වල උකස් අත්තිකාරම් සඳහා උපරිම පොළී අනුපාත.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2020 අංක 8 2020 අගෝස්තු 26

කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන කාලය දීර්ඝ කිරීම

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සහ කොවිඩ්-19 ව්‍යසනය නිසා සංචාරක ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම සැලකිල්ලට ගනිමින් සංචාරක ක්ෂේත්‍රය සඳහා 2019 අප්‍රේල් මස සිට ණය සහන යෝජනාක්‍රම ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කර ඇත. දැනට පවතිනා ආගමන විගමන සීමා කිරීම්, ආර්ථික කටයුතුවල සිදුවී ඇති බාධාවන් සහ සංචාරක අමාත්‍යාංශය සහ අනෙකුත් සම්බන්ධිත නියෝජිතායතන විසින් කරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට ගනිමින් කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන යෝජනාක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 වන දින දක්වා තවත් මාස හයක කාලයකට දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙත දන්වා සිටී.

බලපත්‍රලාභී බැංකු විසින් සංචාරක ක්ෂේත්‍රය වෙත ලබාදී ඇති ණය ප්‍රතිශතය අඩු මට්ටමක පැවතීම, බලපත්‍රලාභී බැංකු විසින් පවත්වාගෙන යන ප්‍රාග්ධන ස්වාරක්ෂක සහ සංචාරක ක්ෂේත්‍රය යලි නගාසිටුවීම සඳහා සංචාරක අමාත්‍යාංශය විසින් යෝජනා කර ඇති වැඩ පිළිවෙල සැලකීමේදී ඉහත යෝජනාක්‍රමය මඟින් බැංකු ක්ෂේත්‍රයේ ස්ථායීතාවයට අහිතකර බලපෑමක් හෝ අනිසි පීඩනයක් ඇති නොවන බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. මේ අනුව, මෙම චක්‍රලේඛය ඉහත ණය සහන යෝජනාක්‍රමය සියළු බලපත්‍රලාභී බැංකු වෙතින් එක සමානව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා නිකුත් කරන ලද්දක් වන අතර මෙම චක්‍රලේඛය මගින් ලබාදෙන සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන ලෙස ගනුදෙනුකරුවන් වෙත අමතර ණය සහන ලබාදීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව ඇත.

1. **පොදු කොන්දේසි හා නියමයන්**

(i) සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්

(අ) කොවිඩ්-19 නිසා බලපෑමට පත් හා පහත ආයතන සමඟ ලියාපදිංචිවී ඇති පුද්ගලයන් හා ව්‍යාපාර.

(i) සංචාරක අමාත්‍යාංශය

(ii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

(iii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජිතායතන

(iv) ප්‍රාදේශිය සභා, නගර සභා සහ මහ නගර සභා වැනි පලාත් පාළන ආයතන (කෙසේ නමුත් මෙම ආයතන හා ලියාපදිංචි වී ඇති පුද්ගලයන් හා ව්‍යාපාර ණය සහන ලබාගැනීමේ දී ඉහත i, ii සහ iii හි සඳහන් සංචාරක කටයුතු පිළිබඳ ආයතනයන් හා ලියාපදිංචි විය යුතුය.)

(v) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

(vi) ශ්‍රී ලංකා හොටල්කරුවන්ගේ සංගමය

(ආ) කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර වල සේවා නියුක්තිකයන්. මෙහිදී, අදාළ සේවා නියුක්තිකයා ඉහත (අ) හි සඳහන් ආයතනයක ලියාපදිංචි ව්‍යාපාරයක සේවයේ නිරත වීම ප්‍රමාණවත් ලෙස සැලකිය යුතුය.

(ii) 2019 අප්‍රේල් 18 දින හෝ ඉන් පසු දිනක් වන විට සක්‍රිය කාණ්ඩයේ පැවති සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන් වෙත ලබා දුන් ණය සහ 2020 මාර්තු 27 වන දින නිකුත් කරන ලද 2020 අංක 05 දරණ චක්‍රලේඛය අනුව ප්‍රතිලේඛන ගත කල අක්‍රිය කාණ්ඩයේ ණය පහසුකම් මෙම යෝජනා ක්‍රමය මගින් සහන ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත.

(iii) ණය සහන කාලය යන්නට 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා තවදුරටත් මාස හයක කාලසීමාවකට මූලික ණය මුදල සහ පොලිය කල් තැබීම අදහස් වේ.

(iv) මෙම ණය සහන ලබා ගැනීමට අපේක්ෂා කරන, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් 2020 සැප්තැම්බර් 25 දින හෝ ඊට පෙර සිය බලපත්‍රලාභී බැංකුව වෙත ඉල්ලීමක් කල යුතුය. කෙසේ නමුත්, මෙම ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලබන, එහෙත් තම ණය ආපසු ගෙවීම සඳහා හැකියාවක් ඇති ගනුදෙනුකරුවන් මෙම ණය සහන කාලය දීර්ඝ කිරීමට අයදුම් නොකොට, සිය ණය පහසුකම් ආපසු ගෙවීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(v) බලපත්‍රලාභී බැංකු විසින් අදාළ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සලකා බලා එම ඉල්ලීම් සපුරාලීමට කටයුතු කල යුතු වේ.

2. **ණය සහනයන් හි සැකැස්ම**

(i) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා ණය සහන කාල සීමාව තුල අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය කාලීන ණයකට හැරවීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දින දක්වා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය සහ 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය එකතු කරනු ඇත. ණය සහන කාල සීමාව තුල අය කල හැකි උපරිම පොලිය 7% කට සීමා කර ඇති සම වටිනාකමින් යුතු වාරික ණය (EMI loans) සඳහා මෙය අදාළ වන්නේ නැත.

(ii) මෙලෙස හරවන ලද ණය යලි අයකර ගැනීම ආරම්භ කිරීම 2021 ජූලි 01 දිනෙන් පසුව සිදු කල යුතුය.

(iii) මෙලෙස හරවන ලද ණය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් 2021 අප්‍රේල් 01 දින වන විට පවතින ආසන්නතම දින365 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට 1% ක් එකතු කල වාර්ෂික පොලියට නොවැඩි පොළී අනුපාතයක් අය කල හැක.

(iv) මෙම ණය ආපසු අය කරගැනීමේ අවම කාලය වසර දෙකක් වනු ඇත. කෙසේ නමුත්, ණය ගනුදෙනුකරු විසින් අදාළ ණය ඊට අඩු කාලයක් තුලදී පියවීමට අදහස් කරන්නේ නම් හෝ බලපත්‍රලාභී බැංකුව විසින් ණය ආපසු පියවීමට වසර දෙකට වඩා වැඩි කාලයක් ලබා දීමට සූදානම් අවස්ථාවන් හිදී එවැනි ඉල්ලීම් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් පහසුකම් සැලසිය හැක. මෙලෙස, ආපසු ගෙවීමේ කාලය වසර දෙකට වඩා වෙනස් වන විට ඒ සඳහා සුදුසු පොළී අනුපාතයක් ගනුදෙනුකරු හා බැංකුව විසින් ගිවිසගත යුතුවේ.

(v) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන සක්‍රිය සහ අක්‍රිය ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් 2020 ඔක්තෝබර් 01 දින වන විට එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොළී කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුලදී දඩ පොළී එකතුකිරීම හෝ අය කිරීම නොකල යුතුවේ.

3. **වාර්තාකරණ අවශ්‍යතා**

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන යෝජනාක්‍රමය ලබාගෙන ඇති ගනුදෙනුකරුවන්ගේ සෑම මසකම 30 වැනි දින වන විට පවතින තොරතුරු, 2020 නොවැම්බර් 01 දින සිට සෑම මසකම වැඩ කරන දින 15 තුල බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වාර්තා කල යුතුය. මේ පිළිබඳ වාර්තාකරණ ආකෘතියක් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

4. **අවලංගු කිරීම්**

කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට සහන සැපයීමේ ක්‍රියාමාර්ග මැයෙන් 2020 ජූලි 16 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 07 දරණ චක්‍රලේඛය මෙමගින් අවලංගු කෙරේ.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 08 2020 සැප්තැම්බර් 08

බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ජන්ද හිමි නිකුත් කළ ප්‍රාග්ධනයේ හිමිකම සම්බන්ධයෙන් වන විධානයන්ගේ සංශෝධනය

බහුපාර්ශ්වීය මූල්‍ය සමාගම් විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල කොටස් හිමිකාරත්වයේ ආයෝජනය කිරීමෙහි ඇති ප්‍රතිලාභ සළකා බැලීමෙන් අනතුරුව, 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) වගන්තියෙන් පවරන ලද බලතලවලට අනුව මුදල් මණ්ඩලය විසින් 2007 ජනවාරි 19 දිනැති 2007 අංක 01 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය කරමින් පහත විධානයන් මෙයින් නිකුත් කරනු ලැබේ.

2007 අංක 01 දරන බැංකු පනත් විධානයන්හි 04 වන විධානය පහත පරිදි ආදේශනය කරනු ලැබේ:

4 ප්‍රාග්ධන හිමිකම් උපරිම ප්‍රතිශතය ඒ අනුව 12(1ඊ), 12(1ක) හා 13වන වගන්ති සහ උචිත යයි සලකනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත් ව මුදල් මණ්ඩලය විසින් පහත කරුණු සඳහා එක් එක් ඉල්ලීම අනුව සළකා බලා අවසර දෙනු ඇත:

(අ) 12(1c) හා 46(1)(d) වගන්තිවල සඳහන් ඕනෑම කොටස් හිමි වර්ගයක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක ජන්ද හිමි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් 15%ට නොවැඩි ප්‍රමාණික හිමිකමක් අත්පත් කර ගැනීමට,

(ආ) ලෝක බැංකුව (World Bank), ජාත්‍යන්තර මූල්‍ය සමායතනය (IFC), ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි බහුපාර්ශ්වික මූල්‍ය සංවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් ඕනෑම බහුපාර්ශ්වික මූල්‍ය සංවිධානයක් සඳහා, ගිවිසුම්ගත දින සිට වසර 10ක කාලයක් තුළ අත්පත් කරගත් ප්‍රමාණික හිමිකම 15% දක්වා අඩු කිරීමේ කොන්දේසියට යටත් ව බලපත්‍රලාභී වාණිජ බැංකුවක ජන්ද හිමි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් 20%ක් නොඉක්මවන ප්‍රමාණික හිමිකමක් අත්පත් කරගැනීමට.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 09 2020 සැප්තැම්බර් 08

බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ජන්ද හිමි නිකුත් කළ ප්‍රාග්ධනයේ හිමිකම සම්බන්ධයෙන් වන විධානයන්ගේ සංශෝධනය

බහුපාර්ශ්වීය මූල්‍ය සමාගම් විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කොටස් හිමිකාරත්වයේ ආයෝජනය කිරීමෙහි ඇති ප්‍රතිලාභ සළකා බැලීමෙන් අනතුරුව, 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 76(ඒ)(1) වගන්තියෙන් පවරන ලද බලතලවලට අනුව මුදල් මණ්ඩලය විසින් 2007 ජනවාරි 19 දිනැති 2007 අංක 02 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය කරමින් පහත විධානයන් මෙයින් නිකුත් කරනු ලැබේ.

2007 අංක 02 දරන බැංකු පනත් විධානයන්හි 3(2) විධානයට පසුව පහත නව විධානය ඇතුළත් කරනු ලැබේ:

4. ප්‍රාග්ධන හිමිකම් උපරිම ප්‍රතිශතය

(3) උක්ත (අ) කෙසේ වුවත්, උචිත යයි සලකනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, ලෝක බැංකුව (World Bank), ජාත්‍යන්තර මූල්‍ය සමායතනය (IFC), ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි බහුපාර්ශ්වික මූල්‍ය සංවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් ඕනෑම බහුපාර්ශ්වික මූල්‍ය සංවිධානයක් සඳහා, ගිවිසුම්ගත දින සිට වසර 10ක කාලයක් තුළ අත්පත් කරගත් ප්‍රාමාණික හිමිකමක් 15% දක්වා අඩු කිරීමේ කොන්දේසියට යටත් ව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ජන්ද හිමි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් 20%ක් නෙ ාඉක්මවන ප්‍රාමාණික හිමිකමක් අත්පත් කරගැනීමට මුදල් මණ්ඩලය විසින් එක් එක් ඉල්ලීම අනුව සළකා බලා අවසර දෙනු ඇත.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 10 2020 සැප්තැම්බර් 30

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල මූල්‍යමය ව්‍යුත්පන්න ගනුදෙනු පිළිබඳ විධානයන් සඳහා වන සංශෝධනයන්.

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති මගින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමට අදාළව මුදල් මණ්ඩලය විසින් විදේශ මුදල් ගලා ඒම දිරිගැන්වීමේ අවශ්‍යතාවය සලකා බලා 2018 අංක 4 දරණ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු පිළිබඳ 2018.08.21 දිනැති බැංකු පනත් විධානයන් සංශෝධනය කරමින් පහත විධානයන් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, පහත පරිදි 5.1 (ආ) සහ 5.7 (ඇ) විධානයන් ආදේශනය වන අතර 5.11 විධානය 5.10 විධානයට පසු ඇතුළත් කරනු ලැබේ.

5. පොදු නියමයන් සහ කොන්දේසි

5.1. ආ) වෙළඳපොල නිර්මාණය කිරීමේ අරමුණින් තොර ගනුදෙනු:

සුදුසුකම් ලබන බැංකු (සු.බැ) සිය ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගනුදෙනු, එනම් ආන්තිකයක් ගැනීමේ අරමුණින් වෙනත් සු.බැ. සමග හෝ සු.බැ.නොවන වෙනත් පාර්ශ්වයක් සමග කරන ගනුදෙනු. මෙම ගනුදෙනු වලදී සු.බැ. කිසිදු ආකාරයකින් තමන්ගේ පොත් වලට වෙළඳපොල අවදානම ක් නොගත යුතු අතර ශ්‍රී ලංකාව තුළ වෙනත් සු.බැ. සමග හෝ විදේශීය ප්‍රතිපාර්ශ්වයක් සමග හෝ ශ්‍රී ලංකා මහ බැංකුව සමග හෝ එම දිනය තුළදීම ගනුදෙනු සඳහා ප්‍රතිආවරණයක් ලබාගත යුතුය.

5.7. ඇ) වෙළඳපොල මිලට අගය කිරීමේ ලකුණු කිරීමේ ලාභය (මූල්‍ය ලාභය) ගනු දෙනුකරුට ගෙවිය යුතු නොවේ. කෙසේ වෙතත්, විදේශ ආයෝජකයින් විසින්, සුරැකුම්පත් වල ආයෝජනය පාදක ගනුදෙනුවක් වූ ව්‍යුත්පන්න අවසන් කිරීමේදී හෝ විකිණීමේදී පැන නගින වෙළඳපොල මිළට අගය කිරීමේ ලකුණු කිරීමේ ලාභය සු.බැ. විසින් ඔවුන්ට ගෙවිය හැකිය.

5.11. 2020.09.23 දිනැති මෙහෙයුම් උපදෙස් අංක 33/04/012/0011/002 සහ පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඊට අදාළව නිකුත් කරන ලද උපදෙස් අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අවතීර්ණවූ ආමුඛ ආයෝජන හුවමාරු ගිවිසුම් සඳහා 5.7 විධානයන් අදාළ නොවේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2020 අංක 9 2020 ඔක්තෝබර් 28

SLFRS - 9 මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය භාවිතා කිරීමට අදාළව නිකුත් කරන ලද 2018 අංක 04 දරන මාර්ගෝපදේශයට කරන ලද සංශෝධන

කොවිඩ්-19 ව්‍යසනයේ ව්‍යාප්තිය හමුවේ SLFRS-9 මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය භාවිතා කිරීම ඒකාකාරීව පවත්වාගෙනයාමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2018 දෙසැම්බර් 31 වන දින නිකුත් කරන ලද, 2018 අංක 04 දරන චක්‍රලේඛයට මෙහි ඇමුණුම් අංක 1 හි දක්වා ඇති සංශෝධන සිදුකරන අතර, බලපත්‍රලාභී බැංකු වෙත පහත සඳහන් පැහැදිළි කිරීම් ද සපයනු ලැබේ.

1. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආර්ථික කටයුතු සඳහා සෘජු තාවකාලික සීමාවන් පැනවීමකදී 3 වන අදියර පහසුකම් ලෙස වර්ගීකරණය කළ යුතුද නැද්ද යන්න තීරණය කිරීම, ආර්ථික කටයුතු සඳහා වූ සීමාවන් ඉවත් කිරීමෙන් පසු ණය ලබාගත් තැනැත්තාට ව්‍යාපාර නැවත පණ ගැන්වීමට සහ නිරාවරණය නැවත ගෙවීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයන් උත්පාදයන් කිරීමට ඇති නොහැකියාව මත බලපත්‍රලාභී බැංකු වලට එක් එක් සිද්ධිය අනුව විනිශ්චය කළ හැකිය.

2. බලපත්‍රලාභී බැංකු විසින් විදේශ මුදලින් නිකුත් කරන ලද ස්වෛරී උපකරණ වලට අදාළව පැහැර හැරීමේ සම්භාවිතාවය ගණනය කිරීමේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙන් සහ විගණකවරුන්ගෙන් වැඩිදුර සහය සහ උපදේශන ලබා ගත හැක.

3. රජය විසින් විදේශ මුදලින් නිකුත් කරන ලද නිරාවරණයන්ට අදාළව අපේක්ෂිත අලාභ ගණනයේදී පැහැර හැරීමෙන් ඇතිවන අලාභයට බලපත්‍රලාභී බැංකු, 2018 අංක 04 දරන චක්‍රලේඛයේ සඳහන් කර ඇති මාර්ගෝපදේශ අඛණ්ඩව පිළිපැදිය යුතුය.

අත්සන් කළේ
වී ඒ ඒ එන් ද සිල්වා මිය
බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

ඇමුණුම 1

SLFRS - 9 මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය භාවිතා කිරීමට අදාළව නිකුත් කරන ලද 2018 අංක 04 දරන මාර්ගෝපදේශයට කරන ලද සංශෝධන

1. පහත දැක්වෙන පරිදි මාර්ගෝපදේශ 4.7 ට පසු වහාම මාර්ගෝපදේශ 4.8 ඇතුළත් කළ යුතුය.

   කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අනපේක්ෂිත තත්ත්වයන් මධ්‍යයේ බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ හානිකරණ පරමාර්ථ සඳහා ණය සහ අත්තිකාරම් අදියර ගත කිරීම පිළිබඳ පැහැදිළි මාර්ගෝපදේශ, බලපත්‍රලාභී බැංකු අදාළ ප්‍රතිපත්ති වල ඇතුළත් කළ යුතුය.

2. මාර්ගෝපදේශ 5.3 (අ) සහ (ආ) පහත සඳහන් දෑ මගින් ප්‍රතිස්ථාපන කළ යුතුය.

   අ) බලපත්‍රලාභී බැංකු ආර්ථික තත්ත්වයන් සහ පුරෝකථන පිළිබිඹු කිරීම සඳහා ණය වෙන් කිරීමේ ආකෘති සකස් කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී. ල. ම. බැ.) විසින් ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථනයන් සහ ප්‍රක්ෂේපන ඒකාකාරීව භාවිතා කළ යුතුය.

   (ආ) ශ්‍රී. ල. ම. බැ. පුරෝකථන නැමැති අවස්ථාවක බලපත්‍රලාභී බැංකු විශ්වාසනීය විකල්ප ප්‍රභවයන් ස්ථාවර පදනමක් මත හෝ අදාළ ලේඛන සාක්ෂි පවත්වා ගත යුතුය.

3. ඇමුණුම 1 හි මාර්ගෝපදේශ 1.3 (ආ) පහත සඳහන් දෑ මගින් ප්‍රතිස්ථාපන කළ යුතුය.

   පහත 3.2 හි සඳහන් ණය පහසුකම් / නිරාවරණ වලට අමතරව දෙවරකට වඩා වැඩි වාර ගණනක් ප්‍රතිව්‍යුහගත කරන ලදි. සියලුම ප්‍රතිව්‍යුහගත ණය කොවිඩ්19 වසංගතය හෝ පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් ඇති වූ අහිතකර ආර්ථික බලපෑම් හේතුවෙන් යම් පහසුකමක් දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇත්නම්, එම පහසුකම් 3 වන අදියරේ පහසුකම් ලෙස වර්ගීකරණය කළ යුතුද නැද්ද යන්න තීරණය කිරීමට බලපත්‍රලාභී බැංකු වලට එක් එක් සිද්ධිය අනුව විනිශ්චය කළ හැකිය.

චක්‍රලේඛය 2020 අංක 10 2020 නොවැම්බර් 9

කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ණය සහන කාලයක් ලබාදීම

කොවිඩ්-19 ව්‍යසනයේ දෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයින් විසින් මුහුණපා ඇති ගැටළු සලකා බලමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් මතුවට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) විසින් කොවිඩ්-19 ව්‍යසනය මගින් බලපෑමට ලක්වී ඇති පුද්ගලයන් හා ව්‍යාපාර වෙත ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් මතුවට යෝජනාක්‍රමය ලෙස හැඳින්වෙන) 2020 ඔක්තෝබර් 01 දින සිට පහත පරිදි තවත් මාස හයක කාලයකින් දීර්ඝ කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කර සිටී.

මේ අනුව, සියළු බලපත්‍රලාභී බැංකු විසින් ඉහත යෝජනාක්‍රමය ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කරවීම තහවුරු කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත. එසේ වුවද ගනුදෙනුකරු හට ලැබෙන සමස්ථ ප්‍රතිලාභය මෙම චක්‍රලේඛය මගින් පිරිනැමෙන සහනයන්ට වඩා අඩු නොවෙන සේ යම් කිසි බලපත්‍රලාභී බැංකුවක ට ගනුදෙනුකරුවන් වෙත අමතර ණය සහනයන් ලබාදිය හැක.

1. **ණය සහන කාල සීමාව සහ එය බලපැවැත්වෙන අයුරු**

   (අ) සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් හට ඔවුන් විසින් මුහුණපා ඇති මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 2020 ඔක්තෝබර් 01 දින සිට ඇරඹෙන පරිදි මාස 6කට නොවැඩි කාලයක් හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාල සීමාවක් සඳහා ණය සහන කාලසීමාවක්, බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් බලය පවරන ලද අධිකාරියක් විසින් ලබාදී ඇති අභ්‍යන්තර මාර්ගෝපදේශ වලට අනුකූලව, ලබා දිය යුතුය.

   (ආ) දුෂ්කරතා වලට මුහුණපා ඇති ගනුදෙනුකරු විසින් කර ඇති ඉල්ලීමට අනුව මුල් ණය මුදල සහ පොලී යන කොටස් දෙක සඳහාම ණය සහන කාලය පිරිනැමිය යුතුය.

2. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය

සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් විසින් 2020 නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් සිය ඉල්ලීම ඉදිරිපත් කල හැක. බලපත්‍රලාභී බැංකු විසින් දුෂ්කරතා වලට මුහුණපා ඇති ගනුදෙනුකරුවන් හට ණය සහන සඳහා ඉල්ලුම් කිරීමට සහ ලබා දෙනු ලබන සහන, අයදුම්කල යුතු අවසාන දිනය සහ අයදුම් කල යුතු ආකාරය ආදී තොරතුරු ඇතුලත් සරළ ආකෘති පත්‍රයක් විද්‍යුත් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුලත්ව) සහ/හෝ මුද්‍රිත මාධ්‍යයන්ගෙන් ලබා දීමට කටයුතු කල යුතුය.

3. සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන්

(අ) සංචාරක, ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි, සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන්, උත්සව කළමණාකරන සහ අපනයන ක්ෂේත්‍රයේ සෘජු හා වක්‍ර ව්‍යාපාර ඇතුළු කොවිඩ්-19 නිසා වැඩ කටයුතු අඩාල වූ සහ දේශීයව සහ විදේශයන්ගේ පැවති පොදු පහසුකම් හා සේවා වසා දැමීම් නිසා අගතියට පත් ව්‍යාපාර, ව්‍යාපාර හිමියන් සහ පුද්ගලයන්.

(ආ) නිෂ්පාදන, මූල්‍ය නොවන සේවා, කෘෂිකාර්මික (සැකසුම් ඇතුළු), ඉදිකිරීම්, අගය එකතුකිරීම්, අවසරලත් ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (රුපියල් බිලියන 1 දක්වා වාර්ෂික පිරිවැටුම් දරන) සහ පුද්ගලයන්

(ඇ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම රැකියා හෝ ආදායම් අහිමි වූ ස්වයං රැකියා ව්‍යාපාර සහ පුද්ගලයන්,

(ඈ) කොවිඩ් -19 ව්‍යසනය නිසා තම ව්‍යාපාර/ආදායම වෙත බලපෑම් ඇතිවී ඇති, විදේශ මුදලින් ණය පියවීමට ඇති විදේශීය විනිමය උපයන ව්‍යාපාර හා පුද්ගලයන්.

4. සුදුසුකම් ලබන ණය පහසුකම්

2020 ඔක්තෝබර් 01 දින වන විට සක්‍රිය කණ්ඩයේ පැවති, රුපියල් හා විදේශ මුදල් කාලීන ණය, කල්බදු (ලීසිං) පහසුකම්, උකස්, අයිරා, වෙළඳ මූල්‍යන ඇතුළු අනෙකුත් ණය පහසුකම්. බලපත්‍රලාභී බැංකු විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන අදියර i, ii සහ iii යටතේ ලබා දුන් ණය පහසුකම් සඳහා ණය සහන කාලය ලබා දීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 නොවැම්බර් 06 වන දින නිකුත් කරන ලද උපදෙස් පිළිපැදිය යුතුය.

5. ණය සහන කාලයේ සැකැස්ම

(අ) 2020 ඔක්තෝබර් 01 සිට 2021 මාර්තු 31 දක්වා හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා වන ණය සහන කාලසීමාව තුලදී ගනුදෙනුකරුවාගෙන් අයවීමට නියමිත මුල් ණය මුදල සහ ගිවිසගෙන ඇති පොලී අනුපාතිකයට අනුව පොලිය කාලීන ණයකට හැරවීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කල යුතුය.

(ආ) මෙම හරවන ලද කාලීන ණය සඳහා බැංකු විසින් ණය සහන කාලසීමාව අවසන් වූ වහාම පැවති 364දින භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතිකයට සියයට එකක් එකතු කල වාර්ෂික පොලී අනුපාතයක් (364-days Treasury Bills auction rate plus 1 per cent per annum) අයකල හැක. විදේශ මුදල් ණය සඳහා දැනට පවතින වෙළඳපොළ පොලී අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් හෝ ගිවිසුම්ගත පොලිය යන විකල්ප දෙකෙන් අඩු අගය හරවන ලද ණය පහසුකම සඳහා අයකල යුතුය.

(ආ) මෙලෙස හරවන ලද කාලීන ණය ආපසුගෙවීමේ අවම කාලය මාස 24ක් වන අතර එම ණය ආපසුගෙවීම 2021 අප්‍රේල් 01 දින සිට ඇරඹිය යුතුවේ.

(ඇ) අයිරා සඳහා 2020 ඔක්තෝබර් 01 සිට 2021 මාර්තු 31 දක්වා හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා වන ණය සහන කාල සීමාව තුලදී අයවීමට නියමිත පොලී කාලීන ණයකට හැරවීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතු අතර, එම කාලීන ණය සඳහා අයකල හැකි උපරිම වාර්ෂික පොලිය සියයට 4ක අගයකට නොවැඩි විය යුතුය. මෙලෙස හරවන ලද කාලීන ණය ආපසුගෙවීමේ අවම කාලය මාස 12ක් වන අතර එම ණය ආපසුගෙවීම 2021 අප්‍රේල් 01 දින සිට ඇරඹිය යුතුවේ.

(ඈ) කෙසේ වෙතත් ගනුදෙනුකරුවන් විසින් ඉහත කාලීන ණයකට හරවන ලද මුදල ඉක්මනින් ගෙවා දැමීමට අදහස්කරන්නේ නම් හෝ බලපත්‍රලාභී බැංකුව විසින් ඉහත නියම කරන ලද කාලයට වඩා වැඩි කාලයක් ලබා දීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා හැකියාව පවතී. මෙලෙස කාලීන ණයකට හරවන ලද මුදල ආපසු ගෙවීම මෙම චක්‍රලේඛය මගින් දක්වා ඇති කාලසීමාවට වඩා වෙනස් කාලයකදී සිදු කරන්නේ නම් ඒ සඳහා සුදුසු පොලී අනුපාතිකයක් ගනුදෙනුකරු හා බැංකුව විසින් ගිවිසගත යුතුය.

(ඉ) උකස් පහසුකම් සම්බන්ධයෙන්, ණය සහන කාලය තුලදී අයවීමට නියමිතව ඇති දිනයන් 2021 අප්‍රේල් 01 දක්වා දීර්ඝ කල යුතුය.

(ඊ) ණය කාඩ් පත් සම්බන්ධයෙන් සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් සුදුසු පරිදි ව්‍යාපාරික තීරණ ගත යුතුය.

(උ) බලපත්‍රලාභී බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ 2020 ඔක්තෝබර් 01 දින වන විට එකතුවී ඇති සහ නොපියවා ඇති දඩ පොලී ඇත්නම් ඒවා කපාහැරීමට කටයුතු කල යුතු අතර ණය සහන කාලසීමාව තුලදී දඩ පොලී එකතුකිරීම හෝ අයකිරීමට කටයුතු නොකල යුතුය.

(ඌ) බලපත්‍රලාභී බැංකු විසින් ඉහත ණය සහන ලබා දීම සඳහා අධික ගාස්තු හෝ අයකිරීමක් එකතු නොකල යුතුය.

(එ) බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන අනුමත කිරීමට ප්‍රථම ඒවායේ සැකැස්ම පිළිබඳව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන් දැනුවත්කිරීමට කටයුතු කල යුතු අතර, යම් ණය සහන සඳහා කරනු ලබන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේදී බලපත්‍රලාභී බැංකු විසින් එසේ ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු පැහැදිලිව දැක්විය යුතුය.

6. ණය සහන කාල සීමාව සම්බන්ධව ගිණුම් තැබීම

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන කාලසීමාවට අදාලව ගිණුම්තැබීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ කොවිඩ්-19 ව්‍යසනය සම්බන්ධව මූල්‍ය වාර්තාකරණයේ දී සැලකිය යුතු දෑ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් යම් අමතර මාර්ගෝපදේශ සපයන්නේ නම් ඒවා හා අනුගතව කටයුතු කල යුතුය. බලපත්‍රලාභී බැංකු හට මේ සම්බන්ධව අමතර මගපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

7. වාර්තාකරණ අවශ්‍යතා

බලපත්‍රලාභී බැංකු විසින් 2020.12.15 දින සිට සෑම මසකම 15 සහ 30 වැනි දා වන විට තම බැංකුවෙන් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු අදාල දිනයේ සිට වැඩකරන දින 5ක් තුලදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කල යුතුය.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් නිර්ණය 2020 අංක 01 2020 නොවැම්බර් 12

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 8 වන හා 76 ඈ (6) යන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද නිර්ණය.

කොවිඩ් 19 වසංගතයේ පැතිරීම හේතුවෙන් බලපත්‍රලාභී බැංකු වලට ඇති විය හැකි අයහපත් බලපෑම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද විශේෂ නියාමන ක්‍රියාමාර්ග පිළිබඳව සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2019 සහ 2020 වසර සඳහා අදාළ වූ බලපත්‍ර ගාස්තු ව්‍යුහය 2021 වසර සඳහාද නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කර ඇත.

ඒ අනුව, 2020 වසර අවසානයේ බැංකුවේ මුළු වත්කම් අගය පදනම් කරගෙන පහත වගුව පරිදි සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් 2021 වසරට අදාළ සිය වාර්ෂික බලපත්‍ර ගාස්තු 2021.01.31 දින හෝ ඊට ප්‍රථම බැංකු පනතේ වගන්ති 8 (1) හා 76(ඈ) ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතුය.

වාර්ෂික බලපත්‍ර ගාස්තු

2020 වසර අවසානයේ මුළු වත්කම් (රු. බිලියන)	බලපත්‍ර ගාස්තුව (රු. මිලියන)
1000 ට වැඩි	33
750 සිට 1000 දක්වා	32
500 සිට 750 දක්වා	26
200 සිට 500 දක්වා	23
125 සිට 200 දක්වා	17
75 සිට 125 දක්වා	11.6
25 සිට 75 දක්වා	6
25 ට අඩු	3

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් විධානය 2020 අංක 03 2020 දෙසැම්බර් 04

උකස්කර මත ලබා දෙන නිවාස ණය සඳහා අයකල හැකි උපරිම පොලී අනුපාත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1)(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

දැනට පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා, මේ දක්වා සිදු කර ඇති ප්‍රතිපත්ති පොලී අනුපාත පහත දැමීම්, දේශීය මුදල් වෙළඳපොළෙහි පවතින අතිරික්ත ද්‍රවශීලතාවය සහ ආර්ථිකය යළි පණගැන්වීම සඳහා ණය පොලී අඛණ්ඩව අඩු මට්ටම් කරා ගෙන ඒමට ඇති අවශ්‍යතාව සලකා බලමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් මතුවට බලපත්‍රලාභී බැංකු ලෙසින් හැඳින්වෙන) මගින් රජයේ සහ පෞද්ගලික අංශයේ වැටුප් ලබන සේවකයන් විසින් ලබා ගන්නා උකස්කර මත ලබා දෙන නිවාස ණය මත අයකල හැකි උපරිම පොලී අනුපාත නියම කරමින් මුදල් මණ්ඩලය විසින් මෙම විධානය නිකුත් කරනු ලැබේ. මෙම විධානය මගින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාවගේ නිවාස හිමිකම් පුළුල් කිරීමට රුකුලක් වීම සහ දේශීය ඉදිකිරීම් කර්මාන්තය සහ එහි සැපයුම් දාමයන්ට අමතර උත්ප්‍රේරණයක් සැපයීමට ද අපේක්ෂිතයි.

1.	මුදල් නීති පනත යටතේ බලගැන්වීම	1.1	බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් විවිධ වර්ගයේ ණය හා අනෙකුත් ණය මෙහෙයුම් සඳහා අය කරන උපරිම පොළි අනුපාතයන් තීරණය කිරීමට මුදල් නීති පනතේ 104 (1) (ආ) වගන්තිය අනුව මුදල් මණ්ඩලයට හැකියාව ඇත.
2.	මෙම විධානයේ අදාළත්වය	2.1	මෙම විධානය නිකුත් කිරීමෙන් පසු බලපත්‍රලාභී බැංකු විසින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ස්ථිර පත්වීම් සහිත වැටුප් ලබන සේවකයන් වෙත පිරිනමනු ලබන පහත සඳහන් නිවාස ණය සඳහා මෙම විධානය අදාල වේ. (i) අදාල දේපල ම ප්‍රාථමික උකස්කරයක් මගින් සුරැකුම් ලෙස තබන, සහ (ii) ඉදිකිරීම් සම්පූර්ණ වීමෙන් අනතුරුව, අදාල දේපල ප්‍රාථමික උකස්කරයකට හරවන බවට ගනුදෙනුකරු සහ බැංකුව ගිවිසුමකට එළඹීමේ පදනම මත, සහාධිපත්‍ය දේපලක් (condominium property) මිලදී ගැනීම සඳහා
3.	වැටුප් ලබන සේවකයන් විසින් උකස්කර මත ලබා ගන්නා නිවාස ණය සඳහා වන පොලී අනුපාත සහ ආපසු ගෙවීමේ කාලය	3.1.	විධාන 2.1 යටතේ දක්වා ඇති උකස්කර මත ලබා දෙනු ලබන නිවාස ණය සඳහා අයකල හැකි උපරිම පොලී අනුපාත පහත පරිදි වේ. (i) අවම වශයෙන් ණය කාලසීමාවේ මුල් වසර පහ දක්වා කාලය තුල සියයට 7ක ස්ථාවර වාර්ෂික පොලී අනුපාතිකයක්

(ii) ණය මුදලේ ඉතිරි කාල සීමාව සඳහා මාසික සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතය සහ සියයට 1ක අනුපාතයකට (Average Weighted Prime Lending Rate (AWPR) plus a maximum margin of 1 percentage point) මත පදනම් වූ විචල්‍ය පොලී අනුපාතිකයක්

(iii) ණය පහසුකමේ පළමු වසර පහ තුල මාසික වාරික ගණනය කිරීමේ දී, සම්පූර්ණ ණය කාලසීමාව සඳහා ම පොලිය සියයට 7ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ සැලකීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කල යුතුය.

(iv) ස්ථාවර පොලී අනුපාතයට අයත් මුල් වසර 5න් අනතුරුව බලපත්‍රලාභී බැංකුව විසින් ණය මුදල ප්‍රතිමිල ගැන්විය හැකි අතර එහිදී පොලී අනුපාතය විචලනය වීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ක්ෂේත්‍රය සඳහා ප්‍රකාශයට පත් කර ඇති ආසන්නතම පසුගිය මාස 6ට අදාල සඳහා මාසික සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාත අගය මත පාදක විය යුතුය.

3.2. බලපත්‍රලාභී බැංකු විසින් ණය මුදලේ කාල සීමාව තීරණය කිරීමේ දී සේවායෝජකයා විසින් සනාථ කර ඇති ගනුදෙනුකරුවා විශ්‍රාම ලබන වසර, ණය මුදල පියවීමේ අවසාන වසර ලෙස සැලකිය හැක.

4. ණය පහසුකම පියවා දැමීම

4.1 ගනුදෙනුකරුවන් හට මෙම විධානය යටතේ ලබා ගන්නා ණය පහසුකම් ස්ථාවර පොලී අනුපාතිකය අයත් මුල් වසර පහ අවසානයේ දී පියවා දැමීමේ ගාස්තු හෝ අයකිරීමකින් තොරව සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් අවස්ථාව සැලසිය යුතුය.

5. ක්‍රියාත්මක කිරීම

5.1 2020 දෙසැම්බර් 10 වන දා සිට බලපැවැත්වෙන පරිදි මෙම විධානය ක්‍රියාත්මක කරවීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් සිය ශාඛා වෙත අදාල අභ්‍යන්තර චක්‍රලේඛ වහාම නිකුත් කිරීමට කටයුතු කල යුතුය.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම නියෝගය සම්බන්ධව නිති අසන පැන සඳහා පිලිතුරු පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_5_of_2020_s.pdf

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_frequently_asked_questions_no_1_of_2021_e.pdf

බැංකු පනත් විධාන 2020 අංක 11 2020 දෙසැම්බර් 11

2020 අංක 05 දරණ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

කොවිඩ් 19 ව්‍යාප්තියේ බලපෑම හේතුවෙන් විදේශ විනිමය අනුපාතයට සහ මූල්‍ය වෙළඳපොළට ඇති කරනු ලබන පීඩනය ලිහිල් කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් නව විදේශ ප්‍රභවයන් මඟින් ලැබෙන විදේශ මුදල් ගලා ඒම් භාවිතා කරමින් හැර සිදු කරනු ලබන ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර මිලදී ගැනීම් මාස හයක කාලයක් සඳහා වහාම අත්හිටුවිය යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනුම් දෙනු ලබයි.

මෙම විධානය වහාම ක්‍රියාත්මක වන බව අවධාරණය කරනු ලබයි.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 12 2020 දෙසැම්බර් 23

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

වසරේ මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර තුළ සැලකිය යුතු ආයෝජනයක් සිදු කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. තව ද, බලපත්‍රලාභී බැංකු විසින් ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමට මුදල් ගලා ඒම් භාවිත කරමින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර අඛණ්ඩව මිලදී ගැනීම් නිසා විදේශ විනිමය වෙළඳපොළට අනවශ්‍ය පීඩනයක් එක් කරන බවට ද ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් නිරීක්ෂණය කර තිබේ.

මෙම වර්ධනයන් සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මාස තුනක කාල සීමාවක් සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර මිලදී ගැනීම් අත්හිටුවිය යුතු බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනුම් දෙනු ලබයි.

ඒ අනුව, 2020 දෙසැම්බර් 11 දිනැති අංක 11 දරණ බැංකු පනතේ විධානය මෙයින් ඉවත් කර ගනු ලැබේ.

මෙම විධානයන් වහාම ක්‍රියාත්මක වන බව අවධාරණය කරනු ලබයි.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2020 අංක 13 2020 දෙසැම්බර් 23

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල නිශ්චල දේපළ තක්සේරුකරණය පිළිබඳ නියාමන රාමුව සඳහා සංශෝධන

1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) සහ 76 (ඒ) (1) වගන්ති මගින් පවරන ලද බලතල ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) නිශ්චල දේපළ තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව පිළිබඳ 2014 අංක 01 දරන බැංකු පනත් විධානයන්ට අදාළ සංශෝධන මෙසේ නිකුත් කරනු ලබයි.

ඒ අනුව, බලපත්‍රලාභී බැංකු වල නිශ්චල දේපළ තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව පිළිබඳ 2014 අංක 01 දරන බැංකු පනත් විධානයන් වල පහත සඳහන් විධානයන් පහත පරිදි ආදේශනය කරනු ලැබේ.

5. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායකයන්

5.1. සෑම බලපත්‍රලාභී බැංකුවක්ම පහත සඳහන් දෑ තහවුරු කළ යුතුය:

(අ) තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායකයන් පහත පරිදි වේ

(i) ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය දරන,

(i) අධි සාමාජිකයෙකු හෝ

(ii) අදාළ ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්ද සහිත වෘත්තීය ආශ්‍රිත සාමාජිකයෙක් විය යුතුය.
වෘත්තීය ආශ්‍රිත සාමාජිකත්ව ශ්‍රේණියේ පළපුරුද්දට අදාළ වසර ගණන නිර්ණය කිරීමේදී 2019 අංක 09 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන සංශෝධිත පනතෙහි 24 වන වගන්තියේ දක්වා ඇති සංක්‍රාන්ති විධිවිධාන අදාළ වේ.

(ii) එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ වරලත් තක්සේරු මිනින්දෝරුවරයෙක් වන,

(i) අධි සාමාජිකයෙකු , හෝ

(ii) එම ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්ද ඇති අනෙකුත් සාමාජිකයෙක් විය යුතුය.

ආ) ඉහත 5.1 (අ) විධානයෙහි දක්වා ඇති සුදුසුකම් මත බලපත්‍රලාභී බැංකු වල තක්සේරුකරුවන්ගේ මණ්ඩලය සඳහා තෝරාගනු ලැබූ තක්සේරුකරුවන් විසින් අදාළ වෘත්තීමය ආයතනය විසින් අනුමත කරන ලද නිර්දේශිත අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

ඇ) නිශ්චල දේපළ පිළිබඳ අභ්‍යන්තර තක්සේරු කිරීම් සිදු කළ යුත්තේ ඉහත විධාන 5.1 (අ) හි නිර්ණායකයන්ට අනුව යෝග්‍යතාවය සපුරාලන තක්සේරුකරුවන් විසිනි.

ඉ) බලපත්‍රලාභී බැංකුවල නිශ්චල දේපල තක්සේරු කිරීමේදී ඉහළ මට්ටමේ වෘත්තීය හැසිරීම, ආචාර ධර්ම සහ සුපිලිපන් බව පවත්වා ගෙන යන තක්සේරුකරුවන් තක්සේරුකරුවන්ගේ මණ්ඩලයට ඇතුළත් කළ යුතුය.

6. අභ්‍යන්තර බාහිර තක්සේරු වාර්තා සඳහා වන සීමාව

6.1. සියළුම ක්‍රියාකාරී ණය සහ අත්තිකාරම් වලට එරෙහිව, ඇප වශයෙන් ලබා ගත යුතු / ලබා ගෙන ඇති නිශ්චල දේපල සම්බන්ධයෙන් බැංකුවේ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි අන්තර් හා බාහිර තක්සේරු කිරීම සඳහා සුදුසු සීමාවන් බැංකු විසින් ස්ථාපනය කළ යුතුය.

6.2. අක්‍රීය ණය සම්බන්ධයෙන්, ණය පහසුකමෙහි හිඟ හිටි ප්‍රාග්ධන ශේෂය රුපියල් 10,000,000 ක් හෝ බලපත්‍රලාභී බැංකුවෙහි ප්‍රාග්ධන පදනමෙන් 0.1% යන අගයන් දෙකෙන් අඩු වටිනාකමකට වඩා අඩු අගයක් ගන්නා විට අභ්‍යන්තර තක්සේරු වාර්තාවක් ලබා ගත හැක.

6.3. හිඟ හිටි ප්‍රාග්ධනය, රු. 5,000,000 හෝ බැංකුවේ ප්‍රාග්ධන අරමුදලනේ 0.1% යන දෙකෙන් අවමය ඉක්මවන විටෙක සිදු කරන දේපළ අත්පත් කරගැනීමක් සඳහා තක්සේරු වාර්තාවක් ලබාගන්නා අවස්ථාවක දී, බලපත්‍රලාභී බැංකු විසින් බාහිර තක්සේරු වාර්තාවක් ලබා ගත යුතුය.

7. තක්සේරු කිරීමෙහි වාර ගණන

7.1. ඉහත කී විධාන අංක 2.2 (ඊ) හි දක්වන ලද තක්සේරු කිරීමෙහි වාර ගණන පහත පරිදි වේ.

(අ) ඕනෑම නියාමන අරමුණක් සඳහා, අක්‍රීය ගණයට මාරු වී ඇති ණය හා අත්තිකාරම් වලට එරෙහිව සුරැකුම් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපළ තක්සේරු කිරීමේ වාර ගණන පහත පරිදි වේ.

(i) නිවාස අවශ්‍යතා සඳහා ණය ගැනුම්කරු විසින් පදිංචිව සිටින නේවාසික දේපළ වලට එරෙහිව ලබා දී ඇති ණය පහසුකම් සඳහා වසර 5 කට වඩා පැරණි නොවූ වාර්තාවක්

(ii) අනෙකුත් සියලුම ණය පහසුකම් සඳහා වසර 4 කට වඩා පැරණි නොවූ වාර්තාවක්

(ආ) ඉහත සඳහන් විධාන අංක 3.1 (ආ) සහ (ඇ) හි දැක්වෙන නිශ්චල දේපළ ප්‍රත්‍යාගණනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්ති වලට අනුකූලව හෝ එවැනි නිශ්චල දේපළ වල සාධාරණ වටිනාක මෙහි සැළකිය යුතු සහ සීඝ්‍ර වෙනස්වීම් වලට අනුකූලව සිදු කළ යුතුය. එහෙත් ඒවාට අදාළ ප්‍රත්‍යාගණන ලාභ දෙවන පෙළ ප්‍රාග්ධනය ලෙස ඇතුළත් කළ හැකි වන්නේ වසර 3 කට වරක් පමණි.

(ඇ) සක්‍රීය ණය පහසුකම් සඳහා ඇපකර ලෙස ලබා ගන්නා නිශ්චල දේපළ තක්සේරු කිරීම ණය පහසුකම් ප්‍රදානය කරන මුල් අවස්ථාවේ දී සහ පසු කාලීනව ණය පහසුකම් ඉහළ නංවන අවස්ථාවන්හි දී සිදු කළ යුතුය.

8. විධානයන් හා චක්‍රලේඛ අහෝසි කිරීම

බැංකු පනත් විධාන 2019 අංක 07 යටතේ නිකුත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල නිශ්චල දේපළ තක්සේරුකරණය පිළිබඳ නියාමන රාමුව සඳහා වන සංශෝධන විධානය මෙයින් අහෝසි කෙරේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2020 මැයි 12

සම්බන්ධ අංකය: 12/02/004/0007/001

චක්‍රලේඛ අංකය: 2020-01

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිළධාරීන් වෙත,

මහත්මයාණෙනි/ මහත්මියනි,

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු සඳහා අයකරනු ලබන සේවා ගාස්තුව තාවකාලිකව අත්හැරීම

"සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු සැකසීම සඳහා සේවා ගාස්තුවක්" ශීර්ෂයෙන් නිකුත් කරන ලද 2009.02.26 දිනැති චක්‍රලේඛය සහ "බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු සඳහා අය කරනු ලබන සේවා ගාස්තුව ඉහළ දැමීම" ශීර්ෂයෙන් නිකුත් කරන ලද 2019.06.25 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

රටතුල පවතින වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු සඳහා අයකරනු ලබන සේවා ගාස්තුව ඉවත් කිරීමට මුදල් මණ්ඩලය අනුමත කර ඇත.

ඒ අනුව, 2020.04.01 දින සිට 2020.06.30 දින දක්වා මාස තුනක කාලයක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කරනු ලබන සියළුම සේවා නිසි (භාවිතයට සුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු සඳහා සේවා ගාස්තු අයකරනු නොලැබේ.

මෙයට විශ්වාසී,
එච්.පී.ටී.විජේසූරිය මිය
අධිකාරී/ ව්‍යවහාර මුදල්

චක්‍රලේඛ අංක: 35/03/016/007/005 2020 පෙබරවාරි 11

සියලුම සහභාගිත්ව ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත

විවට වෙළඳ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි

2016 ඔක්තෝබර් 26 දින නිකුත් කරන ලද වෙළඳපොළ කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ අංක 35/03/016/007/001 හි අංක 83.0 වගන්තිය 2019 සැප්තැම්බර් 05 දින නිකුත් කරන ලද විවට වෙළඳ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වන වෙන්දේසිවලට අදාළ චක්‍රලේඛ අංක 35/03/016/007/004 මගින් සංශෝධනය කරන ලද අතර, 2020 පෙබරවාරි 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි තවදුරටත් පහත අයුරින් සංශෝධනය වනු ඇත.

83.0 (අ) භාණ්ඩාගාර බැඳුම්කර යටතේ වෙන්දේසි නිවේදනය කිරීම

මහ බැංකුව විසින් ස්ථිර පදනම මත වන වෙන්දේසි පැවැත්වීම නිවේදනය කිරීම එම වෙන්දේසි පැවැත්වීමට අවම වශයෙන් එක් ව්‍යාපාරික දිනකට පෙර සිදු කරනු ලබයි. එම නිවේදනය, අදාළ වෙන්දේසියේ වර්ගය (ස්ථිර පදනම මත විකිණීම හෝ මිලට ගැනීම), පිරිනමනු ලබන ප්‍රමාණය (අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම), පරිණත වන දිනය, පරිණත වීම සඳහා ඇති දින ගණන, වෙන්දේසි පවත්වනු ලබන දිනය සහ පියවීමේ කටයුතු සිදු වන දිනය යනාදී තොරතුරුවලින් සමන්විත වේ. ස්ථිර පදනම මත සිදු කරන වෙන්දේසිවල පියවීම් කටයුතු වෙන්දේසි පැවැත් වූ දිනට පසු එළඹෙන පළමු ව්‍යාපාරික දිනයේ දී සිදු කරනු ලැබේ.

අධ්‍යක්ෂ / දේශීය මෙහෙයුම් කටයුතු

මෙහෙයුම් උපදෙස් අංක: 35/01/005/0007/152020 මාර්තු 17

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

සංචිත අවශ්‍යතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනත (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වන අධිකාරිය) සංශෝධිත පරිදි 10(ඈ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ සහ 2020 මාර්තු 17 වැනි දින අංක 2167/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද (ඈ) නිවේදනය සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. ඉහත සඳහන් නිවේදනය ප්‍රකාර සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් පවත්වා ගෙන යනු ලබන මුළු තැන්පතු වගකීම්වලින් සියයට හතරක (4.00%) ප්‍රමාණයක් සංචිතයක් ලෙස පවත්වාගෙන යා යුතුය.

3. 2019 පෙබරවාරි 22 වැනි දින මෙහෙයුම් උපදෙස් අංක 35/01/005/0007/14හි (අ) උපලේඛනය, මෙහි අමුණා ඇති (අ) උපලේඛනය ලෙස ප්‍රතිස්ථාපනය වේ.

4. ඉහත සඳහන් සංශෝධනය 2020 මාර්තු 16 දිනෙන් ආරම්භ වූ සංචිත කාල පරිච්ඡේදයේ සිට බලපැවැත්වෙනු ඇත. 2013 අප්‍රේල් 22 වැනි දින අංක 35/01/005/0007/06 සහ 35/01/005/0007/07 දරන මෙහෙයුම් උපදෙස්වල අඩංගු අනෙකුත් උපදේශන තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

සී.ඒ. අබේසිංහ
අධ්‍යක්ෂ / දේශීය මෙහෙයුම් කටයුතු

'අ' උපලේඛනය

වාර්තා කිරීමේ ආකෘතිය

දෛනික තැන්පතු වගකීම් සාමාන්‍ය පිළිබඳ වාර්තාව

බැංකුවේ නම : .....

කාල වකවානුව : ..... සිට ..... දක්වා

(දිනය) (දිනය)

වෙත : අධ්‍යක්ෂ,
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

ඉහත දක්වා ඇති කාල පරාසයේ එක් එක් දිනයට අදාළ දෛනික ව්‍යාපාර කටයුතු අවසානයේ දී, බැංකුවේ පොත්වල සඳහන් තැන්පතු ශේෂය පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට තැන්පතු වගකීම් හි සාමාන්‍යය වාර්තා කළ යුතුය.

(i)	(ii)	(iii)	(iv)
ඉල්ලුම් තැන්පතු	**කාලීන හා ඉතුරුම් තැන්පතු**	**ණයවර ලිපි / ප්‍රතිග්‍රහණය මත ලියවිලි සඳහා ආන්තික අවශ්‍යතාව**	**අනෙකුත් සියළුම තැන්පතු වගකීම්[1]**

1. තැන්පතු සහතික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල විය යුත්තේ ප්‍රකාශ කළ වටිනාකමයි.

සංචිත අවශ්‍යතා

අදාළ සංචිත කාල පරිච්ඡේදය : .....

අයිතමය	අගය ශ්‍රී ලංකා රුපියල්
1. ණයවර ලිපි සඳහා වන සියයට 100ක සාමාන්‍ය දෛනික සමස්ත ආන්තික අවශ්‍යතාව පහත දක්වා ඇති ණයවර ලිපි සඳහා අවස්ථානෝචිතව සුදුසු පරිදි : (අ) (i) 2018 සැප්තැම්බර් මස 19 දින අංක 35/01/005/0010/20 දරන "මෝටර් රථ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව හෝ (ii) 2018 සැප්තැම්බර් මස 29 දින අංක 35/01/005/0010/21 දරන "මෝටර් රථ හා අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව. (ආ) 2018 ඔක්තෝබර් මස 11 දින චක්‍රලේඛ අංක 2 දරන ප්‍රතිග්‍රහණය මත ලියකියවිලි ලබා දීමේ කොන්දේසිය අනුව සිදු කරන ආනයන සඳහා වන ආන්තික අවශ්‍යතාව.	
2. ඉහත අංක 1 හැර දෛනික රුපියල් තැන්පතු වගකීම්වල මුළු එකතුවේ සාමාන්‍ය අගයෙන් සියයට 4.0ක්.	
3. ඉහත (1) සහ (2) මගින් ආවරණය වන තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් සියයට 2ට වඩා වැඩියෙන් නමුත් සියයට 4 නොඉක්මවා තබාගෙන ඇති ශ්‍රී ලංකා රුපියල් කාසි හා නෝට්ටුවල සාමාන්‍යය.	
4. සංචිත නඩත්තු කාලය තුළ පවත්වා ගෙන යා යුතු මුළු සංචිත අවශ්‍යතාවය (1+2-3)	

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි සහ මෙම බැංකුවේ පොත්වලට අනුකූල බව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති නියෝගවලට අනුකූල බව ද අපි / මම සහතික කරමු / කරමි.

....
දිනය නිල මුද්‍රාව

සටහන -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැර වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන තැන්පතු සහ ස්ථාන ගත කිරීම්, නියම කර ඇති අනුපාතවලට අනුව සංචිත අනුපාත පවත්වා ගෙන යෑම සඳහා ගිණුම්ගත කළ යුතුය.

(ආ) සියලු අගයන් ආසන්න රුපියලට දැක්විය යුතුය.

මෙහෙයුම් උපදෙස් අංක : 35/01/005/0007/16 2020 අප්‍රේල් 17

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

සංචිත අවශ්‍යතා : අවම දෛනික තැන්පතු

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනත (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වන අධිකාරිය) සංශෝධිත පරිදි 10(ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ සහ 2013 අප්‍රේල් 12 වැනි දින අංක 1805/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද (ඈ) නිවේදනයේ සඳහන් වන පරිදි සියලුම වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගැනීමට අවශ්‍ය අවම තැන්පතු සම්බන්ධයෙන් වන සංශෝධිත නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. ඉහත (ඈ) රෙගුලාසියේ අංක 06 රෙගුලාසියෙහි සඳහන් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇති පරිදි ඕනෑම දිනක දී වාණිජ බැංකුවක් විසින් පවත්වා ගත යුතු අවම තැන්පතු ප්‍රමාණය සංචිත අවශ්‍යතාවයෙන් සියයට විස්සක් (20%) වේ.

3. ඉහත සඳහන් සංශෝධනය 2020 අප්‍රේල් 16 දිනෙන් ආරම්භ වූ සංචිත කාල පරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වේ. 2013 අප්‍රේල් 22 වැනි දින අංක 35/01/005/0007/06 දරන මෙහෙයුම් උපදෙස්වල අන්තර්ගත අනෙකුත් උපදේශන තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

මෙහෙයුම් උපදෙස් අංක : 35/01/005/0007/17 2020 ජූනි 17

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

සංචිත අවශ්‍යතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනත (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වන අධිකාරිය) සංශෝධිත පරිදි 10 (ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ සහ 2013 අප්‍රේල් 12 වැනි දින අංක 1805/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සංශෝධිත (ඈ) නිවේදනය සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. ඉහත සඳහන් නිවේදනය ප්‍රකාර සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් පවත්වා ගෙන යනු ලබන මුළු තැන්පතු වගකීම්වලින් සියයට දෙකක (2.00%) ප්‍රමාණයක් සංචිතයක් ලෙස පවත්වාගෙන යා යුතුය.

3. 2013 අප්‍රේල් 22 වැනි දින මෙහෙයුම් උපදෙස් අංක 35/01/005/0007/06 හි 5 වන පරිච්ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවලට තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් සියයට දෙකක (2.00%) ප්‍රමාණය ඉක්මවා ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු හා කාසි ස්වරූපයෙන් පවත්වා ගත හැකි ය. කෙසේ වුව ද, සංචිත ගණනය කිරීම සඳහා ස්වකීය සංචිතවල පවත්වා ගත හැකි මුදල් නෝට්ටු හා කාසි ප්‍රමාණය ලෙස සලකා බැලෙන්නේ එම සියයට දෙක (2.00%) ඉක්මවා ඇති මුදල් නෝට්ටු හා කාසි ප්‍රමාණයෙන් සියයට එකක් (1.00%) පමණි. එවැනි මුදල් නෝට්ටු හා කාසි ස්වරූපයෙන් තබා ගත හැකි සංචිත ප්‍රමාණය ඊට අදාළ ගණනය කිරීමේ කාලපරිච්ඡේදයේ නෝට්ටු හා කාසිවල සාමාන්‍යය විය යුතු ය.

4. 2020 මාර්තු 17 වැනි දින මෙහෙයුම් උපදෙස් අංක 35/01/005/0007/15 හි (අ) උපලේඛනය මෙහි අමුණා ඇති (අ) උපලේඛනය ලෙස ප්‍රතිස්ථාපනය වේ.

5. ඉහත සඳහන් සංශෝධනය 2020 ජූනි 16 දිනෙන් ආරම්භ වූ සංචිත කාල පරිච්ඡේදයේ සිට බලපැවැත්වෙනු ඇත. 2013 අප්‍රේල් 22 වැනි දින අංක 35/01/005/0007/06 දරන මෙහෙයුම් උපදෙස්වල අඩංගු අනෙකුත් සංශෝධිත උපදේශන තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

සී.ඒ. අබේසිංහ
අධ්‍යක්ෂ / දේශීය මෙහෙයුම් කටයුතු

'අ' උපලේඛනය

වාර්තා කිරීමේ ආකෘතිය

දෛනික තැන්පතු වගකීම් සාමාන්‍ය පිළිබඳ වාර්තාව

බැංකුවේ නම : .....

කාල වකවානුව : ..... සිට ..... දක්වා

(දිනය) (දිනය)

වෙත : අධ්‍යක්ෂ,
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

ඉහත දක්වා ඇති කාල පරාසයේ එක් එක් දිනයට අදාළ දෛනික ව්‍යාපාර කටයුතු අවසානයේ දී, බැංකුවේ පොත්වල සඳහන් තැන්පතු ශේෂය පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට තැන්පතු වගකීම් හි සාමාන්‍යය වාර්තා කළ යුතුය.

(i)	(ii)	(iii)	(iv)
ඉල්ලුම් තැන්පතු	**කාලීන හා ඉතුරුම් තැන්පතු**	**ණයවර ලිපි / ප්‍රතිග්‍රහණය මත ලියවිලි සඳහා ආන්තික අවශ්‍යතාව**	**අනෙකුත් සියළුම තැන්පතු වගකීම්[1]**

1. තැන්පතු සහතික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල විය යුත්තේ ප්‍රකාශ කළ වටිනාකමයි.

සංචිත අවශ්‍යතා

අදාළ සංචිත කාල පරිච්ඡේදය : .....

අයිතමය	අගය ශ්‍රී ලංකා රුපියල්
1. ණයවර ලිපි සඳහා වන සියයට 100ක සාමාන්‍ය දෛනික සමස්ත ආන්තික අවශ්‍යතාව පහත දක්වා ඇති ණයවර ලිපි සඳහා අවස්ථානෝචිතව සුදුසු පරිදි : (අ) (i) 2018 සැප්තැම්බර් මස 19 දින අංක 35/01/005/0010/20 දරන "මෝටර් රථ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව හෝ (ii) 2018 සැප්තැම්බර් මස 29 දින අංක 35/01/005/0010/21 දරන "මෝටර් රථ හා අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මගින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව. (ආ) 2018 ඔක්තෝබර් මස 11 දින චක්‍රලේඛ අංක 2 දරන ප්‍රතිග්‍රහණය මත ලියකියවිලි ලබා දීමේ කොන්දේසිය අනුව සිදු කරන ආනයන සඳහා වන ආන්තික අවශ්‍යතාව.	
2. ඉහත අංක 1 හැර දෛනික රුපියල් තැන්පතු වගකීම්වල මුළු එකතුවේ සාමාන්‍ය අගයෙන් සියයට 2.0ක්.	
3. ඉහත (1) සහ (2) මගින් ආවරණය වන තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් සියයට 2ට වඩා වැඩියෙන් නමුත් සියයට 3 නොඉක්මවා තබාගෙන ඇති ශ්‍රී ලංකා රුපියල් කාසි හා නෝට්ටුවල සාමාන්‍යය.	
4. සංචිත නඩත්තු කාලය තුළ පවත්වා ගෙන යා යුතු මුළු සංචිත අවශ්‍යතාවය (1+2-3)	

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි සහ මෙම බැංකුවේ පොත්වලට අනුකූල බව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ තත් කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති නියෝගවලට අනුකූල බව ද අපි / මම සහතික කරමු / කරමි.

....

දිනය නිල මුද්‍රාව

සටහන -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැර වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන තැන්පතු සහ ස්ථාන ගත කිරීම්, නියම කර ඇති අනුපාතවලට අනුව සංචිත අනුපාත පවත්වා ගෙන යෑම සඳහා ගිණුම්ගත කළ යුතුය.

(ආ) සියලු අගයන් ආසන්න රුපියලට දැක්විය යුතුය.

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/001 2020 ජූනි 18

සියලුම සහභාගිත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,

රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා දෙනු ලබන ද්‍රවශීලතා පහසුකම

1. **හැඳින්වීම**

1.1 කොරෝනා (කොවිඩ් 19) වසංගතයේ බලපෑමට ලක්වූ ඉදිකිරීම් ක්ෂේත්‍රය නැවත පණගැන්වීම ජාතික අවශ්‍යතාවක් ලෙස හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රජයේ උපදෙස්වලට අනුකූලව මූල්‍ය අංශය සඳහා සහන සැලසීමට ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වා දෙන ලදී.

1.2 ඒ අනුව, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සහනදායී පොලී අනුපාතිකයකට, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරන පොරොන්දු නෝට්ටුවක් මත දින 180ක කාලයක් දක්වා එම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කඩිනම් ද්‍රවශීලතා පහසුකමක් ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

1.3 කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අහිතකර බලපෑමට ලක්වූ ඉදිකිරීම් ක්ෂේත්‍රය වෙත රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත ණය පහසුකම් ලබා දීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙම මෙහෙයුම් උපදෙස් නිකුත් කරනු ලැබේ.

1.4 ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුකරන ලද කොන්ත්‍රාත් කටයුතු වෙනුවෙන් නොපියවූ ගෙවීම් හේතුවෙන් පැනනැගී ඇති අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා වන ද්‍රවශීලතා ආධාරක පහසුකමක් ලෙස මෙම පහසුකම ක්‍රියාත්මක වනු ඇත.

2. **ද්‍රවශීලතා පහසුකමෙහි මූලික අංග**

2.1 2020 ජූනි මස 18 දින සිට නැවත දැනුම් දෙන තුරු මෙම මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙනු ඇත.

2.2 මුදල් නීති පනතේ 83 (I) සී (II) කොටස යටතේ 83 (2) කොටසෙහි අවශ්‍යතාවන්ට යටත්ව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන වෙත රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුවක් මහ බැංකුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සියයට 1ක සහනදායී වාර්ෂික පොලී අනුපාතිකයකට වාණිජ බැංකුවලට දින 180ක කාලසීමාවක් දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය පහසුකම ලබා දෙනු ලබයි. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් එවැනි නව පොරොන්දු නෝට්ටු ඉදිරිපත් කිරීම මත නැවත නව ණය පහසුකම් ලබා දීමට අවස්ථාව ලැබේ.

2.3 බලපත්‍රලාභී වාණිජ බැංකු මෙම පහසුකම ලබා ගැනීම සඳහා රජයෙන් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන විසින් ලබා ගන්නා ලද ණය පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබීමට සැලැස්විය යුතුය. ඇමුණුම් අංක I පරිදි, නිවැරදිව සම්පූර්ණ කරන ලද ලේඛනයෙහි බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි බලයලත් නිලධාරීන් විසින් අත්සන් කළ දෘඩ පිටපත (Hard Copy) අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඇමුණුම් අංක I හි මෘදු පිටපත (Soft Copy) එම අවස්ථාවේදී ම අදාළ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතුය. වාණිජ බැංකු විසින් ඇමුණුම් අංක I හි සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාව සහ අනුකූලතාව තහවුරු කළ යුතුය.

2.4 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන ඇමුණුම් අංක II හි දැක්වෙන පරිදි අදාළ පොරොන්දු නෝට්ටු සමඟ ඇමුණුම් අංක I ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු විසින් පොරොන්දු නෝට්ටු මුහුණත වටිනාකමින් සියයට 99ක් නොඉක්මවන මුදලක් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි පියවීම් ගිණුම වෙත බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

2.5 මෙම පහසුකම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සියයට 3ක් නොඉක්මවන පොලී ආන්තිකයක් පවත්වා ගෙන යා හැකි අතර, එමගින් මෙම ණය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන සඳහා සියයට 4ක් නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතිකයකට ණය ලබා ගත හැකි විය යුතුය.

2.6 ඇප වශයෙන් තබන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර කල්පිරෙන දිනයේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, ලබා දෙන ලද මුදල සහ ඊට අදාළ පොලී ප්‍රමාණය තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි ඇති අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි පියවීම් ගිණුමෙන් හර කර ගනු ලැබේ.

2.7 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරියට යෙදී ඇති කල්පිරීම් සම්බන්ධ තොරතුරු පොරොන්දු නෝට්ටු / ඇපකර කල්පිරීමට සති දෙකක කාලයකට පෙර, අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

2.8 ඇප වශයෙන් තබන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර රජය විසින් නියමිත පරිදි ගෙවූ අවස්ථාවක දී, බලපත්‍රලාභී වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ පියවීම කඩිනමින් සිදු කළ යුතුය.

2.9 මෙම මෙහෙයුම් උපදෙස් යටතේ ලබා ගත් අරමුදල්වල භාවිතය පිළිබඳ තොරතුරු වාර්තාවක් දෙසතියකට වරක් ඇමුණුම් අංක II පරිදි, සෑම මසකම 15 වන දින සහ 30 වන දිනෙන් පසුව එළඹෙන වැඩ කරන දින 3ක් ඇතුළත, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

2.10 බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම පහසුකම ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරනු ලබයි.

සී.ඒ. අබේසිංහ
අධ්‍යක්ෂ / දේශීය මෙහෙයුම් කටයුතු

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/001 **ඇමුණුම I**

රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම

බැංකුවේ නම :

කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද ණය පිළිබඳ තොරතුරු									
	බැංකුව විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව					රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව / ඇපකර			
	යොමු අංකය (ඇමුණුම II පරිදි)	නිකුත් කළ දිනය	කල්පිරෙන දිනය	වටිනාකම (රු.)	මහ බැංකුවෙන් ඉල්ලුම් කරන ලද ප්‍රමාණය (රු.)	යොමු අංකය	කොන්ත්‍රාත්කරුගේ නම	වටිනාකම (රු.)	නිකුත් කළ දිනය
1									
2									
3									
4									
5									

....

දිනය පරීක්ෂා කළේ අනුමත කළේ

මෙම තොරතුරු විද්‍යුත් තැපෑල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.

ඇමුණුම II

පොරොන්දු නෝට්ටු අංකය:
.....
(බැංකුව විසින් නිකුත් කරන ලද)

පොරොන්දු නෝට්ටුව

කොළඹ

දිනය : 2020/ /

රු. .....

..... (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය), රුපියල් ..... (රු. .....) මුදලක් මෙහි දානමයේ සිට දින 180කින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට හෝ එහි අණට වාර්ෂිකව සියයට 1ක ප්‍රතිශතයක් (1%) වූ පොලිය සමඟ ගෙවීමට පොරොන්දු වේ.

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම

මුද්දර

බලයලත් නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව

සාක්ෂිකරුවන් : 1. .....

2. .....

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

මහ බැංකුවේ යොමු අංකය:

කල්පිරෙන දිනය:

පොලිය සමඟ මුළු මුදල (රුපියල්) :

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/001 ඇමුණුම III

රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම

බැංකුවේ නම :

ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම භාවිතය පිළිබඳ දෙසති වාර්තාව									
	බැංකුව විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව			රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව / ඇපකර					
	යොමු අංකය (ඇමුණුම II පරිදි)	කල්පිරෙන දිනය	දෙන ලද ණය මුදල (රු.)	යොමු අංකය	කොන්ත්‍රාත්කරුගේ නම	මුහුණත වටිනාකම (රු.)	නිකුත් කළ දිනය	කල්පිරෙන දිනය	2020.....දිනට නොපියවූ ණය ප්‍රමාණය
1									
2									
3									
4									
5									

....

දිනය පරීක්ෂා කළේ අනුමත කළේ

මෙම තොරතුරු විද්‍යුත් තැපෑල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/016/007/006 2020 ජූනි 29

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

විවට වෙළඳ කටයුතු යටතේ නිත්‍ය පහසුකම සඳහා පවතින පද්ධතිය තුළ හඳුන්වා දෙන ලද නවීකරණ

2016 ඔක්තෝබර් 26 දින නිකුත් කරන ලද විවට වෙළඳ කටයුතු යටතේ ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්වල අංක 35/03/016/001/001 දරන චක්‍රලේඛය සහ ඉන්පසුව කරන ලද සංශෝධන හා සම්බන්ධවයි.

2020 ජූලි 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි විවට වෙළඳ කටයුතු යටතේ ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්වල අඩංගු නිත්‍ය පහසුකම සඳහා වන වගන්ති පහත පරිදි සංශෝධනය වේ.

30 වන වගන්තිය :

සහභාගිත්ව ආයතනවලට ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් තැන්පත් කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ද අදාළ සුරැකුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු අරමුදල් ණයට ගැනීම සඳහා නිත්‍ය ණය පහසුකම ද දෛනික පහසුකම් ලෙස භාවිතා කළ හැකිය. නිත්‍ය පහසුකම යටතේ තැන්පත් කරන හෝ ණයට ගන්නා අරමුදල් ප්‍රමාණය එකී ආයතනවල අභිමතය මත සිදුවේ. විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිත්‍ය තැන්පතු පහසුකම / නිත්‍ය ණය පහසුකම යටතේ තැන්පතු / ඉල්ලුම් කරන ප්‍රමාණය පිළිබඳ සූචණ වගකීම සහභාගිත්ව ආයතනය සතු වේ. ඒ අනුව, අදාළ තැන්පතු / ඉල්ලුම් කළ ප්‍රමාණය පද්ධතිය හරහා නියමිත වේලාවට ස්වයංක්‍රීයව අනුමත වනු ඇත.

31 වන වගන්තිය :

නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන එම ගනුදෙනුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියට 15:30 පැය වන විට ඇතුළත් කළ යුතුය.

41 වන වගන්තිය :

නිත්‍ය ණය පහසුකම ලබා ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන එම ගනුදෙනුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියට 15:30 පැය වන විට ඇතුළත් කළ යුතුය.

විවට වෙළඳ කටයුතු යටතේ ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්හි අඩංගු වන නිත්‍ය පහසුකම සඳහා අදාළ වන කලින් කලට සිදු කරන ලද සංශෝධන සහිතව අනෙකුත් සියලුම වගන්ති නොවෙනස්ව පවතිනු ඇත.

අධ්‍යක්ෂ / දේශීය මෙහෙයුම් කටයුතු

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/002 2020 ජූලි 03

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම

'රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු / ඇපකර මත ඉදිකිරීම් අංශය සඳහා දෙනු ලබන ද්‍රවශීලතා පහසුකම' පිළිබඳව 2020 ජූනි මස 18 වන දින නිකුත් කරන ලද අංක 35/03/023/0001/001 දරන මෙහෙයුම් උපදෙස් වෙනුවට මෙම මෙහෙයුම් උපදෙස් බලපැවැත්වේ.

මෙම මෙහෙයුම් උපදෙස් 2020 ජූලි 03 වන දින සිට නැවත දැනුම් දෙනු ලබන තෙක් බලපැවැත්වෙනු ඇත.

1. හැඳින්වීම

1.1 කොරෝනා (කොවිඩ්-19) වසංගතයේ බලපෑමට ලක්වූ ආර්ථික කටයුතු යළි පණගැන්වීම ජාතික අවශ්‍යතාවක් ලෙස හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රජයේ උපදෙස්වලට අනුකූලව ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා සහන සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ

බැංකු හරහා ද්‍රවශීලතා පහසුකමක් හඳුන්වා දෙන ලදි.

1.2 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශයේ ආයතන සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් අරමුදල් සපයා ගැනීමට ද්‍රවශීලතා පහසුකමක්, පළමුව 2020 ජූනි 16 සහ ඉන්පසුව 2020 ජූනි 26 වැනි දින මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 83 (I) කොටස යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා සහනදායී පොලී අනුපාතිකයක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය පහසුකම් ලබා ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තමන් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ඇප වශයෙන් තැබූ පොරොන්දු නෝට්ටුවක් ඉදිරිපත් කළ යුතුය.

1.3 ඒ අනුව, 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා ණය ලබා දීම සහ සහනදායී පොලී අනුපාතිකයක් යටතේ වාණිජ බැංකුවලට ඉදිකිරීම් අංශය සඳහා වන ද්‍රවශීලතා පහසුකම මහ බැංකුව වෙතින් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මෙම මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදි.

2. ද්‍රවශීලතා පහසුකමෙහි මූලික අංග

2.1 පෙර ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති උදෙසා ශ්‍රී ලංකා රජය විසින් ඉදිකිරීම් අංශයේ ආයතන සඳහා නොපියවූ ශේෂයන් හේතුවෙන් එම ආයතනවලට ඇති වී තිබෙන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමේ පහසුකමක් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන මෙම ද්‍රවශීලතා පහසුකම සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කෙරේ.

2.2 ඉදිකිරීම් අංශය සඳහා වන මෙම ද්‍රවශීලතා පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගන්නා සෑම අවස්ථාවකදී ම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමඟ ණය ගිවිසුමකට සහ ඇප ගිවිසුමකට එළඹිය යුතු වේ.

2.3 මුදල් නීති පනතේ 83 (I) කොටසෙහි ප්‍රතිපාදනවලට යටත්ව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන වෙත 'කොන්ත්‍රාත්කරුවන් සඳහා නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඇප සුරැකුම් ලෙස භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත පදනම් වූ පොරොන්දු නෝට්ටුවක් මහ බැංකුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සියයට 1ක සහනදායී වාර්ෂික පොලී අනුපාතිකයකට දින 180ක කාලසීමාවක් දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට මෙම ණය පහසුකම ලබා දෙනු ලබයි. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ඇප මත එවැනි නව පොරොන්දු නෝට්ටු ඉදිරිපත් කිරීම හරහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නැවත නව ණය පහසුකම් ලබා ගැනීමට අවස්ථාව ලැබේ.

2.4 මෙම පහසුකම මත බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සියයට 3ක් නොඉක්මවන පොලී ආන්තිකයක් පවත්වා ගත හැකි අතර, එමගින් ඉදිකිරීම් අංශයේ ආයතන සඳහා සියයට 4ක් නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ ණය ලබා ගැනීමට හැකි විය යුතුය.

3. ප්‍රධාන මෙහෙයුම් අවශ්‍යතා

3.1 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙම පහසුකම ලබා ගැනීම සඳහා 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ආකෘති පත්‍ර I පරිදි ඉදිකිරීම් අංශයේ ආයතන විසින් ලබා ගන්නා ලද ණය පිළිබඳ තොරතුරු සහ ආකෘති පත්‍ර II පරිදි පොරොන්දු නෝට්ටුවක්, ආකෘති පත්‍ර III පරිදි ඇපකර සඳහා තැබීමට අපේක්ෂිත රජයේ සුරැකුම්පත් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවිය යුතුය. නිවැරදිව සම්පූර්ණ කොට බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි බලයලත් නිලධාරීන් විසින් අත්සන් කළ ආකෘති පත්‍ර I හා II හි දෘඩ පිටපත් (Hard Copies) අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ගිණුම්කරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීමට සියලුම ආකෘති පත්‍රවල මෘදු පිටපත් (Soft Copies) නොපමාව දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

3.2 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඇපකර ලෙස තැබීමට අපේක්ෂිත භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල තොරතුරු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියට (Online Electronic Bidding System) ඇතුළත් කළ යුතු අතර, එවැනි ඇපකර වශයෙන් තැබූ සුරැකුම්පත්වල කල්පිරීමේ කාලය දින 180කට නොඅඩු විය යුතුය. ඇපකර ලෙස තබන සුරැකුම්පත්හි මිල ගණන් නියම කිරීම සඳහා රජයේ සුරැකුම්පත් මිල කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට යොදාගනු ලබන ක්‍රමවේදය ම භාවිතා කරනු ලැබේ.

3.3 නිවැරදිව සම්පූර්ණ කරනු ලැබූ ආකෘති පත්‍ර සහ ගිවිසුම්වල දෘඪ පිටපත් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත එවීමෙන් පසුව ආකෘති පත්‍ර III හි සඳහන් පරිදි ඇපකර වශයෙන් තැබූ සුරැකුම්පත්වල ප්‍රමාණවත්භාවය තහවුරු කොට අදාළ බැංකුවෙහි ජංගම ගිණුම වෙත අරමුදල් බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. කෙසේ වෙතත්, සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර සහ ගිවිසුම්වල දෘඪ පිටපත් 12:00 පැයට පෙර නොලැබුණහොත් එදින ම අරමුදල් පියවනු නොලැබේ.

3.4 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය සුරැකුම්පත් තොගය තුළ ඇප වශයෙන් තැබීමට ප්‍රමාණවත් වන පරිදි සුරැකුම්පත් ප්‍රමාණයක් අරමුදල් මුදාහරින අවස්ථාව වන විට පවත්වා ගත යුතුය. මෙම පහසුකම යටතේ ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන සුරැකුම්පත් ලංකාසෙක්‍යු පද්ධතියෙහි සුරැකුම්පත් පියවීම් ගිණුමට මාරු කරනු ලැබේ.

3.5 පොරොන්දු නෝට්ටු / ඇපකර කල්පිරීමට සති දෙකක කාලයකට පෙර, ඉදිරියට යෙදී ඇති කල්පිරීම් සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

3.6 ණය කල්පිරෙන දිනයේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලද අරමුදල් ප්‍රමාණය සහ ඊට අදාළ පොලී ප්‍රමාණය අදාළ වාණිජ බැංකුවේ ජංගම ගිණුමෙන් හර කරනු ඇත. 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' අනුව රජය විසින් නියමිත පරිදි හිඟ ගෙවීම් ගෙවූ අවස්ථාවක දී, බලපත්‍රලාභී වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල සහ ඊට අදාළ පොලිය පියවීම කඩිනමින් සිදු කළ යුතුය.

3.7 'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශයේ ආයතන වෙත ලබා දුන් අරමුදල් ද්‍රවශීලතා පහසුකම යටතේ ඉදිකිරීම් අංශය සඳහා ලබා දුන් බවට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තහවුරු කළ යුතුය.

3.8 මෙම මෙහෙයුම් උපදෙස් යටතේ ලබා ගත් අරමුදල්වල භාවිතය පිළිබඳ තොරතුරු වාර්තාවක් දෙසතියකට වරක් එනම් සෑම මසකම 15 වන දින සහ 30 වන දිනෙන් පසුව එළඹෙන වැඩ කරන දින 3ක් ඇතුළත, ඇමුණුම් අංක II පරිදි දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

3.9 බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම පහසුකම ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරනු ලබයි.

සී.ඒ. අබේසිංහ
අධ්‍යක්ෂ / දේශීය මෙහෙයුම් කටයුතු

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/002 ඇමුණුම I

'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම

බැංකුවේ නම : .....

1. පොරොන්දු නෝට්ටු අංකය:
2. පොරොන්දු නෝට්ටුවේ වටිනාකම:
3. නිකුත් කළ දිනය:

කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද ණය පිළිබඳ තොරතුරු							
රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය							
	මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපියේ යොමු අංකය	**කොන්ත්‍රාත්කරුගේ නම**	**බැංකුවේ නම**	**වටිනාකම (රු.)**	**නිකුත් කළ දිනය**	**කල්පිරෙන දිනය**	**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා (මහ බැංකු යොමු අංකය)**
1							
2							
3							
4							
5							

....

දිනය පරීක්ෂා කළේ අනුමත කළේ

මෙම තොරතුරු විද්‍යුත් තැපෑල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.

ඇමුණුම **II**

පොරොන්දු නෝට්ටු අංකය:
.....
(බැංකුව විසින් නිකුත් කරන ලද)

පොරොන්දු නෝට්ටුව

කොළඹ

දිනය : 2020/ /

රු. .....

..... (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය), රුපියල් ..... (රු. .....) මුදලක් මෙහි දානමයේ සිට දින 180කින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට හෝ එහි අණට වාර්ෂිකව සියයට 1ක ප්‍රතිශතයක් (1%) වූ පොලිය සමඟ ගෙවීමට පොරොන්දු වේ.

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම

මුද්දර

බලයලත් නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව

සාක්ෂිකරුවන් : 1. .....

2. .....

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

මහ බැංකුවේ යොමු අංකය:

කල්පිරෙන දිනය:

පොලිය සමඟ මුළු මුදල (රුපියල්) :

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/002 **ඇමුණුම III**

'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම

ඇප වශයෙන් තබන ලද සුරැකුම්පත්වල තොරතුරු:

1. පොරොන්දු නෝට්ටු අංකය:
2. පොරොන්දු නෝට්ටුවේ වටිනාකම:
3. නිකුත් කළ දිනය:

	භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කරවල සුරැකුම්පත් හඳුනා ගැනීම් ජාත්‍යන්තර අංකය (ISIN)	**ඇප වශයෙන් තබන ලද සුරැකුම්පත්වල මුහුණත අගය (රු.)**	**ඇප වශයෙන් තබන ලද සුරැකුම්පත්වල වෙළඳපොළ අගය (රු.)**
1			
2			
3			
4			
5			

....

දිනය අනුමත කළ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව

මෙම තොරතුරු විද්‍යුත් තැපෑල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/002 ඇමුණුම IV

'කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය' මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම

බැංකුවේ නම :

ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම භාවිතය පිළිබඳ දෙසති වාර්තාව									
	බැංකුව විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව			**රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය**					
	යොමු අංකය (ඇමුණුම II පරිදි)	**කල්පිරෙන දිනය**	**දෙන ලද ණය මුදල (රු.)**	**යොමු අංකය**	**කොන්ත්‍රාත්කරුගේ නම**	**මුහුණත වටිනාකම (රු.)**	**නිකුත් කළ දිනය**	**කල්පිරෙන දිනය**	**2020.....දිනට නොපියවූ ණය ප්‍රමාණය (රු.)**
1									
2									
3									
4									
5									

....

දිනය පරීක්ෂා කළේ අනුමත කළේ

මෙම තොරතුරු විද්‍යුත් තැපෑල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/003 2020 ජූලි 24

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම සඳහා වන මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

1. ඉදිකිරීම්, ඖෂධ සහ අනෙකුත් හඳුනාගත් අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව "ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම" යටතේ සපයනු ලබන ණය පහසුකමින් ආවරණය වන පරාසය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පුළුල් කරන ලද බව මෙමගින් දැනුම් දෙනු ලැබේ.
2. ඒ අනුව, 2020 ජූලි 03 වැනි දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අංක 35/03/023/0001/002 හි සඳහන් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම "රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව ඉදිකිරීම්, ඖෂධ අංශ සහ අනෙකුත් හඳුනාගත් අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම" නමින් නම් කරනු ලැබේ.
3. ඉහත සඳහන් කළ සංශෝධනයන්ට අනුව මෙහෙයුම් උපදෙස් අංක 35/03/023/0001/002 හි අඩංගු විධිවිධාන සහ ආකෘති පත්‍ර, ඉදිකිරීම්, ඖෂධ සහ අනෙකුත් හඳුනාගත් අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන්ට සහ සැපයුම්කරුවන්ට අදාළ ණය පහසුකම සඳහා නිකුත් කළ මෙහෙයුම් උපදෙස්වලට අදාළ වේ.
4. මෙම පහසුකම යටතේ සඳහන් "අනෙකුත් හඳුනාගත් අංශ", අවශ්‍යතාව මත මුදල් මණ්ඩලය විසින් විටින් විට තීරණය කරනු ලබන අතර, එවැනි තීරණ අවශ්‍ය පරිදි දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ / දේශීය මෙහෙයුම් කටයුතු

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 01 දරන විධානය

සංචරණ අරමුණු සඳහා විදේශ විනිමය නිදහස් කිරීම සම්බන්ධයෙන්
බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් වන 2017 අංක 01 දරන 2017.11.20 දිනැති විධානයේ II වන උපලේඛනයෙහි 3.1.1 පරිච්ඡේදය මෙයින් අවලංගු කරන අතර, 2020.03.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම පරිච්ඡේදය වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ වන බව සියළුම බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

3.1.1 සංචාරක, ව්‍යාපාරික, පුහුණු, විදෙස් වෛද්‍ය ප්‍රතිකාර ආදී ඕනෑම අරමුණක් සඳහා විදෙස් ගත වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට අදාළ තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන අවස්ථාවකදී ගමන් බලපත්‍රය මත සිදු කරනු ලබන උචිත සටහන් යෙදීමක් සමඟ බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් ඇ.එ.ජ. ඩොලර් 5,000 ක (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන ප්‍රමාණයක) උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් මුදාහළ හැකිය.

(අත්සන් කළේ)
ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 මාර්තු 19

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 02 දරන විධානය

ගෙවීම් මත ලේඛන (DOCUMENTS AGAINST PAYMENTS) සහ විවෘත ගිණුම් (OPEN ACCOUNT PAYMENTS) ක්‍රම යටතේ වූ ආනයනයන් සඳහා සිදු කරන ගෙවීම්වලට අදාළව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානය.

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව වහාම ක්‍රියාත්මක වන පරිදි, 1988 අංක 30 දරන බැංකු පනතේ ආනයනය සහ විදේශ ව්‍යවහාර මුදල් ආයෝජන සීමා කිරීමට පියවර ගැනීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 01 දරන බැංකු පනතෙහි විධානයෙහි ඇමුණුම I හි උපලේඛන 'B' යටතේ දක්වා ඇති අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ, ගෙවීම් මත ලේඛන (DOCUMENTS AGAINST PAYMENTS) සහ විවෘත ගිණුම් (OPEN ACCOUNT PAYMENTS) ක්‍රම යටතේ ආනයනය කිරීම් සඳහා වන ගෙවීම්වලට විදේශ විනිමය නිකුත් කිරීමට, 2020 ජූනි 20 දිනය වන තෙක් බලයලත් වෙළෙඳුන් හට අවසර නොමැති බව දන්වා සිටිනු ලැබේ.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 මාර්තු 20

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2169/3 - 2020 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2020.04.02
I වැනි කොටසට (I) වැනි ඡේදය - සාමාන්‍ය
රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

22 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින් 2020.04.02 දින සිට මාස 3ක කාලයක් සඳහා,

i. 2017.11.17 දිනැති, අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද, 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල I වන උපලේඛනයෙහි ප්‍රදනය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන් හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා කරන ගෙවීම්, පහත බැහැර කිරීම් හැර (එවැනි අවශ්‍යතාවයන් පිළිබඳ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වේ නම් පමණක්) අත්හිටවනු ලැබේ.

   අ. විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන

   හෝ

   ආ. ආයෝජිත රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන ආයෝජන

ii. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රේෂණ හැර අනෙකුත් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටවනු ලැබේ ;

iii. 2017.11.17 දිනැති අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන, විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල IV වන උපලේඛනයෙහි ප්‍රදනය කර ඇති පොදු අවසරය යටතේ දූනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් නැවත යැවීම අත්හිටවනු ලැබේ;

iv. සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව ඇ.එ.ජ. ඩොලර් 30,000ක උපරිමය දක්වා සීමා කරනු ලැබේ ;

v. 2017.11.17 දිනැති අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල I වන උපලේඛනයෙහි ප්‍රදනය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවල දී, එක් එක් ආයෝජනය මත පදනම්ව, විදේශ විනිමය පනතෙහි 7 (10) වගන්තිය ප්‍රකාරව අවසර ප්‍රදනය කිරීමෙහි අධිකාරිය මුදල් මණ්ඩලය සතු වේ :

අ. විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම ;

හෝ

ආ. ආයෝජිත රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජන සිදු කිරීම.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 03 දරන විධානයන්

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වැනි වගන්තිය ප්‍රකාරව, 2017 අංක 09 දරන 2017 නොවැම්බර් 20 දිනැති ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් පිළිබඳ නිකුත් කරන ලද විධානයන්හි (5) පරිච්ඡේදය අවලංගු වී පහත සඳහන් ආකාරයට වහාම ක්‍රියාත්මක වන පරිදි ආදේශ වන බව බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් දන්වා සිටිමු.

(5) (I) අවශ්‍ය වූ විටකදී, අවසාන පිළියම වශයෙන්, එලෙස විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර අය කර ගැනීම සිදු කළයුතුය. මේ සඳහා අදාළ ණය ගිවිසුමෙහි එකඟ වූ පරිදි විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියා (එනම් ණය ගැනුම්කරු) තම සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ණය මුදල සම්පූර්ණයෙන් ගෙවීමට විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහයක් නොලබන බවට බලයලත් වෙළෙන්දා තෘප්තිමත් වියයුතු අතර ඒ සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි පවත්වා ගත යුතුය.

(II) ඉහත 5(අ) ට අනුගතවීමේදී, මහ බැංකු අධිපතිවරයා විසින් 2020 මාර්තු 27 දින සියළුම බලයලත් වෙළෙඳුන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත, කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා තනි පුද්ගලයන් වෙත පහසුකම් සැපයීම සඳහා ගනු ලැබූ අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ග සඳහන් කරමින් නිකුත් කරන ලද "ණය හා අත්තිකාරම් වර්ගීකරණය සහ විදේශ ව්‍යවහාර මුදල් ණය නැවත අය කර ගැනීම පිළිබඳ ලිහිල් කිරීම්" ලිපියේ සඳහන් විස්තර පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 අප්‍රේල් 03

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2170/4 - 2020 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2020.04.08
I වැනි කොටස: (I) වැනි ජෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු, 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග

1. ශ්‍රී ලංකාවේ සිටින නේවාසික ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු, ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුරවැසියන්, ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත/ලියාපදිංචි කළ අරමුදල්, සංස්ථාපිත මණ්ඩල, සංගම් සහ ශ්‍රී ලංකාවේ සුභසිද්ධිය පතන වෙනත් පාර්ශ්ව මෙම නියෝගයෙහි දිනයේ සිට මාස හයක කාලයක් තුළ තමන් වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා විදේශයන්ගෙන් ලද ආමුඛ ප්‍රේෂණවලින්, ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දෙකු සමග, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් "විශේෂ තැන්පතු ගිණුම" නම් ගිණුමක් කාලීන තැන්පතු වශයෙන් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට මෙමගින් අවසර දෙනු ලැබේ.

2. විශේෂ තැන්පතු ගිණුමෙහි වැදගත් ලක්ෂණ පහත පරිදි වේ :

   I. අවම කාල සීමාව : මාස හයයි (06);

   II. ගෙවිය යුතු පොලිය : අදාළ බැංකුවෙහි සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා අදාළවන තැන්පතු පොළී අනුපාතවලට වඩා වාර්ෂිකව ප්‍රතිශතාංක එකක් සහ ප්‍රතිශතාංක දෙකක් පිළිවෙලින් මාස 6 ක සහ මාස 12 ක කාල සීමාවක් සහිත විශේෂ තැන්පතු ගිණුම් සඳහා කල්පිරීමේදී ගෙවනු ලැබේ.

   III. අරමුදල් ආපසු යැවීම : කාලීන තැන්පතුව කල්පිරීමේදී විදේශ මුදල් බවට පරිවර්තනය කිරීම සහ ආපසු යැවීම නිදහසේ සිදුකළ හැකිය.

3. විශේෂ තැන්පතු ගිණුම්, 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළකරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල නිශ්චිතව දක්වා ඇති ඕනෑම කාර්ය පටිපාටිමය අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කරනු ඇත.

4. විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ නිර්ණායක, ඒවායෙහි අවසරලත් හර කිරීම් සහ බැර කිරීම්, අදාළ පනතෙහි 9 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද විධානයන්ට අනුකූලව විය යුතු ය.

5. මෙම නියෝගවල කාර්යය සඳහා, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වනුයේ, ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් (ඇ.එ.ජ. ඩොලර්), යූරෝ, ස්ටර්ලිං පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර්, සිංගප්පූරු ඩොලර්, ස්වීඩන ක්‍රෝනර්, ස්විස් ෆ්‍රෑන්ක්, කැනේඩියානු ඩොලර්, හොංකොං ඩොලර්, ජපන් යෙන්, ඩෙන්මාර්ක ක්‍රෝනර්, නෝර්වීජියානු ක්‍රෝනර්, චීන රෙන්මින්බි සහ නවසීලන්ත ඩොලර් ය.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 04 දරන විධානයන්
විශේෂ තැන්පතු ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2020.04.08 දිනැති අංක 2170/4 දරන රජයේ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වැනි වගන්තිය ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකයේ විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙනයාමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලැබේ.

2. සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික පුද්ගලයෙකු;

(ආ) ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුරවැසියන්;

(ඇ) ශ්‍රීලාංකීය සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත/ලියාපදිංචි කළ අරමුදල්, සංස්ථාපිත මණ්ඩල සහ සංගම්;

(ඊ) සුභසිද්ධිය පතන වෙනත් ඕනෑම පාර්ශ්වයක්.

3. විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

(අ) නියෝගවල දිනයේ සිට මාස හයක කාලයක් ඇතුළත විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ යුතුය.

(ආ) විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම කාලීන තැන්පතු ආකාරයෙන් පමණක් සිදු කළ යුතුය. කාලීන තැන්පතු තැබීමට අරමුදල් ලබා ගැනීමේ කාර්යය සඳහා පමණක් ක්‍රියාකාරීත්ව ගිණුම් වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් ඉතුරුම් ගිණුම් ආකාරයෙන් විවෘත කළ හැකිය.

(ඇ) නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.

(ඈ) විශේෂ තැන්පතු ගිණුම් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් හවුල් ගිණුම් ලෙස පවත්වාගෙන යා හැකිය.

4. අවම කාලසීමාව: මාස හයයි (6)

5. ගෙවිය යුතු පොලිය: අදාළ බැංකුවෙහි සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා අදාළ වන තැන්පතු පොළී අනුපාතවලට වඩා වාර්ෂිකව ප්‍රතිශතාංක එකක් සහ ප්‍රතිශතාංක දෙකක් පිළිවෙලින් මාස 6 ක සහ මාස 12 ක කාලසීමාවක් සහිත විශේෂ තැන්පතු ගිණුම් සඳහා කල් පිරීමේදී ගෙවනු ලැබේ.

(සටහන: ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම අතිරේක පොළී ගෙවීම සඳහා වන වියදම් බලයලත් වෙළෙඳුන් හට ප්‍රතිපූර්ණය කරනු ඇත.)

6. අරමුදල් ආපසු යැවීම : කාලීන තැන්පතුව කල්පිරීමේදී විදේශ මුදල් බවට පරිවර්තනය සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම නිදහසේ සිදු කළ හැකිය.

7. අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන විදේශ මුදලින් වූ ආමුඛ ප්‍රේෂණ

(ආ) නියෝගවල දිනයේ සිට මාස හයක කාලයක් තුළ ආමුඛ ප්‍රේෂණ ලෙස ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට ලැබුණු මුදල් වලින් වන මාරු කිරීම්

8. අවසරලත් හර කිරීම්

(අ) තැන්පතුව කල්පිරීමේදී ලද මුදලින් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ

(ආ) විශේෂ තැන්පතු ගිණුම් කාලීන තැන්පතුවල කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට මාරු කිරීම

(ඇ) ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ගෙවීම්

9. අනෙකුත් කොන්දේසි

(අ) සමාන ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමක් හරහා අරමුදල් ලැබෙන්නේ නම්, එම අරමුදල් ශ්‍රී ලංකාවට ආමුඛ ප්‍රේෂණ වශයෙන් ලැබී ඇති බව බලයලත් වෙළෙඳුන් විසින් සහතික කර ගත යුතුය.

(ආ) ඉහත 8 (ඇ) ඡේදය යටතේ ආපසු ලබාගත් අරමුදල් නැවත විශේෂ තැන්පතු ගිණුමකට බැර කිරීමට අවසර නොමැත.

(ඇ) අරමුදල්, නියෝගයට අනුකූලව ගිණුම් හිමියාගේ විශේෂ තැන්පතු ගිණුමට බැර කරන ලද බවට සහ එම ගිණුමෙන් හර කරන ලද බවට, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාගෙන් තහවුරුවක් ලබා ගැනීමට යටත්ව, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දා හැර වෙනත් බලයලත් වෙළෙන්දෙකු හරහා ගිණුම් හිමියාට ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කළ හැකිය.

10. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

(අ) ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතියට අනුව බලයලත් වෙළෙඳුන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපෑල (dfe@cbsl.lk) හරහා එළඹෙන සතියේ 2 වන රාජකාරී දිනය අවසන් වීමට පෙර, සතිපතා තොරතුරු එවීම අවශ්‍ය වේ.

(ආ) ඉහත වාර්තාකරන අවශ්‍යතාවන්ට අනුව, බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත්වලින් අදාල තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 අප්‍රේල් 09

ඇමුණුම 1

විශේෂ තැන්පතු ගිණුම්වල (SDAs - කාලීන තැන්පතු) සතිපතා ප්‍රකාශනය

බැංකුවේ නම :

..... දිනට අවසන් වන සතිය

ව්‍යවහාර මුදල් වර්ගය *	සතිය ආරම්භයේ දී ගිණුම් සංඛ්‍යාව	සතිය ආරම්භයේ දී ශේෂය	බැර කිරීම්			සතිය අවසානයේ දී ශේෂය	සතිය අවසානයේ දී ගිණුම් සංඛ්‍යාව
			ආමුඛ ප්‍රේෂණ **	මාරු කිරීම්			
				ආමුඛ ආයෝජන ගිණුම්වල සිට	අක්වෙරළ බැංකු ඒකකයන්හි ගිණුම්වල සිට		
ඇ.එ.ජ.ඩො.							
යූරෝ							
ශ්‍රී ලංකා රුපියල්							

* අනෙකුත් නම් කරන ලද ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

** විශේෂ තැන්පතු ඉතිරි කිරීමේ ගිණුම් (මෙහෙයුම්)වල සිට මාරු කිරීම් ද ඇතුළත් කරන්න

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් ඉඛිපත කිරීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත්වලින් උපුටාගත්/ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම :

අත්සන :

දිනය :

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව :

අත්සන :

දිනය :

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 05 දරන විධානයන්

ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවේ නියුතු (විගාමිකයන් නොවන) පුද්ගලයන් සඳහා ණය සහ අත්තිකාරම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7(10) වගන්තිය සමග කියැවෙන 9(2) වගන්තිය ප්‍රකාරව, 2017 අංක 10 දරන 2017 නොවැම්බර් 20 දිනැති විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ණය සහ අත්තිකාරම් ලබාදීම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද විධානයෙහි 4 වන පරිච්ඡේදය අවලංගු වී පහත සඳහන් ආකාරයට වහාම ක්‍රියාත්මක වන පරිදි ආදේශ වන බව බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් දන්වා සිටිමු.

4. (I) විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරන ලද ණය සහ අත්තිකාරම්වල කාලසීමාව, ඇපකරය සහ ආපසු ගෙවීම රෙගුලාසිවලට අනුකූල වියයුතුය.

(II) එසේ රෙගුලාසිවලට යටත්ව විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය නැවත අය කර ගත නොහැකි අවස්ථාවකදී අවසාන පිළියම වශයෙන් බලයලත් වෙළෙඳුන් විසින් එම ණය ශ්‍රී ලංකා රුපියල්වලින් අය කර ගත යුතුය. ඒ වෙනුවෙන් බලයලත් වෙළෙඳුන්;

(අ) විදේශ ව්‍යවහාර ණය මුදල් ශ්‍රී ලංකා රුපියල් ණය මුදල් වලට පරිවර්තනය කළයුතුය

(ආ) අදාළ ණය ගිවිසුමෙහි එකඟ වූ පරිදි විදේශ සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයා (එනම් ණය කරු) හට ණය මුදල් නියමිත කාලයට ගෙවීමට තම විදේශ රැකියාවෙන් ප්‍රමාණවත් පරිදි විදේශ විනිමය නොලබන බව හෝ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ශේෂයන් ද ඇතුළුව ප්‍රමාණවත් විදේශ විනිමය වත්කම් නොමැති බව සහ ණය කරු ණය මුදල විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීමට ගතහැකි සියළු පියවර ගත් බවට බලයලත් වෙළෙන්දා තෘප්තිමත් වියයුතු අතර ඒ සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි පවත්වා ගත යුතුය

(III) ඉහත 4 (II) ට අනුගතවීමේදී, මහ බැංකු අධිපතිවරයා විසින් 2020 මාර්තු 27 දින සියළුම බලයලත් වෙළෙඳුන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා තනි පුද්ගලයන් වෙත පහසුකම් සැපයීම සඳහා ගනු ලැබූ අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ග සඳහන් කරමින් නිකුත් කරන ලද "ණය හා අත්තිකාරම් වර්ගීකරණය සහ විදේශ ව්‍යවහාර මුදල් නැවත අය කර ගැනීම පිළිබඳ ලිහිල් කිරීම" ලිපියේ සඳහන් විස්තර පිළිබඳ අවධානය යොමු කළයුතු අතර බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ඒ වෙනුවෙන් නිකුත් කළ වෙනත් වැඩිදුර උපදෙස්/පැහැදිලි කිරීම්වලට අනුගත වීම සිදු විය යුතුය.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 අප්‍රේල් 16

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2182/32 - 2020 ජූලි මස 01 වැනි බදාදා - 2020.07.01

I වැනි කොටසථ (I) වැනි ජෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග

පනතේ විධිවිධාන යටතේ 2020 අප්‍රේල් මස 8 දිනැති අංක 2170/4 *අති විශෙෂ ගැසට් නිවේදනයේ* ප්‍රකාශයට පත් කරන ලද **"විශේෂ තැන්පතු ගිණුම්"** පිළිබඳ නියෝගවලට අමතරව,

1. විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට සුදුසුකම්ලත් සහ 2020 ජනවාරි මස 01 වැනි දින හෝ එදිනට පසුව විදේශයන්හි සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇති ඕනෑම පුද්ගලයෙකුට, **2020 අප්‍රේල් මස 08 වැනි දින සිට මාස 06ක් ඉකුත්වීමට පෙර,** එවැනි පුද්ගලයන් විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් සහ පහත පරිදි ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ විනිමයවලින්, ශ්‍රී ලංකාවේ ඕනෑම බලයලත් වෙළෙන්දෙකු සමග විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබයි.

   (අ) 2017 නොවැම්බර් මස 17 දිනැති අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි ප්‍රකාශයට පත් කර ඇති පනතෙහි 8 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග (සහ ඒ සඳහා වන ඕනෑම සංශෝධනයක්) ප්‍රකාරව, පැමිණෙන තොටුපොළෙහිදී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මත.

   (ආ) එවැනි විදේශ විනිමය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් 15,000ක් හෝ ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් හෝ අඩු ප්‍රමාණයක් වන අවස්ථාවකදී විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට නියමිත බලයලත් වෙළෙන්දා වෙත සුදුසු ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මත.

2. මෙම පනතේ 8 වන වගන්තිය යටතේ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත්කර ඇති, අමාත්‍යවරයා විසින් පනවන ලද නියමයෙහි සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත්ව සහ එවැනි සීමාවන් දක්වා, ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික ඕනෑම තැනැත්තෙක් සන්තකයේ පවතිනවිදේශ ව්‍යවහාර මුදල්වලින්, බලයලත් වෙළෙන්දා හට අරමුදල්වල මූලාශ්‍රය පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, සන්තකයේ ඇති එවැනි විදේශ ව්‍යවහාර මුදල්වලින් **2020 අප්‍රේල් මස 08 වැනි දින සිට මාස 6ක් ඉකුත්වීමට පෙර** ඕනෑම බලයලත් වෙළෙන්දෙකු සමග විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබයි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2182/33 - 2020 ජූලි මස 01 වැනි බදාදා - 2020.07.01

I වැනි කොටසථ (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

8 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මේ නියමය මගින්, ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් -

(අ) යම් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම ;

(ආ) ශ්‍රී ලංකාව තුළ, විදේශ විනිමය තම සන්තකයේ හෝ බැංකු ගිණුමක තබා ගැනීම,

සිදු කිරීමේදී යටත් විය යුතු කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි වන මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි මෙයින් නියම කරනු ලැබේ.

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ, 2017 නොවැම්බර් මස 17 වැනි දින අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයන් මෙයින් අවලංගු කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

I වන කොටස

විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ආනයනය කිරීම සහ අපනයනය කිරීම සම්බන්ධයෙන් වන කාර්යයන්, සීමාවන්, නියමයන් සහ කොන්දේසි.

1. (1) ශ්‍රී ලංකාවෙන් පිටතට යන්නා වූ හෝ ශ්‍රී ලංකාවට පැමිණෙන්නා වූ යම් තැනැත්තකු තමන් විසින් රැගෙන යනු ලබන විදේශ විනිමයේ මුළු අගය එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නේ නම් පිළිවෙලින්, පිටත්වන හෝ පැමිණෙන තොටුපොළෙහි දී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, එම තැනැත්තා විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් ව්‍යවහාර මුදල් නෝට්ටු, බැංකු අණකර, චෙක්පත්, සංචාරක කාඩ්පත් ආදී ආකාරයෙන් වන විදේශ විනිමය ඕනෑම ප්‍රමාණයක් එම තැනැත්තා විසින් රැගෙන යනු ලැබිය හැකි ය.

(2) එසේ වුවද, ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තෙකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු රැගෙන යාමට අදහස් කරනු ලබන අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යන තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු රැගෙන යනු ලබන අවස්ථාවකදී එම තැනැත්තා විසින් රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ය.

2. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් රුපියල් 20,000 ක් දක්වා පිළිවෙලින් ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යනු හෝ ශ්‍රී ලංකාව තුළට රැගෙන එනු ලැබිය හැකි ය.

3. යම් බලයලත් වෙළෙන්දෙකු විසින් සිය ව්‍යාපාරය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේදී හෝ ඒ සඳහා සිය බලය ලබා දීමේ නියමයන් තුළ කටයුතු කිරීමේදී අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම කළ හැකි ය.

4. මේ කොටසේ කාර්යය සඳහා :-

"බලයලත් වෙළෙන්ද" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබාදී ඇති අර්ථයම තිබිය යුතු ය.

II වන කොටස

විදේශ විනිමය සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් වන කාර්යයන්, සීමාවන්, නියමයන් හා කොන්දේසි

1. I. ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික යම් තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු වශයෙන් වන විදේශ ව්‍යවහාර මුදල් :

(අ) එම තැනැත්තාගේ විදේශ සංචාර සඳහා එම තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දෙකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දෙකුගෙන් මිලදී ගනු ලැබ, ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේදී භාවිත නොකළ ව්‍යවහාර මුදල් ලෙස ආපසු ගෙන එනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ; හෝ

(ආ) එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තෙකු වෙත විදේශයන්හි ලබාදෙන ලද සේවාව හෝ සපයන ලද භාණ්ඩ සඳහා වන ගෙවීම් ලෙස හෝ වෙනත් යම් නීත්‍යානුකූල මූලාශ්‍රයකින් එම තැනැත්තා ලද විදේශ ව්‍යවහාර මුදල් ; හෝ

(ඇ) සංචාරය කිරීමේ අරමුණ වෙනුවෙන් එම තැනැත්තා විසින් සිය පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් ආපසු ලබා ගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු,

වන්නේ නම්, මෙහි 2 වන ඡේදයේ සඳහන් කාලසීමාව පිළිබඳ සීමාකිරීම් නොසලකා ඕනෑම කාලසීමාවක් දක්වා සිය සන්තකයේ රඳවා ගනු ලැබිය හැකි ය.

II. (අ) තීරුබදු සහන යටතේ ශ්‍රී ලංකාවේ තොටුපළවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරට යන මගීන් වෙත, නේවාසික තත්ත්වය නොසලකමින් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අවසරලත් ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තෙකුට හෝ ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තෙකුට යම් තැනැත්තෙකු විසින් සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා භාරගත් විදේශ ව්‍යවහාර මුදල් එම තැනැත්තා විසින් සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(ආ) එම තැනැත්තා විසින් එසේ භාරගත් විදේශ ව්‍යවහාර මුදල් ඒ පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු එම විදේශ ව්‍යවහාර මුදල් භාරගත් තැනැත්තාගේ නමට පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීමෙන් හෝ බලයලත් වෙළෙන්දෙකුට හෝ පරිසීමිත වෙළෙන්දෙකුට විකිණීමෙන් තොරව, භාරගත් දිනයේ සිට දින 7ක් ඉක්මවන කාලසීමාවක් සඳහා රඳවා තබා නොගත යුතු ය.

III. ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විටදී අත්පත් කරගත් හෝ බලයලත් වෙළෙන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් සමග පවත්වාගෙන යනු ලැබූ විදේශ විනිමය ගිණුම් මගින් අත්පත් කර ගත් විදේශ ව්‍යවහාර මුදල් වන්නේ නම් එම විදේශ ව්‍යවහාර මුදල් එම තැනැත්තා විසින් සීමාවකින් තොරව ශ්‍රී ලංකාව තුළ සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

2. විදේශ විනිමය රඳවා තබා ගැනීමට අදළ කාලසීමාව පහත සඳහන් පරිදි විය යුතු ය :

(1) අදළ තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දගෙන් හෝ පරිසීමිත වෙළෙන්දගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් එකී කාර්යය සඳහා භාවිත නොකරන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් තොරව, එම විදේශ ව්‍යවහාර මුදල් ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබා නොගත යුතු ය.

(2) (අ) අදළ තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දගෙන් හෝ පරිසීමිත වෙළෙන්දගෙන් විදේශ ව්‍යවහාර මුදල් ලබාගෙන ඉන්පසු එකී විදේශ විනිමය හෝ ඉන් කොටසක් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තෙකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් තොරව එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් සඳහා රඳවා තබා නොගත යුතු ය.

(ආ) එසේ වුවද, සංචාරය කිරීමේ අරමුණ සඳහා 1 වන ඡේදයේ I (අ) ඡේදය යටතේ එක්සත් ජනපද ඩොලර් 15,000 ක සමුච්චිත අගයක් දක්වා හෝ ඒ හා සමාන සමුච්චිත අගයකින් යුත් වෙනත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ලබාගත් තැනැත්තෙකුට, එම විදේශ ව්‍යවහාර මුදල් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමග පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීම සඳහා අවසර ලබා දිය යුතු ය.

(3) රැකියාවක් සඳහා, වෘත්තීය කාර්යයක නිරතවීම සඳහා හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට නික්ම ගොස් එකී රැකියාවෙන්, වෘත්තියෙන් හෝ ව්‍යාපාරයෙන් විදේශ ව්‍යවහාර මුදල් උපයාගෙන හෝ ලබාගෙන එම මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තෙකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධානවලට අනුකූලව එම තැනැත්තා විසින් ආරම්භ කර සහ/හෝ පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය ගිණුමකට බැර කිරීමෙන් තොරව එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් සඳහා රඳවා තබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

3. මෙම කොටසේ කාර්යය සඳහා :-

"බලයලත් වෙළෙන්දෑ" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථය තිබිය යුතු ය; සහ

"පරිසීමිත වෙළෙන්දෑ" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දී ඇති බලයලත් වෙළෙන්දෙකු නොවන්නාවූ යම් තැනැත්තෙකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ග අදහස් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2182/37 - 2020 ජූලි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.02

I වැනි කොටස (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

22 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින්,

(i) 2017.11.17 දිනැති, අංක 2045/56 දරන *අති විශේෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද, 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල 1 වන උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා පහත (අ) සිට (ඈ) දක්වා අවශ්‍යතාවයන් ඉටු වන බවට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වන ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටවනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන;

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්;

(ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ. ජ. ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි);

(ඈ) සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා, එ.ජ. ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.

(ii) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ඕනෑම ප්‍රමාණයක් දක්වා අනුමත ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ ඇ. ඒ. ජ. ඩොලර් 20,000 උපරිමයක් දක්වා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හැර මෙම නියමය බලාත්මක වන කාලපරිච්ඡේදය අතරතුර අනෙකුත් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටවනු ලැබේ;

(iii) 2017.11.17 දිනැති අංක 2045/56 දරන *අති විශේෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන, විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල iv වන උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් නැවත යැවීම මෙම නියමය බලාත්මක වන කාලපරිච්ඡේදය අතරතුර ඇ.එ.ජ. ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

(iv) සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව ඇ.එ.ජ. ඩොලර් 30,000 ක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ;

(v) 2017.11.17 දිනැති අංක 2045/56 දරන විශේෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල 1 වන උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවලදී, එක් එක් ආයෝජනය මත පදනම්ව, විදේශ විනිමය පනතෙහි 7(10) වගන්තිය ප්‍රකාරව අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ අයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම;

හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජනයක් සිදු කිරීම.

මෙම නියමය, මෙම නියමයෙහි දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 06 දරන විධානයන්

විශේෂ තැන්පතු ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2020 අප්‍රේල් 08 දිනැති අංක 2170/4 දරන රජයේ ගැසට් පත්‍රයෙහි (අති විශේෂ) පළ කරන ලද නියෝග, 2020 ජූලි 02 දිනැති අංක 2182/32 දරන රජයේ ගැසට් පත්‍රයෙහි (අති විශේෂ) පසුව පළ කරන ලද නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකයෙහි විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙනයාමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලැබේ.

2. **සුදුසුකම් ලත් තැනැත්තන්**

(අ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික පුද්ගලයෙකු;

(ආ) ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුරවැසියන්;

(ඇ) ශ්‍රීලාංකීය සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත/ලියාපදිංචි කළ අරමුදල්, සංස්ථාපිත මණ්ඩල සහ සංගම්;

(ඊ) සුභසිද්ධිය පතන වෙනත් ඕනෑම පාර්ශ්වයක්.

3. **විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම**

(අ) 2020 අප්‍රේල් 8 වනදා සිට මාස හයක කාලයක් ඇතුලත විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ යුතුය.

(ආ) විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම කාලීන තැන්පතු ආකාරයෙන් පමණක් සිදු කළ යුතුය. කාලීන තැන්පතු තැබීමට අරමුදල් ලබා ගැනීමේ කාර්යය සඳහා පමණක් ක්‍රියාකාරීත්ව ගිණුම් වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් ඉතුරුම් ගිණුම් ආකාරයෙන් විවෘත කළ හැකිය.

(ඇ) නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.

(ඈ) විශේෂ තැන්පතු ගිණුම් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් හවුල් ගිණුම් ලෙස පවත්වාගෙන යා හැකිය.

4. **අවම කාලසීමාව:** මාස හයයි (6)

5. **ගෙවිය යුතු පොලිය:** අදාළ බලයලත් වෙළෙන්දා විසින් සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා ගෙවනු ලබන තැන්පතු පොළී අනුපාතවලට අමතරව වාර්ෂිකව ප්‍රතිශතාංක එකක් සහ ප්‍රතිශතාංක දෙකක් (පිළිවෙලින් මාස 6 ක සහ මාස 12 ක කාලසීමාවක් සහිත) විශේෂ තැන්පතු ගිණුම් සඳහා විශේෂ තැන්පතු ගිණුම කල් පිරීමේදී ගෙවනු ලැබේ.

සටහන: තැන්පතුව කල්පිරීමේදී පොලිය ගෙවනු ලබන දිනයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂණය කරනු ලබන දර්ශක අනුපාතයක් භාවිතයෙන් පරිවර්තිත අමතර පොලිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙඳුන් හට ශ්‍රී ලංකා රුපියල් වලින් කලින් කලට ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

6. **අරමුදල් ආපසු යැවීම:** කාලීන තැන්පතුව කල්පිරීමේදී විදේශ මුදල් බවට පරිවර්තනය සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම බාධාවකින් තොරව සිදු කළ හැකිය.

7. **අවසරලත් බැර කිරීම්**

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන විදේශ මුදලින් වූ ආමුඛ ප්‍රේෂණ

(ආ) 2020 අප්‍රේල් 08 වනදා සිට මාස හයක කාලයක් තුළ ආමුඛ ප්‍රේෂණ ලෙස ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට ලැබුණු මුදල් වලින් වන මාරු කිරීම්

(ඇ) පනතෙහි 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද පරිදි, පැමිණෙන තොටුපොළෙහිදී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, 2020 ජනවාරි 01 දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට පැමිණි ගිණුම්හිමියෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කරගන්නා ලද සහ රැගෙන එන ලද විදේශ විනිමය

(ඈ) බලයලත් වෙළෙන්දා හට සුදුසු පරිදි කරනු ලබන ප්‍රකාශයකට යටත්ව, 2020 ජනවාරි 01 දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට පැමිණි ගිණුම්හිමියෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගන්නා ලද සහ රැගෙන එන ලද ඇ.එ.ජ. ඩොලර් 15,000 හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයකට සමාන වන හෝ අඩුවන විදේශ විනිමය

(ඉ) බලයලත් වෙළෙන්දා හට අරමුදල්හි මූලාශ්‍රය පිළිබඳව කරන ලද ප්‍රකාශයකට යටත්ව, පනතෙහි 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද පරිදි එම කොන්දේසි සහ නියමයන්ට යටත්ව සහ එම සීමාවන් දක්වා ගිණුම් හිමියා සන්තකයෙහි ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු

8. **අවසරලත් හර කිරීම්**

(අ) තැන්පතුව කල්පිරීමේදී ලද මුදලින් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ

(ආ) විශේෂ තැන්පතු ගිණුම් කාලීන තැන්පතුවල කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට මාරු කිරීම

(ඇ) ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ගෙවීම්

9. **අනෙකුත් කොන්දේසි**

(අ) සමාන ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමක් හරහා අරමුදල් ලැබෙන්නේ නම්, එම අරමුදල් 2020 අප්‍රේල් 08 වනදා හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවට ආමුඛ ප්‍රේෂණ වශයෙන් ලැබී ඇති බව බලයලත් වෙළෙඳුන් තහවුරු කර ගත යුතුය.

(ආ) අපනයන මගින් ලද සහ ලැබිය යුතු මුදල්, නේවාසික ආයෝජකයන් විසින් සිදු කරන ලද ආයෝජනවල ප්‍රතිලාභ/විකිණීම මගින් ලද මුදල් සහ ලැබිය යුතු මුදල් වෙනත් නියාමන අවශ්‍යතාවන්ට යටත් වන ආමුඛ ප්‍රේෂණ හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවකට යටත් වන වෙනත් ආමුඛ ප්‍රේෂණ, විශේෂ තැන්පතු ගිණුමට බැර කිරීමට සුදුසුකම් නොලබන බව බලයලත් වෙළෙඳුන් තහවුරු කරගත යුතුය

(ඇ) මාස 6 හි අවම කල්පිරීමේ කාලසීමාවට පෙර සිදු කරනු ලබන ආපසු ගැනීම් අධෛර්යමත් කළ යුතුය. විශේෂ තැන්පතු ගිණුම් වලින් කල්පිරීමට පෙර සිදු කරනු ලබන ආපසු ගැනීම් ඉහත 5 වන ඡේදයෙහි පරිදි අමතර පොලියක් ගෙවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබිය යුතුය.

(ඈ) මාස 6 ක කල්පිරීම් කාලයක් සහිත විශේෂ තැන්පතු ගිණුම්, තවත් මාස 6 ක කාලයක් සඳහා පමණක් නැවත ආයෝජනය කළ හැකි අතර මාස 6 ක කාලසීමාවෙහි විශේෂ තැන්පතු ගිණුම සඳහා පිරිනමන ලද අමතර පොලිය සඳහා පමණක් සුදුසුකම් ලබනු ඇත. (එනම් අදාළ බලයලත් වෙළෙන්දා විසින් සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා ගෙවනු ලබන තැන්පතු පොළී අනුපාතවලට වඩා වාර්ෂිකව ප්‍රතිශතාංක එකක්)

(ඉ) බලයලත් වෙළෙඳුන්ට ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම සඳහා ඇපකර වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් සලකා බැලිය හැකිය. තවද, 2017.11.17 දිනැති අංක 2045/56 දරන ගැසට් පත්‍රයෙහි (අතිවිශේෂ) පළ කරන ලද 2017 අංක 01 දරන නියෝගවල අවසර දී ඇති පරිදි ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ඕනෑම පුද්ගලයෙකු හට ණය ප්‍රදානය කිරීමට අදාළ නියෝගවලට යටත්ව, එවැනි පුද්ගලයන් හට ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ ව්‍යවහාර මුදලින් ණය ප්‍රදානය කිරීම සඳහා ඇපකර වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් යෙදා ගත හැකිය.

(ඊ) ඉහත 8 (ඇ) ඡේදය යටතේ ආපසු ලබාගන්නා ලද අරමුදල් විශේෂ තැන්පතු ගිණුමකට නැවත බැර කළ නොහැකිය.

(උ) බැංකු සම්බන්ධතාවක් හේතුවෙන් ගිණුම් හිමියා වෙනුවෙන් ආමුඛ ප්‍රේෂණ වෙනත් බලයලත් වෙළෙන්දෙකු හරහා ලැබෙන්නේ නම්, ආමුඛ ප්‍රේෂණ ලබන බලයලත් වෙළෙන්දා එම අරමුදල් මාරු කරන අවස්ථාවේදී එකී අරමුදල් නියමිත පරිදි ආමුඛ ප්‍රේෂණ ලෙස ලද බවට ප්‍රකාශ කරමින් විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට නියමිත බලයලත් වෙළෙන්දා වෙත තහවුරුවක් නිකුත් කළයුතුය.

(ඌ) අරමුදල්, නියෝගයට අනුකූලව ගිණුම් හිමියාගේ විශේෂ තැන්පතු ගිණුමට බැර කරන ලද බවට සහ එම ගිණුමෙන් හර කරන ලද බවට, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාගෙන් තහවුරුවක් ලබා ගැනීමට යටත්ව, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දා හැර වෙනත් බලයලත් වෙළෙන්දෙකු හරහා ගිණුම් හිමියාට ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කළ හැකිය.

(එ) තැන්පතුව විවෘත කරන අවස්ථාවේදී, බලයලත් වෙළෙඳුන් විශේෂ තැන්පතු ගිණුම්වලට අදාළ නියම සහ කොන්දේසි පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කළ යුතුය.

10. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

(අ) ඇමුණුම 1හි දැක්වෙන ආකෘතියට අනුව බලයලත් වෙළෙඳුන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපෑල (dfe@cbsl.lk) හරහා එළඹෙන සතියේ 2 වන රාජකාරී දිනය අවසන් වීමට පෙර, සතිපතා තොරතුරු එවීම අවශ්‍ය වේ.

(ආ) ඉහත වාර්තාකරන අවශ්‍යතාවන්ට අනුව, බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ.

11. 2020 අප්‍රේල් 09 දිනැති 2020 අංක 04 දරන විධානයන් යටතේ විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද පූර්ව විධානයන් මෙමගින් අවලංගු කරනු ලැබේ.

12. ඉහත 11 වන ඡේදයෙහි දක්වා ඇති පූර්ව විධානයන් අවලංගු කිරීම මගින් එම අවලංගු කිරීමට පෙර ඒවා යටතේ උපචිත යම් අයිතියකට හෝ දැරිය යුතු වූ දඩ මුදල් හෝ වගකීම්වලට බලපෑමක් සිදු නොවිය යුතුය.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 ජුනි 06 වැනි දින

ඇමුණුම I

විශේෂ තැන්පතු ගිණුම්වල (SDAs - කාලීන තැන්පතු) සතිපතා ප්‍රකාශනය

බැංකුවේ නම

..... දිනට අවසන් වන සතිය

ව්‍යවහාර මුදල් වර්ගය *	සතිය ආරම්භයේ දී ගිණුම් සංඛ්‍යාව	සතිය ආරම්භයේදී ශේෂය	බැර කිරීම්				සතිය අවසානයේ දී ශේෂය	සතිය අවසානයේ දී ගිණුම් සංඛ්‍යාව
			ආමුඛ ප්‍රේෂණ **	මාරු කිරීම්		විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු		
				ආමුඛ ආයෝජන ගිණුම්වල සිට	අක්වෙරළ බැංකු ඒකකයන්හි ගිණුම්වල සිට			
ඇ.එ.ජ.ඩො.								
යූරෝ								
ශ්‍රී ලංකා රුපියල්								

* අනෙකුත් නම් කරන ලද ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

** විශේෂ තැන්පතු ඉතිරි කිරීමේ ගිණුම් (මෙහෙයුම්)වල සිට මාරු කිරීම් ද ඇතුළත් කරන්න.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත්වලින් උපුටාගත්/ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම :

අත්සන :

දිනය :

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව :

අත්සන :

දිනය :

විශේෂ තැන්පතු ගිණුම්වල (SDAs - කාලීන තැන්පතු) සතිපතා ප්‍රකාශනය
(අතිරේක පොලිය ප්‍රතිපූර්ණය කිරීමේ අරමුණ සඳහා පුද්ගල තොරතුරු)

බැංකුවේ නම :
වාර්තා කරන වර්ෂය, මාසය සහ සතිය :

															ශ්‍රී.ලං.ම.බැ. විසින් සම්පූර්ණ කළ යුතු
ශාඛාවේ නම	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම**	ගිණුම් හිමියාගේ නේ-වාසිකභාවය	ජා.හැ.අංකය / ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය*	ගිණුම් අංකය	විවෘත කළ දිනය	තැන්පතු මුදල් ප්‍රමාණය (000')	තැන්පතුවේ කාල සීමාව මාසවලින් (මාස 6 / 12)		කල්පිරීමේ දිනය	බැංකුව විසින් දෙන ලද සාමාන්‍ය පොලී අනුපාතය (ශ්‍රී.ලං.ම.බැ. විසින් ලබා දී ඇති අමතර පොලී අනුපාතය හැර)	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති අමතර පොලී අනුපාතය (මාස 6 සඳහා වාර්ෂිකව 1% / මාස 12 සඳහා වාර්ෂිකව 2%)	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොලිය (මුදල් ප්‍රමාණය)	ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගතයුතු පොලිය (මුදල් ප්‍රමාණය)
1	2	3	4	5	6	7	8	9	10		11	12	13	14	15
									6	12					
					USD										
					EUR										
					LKR										

සටහන :

* අනෙකුත් නම් කරන ලද ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

** එකම පුද්ගලයා තැන්පතු කිහිපයක් පවත්වාගෙන යන්නේ නම්, එක් එක් තැන්පතුව සඳහා වෙනම පේළියක් භාවිතා කරන්න.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත්වලින් උපුටාගත් / ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම :

අත්සන :

දිනය :

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව :

අත්සන :

දිනය :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2196/22 - 2020 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා - 2020.10.06

I වැනි කොටස (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග

2020 අප්‍රේල් මස 8 දිනැති අංක 2170/4 *අති විශෙෂ ගැසට්* නිවේදනයේ සහ 2020 ජූලි මස 1 දිනැති අංක 2182/32 *අති විශෙෂ ගැසට්* නිවේදනයේ (නියෝග) ප්‍රකාශයට පත් කරන ලද නියෝගවලට අමතරව, එකී නියෝගවලට යටත්ව විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්, තැන්පතු කල්පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව ද, විශේෂ තැන්පතු ගිණුම් ආකාරයෙන් ම අළුත් කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර දෙනු ලැබේ.

තැන්පතු කල්පිරීමේ දිනය ඉක්මවීමෙන් පසුව පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්, බලයලත් වෙළෙඳුන් විසින් සාමාන්‍ය කාලීන තැන්පතු සඳහා ලබා දෙන පොළී අනුපාත සඳහා පමණක් සුදුසුකම් ලබන අතර, එවැනි විශේෂ තැන්පතු ගිණුම්වල ඇති අරමුදල් කාලීන තැන්පතු වල කල් පිරීම මත විදේශ මුදල් බවට පරිවර්තනය කිරීම සහ ආපසු යැවීම නිදහසේ සිදු කළ හැකිය.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01,
2020 ඔක්තෝබර් මස 06 වැනි දින.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 07 දරන විධානයන්

පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 *අති විශේෂ ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද 2017 අංක 03 දරන විදේශ විනිමය නියෝග (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාම) (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වැනි වගන්ති ප්‍රකාරව, 2017 අංක 03 දරන විධාන සහ නියෝගයෙහි සඳහන් බැර කිරීම් වලට අමතරව, පහත බැර කිරීම් සඳහා පහසුකම් සැලසීමට බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

2. අවසරලත් බැර කිරීම්

අ) 2020 අංක 06 සහ 09 දරන විධානයන් ප්‍රකාරව විශේෂ තැන්පතු ගිණුමක් විවෘත කර පවත්වා ගෙන යනු ලබන ගිණුම් හිමියෙකු පුද්ගලික ව්‍යවහාර ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට ද සුදුසුකම් ලැබූවෙකු වන විට දී එකී විශේෂ තැන්පතු ගිණුම තුළින් එම ගිණුම් හිමියා ලද පොලිය ඇතුළු කල්පිරීමෙන් ලද මුදල්.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 ඔක්තෝබර් 07

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 08 දරන විධානයන්

ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 *අති විශේෂ ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද 2017 අංක 02 දරන විදේශ විනිමය නියෝග (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත 2017 නොවැම්බර් 20 දින නිකුත් කරන ලද 2017 අංක 13 දරන විධානයන් සහ 2018 දෙසැම්බර් 20 දින නිකුත් කරන ලද 2018 අංක 02 දරන විධානයන් සහ නියෝගයන්හි දක්වා ඇති බැර කිරීම් වලට අමතරව, ආමුඛ ආයෝජන ගිණුම් වලට පහත බැරකිරීම් සඳහා පහසුකම් සැලසීමට බලයලත් වෙළෙඳුන් හට මෙමඟින් අවසර ලබා දෙනු ලැබේ.

2. අවසරලත් බැර කිරීම්

අ) නියෝග ප්‍රකාරව, ගිණුම් හිමියා ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම් ලත් තැනැත්තෙකු වන අවස්ථාවක දී, විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳව නිකුත් කරන ලද 2020 අංක 06 සහ 09 දරන විධානයන් ප්‍රකාරව, එම ගිණුම් හිමියා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන විශේෂ තැන්පතු ගිණුම්වල පොලිය ද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල්පිරීමෙන් ලද මුදල්.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 ඔක්තෝබර් 07

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 09 දරන විධානයන්

විශේෂ තැන්පතු ගිණුම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2020 අප්‍රියෙල් 08 දිනැති අංක 2170/4 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද නියෝග, 2020 ජූලි 01 දිනැති අංක 2182/32 දරන *අති විශේෂ ගැසට්* නිවේදනයේ සහ 2020.10.06 දිනැති අංක 2196/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පසුව පළ කරන ලද නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය ප්‍රකාරව, විශේෂ තැන්පතු ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද 2020 ජූලි 06 දිනැති 2020 අංක 06 දරන විධානවල නිශ්චිතව දක්වා ඇති හර කිරීම්වලට අමතරව විශේෂ තැන්පතු ගිණුම්වලින් පහත හර කිරීම් සිදු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට මෙයින් අවසර දෙනු ලැබේ. තවද, 2020 අංක 06 දරන විධානවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට ද බලයලත් වෙළෙඳුන් අනුකූල විය යුතුය.

2. අවසරලත් හර කිරීම්

(අ) 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන *අති විශේෂ ගැසට්* නිවේදනයේ පළ කරන ලද 2017 අංක 2 දරන නියෝග ප්‍රකාරව, ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විශේෂ තැන්පතු ගිණුම් හිමියෙකු නම්, පොලිය ද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල්පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුමකට මාරු කිරීම.

(ආ) 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන *අති විශේෂ ගැසට්* නිවේදනයේ පළ කරන ලද 2017 අංක 3 දරන නියෝග ප්‍රකාරව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විශේෂ තැන්පතු ගිණුම් හිමියෙකු නම්, පොලිය ද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල්පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට මාරු කිරීම.

3. අනෙකුත් කොන්දේසි

(අ) මෙම නියෝග යටතේ විශේෂ තැන්පතු ගිණුම්, තැන්පතු කල්පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව ද "විශේෂ තැන්පතු ගිණුම" නමින් දේශීය බැංකු ඒකකයෙහි, සාමාන්‍ය කාලීන තැන්පතු ලෙස තවදුරටත් පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන්ට හැකියාව ඇත. මෙලෙස තැන්පතු කල්පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම් සඳහා බලයලත් වෙළෙඳුන් විසින් අනෙකුත් කාලීන තැන්පතු සඳහා ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය තැන්පතු පොළී අනුපාත පමණක් ප්‍රදානය කළ යුතුය.

(ආ) විශේෂ තැන්පතු ගිණුම් සඳහා අදාළ වන ලේඛනගත සාක්ෂි ව්‍යවස්ථාපිත ලේඛන රඳවා තබාගැනීමේ කාලය පිළිබඳ අවශ්‍යතාවයන් ඉක්මවා යමින්, එවැනි විශේෂ තැන්පතු ගිණුම් අවසන් කරන තෙක් පවත්වාගෙන යා යුතුය.

4. **වාර්තා කිරීමේ අවශ්‍යතාව**

(අ) මෙම විධානවල ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතියට අනුව බලයලත් වෙළෙඳුන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත dfem@cbsl.lk නමැති විද්‍යුත් ලිපිනය වෙත එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර 2020 ඔක්තෝබර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි මාසිකව තොරතුරු වාර්තා කිරීම අවශ්‍ය වේ.

(ආ) 2020 අංක 6 දරන විධානවල 9 (ඈ) ඡේදයට අනුව විශේෂ තැන්පතු ගිණුම් තවදුරටත් පවත්වාගෙන යන්නේ නම්, බලයලත් වෙළෙඳුන් විසින් එම විධානවල ඇමුණුම 2 හි ඉල්ලා ඇති තොරතුරු වාර්තා කිරීම තවදුරටත් සිදු කරගෙන යාම අවශ්‍ය වේ.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 ඔක්තෝබර් 07

ඇමුණුම I

සාමාන්‍ය කාලීන තැන්පතු ආකාරයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වූ විශේෂ තැන්පතු ගිණුම්වල (SDAs) මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : .....

වාර්තා කරන වර්ෂය සහ මාසය : .....

000’

ව්‍යවහාර මුදල් වර්ගය*	මාසය ආරම්භයේදී ගිණුම් සංඛ්‍යාව	මාසය ආරම්භයේදී ශේෂය	මාසය තුළ සාමාන්‍ය කාලීන තැන්පතු ආකාරයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වූ විශේෂ තැන්පතු ගිණුම්		හර කිරීම්					මාසය අවසානයේදී ශේෂය	මාසය අවසානයේදී ගිණුම් සංඛ්‍යාව
			ගිණුම් සංඛ්‍යාව	මුදල් ප්‍රමාණය	ශ්‍රී ලංකාව තුළදී සිදු කරන ලද ආපසු ගැනුම්	ප්‍රතිමුඛ ප්‍රේෂණ	මාරුකිරීම්				
							ආමුඛ ආයෝජන ගිණුම්වලට	පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට	අක්වෙරළ බැංකු ඒකකයේ ගිණුම්වලට		
USD											
EUR											
LKR											

* අනෙකුත් නම් කරන ලද ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

ඉහත පරිදි සකස්කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත්වලින් උපුටාගත් / ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම:
අත්සන:
දිනය:

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව:
අත්සන:
දිනය:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2202/7 - 2020 නොවැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2020.11.17

I වැනි කොටසට (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

1. 2020 අප්‍රේල් මස 8 වන දින අංක 2170/4 දරන රජයේ *(අති විශෙෂ) ගැසට්* පත්‍රයෙහි පළකරන ලද නියෝග පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි දැක්වෙන "මාස හයක" යන වචන, මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට "මාස දොළහක" යන වචන ආදේශ කරනු ලැබේ.

2. 2020 ජූලි මස 1 වන දින අංක 2182/32 දරන රජයේ *(අති විශෙෂ) ගැසට්* පත්‍රයෙහි පළකරන ලද නියෝග පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි සහ 2 වන ඡේදයෙහි දැක්වෙන "මාස 6ක්" යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට "මාස 12ක්" යන වචන ආදේශ කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2020 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 10 දරන විධානයන්

විශේෂ තැන්පතු ගිණුම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/7 දරන රජයේ ගැසට් පත්‍රයෙහි (අතිවිශේෂ) පළ කරන ලද නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය ප්‍රකාරව, 2020 අංක 06 දරන විධානයන් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. තවද, බලයලත් වෙළෙඳුන් මෙම විධානවල 3 වන ඡේදය යටතේ දක්වා ඇති අනෙකුත් කොන්දේසිවලට අනුකූල වීම අවශ්‍ය වේ.

2. 2020 අංක 06 දරන විධානයන්

2.1 3(අ) සහ 7(ආ) ඡේදවල දැක්වෙන "හය" යන වචනය මෙමගින් ඉවත් කරනු ලබන අතර, එම වචනය වෙනුවට "දොළහ" යන වචනය ආදේශ කරනු ලැබේ.

3. අනෙකුත් කොන්දේසි

3.1 සුදුසුකම්ලත් පුද්ගලයෙකුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කරන ලද, 2020 අප්‍රියෙල් 08 දිනැති අංක 2170/4 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග යටතේ 2020 ඔක්තෝබර් 07 සිට 2020 ඔක්තෝබර් 12 දක්වා කාල පරිච්ඡේදය තුළ විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමේ අරමුණ සඳහා ආමුඛ ප්‍රේෂණ ලෙස ලද අරමුදල් වලින් එම ආමුඛ ප්‍රේෂණ ලැබී ඇත්තේ විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමේ අරමුණ සඳහා පමණක්ම බවට සෑහීමට පත්වීම මත බලයලත් වෙළෙඳුන්ට එම සුදුසුකම්ලත් පුද්ගලයන් සඳහා විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ හැකිය.

4. වාර්තාකිරීමේ අවශ්‍යතාව

4.1 විශේෂ තැන්පතු ගිණුම් සම්බන්ධයෙන් වන 2020 අංක 06 දරන විධානයන් සහ 2020 අංක 09 දරන විධානයන් යටතේ දක්වා ඇති වාර්තාකිරීමේ අවශ්‍යතාවන් මෙමඟින් ඉවත් කරනු ලැබේ.

4.2 බලයලත් වෙළෙඳුන් විසින් dfem@cbsl.lk විද්‍යුත් තැපෑල හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත පහත පරිදි විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳ තොරතුරු සැපයීම අවශ්‍ය වේ.

i. එළඹෙන සතියේ 2 වන රාජකාරි දිනය අවසන් වීමට පෙර, මෙම විධානවල ඇමුණුම I හි දැක්වෙන ආකෘතියට අනුව, සතිපතා

ii. එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර, මෙම විධානවල ඇමුණුම II හි දැක්වෙන ආකෘතියට අනුව, මාසිකව

4.3 ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට අනුව, බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 නොවැම්බර්

විශේෂ තැන්පතු ගිණුම්වල සතිපතා ප්‍රකාශනය - කාලීන තැන්පතු

අංක 10 දරන විධානවල ඇමුණුම I

බැංකුවෙහි නම:

වාර්තා කරන සතිය, මාසය සහ වර්ෂය:

1 වන වගුව - සතිය තුළ විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම*	ගිණුම් හිමියාගේ නේවාසිකභාවය**	ජා.හැ.ප/ විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	විවෘත කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	තැන්පතු කාලසීමාව මාසවලින් (අදාළ තීරය සලකුණු කරන්න)		තැන්පතු කාලසීමාව මාසවලින් (අදාළ තීරය සලකුණු කරන්න) (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද අමතර පොලිය හැර) (වාර්ෂිකව %)	අදාළ අමතර පොළී අනුපාතය (මාස 6ක් සඳහා වාර්ෂිකව 1% හෝ මාස 12ක් සඳහා වාර්ෂිකව 2%)	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොලිය (ප්‍රමාණය)	ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හිමිකම් පෑ යුතු පොලිය (ප්‍රමාණය)
									6	12					

1(අ) වන වගුව ඉහත 1 වන වගුවෙහි වාර්තා කර ඇති, සතිය තුළ විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්වල අරමුදල් මූලාශ්‍රය ව්‍යවහාර මුදල් වර්ගය අනුව සාරාංශය

ව්‍යවහාර මුදල් කේතය ***	ආමුඛ ප්‍රේෂණ	මාරු කිරීම්		විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු
		ආමුඛ ආයෝජන ගිණුම්වල සිට	අක්වෙරළ බැංකු ඒකකයෙහි ගිණුම්වල සිට	
එ.ජ.ඩොලර්				
යූරෝ				
ශ්‍රී ලංකා රුපියල්				

සටහන:* එකම පුද්ගලයා තැන්පතු කිහිපයක් පවත්වාගෙන යන්නේ නම්, සෑම තැන්පතුවක් සඳහාම වෙන වෙනම පේළි භාවිත කරන්න.

** ගිණුම් හිමියාගේ නේවාසිකභාවය R නේවාසික
NR නේවාසික නොවන

*** අනෙකුත් නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් සැපයීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත් වලින් උපුටාගත් / ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම:

අත්සන: .....

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව:

අත්සන: .....
දිනය:

දිනය:

අංක 10 දරන විධානවල ඇමුණුම II හි පිටු අංක 1

කල් පිරුණු / නැවත ආයෝජනය කළ / සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්වල මාසික ප්‍රකාශනය

බැංකුවෙහි නම:

වාර්තා කරන මාසය සහ වර්ෂය:

1 වන වගුව 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන විධානවල 9(ඈ) ඡේදය යටතේ, මාසය තුළදී නැවත ආයෝජනය කරන ලද විශේෂ තැන්පතු

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම*	ගිණුම් හිමියාගේ නේවාසිකභාවය **	ජා.හැ.ප/ විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	නැවත ආයෝජනය කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද අමතර පොළිය හැර) (වාර්ෂිකව %)	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)	ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හිමිකම් පෑ යුතු පොළිය (ප්‍රමාණය)

2 වන වගුව 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 09 දරන විධානවල 3(අ) ඡේදය යටතේ, මාසය තුළදී සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම *	ගිණුම් හිමියාගේ නේවාසිකභාවය **	ජා.හැ.ප/ විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	සාමාන්‍ය තැන්පතුවක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම ආරම්භ කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද පොළී අනුපාතය	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)

3 වන වගුව 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන විධානවල 9(ඈ) ඡේදය යටතේ යටතේ නැවත ආයෝජනය නොකළ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 09 දරන විධානවල 3(අ) ඡේදය යටතේ සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට ගෙනයාම සිදු නොකළ, මාසය තුළදී කල් පිරුණු විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම *	ගිණුම් හිමියාගේ නේවාසිකභාවය **	ජා.හැ.ප/ විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	විවෘත කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද පොළී අනුපාතය	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවන ලද පොලිය (ප්‍රමාණය)

3(අ) වන වගුව - ඉහත 3 වන වගුවෙහි වාර්තාකර ඇති විශේෂ තැන්පතු ගිණුම්වල ඇති අරමුදල්වල කල්පිරීමෙන් පසු බැර කිරීම් - ව්‍යවහාර මුදල් වර්ගය අනුව සාරාංශය

ව්‍යවහාර මුදල් කේතය ***	ශ්‍රී ලංකාව තුළදී ආපසු ගන්නා ලදී	ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරන ලද	මාරු කරන ලද		
			ආමුඛ ආයෝජන ගිණුම් වෙත	පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත	අක්වෙරළ බැංකු ඒකකයෙහි ගිණුම් වෙත
එ.ජ.ඩොලර්					
යූරෝ					
ශ්‍රී ලංකා රුපියල්					

සටහන: * එකම පුද්ගලයා තැන්පතු කිහිපයක් පවත්වාගෙන යන්නේ නම්, සෑම තැන්පතුවක් සඳහාම වෙන වෙනම පේළි භාවිත කරන්න.

** ගිණුම් හිමියාගේ නේවාසිකභාවය R - නේවාසික

NR - නේවාසික නොවන

*** අනෙකුත් නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් සැපයීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත් වලින් උපුටාගත් / ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම: අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව:

අත්සන: ……..…….. අත්සන: ……..……..

දිනය: ……..…….. දිනය: ……..……..

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 11 දරන විධානයන්

විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සීමුකරන, තම මූලික ව්‍යාපාරය ලෙස මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතව සිටින පරිසීමිත වෙළඳුන් (මුදල් හුවමාරුකරන්නන්) වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය සමඟ කියවිය යුතු 4(2) හා 6 වන වගන්ති ප්‍රකාරව, විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම පහත සඳහන් නියමයන්ට යටත්ව පරිසීමිත වෙළඳුන් විසින් සිදු කළ යුතු ය.

2. සාමාන්‍ය කොන්දේසි

2.1 විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සඳහා නිරතවීමේ කාල පරාසය විශේෂයෙන් දක්වන ලද විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සෑම මුදල් හුවමාරුකරන්නෙක් සතුව ම පැවතිය යුතු ය.

2.2 තවද, මෙම විධානයන්ට අමතරව, සෑම මුදල් හුවමාරුකරන්නෙක්ම එම අවසර පත්‍රයේ සඳහන් නියමයන් සහ කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

2.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නිර්ණායක ප්‍රකාරව මුදල් හුවමාරු කිරීමේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි අධ්‍යක්ෂවරු, මූලික කොටස් හිමියන්, අවසන් අර්ථලාභී අයිතිකරුවන් සහ කළමනාකරණ තනතුරු දරන පුද්ගලයන් යථා යෝග්‍ය විය යුතු අතර අවසරපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී, අවසරපත්‍රය සමඟ අමුණා ඇති දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඒ බව සනාථ කල යුතු ය.

2.4 අවසර පත්‍රය නිකුත් කරන අවස්ථාවේදී, සෑම මුදල් හුවමාරුකරන්නෙක්ම මුදල් හුවමාරු ව්‍යාපාරයේ නියුතු බලය පවරන ලද සේවකයන්ගේ තනතුරු සහ ආදර්ශ අත්සන් ඇතුළත් වූ වෙනම නම් ලැයිස්තුවක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත සැපයිය යුතු ය. පසුව සිදුවන ඕනෑම වෙනසක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත, එම වෙනස සිදු වී රාජකාරී දින තුන(03)ක් ඇතුළත දැනුම් දිය යුතු ය.

2.5 ඉහත 2.4 කොන්දේසිය යටතේ යම් බලයලත් ව්‍යාපාරික ස්ථානයක් සඳහා නම් සහ අනෙකුත් විස්තර සපයා ඇති පුද්ගලයකු /පුද්ගලයන් හැර වෙනත් කිසිදු පුද්ගලයෙකු එම බලයලත් ස්ථානයේ මුදල් හුවමාරු ව්‍යාපාරයේ නිරත නොවිය යුතු ය.

2.6 මුදල් හුවමාරුකරන්නන් විසින් මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා පමණක්ම පවත්වාගෙන යා යුතු බලයලත් ව්‍යාපාරික ස්ථානයන්හි අවසර පත්‍රයෙන් නියම කර ඇති ගනුදෙනුවල නිරත විය යුතු ය. මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයට අමතරව එම ස්ථානයේම වෙනත් ඕනෑම ව්‍යාපාරයක නිරතවීමට මුදල් හුවමාරුකරන්නන් අදහස් කරන්නේ නම්, එය විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු අතර, එවැනි ව්‍යාපාර මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙන් වෙන්ව පවත්වාගෙන යා යුතු ය.

2.7 ඕනෑම මුදල් හුවමාරුකරන්නෙකු විසින් නව ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීමට හෝ බලයලත් ව්‍යාපාරික ස්ථානයක් වෙනත් ස්ථානයකට ගෙන යාමට අදහස් කරන්නේ නම්, එවැනි වෙනසක් සිදුකිරීමට ප්‍රථම මුදල් හුවමාරුකරන්නන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ගෙන්, පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය. තවද, ඕනෑම මුදල් හුවමාරුකරන්නෙකු විසින් බලයලත් ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට අදහස් කරන්නේ නම් හෝ, හිමිකම් ව්‍යුහය, අධ්‍යක්ෂවරුන් සහ කොටස් පැවරීම යනාදියෙහි යම් වෙනසක් සිදුවන්නේ නම්, එවැනි වෙනසක් සිදු කිරීමට ප්‍රථම මුදල් හුවමාරුකරන්නා විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු ය.

2.8 බලයලත් වෙළෙන්දෙකු සමඟ ඇති කර ගත් පූර්ව ගිවිසුම් මත ඔවුන් වෙත විකිණිය හැකි විදේශ ව්‍යවහාර මුදල් පමණක් මුදල් හුවමාරුකරන්නාගේ බලයලත් ව්‍යාපාරික ස්ථාන වලදී භාරගත යුතු අතර සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයක් සඳහාම එකී ගිවිසුම්වල අන්තර්ගත විදේශ ව්‍යවහාර මුදල් වර්ගවල ලැයිස්තු, වර්ෂය ආරම්භයේ දී විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය. මෙම ලැයිස්තු කලින් කලට සංශෝධනය විය හැකි අතර, එවැනි සංශෝධන රාජකාරී දින තුන(03)ක් ඇතුළත විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු ය.

2.9 මිලදීගන්නා ලද හෝ හුවමාරු කරන ලද විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් විකිණීමට සුදුසුකම් ඇති මුදල් හුවමාරුකරන්නන් සතුව ඇති විදේශ ව්‍යවහාර මුදල් විකිණීමෙන් පසු ශේෂය ලෙස පවතින විදේශ ව්‍යවහාර මුදල්, එම මිලදීගැනීමේ හෝ හුවමාරුකිරීමේ දින සිට රාජකාරී දින පහ(05)ක් ඇතුළත බලයලත් වෙළෙන්දකු සමඟ වෙනම පවත්වාගෙන යනු ලබන රුපියල් ගිණුමක තැන්පත් කළ යුතු ය.

2.10 මුදල් හුවමාරුකරන්නන් විසින් ගිණුමක් පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දෙකු විසින් මුදල් හුවමාරුකරන්නන් වෙත ප්‍රදානය කරන ලද විනිමය අනුපාතය නොඉක්මවමින් ශ්‍රී ලංකා රුපියල් හෝ ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් වර්ගයක් සඳහා හුවමාරු කිරීමට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු භාරගත හැකි ය.

2.11 මුදල් හුවමාරුකරන්නා විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු භාරගැනීමට හෝ නිකුත් කිරීමට ප්‍රථම, එම මුදල් නෝට්ටුවල වලංගුභාවය, අදාළ රටෙහි මුදල් නිකුත් කිරීමේ අධිකාරිය මගින් අවලංගු කර නොමැති බව පරීක්ෂා කිරීමෙන් තහවුරු කර ගත යුතු ය.

2.12 විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ලබා දී ඇති විශේෂාංගවලට අනුකූලව මුදල් හුවමාරුකරන්නන් විසින් සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයකම සංවෘත පරිපථ රූපවාහිනී පද්ධතියක් (CCTV) ස්ථාපනය කළ යුතු අතර විදේශ විනිමය දෙපාර්තමේන්තුව හට ඕනෑම අවස්ථාවකදී එම මුදල් හුවමාරුකරන්නන් සිදු කරන මුදල් හුවමාරු කිරීමේ ක්‍රියාකාරකම්, එමගින් මෙහෙයුම් කිරීමට හැකියාව පැවතිය යුතු ය.

2.13 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාරව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නම් කරනු ලැබූ නිලධාරීන් හට එතැන් විමර්ශන පැවැත්වීමට සෑම මුදල් හුවමාරුකරන්නෙකුම අවසර ලබා දිය යුතු ය.

3. ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා පමණක් අදාල අතිරේක විධානයන්;

3.1 විදේශයන්හි සංචාරය කිරීමේ අරමුණ සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට මුදල් හුවමාරුකරන්නන් සුදුසුකම් ලබනු ලැබේ.

3.2 එක් එක් බලයලත් ව්‍යාපාරික ස්ථානය මඟින් ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට එක් විදේශ සංචාරයක් සඳහා එක් ගනුදෙනුවකදී විකිණිය හැකි විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය ඇ.එ.ජ.ඩොලර් 5000ක් හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයකට නොවැඩි විය යුතු ය. යම් බලයලත් පුද්ගලයෙකු විසින් විදේශ සංචාරයක් සඳහා ඇ.එ.ජ.ඩොලර් 5000ට සමාන අගයකට දැනටමත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත්කර ඇත්නම් සහ එම ගනුදෙනුව දැනටමත් විදේශ ගමන් බලපත්‍රයේ පිටසන් කර ඇත්නම්, එම සංචාරය සඳහා නැවත විදේශ මුදල් නිකුත් කිරීම, මුදල් හුවමාරුකරන්නා විසින් නොකළ යුතු ය. එසේ වුවද, එම බලයලත් පුද්ගලයා විසින් ඇ.එ.ජ.ඩොලර් 5000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයකට අඩුවෙන් විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කර ඇත්නම්, නිසි උද්යෝගයකින් කටයුතු කිරීමෙන්, ඇ.එ.ජ.ඩොලර් 5000 හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් දක්වා වූ ඉතිරි මුදල් ප්‍රමාණය, විදේශ ගමන් බලපත්‍රයේ නියමිත පිටසන් කිරීම සහිතව විකිණීමට මුදල් හුවමාරුකරන්නාට අවසර ලැබේ.

3.3 විදේශ සංචාරවල යෙදෙන්නන්ගේ ඉල්ලීම්වල සද්භාවය පිළිබඳව සෑහීමකට පත්වීමට අවශ්‍ය ඇමුණුම (I)හි දී ඇති වගුවෙන් දක්වා ඇති ලිපිලේඛන ලබා ගැනීමෙන් පසුව ඉහත 3.2හි දී ඇති සීමාවට යටත්ව විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම, මුදල් හුවමාරුකරන්නන් ට සිදු කළ හැකි ය.

3.4 පුද්ගලයෙකුගේ නේවාසිකත්වය තීරණය කිරීම, විදේශ විනිමය පනතෙහි 31(3) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විෂයභාර ඇමැතිවරයා විසින් නිකුත් කරන ලද නියෝගය ප්‍රකාරව සිදු කළ හැකි ය

3.5 ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව සිදුකරන සියලුම විදේශ ව්‍යවහාර මුදල් විකිණීම් තරඟකාරී වෙළෙඳපොළ අනුපාතික යටතේ ඇමුණුම (II)හි දක්වා ඇති පරිදි "අංක 1 ආකෘති පත්‍රය" මඟින් කරන ලද අයදුම් කිරීම් සඳහා සිදු කළ යුතු ය.

3.6 සියලුම විදේශ ව්‍යවහාර මුදල් විකිණීම්, එම විදේශ ව්‍යවහාර මුදල් ඉල්ලුම් කරන පුද්ගලයාගේ විදේශ ගමන් බලපත්‍රයේ මෙම අරමුණ සඳහා වෙන්කර ඇති විශේෂිත පිටු වල රබර් මුද්‍රාව මත බලයලත් අත්සන සහිතව පිටසන් කළ යුතු ය.

4. වාර්තා පවත්වා ගැනීමේ අවශ්‍යතාවන්

4.1 සෑම ව්‍යාපාරික ස්ථානයකම විදේශ විනිමය ගනුදෙනු පවත්වා ගැනීම සඳහා සුදුසු මෙහෙයුම් මෘදුකාංගයක් ස්ථාපනය කිරීම මගින් සියලුම ගනුදෙනු ස්වයංක්‍රීයකරණය කළ යුතු ය.

4.2 ලදුපතක් නිකුත් කිරීමකින් තොරව සහ ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කිරීමකින් තොරව කිසිදු ගනුදෙනුවක්, සමාගම විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය. තවද, ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කරන ලද ගනුදෙනුවක් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ මකා දැමීම නොකළ යුතු ය. ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණවල විෂමතාවක් ඇති බව ගනුදෙනුව නිවැරැදි බවට තහවුරු කිරීමෙන් පසු හඳුනාගතහොත්, සමාගම විසින් එම දෝෂය විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වහාම දැනුම් දීමෙන් අනතුරුව එසැණින් නිවැරදි කළ යුතු ය.

4.3 එවැනි සියලු ගනුදෙනු පිලිබඳ වාර්තා ගබඩා කිරීම සඳහා උපස්ථ විධිවිධානයන් (back-up arrangement) ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු සලසා ගත යුතුය.

4.4 ලදුපත්

i. විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කරන අවස්ථාවේ දී මුදල් හුවමාරුකරන්නන් විසින් ලදුපතක් නිකුත් කළ යුතු ය.

ii. ලදුපත් මුද්‍රණය කිරීම

අනුක්‍රමික අංක අනුපිලිවෙලට ස්වයංක්‍රීය පද්ධතියක් තුලින් ලදුපත් මුද්‍රණය කළ යුතු අතර, ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී සියලුම ගනුදෙනුකරුවන් වෙත නිකුත් කළ යුතු ය. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය ලදුපතෙහි ඉතා පැහැදිලිව දැක්විය යුතු ය.

iii. ලදුපත්වල විශේෂාංග

අ. විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම හා හුවමාරු කිරීම සඳහා පමණක් අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - ඇමුණුම (III)හි විශේෂයෙන් දක්වා ඇති තොරතුරු ලදුපතෙහි අඩංගු විය යුතු ය.

ආ. ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - ඇමුණුම (IV)හි විශේෂයෙන් දක්වා ඇති තොරතුරු ලදුපතෙහි අඩංගු විය යුතු ය.

iv. ලදුපතෙහි සියලුම ක්ෂේත්‍රවලට දත්ත ඇතුළත් කළ යුතු ය.

v. ස්වයංක්‍රීය පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේදී සහ ගනුදෙනු පරීක්ෂා කර නිවැරදි බවට තහවුරු කිරීමේදී ද්විත්ව පාලනයක් (පුද්ගලයන් දෙදෙනකු සම්බන්ධවීමේ අවශ්‍යතාව) පවත්වා ගැනීමට අවශ්‍ය වේ. ලදුපත ගනුදෙනුකරු වෙත නිකුත් කිරීමට ප්‍රථම බලයලත් නිලධාරියා විසින් සියලු ගනුදෙනු පරීක්ෂා කර නිවැරැදි බවට තහවුරු කළ යුතු ය.

vi. ලදුපත් කියවිය හැකි පරිදි පැහැදිලි විය යුතු අතර පිටපත් දෙකක් මුද්‍රණය කළ යුතු ය. මුල් පිටපත ගනුදෙනුකරු වෙත නිකුත් කළ යුතු අතර දෙවන පිටපත සමාගම සතුව තබා ගත යුතු ය. නිකුත් කරන ලද ලදුපත්වල වාර්තා ලබා ගැනීමේ පහසුකම ස්වයංක්‍රීය පද්ධතිය තුළ පැවතිය යුතු ය.

4.5 මිලදී ගැනුම් හා විකිණීමේ ලේඛනය

i. මිලදී ගැනුම් ලේඛනය - ඇමුණුම (V)හි දී ඇති ආදර්ශය අනුව මිලදී ගැනුම් ලේඛනය ජනනය කළ හැකි වන පරිදි සියලුම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම්වලට අදාළ ගනුදෙනු, ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ස්වයංක්‍රිය පද්ධතිය තුළ සටහන් කළ යුතු ය.

ii. විකිණීමේ ලේඛනය - (ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා පමණි) - ඇමුණුම (VI)හි දී ඇති ආදර්ශය අනුව විකිණීමේ ලේඛනය ජනනය කළ හැකි වන පරිදි ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව සියලුම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීම්වලට අදාළ ගනුදෙනු, ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ස්වයංක්‍රීය පද්ධතිය තුළ සටහන් කළ යුතු ය.

iii මුදල් හුවමාරුකරන්නන්ගේ බලයලත් නිලධාරියාගේ හඳුනාගැනීමේ විස්තර පැහැදිලිව ලේඛනය තුළ දැක්විය යුතු ය.

iv. සෑම ව්‍යාපාරික ස්ථානයකම වෙන වෙනම ලේඛන පවත්වාගත යුතු ය.

4.6 "අංක 1 ආකෘති පත්‍රය" පිරවීම හා තබාගැනීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලබන නිරන්තර විමර්ශන කටයුතුවලට පහසුවන පරිදි පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ද සහිතව බලයලත් ව්‍යාපාරික ස්ථාන තුළ ඉහත පරිච්ඡේද 3.5හි දක්වා ඇති පරිදි අංක 1 ආකෘති පත්‍ර, මුදල් හුවමාරුකරන්නා විසින් ව්‍යාපාරික ස්ථානය තුල තබාගත යුතු ය.

4.7 ශේෂ ප්‍රකාශන

i. සිදුකරන ලද ගනුදෙනු, දෛනිකව සහ මාසිකව සාරාංශ කරමින් ස්වයංක්‍රීය පද්ධතිය මඟින් සෑම ව්‍යාපාරික ස්ථානයක් සඳහාම ශේෂ ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි විය යුතු ය.

ii. ශේෂ ප්‍රකාශනයේ විශේෂාංග

අ. විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම හා හුවමාරු කිරීම සඳහා පමණක් අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - ඇමුණුම (VII)හි දී ඇති ආකෘතියට අනුව මුදල් හුවමාරුකරන්නන්ගේ ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශේෂ ප්‍රකාශන පිලියෙල කිරීමට හැකි විය යුතුය.

ආ. ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා - ඇමුණුම (VIII)හි දී ඇති ආකෘතියට අනුව මුදල් හුවමාරුකරන්නන්ගේ ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශේෂ ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි විය යුතුය.

4.8 විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නම් කරන ලද වෙනත් ඕනෑම නිලධාරියෙකු හට අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වූ විටෙක ලදුපත්, මිලදී ගැනුම් ලේඛනය, විකුණුම් ලේඛනය සහ ශේෂ ප්‍රකාශන ඉදිරිපත් කිරීමට මුදල් හුවමාරුකරන්නන්ට හැකි විය යුතුය.

4.9 විදේශ විනිමය පනතේ 9(5) වගන්තිය හා 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව මුදල් හුවමාරුකරන්නා විසින් ව්‍යවස්ථාපිත වාර්තා පවත්වා ගැනීමේ අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු ය.

5. වාර්තා කිරීමේ අවශ්‍යතාවන්

5.1 දෛනික විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්

සෑම ව්‍යාපාරික ස්ථානයකම සිදුකරන ලද දෛනික විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ජාලගත වාර්තා කිරීමේ පද්ධතිය හරහා අදාළ දිනය තුළ වෙන වෙනම විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

5.2 දෛනික විදේශ ව්‍යවහාර මුදල් විකිණීම්

ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් විසින් සෑම ව්‍යාපාරික ස්ථානයකම සිදු කරන ලද දෛනික විදේශ ව්‍යවහාර මුදල් විකිණීම්, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ජාලගත වාර්තා කිරීමේ පද්ධතිය හරහා අදාළ දිනය තුළ වෙන වෙනම විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

5.3 තැන්පතුවල මාසික ප්‍රකාශනය

i. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල මාසික ප්‍රකාශන, ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ජනනය කළ යුතු ය.

ii. ඇමුණුම (IX)හි දී ඇති ආකෘතියට අනුව සියලුම ව්‍යාපාරික ස්ථාන සඳහා වෙන වෙනම පිළියෙල කරන ලද සහ අදාළ බලයලත්වෙළෙන්දන්විසින්තහවුරුකරනලදවිදේශව්‍යවහාරමුදල්තැම්පතුවලටඅදාළ,මාසිකප්‍රකාශනවලදෘඩපිටපත්ඊළඟ මාසයේ 10වන දින හෝ ඊට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතු ය. තවද, මුදල් හුවමාරුකරන්නන් විසින් සෑම ව්‍යාපාරික ස්ථානයක් සඳහාම එහි Microsoft Excel පිටපත dfem@cbsl.lk විද්‍යුත් තැපෑල වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

5.4 2005 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ පනත (සංශෝධිත පරිදි) හෝ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව සමාගම විසින් සියලුම සැක කටයුතු ගනුදෙනු, අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය, 14 වන මහල, ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01, යන ලිපිනයට වාර්තා කළ යුතු ය.

5.5 සමාගමේ විගණනය කරන ලද ගිණුම්, සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ සිට මාස හය(06)ක් ඇතුළත විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය.

6. අනාවරණය කිරීම්

6.1 සමාගම විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන දෛනික විනිමය අනුපාතික, සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයකම කැපී පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

6.2 සමාගමේ සෑම බලයලත් ව්‍යාපාරික ස්ථානයකම අවසරපත්‍රය කැපී පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු අතර විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය පරිදි අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කළ යුතු ය.

6.3 සමාගම විසින් අවසරපත්‍ර අංකය සහිත නාම පුවරුව සහ ඇමුණුම (X)හි පෙන්වා ඇති ලාංඡනය (60cm x 60cm) පුවරුවක් මත අඟල් 10ක අරයක් සහිතව සුදු පසුබිමක රතු පැහැයෙන් [Pantone 187C (100%)] ඇමුණුම (X)හි පෙන්වා ඇති අන්‍යෝන්‍ය ප්‍රමාණවලට සෑහෙන තරම් අනුරූප වන පරිදි, අදාල ව්‍යාපාරික ස්ථානය මුදල් හුවමාරු කිරීම සඳහා බලයලත් ස්ථානයක් බවට මහජනතාවට දැනුම් දෙමින් සෑම ව්‍යාපාරික ස්ථානයකම ප්‍රදර්ශනය කළ යුතු ය.

7. මෙම විධානයන්හි කාර්යය සඳහා අර්ථකථන:

(අ) "බලයලත් ව්‍යාපාරික ස්ථාන" යන්නෙහි අදහස:

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 16 වන වගන්තිය සමඟ කියවිය යුතු 4(2) වගන්තිය ප්‍රකාරව විදේශ විනිමය වෙළඳාම් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවසර ලබා දී ඇති පරිසීමිත වෙළෙන්දන්ගේ ව්‍යාපාරික ස්ථාන.

(ආ) "බලයලත් වෙළෙන්දා" යන්නෙහි අදහස:

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 33 වන වගන්තිය ප්‍රකාරව බලයලත් වෙළෙන්දා.

(ඇ) "බලයලත් පුද්ගලයා" යන්නෙහි අදහස:

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 4 වන වගන්තිය ප්‍රකාරව බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා

(ඈ) "බලයලත් නිලධාරියා" යන්නෙහි අදහස:

බලයලත් ව්‍යාපාරික ස්ථානයන්හි සිදුකරන විදේශ විනිමය ගනුදෙනු පරීක්ෂාකර නිවැරදි බවට තහවුරු කිරීම සඳහා පරිසීමිත වෙළෙන්දා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයා.

(ඉ) "බලයලත් අත්සන" යන්නෙහි අදහස:

මෙම විධානයන්හි සඳහන් ව්‍යාපාරයේ නිරතව සිටින පරිසීමිත වෙළෙන්දා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයාගේ අත්සන.

(අත්සන් කළේ) ආර්.ආර්. ජයරත්න
අධ්‍යක්ෂ විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2020 දෙසැම්බර් 15

ඇමුණුම I

විදේශ සංචාර වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන:

	සංචාරයෙහි අරමුණ	අවශ්‍ය ලිපිලේඛන
1	නිවාඩු සහ වන්දනා ගමන්	i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්; සහ ii. නැවත පැමිණීම සඳහා ගුවන් ටිකට්පතක්.
2	ව්‍යාපාරික අරමුණු	i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්; සහ ii. අධ්‍යක්ෂ, හවුල්කරු, තනි අයිතිකරු හෝ සේවායෝජක වශයෙන් අයදුම්කරු ව්‍යාපාර සංවිධානයේ දරන තනතුර තහවුරු කරන ලිපියක්.
3	රාජකාරී අරමුණු	i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්; ii. රාජකාරී අරමුණක් සඳහා සංචාරය කිරීමට අයදුම්කරුගේ නාම යෝජනාව තහවුරු කරමින් එම අයදුම්කරු සේවයේ නියුතු අමාත්‍යාංශයේ ලේකම් හෝ රජයේ දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියාගෙන් ලිපියක්; සහ iii. අයදුම්කරුට රටින් පිටවීම සඳහා අදාළ වන පරිදි ජනාධිපතිගේ හෝ අගමැතිගේ අනුමැතිය ලබා දෙන ලිපියක්.
4	පෞද්ගලික පුහුණු පාඨමාලා	i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්; ii. අයදුම්කරුගේ අර්ථසාධක අරමුදල් අංකය ඇතුළත් කරමින් අයදුම්කරුගේ නාමයෝජනාව තහවුරු කරන අයදුම්කරුගේ සේවායෝජකයාගෙන් ලිපියක්; සහ iii. අයදුම්කරු පුහුණු පාඨමාලාව සඳහා තෝරාගත් බවට පුහුණුව සඳහා සංචාරය කිරීමට නියමිත රටෙහි අදාළ පුහුණු ආයතනය මගින් ලබා දුන් ලිඛිත සාක්ෂි.
5	ක්‍රීඩා	i. සංචාරය කිරීමට නියමිත රට වීසා බලපත්‍රයක් අවශ්‍ය රටක් නම්, වලංගු වීසා බලපත්‍රයක්; ii. අයදුම්කරුගේ නාමයෝජනාව තහවුරු කරමින් අදාළ ක්‍රීඩා ආයතනය මගින් ලබාදුන් ලිපියක් සහ ක්‍රීඩා සඳහා අදාළ අමාත්‍යාංශය මගින් නිර්දේශය ලබාදුන් ලිපියක්; iii. අයදුම්කරු රජයේ නිලධාරියෙකු වන අවස්ථාවක දී අයදුම්කරුට රටින් පිටවීම සඳහා අවසරය ලබා දෙමින් ජනාධිපති හෝ අගමැතිගෙන් ලබාගත් ලිපියක්; සහ iv. අයදුම්කරු ආරක්ෂක බලකායේ හෝ පොලිස් බලකායේ සාමාජිකයෙකු වන අවස්ථාවකදී, ආරක්ෂක කටයුතු සම්බන්ධ අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දෙන ලිපියක්.
6	සමුළු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු	i සමුළු, සම්මන්ත්‍රණ හෝ වැඩමුළු පැවැත්වෙන රටෙහි සංචාරය කිරීම සඳහා වීසා බලපත්‍ර අවශ්‍ය වේ නම්, වලංගු වීසා බලපත්‍රයක්; ii. අදාළ රටෙන් අයදුම්කරු වෙත කරන ලද ආරාධනය දැක්වෙන ලිපියක්; සහ iii. අදාළ සමුළුව, සම්මන්ත්‍රණය හෝ වැඩමුළුව සඳහා සහභාගි වීමට සේවායෝජක විසින් කරන ලද අයදුම්කරුගේ නාමයෝජනාව සහිත ලිපියක්; හෝ එවැනි සහභාගිත්වයක් සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාව පෙන්වන ඕනෑම ලියවිල්ලක්.
7	අධ්‍යාපන (ජීවන වියදම් පමණි)	i. පිළිගත් විදේශීය අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි කර ගැනීමේ සහතිකය සහ අයදුම්කරුගේ වියදම් සම්බන්ධයෙන් එම ආයතනය විසින්ම නිකුත් කළ ලිඛිත සාක්ෂි; සහ ii. ශිෂ්‍ය වීසා බලපත්‍රයක්.
8	වෛද්‍ය	i. දේශීය විශේෂඥ වෛද්‍යවරයකුගේ නිර්දේශයක් සමග රෝහල්, වෛද්‍ය සහ සාත්තු සේවා සම්බන්ධයෙන් පිළිගත් විදේශීය සාත්තු සේවා නිවාසයක්/රෝහලක් මගින් ලබාගත් කුවිතාන්සියක් හෝ ඇස්තමේන්තුවක්; සහ ii. වලංගු වීසා බලපත්‍රයක්.

පරිසීමිත වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය විකිණීම

පෝරමය 1

| | | |

ඇමුණුම III

ශ්‍රී ලංකා රුපියල්වලට හෝ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සිදුකරන අවස්ථාවේදී නිකුත් කළ යුතු ලදුපත

බලයලත් ව්‍යාපාරික ස්ථානයේ නම, ලිපිනය සහ දුරකථන අංකය

අවසරපත්‍ර අංකය: DFE/RD/.....

අනුක්‍රමික අංකය : .....

දිනය : .....

ගනුදෙනුකරුගේ නම : .....

ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය : .....

ජාතිය : .....

ලිපිනය : .....

.....

ව්‍යවහාර මුදල් වර්ගය	ලැබුණු විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය	ප්‍රදානය කරන ලද විනිමය අනුපාතය	නිකුත් කරන ලද ප්‍රමාණය (රු./වෙනත් විදේශ ව්‍යවහාර මුදල්)

.....

ගනුදෙනුකරුගේ අත්සන

.....

පරිසීමිත වෙළෙන්දාගේ අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම IV

ශ්‍රී ලංකා රුපියල්වලට හෝ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සිදුකරන අවස්ථාවේදී නිකුත් කළ යුතු ලදුපත

බලයලත් ව්‍යාපාරික ස්ථානයේ නම, ලිපිනය සහ දුරකථන අංකය

අවසරපත්‍ර අංකය: DFE/RD/.....

අනුක්‍රමික අංකය : .....

දිනය : .....

ගනුදෙනුකරුගේ නම : .....

ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය : .....

ජාතිය: .....

ලිපිනය: .....

.....

ලැබුණු ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය	ව්‍යවහාර මුදල් වර්ගය	**ප්‍රදානය කරන ලද විනිමය අනුපාතය**	**නිකුත් කරන ලද / විකුණන ලද ඇ.ඒ.ජ.ඩො. හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය**

....

ගනුදෙනුකරුගේ අත්සන පරිසීමිත වෙළෙන්දාගේ අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම V

මිලදී ගැනුම් ලේඛනය

දිනය	ලද්දෙන්ගේ අනුක්‍රමික අංකය	ගනුදෙනුකරුගේ නම	ලිපිනය	ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය	ජාතිය	විදේශ ව්‍යවහාර මුදල් මූලාශ්‍ර	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගත් විදේශ ව්‍යවහාර මාණ්ඩය ප්‍රමාණය	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා නුවමාරු කිරීම විනිමය අනුපාතය	නිකුත් කරන ලද රු./වෙනත් විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය	බලයලත් නිලධාරියාගේ හඳුනා ගැනීමේ තොරතුරු	වෙනත් සටහන්

ඇමුණුම VI

විකුණුම් මේඛනය

(1)	(2)	(3)	(4)	(5)	(6)	(7)	(8)	(9)
අනුක්‍රමික අංකය	දිනය	ගනුදෙනුකරුගේ නම සහ ලිපිනය	ජා.හැ./බිල්පත් ගණන් බලපත්‍ර අංකය	සංවාරය කිරීමට නියමිත රටවල්	නිකුත් කළ විදේශ වෘවහාර මුදල් ප්‍රමාණය	ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කිරීමේ අනුපාතය	බලයලත් නිලධාරියාගේ නඳුනා ගැනීමේ විස්තර	වෙනත් සටහන්

ඇමුණුම **VII**

විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා පමණක් අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා ශේෂ ප්‍රකාශනය

.. / .... / .... සිට .... /.... / .... දක්වා ශේෂ ප්‍රකාශනය

ව්‍යවහාර මුදල් වර්ගය	ආරම්භක ශේෂය	මුළු විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්	වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකට හුවමාරු කිරීම්	බලයලත් වෙළෙන්දන් හට විකිණීම්	අවසන් ශේෂය
ඇ.එ.ජ.ඩො.					
ස්ටර්ලිං පවුම්					
යූරෝ					
වෙනත් විදේශ ව්‍යවහාර මුදල්					

සටහන : වෙනත් ව්‍යවහාර විදේශ මුදල් වර්ග සඳහා අවශ්‍ය පරිදි පේළි දීර්ඝ කර ගත හැකිය.

ඇමුණුම **VIII**

ශ්‍රී ලංකා රුපියල්වලට එදිරිව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු විකිණීමට අවසර ඇති මුදල් හුවමාරුකරන්නන් සඳහා ශේෂ ප්‍රකාශනය

.. / .... / .... සිට .... /.... / .... දක්වා ශේෂ ප්‍රකාශනය

ව්‍යවහාර මුදල් වර්ගය	ආරම්භක ශේෂය	මුළු විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම්	වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකට හුවමාරු කිරීම්	බලයලත් වෙළෙන්දන් හට විකිණීම්	අවසන් ශේෂය
ඇ.එ.ජ.ඩො.					
ස්ටර්ලිං පවුම්					
යූරෝ					
වෙනත් විදේශ ව්‍යවහාර මුදල්					

සටහන : වෙනත් ව්‍යවහාර විදේශ මුදල් වර්ග සඳහා අවශ්‍ය පරිදි පේළි දීර්ඝ කර ගත හැකිය.

ඇමුණුම **IX**

විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල මාසික ප්‍රකාශනය

පරිසීමිත වෙළෙන්දාගේ නම / ශාඛාව:

අවසරපත්‍ර අංකය:

වාර්තා කරන වර්ෂය සහ මාසය:

DFE	RD	

ව්‍යවහාර මුදල් වර්ගය	මුදල් කේතය	මුළු තැන්පතු
එක්සත් අරාබි එමීර් ඩිරාම්	AED	
ඔස්ට්‍රේලියානු ඩොලර්	AUD	
බහරේන් ඩිනාර්	BHD	
බෘනායි ඩොලර්	BND	
කැනේඩියානු ඩොලර්	CAD	
ස්විස් ෆ්‍රෑන්ක්	CHF	
චීන යුවාන් (රෙන්මින්බි)	CNY	
සයිප්‍රස් පවුම්	CYP	
ඩෙන්මාර්ක් ක්‍රෝනර්	DKK	
යූරෝ	EUR	
ස්ටර්ලිං පවුම්	GBP	
හොංකොං ඩොලර්	HKD	
ඉන්දුනීසියානු රුපියා	IDR	
ජෝර්දාන ඩිනාර්	JOD	
ජපන් යෙන්	JPY	
කොරියානු වොන්	KRW	
කුවේට් ඩිනාර්	KWD	
මැලේසියානු රින්ගිට්	MYR	
නෝර්වේජියානු ක්‍රෝනර්	NOK	
නවසීලන්ත ඩොලර්	NZD	
ඕමාන් රියාල්	OMR	
පිලිපීන පෙසෝ	PHP	
කටාර් රියාල්	QAR	
සවුදි අරාබි රියාල්	SAR	
ස්කොට්ලන්ත පවුම්	SCP	
ස්වීඩන ක්‍රෝනර්	SEK	
සිංගප්පූරු ඩොලර්	SGD	
තායිලන්ත බාත්	THB	
ඇ.එ.ජ. ඩොලර්	USD	
දකුණු අප්‍රිකානු රෑන්ඩ්	ZAR	
ඉහත සඳහන් ව්‍යවහාර මුදල් වර්ගවලට අමතරව තවත් මුදල් වර්ග වේ නම්, පේළි දිර්ඝ කර ගත හැකිය.		

අදාළ ලිපිලේඛන පරීක්ෂා කළ අතර ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.....	.....
පරිමිත වෙළෙන්දාගේ අත්සන සහ නිල මුද්‍රාව	බැංකුවේ අත්සන සහ නිල මුද්‍රාව
.....	.....
දිනය	දිනය

ඇමුණුම **X**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2206/25 - 2020 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.12.18

I වැනි කොටසට (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

22 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මඟින්, 2020 ජූලි මස 02 දිනැති අංක 2182/37 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළකරන ලද පනතෙහි 22 වන වගන්තිය යටතේ වූ නියමයෙහි වලංගු කාලය, 2021 ජනවාරි මස 02 දින සිට තවත් මාස හයක කාලයකින් දීර්ඝ කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

මාර්ගෝපදේශ-01/2020

යොමු අංකය : 037/04/002/0004/019

2020 පෙබරවාරි 5

බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම් සහ කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

හිතවත් මහත්මයාණෙනි,

සිදුවීම් පදනම් කරගත් LankaFIN වාර්තාකරණ මාර්ගෝපදේශය

1. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 6 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ 2008 ජූනි 25 දින අංක 1555/9, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ රෙගුලාසි, 2008 අංක 1 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි, මුදල් ගනුදෙනු වාර්තා (CTR) සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා (EFT), වාර්තා කිරීම කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීමට අපි කැමැත්තෙමු.

2. බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම් සහ කොටස් තැරැව්කාර සමාගම් විසින් වෙනත් මූල්‍ය ආයතනවල (ප්‍රධාන වශයෙන් බැංකුවල) පවත්වාගෙන යනු ලබන රැස් කිරීමේ ගිණුම්වලට අදාළ ගනුදෙනු තොරතුරු වාර්තා කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදුවීම් පදනම් කරගත් මාර්ගෝපදේශයක් සකස් කර ඇත. 2020 පෙබරවාරි 15 සිට බලපැවැත්වෙන පරිදි සියලුම බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම් සහ කොටස් තැරැව්කාර සමාගම්, අංක I සිට V ඇමුණුම් වල දක්වා ඇති මාර්ගෝපදේශයට අනුව CTR සහ EFT වාර්තා ඉදිරිපත් කළ යුතුය.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂක
මූල්‍ය බුද්ධි ඒකකය

ඇමුණුම I

සිදුවීම් පදනම් කරගත් LankaFIN වාර්තාකරණ මාර්ගෝපදේශය

1. ගනුදෙනුකරුවන්ගෙන් තැන්පතු භාර ගැනීම, ගනුදෙනුකරුවන් හට මුදල් ආපසු ලබා දීම සහ ගෙවීම් සිදු කිරීම සඳහා වෙනත් මූල්‍ය ආයතනවල (ප්‍රධාන වශයෙන් බැංකුවල) රැස් කිරීමේ ගිණුමක්/ගිණුම් පවත්වාගෙන යන ඕනෑම මූල්‍ය ආයතනයක්, එවැනි රැස් කිරීමේ ගිණුම්වල ගනුදෙනු තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කිරීමට අවශ්‍ය වේ.

2. ගනුදෙනුකරුවකුගෙන් රැස් කිරීමේ ගිණුමකට කෙරෙන ඕනෑම මුදල් තැන්පතුවක්, වාර්තාකරණ මූල්‍ය ආයතනයට ලැබෙන මුදල් තැන්පතුවක් ලෙස සැලකිය යුතුය. රුපියල් ලක්ෂ දහයක (රු. 1,000,000) මුදලින් වූ මුදල් ප්‍රමාණයක් හෝ විදේශ මුදල් වලින් ඊට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන එවැනි මුදල් තැන්පතුවක්, වාර්තාකරණ මූල්‍ය ආයතනයේ පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුගේ ගිණුමට කරන ලද මුදල් තැන්පතුවක් ලෙස සලකා මුදල් ගනුදෙනු වාර්තාවක් (CTR) මගින් මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කළ යුතුය.

3. රැස් කිරීමේ ගිණුමකින් ගනුදෙනුකරුවෙකු විසින් කරන මුදල් ආපසු ගැනීමක් හෝ ගනුදෙනුකරුවෙකුට කරන ගෙවීමක්, (මුදල් හෝ මුදල් චෙක්පත් ආකාරයට) වාර්තාකරණ මූල්‍ය ආයතනයේ පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුගේ ගිණුමෙන් සිදු කරන මුදල් ආපසු ගැනීමක් හෝ ගෙවීමක් ලෙස සැලකිය යුතුය. රුපියල් ලක්ෂ දහයක (රු. 1,000,000) මුදලින් වූ මුදල් ප්‍රමාණයක් හෝ විදේශ මුදල් වලින් වූ ඊට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන එවැනි මුදල් ගනුදෙනුවක් වාර්තාකරණ මූල්‍ය ආයතනයේ පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුගේ ගිණුමෙන් සිදු කරන මුදල් ආපසු ගැනීමක් හෝ ගෙවීමක් ලෙස සලකා මුදල් ගනුදෙනු වාර්තාවක් (CTR) මගින් මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කළ යුතුය.

4. රැස් කිරීමේ ගිණුමකට ගනුදෙනුකරුවෙකු විසින් කරන ලද විද්‍යුත් අරමුදල් මාරුවක් (EFT) හෝ චෙක්පත් තැන්පතුවක්, වාර්තාකරණ මූල්‍ය ආයතනයට ලැබෙන විද්‍යුත් අරමුදල් මාරුවක් (Incoming EFT) ලෙස සැලකිය යුතුය. එවැනි විද්‍යුත් අරමුදල් මාරුවක් සම්බන්ධයෙන් වූ මුදල් ප්‍රමාණය මුදලින් රුපියල් ලක්ෂ දහයක (රු. 1,000,000) හෝ ඊට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන අවස්ථාවකදී, වාර්තාකරණ මූල්‍ය ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන රැස් කිරීමේ ගිණුමේ සිට ගනුදෙනුකරුගේ ගිණුමට කරන ලද විද්‍යුත් අරමුදල් මාරුවක් ලෙස සලකා විද්‍යුත් මුදල් ප්‍රේෂණ ලැබීම් වාර්තාවක් (EFTIN) මගින් මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කළ යුතුය.

5. රැස් කිරීමේ ගිණුමකින් ගනුදෙනුකරුවෙකුගේ ගිණුමකට කරන ලද විද්‍යුත් අරමුදල් මාරුවක්, වාර්තාකරණ මූල්‍ය ආයතනයෙන් යැවෙන විද්‍යුත් අරමුදල් මාරුවක් (Outgoing EFT) ලෙස සැලකිය යුතුය. එවැනි විද්‍යුත් අරමුදල් මාරුවක් සම්බන්ධයෙන් වූ මුදල් ප්‍රමාණය මුදලින් රුපියල් ලක්ෂ දහයක (රු. 1,000,000) හෝ ඊට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන අවස්ථාවකදී, ගනුදෙනුකරුගේ ගිණුමේ සිට වාර්තාකරණ මූල්‍ය ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන රැස් කිරීමේ ගිණුමට කරන ලද විද්‍යුත් අරමුදල් මාරුවක් ලෙස සලකා විද්‍යුත් මුදල් ප්‍රේෂණ යැවීම් වාර්තාවක් (EFTOUT) මගින් මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කළ යුතුය.

ඇමුණුම **II**

නියැදි සිදුවීම්

''සිලෝන් ෆිනෑන්ස්'' මූල්‍ය ආයතනය (ආයතන කේතය: 777) විසින් "ට්‍රස්ට්" බැංකුවෙහි (BIC(2525) ගිණුම් අංක 1234 දරන රැස් කිරීමේ ගිණුමක් පවත්වාගෙන යයි.

අංක 12, පන්සල් වීදිය, හෝමාගම ලිපිනයේ පදිංචි නිමල් පෙරේරා මහතා (ජා.හැ.: 651591632V) "සිලෝන් ෆිනෑන්ස්" මූල්‍ය සමාගමේ ගනුදෙනුකරුවෙකු වන අතර ඔහු පහත සඳහන් ගනුදෙනු සිදු කරයි.

සිදුවීම 1 - මුදල් තැන්පතු

නිමල් පෙරේරා මහතා විසින් සිලෝන් ෆිනෑන්ස් හි ස්ථාවර ගිණුමක් විවෘත කිරීම සඳහා ට්‍රස්ට් බැංකුවෙහි ගිණුම් අංක 1234 දරන රැස් කිරීමේ ගිණුමට රු. 10,000,000 ක මුදලක් 2020 ජනවාරි 8 වන දින තැන්පත් කරයි. ස්ථාවර තැන්පතු ගිණුම් අංක: 6789 වන මෙම ගිණුම සිලෝන් ෆිනෑන්ස් ආයතනයේ කොළඹ ශාඛාවේ (ශාඛා කේතය: 001) පවත්වාගෙන යනු ලැබේ.

සිදුවීම 2 - චෙක්පත් තැන්පතු

නිමල් පෙරේරා මහතා විසින් සිලෝන් ෆිනෑන්ස් හි ස්ථාවර ගිණුමක් (ගිණුම් අංක: 4040) විවෘත කිරීම සඳහා ට්‍රස්ට් බැංකුවේ පවත්වාගෙන යන රැස් කිරීමේ ගිණුම (ගිණුම් අංක: 1234) රු. 7,500,000 ක චෙක්පත් තැන්පතුවක් 2020 ජනවාරි 10 වන දින සිදුකරයි.

සිදුවීම 3 - විද්‍යුත් අරමුදල් තැන්පතු

නිමල් පෙරේරා මහතා විසින් සිලෝන් ෆිනෑන්ස් හි ස්ථාවර ගිණුමක් විවෘත කිරීම සඳහා (ගිණුම් අංක: 5050) ට්‍රස්ට් බැංකුවෙහි පවත්වාගෙන යන රැස් කිරීමේ ගිණුම (ගිණුම් අංක: 1234) විද්‍යුත් අරමුදල් මාරු කිරීම මගින් රුපියල් 5,000,000 ක මුදලක් 2020 ජනවාරි 12 වන දින යවයි.

සිදුවීම 4 – ආපසු ගැනීම් (මුදල්/මුදල් චෙක්පත්)

ගිණුම් අංක 6789 දරන ස්ථාවර තැන්පතුව කල්පිරීම හේතුවෙන් සිලෝන් ෆිනෑන්ස් ආයතනය විසින් නිමල් පෙරේරා මහතාට රු. 11,500,000ක වටිනාකමකින් යුත් මුදල් චෙක්පතක් ලබා දෙන ලදී. ඔහු 2020 ජනවාරි 15 වන දින චෙක්පත ට්‍රස්ට් බැංකුවට ඉදිරිපත් කිරීමෙන් මුදල් ලබාගන්නා ලදී.

සිදුවීම 5 - ආපසු ගැනීම් (ආදායකයාගේ ගිණුමට පමණක් බැර කල හැකි චෙක්පත්)

ගිණුම් අංක 6789 දරන ස්ථාවර තැන්පතුව කල්පිරීම හේතුවෙන් සිලෝන් ෆිනෑන්ස් ආයතනය විසින් නිමල් පෙරේරා මහතාට රු. 11,500,000ක වටිනාකමකින් යුත් චෙක්පතක් ලබා දුන් අතර ඔහු 2020 ජනවාරි 17 වන දින චෙක්පත ට්‍රස්ට් බැංකුවට ඉදිරිපත් කිරීමෙන් මුදල් ලබාගන්නා ලදී.

සිදුවීම 6 - ආපසු ගැනීම් (විද්‍යුත් අරමුදල් මාරු මගින්)

නිමල් පෙරේරා මහතාට අයත් ගිණුම් අංක 5050 දරන ස්ථාවර තැන්පතුව කල්පිරීමේදී ඔහුගේ ඉල්ලීම මත රු. 1,500,000 ක පොලී මුදල, සිලෝන් ෆිනෑන්ස් ආයතනය විසින් "ලක්" බැංකුවේ ගිණුම් අංක 9999 දරන ඔහුගේ ගිණුමට විද්‍යුත් අරමුදල් මාරුවක් මගින් යවන ලදී.

ඇමුණුම **III**

නියැදි සිදුවීම් සඳහා වාර්තාකරණ ආකෘති

1 සහ 4 යන සිදුවීම් සිලෝන් ෆිනෑන්ස් මූල්‍ය ආයතනය විසින් පහත දැක්වෙන ආකාරයට මුදල් ගනුදෙනු වාර්තාවක් (CTR) මගින් වාර්තා කළ යුතුය.

ක්ෂේත්‍රයේ නම	අනිවාර්ය	සිදුවීම 1	සිදුවීම 4	අදහස
BankCode	ඔව්	777	777	ආයතන කේතය
BranchCode	ඔව්	001	001	ශාඛාවේ කේතය
BranchName	ඔව්	කොළඹ	කොළඹ	ශාඛාවේ නම
AccNumber	ඔව්	6789	6789	ගිණුම් අංකය
ValueDate	ඔව්	20200108	20200115	ගනුදෙනු දිනය
CurCode	ඔව්			මුදල් කේතය
Amount	ඔව්	10000000	11500000	ගනුදෙනුවේ ප්‍රමාණය
CrDr	ඔව්	බැර	හර	හර හෝ බැර යන්න
AccType	ඔව්	ස්ථාවර තැන්පතුව	ස්ථාවර තැන්පතුව	ගිණුම් වර්ගය
TxnNature	ඔව්	මුදල් තැන්පතු	ආපසු ගැනීම මුදල් චෙක්පත්	ගනුදෙනුවේ ස්වභාවය
CusFirstName	නැත	නිමල්	නිමල්	ස්වභාවික තැනැත්තන් සඳහා මුල් නම
CusLastName	ඔව්	පෙරේරා	පෙරේරා	ස්වභාවික තැනැත්තන්ගේ අවසාන නම හෝ ආයතනවල, සංස්ථාපිත ආයතන, සංගම් ආදියේ නම.
AddressLine1	ඔව්	නො 12	නො 12	ලිපිනයේ පළමු පේළිය.
AddressLine2	ඔව්	පන්සල් වීදිය	පන්සල් වීදිය	ලිපිනයේ දෙවන පේළිය
AddressLine3	ඔව්	හෝමාගම	හෝමාගම	ලිපිනයේ තුන්වන පේළිය.
IDNumber	ඔව්	651591632V	651591632V	හැඳුනුම්පත්, ගමන් බලපත්‍ර හෝ ව්‍යාපාර ලියාපදිංචි අංකය
Tel	නැත	0771591591	0771591591	දුරකථන අංකය
Fax	නැත			ෆැක්ස් අංකය
Email	නැත	NIMAL@ABC.LK	NIMAL@ABC.LK	විද්‍යුත් තැපෑල
RiskRating	නැත	1	1	අවදානම් ඇගයීම 1 අඩු, 2 මධ්‍යම, 3 ඉහළ
BusinessType	ඔව්	ගුරු වෘත්තිය	ගුරු වෘත්තිය	ව්‍යාපාරයේ ස්වභාවය/වෘත්තිය
CusType	ඔව්	NP	NP	GA - රාජ්‍ය ගිණුම්, NP ස්වභාවික තැනැත්තන්, IN ආයතන, CO සංස්ථාපිත ආයතන, RB විශ්‍රාමික ප්‍රතිලාභ වැඩසටහන්, NG රාජ්‍ය නොවන සංවිධාන, TR නාමික භාරයන්
AccStatus	ඔව්	ක්‍රියාකාරී	වසා ඇත	ගිණුම් තත්ත්වය
Nationality	ඔව්	ශ්‍රී ලාංකික	ශ්‍රී ලාංකික	ජාතිය
TranReference	ඔව්	7772020010801	7772020011501	ගනුදෙනුව හඳුනා ගැනීම සඳහා හඳුනාගැනීමේ කේතය

ඇමුණුම IV

2 සහ 3 යන සිදුවීම් සිලෝන් ෆිනෑන්ස් මූල්‍ය ආයතනය විසින් පහත දැක්වෙන ආකාරයට විද්‍යුත් මුදල් ප්‍රේෂණ ලැබීම් වාර්තාවක් (EFTIN) මගින් වාර්තා කළ යුතුය.

ක්ෂේත්‍රයේ නම	අනිවාර්ය	සිදුවීම 2	සිදුවීම 3	අදහස
BankCode	ඔව්	777	777	ආයතන කේතය
ValueDate	ඔව්	20200110	20200112	ගනුදෙනු දිනය
ValueFCY	ඔව්	0	0	විදේශ මුදල් ප්‍රමාණය
Curcode	ඔව්	LKR	LKR	මුදල් කේතය
ValueRs	ඔව්	7500000	5000000	ගනුදෙනුවේ ප්‍රමාණය (රු.)
TxnDetails	ඔව්	ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම සඳහා කරන ලද චෙක් තැන්පතුව	ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම සඳහා කරන ලද විද්‍යුත් අරමුදල් මාරු තැන්පතුව	ගනුදෙනු විස්තර
SenderName	නැත	සිලෝන් ෆිනෑන්ස්	සිලෝන් ෆිනෑන්ස්	ගිණුම් අංක 1234 හි ගිණුම් හිමියාගේ නම
SenderAddress	නැත	නො 20, යෝර්ක් වීදිය, කොළඹ 01	නො 20, යෝර්ක් වීදිය, කොළඹ 01	ගිණුම් හිමියාගේ ලිපිනය
SenderBusiness	නැත	බලපත්‍රලාභී මූල්‍ය සමාගම	බලපත්‍රලාභී මූල්‍ය සමාගම	යවන්නාගේ ව්‍යාපාරය/වෘත්තිය
SenderBankBIC	ඔව්	2525	2525	යවන්නාගේ බැංකු හඳුනාගැනුම (BIC)
SenderBankName	නැත	ට්‍රස්ට් බැංකුව	ට්‍රස්ට් බැංකුව	යවන්නාගේ බැංකුව
SenderBankAddress	නැත	30, නෙක්ස්ට් පෙදෙස, කොළඹ 01	30, නෙක්ස්ට් පෙදෙස, කොළඹ 01	යවන්නාගේ බැංකු ලිපිනය
ReceiverBank	ඔව්	සිලෝන් ෆිනෑන්ස්	සිලෝන් ෆිනෑන්ස්	ලබන්නාගේ බැංකුව
ReceiverAccNo	ඔව්	4040	5050	ලබන්නාගේ ගිණුම් අංකය
ReceiverName	ඔව්	නිමල් පෙරේරා	නිමල් පෙරේරා	ලබන්නාගේ නම
ReceiverID	ඔව්	651591632V	651591632V	හැඳුනුම්පත්, ගමන් බලපත්‍ර හෝ ව්‍යාපාර ලියාපදිංචි අංකය
ReceiverAddress1	ඔව්	නො 12	නො 12	ලිපිනයේ පළමු පේළිය.
ReceiverAddress2	ඔව්	පන්සල් වීදිය	පන්සල් වීදිය	ලිපිනයේ දෙවන පේළිය.
ReceiverAddress3	ඔව්	හෝමාගම	හෝමාගම	ලිපිනයේ තුන්වන පේළිය.
ReceiverBusiness	ඔව්	ගුරු වෘත්තිය	ගුරු වෘත්තිය	ව්‍යාපාරයේ ස්වභාවය/වෘත්තිය
TranReference	ඔව්	7772020011001	7772020011205	ගනුදෙනුව හඳුනා ගැනීම සඳහා හඳුනාගැනීමේ කේතය

ඇමුණුම V

5 සහ 6 යන සිදුවීම් සිලෝන් ෆිනෑන්ස් මූල්‍ය ආයතනය විසින් පහත දැක්වෙන ආකාරයට විද්‍යුත් අරමුදල් මාරු යැවීම් වාර්තාවක් (EFTOUT) මගින් වාර්තා කළ යුතුය.

ක්ෂේත්‍රයේ නම	අනිවාර්ය	සිදුවීම 5	සිදුවීම 6	අදහස
BankCode	ඔව්	777	777	ආයතන කේතය
ValueDate	ඔව්	20200117	20200120	ගනුදෙනු දිනය
ValueFCY	ඔව්	0	0	විදේශ මුදල් ප්‍රමාණය
Curcode	ඔව්	LKR	LKR	මුදල් කේතය
ValueRs	ඔව්	11500000	1500000	ගනුදෙනුවේ ප්‍රමාණය (රු.)
TxnDetails	ඔව්	ගිණුම කල්පිරීමේදී චෙක්පත් මගින් සිදුකළ මුදල් ආපසු ගැනීම	ගිණුම කල්පිරීමේදී චෙක්පත් මගින් සිදුකළ මුදල් ආපසු ගැනීම	ගනුදෙනු විස්තර
SenderName	ඔව්	නිමල් පෙරේරා	නිමල් පෙරේරා	ගිණුම් හිමියාගේ නම
SenderAccNo	ඔව්	6789	5050	යවන්නාගේ ගිණුම් අංකය
SenderID	ඔව්	651591632V	651591632 V	හැඳුනුම්පත්, ගමන් බලපත්‍ර හෝ ව්‍යාපාර ලියාපදිංචි අංකය
SenderAddress1	ඔව්	නො. 12	නො. 12	ලිපිනයේ පළමු පේළිය.
SenderAddress2	ඔව්	පන්සල් වීදිය	පන්සල් වීදිය	ලිපිනයේ දෙවන පේළිය
SenderAddress3	නැත	හෝමාගම	හෝමාගම	ලිපිනයේ තුන්වන පේළිය.
SenderBusiness	ඔව්	ගුරු වෘත්තිය	ගුරු වෘත්තිය	ව්‍යාපාරයේ ස්වභාවය / වෘත්තිය
ReceiverAccNo	නැත	1234	1234	ලබන්නාගේ ගිණුම් අංකය
ReceiverName	ඔව්	සිලෝන් ෆිනෑන්ස්	සිලෝන් ෆිනෑන්ස්	ගිණුම් අංක 1234 හි ගිණුම් හිමියාගේ නම
ReceiverAddress	නැත	නො 20, යෝර්ක් වීදිය, කොළඹ 01	නො 20, යෝර්ක් වීදිය, කොළඹ 01	ගිණුම් හිමියාගේ ලිපිනය
ReceiverBankName	ඔව්	ට්‍රස්ට් බැංකුව	ට්‍රස්ට් බැංකුව	ලබන්නාගේ බැංකු නම
ReceiverBankBIC	ඔව්	2525	2525	ලබන්නාගේ බැංකු හඳුනාගැනුම (BIC)
TranReference	ඔව්	7772020011705	7772020012003	ගනුදෙනුව හඳුනා ගැනීම සඳහා හඳුනාගැනීමේ කේතය

චක්‍රලේඛ : 01/2020 2020 මාර්තු 31

යොමුව: 37/04/002/0004/019

වාර්තාකරණ ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී / කළමණාකාර අධ්‍යක්ෂ / සාමාන්‍යාධිකාරී වෙත

සීමා ඉක්මවූ ගනුදෙනු වාර්තා කිරීමේ අවසාන දිනය දික් කිරීමේ අති විශේෂ ක්‍රියාපටිපාටිය

හිතවත් මහත්මයාණෙනි, මහත්මියනි,

වාර්තාකරණ ආයතන කිහිපයක ඉල්ලීම් මත සහ මුහුන පා ඇති වත්මන් තත්වය සලකා බලා, අති විශේෂ ක්‍රියාමාර්ගයක් ලෙස, සීමා ඉක්මවූ ගනුදෙනු (මුදල් ගනුදෙනු වාර්තා, විද්‍යුත් මුදල් ප්‍රේෂණ-ලැබීම් වාර්තා, විද්‍යුත් මුදල් ප්‍රේෂණ-යැවීම් වාර්තා) යොමු කිරීමේ දැනට පවතින සියලු අවසාන දිනයන් 2020 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය තීරණය කර ඇත.

ඒ අනුව, පහත දැක්වෙන වාර්තා කිරීමේ කාල පරාස සඳහා, වාර්තාකරණ ආයතනවලට 2020 අප්‍රේල් 30 දින වන තෙක් සීමා ඉක්මවූ ගනුදෙනු වාර්තා යොමු කල හැක:

දෙසති වාර්තාකරණය

- 2020 පෙබරවාරි - දෙවැනි අර්ධය
- 2020 මාර්තු - පළමු සහ දෙවැනි අර්ධය

මාසික වාර්තාකරණය

- 2020 පෙබරවාරි
- 2020 මාර්තු

දැනට පවතින පරිදිම, අප්‍රේල් පළමු අර්ධය සඳහා වන සීමා ඉක්මවූ ගනුදෙනු වාර්තා, 2020 අප්‍රේල් 30 දින හෝ ඊට පෙර යොමු කල යුතුය.

ඉහත දක්වා ඇති අවසාන දින නොතකා, මෙම දීර්ඝ කල කාල වකවානුවේ වාර්තා සූදානම් වූ විගසම LankaFIN පද්ධතිය වෙත යොමු කිරීමට වාර්තාකරණ ආයතන උනන්දු විය යුතුය.

මීට විශ්වාසී
සහකාර අධිපති
ප්‍රධානී / මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: සියලුම වාර්තාකරණ ආයතන වල අනුකූලතා නිලධාරී

චක්‍රලේඛ : 02/2020 2020 අප්‍රේල් 28

යොමුව : 37/04/002/0004/019

වාර්තාකරණ ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී / කළමනාකාර අධ්‍යක්ෂ / සාමාන්‍යාධිකාරී වෙත

සීමා ඉක්මවූ ගනුදෙනු වාර්තා කිරීමේ අවසාන දිනය දික් කිරීමේ අති විශේෂ ක්‍රියාපටිපාටිය - දෙවන දිගුව

හිතවත් මහත්මයාණෙනි, මහත්මියනි,

ඉහත කරුණ සම්බන්ධව 2020 මාර්තු 31 දින ඔබ වෙත එවූ ලිපිය හා බැඳේ.

උද්ගතව ඇති කොවිඩ්-19 පැතිරීයාමේ තත්වය නිසා රටේ පනවා ඇති ඇදිරි නීතිය දීර්ඝ කිරීම සලකා බලා, දැනට පවත්නා සියලුම සීමා ඉක්මවූ ගනුදෙනු (මුදල් ගනුදෙනු වාර්තා, විද්‍යුත් මුදල් ප්‍රේෂණ - ලැබීම් වාර්තා, විද්‍යුත් මුදල් ප්‍රේෂණ යැවීම් වාර්තා) යොමු කිරීමේ අවසාන දිනයන් 2020 මැයි 31 දින දක්වා අති විශේෂ ක්‍රියාමාර්ගයක් ලෙස දීර්ඝ කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය තීරණය කර ඇත.

ඒ අනුව, පහත දැක්වෙන වාර්තා කිරීමේ කාල පරාස සඳහා, වාර්තාකරණ ආයතන වලට 2020 මැයි 31 දින වන තෙක් සීමා ඉක්මවූ ගනුදෙනු වාර්තා යොමු කල හැක:

දෛනික වාර්තාකරණය

- 2020 පෙබරවාරි - දෙවැනි අර්ධය
- 2020 මාර්තු - පළමු සහ දෙවැනි අර්ධය
- 2020 අප්‍රේල් - පළමු සහ දෙවැනි අර්ධය
- 2020 මැයි - පළමු අර්ධය

මාසික වාර්තාකරණය

- 2020 පෙබරවාරි
- 2020 මාර්තු
- 2020 අප්‍රේල්

ඉහත දක්වා ඇති අවසාන දින නොතකා, මෙම දීර්ඝ කල කාල වකවානුවේ වාර්තා සූදානම් වූ විගසම, LankaFIN පද්ධතිය වෙත යොමු කිරීමට වාර්තාකරණ ආයතන උනන්දු විය යුතුය.

මීට විශ්වාසී
අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: සියලුම වාර්තාකරණ ආයතන වල අනුකූලතා නිලධාරී

මාර්ගෝපදේශ- 02/2020 2020 ජූනි 10

යොමු අංකය : 037/08/001/0027/018

ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී / හිමිකරු වෙත,

හිතවත් මහත්මයාණෙනි/මහත්මියනි,

2020 අංක 02 දරන ගණකාධිකාරීවරුන් සහ භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා බැඳීම් සඳහා වන මාර්ගෝපදේශය

ඉහත සඳහන් කරන ලද මාර්ගෝපදේශ වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක වන අතර, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2018 අංක 1 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිලිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සමඟ කියවිය යුතු වේ.

මෙයට විශ්වාසි,
ඊ. එච්. මොහොට්ටි
අධ්‍යක්ෂ / මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත් : අනුකූලතා නිලධාරීන්

2020 අංක 02 දරන ගණකාධිකාරීවරුන් සහ භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා බැඳීම් සඳහා වන මාර්ගෝපදේශය

I කොටස

හැඳින්වීම

1. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 15 (1) (ඒ) වගන්තියට අනුකූලව නිකුත් කරනු ලබයි. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය 2018.01.10 දින අංක 2053/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සඳහා අදාළ වන්නා වූ 2018 අංක 01 දරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සමඟ කියවිය යුතුය.

2. මෙම මාර්ගෝපදේශ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති අර්ථ නිරූපණය කිරීම සඳහා ආධාරකයක් ලෙස සපයනු ලබන අතර පනතෙ හි 33 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි පහත සඳහන් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා මග පෙන්වීමක් ලෙස ක්‍රියා කරනු ඇත (මෙතැන් සිට "සේවා සපයන්නා" ලෙස හැඳින්වේ).

   i. පහත දැක්වෙන කටයුතු අතුරෙන් කිසිවකට අදාළව, තම සේවා දායකයන් වෙනුවෙන් ගනුදෙනු සඳහා සුදානම් වන විට හෝ ඒවා කරගෙන යන විට, නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් හා ගණකාධිකාරිවරුන්:

      අ) නිශ්චල දේපල මිලට ගැනීම හා විකිණීම;

      ආ) සේවාදායක මුදල්, ඇප හෝ වෙනත් වත්කම් කළමනාකරණය;

      ඇ) බැංකුවේ ඉතිරිකරගත් මුදල් හෝ ඇප ගිණුම් කළමනාකරණය කිරීම;

      ඈ) සමාගම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා දායක මුදල් සංවිධානය කිරීම; සහ

      ඉ) නෛතික පුද්ගලයන් ඇති කිරීම, මෙහෙයවීම හෝ කළමනාකරණය කිරීම හෝ ව්‍යාපාර අස්තිත්ව පිළියෙළ කිරීම, මිලට ගැනීම හා විකිණීම;'

   ii. මෙම අර්ථකතනයෙන් අන්‍යාකාරයකින් අනාවරණය නොවන්නා වූ, ව්‍යාපාරයක් වශයෙන් තුන්වන පාර්ශවයන්ට පහත දැක්වෙන සේවාවන් එකක් හෝ වැඩි ගණනක් සපයන්නා වූ භාරයක් හෝ සමාගම් සේවා සපයන්නෙක්:

ඇ) නෛතික පුද්ගල සැපයුම හෝ කළමනාකරණය

ඈ) සමාගමක අධ්‍යක්ෂකවරයෙකු හෝ ලේකම්වරයෙකු, කොටස්කරුවෙකු හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ වෙනත් නෛතික පුද්ගලයින්ට අදාළව සමාන තත්ත්වයකින් ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු වෙනුවෙන් කටයුතු පිළියෙළ කිරීම.

ඉ) සමාගමක් හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් යම් නෛතික පුද්ගලයෙක් හෝ නියමිත ස්ථානයක් සඳහා ලියාපදිංචි කරන ලද කාර්යාලයක්, ව්‍යාපාරික ලිපිනයක් හෝ ඉඩකඩ තැපැල් මාර්ගික හෝ පරිපාලනමය ලිපිනයක් ලබා දීම.

ඊ) ප්‍රකාශිත භාරයක භාරකරු වශයෙන් ක්‍රියාකිරීම හෝ ක්‍රියාකිරීම සඳහා වෙනත් තැනැත්තෙකු සුදානම් කිරීම.

උ) වෙනත් තැනැත්තෙකු වෙනුවෙන් නාමික කොටස්කරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු සුදානම් කිරීම.

ඉහත 2 (i) සහ 2 (ii) හි සඳහන් ක්‍රියාකාරකම් මෙතැන් සිට "සම්බන්ධිත ක්‍රියාකාරකම්" ලෙස හැඳින්වේ.

3. සම්බන්ධිත ක්‍රියාකාරකම් සිදු කිරීමේදී මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සේවා සපයන්නන්ට සහාය වීම සඳහා මෙම මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ.

4. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය නිරවශේෂයෙන්ම සවිස්තරාත්මක යැයි අදහස් නොකරන අතර පනත සහ ඒ අනුව නිකුත් කරන ලද වෙනත් නීති රීති වලට අනුකූල වීම සඳහා ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පාලනයන් ඇති කිරීමේදී මඟ පෙන්වීමක් ලෙස පමණක් සැලකිය යුතුය. මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි කිසිවක් මූල්‍ය බුද්ධි ඒකකයෙන් ලද නෛතික උපදෙස් ලෙස අර්ථකථනය නොකල යුතු වේ.

5. මෙම මාර්ගෝපදේශ වල කාර්යයන් සඳහා, පද සම්බන්ධය අනුව, අන්‍යයාර්ථයක් අවශ්‍ය වේ නම් මිස;

- ප්‍රතිලාභී හිමිකරු යනු ගනුදෙනුකරුවෙකුගේ අත්‍යන්ත හිමිකාරත්වය හෝ පාලනය සහිත ස්වභාවික තැනැත්තෙකු, නැතහොත් ගනුදෙනුව පවත්වනු ලබන්නේ යම් තැනැත්තෙකුගේ ප්‍රතිලාභය සඳහා ද, ඒ තැනැත්තා අදහස් වන අතර යම් තැනැත්තෙකුගේ හෝ නෛතික වැඩපිළිවෙලක සක්‍රීය ලෙස අත්‍යන්ත පාලනය දරනු ලබන තැනැත්තෙකු ද ඊට ඇතුලත් වේ.
- සේවාදායකයා යන්නෙන් අදහස් කරන්නේ පනතෙහි 33 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි "ගනුදෙනුකරු" යන්නයි.
- මූල්‍ය කාර්ය සාධක බලකාය යනු මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සහ එමඟින් සමාජයට සිදුවන හානිය වැළැක්වීම අරමුණු කරගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් සකස් කරන අන්තර් රාජ්‍ය ආයතනය වේ.
- මුල්‍ය බුද්ධි ඒකකය යනු 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නියම කර ඇති එම පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පිහිටුවා ඇති ආයතනයයි.
- මුදල් විශුද්ධිකරණය යනු 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 3 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති දඬුවම් ලැබිය හැකි මුදල් විශුද්ධිකරණය කිරීමේ වරද
- ත්‍රස්තවාදයට මුදල් සැපයීම යනු 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතෙහි 3 වන වගන්තිය ප්‍රකාරව ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ වරද
- දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තා යනු දේශීය වශයෙන් හෝ විදේශීය රාජ්‍යයක් විසින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින්, ප්‍රමුඛ රජයේ කර්තව්‍ය පවරා ඇති යම් පුද්ගලයෙකු අදහස් වන අතර එයට යම් රාජ්‍යක හෝ රජයක, ප්‍රධානියෙකු, දේශපාලනඥයකු, ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරියෙකු, අධිකරණ නිලධාරියෙකු හෝ හමුදා නිලධාරියෙකු හෝ රජය සතු සංස්ථාවක, රජයේ හෝ ස්වාධීන ආයතනයක ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු අදහස් වන අතර, මධ්‍යම මට්ටමේ හෝ කනිෂ්ඨ මට්ටමේ පුද්ගලයන් ඊට ඇතුලත් නොවේ.
- සැක සහිත ගනුදෙනු වාර්තා යනු පනතේ 7 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති සැක සහිත ගනුදෙනු වාර්තා.

ගණකාධිකරණ සේවාවන් අවධානමට ලක්වීමේ හැකියාව

6. ගණකාධිකාරිවරුන් විසින් සපයනු ලබන සමහර සේවාවන් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් වලට ගොදුරු වේ. එබැවින් මුදල් විශුද්ධිකරණයේ නිරතවන්නන් / කරන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් විසින් එම ව්‍යාත්තීන් අවභාවිතා කල හැකිය. අපරාධවලින් ලැබෙන මුදල් සැඟවීමේදී ගණකාධිකාරිවරුන්ගේ විශේෂඥ දැනුම උපයෝගී කර ගනිමින් ඔවුන්ව අතරමැදියන් ලෙස යොදා ගනී. එවැනි සමහර සේවාවන් පහත ඇතුළත් වේ.

ක) දේපල මිලදී ගැනීම හෝ විකිණීම - නීතිවිරෝධී ලෙස උපයාගත් අරමුදල් හුවමාරු කිරීම සඳහා ආවරණයක් ආකාරයෙන් හෝ නීති විරෝධී මුදල්වල අවසාන ආයෝජනයක් ආකාරයෙන් අපරාධකරුවන්ට දේපල පැවරීම් භාවිතා කළ හැකි අතර එම ගනුදෙනුව සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියට අදාල විය හැකිය.

ඛ) මූල්‍ය ගනුදෙනු සිදු කිරීම - අපරාධකරුවන් හෝ අපරාධකරුවන් විය හැකි පුද්ගලයන් ඔවුන්ගේ විවිධ මූල්‍ය මෙහෙයුම් සිදු කර ගැනීමට හෝ පහසුකම් සලසා ගැනීමට ගණකාධිකාරිවරුන් යොදා ගත හැකිය (උදාහරණ: මුදල් තැන්පතු හෝ ගිණුම් වලින් මුදල් ආපසු ගැනීම, සිල්ලර විදේශ විනිමය මෙහෙයුම්, චෙක්පත් නිකුත් කිරීම සහ නිෂ්කාශනය, කොටස් මිලදී ගැනීම සහ විකිණීම, ජාත්‍යන්තර අරමුදල් යැවීම සහ ලැබීම යන ආදිය).

ග) මූල්‍ය ආයතන හරහා ප්‍රතිලාභ ලබා ගැනීම - අපරාධකරුවන් විසින් ගණකාධිකාරීවරුන්ව හඳුන්වාදෙන්නන් හෝ අතරමැදියන්

ලෙස භාවිතා කළ හැකිය. අපරාධකරුවන් විසින් ගණකාධිකාරීවරුන් හඳුනා ගැනීමට මූල්‍ය ආයතන යොදා ගැනීම මින් දෙයාකාරයටම සිදුවිය හැකිය.

ඈ) සමාගම් සහ භාරයන් පිහිටුවීම - සංස්ථාපිත ආයතන හෝ වෙනත් සංකීර්ණ නීතිමය විධිවිධාන නිර්මාණය මගින් අපරාධකරුවන් සහ අපරාධකරුගේ ආදායම අතර සම්බන්ධතා ව්‍යාකුල කිරීමට හෝ සැඟවීමට අපරාධකරුවන් උත්සාහ කළ හැකිය.

7. ගණකාධිකාරිවරුන්ගේ වෘත්තීය දැනුම, කුසලතා සහ හැකියාවන් මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් සිදු කිරීමේදී අපරාධකරුවන් විසින් අනිසි ලෙස භාවිතා කිරීමට ඉඩ ඇත. සේවා සැපයුම්කරුවන් දැනුවත්ව හෝ නොදැනුවත්ව මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් වල යෙදී සිටින සේවාදායකයින් සමග සම්බන්ධ වී සිටින්නේ නම් ඔවුන්ට කීර්ති නාමය අහිමිවීම සහ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු විවිධ අවාසි වලට මුහුණ දීමට සිදුවේ.

8. අරමුදල් ප්‍රභවය සඟවා ගැනීම සඳහා ව්‍යාජ ගිණුම් වලට නීත්‍යානුකූල බවක් ආරෝපණය කිරීම සඳහා අපරාධකරුවන් හෝ අපරාධකරුවන් විය හැකි පුද්ගලයන් ගණකාධිකාරිවරුන් විසින් සපයනු ලබන සේවාවන් අනිසි ලෙස භාවිතා කළ හැකිය. නිදසුනක් වශයෙන්, ගණකාධිකාරීවරයෙකු අපරාධකරුවන්ට සම්බන්ධ ව්‍යාපාරයක ගිණුම් සමාලෝචනය කර අත්සන් කිරීම මුදල් විශුද්ධිකරණය සඳහා පහසුකම් සැපයීමක් ලෙස සලකනු ලැබිය හැකිය. ඇතැම් ගණකාධිකාරීවරුන් විසින් සිදු කරන නුබුන්වත්භාවය පරීක්ෂා කිරීම මගින් අපරාධකරුවන් සමාගමක් හරහා මුදල් විශුද්ධිකරණය කල බවට වන විගණන සාක්ෂි සඟවා අපරාධ වලින් ලැබෙන මුදල් හුවමාරු කිරීමේ අවධානමක් පවතී.

භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන්ගේ සේවාවන් අවදානමට ලක්වීමේ හැකියාව

9. භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන් විසින් සමාගම් සහ භාරයන් පිහිටුවීම හා කළමනාකරණය කිරීම සම්බන්ධ සේවාවන් සපයන අවස්ථාවන්හිදී මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් සඳහා අවදානමට ලක්විය හැකි යැයි සලකනු ලැබේ.

10. අපරාධකරුවන් සහ අපරාධකරුවන් විය හැකි පුද්ගලයන් සමාගම්, භාරයන් සහ ඒ හා සමාන වෙනත් නෛතික වැඩපිළිවෙලවල් යොදා ගනිමින් සාපරාධී ලෙස උපයාගත් වත්කම්වල මූලාශ්‍රය සහ අයිතිය / ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා මුදල් යෙදවීම සැඟවීමට උත්සාහ දරයි.

11. තවද, මුදල් විශුද්ධිකරණයේ නිරතවන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් ස්වාධීන මෙහෙයුම්, සැලකිය යුතු වත්කම්, අඛණ්ඩ ව්‍යාපාරික ක්‍රියාකාරකම් නොමැති, හෝ සේවකයින් හරහා ප්‍රතිලාභී හිමිකරු සැඟවිය හැකි ෂෙල් සමාගම් පිහිටුවාගනිමින් ඒ හරහා ගනුදෙනු සිදු කිරීමට හෝ නීත්‍යානුකූලභාවය ලබා දීමට උත්සහ දරයි.

12. අපරාධකරුවන් සහ අපරාධකරුවන් විය හැකි පුද්ගලයන් ඔවුන්ගේ භෞතික පිහිටීම වෙනුවට සමාගම් සේවා සපයන්නන්ගේ ලිපිනය භාවිතා කරන අතර එමඟින් ඔවුන් සිදුකරන ගනුදෙනු හා ක්‍රියාකාරකම් නිර්නාමිකව සහ දුරස්ථව තබා ගැනීමට උත්සහ දරයි. තවද, ඒ මගින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට නීත්‍යානුකූල මුහුණුවරක් එක් වේ.

13. අපරාධකරුවන් සහ අපරාධකරුවන් විය හැකි පුද්ගලයන් තම සමාගම් හෝ භාරයන් වල ඉහල කළමනාකාරීත්වයේ තනතුරු සඳහා සමාගම් සේවා සපයන්නන් ගේ සේවාව ලබා ගැනීම මගින් වැඩි ගෞරවයක් සහ නීත්‍යානුකූලභාවයක් ලබා ගැනීම හරහා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා මුදල් යොදවයි.

14. අපරාධකරුවන් සහ අපරාධකරුවන් විය හැකි පුද්ගලයන් සමාගම් සේවා සපයන්නන් යොදා ගනිමින් නාමික කොටස් හිමියන් හෝ නාමික අධ්‍යක්ෂවරුන් හෝ සමාගම්වල භාරකරුවන් හෝ භාරයන් හෝ වෙනත් නෛතික වැඩපිළිවෙලවල හිමිකාරිත්වය සැඟවීම සඳහා භාවිතා කරයි. මෙමගින් සමාගම හෝ නෛතික වැඩපිලිවෙල විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ව්‍යාජ නීත්‍යානුකූලභාවයක් සපයමින් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ වෙනත් අපරාධ අනාවරණය කර නොගෙන අපරාධකරුවන්ට තම සමාගම් හෝ වෙනත් නීතිමය විධිවිධාන ඒ සඳහා භාවිතා කිරීමට අවස්ථාව ලැබේ.

II කොටස

අවදානම පදනම් කරගත් ප්‍රවේශය

15. ගනුදෙනුකරු නිසි පරිදි හඳුනාගැනීමේ රීති යටතේ සෑම සේවා සැපයුම්කරුවෙකුටම මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ එවැනි අවදානම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පාලනයන් ඇති කිරීම අවශ්‍ය වේ. එම ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පාලනයන්හි සඵලදායීත්වය අඛණ්ඩ අධීක්ෂණය කිරීම ද අපේක්ෂා කෙරේ. අවදානම පදනම් කරගත් ප්‍රවේශය මඟින් සේවා සැපයුම්කරුවන්ට අවදානම් වැඩි ප්‍රදේශවලට වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීමට හැකි වේ.

16. සේවා සපයන්නාගේ ආයතනික ස්වභාවය සහ ප්‍රමාණය මත පදනම්ව ඔවුන්ගේ විශේෂිත ආයතනික ව්‍යුහය සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් සඳහා තමාගේ විනිශ්චය, දැනුම සහ විශේෂඥතාව භාවිතා කරමින් සුදුසු අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් ඇති කර ගැනීම සෑම සේවා සැපයුම්කරුවෙකුගෙන්ම අපේක්ෂා කෙරේ. අවදානම් තක්සේරු කිරීම අවදානම් පදනම් කරගත් ප්‍රවේශයේ ප්‍රධාන ආරම්භක ස්ථානයයි. එය ව්‍යාපාරයේ ස්වභාවය, ප්‍රමාණය සහ සංකීර්ණත්වය සමඟ ගැලපීම අවශ්‍ය වේ. අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් ඇති කිරීමේදී සලකා බැලිය හැකි සාධක කිහිපයක් පහත පරිදි වේ.

- සේවා සැපයුම්කරුගේ ප්‍රමාණය, භූගෝලීය පිහිටීම සහ ආයතනික සංකීර්ණතාවයට අදාළ අවදානම්

- සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන විශේෂිත සේවාවන් හා සම්බන්ධ අවදානම්
- විවිධ විශේෂ සේවාදායකයින්ට සම්බන්ධ අවදානම්
- බෙදා හැරීමේ ජාල සම්බන්ධ අවදානම්

මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම තීරණය කිරීම සඳහා මෙම සාධක වෙන වෙනම හෝ ඒකාබද්ධව සැලකිය හැකිය. නිදසුනක් ලෙස, සමාගම් පිහිටුවීම, ගනුදෙනුකරුවන්ගේ මුදල් කළමනාකරණය කිරීම, සංකීර්ණ ප්‍රතිලාභී හිමිකාරිත්ව ව්‍යුහයන් හෝ දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් හෝ ඉහළ අවදානමක් සහිත සහ වෙනත් අධීක්ෂණය යටතේ පවතින රටක සහ / හෝ ඉහළ අවදානමක් සහිතව ව්‍යාපාරයක නිරතවන්නන් සමග ගනුදෙනු කිරීම වැනි සම්බන්ධිත ක්‍රියාකාරකම් වල නිරත සමාගම් සේවා සපයන්නන් මෙම අවදානම් කාණ්ඩ වලින් එකකට පමණක් නිරාවරණය වන සමාගමකට වඩා වැඩි මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමකට ගොදුරු විය හැකිය.

17. මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සන්දර්භය තුළ අවදානම පදනම් කරගත් ප්‍රවේශය පහත සඳහන් පියවරයන්ගෙන් සමන්විත වේ:

(අ) මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනා ගැනීම;
(ආ) මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරු කිරීම;
(ඇ) මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා පාලනයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;
(ඈ) අවදානම මත පදනම් වූ පාලනයන්ගේ සඵලදායී ක්‍රියාකාරිත්වය අධීක්ෂණය සහ වැඩිදියුණු කිරීම.

(අ) මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනා ගැනීම

18. අවදානම මත පදනම් වූ ප්‍රවේශයේ පළමු පියවර ලෙස සේවා සපයන්නා විසින් සේවාදායකයින්, භූගෝලීය පිහිටීම්, සේවා සහ සේවා සපයන ආකාරය සමඟ සම්බන්ධ වූ සෘජු හා වක්‍ර ML / TF අවදානම් සාධක හඳුනාගත යුතුය.

19. ඉහත සඳහන් අංශ හා සම්බන්ධ අවදානම් හඳුනාගැනීමේදී, සේවා සපයන්නා විසින් අදාළ අවදානම සලකා බලා ලේඛනගත කළ යුතුය:

- සේවාදායකයින් ඔවුන්ගේ ප්‍රතිලාභී හිමිකරුවන්ද ඇතුළුව
- සේවාදායකයින්ගේ / ප්‍රතිලාභී හිමිකරුවන්ගේ ව්‍යාපාර හෝ වෘත්තීය ක්‍රියාකාරකම්.
- සේවාදායකයින්ගේ ප්‍රතිලාභී හිමිකරුවන්ගේ කීර්තිය.
- ස්වභාවය සහ සේවාදායකයින්ගේ ප්‍රතිලාභී හිමිකරුවන්ගේ හැසිරීම.

භූගෝලීය පිහිටීම

- සේවාදායකයාගේ / ප්‍රතිලාභී හිමිකරුගේ භූගෝලීය සම්භවය සහ ස්ථානය.
- සේවාදායකයාගේ / ප්‍රතිලාභී හිමිකරුගේ ව්‍යාපාර ස්ථාන.
- සේවාදායකයාට / ප්‍රතිලාභී හිමිකරුට පුද්ගලික සම්බන්ධතා ඇති භූගෝලීය ස්ථාන.

සේවා

- සේවා සපයන්නන් විසින් සපයනු ලබන සේවාවන් වර්ග.
- ගනුදෙනුවේ සංකීර්ණත්වය.
- ගනුදෙනුවේ වටිනාකම හෝ ප්‍රමාණය.

බෙදා හැරීමේ මාර්ග

- මුහුණට මුහුණ මුණ නොගැසි සිදු කරන ව්‍යාපාරික සම්බන්ධතා ප්‍රමාණය.
- ගනුදෙනු ක්‍රියාවලියේදී යොදා ගනු ලබන අතරමැදියන් හෝ හඳුන්වා දෙනු ලබන පුද්ගලයන් සහ ඔවුන්ගේ සම්බන්ධතාවයේ ස්වභාවය.

20. සම්බන්ධිත ක්‍රියාකාරකම් ආශ්‍රිත මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් සඳහා උදාහරණ සහ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සඳහා ආදර්ශ පිරික්සුම් ලැයිස්තුව පිළිවෙලින් ඇමුණුම I සහ II හි මඟ පෙන්වීමක් ලෙස දක්වා ඇත. තම ආයතනයේ මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම මත පදනම්ව තමන්ගේම පිරික්සුම් ලැයිස්තුවක් සකස් කිරීමට සේවා සපයන්නා දිරිමත් කරනු ලබන අතර ඒ සඳහා ඇමුණුම II මඟින් යම් මඟ පෙන්වීමක් ලබා දෙනු ඇත.

(ආ) අවදානම් තක්සේරු කිරීම

21. සේවා සපයන්නාගේ මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් සාධක හඳුනාගත් පසු එම අවදානම් තක්සේරුව සිදු කිරීම අවශ්‍ය වේ.

මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරුව යනු සේවා සපයන්නා නිරාවරණය වන මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ තර්ජන හා එම අවදානමට ලක්වීමට ඇති හැකියාව පිලිබඳ විශ්ලේෂණයකි. අනෙක් සාධක අතර සේවා සපයන්නාගේ ස්වභාවය, ප්‍රමාණය සහ මුහුණ දෙන අවදානම අනුව මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරුවේ සංකීර්ණතාවය රඳා පවතී.

22. ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම, වාර්තා තබා ගැනීම සහ වාර්තාකිරීමේ අවශ්‍යතා සඳහා පවත්නා ප්‍රතිපත්ති ක්‍රියා පටිපාටි සහ පාලනයන් නොසලකා මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරුව සිදු කරනු ලැබේ.

(ඇ) මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් කළමනාකරණය සහ අවම කිරීම සඳහා පාලනයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

23. අවදානම් අවම කිරීම යනු සේවා සපයන්නාට දරාගත හැකි ආකාරයට අවදානම් රැගෙන එන්නන් හෝ අවදානම් ප්‍රභවයන් (එනම් තර්ජන, අවදානම් ඇති වීමේ හැකියාවන්) කාලෝචිත ආකාරයකින් ආමන්ත්‍රණය කිරීම සඳහා පාලනයන් ක්‍රියාත්මක කිරීම වේ. පාලනයන් ලිඛිත ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි ආකාරයෙන් පවත්වා ගත යුතුය.

24. කළමනාකාරිත්වයේ, සේවකයින්ගේ හෝ ව්‍යාපාර ව්‍යුහයේ වෙනස්වීම් සිදු වුවද, කිසිදු බාධාවකින් තොරව මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය, ක්‍රියා පටිපාටි සහ පාලනයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සේවා සපයන්නා විසින් සහතික කල යුතුවේ.

(ඈ) අවදානම පදනම් කරගත් පාලනයන්හි සඵලදායි මෙහෙයුම් අධීක්ෂණය සහ වැඩි දියුණු කිරීම

25. මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම සඵලදායි ලෙස කළමනාකරණය කිරීම අඛණ්ඩ හා ගතික ක්‍රියාවලියකි. සමාගම් සේවා සපයන්නාගේ මෙහෙයුම්වල පරිමාණයේ හෝ ස්වභාවයෙහි වෙනස්වීම්, නව සේවා වර්ග, නව සේවාදායකයකයින් මගින් ඇතිවන නව අවදානම් සහ ඇතිවිය හැකි අවදානම් ද ඇතුලත්ව යාවත්කාලීන සඵලදයී අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය නිරන්තර සමාලෝචනයට භාජනය වන බවට සේවා සැපයුම්කරු සහතික විය යුතු ය.

26. සේවා සැපයුම්කරුගේ අවදානම තක්සේරු කිරීමේ අරමුණින් සකස් කරන ලද පිරික්සුම් ලැයිස්තුව නව සහ මතුවෙමින් පවතින අවදානම් නිසි පරිදි යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය මෙවලමක් ලෙස අඛණ්ඩව පවත්වා ගත හැකිය.

III කොටස

අනුකූලතාවය

අනුකූලතා නිලධාරිවරයා

27. සෑම සේවා සැපයුම්කරුවෙකු විසින් ම මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන හා ඒ යටතේ නිකුත් කර ඇති වෙනත් රීති හා රෙගුලාසි සඳහා සේවා සැපයුම්කරුගේ අනුකූලතාවය සහතික කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් සේවය කරන නිලධාරිවරයෙකු, අනුකූලතා නිලධාරිවරයා ලෙස පත් කිරීම අවශ්‍ය වේ. මුදල් විශුද්ධිකරණය වැළක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගවලට අනුකූල වන පරිදි ක්‍රියා පටිපාටි සහ පද්ධති ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම අනුකූලතා නිලධාරිවරයාගේ වගකීම වේ. අනුකූලතා නිලධාරිවරයාට ඔහුගේ හෝ ඇයගේ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය අධිකාරිය සහ සම්පත් නිසි ලෙස පවරා තිබීම අවශ්‍ය වන අතර ඔහු/ඇය විසින් සේවා සැපයුම්කරුගේ මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග නිසි ලෙස අධීක්ෂණය කිරීම මගින් ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවටත් යාවත්කාලීනව පවතින බවටත් සහතික කිරීම අවශ්‍ය වේ.

28. සේවා සැපයුම්කරුගේ කළමනාකරණ ව්‍යුහයට අනුව, අනුකූලතා නිලධාරියාට ඉහළ කළමනාකරණයට හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව ප්‍රවේශ වීමට හැකියාවක් පැවතිය යුතු ය. එබැවින් අනුකූලතා නිලධාරී තනතුර දරන්නා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරිවරයෙකු විය යුතු ය.

29. සේවා සැපයුම්කරු විසින් පළමුවර අනුකූලතා නිලධාරිවරයකු පත් කිරීම ද ඇතුළුව එම තනතුරේ පසු කාලීනව ඇතිවන වෙනස්වීමක්, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂකවරයා වෙත "අනුකූලතා නිලධාරී ප්‍රකාශන පෝරමය' (ඇමුණුම III) භාවිත කරමින් දැනුම් දිය යුතු ය. එහි දී, මෘදු පිටපත, fiudnfbp@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කල යුතු අතර ඒ සමඟම දෘඪ පිටපත අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතු ය.

30. අනුකූලතා නිලධාරිවරයාගේ පත්වීම විධිමත් ලෙස සිදු කල යුතු අතර අදාළ වගකීම් අනුකූලතා නිලධාරියාගේ රැකියා විස්තරයට ඇතුළත් කළ යුතු ය.

IV කොටස

මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය, ක්‍රියා පටිපාටි සහ පාලන

31. මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරුව අනුව සෑම සේවා සැපයුම්කරුවකු විසින්ම මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තියක් ලිඛිත ව ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. සේවා සැපයුම්කරු විසින් මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම හා ඵලදායී ලෙස සේවා සැපයුම්කරුගේ කාර්ය මණ්ඩලය විසින් නිසි ලෙස අනුගමනය කරනු ලබන සහ අවබෝධ කර ගත් එමෙන්ම කාලෝචිතව සන්නිවේදනය කරන ලද ක්‍රියා පටිපාටි සහ පාලනයන් භාවිතා කරමින්, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

32. එක් එක් සේවා සැපයුම්කරුගේ මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය, ක්‍රියා පටිපාටි සහ පාලනයන්හි ප්‍රමාණය හා මට්ටම රඳා පවතින්නේ සේවා සපයන්නාගේ විශේෂිත තත්වයන් මෙන්ම අවදානම් තක්සේරු කිරීමේ ප්‍රතිඵල මත ය.

33. සේවා සපයන්නාගේ මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය, ක්‍රියා පටිපාටි සහ පාලනයන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හෝ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන් විසින් අනුමත කිරීම අවශ්‍ය වේ. මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය, ක්‍රියා පටිපාටි සහ පාලනයන් සකස් කිරීමේදී අවම වශයෙන් පහත දෑ ඇතුලත් කිරීම අවශ්‍ය වේ;

- සේවාදායකයින් හඳුනා ගැනීම සහ අනන්‍යතාවය සත්‍යාපනය කිරීම,
- ගනුදෙනුකරුවන් පිලිබඳ නිසි පරිදි හඳුනා ගැනීම සඳහා සිදු කළ යුතු අනෙකුත් දෑ (ප්‍රතිලාභී හිමිකරු සහ / හෝ සේවාදායකයා වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම පුද්ගලයෙකු හඳුනා ගැනීම සහ සත්‍යාපනය කිරීම ඇතුළුව),
- වාර්තා පවත්වා ගැනීම,
- මූල්‍ය බුද්ධි ඒකකය වෙත යොමු කළ යුතු අනිවාර්ය වාර්තා ඉදිරිපත් කිරීම,
- සේවා සැපයුම්කරු විසින් මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා යොදා ගනු ලබන අනුකූලතා ක්‍රියාමාර්ග පිලිබඳව ස්වාධීන විගණනය සහතික කිරීම,
- එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල සම්මුතිය විසින් නිකුත් කරන ලද ත්‍රස්තවාදය, ත්‍රස්තවාදය සඳහා මූල්‍යකරණය සහ මහා විනාශකාරී ආයුධ ව්‍යාප්ත කිරීම පිළිබඳ නම් කරන ලද ලැයිස්තු වලට එරෙහිව සේවාදායකයින් පරීක්ෂා කිරීම.,
- සේවකයින් බඳවා ගැනීමට පෙර සේවකයින් පිලිබඳ සුපරීක්ෂාකාරී වීම සහ මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ සේවක පුහුණුව.

34. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්/ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන්ට මුදල් විශුද්ධිකරණය වැළක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ ආයතනය වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම් පිලිබඳ අවබෝධයක් පැවතිය යුතු ය. ආයතනයේ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවධානම පාලනය කිරීමට සහ අවම කිරීමට අවශ්‍ය වන ක්‍රියාපටිපාටි සහ පාලනයන් සහ මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ වගකීම අවසාන වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන් වෙත රඳා පවතී.

35. විස්තර කර ඇති මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තිය, ක්‍රියා පටිපාටි සහ පාලනයන් විකාශනය වෙමින් පවතින හා නැගී එන අවදානම් වලට අනුකූල වන බව සහතික කිරීම සඳහා අඛණ්ඩ ව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතු ය.

36. සේවා සැපයුම්කරු කිසියම් දේශීය හෝ විදේශීය ශාඛා / කාර්යාල / උප සමාගම් පවත්වාගෙන යන විට, සියලුම ශාඛා / කාර්යාල / පරිපාලිත සමාගම් දේශීය නීති සහ රෙගුලාසිවලට අනුකූලවන පරිදි එකම මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා 'පොදු මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා ප්‍රතිපත්තියක්' ස්ථාපිත කර තිබීම අවශ්‍ය වේ.

37. විදේශීය ශාඛාවක් / කාර්යාලයක් / අනුබද්ධිත ආයතනයක් සඳහා අදාළ වන විදේශීය නීති සහ / හෝ රෙගුලාසි ශ්‍රී ලංකා නීති සහ / හෝ නීතිරීතිවලට පටහැනි නම් හෝ වෙනත් ආකාරයකින් සීමා කරන්නේ නම්, සේවා සපයන්නා විසින් CDD රීතිවල දක්වා ඇති පරිදි ක්‍රියා කිරීම අවශ්‍ය වේ.

V කොටස

ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සේවාදායකයා, ප්‍රතිලාභී හිමිකරු සහ සේවාදායකයා වෙනුවෙන් කටයුතු කරනු ලබන පුද්ගලයන් හඳුනා ගැනීම සහ අනන්‍යතාවය සනාථ කර ගැනීම

38. සළකා බලනු ලබන කාර්යයන්හි නිරත වන විටදී, සේවා සපයන්නන් විසින් ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළව නිකුත් කර ඇති රීතීන්හි නිශ්චය කර ඇති ආකාරයට, වරින් වර හෝ එක් වරක් පමණක් පැමිණෙන සේවාදායකයන්ද ඇතුළුව ඔවුන්ගේ සියලුම සේවාදායකයන් පිළිබඳව නිසි අවබෝධයෙන් කටයුතු කිරීම අවශ්‍ය කෙරේ.

39. සේවාදායකයා තෙවන පාර්ශවයක් වෙනුවෙන් කටයුතු කරන්නේද, සේවාදායකයා තෙවන පාර්ශ්වයක නියෝජිතයෙකු වන අවස්ථාවකදී සේවාදායකයාගේ ප්‍රතිලාභී හිමිකරු කවරෙක්ද සහ/හෝ ගනුදෙනුවට අරමුදල් සපයන්නේ කවරෙක්ද යන්න සේවා සපයන්නා විසින් නිශ්චය කර ගැනීම අවශ්‍ය කෙරේ. ඒ අනුව, සේවා සැපයුම්කරු විසින්, සළකා බලනු ලබන කාර්යයකට අදාළව, ප්‍රතිලාභී හිමිකරුවන් සම්බන්ධයෙන්ද ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළ ප්‍රතිමානයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය කෙරේ.

40. සේවා සැපයුම්කරු විසින් ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ රීතීන්හි නිශ්චය කර ඇති ආකාරයට සේවාදායකයාගේ, ප්‍රතිලාභී හිමිකරුගේ සහ සේවාදායකයා වෙනුවෙන් කටයුතු කරනු ලබන පුද්ගලයාගේ අනන්‍යතාවය පිළිබඳව අවම තොරතුරු ලබා ගත යුතු අතර ස්වාධීන, විශ්වසනීය මූලාශ්‍ර ලේඛනයක් මගින් එකී අනන්‍යතාවය සත්‍යාපනය කර ගැනීම අවශ්‍ය කෙරේ.

41. සේවා සැපයුම්කරුවන් විසින් සේවාදායකයා සමග ව්‍යාපාරික සම්බන්ධතාවයක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් හෝ ආරම්භ කරනු ලබන අවස්ථාවේදී ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ ප්‍රතිමානයන් යොදා ගැනීම අවශ්‍ය කෙරේ. සාමාන්‍යයෙන්, සේවාදායකයෙකු සමග ව්‍යාපාරික සම්බන්ධතාවයක් ගොඩ නැගෙන්නේ සේවාදායකය විසින් මූලික විමසීම් සිදු කළ පසුව නමුත් කිසිදු කටයුත්තක් ආරම්භ කිරීමට පූර්වයෙනි.

42. සේවා සපයන්නා විසින්, ගනුදෙනුකරු හඳුනා ගැනීමේ අරමුණ උදෙසා, යම් ඕනෑම තෙවන පාර්ශ්වයකගේ අනන්‍යතාවය සහ සේවාදායකයා හෝ අවසාන ප්‍රතිලාභී හිමිකරු සමඟ ඔහුට ඇති සම්බන්ධතාවය පිළිබඳව තොරතුරු ලබා ගැනීම අවශ්‍ය කෙරේ. තවද, සේවාදායකයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අදාළ තෙවන පාර්ශවය සතුව අධිකාරිත්වයක් ඇති බවට ලේඛනගත සාක්ෂිද සේවා සපයන්නා විසින් ලබාගත යුතුය.

43. සේවාදායකයා විසින්, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සහ ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළ රීතීන්හි නියම කෙරෙන පරිදි, ඔහුගේ/ඇයගේ අනන්‍යතාවය පිලිබඳව සෑහීමකට පත් වීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි සේවා සපයන්නා වෙත ලබා නොදුනහොත්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඉඩ ලබා දෙන්නේනම් හැර, සේවා සැපයුම්කරු විසින් එම ගනුදෙනුව තවදුරටත් කරගෙන යා නොහැකි අතර එකී ප්‍රයත්නය සැක කටයුතු ගනුදෙනුවක් ලෙස මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කළ යුතුය. තවද, ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ තොරතුරු ලබා දීමට සේවාදායකයා කැමැත්තක් නොදක්වන විටද සේවා සපයන්නා විසින් සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

44. ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ ප්‍රතිමානයන් ක්‍රියාත්මක කිරීම මගින් සේවාදායකයා වෙත ගනුදෙනුවේ සැකකටයුතුභාවය පිළිබඳව යම් හෙළිදරව් වීමක් වනු ඇති බවට සේවා සපයන්නා සාධාරණව විශ්වාස කරන්නේනම්, එකී ප්‍රතිමානයන් ක්‍රියාත්මක නොකර ගනුදෙනුව ඉදිරියට කරගෙන යා හැක. කෙසේ වෙතත්, සේවා සැපයුම්කරු විසින් හැකි ඉක්මනින් සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ගොනු කළ යුතුය.

45. එක් එක් ව්‍යාපාරික සබඳතාවයට ආවේණික සාධක සහ ගුණාංග, සේවාදායකයාගේ ගති ලක්ෂණ, සළකා බලනු ලබන කටයුත්තේ සහ සිදු කිරීමට නියමිත ගනුදෙනුවල ස්වභාවය සහ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ අවධානම් වලට නිරාවරණය වීමට ඇති විභවතාවය වැනි සාධක මත පදනම්ව ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළව වඩා වැඩි සැළකිල්ලකින් කටයුතු කළ යුත්තේද යන්න සේවා සපයන්නා විසින් තීරණය කළ යුතුය.

46. ඉහළ අවධානමක් ඇතැයි හඳුනාගත් සේවාදායකයන්, ප්‍රතිලාභී හිමිකරුවන් සහ සේවාදායකයන් වෙනුවෙන් කටයුතු කරනු ලබන පුද්ගලයන් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළව වඩා වැඩි ක්‍රියාමාර්ග යොදා ගැනීම අවශ්‍ය කෙරේ. ඒ අනුව, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් ඉහළ අවධානමක් පවතින බවට හඳුනාගත් සේවදායකයෙකු/ප්‍රතිලාභී හිමිකරුවෙකු/සේවාදායකයා වෙනුවෙන් කටයුතු කරනු ලබන තෙවන පාර්ශවයක් සිටින අවස්ථාවලදී, ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළ රීතීන්හි නියම කර ඇති පරිදි සේවා සපයන්නා විසින් වඩා වැඩි ක්‍රියාමාර්ග යොදා ගත යුතුය.

47. තවද, නිරන්තරයෙන් තොරතුරු සමාලෝචනය කිරීම සහ නව ගනුදෙනු විශ්ලේෂණය කිරීම මගින් දැනට සිටින සේවාදායකයන් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළ ක්‍රියාමාර්ගයන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය.

සේවාදායක අවධානම බාණ්ඩගත කිරීම

48. ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ ක්‍රියාමාර්ගයන් යොදාගත් පසු, සේවා සපයන්නා විසින් සියලුම සේවාදායකයන්/ප්‍රතිලාභී හිමිකරුවන්/සේවාදායකයා වෙනුවෙන් කටයුතු කරන තෙවන පාර්ශවයන් ඔවුන්ට අනුරූප මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් මට්ටම අනුව බාණ්ඩගත කළ යුතුය.

49. සේවාදායකයෙකු සමඟ සේවා සපයන්නා විසින් කරනු ලබන කටයුත්ත එක් ගනුදෙනුවකට පමණක් සීමා වන විටකදී (වරක් පමණක් සිදු කරන ගනුදෙනු), එය ඉදිරියට පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික සම්බන්ධතාවයක් ලෙස නොසැලකේ. කෙසේ වෙතත්, සේවා සපයන්නා විසින් එවන් සේවාදායකයෙකු සම්බන්ධයෙන් අවධානම් තක්සේරුවක් සිදු කළ යුතුය. ගනුදෙනුව යම්කිසි නීතිමය වරදක් හා සම්බන්ධ බවට සේවා සපයන්නා හට සැකයක් පවතින්නේනම්, එවිට එකී ගනුදෙනුව සැක කටයුතු වාර්තාවක් ලෙස මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතුය. වැඩිදුර තොරතුරු සඳහා VI කොටස පරිශීලනය කරන්න.

ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ ප්‍රවර්ධිත ක්‍රියාමාර්ග

50. සේවා සපයන්නන් හට වඩා වැඩි මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවධානමක් එල්ල කළ හැකි සේවාදායකයන්/ගනුදෙනු/සේවා වර්ග පවතී. (ඇතැම් සේවාදායකයන්/ගනුදෙනු/සේවා මගින් සේවා සපයන්නන් හට වඩා වැඩි මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවධානමක් එල්ල කරනු ලබයි). එවන් අවස්ථාවකදී, සේවා සපයන්නා විසින් ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළව අතිරේක ක්‍රියාමාර්ග යොදා ගත යුතුය.

සේවාදායකයෙකු, ප්‍රතිලාභී හිමිකරුවෙකු, තෙවන පාර්ශවයක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ වැඩිදුර ක්‍රියාමාර්ග යොදා ගැනීමට අවශ්‍ය වන අවස්ථා සඳහා උදාහරණ:

අ) මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශයන් සමඟ අනුකූල නොවන හෝ අනුකූලතාවය ප්‍රමාණවත් නොවන රටවල් සමඟ සම්බන්ධතා පවතින පුද්ගලයන් (ඉහළ අවධානමක් සහිත හා සහයෝගිත්වයක් නොදක්වන රටවල් කවරේදැයි දැන ගැනීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකායේ වෙබ් අඩවිය (http://fatf-gafi.org), මුදල් විශුද්ධිකරණය පිලිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වෙබ් අඩවිය (http://apgml.org) සහ මූල්‍ය බුද්ධි ඒකකයේ වෙබ් අඩවිය (http://fiusrilanka.gov.lk) පරීශීලනය කරන්න.

ආ) මත්ද්‍රව්‍ය ජාවාරම, මිනිස් ජාවාරම, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය හෝ නීත්‍යානුකූල නොවන මූල්‍යනය හා සම්බන්ධ බවට යම් ජාතික අධිකාරිත්වයක් විසින් හඳුනා ගනු ලැබ ඇති බල ප්‍රදේශ/රටවල් සමඟ සම්බන්ධතා පවත්වන්නන්;

ඇ) ඉහළ මට්ටමේ රාජ්‍ය දූෂණයක් පවතින බවට යම් පිළිගත් ආයතනයකින් හඳුනා ගනු ලැබ ඇති යම් රටක් සමඟ සම්බන්ධතා පවත්වන්නන්;

ඈ) සංකීර්ණ හෝ අසාමාන්‍ය ආකාරයේ ගනුදෙනුවක් සිදු කරන, සේවාදායකයාගේ පරිචය සමඟ නොගැළපෙන ආකාරයේ අසාමාන්‍ය ගනුදෙනු රටාවන් පවතින, නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම් හා සම්බන්ධිත ගනුදෙනු රටාවන් වලට සමාන ආකාරයේ ගනුදෙනු සිදු කරන සහ පැහැදිලි නීත්‍යානුකූල අරමුණක් නොමැති ගනුදෙනු සිදු කරන පුද්ගලයන්;

ඉ) දේශීයව හෝ විදේශීයව දේශපාලනමය වශයෙන් නිරාවරණය වූ තැනැත්තන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහ සමීපතම හිතවතුන්;

තවද, පහත අවස්ථාවලදී ද ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ අතිරේක ක්‍රියාමාර්ග යොදාගත යුතුය.

අ) සේවාදායකයාගේ අවධානම ඛාණ්ඩගත කිරීමේදී, සේවා සපයන්නා හට වඩා ඉහළ අවධානමක් යොමු කරන බවට හඳුනා ගනු ලැබූ යම් ගනුදෙනුකරුවෙක් හෝ ගනුදෙනුවක්;

ආ) සළකා බලනු ලබන ගනුදෙනුව සිදු කිරීමේදී අදාළ පුද්ගලයා පෞද්ගලිකව පෙනී නොසිටින අවස්ථා සහිත ගනුදෙනු;

ඇ) රාජ්‍ය නොවන සංවිධාන/ලාභ අරමුණු කර නොගත් සංවිධාන සමඟ සිදු කරන ගනුදෙනු.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතීන් සමඟ අනුකූලතාවය

51. ත්‍රස්තවාදය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතන අවි ව්‍යාප්තිය සහ ඊට මුදල් සැපයීම හා සම්බන්ධිත ඉලක්කගත මූල්‍යමය සම්බාධක සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ පහත දැක්වෙන නියෝග ප්‍රකාරව, 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත හා අනුකූලව නිකුත් කරනු ලැබූ කවර හෝ නම් කරන ලද ලේඛනයක් තුළ යම් සේවාදායකයෙකුගේ/ප්‍රතිලාභී හිමිකරුවෙකුගේ /සේවාදායකයා වෙනුවෙන් කටයුතු කරනු ලබන තෙවන පාර්ශවයකගේ නම අඩංගු වන්නේදැයි සේවා සපයන්නා විසින් පිරික්සා බැලිය යුතුය.

අ) 2012 අංක 01 දරන එක්සත් ජාතීන්ගේ නියෝග: 1373 (2001) වැනි එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය ප්‍රකාරව, ජාතික මට්ටමින් ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධිත පුද්ගලයන් හා ආයතන නම් කරමින් විදේශ කටයුතු ඇමති විසින් නිකුත් කෙරේ.

ආ) 2012 අංක 02 දරන එක්සත් ජාතීන්ගේ නියෝග:

ඇ) 2017 එක්සත් ජාතීන්ගේ නියෝග (ප්‍රජාතන්ත්‍රවාදී කොරියානු මහජන සමූහාණ්ඩුව හා සම්බන්ධ සම්බාධක): 1718 (2006), 1874 (2009), 2087 (2013), 2094 (2013), 2270 (2016), 2321 (2016) යන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුති හා ඊට අනුයාත සම්මුතීන් ප්‍රකාරව ප්‍රජාතන්ත්‍රවාදී කොරියානු මහජන සමූහාණ්ඩුව මත සම්බාධක පනවමින් විදේශ කටයුතු ඇමති විසින් නිකුත් කෙරේ.

ඈ) 2018 අංක 01 දරන එක්සත් ජාතීන්ගේ නියෝග (ඉරානය හා සම්බන්ධ සම්බාධක): 1737 (2016) සහ 2231 (2015) දරණ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතීන් සහ ඉරානය සම්බන්ධයෙන් ඊට අනුයාතව නිකුත් කෙරෙන නියෝග හා ඉරානයට අදාළව කලින් නිකුත් කළ නියෝගයක් අවලංගු කරමින්, ප්‍රතිස්ථාපනය කරමින් හෝ වෙනස්කම් සිදු කරමින් නිකුත් කරනු ලබන නියෝගයන් ක්‍රියාවේ නංවමින් විදේශ කටයුතු ඇමති විසින් නිකුත් කෙරේ.

52. ඉහත නියෝග යටතේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති නම් කරන ලද ලේඛන http://fiusrilanka.gov.lk/unscr.html යන වෙබ් අඩවිය ඔස්සේ පරීශීලනය කළ හැක.

53. ඉහත නම් කරන ලද පුද්ගලයන් හෝ ආයතන හෝ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ට හෝ ඔවුන්ගේ ප්‍රතිලාභය වෙනුවෙන් කිසිදු අරමුදලක්, මූල්‍ය වත්කමක් හෝ ආර්ථික සම්පතක් ලබා නොදෙන බවට සේවා සපයන්නා විසින් සනාථ කරගත යුතුය.

54. නිසි බලධාරියාගේ ලිපිනය පහත පරිදි වේ.

නිසි බලධාරියාගේ කාර්යාලය
ආරක්ෂක අමාත්‍යාංශය
අංක 15/5, බෞද්ධාලෝක මාවත
කොළඹ
ශ්‍රී ලංකාව
දූ.ක. +94 112320585
ෆැක්ස් +94 112390288
විද්‍යුත් තැපෑල: camod@defence.lk

VI කොටස

වාර්තා කිරීම්

සැක සහිත ගනුදෙනු වාර්තා ඉදිරිපත් කිරීමේ කාර්ය

55. සැකකටයුතු වාර්තා ඉදිරිපත් කිරීමට තීරණය කිරීමේදී, සේවා සපයන්නා, සේවාදායකයාගේ පැතිකඩ සහ සේවාදායකයාගේ ව්‍යාපාර/රැකියා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු සැලකිල්ලට ගත යුතුය. සැක සහිත ක්‍රියාවක් යනු කුමක්ද යන්න පිළිබඳව අමතර මග පෙන්වීමක් ඇමුණුම IV හි සඳහන් කර ඇති අවදානම් දර්ශක ලැයිස්තුව මඟින් ලබා දෙනු ඇත. සම්පූර්ණ කරන ලද හෝ කිරීමට උත්සාහ කරන ලද සැක සහිත ගනුදෙනු වඩාත් හොඳින් හඳුනා ගැනීම සඳහා සේවා සපයන්නාට ක්ෂේත්‍රයට විශේෂිත දර්ශක ද උපකාරී වේ. සේවා සපයන්නන් භාවිතා කරන මූල්‍ය විශුද්ධිකරණය පිළිබඳ උදාහරණ කිහිපයක් ඇමුණුම V හි දක්වා ඇත

56. සෑම සේවා සැපයුම්කරුවෙකුම සැක සහිත ගනුදෙනු කිරීමට කළ උත්සාහයන් පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. සේවාදායකයකු ගනුදෙනුවක් සිදු කිරීමට උත්සාහ කළත්, මොනයම් වූ හේතුවක් නිසා එම ගනුදෙනුව සම්පූර්ණ වී නොමැති නම් සහ උත්සාහ කළ ගනුදෙනුව සැක සහිත බව සේවා සපයන්නා විසින් තීරණය කරන්නේ නම්, සේවා සැපයුම්කරු එය මුල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම අවශ්‍ය වේ.

57. 2017 අප්‍රේල් 21 දින නිකුත් කල 2017 අංක 2015/56 දරන සැක සහිත ගනුදෙනු (ආකෘති) රෙගුලාසි අති විශේෂ ගැසට් පත්‍රයෙහි (උපලේඛන V- ඇමුණුම VI) දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින් සේවා සපයන්නා විසින් සැක සහිත ගනුදෙනු වාර්තා ඉදිරිපත් කළ යුතුය.

58. අනුකූලතා නිලධාරියා විසින් දිනයන්, අනුක්‍රමික අංක, වාර්තා කළ සේවකයාගේ නම යනාදිය ඇතුළුව සැක කටයුතු ගනුදෙනු වාර්තා ලේඛනයක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

VII කොටස

වාර්තා තබා ගැනීම

59. පනතෙහි දක්වා ඇති පරිදි වාර්තා තබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම හා පවත්වාගෙන යාම සඳහා සේවා සපයන්නා විසින් අවශ්‍ය පියවර ගත යුතු අතර, එමඟින් අවශ්‍ය විටෙක හෝ මුල්‍ය බුද්ධි ඒකකය විසින් ඉල්ලා සිටින විට දත්ත වහාම ලබා ගැනීමට හැකි විය යුතුය. වාර්තා තබා ගැනීමේදී, ගනුදෙනුකරු නිසි පරිදි හඳුනා ගැනීමේ තොරතුරු, හඳුනාගැනීමේ ලේඛනවල පිටපත්, ගනුදෙනු වාර්තා, ගනුදෙනු වලට අදාළව හුවමාරු වූ ලිපි සහ මුල්‍ය බුද්ධි ඒකකය වෙත ලබා දී ඇති වෙනත් ඕනෑම වාර්තා පවත්වාගෙන යා යුතුය.

VIII කොටස

වෙනත් මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අවශ්‍යතා

60. සේවකයින් බඳවා ගැනීමේදී ඉහළ ප්‍රමිතීන් සහතික කිරීම සඳහා සහ සේවකයින් කිසිදු මුදල් විශුද්ධිකරණ හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකමකට සම්බන්ධ නොවන බවට සහතික කිරීම සඳහා සේවා සපයන්නන් සතුව සුපරීක්ෂණ ප්‍රතිපත්තියක් තිබිය යුතුය.

61. සේවා සපයන්නන් වෙනුවෙන් කටයුතු කරනා ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන් / ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, සේවකයින්, නියෝජිතයින් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු හට සේවා සපයන්නා විසින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවදයට මුදල් සැපයීම වැළැක්වීමේ අනුකූලතාවය පිළිබඳ පුහුණුව ලබා දිය යුතුය.

62. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ආයතනික අනුකූලතා ප්‍රතිපත්තිය පිළිබඳව සහ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධ අභ්‍යන්තර ක්‍රියා පටිපාටි සහ පාලනයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා එවැනි පුහුණුවක් අවශ්‍ය වේ. අදාළ පුද්ගලයාගේ වගකීම් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දීම සඳහා පුහුණු වැඩසටහන් අවශ්‍ය වන අතර එමඟින් සේවා සපයන්නාගේ සියලුම සේවකයින් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි පියවරයන් සඳහා යොමු වූ හා ක්‍රියාත්මක වූ උප සංස්කෘතියක් ඇති කිරීමට ඔවුන්ට හැකි වේ.

63. රටේ පවත්නා මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි නීතිවලට අනුකූලව ඔවුන්ගේ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පාලනයන් ඇති බව සේවා සැපයුම්කරු විසින් සහතික කිරීම අවශ්‍ය වේ.

64. විගණනය සිදුකරන අතරතුරදී කිසියම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු මාලාවක් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සමඟ සම්බන්ධ බවට විගණකවරයා සැක කරන්නේ නම් එවිට සැක කටයුතු වාර්තාවක් ඉදිරිපත් කිරීමට පනතට අනුව විගණකවරයා බැඳී ඇති බව සේවා සපයන්නන් දැන සිටිය යුතුය.

IX කොටස

අනුකූල නොවීම් සඳහා වන දණ්ඩන

65. පනත හා ඊට අනුකූලව නිකුත් කරන ලද නීති රීති වලට අනුකූල වීමට අපොහොසත් වීම දණ්ඩන වලට යටත් වීමට හේතු වේ. ඊට අමතරව, සේවා සපයන්නන්ට එරෙහිව අදාළ වෘත්තීය ආයතන හරහා ගෙන යන නියාමන හා විනය ක්‍රියාමාර්ග ඇතුළු වෙනත් ක්‍රියාමාර්ගද තිබිය හැකිය.

2020 ජූනි 10 වන දින නිකුත් කරන ලදී

ඇමුණුම I

හඳුනාගත් ක්‍රියාකාරකම් හා සම්බන්ධ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් සඳහා උදාහරණ

	හඳුනාගත් ක්‍රියාකාරකම	උදාහරණ	හඳුනාගත් ක්‍රියාකාරකම් හා සම්බන්ධ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් සඳහා උදාහරණ
1	නිශ්චල දේපල මිලට ගැනීම සහ විකිණීම	සේවාදායකයින් වෙනුවෙන් නිශ්චල දේපල මිලදී ගැනීම සහ විකිණීම සම්බන්ධ ක්‍රියාකාරකම්වල යෙදීම හෝ සංවිධානය කිරීම.	ගණකාධිකාරීවරුන්ගේ කීර්තිනාමයට හානි කරමින්, ඔවුන් වෙනුවෙන් දේපළ මිලදී ගැනීම සඳහා අපරාධකරුවන් විසින් ගණකාධිකාරිවරුන් භාවිතා කළ හැකිය.
2	සේවාදායකයින්ගේ මුදල්, ඇප හෝ වෙනත් වත්කම් කළමනාකරණය කිරීම.	සේවාදායකයාගේ බැංකු ගිණුම් හරහා සේවාදායකයා වෙනුවෙන් සෘජුවම ගෙවීම් කිරීම.	අරමුදල් රඳවා තබා ගැනීම සේවා සපයන්නා වෙත පැවරෙන බැවින්, එහි නීත්‍යානුකූලභාවයක් පෙන්වන අතර අරමුදල් ප්‍රභවය සඟවා තැබිය හැකිය.
3	බැංකුවේ ඉතිරිකරගත් මුදල් හෝ ඇප ගිණුම් කළමනාකරණය කිරීම.	සේවාදායකයාගේ ගිණුමේ අරමුදල් භාවිතා කරමින් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම.	
4	සමාගම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා දායක මුදල් සංවිධානය කිරීම.		
5	නෛතික පුද්ගලයන් හෝ නෛතික වැඩපිළිවෙල ඇති කිරීම, මෙහෙයවීම හෝ කළමනාකරණය කිරීම හෝ ව්‍යාපාර අස්තිත්ව පිළියෙළ කිරීම, මිලට ගැනීම හා විකිණීම.	සේවාදායකයෙකු වෙනුවෙන් සමාගමේ කාර්යාලයේ සමාගමක් ලියාපදිංචි කිරීම.	සමාගමේ සත්‍ය අයිතිය සැඟවිය හැකිය / අපැහැදිලි විය හැකිය. සංකීර්ණ නීතිමය ව්‍යුහයන් භාවිතා වේ.
		සේවාදායකයෙකු වෙනුවෙන් සංස්ථාපිත සංගමයක් ගොඩනැගීම.	පුණ්‍යායතන භාරයක ස්වරූපය ගත් ඉලක්කගත කණ්ඩායම් නොමැති පුළුල් පරාසයක විහිදෙන බව පෙනේ.

ඇමුණුම II

සේවා සැපයුම්කරුගේ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි පිරික්සුම් ලැයිස්තුවක්

ගනුදෙනුකරුවන්, නිෂ්පාදන, සේවා, බෙදාහැරීමේ මාර්ග සහ භූගෝලීය ස්ථාන සඳහා අවදානම තක්සේරු කරන්නේ කෙසේද යන්න පිළිබඳ උදාහරණයක් සැපයීමට පහත පිරික්සුම් ලැයිස්තුව යොදා ගැනේ. සේවා සපයන්නා විසින් තම ව්‍යාපාරයට ගැලපෙන පරිදි පිරික්සුම් ලැයිස්තුව වෙනස් කළ යුතුය. ඔබ දැනටමත් වෙනත් අවදානම් තක්සේරු කිරීමේ මෙවලමක් භාවිතා කරන්නේ නම්, ඔබට එය දිගටම භාවිතා කිරීමට හෝ අවශ්‍ය පරිදි වැඩි දියුණු කිරීමට හැකිය.

මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් සහ එම අවදානම් බැහැර කිරීමට හෝ පාලනයට සහ අවම කිරීමට සුදුසු ප්‍රතිපත්ති, ක්‍රමවේදයන් සහ පාලන ක්‍රම පිලිබඳව සලකා බැලිය යුතුය.

ගණකාධිකාරීවරුන් සහ භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන් සඳහා ආයතනික මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරුව					
ආයතනයේ නම			**XXX**		
අනු අංකය	**අවදානම් සාධකය**	**ආයතනික අවදානම**	**අවදානම් දර්ශකය**		**අවදානම් අවම කිරීමේ පියවර**
			ඉහළ	**පහළ**	
1) ආයතනයේ ස්වභාවය, ප්‍රමාණය සහ සංකීර්ණත්වය තක්සේරු කිරීම					
1.1	ව්‍යාපාරයේ ප්‍රමාණය	උදා. විශාල/කුඩා (ආයතනික ව්‍යුහය, සේවකයන් ගණන, ශාඛා, සේවාදායකයන් ගණන ආදිය සැලකිල්ලට ගනිමින්)			
1.2	හිමිකාරත්ව ව්‍යුහය	උදා. තනි අයිතිය (දේශීය, විදේශීය, ද්විත්ව පුරවැසි)/ වෙනත් ආයතනයක හිමිකාරත්වය යටතේ පවතින (දේශීය, විදේශීය) හෝ (තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමාගම්)			
1.3	සේවා සපයන්නාගේ ස්වභාවය	උදා. සරල ව්‍යුහයක් සහිත තනි හිමිකාරත්වය/ සරල ව්‍යුහයක් සහිත හවුල් ව්‍යාපාර/ පුද්ගලික සමාගම්/ පොදු සමාගම් / විදේශ රටවල ශාඛා ඇති සමාගම්			
1.4	සපයනු ලබන සේවා වන්හි ස්වභාවය සහ ML/TF අවදානම සමඟ සම්බන්ධ වී ඇති බවට හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම්	උදා. ඉහළ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමක් සහිත හෝ ව්‍යවහාර මුදලින් ගනුදෙනු වැඩි වශයෙන් පවතින ව්‍යාපාර (නිශ්චල දේපල ව්‍යාපාර, කැසිනෝ, මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකරුවන්, වාහන කර්මාන්ත) ලෙස හඳුනාගත් අංශවලට සම්බන්ධ සේවාවන්			
2) ගනුදෙනුකරු සම්බන්ධ වූ අවදානම්					
2.1	හිමිකාරත්ව ව්‍යුහය	උදා. තනි අයිතිය (දේශීය, විදේශීය, ද්විත්ව පුරවැසි)/ වෙනත් ආයතනයක හිමිකාරත්වය යටතේ පවතින (දේශීය, විදේශීය) හෝ (තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමාගම්)			
2.2	ඉහළ අවදානම් රැකියාවල නියුතු සේවාදායකයන්	උදා. මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා බෙහෙවින් ගොදුරු විය හැකි ව්‍යාපාර හෝ වෘත්තීන්හි නියැලී සිටින සේවාදායකයින් (කැසිනෝ, නිශ්චල දේපළ වෙළෙඳාම, ගණකාධිකාරිවරුන්, නීතිඥයන්)			

2.3	ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන සේවාදායකයන්	උදා. විදේශීය ගනුදෙනුකරුවන්/ දේශීය සේවාදායකයන්			
2.4	ඉහළ අවදානම් සහිත රටක වාසය කරන සේවාදායකයන්	උදා. ඉරානය/ පකිස්ථානය හෝ මූල්‍ය කාර්ය සාධක බලකායේ අධීක්ෂණය යටතේ පවතින රටක සේවාදායකයන්			
2.5	දේශපාලන වශයෙන් නිරාවරණය වූ තැනැත්තන්	උදා. දේශපාලඥයන්/ ඉහළ රජයේ නිලධාරීන්/ රාජ්‍යයක හෝ රජයේ ප්‍රධානියෙක් වැනි සේවාදායකයන්			
2.6	දැන සිටින ඉහළ අපරාධ අනුපාතයක් ඇති බවට ප්‍රසිද්ධ ප්‍රදේශයක වාසය කරන සේවාදායකයන	උදා. මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා ප්‍රසිද්ධ මෙක්සිකෝ රාජ්‍යයේ සේවාදායකයන්			
2.7	සේවාදායකයා සිටින (පදිංචි) ස්ථානය	උදා. හොඳින් දන්නා සේවාදායකයන්/ හොඳින් ස්ථාපිත ව්‍යාපාරිකයන්/සේවා සපයන්නා නොදන්නා සේවාදායකයන්/ සේවාදායකයින් තම සමාගම් ලේකම්ගේ ලිපිනය ව්‍යාපාරික ලිපිනය ලෙස භාවිතා කිරීම			
2.8	සේවාදායකයා පිලිබඳව අපරාධමය වැරදි වාර්තා වී තිබීම හෝ සංවිධානාත්මක අපරාධ සමග සම්බන්ධතාවක් පැවතීම	උදා. දන්නා අපරාධකරුවන්			
3) සේවා අවදානම					
3.1	භෞතික මුදල් තැන්පතු සහ/හෝ මුදල් ආපසු ගැනීම සඳහා සහායවන සේවාවන්	උදා. සේවාදායකයාගෙන් මුදල් භාර ගැනීම			
3.2	ජාත්‍යන්තර අරමුදල් හුවමාරුව සඳහා සහායවන සේවාවන්	උදා. විදේශිකයන්ගෙන් මුදල් ලැබීම			
3.3	තෙවන පාර්ශවයකට හෝ සේවාදායකයන් නොවන අයට ගෙවීම් සඳහා සහායවන සේවා	උදා. මුහුණට මුහුණලා සිදු නොවන ගනුදෙනු වලට ඉඩ ලබා දේ / අත්තිකාරම් ආපසු ගෙවීම සේවාදායකයා හැර වෙනත් පාර්ශවයකට හෝ අරමුදල් මුලින් ජනනය කළ වෙනත් ගිණුමකට ගෙවනු ලැබේ.			
3.4	සේවා සපයන්නා සමඟ දුරස්ථව හෝ මැදිහත්වීමකින් තොරව සිදු කළ හැකි ගනුදෙනු සඳහා සහායවන සේවා	උදා. සේවාදායකයාගේ බැංකු ගිණුම් පවත්වාගෙන යාම			
3.5	ෂෙල් සමාගමක්, නාමික හිමිකාරිත්වය ඇති සමාගමක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම හා සම්බන්ධ සේවාවන් සැපයීම.	උදා. නෛතික තැනැත්තන් හෝ නෛතික වැඩපිළිවෙල නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම			
3.6	පැහැදිලි වාණිජමය පදනමකින් තොරව ගනුදෙනු සිදුකිරීම	උදා. අක්‍රීය ගිණුමට අඛණ්ඩව අරමුදල් යැවීම			

4) බෙදා හැරීමේ මාර්ග/ ව්‍යාපාර සම්බන්ධතා අවදානම					
4.1	බෙදාහැරීමේ ක්‍රමය, සේවාදායකයා සමඟ පවතින මුහුණට මුහුණලා සිදුවන සම්බන්ධතා ඉවත් කිරීම හෝ අවම කිරීම සිදුකරයි	උදා. අන්තර්ජාලය හරහා සිදුකෙරෙන ගනුදෙනු			
4.2	තෙවන පාර්ශවයක් බෙදා හැරීමේ මාර්ග යක් ලෙස භාවිතා කළ හැකිය	උදා. නියෝජිතයින් / සේවා සපයන්නන් / නීතිඥයන් / ගණකාධිකාරීවරුන්			
4.3	දේශසීමා ගෙවීම් සම්බන්ධ බෙදා හැරීමේ නාලිකා	උදා. මාර්ගගත මුදල් හුවමාරුව			
4.4	මුදල් ගෙවීම් සම්බන්ධ බෙදා හැරීමේ නාලිකා	උදා. සේවා ගාස්තු සඳහා මුදල් භාවිතා කිරීම			
5) භූගෝලීය අවදානම					
5.1	මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමවේදයන්හි දුර්වලතා පවතින රටවල් සමග හෝ එක්සත් ජාතීන්ගේ ආරක්ෂණ මණ්ඩලේ සම්මත යෝජනා (UN-SCR) විසින් නිකුත් කරන ලද සම්බාධක හෝ ඒ හා සමාන ක්‍රියාමාර්ගයන්ට යටත්වූ රටවල් සමග ගනුදෙනු කිරීම	උදා. ඝානාව, බොට්ස්වානා වැනි අධීක්ෂණයට ලක්වන රටවල් / ඉහළ අවදානම් සහිත රටවල් ඉරානය සහ උතුරු කොරියාව			
5.2	නීත්‍යානුකූල නොවන ක්‍රියාකාරකම් සිදුවන රටවල් සමග ගනුදෙනු කිරීම.	උදා. සංවිධානාත්මක අපරාධ හෝ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ ඉහළ මට්ටමක පවතින රටවල් හෝ මිනිස් ජාවාරම් ඉහළ මට්ටමක පවතින රටවල්			
5.3	ඉහළ මට්ටමේ දූෂණ හා අල්ලස් ඇති රටවල් සමඟ ගනුදෙනු කිරීම	උදා. සෝමාලියාව, දකුණු සුඩානය, සිරියාව (මූලාශ්‍රය: Corruption Perceptions Index 2018)			
5.4	ගැටුම් කලාපයක සිටින හෝ සැලකිය යුතු ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ඇති රටවල් හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අරමුදල් හෝ ආධාර සැපයීම වැනි රටවල් සමඟ ගනුදෙනු කිරීම	උදා. සිරියාව, ඇෆ්ගනිස්ථානය, ඉරාකය			
5.5	මූල්‍ය රහස්‍යභාවයක් සහිත බවට හඳුනාගෙන ඇති ඕනෑම රටක්	උදා. ඇමරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය, කේමන් දූපත් (Source: The Financial Secrecy Index 2018)			

5.6	සේවා සපයන්නාගේ ශාඛා සහ උප සමාගම් වෙනත් රටවල පිහිටා ඇත	උදා. දූර්වල හෝ අකාර්යක්ෂම මුදල් විශුද්ධිකරණයවැළක්වීමේසහත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමවේදයන් පවතින රටවල් / අධි අවදානම් රටවල් / ඉහළ සංවිධානාත්මක අපරාධ හෝ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ හෝ ඉහළ මිනිස් ජාවාරම් පවතින රටවල් / දැඩි මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීති සහ රෙගුලාසි ඇති රටවල්			

අවදානම් තක්සේරුකරණයට සටහන්

අනු අංකය	අවදානම් සාධක	අවදානම් සාධකය පිළිබඳ විස්තරය
1) ආයතනයේ ස්වභාවය, ප්‍රමාණය සහ සංකීර්ණතාවය තක්සේරු කිරීම		
1.1	ව්‍යාපාරයේ ප්‍රමාණය	ව්‍යාපාරය විශාල වන විට, ව්‍යාපාරික කාලය තුළ සැක සහිත ක්‍රියාකාරකම් හා ගනුදෙනු සිදු වීමේ හැකියාව වැඩි ය.
		මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා එම පියවර ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම විශාල සංවිධානවලට අපහසු විය හැකිය.
1.2	හිමිකාරීත්ව ව්‍යුහය	දේශීය / තනි හිමිකාරිත්වයට සාපේක්ෂව හිමිකාරිත්වය විදේශීය / ද්විත්ව පුර වැසියන් හෝ වෙනත් ආයතනයක් යටතේ පවතින විට ML / TF අවදානම වැඩි වේ.
1.3	සේවාවන්හි සංකීර්ණත්වය	ව්‍යාපාරයෙහි සංකීර්ණත්වය වැඩි වත්ම ව්‍යාපාර ගනුදෙනු සහ ක්‍රියාකාරකම්වල විනිවිදභාවය අඩු වන අතර මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් වලට නිරාවරණය වීමේ හැකියාව වැඩි කරයි. ඒ මගින් මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග වල සඵලදයකත්වය අඩු කරයි.
1.4	සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් වලට භාජනය විය හැකි බවට හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම්	ජාතික අවදානම් තක්සේරුකරණයේ දී මුදල් විශුද්ධිකරණ අවදානමට ගොදුරු වීමේ හැකියාව ඉහළ හෝ මධ්‍යම මට්ටමේ යැයි හඳුනාගෙන ඇති සේවා හෝ ක්‍රියාකාරකම් හෝ ව්‍යවහාර මුදලින් ගනුදෙනු වැඩි වශයෙන් පවතින ව්‍යාපාර
2) සේවාදායකයාගේ අවදානම		
2.1	හිමිකාරත්ව ව්‍යුහය	සංකීර්ණ හා විනිවිදභාවයෙන් තොර ව්‍යුහයන් මඟින් ප්‍රතිලාභී හිමිකරු / අත්‍යන්ත පාලනය සැඟවීමට සහ මුලා කිරීම සහ ML/TF ක්‍රියාකාරකම් සැඟවීමට හැකිය. සේවාදායකයාට විදේශයන්හි පවතින වත්කම්වල සැබෑ අයිතිය සහ පාලනය සැඟවීම සඳහා විවිධ රටවල් වල ව්‍යුහයන් හි දාමයක් තුළ නීතිමය ආයතන පිහිටුවිය හැකිය.
2.2	ඉහල අවදානම් සහිත වෘත්තීන්හි සේවාදායකයින්	සමහර වෘත්තීන් ML/TF වලට වැඩි අවදානමක් ඇති කරයි. (නිදසුනක් ලෙස, වැඩි වශයෙන් ව්‍යවහාර මුදලින් ගනුදෙනු සිදු කරන ව්‍යාපාර, අතරමැදිකරුවන් ලෙස සැලකිය හැකි වෘත්තීන්, ස්වර්ණාභරණ, ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ අලෙවිකරුවන්, දේපල වෙළඳාම් නියෝජිතයන්, සංචාරක නියෝජිතයන්, ආනයන / අපනයන සමාගම්, ප්‍රේෂණ කරන්නන් සහ මුදල් සේවා ව්‍යාපාර)
2.3	ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින සේවාදායකයින්	විදේශිකයන් හෝ වෙනත් රටවල පදිංචි වී සිටින ශ්‍රී ලාංකිකයන්
2.4	සේවාදායකයින් ඉහළ අවදානම් සහිත රටවල වාසය කරයි	සේවාදායකයා ඉහළ අවදානම් සහිත රටක වාසය කිරීම සේවා සපයන්නාට ඉහළ මට්ටමේ ML/TF අවදානමකට නිරාවරණය වීමේ හැකියාවක් ඇති කරයි.
2.5	දේශපාලන වශයෙන් නිරාවරණය වූ තැනැත්තන්	ඔවුන්ගේ තනතුරු සහ බලය හේතුවෙන්, දේශපාලන වශයෙන් නිරාවරණය වූ තැනැත්තන් දූෂණ හා අල්ලස් මෙන්ම ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළු මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධ වැරදි සඳහා අවභාවිතා කල හැකි වේ.

2.6	සේවාදායකයින් අපරාධ සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයක ස්ථානගත වී ඇති විට	සේවාදායකයින් අපරාධ ඉහල වශයෙන් සිදුවන ප්‍රදේශයක වාසය කිරීම සේවා සපයන්නට ඉහල මට්ටමේ මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවධානමක් ඇති කරයි
2.7	සේවාදායකයාගේ භෞතික ස්ථානගතවීම	ලිපිනයක් නොමැති හෝ ලිපින කිහිපයක් ඇති සේවාදායකයෙකුගේ සැබෑ අනන්‍යතාවය සොයා ගැනීම දුෂ්කර ය. මෙය සේවා සපයන්නාට ඉහළ මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමක් ඇති කරයි.
2.8	අපරාධ වාර්තා හෝ සංවිධානාත්මක අපරාධ සඳහා සම්බන්ධතා ඇති සේවාදායකයින්	සේවාදායකයින්ට පූර්ව අපරාධ වාර්තා හෝ සංවිධානාත්මක අපරාධ සඳහා සම්බන්ධතා ඇති විට එවැනි ගනුදෙනුකරුවන්ගේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා ඇති අවදානම ඉහළ වේ
3) සේවා අවදානම		
3.1	භෞතික මුදල් තැන්පතු සහ / හෝ මුදල් ආපසු ගැනීමට සහය වන සේවාවන්	මුදල් චලනය කිරීමේදී එය විගණන මගකින් තොරව කිරීමට ඇති හැකියාව මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් සඳහා අවදානමක් ඇති කරයි. ඔබේ ආයතනය විසින් පිරිනමනු ලබන සේවාවන් මුදල් තැන්පත් කිරීමට හෝ ලබා ගැනීමට වේදිකාවක් සපයන්නේ නම් (උදා: ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, විකුණුම් ස්ථානයක හෝ මුදල් අත්තිකාරම් ගනුදෙනුවක් හරහා) එබඳු අවස්ථාවන්හි මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම සලකා බැලිය යුතුය. මෙම මුදල් ගනුදෙනු විශාල මූල්‍යමය අගයන්ගෙන් සිදුවන විට එය මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම වැඩි කරයි.
3.2	ජාත්‍යන්තර අරමුදල් හුවමාරු කිරීම් සඳහා පහසුකම් සපයන සේවාවන්	මෙම සේවාවන් ආමුඛ හෝ ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා පහසුකම් සපයන්නේ නම්, එවැනි ලැබුනු හෝ ගෙවනු ලැබූ ප්‍රේෂණ නියම කරන ලද යාන්ත්‍රණයන් මග හරින්නේය. (ආමුඛ ආයෝජන ගිණුම් සහ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්)
3.3	තෙවන පාර්ශවයකට හෝ සේවාදායකයින් නොවන අයට ගෙවීම් කිරීම් සහ ලැබීම් සඳහා සේවාවන් සහාය වීම	මෙමඟින් අරමුදලේ ප්‍රතිලාභී හිමිකාරිත්වය හෝ සඵලදායී පාලනය සැඟවිය හැක. අතරමැදියන් කිහිප දෙනෙකු සිටීම සහ නියෝජිතයින් සිටීම ප්‍රතිලාභී හිමිකම සැඟවීමට හා මුලා කිරීම මඟින් ඉඩ ඇත
3.4	දුරස්ථව හෝ සේවා සපයන්නාගේ මැදිහත්වීමකින් තොරව සිදු කළ හැකි ගනුදෙනු සඳහා සේවා සහය	ගනුදෙනුකරුවන් සමඟ මුහුණට මුහුණලා කටයුතු කිරීම අඩු වීම මූල්‍ය විශුද්ධිකරන සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් වලට ඇති අවදානම වැඩි කරයි. විශේෂයෙන් මාර්ගගත ක්‍රියාකාරකම් මඟින් අන්තර්ජාතික මට්ටමින් බොහෝවිට සේවා සපයන්නා සහ සේවාදායකයා අතර සුළු හෝ අන්තර්ක්‍රියාකාරිත්වයක් නොමැතිව ඉහළ සංඛ්‍යාත සහ ඉහළ වටිනාකම් සහිත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසිය හැකිය.
3.5	නාමික හිමිකාරිත්වය ඇති සමාගම් හෝ ෂෙල් සමාගම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම හා සම්බන්ධ සේවාවන් සැපයීම	ෂෙල් සමාගම් (ෆැන්ටම් සමාගම් හෝ නිර්නාමික සමාගම් ලෙස ද හැඳින්වේ) ඒවා පාලනය කරන හෝ ලාභ ලබන සැබෑ හිමිකරුගේ අනන්‍යතාවය සැඟවීමට භාවිතා කරන ආයතන වේ.
3.6	පැහැදිලි වාණිජමය තාර්කිකත්වයක් නොමැතිව ගනුදෙනු සිදු කරයි	අපරාධකරුවන් විසින් සාපරාධී ලෙස උපයාගත් මුදල් සැඟවීම සඳහා නිශ්චිත හේතුවක් නොමැතිව ගනුදෙනු කරයි. මෙමඟින් මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම ඉහල යයි.
4) බෙදා හැරීමේ මාර්ග / ව්‍යාපාර සම්බන්ධතා සම්බන්ධ අවදානම්		
4.1	සේවය සැපයීමේ ක්‍රමය හෝ සේවාදායකයා සමඟ මුහුණට මුහුණ සිදු කරන සම්බන්ධතා අවම කිරීම	සේවාදායකයෙකු සමඟ මුහුණට මුහුණලා කටයුතු නොකිරීම මඟින් මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් වලට ඇති අවදානම වැඩි කරයි.
4.2	තෙවන පාර්ශවයක් බෙදා හැරීමේ මාර්ග ලෙස භාවිතා කළ හැකිය	මෙමඟින් ඔබේ සේවාදායකයාගේ අනන්‍යතාවය, ප්‍රතිලාභී හිමිකරු හෝ අත්‍යන්ත පාලනය පැහැදිලි නොවීම නිසා මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම වැඩි කරයි.
4.3	දේශසීමා හරහා සිදු කරන ගෙවීම් සම්බන්ධ බෙදා හැරීමේ මාර්ග	දේශසීමා හරහා සිදු කරන ගෙවීම්, විදේශ ප්‍රේෂණ සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලින් සිදු වන ගනුදෙනු මඟින් ඉහළ මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමක් ඇති කරයි.
4.4	ව්‍යවහාර මුදල් මඟින් ගෙවීම් සිදු කරන බෙදා හැරීමේ නාලිකා	විගණනයකින් තොරව මුදල් චලනය කිරීමේ පහසුව මඟින් මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් වලට ගොදුරු වීමේ හැකියාව ඉහල නංවයි. වටිනාකමින් ඉහළ මුදල් ගෙවීම් පවතී නම් එවැනි අවස්ථාවන්හි මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම සලකා බැලිය යුතුය.

5) භූගෝලීය අවදානම		
5.1	දූර්වල හෝ අකාර්යක්ෂම මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග පවතින ලෙස හඳුනාගත් හෝ සම්බාධක වලට යටත් වන රටවල් සමඟ ගනු දෙනු කිරීම, දූර්වල හෝ අකාර්යක්ෂම මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග පවතින ලෙස හඳුනාගත් හෝ සම්බාධක වලට යටත් වන රටවල් සමඟ ගනුදෙනු කිරීම,එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා (UNSCR) විසින් නිකුත් කරන ලද සම්බාධක හෝ ඒ හා සමාන ක්‍රියාමාර්ග	මූල්‍ය කාර්යසාධක බලකාය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමට එරෙහි ක්‍රියාන්විතයේදී සමහර රටවල් සහයෝගී නොවන බව හඳුනාගෙන ඇති අතර එම රටවලට එරෙහිව සම්බාධක පැනවීය. එවැනි රටවල සේවාදායකයින් හරහා සේවා සපයන්නාට ඉහළ මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමක් ඇති කරයි.
5.2	නීති විරෝධී ක්‍රියාකාරකම් සිදුවන රටවල් සමඟ ගනුදෙනු කිරීම	ඉහළ මට්ටමේ සංවිධානාත්මක අපරාධ පැවතීම රටේ අවදානම තීරණය කිරීමේ වැදගත් සාධකයක් ලෙස සැලකිය හැක.
5.3	ඉහළ මට්ටමේ දූෂණ හා අල්ලස් ඇති රටවල් සමඟ ගනුදෙනු කිරීම	රටක අවදානම තීරණය කිරීමේදී ඉහළ මට්ටමේ අල්ලස් හා දූෂණ පැවතීම වැදගත් කරුණක් ලෙස සැලකිය යුතු අතර රටේ අවදානම තීරණය කිරීමේ මූලික සාධකයකි. අල්ලස් හා දූෂණය ඕනෑම මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ තන්ත්‍රයක් මූලික වශයෙන් දුර්වල කරයි.
5.4	ගැටුම් කලාපයක සිටින හෝ සැලකිය යුතු ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් පවතින රටවල් හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අරමුදල් හෝ ආධාර සපයන රටවල් සමඟ ගනුදෙනු කිරීම	යුධ ගැටුම් සහිත කලාප මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ අතිශය ඉහළ අවදානමක් පෙන්නුම් කරයි. මෙම කලාප තුළට සහ ඒ හරහා අරමුදල් ගලායාම සොයා ගැනීම අතිශයින් දුෂ්කර ය. මෙම කලාපවල ක්‍රියාත්මක වන ලාභ නොලබන සංවිධාන අනිසි ලෙස හෝ ආවරණයක් ලෙස භාවිතා කළ හැකිය.
5.5	මූල්‍යමය රහස්‍යභාවයක් පවතින බවට හඳුනගන ඇති ඕනෑම රටක්	පුද්ගලයෙකුගේ / ආයතනයක මූල්‍ය තොරතුරු නීත්‍යානුකූල බලධාරීන් සමඟ බෙදා ගැනීම ප්‍රතික්ෂේප කළ විට මූල්‍ය රහස්‍යභාවය ඇතිවේ, උදාහරණයක් ලෙස බදු බලධාරීන් සහ පොලිස් බලධාරීන්. එබැවින්, එවැනි රටවල ගනු දෙනුකරුවන් සමඟ ගනුදෙනු කිරීමේදී ඔවුන්ගේ මූල්‍ය තොරතුරු ලබා ගැනීමේ බාධක ඉහළ හෝ අඩු මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම අනුව තක්සේරු කරනු ලැබේ.
5.6	ආයතනයේ ශාඛා සහ උප සමාගම් වෙනත් රටවල පිහිටා ඇත	සේවා සැපයුම්කරුගේ ශාඛා හෝ නියෝජිතයන් වෙනත් රටවල පිහිටා ඇති විට, එම රටවල පවතින මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ යාන්ත්‍රණයේ අඩුපාඩු, ක්‍රියාමාර්ග සහ පවතින නීතීන් වැනි සාධක මත පදනම්ව අවදානම වැඩි හෝ අඩු විය හැකිය.

ඇමුණුම **III**

අනුකූලතා නිලධාරී ප්‍රකාශන පෝරමය

Financial Intelligence Unit මූල්‍ය බුද්ධි ඒකකය நிதியியல் உளவறிதல் பிரிவு		කාර්යාලීය භාවිතය සඳහා පමණි

මෙම ආකෘති පත්‍රය ආයතනයේ හිමිකරු / කළමණාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරියා විසින් පුරවා තිබිය යුතුය.

ප්‍රකාශන වර්ගය	අංශය	
A ☐ මූලික ලියාපදිංචිය	A ☐ දේපළ වෙළඳාම්	D ☐ නීතිඥයා / නොතාරිස්
B ☐ පවත්නා තොරතුරු වෙනස් කිරීම	B ☐ මැණික් හා ස්වර්ණාභරණ	E ☐ ගණකාධිකාරී
	C ☐ කැසිනෝ	F ☐ භාර සහ සමාගම් සේවා සැපයුම්කරු

.....(නම)..... මහතා /මහත්මිය,.....(තනතුර).....2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 14 (1) (අ) වගන්තිය යටතේ .....(වාර්තාකරණ ආයතනය)..... හි අනුකූලතා නිලධාරීවරයා ලෙස පත් කර ඇත.

අනුකූලතා නිලධාරීවරයාගේ විස්තර පහත පරිදි වේ.

ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍ර අංකය:.....

කාර්යාලීය ලිපිනය:.....

දුරකථන අංකය : කාර්යාල ..... ජංගම .....

විද්‍යුත් ලිපිනය :..... ෆැක්ස් .....

අත්සන :.....

මෙයට විශ්වාසී

....

නිල මුද්‍රාව සමඟ හිමිකරුගේ/ කළමනාකරණ අධ්‍යක්ෂකගේ/ දිනය

ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සන

හිමිකරුගේ / කළමනාකරණ අධ්‍යක්ෂකගේ/

ප්‍රධාන විධායක නිලධාරියාගේ නම:.....

ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍ර අංකය :.....

කාර්යාලීය ලිපිනය :.....

දුරකථන අංකය : කාර්යාල ..... ජංගම .....

විද්‍යුත් ලිපිනය :..... ෆැක්ස් .....

පිටපත් :..... (අනුකූලතා නිලධාරීවරයාගේ නම)

ඇමුණුම **IV**

ගණකාධිකාරිවරුන් විසින් සුපරික්ෂාකාරී විය යුතු මුදල් විශුද්ධිකරණය / ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා හේතු වේ යයි/ මුල් වේ යයි සැක සහිත දර්ශක

සේවාදායකයා සහ සේවාදායකයාගේ හැසිරීම:

i. සේවාදායකයා ඔහුගේ සුපුරුදු ගනුදෙනු තත්ත්වය/ පැතිකඩට අනුකූල නොවන ගනුදෙනුවක් / ගනුදෙනු සිදු කරයි.

ii. සේවාදායකයා ඔහුගේ සුපුරුදු මූල්‍ය තත්ත්වය/ පැතිකඩ සමඟ නොගැලපෙන ගනුදෙනුවක් කරයි.

iii. සේවාදායකයාට ඔහුගේ/ ඇයගේ විකුණුම් සමඟ නොගැලපෙන චෙක්පත් ඇත. (එනම්, බලාපොරොත්තු නොවූ ප්‍රභවයන්ගෙන් අසාමාන්‍ය ගෙවීම් දක්නට ලැබේ).

iv. සේවාදායකයා විසින් පොත් තබන්නන් හෝ ගණකාධිවරුන් නිරන්තරව වෙනස් කිරීමේ රටාවක් දක්නට ලැබේ.

v. සේවාදායකයා, පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර වර්ගයට නොගැලපෙන අන්දමේ සේවකයින් සංඛ්‍යාවක් සහිත සමාගමක් වීම.

vi. සේවාලාභියා යනු අක්වෙරළ සමාගම්වලට අසාමාන්‍ය උපදේශක ගාස්තු ගෙවන සමාගමක් වීම.

vii. සේවාදායකයා කිසිදු ආර්ථික තාර්කිකත්වයකින් තොරව විදේශ මුදල් භාවිතා කරමින් විශාල හෝ නිරන්තර ගනුදෙනු සිදු කරයි.

viii. සේවාදායකයා නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සහ වාර්තා පවත්වා ගැනීම සඳහා වෙනස් කරන ලද, වංචනික හෝ ව්‍යාජ අනන්‍යතා ලේඛන භාවිතා කරන බවට සැක පැවතීම.

ix. සේවාදායකයා අසම්පූර්ණ ගිණුම් වාර්තා පවත්වාගෙන යන අතර ම අවසාන ගිණුම් පිළියෙළ කිරීම සඳහා ඒවා ගණකාධිකාරිවරුන් වෙත ඉදිරිපත් කරයි.

x. සේවාදායකයා අසාමාන්‍ය ලෙස සේවා සපයන්නාගේ මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතා සහ අභ්‍යන්තර අනුකූලතා ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි හෝ පාලනයන් පිළිබඳව සැලකිලිමත් වන අතර සහ හෝ ඒ පිළිබඳව විමසිම් කරයි.

xi. ගනුදෙනුකරු ගනුදෙනු සම්බන්ධයෙන් ඉහළ රහස්‍යතාවක් පවත්වා ගැනීමට උත්සාහ කරයි, උදාහරණයක් ලෙස සාමාන්‍ය ව්‍යාපාරික වාර්තා තබා නොගන්නා ලෙස ඉල්ලා සිටීමෙන්.

xii. සේවාදායකයාගේ අරමුදල් ප්‍රභවයට අදාළව අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් වැළකී සිටීමට උත්සාහ දරයි.

xiii. සේවාදායකයා අපරාධමය කටයුතුවලට හෝ ත්‍රස්තවාදී කටයුතුවලට සම්බන්ධ පුද්ගලයෙකු බව ප්‍රසිද්ධ කරුණක් වීම.

xiv. සේවාදායකයා මුදල් විශුද්ධිකරණය / ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධිත රටකට හෝ ආයතනයකට සම්බන්ධ බව පෙනේ.

xv. සේවාදායකයා යනු මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා ඉහළ අවදානමක් ඇතැයි සැලකෙන භූගෝලීය ප්‍රදේශයක පදිංචිකරුවෙකි.

xvi. සේවාදායකයා යනු නාමික කොටස් හිමියන්ගේ කොටස් දරණ ස්වරූපයෙන් ඇති සමාගමකි.

xvii. සේවාලාභියා මුදල් මත පදනම් වන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සමගමක් වීම.

xviii. සේවාදායකයා සමාගමක් වන විටදී එහි ආයතනික ව්‍යුහය එම ක්ෂේත්‍රයේම අනෙක් සමාන සමාගම්වල ව්‍යුහය මෙන් නොව අසාමාන්‍ය හෝ සංකීර්ණ සොබාවයක් ඉසිලීම.

xix. සමාගම් නාමය වෙනස් කිරීම, හිමිකාරිත්වය පැවරීම සහ මූලස්ථානයේ පිහිටීම ඇතුළුව සේවාදායකයාගේ (සමාගමේ) නෛතික ව්‍යුහය නිතර වෙනස් වීමට භාජනය වීම.

xx. ගණකාධිකාරිවරයා සිය සේවදයකයාව මුහුණට මුහුණ හමු වී නොමැති වීම.

xxi. සේවාදායකයාගේ ප්‍රතිලාභී හිමිකරු හඳුනා ගැනීමට අපහසු වීම.

xxii. සේවාදායකයා දේශපාලනමය වශයෙන් අනාවරණය වූ තැනැත්තෙකු හෝ එවැනි පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙක් වීම.

නිෂ්පාදන, සේවා හෝ බෙදා හැරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් වන අවදානම:

i. නිෂ්පාදනයට පෞද්ගලික බැංකුකරණය සම්බන්ධ වේ.

ii. නොදන්නා හෝ අනුබද්ධ නොවන තෙවන පාර්ශවයන්ගෙන් ගෙවීම් ලැබේ.

iii. නව නිෂ්පාදන, නව බෙදාහැරීමේ මාර්ග සහ නව ව්‍යාපාර භාවිතයන් සම්බන්ධ වේ.

රට / භූගෝලීය අවදානම

i. සේවාදායකයා මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම මර්දනය සඳහා ඵලදායී පද්ධති ස්ථාපිත කර නොමැති රටක් සමඟ ගනුදෙනු කරයි.

ii. සේවාදායකයා සැලකිය යුතු මට්ටමේ දූෂණ, මත්ද්‍රව්‍ය / මිනිස් ජාවාරම් හෝ ත්‍රස්තවාදයක් ඇති බවට පිළිගත් රටවලට අරමුදල් ප්‍රේෂණය කරයි.

iii. සේවාලාභියා ත්‍රස්තවාදයට මුදල් යෙදවීම සඳහා ප්‍රසිද්ධ රටකින් අරමුදල් ලබා ගනී.

ඇමුණුම V

සිද්ධි අධ්‍යයන (ගණකාධිකාරිවරුන් හරහා මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සිදුවන ආකාරය සඳහා උදාහරණ)

සිද්ධිය 01

Z රටේ මිනිස් ජාවාරම්කරුවෙකු වන D මහතාට කුඩා වටිනාකමින් යුතු මුදල් තැන්පතු විශාල ප්‍රමාණයක් නිතරම ලැබී ඇති බව z පොලීසිය අනාවරණය කර තිබේ. මෙම අරමුදල් Y රටේ දේපළ වෙළඳාම් මිලදී ගැනීම සඳහා භාවිතා කර ඇත. D මහතා විසින් බැංකු ගිණුම් විවෘත කිරීමට සහ දේපළ වෙළඳාමේ නිරත වීමට යොදාගෙන ගණකාධිකාරිවරයෙකු යොදාගෙන ඇති බව ද අනාවරණය වී තිබේ. තවද, ගණකාධිකාරීවරයා D මහතාට ආයෝජන උපදෙස් ද ලබා දී ඇත.

සිද්ධිය 02

ගණකාධිකරණ සේවා සපයන "M" නම් ආයතනය "H" නම් සේවාදායකයාට දේපල මිලදී ගැනීම සඳහා සිය සේවය ලබා දී ඇත. "H" සතුව මෝටර් රථ විකිණීමේ ව්‍යාපාරයක් ඇති අතර ඔහුට මත්ද්‍රව්‍ය ජාවාරම් ව්‍යාපාර සමඟ ද සම්බන්ධයක් ඇත.

ගණකාධිකරණ සේවා සපයන "M" නම් ආයතනය "H" නම් සේවාදායකයාට දේපල මිලදී ගැනීම සඳහා සිය සේවය ලබා දී ඇත.

"H" සතුව මෝටර් රථ විකිණීමේ ව්‍යාපාරයක් ඇති අතර ඔහුට මත්ද්‍රව්‍ය ජාවාරම් ව්‍යාපාර සමඟ ද සම්බන්ධයක් ඇත. මෙම දේපල මිලදී ගැනීම සඳහා ඔහුගේ නීත්‍යානුකූල ව්‍යාපාරික කටයුතුවලින් උපයන මුදල් වලට වඩා වැඩි මුදලක් භාවිතා කර ඇත. .

"H" මත්ද්‍රව්‍ය ජාවාරම් ව්‍යාපාරය සමඟ ඇති සම්බන්ධය හෙළි වීමෙන් අනතුරුව, " M ආයතනය" මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක සහිත ගනුදෙනු වාර්තාවක් ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීය.

සිද්ධිය 03

ගණකාධිකරණ සේවා සපයන "KA" ආයතනයෙහි A නම් සේවාදායකයා කිසිදු සාධාරණ පැහැදිලි කිරීමකින් තොරව විවිධ බැංකු ගිණුම් වෙත මුදල් යැවීමට සහ මුදල් ලබා ගැනීමට නිතර ඉල්ලීම් කර ඇත. ඒ වගේම විසින් විවිධ මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කරන ලෙස "KA" ආයතනයෙන් ඉල්ලා ඇත. "KA" ආයතනයෙහි අනුකූලතා නිලධාරියා මෙම සේවාදායකයා සැක සහිත අයෙකු ලෙස හඳුනාගෙන ඇති අතර ගනුදෙනු වල මෙම සැක සහිත ස්වභාවය පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කර ඇත. සේවාදායක් ත්‍රස්ත කණ්ඩායමක් සමඟ සම්බන්ධතා ඇති බවත්, ආයතනය භාවිතා කරමින් ත්‍රස්තවාදී මූල්‍යකරණ කටයුතු සඳහා සහාය වී ඇති බවත් පසුව අනාවරණය විය.

ඇමුණුම **VI**

V වන උපලේඛනය

රහසිගතයි

පළාත:
දිස්ත්‍රික්කය:

සැක කටයුතු ගනුදෙනු වාර්තාව						
අ.	මෙම වාර්තාව 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීමේ අවශ්‍යතාවයට අනුකූලව සකස් කරන ලදී.					
ආ.	සද්භාවයෙන් එවැනි වාර්තාවක් ඉදිරිපත් කරන තැනැත්තකුට විරුද්ධව පනතේ 12 වන වගන්තිය යටතේ සිවිල්, අපරාධ හෝ විනයානුකූල නීති කෘත්‍යකිසිවක් පවරනු නොලැබිය යුතුය.					
අ කොටස - වාර්තාවේ තොරතුරු						
1.	වාර්තාව යවන දිනය					
2.	මෙය කලින් වාර්තාවක් වෙනුවට ඉදිරිපත් කරන්නක් ද?	ඔව්		නැත		
ආ කොටස - සැක කටයුතු ගනුදෙනු/ක්‍රියාව පිළිබඳ තොරතුරු						
3.	සම්පූර්ණ නම (ආයතනයක් නම්, ලියාපදිංචි ව්‍යාපාර/ආයතන නාමය සඳහන් කරන්න)					
4.	පදිංචි/ලියාපදිංචි ලිපිනය					
5.	ජා.හැ. අංකය/විදේශ ගමන් බලපත්‍රයේ අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය					
6.	ස්ත්‍රී පුරුෂ භාවය	පුරුෂ		ස්ත්‍රී		
7.	පදිංචි රට සහ ජාතිය (පුද්ගලයෙක් නම්)					
8.	ව්‍යාපාරයේ/රැකියාවේ ස්වභාවය					
9.	රක්ෂාව (සුදුසු අවස්ථාවක දී, ගනුදෙනුව සිදුකරන තැනැත්තාගේ ප්‍රධාන කාර්යය)					
10.	සේවායෝජකයාගේ නම (අදාළ වන අවස්ථාවක දී)					
11.	සම්බන්ධ විය හැකි දුරකථන විස්තර					
ඇ කොටස - සැක කටයුතු ගනුදෙනුව/ක්‍රියාවේ විස්තර						
12.	ගනුදෙනුවේ/ක්‍රියාවේ තොරතුරු					
13.	සැක කිරීමේ හේතු/පසුබිම					

චක්‍රලේඛ අංක : 03/2020 2020 ජූනි 15
යොමු අංකය : 037/02/008/0010/016

වෙත : මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්, සාමාන්‍යාධිකාරීවරුන්, කළමනාකාර අධ්‍යක්ෂවරුන්

නැගී එන මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවදානම් පිළිබඳව සුපරික්ෂාකාරී වන ලෙස මූල්‍ය ආයතනවලට උපදෙස් ලබා දීම.

ඉහත කරුණ සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් යොමු කර ඇති 2020 මාර්තු 23 දිනැති විද්‍යුත් තැපෑල හා වැඩිමනත් බැඳේ.

ගෝලීය කොවිඩ්19 වසංගතය හමුවේ පැන නගින මුදල් විශුද්ධිකරණ / ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවදානම්වලින් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා සුපරික්ෂාකාරී බව / නිසි උද්යෝගය වැඩි කිරීමට මූල්‍ය ආයතනවලට උපදෙස් දෙනු ලැබේ. ඒ අනුව, පහත සඳහන් කරුණු වෙත ඔබේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ව්‍යාජ / වැරදි විද්‍යුත් තැපැල් අක්තපත්‍ර භාවිතා කරමින් අරමුදල් හුවමාරු කර ඇති සයිබර් ප්‍රහාර සහ අනවසරයෙන් ඇතුළුවීමේ සිදුවීම් කිහිපයක් පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය දැනුවත් කර ඇත. ඒ අනුව, සිදුවිය හැකි ආරක්ෂක උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් දිගින් දිගටම අවදියෙන් සිටින ලෙසත්, එවැනි සිදුවීම් වැළැක්වීමට පියවර ගන්නා ලෙසත්, එවැනි ප්‍රහාරවලට ගොදුරු විය හැකි වින්දිතයන් වහාම දැනුවත් කරන ලෙසත් මූල්‍ය ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

(ආ) රාජ්‍ය රහස් ඔත්තු හා නීතිය බලාත්මක කිරීමේ ආයතනවලින් සැක කටයුතු ගිණුම් සම්බන්ධ වාර්තාවලින් ලද හෙළිදරව් කිරීම් මාර්ගයෙන් කොවිඩ්19 වසංගත තත්ත්වය සමඟ පැන නැගී ඇති අනාරක්ෂිතතා උපයෝගී කර ගනිමින් ත්‍රස්තවාදයට මුදල් සැපයීම්, මූල්‍ය වංචා සහ පුණ්‍යායතන භාවිතා කිරීමේ වැඩි ප්‍රවණතාවක් ඇති බව මූල්‍ය බුද්ධි ඒකකය විශ්වාස කරයි.

(ඇ) රට තුළ හා ඉන් පිටත පවතින වර්තමාන තත්ත්වයෙන් ප්‍රයෝජන ගැනීමට අපේක්ෂා කරන සයිබර් අපරාධකරුවන්ට සහ හැකර්වරුන්ට එරෙහිව මූල්‍ය ආයතන විසින් පූර්ව ආරක්ෂක පියවර ගත යුතුය. කොවිඩ්19 වසංගත තත්ත්වය හමුවේ ගනුදෙනුකරුවන්ට වැඩි වශයෙන් මාර්ගගත / අන්තර්ජාල බැංකු කටයුතු භාවිතා කිරීමට උනන්දු කරන ලද අතර, එය අනපේක්ෂිත ලෙස පද්ධති අවදානම වැඩි වීමට හේතු වන්නට ඇත.

(ඈ) මූල්‍ය ආයතන විසින් විද්‍යුත් ගනුදෙනු පිළිබඳව වහාම පාරිභෝගිකයන් දැනුවත් කිරීම ඇතුළුව පූර්ව ආරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය. එවැනි සයිබර් ප්‍රහාරයක් / අනවසර ඇතුළුවීමක් සිදු වුවහොත් ඊට ගොදුරුවන ගනුදෙනුකරු ඒ පිළිබඳව දැනුවත් කළ යුතු අතර, එවැනි ප්‍රහාරයක් / අනවසර ඇතුළුවීමක් දුටු වහාම මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් එවීමට අමතරව පොලීසිය / අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට පියවර ගත යුතුය.

මෙයට විශ්වාසී,

අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: අනුකූලතා නිලධාරී

විධාන අංක 01 2020 අගෝස්තු 21
යොමු අංකය: 037/05/003/0005/016

බලපත්‍රලාභී බැංකු වල ප්‍රධාන විධායක නිලධාරීන් /සාමාන්‍යාධිකාරිවරුන් /කළමනාකරණ අධ්‍යක්ෂකවරුන් වෙත,

පොදු සහ බැංකු නිවාඩු/සති අන්ත වලදී අනුකූලතා නිලධාරීන් සමඟ සම්බන්ධ වීම

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්ති 15 (2) ප්‍රකාරව නිකුත් කරන ගිණුම් අත්හිටුවීමේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා, පොදු සහ බැංකු නිවාඩු හෝ සති අන්ත හෝ සතියේ දින, මේ කුමන දිනයකදී වුවද, දවසේ ඕනෑම වේලාවකදී මූල්‍ය බුද්ධි ඒකකය හා සම්බන්ධ වීමට අනුකූලතා නිලධාරීන් සහ ඔවුන්ගේ ඇමතුම් තොරතුරු හඳුනාගැනීම අවශ්‍ය වී ඇත.

එසේ හෙයින්, එවැනි ගිණුම් අත්හිටුවීමේ නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කටයුතු කිරීමට නිලධාරීන් 03 දෙනෙකු නම් කරන ලෙසට සහ ඔවුන්ගේ විස්තර පහත දැක්වෙන ආකාරයට fiulegal@cbsl.lk යන ඊමේල් ලිපිනයට මූල්‍ය බුද්ධි ඒකකය වෙත යොමු කරන ලෙස මෙයින් විධාන කරයි.

නම සහ තනතුර :

ඊමේල් ලිපිනය :

දුරකථන අංකය (ස්ථාවර සහ ජංගම) :

ෆැක්ස් අංකය :

ගිණුම් අත්හිටුවීමේ නියෝග පමාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා, එසේ නම් කරන ලද නිලධාරීන් පොදු සහ බැංකු නිවාඩු හෝ සති අන්ත දින වලදී සම්බන්ධ කරගත හැකි විය යුතු අතර, ගිණුම් අත්හිටුවීමේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අවැසි අධිකාරිය සහ ප්‍රවේශයද හිමි වී තිබිය යුතුය.

අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත : අනුකූලතා නිලධාරී

මාර්ගෝපදේශ අංක 03/2020 2020 දෙසැම්බර් 30
යොමු අංකය : 037/05/006/0009/020
වෙත : සියලුම මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්, සාමාන්‍යාධිකාරීවරුන්, කළමනාකාර අධ්‍යක්ෂවරුන්

මහත්මයාණෙනි/මහත්මියණි,

2020 අංක 3 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ තහවුරු කිරීම සඳහා වූ සංශෝධිත මාර්ගෝපදේශය

ඉහත කරුණ සම්බන්ධයෙන් 2020 ඔක්තෝබර් 22 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශය හා බැඳේ.

මෙම මාර්ගෝපදේශය වහාම බලාත්මක වන අතර, වරින්වර සිදුකරන ලද සංශෝධනයන්ට යටත්ව 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සහ 2019 අංක 1 දරන රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සමඟ කියවිය යුතුය.

ඒ අනුව, 2020 ඔක්තෝබර් 22 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශය 2020 දෙසැම්බර් 30 දින සිට බලාත්මක වන පරිදි පරිච්ඡින්න කරනු ලැබේ.

මෙයට විශ්වාසී,

ඊ. එච්. මොහොට්ටි
අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්:
1. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
2. අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
3. අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
4. අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
5. අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
6. කොමසාරිස් ජෙනරාල්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
7. අනුකූලතා නිලධාරීන්, සියලුම මූල්‍ය ආයතන

2020 අංක 03 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ තහවුරු කිරීම සඳහා වූ මාර්ගෝපදේශය

I කොටස - හැඳින්වීම

1. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(ඒ) වගන්තියට අනුව, මෙම මාර්ගෝපදේශය නිකුත් කරනු ලැබේ.

2. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් නව මූල්‍ය සබඳතා අරඹන සම්මුඛ නොවන ගනුදෙනුකරුවන්ගේ[1] (ස්වාභාවික පුද්ගලයන්) අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා (මුල් පිටපත සමඟ සසඳා තහවුරු කිරීම) මූල්‍ය ආයතනවලට හා රක්ෂණකරුවන්ට[2] පහසුකම් සැලසීම වෙනුවෙන් මෙම මාර්ගෝපදේශය නිකුත් කරනු ලැබේ.

3. මෙම මාර්ගෝපදේශය වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක වන අතර, වරින්වර සිදු කරන ලද සංශෝධනයන්ට යටත්ව 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සහ 2019 අංක 1 දරන රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සමඟ කියවිය යුතුය.

4. සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සමඟ මූල්‍ය සබඳතා ඇරඹීමේ දී ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාවය ස්ථාපිත කිරීම හා තහවුරු කිරීමේ වඩා ඵලදායී හා විශ්වාසදායී ක්‍රම බලාත්මක කිරීම වෙනුවෙන් හෝ අනාගතයේ කවරාකාරයකින් වුව ඇතිවිය හැකි අනපේක්ෂිත අවදානම් හමුවේ මෙම මාර්ගෝපදේශය වරින්වර සංශෝධනයට ලක් කිරීම හෝ ඉවත් කිරීම සිදු විය හැකිය.

II කොටස - විෂය පථය

5. ස්වාභාවික පුද්ගලයන් වන තනි පුද්ගල ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් මුල් පිටපත සමඟ සසඳා බලා තහවුරු කිරීමේ අවශ්‍යතාවය සපුරාලීමේ දී මෙම මාර්ගෝපදේශය මගින් පහත සඳහන් සවිස්තරාත්මක විකල්ප ක්‍රම සපයයි.
   (අ) මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන් හි 27 රීතිය යටතේ ඇති උපලේඛනය අයිතම (1)(අ)(i) අනන්‍යතා ලේඛනය තහවුරු කිරීම
   (අා) මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි 27 රීතිය යටතේ ඇති උපලේඛනය අයිතම (1)(අා)(ii) ලිපිනය තහවුරු කිරීම
   (ඇ) රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි 26 හා 41 රීති යටතේ ඇති උපලේඛනය අයිතම (1) (අා) (i) අනන්‍යතා ලේඛනය තහවුරු කිරීම
   (ඈ) රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි 26 හා 41 රීති යටතේ ඇති උපලේඛනය අයිතම (1) (අා) (ii) ලිපිනය තහවුරු කිරීම

6. ඉහත ක්‍රමය භාවිතා කර ගනුදෙනුකරුවන් සමග මූල්‍ය සබඳතාවලට එළඹීමේ දී, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතීන් යටතේ පනවා ඇති අනෙකුත් සියළුම අවශ්‍යතාවයන් කිසිදු ව්‍යතිරේකයකින් තොරව අදාල වේ.

III කොටස - අයදුම් කිරීමේ ක්‍රම

7. තනි පුද්ගල ගනුදෙනුකරුවෙකුගේ හඳුනා ගැනීමේ ලේඛනය තහවුරු කිරීම
   (අ) හිමිකම් පෑ අනන්‍යතාවය[3]

   ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතීන්හි 27(1)(අ) රීතියට ප්‍රකාරව සෑම මූල්‍ය ආයතනයක් විසින්ම සිය ගනුදෙනුකරුවන් පූර්ණ වශයෙන් හඳුනා ගැනීම සිදු කළ යුතු අතර, 27(1)(අා) රීතියෙහි විස්තර කර ඇති සියලු තොරතුරු ගනුදෙනුකරුගෙන් ලබා ගත යුතුය.

   මූල්‍ය ආයතන/රක්ෂණකරුවන්ට සිය තොරතුරු සම්ප්‍රේෂණ ක්‍රියාවලියේ අඛණ්ඩතාවය ආරක්ෂා කරන ඕනෑම ක්‍රමයකට හිමිකම් පෑ අනන්‍යතා තොරතුරු ලබා ගත හැකිය. විද්‍යුත් ක්‍රම, ජංගම දුරකථන යෙදවුම්, වීඩියෝ සම්මන්ත්‍රණ, ආරක්ෂිත විද්‍යුත් තැපෑල, කියොස්ක්ස් උපකරණ, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර, ලියාපදිංචි තැපෑල යනාදිය අනන්‍යතා තොරතුරු ලබාගත් හැකි ක්‍රමවලට ඇතුළත් වන නමුත් සීමා නොවේ.

---

1 එකම භෞතික ස්ථානයක නොසිටිමින් සහ ඩිජිටල් හෝ වෙනත් භෞතික නොවන තත්කාලීන යෙදවුම් ඔස්සේ දුරස්ථව සම්බන්ධ වීම සම්මුඛ නොවන අන්තර් ක්‍රියා ලෙස සලකයි.

2 රක්ෂණකරු යන්නෙන් 2019 අංක 1 දරන රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතිවල 2 වන රීතියෙහි දක්වා ඇති අර්ථය අදහස් වේ.

3 හිමිකම් පෑ අනන්‍යතාවය යන්නෙන් වලංගු නොවන සහ තහවුරු නොකළ පුද්ගලික ගුණාංග පිළිබඳ අයදුම්කරුගේ ප්‍රකාශනය අදහස් වේ.

(ආ) හිමිකම් පෑ අනන්‍යතාවයෙහි වලංගුභාවය

ගනුදෙනුකරුගේ හිමිකම් පෑ අනන්‍යතාවය ස්වාධීනව තහවුරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට මූල්‍ය ආයතනවලට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද විද්‍යුත් අතුරු මුහුණත පහත පරිදි භාවිතා කළ හැකිය.

(i) ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ආයතනවලට/රක්ෂණකරුවන්ට ලබා දී ඇති අනන්‍ය කේත භාවිතයෙන් අතුරු මුහුණතට ප්‍රවේශ විය යුතුය.

(ii) අතුරු මුහුණතට ප්‍රවේශවීමේ දී එහි භාවිතා නියමයන්ට දැඩි ලෙස අනුකූල විය යුතුය.

(iii) මූල්‍ය ආයතනය/රක්ෂණකරුට අතුරු මුහුණත භාවිතා කළ හැකි අවස්ථා

(අ) අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් පෑ අනන්‍යතාව පිළිබඳ තොරතුරු අතුරු මුහුණතෙහි පවතින තොරතුරු සමග පූර්ණ ලෙස ගැලපෙන විට;

(ආ) ගනුදෙනුකරුවන් විසින් ලබාදුන් ඡායාරූපය අතුරු මුහුණතෙහි ඇති හැඳුනුම්පතේ ඡායාරූපය සමග සැසඳෙන විට;

(ඇ) ගනුදෙනුකරුගේ හිමිකම් පෑ අනන්‍යතාවය තහවුරු කිරීමේ දී අතුරු මුහුණතෙන් ලබා ගන්නා ඡායාරූපය සුදුසු වන විට.

(iv) අතුරු මුහුණත හෝ එහි කාර්යක්ෂමතාවය කිසියම් ආකාරයකින් ද්වේෂ සහගත ලෙස හානියට ලක් වී ඇතැයි විශ්වාස කිරීමට මූල්‍ය ආයතනයට/රක්ෂණකරුට සාධාරණ හැඟවීමක් නොමැත.

(ඈ) හිමිකම් පෑ අනන්‍යතාවය ගනුදෙනුකරු සමග සහසම්බන්ධ කිරීම

හිමිකම් පෑ අනන්‍යතාව ගනුදෙනුකරු සමග සහසම්බන්ධ කිරීම සඳහා පහත දැක්වෙන පියවර අනුගමනය කළ යුතුය.

(i) ගනුදෙනුකරුගේ ඡායාරූපය සහ අනෙකුත් ලේඛන ගනුදෙනුකරුගෙන් ලබා ගැනීම

ගනුදෙනුකරුගේ උසස් තත්ත්වයේ නිශ්චල ඡායාරූප[4], හැඳුනුම්පත් ලේඛන සහ ලිපිනය තහවුරු කිරීමේ ලේඛන ලබාගත යුතුය. ශ්‍රී ලංකාවේ නොසිටින ගනුදෙනුකරුවන්ගෙන්, ඔවුන්ගේ ජීව දත්ත අඩංගු විදෙස් ගමන් බලපත්‍රයේ ඡායාරූප, වත්මන් වීසා බලපත්‍රය සහ පිවිසුම් මුද්‍රාව හෝ ඔවුන් සිටින රටට ප්‍රවේශ වීමට අවසර දුන් වෙනත් නිල ලේඛනයක් ලබාගත යුතුය. හැඳුනුම්පත් ලේඛනයේ ඇතුළත් තොරතුරු කියවීමට, එහි සාමාන්‍ය ආරක්ෂක අංග[5] පරීක්ෂා කිරීමට, ගනුදෙනුකරුගේ මුහුණේ සුවිශේෂී ලක්ෂණ හඳුනාගැනීමට සහ ලේඛනයේ කිසිදු වෙනස් කිරීමක් සිදුකර ඇත්දැයි හඳුනා ගැනීමට අදාළ ඡායාරූපය ප්‍රමාණවත් ගුණාත්මකභාවයකින් යුක්ත විය යුතුය. අදාළ ඡායාරූපය ගනුදෙනුකරු සමග මැනවින් සම්බන්ධ වී ඇති උපකරණයක් (උදා ජංගම දුරකථනය) හෝ මූල්‍ය ආයතන/රක්ෂණකරුවන් විසින් මෙහෙයවනු ලබන හෝ ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක වන විශේෂිත උපකරණයකින් (උදා කියොස්ක්ස් උපකරණ) නිසි පරිදි ලබාගත් ඡායාරූපයක් විය යුතුය.

(ii) ගනුදෙනුකරුගේ තත්කාලීන වීඩියෝ ලබා ගැනීම

මූල්‍ය ආයතනයේ/රක්ෂණකරුගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු ගනුදෙනුකරු සමග ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු තත්කාලීන වීඩියෝ[6] සම්මන්ත්‍රණයට සහභාගී විය යුතු අතර මෙම තත්කාලීන වීඩියෝ සම්මන්ත්‍රණය අතරතුර ගනුදෙනුකරුගේ අනන්‍යතා ලේඛන ඔහු/ඇය සන්තකයේ තිබේදැයි යන්න සහ ලිපිනය සනාථ කිරීමේ ලේඛන පිළිබඳව තහවුරු කිරීම කළ යුතුය. ශ්‍රී ලංකාවේ නොසිටින ගනුදෙනුකරුවන් සඳහා ඉහත (i) මගින් ලබාගත් විදේශ ගමන් බලපත්‍ර සහ වීසා දත්ත තහවුරු කරගත යුතුය. ගනුදෙනුකරු විසින් සපයන ලද ඡායාරූපයෙහි වලංගුභාවය ස්ථාපිත කිරීමේ දී සහ ලබා දුන් ගනුදෙනුකාර තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා මූල්‍ය ආයතන/රක්ෂණකරු විසින් තත්කාලීන වීඩියෝ සම්මන්ත්‍රණ ඔස්සේ කරනු ලබන විමසීම්වලට ගනුදෙනුකරු ප්‍රතිචාර දැක්විය යුතුය.

(iii) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ගනුදෙනුකරුගේ ඡායාරූපය ලබා ගැනීම

ගනුදෙනුකරුගේ හිමිකම් පෑ අනන්‍යතාවය සමග සැසඳීමෙන් අනන්‍යතා තොරතුරු සහතික කිරීම හා වලංගු කිරීම සඳහා මූල්‍ය ආයතන විසින් 7 (ආ) ඡේදයෙහි විස්තර කර ඇති විධිවිධානවලට අනුකූලව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද විද්‍යුත් අතුරු මුහුණත භාවිතා කළ යුතුය. මේ සඳහා දැනට භාවිතා කළ හැක්කේ ජාතික හැඳුනුම්පත හා සම්බන්ධ ඡායාරූපය පමණි.

4 උසස් තත්ත්වයේ ගුණාත්මක නිශ්චල ඡායාරූප යන්නෙන් අඟලකම පික්සල/අඟලකම තිත් 300 විභවතාවයකට සමාන හෝ වැඩි අදහස් වේ.

5 සාමාන්‍ය ආරක්ෂක අංග යන්නෙන් අනන්‍යතා ලේඛනය භෞතිකව පරීක්ෂා කිරීමේදී සාමාන්‍යයෙන් දක්නට ලැබෙන අංග අදහස් වේ.

6. ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු තත්කාලීන වීඩියෝ සම්මන්ත්‍රණ යන්නෙන් පික්සල 360 සමාන හෝ වැඩි නියත විභේදනය හෝ අවම රාමු ගිලිහීම අදහස් වේ.

මූල්‍ය ආයතන/රක්ෂණකරුවන් විසින් එක් එක් ගනුදෙනුකරු වෙනුවෙන් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අතුරු මුහුණත භාවිතයෙන් ලබා ගන්නා ලද අනන්‍යතා තොරතුරු පිළිබඳ වාර්තාවක් තබා ගත යුතුය. (උදා: විගණන සටහන්, අනන්‍ය වූ යොමු, හෝ තිර සේයා)

(iv) ගනුදෙනුකරු සමග හිමිකම් පෑ අනන්‍යතාවය සහතික කිරීම.

හිමිකම් පෑ අනන්‍යතාවය ගනුදෙනුකරු සමග සහතික කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රම භාවිතා කළ හැකිය.

1. ඇල්ගොරිතම්කව මූල්‍ය ආයතනයක් විසින් ගනුදෙනුකරුගෙන් සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යන දෙපාර්ශ්වයෙන්ම ලබාගත් දත්ත සහ ඡායාරූප භාවිතයෙන් හිමිකම් පෑ අනන්‍යතාවය ඇල්ගොරිතමාකාරයට තහවුරු කිරීමට අපේක්ෂා කරන්නේ නම් මූල්‍ය බුද්ධි ඒකකයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ "නියාමන පරීක්ෂක අවකාශය" වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්පත සමග ඇති මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේකය සම්පූර්ණ කළ යුතුය. මූල්‍ය ආයතනය/රක්ෂණකරු හා මූල්‍ය බුද්ධි ඒකකය අතර ගිවිසුම්ගත වීමක් මගින් ඉහත ආකාරයට අනුමැතිය ලබා නොගන්නේ නම් මූල්‍ය ආයතනයට/රක්ෂණකරුට හිමිකම් පෑ අනන්‍යතාවය තහවුරු කිරීමට මෙම ක්‍රමය යොදාගත නොහැකිය.

   නියාමන පරීක්ෂක අවකාශ රාමුවට අදාළ අයදුම්පත සහ ලේඛන https://www.cbsl.gov.lk/en/public-notices යන වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. ඕනෑම විමසීමක් හෝ පැහැදිලි කිරීමක් සඳහා 2477542, 2477642 යන දුරකථන මාර්ග ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකි අතර, නැතහොත් sandbox@cbsl.lk වෙත විද්‍යුත් තැපෑලක් යොමු කළ හැකිය.

2. ශ්‍රමික මැදිහත්වීම- මාර්ගෝපදේශ හෝ පූර්වගාමී ලිපි (ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන පරීක්ෂක අවකාශය හරහා ලද) හරහා ඇල්ගොරිතමාකාරයේ සැසඳීම් සඳහා කරන ලද ඉල්ලීම්වලට මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනුමැතිය ලබා නොදෙන සෑම අවස්ථාවකදීම මූල්‍ය ආයතනයේ/රක්ෂණකරුගේ කාර්ය මණ්ඩලයේ සේවක මැදිහත්වීමෙන් තොරතුරු සැසඳීම කළ යුතුය. ඉහළ ප්‍රමිතියකින් යුතුව සාර්ථක ලෙස සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සහතික කිරීමේ ක්‍රමවේදය අවම වශයෙන් මූල්‍ය ආයතන/රක්ෂණකරුවන් විසින් සම්මුඛ ක්‍රමයට අනුගමනය කරන තරමේ දැඩි ක්‍රමවේදයක් විය යුතුය.

3. ඇල්ගොරිතම සහ ශ්‍රමික යන ක්‍රම දෙකේම සංයෝජනයක් භාවිතා කිරීම කළ හැකිය. කෙසේ වෙතත්, මාර්ගෝපදේශයන් හෝ පූර්වගාමී ලිපි මාර්ගයෙන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඇල්ගොරිතම ක්‍රමය භාවිතය සඳහා අනුමැතිය ලබා නොදුනහොත්, එකම නිර්නායකය ලෙස ශ්‍රමික මැදිහත්වීමේ ක්‍රමය යොදාගත යුතුය.

   මූල්‍ය ආයතනයට/රක්ෂණකරුට හිමිකම් පෑ අනන්‍යතාවය සහතික කිරීමට නොහැකි අවස්ථාවල ගනුදෙනුකරු සමග හෝ ඔහු වෙනුවෙන් ව්‍යාපාරික සම්බන්ධතාවයන්ට එළඹීමට මෙම විකල්ප ක්‍රමය භාවිතා නොකළ යුතුය.

8. තනි පුද්ගල ගනුදෙනුකරුගේ ලිපිනය තහවුරු කිරීම

මූල්‍ය ආයතන/රක්ෂණකරු විසින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද විද්‍යුත් අතුරු මුහුණත මගින් ලබා ගන්නා ලද ගනුදෙනුකරුගේ හිමිකම් පෑ අනන්‍යතා දත්ත සමග තනි පුද්ගල ගනුදෙනුකරුගේ ලිපිනය සඳහා බලා තහවුරු කළ යුතුය. ගනුදෙනුකරු විසින් ලබාදෙන ලද ස්ථිර ලිපිනය පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද අතුරු මුහුණත හරහා ලබාගත් ගනුදෙනුකරුගේ ලිපිනය සමඟ වෙනස්වන අවස්ථාවලදී, මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි 27 රීතිය යටතේ ඇති උපලේඛනයේ අයිතම (1)(අ)(අ1)(iii) හෝ රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි 26 හා 41 රීති යටතේ ඇති උපලේඛනයේ අයිතම (1)(අ)(අ1)(iii) හි දක්වා ඇති පරිදි මූල්‍ය ආයතන/රක්ෂණකරුට එකකින් හෝ වැඩි ගණනකින් වෙනත් විද්‍යුත් මූලාශ්‍ර ලබාගත් ස්වාධීන දත්ත හෝ සේවා[7], හෝ ලිපිනය තහවුරු කිරීමේ ලේඛනවල ඉහළ ගුණාත්මක ඡායාරූප ලබා ගැනීම හෝ ලිපිනය තහවුරු කිරීමේ ලේඛනයන් හි විද්‍යුත් ප්‍රකාශ ලබා ගැනීමෙන් ගනුදෙනුකරුගේ ලිපිනය සනාථ කිරීමට පියවර ගත යුතුය.

9. මූල්‍ය ආයතන විසින් සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් ගිණුම් විවෘත කිරීමෙන් හෝ ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීමෙන් වැළකී සිටිය යුතු අවස්ථා.

   අ. සම්මුඛ නොවන ගනුදෙනුකරුවෙකු තමා හඳුනා ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හැර විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය වැනි වෙනත් අනන්‍යතා ලේඛනයක් භාවිතා කරන විට

7 වෙනත් විද්‍යුත් මූලාශ්‍ර එකකින් හෝ වැඩි ගණනකින් ලබාගත් ස්වාධීන දත්ත හෝ සේවා (ලිපිනය තහවුරු කිරීම සඳහා) යන්නෙන් බිල්පත් ගෙවීම සඳහා යොදා ගන්නා නම සමග ලිපිනය සඳහන් වන උපයෝගිතා සේවා සපයන ආයතනවල වෙබ් අඩවි හෝ ජංගම දුරකථන යෙදුම් භාවිතා කිරීම අදහස් වේ.

ආ. ගනුදෙනුකරුගේ උසස් තත්ත්වයේ අන්තර්ක්‍රියාකාරී තත් කාලීන (Real Time) වීඩියෝ ලබා ගත නොහැකි විට

ඇ. ගනුදෙනුකරුගේ අනන්‍යතා ලේඛනවල උසස් තත්ත්වයේ දත්ත සහ නිශ්චල ඡායාරූප ලබා ගත නොහැකි විට

ඈ. ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කරන ලද අනන්‍යතා ලේඛන, හඳුනාගැනීමේ අරමුණ සඳහා තවදුරටත් සුදුසු නොවන තරමට හානිවී හෝ පිරිහී ඇති විට

ඉ. ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කරන ලද අනන්‍යතා ලේඛන වෙනස් කර ඇතැයි හැඟෙන විට, හෝ ලේඛනයේ සාමාන්‍ය ආරක්ෂක විශේෂාංගවල වලංගු බව තහවුරු කළ නොහැකි විට හෝ වෙනත් හේතුවක් නිසා ලේඛනයේ සත්‍යතාව සැකයට බඳුන් වන විට

ඊ. මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් විසින් ස්ථාපිත කර ඇති සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සමඟ මූල්‍ය සම්බන්ධතාවලට එළඹීමේ ක්‍රියාපටිපාටිවල ඕනෑම අංගයක් ගනුදෙනුකරු විසින් ප්‍රතික්ෂේප කරන විට හෝ ඒවාට අනුකූල වීමට නොහැකි වූ විට මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් විසින් ස්ථාපිත කර ඇති සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සමඟ මූල්‍ය සම්බන්ධතාවලට එළඹීමේ ක්‍රියාපටිපාටි සම්පූර්ණ කිරීම සඳහා පාරිභෝගිකයා සහයෝගයෙන් කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් සම්මුඛ නොවන මාදිලිය භාවිතා කර ගනුදෙනුකරු සමඟ මූල්‍ය සම්බන්ධතාවට එළඹිය නොහැක. එවැනි අනුකූල නොවීම් පහත සඳහන් අවස්ථා ඇතුළුව විවිධ ආකාර ගත හැකි නමුත් ඒවාට සීමා නොවේ. ආලෝකය සුදුසු පරිදි සකස් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට නොහැකියාව, ගනුදෙනුකරුගේ මුහුණ පැහැදිලි ලෙස පෙනීමට බාධා වන කිසිවක් ඉවත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට නොහැකියාව, ගනුදෙනුකරුට නිශ්චලව සිටීමට නොහැකි වීම හෝ රූපය ග්‍රහණය කර ගැනීමේ උපකරණය නිශ්චලව පවත්වා ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට නොහැකියාව, මූල්‍ය සම්බන්ධතාවලට එළඹීමේ නිලධාරියා විසින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම ගනුදෙනුකරු ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට නොහැකියාව.

උ. මූල්‍ය ආයතන / රක්ෂණකරුවන්ගේ පද්ධති අසමත් වීම නිසා මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් විසින් ස්ථාපිත කර ඇති සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සමඟ මූල්‍ය සම්බන්ධතාවලට එළඹීමේ ක්‍රියාපටිපාටි සම්පූර්ණ කිරීමට අපොහොසත් වන විට, නිදසුනක් ලෙස, ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹීමේදී භාවිතා කරන වීඩියෝ සහ අනන්‍යතා ලේඛනවල රූප පටිගත කිරීම සහ සුරක්ෂිතව ගබඩා කිරීම.

ඌ. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් හිමිකම් පෑ අනන්‍යතාවය නොපෙන්වන විට.

එ. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ විද්‍යුත් අතුරු මුහුණත හරහා හිමිකම් පෑ අනන්‍යතාවය සඳහා ලබාගත් විස්තර සමඟ ගනුදෙනුකරුගේ හිමිකම් පෑ අනන්‍යතාවය නොගැලපෙන විට

ඒ. සම්මුඛ නොවන ගනුදෙනුකරුවෙකු ඡායාරූපයක් සහිත ජාතික හැඳුනුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවකදී, එය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දත්ත හා ඡායාරූප සමඟ ගැලපෙන නමුත්, අනන්‍යතාවය ඉල්ලා සිටින ගනුදෙනුකරුගේ වර්තමාන පෙනුම සමඟ ධනාත්මකව නොගැලපෙන විට

ඔ. ගනුදෙනුකරුව නිවැරදිව හඳුනා ගැනීම හා අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සහ සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සමඟ මූල්‍ය සම්බන්ධතාවලට එළඹීමේ ස්ථාපිත ක්‍රියාපටිපාටිය සම්පූර්ණ කිරීම සඳහා මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් සතු හැකියාව අඩපණ කිරීමට සම්මුඛ නොවන ගනුදෙනුකරුවෙකු තම පෙනුම හිතාමතාම වෙනස් කර ඇති බවක් පෙනෙන්නට ඇති විට

ඕ. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අනුරූප ඡායාරූප සමඟ ගනුදෙනුකරුගෙන් ලබාගත් ඡායාරූප හා අනන්‍යතා ලේඛන ඉහළ විශ්වසනීයත්වයකින් යුතුව ගැලපීමට නොහැකි වීම හේතුවෙන් ගනුදෙනුකරු හා ඔහුගේ හිමිකම් පෑ අනන්‍යතාව තහවුරු කළ නොහැකි වූ විට

ක. අනන්‍යතාව හෝ වෙනත් ඕනෑම කරුණකට අදාළව ගනුදෙනුකරුගේ හිමිකම් පෑ නිරවද්‍යතාවය සැක කිරීමට මූල්‍ය ආයතනය / රක්ෂණකරුහට හේතු ඇති විට

ග. ගනුදෙනුකරුගේ හැසිරීම හේතුවෙන්, ව්‍යාපාරික සම්බන්ධතා ඇති කර ගැනීමේ දී ගනුදෙනුකරුගේ නෛතික අභිප්‍රායන් හෝ අරමුණු පිළිබඳ සැක කිරීමට මූල්‍ය ආයතනයට / රක්ෂණකරුට හේතු ඇති විට.

ජ. මූල්‍ය ආයතනය / රක්ෂණකරුට ගනුදෙනුකරුගේ වර්තමාන ස්ථානය හඳුනා ගැනීමට නොහැකි වූ විට (උදා: ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) හෝ වෙනත් සුදුසු යාන්ත්‍රණයක් භාවිතා කරමින් ස්ථානය හඳුනා ගැනීමට සහ ගනුදෙනුකරු නේවාසිකයෙකු ද අනේවාසිකයෙකු ද යන්න තීරණය කිරීමට)

ට. මූල්‍ය ආයතනය / රක්ෂණකරුට ලේඛනවල සත්‍යතාව පිළිබඳ ඕනෑම ආකාරයකින් සාධාරණ සැකයක් ඇති විට.

10. ප්‍රතිපත්ති, පුහුණුව, වාර්තා තබා ගැනීම සහ විගණනය

අ. මෙහි විස්තර කර ඇති විකල්ප ක්‍රම අනුගමනය කිරීමට පෙර, මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් විසින් සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ ඔවුන් සමඟ මූල්‍ය සම්බන්ධතාවලට එළඹීම සඳහා පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථාපිත කළ යුතුය.

ආ. මෙහි විස්තර කර ඇති විකල්ප ක්‍රම අනුගමනය කිරීමට පෙර, මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් විසින් සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹෙන නිලධාරීන් සඳහා අවම වශයෙන් ප්‍රවේශ මට්ටමේ පුහුණු වැඩසටහනක් පැවැත්විය යුතු අතර අඛණ්ඩ පුහුණුවක් ද ලබා දිය යුතුය. ගනුදෙනුකාර සම්බන්ධතා සමඟ සෘජුව හෝ වක්‍රව සම්බන්ධිත මෙහෙයුම්වල සාර්ථකත්වය සඳහා එවැනි පුහුණුවක් ප්‍රයෝජනවත් වනු ඇති බවට මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් විසින් අදහස් කරන කරුණු සම්බන්ධයෙන් මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් විසින් ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹීමට අමතරව, වෙනත් කාර්යයන්ට අදාළව ද කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් පුහුණුවක් ලබා දිය යුතුය.

ඇ. මෙහි සඳහන් කර ඇති ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ හා ඔවුන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹීමේ විකල්ප ක්‍රමවලට අනන්‍ය වූ මූල්‍ය ආයතන / රක්ෂණකරුවන්ගේ වාර්තා, වාර්තා තබා ගැනීම සම්බන්ධයෙන් පවතින නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතිවලට සම්පූර්ණයෙන්ම යටත් වන අතර, ඕනෑම ගනුදෙනුකරුවෙක් හඳුනාගැනීමේ සම්පූර්ණ ක්‍රියාවලිය ස්වාධීනව ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර විගණකවරයෙකුට ප්‍රමාණවත් ආකාරයකින් පවත්වා ගත යුතුය. වීඩියෝ පට තබා ගැනීම නිර්දේශ කරනු ලැබේ. ගනුදෙනුකරුගේ අනන්‍යතාවයට අදාළව සැකයක් ඇතිවන අවස්ථාවලදී වීඩියෝ පට තබා ගැනීම අනිවාර්ය වේ.

ඈ. වැඩසටහන්වල කාර්යක්ෂමතාව තීරණය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන අපගමනයන් හඳුනා ගැනීමේ අරමුණින්, මෙහි විස්තර කර ඇති විකල්ප ක්‍රම භාවිතා කරමින් මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් සිදුකරන ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ වැඩසටහන්, මූල්‍ය ආයතන / රක්ෂණකරුවන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වන අභ්‍යන්තර විගණන විෂය පථයට ඇතුළත් කළ යුතුය.

IV වන කොටස - අවදානම් කළමනාකරණය

11. මෙහි විස්තර කර ඇති අනන්‍යතාව තහවුරු කිරීමේ සම්මුඛ නොවන ක්‍රම, ඒවා භාවිතා කිරීමට පෙර, මූල්‍ය ආයතන / රක්ෂණකරුවන්ගේ "අවදානම මත පදනම් වූ ප්‍රවේශය" තුළ සලකා බැලිය යුතුය. සම්මුඛ නොවන ක්‍රමවල බලපෑම පිළිබිඹු වන පරිදි මූල්‍ය ආයතන / රක්ෂණකරුවන්ගේ අවදානම් තක්සේරුව යාවත්කාලීන කළ යුතුය.

12. ගනුදෙනුකරුගේ අවදානම් පැතිකඩ මගින් ඔවුන් හඳුනාගැනීම සඳහා භාවිතා කරන ඕනෑම සම්මුඛ නොවන ක්‍රමයක් පිළිබිඹු විය යුතුය.

13. මූල්‍ය ආයතන / රක්ෂණකරුවන් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියාකිරීමේ රීතිවල දක්වා ඇති අවදානම් කළමනාකරණ පියවරවලට අනුකූලව, මෙහි විස්තර කර ඇති සම්මුඛ නොවන ක්‍රම භාවිතා කර හඳුනාගත් ගනුදෙනුකරුවන් සම්බන්ධ අවදානම් කළමනාකරණය කළ යුතුය.

14. ගනුදෙනුකරු සිටින රටේ පවතින අවදානම් වලට අනුකූලව, ශ්‍රී ලංකාවෙන් පිටත සිටින ගනුදෙනුකරුවන්ගේ අවදානම් කළමනාකරණය කළ යුතුය.

V වන කොටස - සැකකටයුතු ගනුදෙනු වාර්තාකරණය

15. සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹීම සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ගොනු කිරීම අවශ්‍ය දැයි තීරණය කිරීම සඳහා, විශේෂයෙන්ම, සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම ඇතුළත්ව සමස්ත තත්වයන් පිළිබඳ සලකා බැලිය යුතුය.

16. ව්‍යාජ ලෙස පෙනී සිටීම, ලේඛනවල සත්‍යතාව පිළිබඳ සැකයන්, ව්‍යාජ හැඳුනුම්පත් සහ ලිපිනය තහවුරු කිරීමේ ව්‍යාජ ලේඛන, වෙනස් කළ හැඳුනුම්පත් හෝ ලිපිනය තහවුරු කිරීමේ ලේඛන, වෙනස් කළ ඡායාරූප, කොල්ලකෑම (spoofing), සහයෝගය දැක්වීමට හෝ තහවුරු කිරීම සඳහා අමතර තොරතුරු සැපයීමට ඇති අකමැත්ත, සැක සහිත හැසිරීම, සැපයූ තොරතුරුවල විෂමතා වැනි කරුණු එවැනි තත්ත්වවලට ඇතුළත් විය හැකි නමුත් ඊට සීමා නොවේ.

VI වන කොටස - බලාත්මක කිරීම

17. මූල්‍ය ආයතන, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියාකිරීමේ රීතිවල 27 වන රීතියට අදාල උපලේඛනයේ අයිතම (1) (ආ) (i) හා අයිතම (1) (ආ) (ii) සහ රක්ෂණකරුවන්, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියාකිරීමේ රීතිවල 26 හා 41 වන රීතිවලට අදාල උපලේඛනයේ අයිතම (1) (ආ) (i) හා අයිතම (1) (ආ) (ii) බලාත්මක කිරීම සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකය, පහත අවස්ථාවන්හි දී වැලකී සිටිනු ඇත.

අ. මෙහි සඳහන් කර ඇති සම්මුඛ නොවන ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ ක්‍රම විශේෂිත තනි පුද්ගල ගනුදෙනුකරුවකුට අදාළ වන විට;

ආ. මූල්‍ය ආයතනය විසින් මෙම මාර්ගෝපදේශ මුලුමනින්ම අනුගමනය කරන විට; සහ

ඇ. මෙම මාර්ගෝපදේශය බලාත්මකව පවතින තෙක්.

17 අගෝස්තු 2020

අපේ යොමුව : 33/04/012/0011/002

සියලුම සුදුසුකම්ලත් බලපත්‍රලාභී බැංකුවල භාණ්ඩාගාර ප්‍රධානීන් වෙත,

ආනයන වෙළඳ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා මෙහෙයුම් උපදෙස්

ආනයන වෙළඳාමට අදාළ තොරතුරු පිළිබඳ සවිස්තරාත්මක දත්ත සමුදායක් පවත්වාගෙනයාම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම තුළින් විදේශ විනිමය සඳහා ඇති විය හැකි ඉල්ලුම පිළිබඳ පුරෝකථනය කිරීම පහසු කිරීම සඳහා ''ආනයන වෙළඳ තොරතුරු'' පිළිබඳ සතිපතා වාර්තාවක් සියලුම බලපත්‍රලාභී බැංකු විසින් ඉදිරිපත් කළ යුතුය. වර්තමානයේ දී, සියලුම බලපත්‍රලාභී බැංකු ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂකය (Central Integrated Market Monitor - CIMM) හරහා ආනයන සඳහා ''විදේශ විනිමය අවශ්‍යතාව'' (FXR) දෛනිකව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරයි. කෙසේවෙතත්, බලපත්‍රලාභී බැංකු විසින් ඉදිරිපත් කරන ලද බොහෝ තොරතුරු ප්‍රමාණවත් තරම් පුළුල් නොවන අතර ඒවා නැවත සලකා බැලීමේ දී සාවද්‍ය බව සොයාගෙන ඇත. එබැවින්, නිවැරදි හා පුළුල් ආනයන වෙළඳ තොරතුරු පුළුල් පරාසයක් ආවරණය කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 අගෝස්තු 21 දින සිට බලපැවැත්වෙන පරිදි ආනයන වෙළඳාම සම්බන්ධ දත්ත උඩුගත කිරීම සඳහා බැංකු වෙත ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂකයෙහි (CIMM), ආනයන වෙළඳ තොරතුරු (FXM) යනුවෙන් නව අතුරු මුහුණතක් හඳුන්වා දෙනු ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ''ආනයන වෙළඳ තොරතුරු'' ඉදිරිපත් කිරීමේ දී සියලුම බලපත්‍රලාභී බැංකු පහත සඳහන් මෙහෙයුම් උපදෙස් (OI) පිළිපැදිය යුතුය.

01. ඉදිරිපත් කිරීමේ ආකාරය

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි CIMM හරහා තොරතුරු ඉදිරිපත් කළ යුතුය. CIMM හරහා තොරතුරු උඩුගත කිරීමේ මෙහෙයුම් ක්‍රියා පටිපාටි පහත පරිදි වේ.

- CIMM අතුරු මුහුණතේ දක්වා ඇති ආකෘතියට අනුකූලව text ගොනුවක් (.txt) හරහා තොරතුරු උඩුගත කළ යුතුය (excel ගොනුවක් text ගොනුවක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය CIMM හි FXM මොඩියුලය යටතේ ලබා දී ඇත).
- සටහන් 5,000 ඉක්මවන විශාල දත්ත ඉදිරිපත් කිරීමේ දී, බලපත්‍රලාභී බැංකු විසින් CIMM වෙත ගොනු කිහිපයක් වශයෙන් උඩුගත කළ යුතුය.
- ''ශූන්‍ය'' වාර්තා ඇතුළුව සියලුම වාර්තා, CIMM හි FXM මොඩියුලයේ බලයලත් පරිශීලකයා විසින් අනුමත කළ යුතුය.

02. ඉදිරිපත් කිරීමේ වාර ගණන

සෑම සතියකම අවසාන වැඩ කරන දිනයේ දහවල් 12ට හෝ ඊට පෙර සතිපතා පදනම මත.

03. අවශ්‍ය තොරතුරු

ගෙවිය යුතු ආනයන වෙළඳ පහසුකම් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. එනම්, සෑම සතියකම අවසාන වැඩ කරන දිනට පෙර දිනය අවසන් වන විට පවතින ගෙවිය යුතු ආනයන වෙළඳ පහසුකම් පිළිබඳවයි. වාර්තා කිරීමට ගෙවිය යුතු ආනයන වෙළඳ පහසුකමක් බැංකුව සතුව නොමැතිනම් 'ශූන්‍ය' වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

නිදසුනක් ලෙස, 2020 අගෝස්තු 20 වන දින අවසන් වන විට ගෙවිය යුතුව ඇති ආනයන වෙළඳ පහසුකම් පිළිබඳ විස්තර 2020 අගෝස්තු 21 දින දහවල් 12ට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

04. ආනයන වෙළඳ තොරතුරු වාර්තාවේ දත්ත ක්ෂේත්‍රවල අර්ථ දැක්වීම්

(i) A තීරුව - ''පහසුකම් වර්ගය''

පහත සඳහන් ලැයිස්තුවෙන් තෝරාගත් කේතයක් ලෙස පහසුකම් වර්ග ඇතුළත් කළ යුතුය.

LC(U)	ණයවර ලිපිය : භාවිතය
LC(S)	ණයවර ලිපිය : දුටු වන
DP	ලියවිලි එරෙහිව ගෙවීම්
DA	ලියවිලි එරෙහිව පිළිගැනීම
AP	අත්තිකාරම් ගෙවීම්
OA	විවට ගිණුම
CO	තොග
OT	වෙනත්

නිදසුනක් ලෙස ''අත්තිකාරම් ගෙවීම්'' පහසුකම සඳහා "AP" කේතය ඇතුළත් කළ යුතුය.

(ii) B තීරුව - ''පහසුකම හඳුනාගැනීමේ අංකය''

''පහසුකම හඳුනාගැනීමේ අංකය'' යනු එක් එක් පහසුකම සඳහා අනන්‍ය හඳුනාගැනීමේ යොමුවයි.

(iii) C තීරුව - ''අයදුම්කරුගේ නම''

පාරිභෝගිකයාගේ නම (තනි පුද්ගල හෝ සංස්ථාපිත)

(iv) D තීරුව - ''පහසුකම නිකුත් කරන දිනය''

මෙය වසර-මාසය-දිනය ආකෘතියෙන් විය යුතුය.

නිදසුනක් ලෙස, 2020 ජූලි 24 වන දින පහසුකමක් විවෘත කරන්නේ නම්, FXM වාර්තාවේ දිනය 2020-07-24 විය යුතුය.

(v) E තීරුව - ''පහසුකම කල් ඉකුත් වීමේ දිනය''

මෙය ගනුදෙනුකරු වෙනුවෙන් විදේශ මුදල් ගෙවීමට බැංකුව අදහස් කරන දිනයට කලින් තීරණය කරන ලද කල් ඉකුත් වීමේ දිනයකි. මෙය වසර-මාසය-දිනය ආකෘතියෙන් විය යුතුය.

නිදසුනක් ලෙස, 2020 සැප්තැම්බර් 30 වන දින පහසුකමක් කල් ඉකුත්වීමට නම්, FXM වාර්තාවේ දිනය 2020-09-30 විය යුතුය.

(vi) F තීරුව - ''පළමු ගෙවීම් දිනය''

පහසුකම සඳහා කලින් තීරණය කරන ලද කල් ඉකුත්වීමේ දිනයක් නොමැති නම්, එම පහසුකම විදේශ මුදල් ගෙවීම සඳහා ආසන්නතම ගෙවීම් දිනය තක්සේරු කර බැංකුවට එම දිනය ඇතුළත් කළ හැකිය. මෙය වසර-මාසය-දිනය ආකෘතියෙන් විය යුතුය.

නිදසුනක් ලෙස, 2020 සැප්තැම්බර් 30 වන දින පහසුකමක් පියවීමට අපේක්ෂා කරන්නේ නම්, FXM වාර්තාවේ දිනය 2020-09-30 විය යුතුය.

(vii) G තීරුව - "වාර්තා කරන දිනට පෙර දිනය අවසන් වන විට පහසුකමේ ගෙවිය යුතු ශේෂය එක්සත් ජනපද ඩොලර් වලින්"

සෑම සතියකම අවසාන වැඩ කරන දිනට පෙර දිනය අවසන් වන විට පහසුකම්වල ගෙවිය යුතු ශේෂය එක්සත් ජනපද ඩොලර්වලින් වාර්තා කළ යුතුය. එ.ජ. ඩොලර් හැර වෙනත් විදේශ මුදලකින් පහසුකම ඇත්නම්, හිඟ ශේෂය සුදුසු යොමු විනිමය අනුපාතයක් භාවිතා කරමින් එ.ජ. ඩොලර් වලට පරිවර්තනය කර ගත යුතුය. එම එක්සත් ජනපද ඩොලර්වලින් දශම ස්ථාන දෙකක් දක්වා සඳහන් කළ යුතුය.

නිදසුනක් ලෙස, 2020 අගෝස්තු 21න් අවසන් වන වාර්තාකරණ සතිය සඳහා, 2020 අගෝස්තු 20 අවසන් වන විට ඇති පහසුකමෙහි ශේෂය වාර්තා කළ යුතුය.

(viii) H තීරුව - ''භාණ්ඩ හා සේවා විස්තරය''

මෙම මෙහෙයුම් උපදෙස් වල ඇමුණුම I අනුව කාණ්ඩ හා ලැයිස්තුවෙන් තෝරාගත් අංකයක් ලෙස භාණ්ඩ හා සේවා විස්තර ඇතුලත් කළ යුතුය.

නිදසුනක් ලෙස, ''ආහාර හා පාන වර්ග'' සඳහා අංක ''1'' ඇතුළත් කළ යුතුය.

(ix) I තීරුව - ''වෙනත් කාණ්ඩවල විස්තර''

''භාණ්ඩ හා සේවා විස්තරය'' (H තීරුව) යටතේ ''වෙනත්'' තෝරාගෙන තිබේනම් පහසුකමෙහි ස්වභාවය විග්‍රහ කිරීම සඳහා ''වෙනත් කාණ්ඩවල විස්තර'' යටතේ කෙටි විස්තරයක් සැපයිය යුතුය.

නිදසුනක් ලෙස, පාරිභෝගිකයා ක්‍රියාත්මක වන කර්මාන්තය හෝ ආනයනය කරන ලද භාණ්ඩ හෝ සේවාවල ස්වභාවය විස්තරය ලෙස දැක්විය හැකිය.

05. ආනයන වෙළඳ තොරතුරු සඳහා CIMM පද්ධතියේ පරිශීලක කාණ්ඩ

"FXR_P_ENTRY" සහ "FXR_P_APPROVE" පවරා ඇති FXR මොඩියුලයේ දැනට සිටින පරිශීලකයින් FXM මොඩියුලයේ ද පිළිවෙළින් ඇතුළත් කිරීමේ සහ අනුමත කිරීමේ භූමිකාවන් කරනු ඇත. එබැවින්, FXM මොඩියුලය සඳහා නව පරිශීලකයින් සඳහා අක්තපත්‍ර ඉදිරිපත් කිරීම බලපත්‍රලාභී බැංකුවලට අනිවාර්ය නොවේ. කෙසේවෙතත්, නව පරිශීලකයින් නිර්මාණය කිරීමට අවශ්‍ය නම් බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉල්ලීම් කළ යුතුය.

06. ආනයන වෙළඳ තොරතුරු වාර්තාව (FXM) ඉදිරිපත් කළ යුතු දිනය සහ දෛනික විදේශ විනිමය අවශ්‍යතා (FXR) අඛණ්ඩව උඩුගත කිරීම

සියලුම බලපත්‍රලාභී බැංකු විසින් 2020 අගෝස්තු 21 දින සිට බලපැවැත්වෙන පරිදි FXM ඉදිරිපත් කළ යුතුය. කෙසේවෙතත්, බැංකු විසින් දෛනික විදේශ විනිමය අවශ්‍යතා (FXR) ගොනුව, අනාගතයේ දී, එය අවසන් කිරීමට දැනුම් දෙනතුරු දැනට පවත්නා මාර්ගෝපදේශයන්ට අනුව CIMM වෙත උඩුගත කළ යුතුය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය නම්, (0112398715) ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජයතු පෙරේරා මහතා හෝ (0112398711) ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂිකා චේතනා ප්‍රදීනාන්දු මහත්මිය අමතන්න. නැතිනම් විද්‍යුත් තැපෑල dfx@cbsl.lk ඔස්සේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ අංශය, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරන්න.

දිමුතු සමරතුංග
අධ්‍යක්ෂ - ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 සැප්තැම්බර් 23

අපේ යොමු අංකය : 33/04/012/0011/002

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම් ක්‍රමය - IIS" පිළිබඳ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා මෙහෙයුම් උපදෙස්

1. අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම් ක්‍රමය IIS යෝජනා ක්‍රමය හඳුන්වාදීම

   රටට නව විදේශ විනිමය ගලා ඒම් දිරිගැන්වීම සඳහා අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම් ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් වසරකට වැඩි හා වසර දෙකකට නොවැඩි එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. මුදල් මිලදී ගැනීම-විකිණීම හුවමාරු ගිවිසුම් ක්‍රමය, බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පිරිනැමීමට තීරණය කර ඇත. IIS යෝජනා ක්‍රමය ඉදිරිපත් කිරීමේ පරමාර්ථය වන්නේ අභ්‍යන්තර ආයෝජන ගිණුම (IIA) හරහා යොමු කරනු ලබන විදේශ මුදල් ගලා ඒම සම්බන්ධ විදේශ විනිමය අවදානම වළක්වා ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පහසුකම් සැලසීමයි.

2. ඒ අනුව, මෙම මෙහෙයුම් උපදෙස් පිළිපදිමින් ''IIS යෝජනා ක්‍රමය'' යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ හුවමාරු ගිවිසුම් වලට (SWAP) එළඹීමට බලපත්‍රලාභී වාණිජ බැංකු වලට ආරාධනා කෙරේ.

3. IIS යෝජනා ක්‍රමයේ ප්‍රධාන පරාමිතීන් පහත වගුවේ දක්වා ඇත.

''අ'' වගුව IIS යෝජනා ක්‍රමයේ ප්‍රධාන පරාමිතීන්

3.1	පාර්ශවයන්	ශ්‍රී ලංකා මහ බැංකුව එදිරිව තනි බලපත්‍රලාභී වාණිජ බැංකු
3.2	සුදුසුකම්ලත් ආයෝජකයින්	අභ්‍යන්තර ආයෝජන ගිණුම (IIA) ක්‍රියාත්මක කිරීමට සුදුසුකම් ඇති අනේවාසික ආයෝජකයින්
3.3	අදාළතාවය	2020.09.23 දින සිට බලපැවැත්වෙන පරිදි IIA හරහා රට තුළට ගලා එන නව විදේශ මුදල්
3.4	ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්නා හුවමාරු ගිවිසුම් කාලසීමාව	වසරකට වඩා වැඩි සහ වසර දෙකක් දක්වා
3.5	අවම ගනුදෙනු ප්‍රමාණය	අනේවාසික ආයෝජකයෙකුට, එ.ජ. ඩො. මිලියන 25
3.6	ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු අතර මිලකරණ යාන්ත්‍රණය	ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු අතර හුවමාරු ගිවිසුම්හි වලංගු වන හා පරිණත වන දිනයන්හි එකම විනිමය අනුපාතය ගැනීම (එනම් ශූන්‍ය පිරිවැය හුවමාරු ගිවිසුම්)

4. IIS යෝජනා ක්‍රමයේ කොන්දේසි පහත වගුවේ දක්වා ඇත.

''ආ'' වගුව IIS යෝජනා ක්‍රමයේ කොන්දේසි

4.1	ලබා ගැනීමේ හැකියාව	අනේවාසික ආයෝජකයෙකු සමඟ හුවමාරු ගිවිසුම් ගනුදෙනුවකට එළඹීමට පෙර, IIS යෝජනා ක්‍රමය යටතේ ඇති සීමාවන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව (IOD) සමඟ පරීක්ෂා කළ යුතුය.
4.2	අරමුදල් ප්‍රභව ප්‍රකාශනය	ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගනුදෙනුවකට එළඹීමට පෙර බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් අරමුදල් ප්‍රභවය, යටත් වන ගනුදෙනුව/ගනුදෙනු සහ අදාළ අනේවාසික ආයෝජකයාගේ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හෙළි කළ යුතුය.
4.3	උපරිම හුවමාරු ගිවිසුම් වාරික අය කිරීම	බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අනේවාසික ආයෝජකයෙකුගෙන් හුවමාරු ගිවිසුම් වාරිකයක් ලෙස ආයෝජන වටිනාකමෙන් උපරිම 0.10%ක් අය කළ හැකිය.
4.4	පූර්ව පරිණත හුවමාරු ගිවිසුම් ඉවත් කිරීම	■ IIS යෝජනා ක්‍රමය යටතේ පූර්ව පරිණත හුවමාරු ගිවිසුම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දිරිමත් නොකරයි. ■ කෙසේවෙතත්, නොවැළැක්විය හැකි තත්ත්වයක් තුළ, අනේවාසික ආයෝජකයෙකු IIS පූර්ව පරිණත නොවීම සඳහා ඉල්ලීමක් කරන්නේ නම්, ඊට ප්‍රතිවිරුද්ධව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ හුවමාරු ගිවිසුම අවසන් කළ යුතුය. ■ එවැනි තත්ත්වයක් තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු අතර පියවීම සඳහා අදාළ වන පියවීමේ විනිමය අනුපාතය පහත පරිදි වේ. (i) පවත්නා එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතය එකඟ වූ පියවීමේ අනුපාතයට වඩා වැඩි නම් (එනම් ශ්‍රී.ලං.රු. අවප්‍රමාණය වී ඇත), සංශෝධිත පියවීමේ විනිමය අනුපාතය පවත්නා නිරූපිත එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතය ** සහ දඩ මුදල විය යුතුය. (ii) පවත්නා එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතය එකඟ වූ පියවීමේ විනිමය අනුපාතයට වඩා අඩු නම් (එනම් ශ්‍රී.ලං.රු. අධිප්‍රමාණය වී ඇත), සංශෝධිත පියවීමේ විනිමය අනුපාතය ආසන්නතම එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතය සහ දඩ මුදල විය යුතුය. ■ එකඟ වූ එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. ''පියවීමේ විනිමය අනුපාතයට'', ''දඩ මුදල'' 2%ක් විය යුතුය.

** පවත්නා එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතය යනු එදිනම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ''නිරූපිත එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතය'' වේ.

5. ඉහත හුවමාරු ගිවිසුම් ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ නිරාකරණය කිරීමේ දී සම්මත බේරුම්කරණ ක්‍රියාපටිපාටිය අනුගමනය කරන ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ඉල්ලා සිටී.

6. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අදාළ උපදෙස්වලට ද අනුකූල වන ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ඉල්ලා සිටී.

7. පූර්ව දැනුම්දීමකින් තොරව IIS යෝජනා ක්‍රමය ඉවත්කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට අයිතියක් ඇත.

8. වැඩි විස්තර සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව 0112398715 හා 0112477084 අමතන්න.

අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 ඔක්තෝබර් 23

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

''අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම්'' ක්‍රමය පිළිබඳ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

මෙය 2020 සැප්තැම්බර් 23 දින නිකුත් කරන ලද ''අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම්'' ක්‍රමය පිළිබඳ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන මෙහෙයුම් උපදෙස් 33/04/012/0011/002ට අදාළවය. ඉහත ක්‍රමය යටතේ පරිණතවන දිනයට පෙර හුවමාරු ගිවිසුම් පරිණත කිරීමක දී අදාළ වන එකඟ වූ එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. පියවීම් විනිමය අනුපාතයෙන් 2.00% වූ දඩ මුදල 0.25% ක් දක්වා අඩු කරන ලද අතර 2020 ඔක්තෝම්බර් 23 දින සිට එය බලපැවැත්වේ. තවද, මීට පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් (33/03/012/0011/002) වලට අදාළ අනෙකුත් පරාමිතීන් සහ කොන්දේසි තවදුරටත් නොවෙනස්ව පවතී.

වැඩි විස්තර සඳහා 0761754680, 0112398715 සහ 0112477084 යන දුරකථන අංක හරහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අමතන්න.

අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 නොවැම්බර් 27

අපේ යොමුව : 33/04/012/0011/002

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ භාණ්ඩාගාර ප්‍රධානීන් වෙත :

ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂකය (Central Integrated Market Monitor - CIMM) හරහා දෛනික ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණ වාර්තාව (NOP) ඉදිරිපත් කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්

2020 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (මින් මතු බැංකු ලෙස හඳුන්වන) සඳහා දෛනික ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණ වාර්තාව (NOP) ඉදිරිපත් කිරීමට ''දෛනික ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණ වාර්තාව ඇතුළත් කරන්න'' නමින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂකය (CIMM) පද්ධතියේ නව වාර්තාකරණ අතුරු මුහුණතක් හඳුන්වාදෙනු ඇත. මෙම නව අතුරු මුහුණත හඳුන්වාදීමේ අරමුණ වන්නේ බැංකු විසින් දෛනිකව NOP වාර්තා කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන අතරම ශ්‍රී ලංකා මහ බැංකුවේ ඵලදායී දේශීය විදේශ විනිමය වෙළඳපොළ අධීක්ෂණ යාන්ත්‍රණයට පහසුකම් සැපයීම වේ. ඒ අනුව, නව අතුරු මුහුණත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2014 මැයි 30 දින නිකුත් කරන ලද ''බලපත්‍රලාභී වාණිජ බැංකුවල දෛනික ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණ වාර්තාව සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන උපදෙස්'' හි පරිච්ඡේද 3.1ට අනුකූලව මයික්‍රොසොෆ්ට් එක්සෙල් (MS Excel) වාර්තාකරණ ආකෘතිය මගින් dfx@cbsl.lk වෙත විද්‍යුත් තැපෑල හරහා NOP ඉදිරිපත් කිරීමේ දැනට පවතින යාන්ත්‍රණය ප්‍රතිස්ථාපනය කරනු ඇත. එසේ වුව ද, 2014 මැයි 30 දිනැති ඉහත උපදෙස් සමඟ නිකුත් කරන ලද අනෙකුත් අවශ්‍යතා සහ වාර්තාකරණ ආකෘතිය තව රටත් නොවෙනස්ව පවතී.

ඒ අනුව, සියලුම බැංකු CIMM හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට දෛනිකව NOP ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් මෙහෙයුම් උපදෙස්වලට අනුගත විය යුතු වේ.

1. සෑම බැංකුවක් විසින්ම පෙර වැඩකරන දිනයේ දෛනික NOP වාර්තාව ''ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය ඇතුළත් කරන්න'' අතුරු මුහුණත හරහා CIMM වෙත ඇතුළත් කළ යුතු අතර තත්කාලීන දින පෙ.ව. 8.30ට පෙර එය එහි අනුමත කළ යුතුය.
2. ද්විත්ව නිරීක්ෂණ ක්‍රමවේදය (Four Eyes) අනුගමනය කිරීමෙන් නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා දෛනික NOP වාර්තා ඇතුළත් කිරීම සහ අනුමත කිරීම සඳහා සෑම බැංකුවකම CIMM හි වෙනම පරිශීලක භූමිකාවක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා අවශ්‍ය පරිශීලක ගිණුම් CIMM හි නිර්මාණය කරගැනීමේ පූර්ණ වගකීම එක් එක් බැංකුව සතුය. මේ සම්බන්ධයෙන් නව පරිශීලක ගිණුම් නිර්මාණය කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා බැංකු විසින් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය.
3. මීට පෙර ඉදිරිපත් කරන ලද NOP වාර්තාවට කිසියම් සංශෝධනයක් කිරීමට යම් බැංකුවකට අවශ්‍ය නම්,

(i) එවැනි බැංකුවක් 0112477595/0761754680 යන දුරකථන අංක හරහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවෙහි දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ අංශයට දැනුම් දිය යුතු අතර dfx@cbsl.lk වෙත විද්‍යුත් තැපෑලක් මගින් සංශෝධනය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සහිතව ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

(ii) එම බැංකුව විසින් CIMM වෙත ඉදිරිපත් කරන ලද NOP වාර්තාව, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආපසු හරවා යැවීමෙන් පසු, එම බැංකුව විසින් CIMM හි නිවැරදි NOP වාර්තාව නැවත ඇතුළත් කර අනුමත කළ යුතු අතර වහාම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිය යුතුය.

4. නියමිත කාල සීමාව තුළ යම් බැංකුවකට CIMM හරහා දෛනික NOP වාර්තාව ඉදිරිපත් කිරීමට ස්වකීය පාලනයෙන් බැහැර වූ හේතු මත නොහැකි වේ නම්, එවැනි බැංකුවක් තාවකාලිකව ඉහත දක්වා ඇති කාල රාමුවට අනුකූලව දෛනික NOP වාර්තාව විද්‍යුත් තැපෑලෙන් dfx@cbsl.lk වෙත හෝ ෆැක්ස් (0112346282) හරහා ඉදිරිපත් කළ යුතුය. කෙසේවෙතත්, එවැනි බැංකුවක් එයම හැකි ඉක්මනින් CIMM හරහා ද ඉදිරිපත් කළ යුතුය.

5. සෑම විටම NOP හි වාර්තා වී ඇති තොරතුරුවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සහ සහතික කිරීම සඳහා සියලු බැංකු අවශ්‍ය වන අතර සපයනු ලබන තොරතුරුවල පරම වගකීම අදාළ බැංකු හා ඊට සම්බන්ධ පරිශීලකයින්ගේ කළමනාකරණය මත වේ.

6. CIMM හරහා දෛනික NOP ඉදිරිපත් කිරීමේ නව යාන්ත්‍රණය 2020 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, දැනට පවතින දෛනික NOP ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණය ද 2020 දෙසැම්බර් 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා මසක කාලයක් එක්සෙල් ආකෘතියෙන් විද්‍යුත් තැපෑල හරහා dfx@cbsl.lk වෙත අඛණ්ඩව ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, 0112398714 / 0712655620 හරහා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ චතුරි දොඩංගොඩ මහත්මිය හෝ 0112477084 / 0777418636 අංක හරහා සහකාර අධ්‍යක්ෂ ඉසුරු නානායක්කාර මහතා හෝ dfx@cbsl.lk විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබා ගත හැකිය.

දිමුතු සමරතුංග
අධ්‍යක්ෂ - ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 දෙසැම්බර් 22

අපේ යොමුව : 33/04/012/0011/004

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

අභ්‍යන්තර සේවක ප්‍රේෂණ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා මෙහෙයුම් උපදෙස්

රට තුළට විධිමත් මාර්ග ඔස්සේ අරමුදල් ප්‍රවේශය සඳහා සේවක ප්‍රේෂණ කිරීම වඩ වඩාත් දිරිගැන්වීමේ අරමුණින්, 2021 අයවැය මගින් ශ්‍රී ලංකාවේ බැංකුවලට විදේශගත ශ්‍රමිකයන් විසින් එවන ලද විදේශ විනිමය ප්‍රේෂණයන් සඳහා වන සාමාන්‍ය විනිමය අනුපාතය අභිබවා ඩොලරයකට රු. 2ක් වශයෙන් ගෙවීමට යෝජිතය (යාන්ත්‍රණය). එවැනි දිරිගැන්වීම්වල ප්‍රතිලාභ කම්කරුවන්ට සහ/හෝ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ට මිස එම සේවක ප්‍රේෂණ රට තුළට ගෙන ඒමේ ක්‍රියාවලියට සම්බන්ධ අතරමැදියන් වෙත ලබා නොදෙනු ඇතැයි අපේක්ෂා කරයි.

ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු එම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් මෙහෙයුම් උපදෙස්වලට අනුගත වීමට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

1. අයදුම් කිරීමේ විෂය පථය

රට තුළට ගලා එන සේවක ප්‍රේෂණ එකතු කිරීම හා බෙදා හැරීමෙහි යෙදී සිටින සියලුම බලපත්‍රලාභී බැංකුවලට අදාළ වේ.

2. දිරිදීමනාව සඳහා සුදුසුකම් ලබන ප්‍රේෂණ

(i) 2020.12.28 වන දින සිට බලපැවැත්වෙන පරිදි විදේශයක සේවය කරන/කළ ශ්‍රී ලාංකිකයෙකු විසින් රැකියාවක් මගින් උපයා ඇති විදේශ මුදල් ආදායම ප්‍රේෂණය කරන සහ රුපියල්වලට පරිවර්තනය කරන එක්සත් ජනපද ඩොලරයකට අතිරේකව ශ්‍රී ලංකා රුපියල් 2.00ක් ලැබීමට සුදුසුකම් ලබයි.

(ii) ඒ අනුව, දිරිදීමනා සඳහා සුදුසුකම් ලැබිය යුතු ප්‍රේෂණ හඳුනාගැනීම සඳහා සියලුම බලපත්‍රලාභී බැංකු විසින් සවිස්තරාත්මක යථායෝගී ක්‍රියාපටිපාටි සහ අභ්‍යන්තර පාලනයන් පවත්වා ගෙන යායුතුය.

සේවක ප්‍රේෂණ ගලා ඒමේ විධිමත් නාලිකා සහ එක්සත් ජනපද ඩොලරයකට අතිරේකව ශ්‍රී ලංකා රුපියල් 2.00ක් ගෙවීමේ අවස්ථා (මින් ඉදිරියට ''දිරි දීමනා'' ලෙස හැඳින්වෙන) පහත වගුව 01 මගින් දැක්වේ.

වගුව 01: - සේවක ප්‍රේෂණ ගලා ඒමේ විධිමත් නාලිකා සහ දිරි දීමනා ගෙවන අවස්ථා

ප්‍රේෂණ නාලිකාව	දිරි දීමනා ගෙවීමේ අවස්ථාව
(අ) පුද්ගලික විදේශ මුදල් ගිණුම් වෙත සෘජුව අරමුදල් මාරු කිරීම	පුද්ගලික විදේශ මුදල් ගිණුම් වෙත විදේශ මුදල් ප්‍රමාණය හර කර ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ විට පරිවර්තනය කරන ලද ශ්‍රී ලංකා රුපියල් මුදල බිල්පත්, ණය වැනි කාර්යයන් සඳහා ආයතනයකට ගෙවීම සඳහා යොදා ගන්නේ නම්, බලපත්‍රලාභී බැංකු විසින් එක්සත් ජනපද ඩොලරයක් සඳහා වන රු.2.00ක දිරි දීමනාව එයට හැඩගස්වමින් පුද්ගලික විදේශ මුදල් ගිණුම වෙත එම අඩු විදේශ මුදල් ප්‍රමාණයකින් හර කළ යුතුය.
(ආ) විදේශ මුදල් නෝට්ටු පරිවර්තනය	විදේශ මුදල් නෝට්ටු ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන විට
(ඇ) අතරමැදියන් *	ගනුදෙනුකරු සහ/හෝ ප්‍රතිලාභියෙකු ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් සිදු කරන විට බලපත්‍රලාභී බැංකු විසින් දිරිදීමනාව ගෙවීම් සහ වාර්තා කිරීම කළ යුතු අතර එහි දී පාරිභෝගිකයෙකුට සහ/හෝ ප්‍රතිලාභියෙකුට කවුන්ටරය හරහා හෝ ගිණුමකට බැර කිරීමෙන් ශ්‍රී ලංකා රුපියල් ලැබිය යුතුය.

* අතරමැදියෙකු හරහා ශ්‍රී ලංකා රුපියල්වලින් සේවක ප්‍රේෂණ යවන විට, එක් එක් ගනුදෙනුකරුගේ සහ/හෝ ප්‍රතිලාභියාගේ ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණ එක්සත් ජනපද ඩොලර් බවට පරිවර්තනය කළ යුත්තේ පෙර වැඩ කරන දින අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ''එ.ජ.ඩො. /ශ්‍රී.ලං.රු මධ්‍ය විනිමය අනුපාතය (එහි දශම ස්ථාන දෙකක් දක්වා වටයන ලද)'' භාවිතා කළ යුතු අතර සහ එසේ පරිවර්තනය කරන ලද එක්සත් ජනපද ඩොලර් මුදල් (එහි දශම ස්ථාන දෙකක් දක්වා වටයන ලද) පදනම් කරගෙන එම දිරි දීමනාව ගණනය කර ගෙවිය යුතුය. ''එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. මධ්‍ය විනිමය අනුපාතය'' ලබා ගත යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ටෙලිග්‍රැෆික් හුවමාරු සඳහා වූ එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. සාමාන්‍ය ගැණුම් සහ විකුණුම් විනිමය අනුපාත තුළිනි.

4. එක්සත් ජනපද ඩොලර් හැර වෙනත් විදේශ මුදල්වලින් පවතින ප්‍රේෂණ සඳහා දිරි දීමනා ගෙවීම

   බලපත්‍රලාභී බැංකු විසින් එක්සත් ජනපද ඩොලර් හැර වෙනත් විදේශ මුදල්වලින් පවත්නා සේවක ප්‍රේෂණ (දශම ස්ථාන දෙකක් දක්වා වටයන ලද) සඳහා දිරි දීමනාව ගණනය කර ගෙවීමේ දී පෙර වැඩ කරන දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පවත්නා නිරූපිත විනිමය අනුපාතය භාවිතා කළ යුතුය. එසේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත විනිමය අනුපාතයක් නොමැති විට, බලපත්‍රලාභී බැංකු විසින් සුදුසු පරාවර්තක විනිමය අනුපාතයක් භාවිතා කළ යුතුය.

   එබැවින් ව්‍යුත්පන්න එක්සත් ජනපද ඩොලර් ප්‍රමාණය විය යුත්තේ, (වෙනත් මුදල් ප්‍රමාණය ''වෙනත් මුදල් / ශ්‍රී.ලං.රු. නිරූපිත හෝ පරාවර්තක විනිමය අනුපාතය) එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. මධ්‍ය විනිමය අනුපාතය ඉහත 3 වන වගන්තියේ දක්වා ඇති පරිදි,

5. දිරි දීමනා ගෙවීම ගිණුම්කරණය සහ වාර්තා කිරීම

   (i) බලපත්‍රලාභී බැංකු විසින් වෙනම ලැබිය යුතු ගිණුමක ගෙවන ලද දිරි දීමනාවලට සම්බන්ධයෙන් ගෙවීම් සඳහා අවශ්‍ය වන සියලුම ලියකියවිලි ද සහිතව වෙනම ගිණුම් පවත්වාගෙන යෑම අවශ්‍ය වේ.

   (ii) එක් එක් කාර්තුව අවසන් වී දින 15ක් ඇතුළත, භාණ්ඩාගාරයෙන් ප්‍රතිපරණය සැලසීම සඳහා කාර්තුව තුළ ගෙවන ලද දිරි දීමනා පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට (ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට පිටපතක් ද සහිතව) ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් සපයන ලද ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතුය.

5. වැඩි විස්තර සඳහා 0112398711, 0112477595 හෝ 0761754680 යන දුරකථන අංක ඇමතිය හැකිය.

දේශමාන්‍ය ආචාර්ය ඩබ්.ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය : 08/25/001/0005/001 2020 දෙසැම්බර් 09

මාර්ගෝපදේශ අංකය : SSSS/02/2020

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් වෙත,

ද්විතීයික වෙළඳ පොළ ගනුදෙනු තොරතුරු වාර්තා කිරීම සහ නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතියට සුරැකුම්පත් පියවීමේ උපදෙස් එවීම සඳහා වන මාර්ගෝපදේශයන්

1. ලංකාසෙකුෘ පද්ධතිය තුළ රජයේ සුරැකුම්පත් ගනුදෙනුවල තොරතුරු වාර්තා කිරීමේ දී එහි නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින්, දැනට බලපැවැත්වෙන ගනුදෙනු වාර්තා කිරීමේ ක්‍රමවේදයන් සවි ගැන්වීමට සහ ලංකාසෙට්ල් ගනුදෙනු වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටිය වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර තිබේ.
2. ඒ අනුව, සියලුම සහභාගිකරුවන් ලංකාසෙකුෘ පද්ධතිය තුළ ගනුදෙනු වාර්තා කිරීමේ දී මෙම මාර්ගෝපදේශයන්හි නියම කර ඇති පරිදි,

   a). ගනුදෙනු යොමු අංක ආකෘතියට (TRN) සහ

   b). ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවල මුල් ගනුදෙනුව සහ ඒ හා සම්බන්ධ වන අනෙකුත් සුරැකුම්පත් සංචලනයන් (ප්‍රතිෂ්ඨාපනය/ආදේශනය/ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල වටිනාකම වෙනස් කිරීම්[1]) සඳහා වන අමතර උපදෙස් වලට අනුගත විය යුතු වේ.
3. **ඇමුණුම් අංක 01** මඟින් ගනුදෙනු යොමු අංකය සඳහා උපදෙස් සැපයේ.
4. අමතර උපදෙස් විශේෂයෙන්ම පහත අයිතම වාර්තා කිරීමට අදාළව සපයා ඇත.
   - එවන්නාගේ පණිවිඩ යොමුව
   - ගනුදෙනුව සිදු වූ දිනය **(2021.01.01 සිට සැපයුම අනිවාර්ය වේ)**
   - මිල **(සැපයුම අනිවාර්ය වේ)**
   - ඵලදා අනුපාතිකය **(සැපයුම අනිවාර්ය වේ)**
   - ප්‍රමාණය (මුහුණත අගය)
   - සුරැකුම්පත් ලබාදුන් සහ ලබා ගත් ගිණුම්
   - පියවීමේ අගය **(සැපයුම අනිවාර්ය වේ)**
5. ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවලට අදාළ වන අමතර උපදෙස් සහිතව MT 542 සහ MT 543 පණිවිඩ සඳහා නිදර්ශක ආකෘති **ඇමුණුම් අංක 2** හි දක්වා ඇත. (MT 540 සහ MT 541 පණිවිඩවල අදාළ ක්ෂේත්‍රවලට ද මෙම උපදෙස් අදාළ වේ).
6. මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීමේ (MT 542) / ලැබීමේ (MT 540) පණිවිඩවල අදාළ ක්ෂේත්‍රයන්හි සටහන් වන පියවීමේ වටිනාකම් පියවීමේ ක්‍රියාවලියේ දී නොසලකනු ලබන අතර, ඒ සඳහා රාජ්‍ය සුරැකුම්පත් ගිණුම් හර හා බැර කිරීමේදී, මුහුණත වටිනාකම පමණක් ලංකාසෙකුෘ පද්ධතිය මඟින් භාවිතා කරනු ලබයි.
7. රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීම සඳහා SWIFT පද්ධතිය මඟින් පණිවිඩ යැවීමට අමතරව CSS Trades වෙබ් පාදක යෙදුම හරහා, එනම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද ලංකාසෙට්ල් පද්ධති රීතිවල 3 වන වෙළුමේ 5.4 රීතිය යටතේ උපදෙස් දී ඇති පරිදි රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු යොමු කිරීමේදී ද, ඉහත අංක 02 අදළ වේ.
8. ලංකාසෙට්ල් පද්ධති රීතිවල තෙවන වෙළුමේ රීති අංක 5.7 යටත්ව, ගනුදෙනුවක් සඳහා එකඟතාවයක් සිදු වී ඇති අවස්ථාවක ඒ හා සම්බන්ධ සුරැකුම්පත් පියවීමේ උපදෙස් එකී එකඟතාවය ඇති වී **මිනිත්තු 30ක් ඇතුළත**, ලංකාසෙකුෘ පද්ධතියට ඇතුළත් කිරීම සහභාගිකරුවන් විසින් සිදු කළ යුතුය.
9. ලංකාසෙකුෘ පද්ධතිය තුළ රජයේ සුරැකුම්පත් ගනුදෙනු වාර්තා කිරීමේ දී මෙම මාර්ගෝපදේශයේ නියම කර ඇති පරිදි, අදළ පණිවිඩ ආකෘතියේ සහ නියම කර තිබෙන කාල රාමුව තුළ නිවැරදි තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතාවය 2021.01.01 දින සිට බලාත්මක වේ. (2020 දෙසැම්බර් මාසය තුළ නව උපදෙස්වලට අදාළ සියලුම පරීක්ෂා කිරීම් අවසන් කළ යුතුවේ.)

එම්. ඉසඩ්.එම්. ආසිම්
රාජ්‍ය ණය අධිකාරී

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ ගෙවීම් හා පියවීම්

1 රඳවාගත් සුරැකුම්පත් මුහුණත වටිනාකම් වෙනස් කිරීමක් සහිත

a). ප්‍රතිමිලදී ගැනීම් කාලපරිච්ඡේදය තුළ අමතර අගයකට ප්‍රතිමිලදී ගැනුම් ඉහළ දැමීම
b). ප්‍රතිමිලදී ගැනුම් කල්පිරීමට පෙර අර්ධ වශයෙන් පියවීම

ගනුදෙනු යොමු අංක ආකෘතිය **ඇමුණුම 01**

ගනුදෙනු යොමු අංක ක්ෂේත්‍රයේ ඉලක්කම් 16ක් අඩංගු වේ.

නව ගනුදෙනු යොමු අංක ආකෘතියට අනුව පළමු ඉලක්කම් 4 ගනුදෙනුව වර්ගීකරණය කිරීම සඳහා විශේෂයෙන්ම වෙන් කළ යුතු අතර ඉතිරි ඉලක්කම් 12 සහභාගීකරුට තම අභිමතය පරිදි යොමු අංක / අංකනය කිරීම සඳහා භාවිතා කළ හැකිය.

එක් ගනුදෙනුවක් සහ ඒ හා සම්බන්ධ අනෙක් ගනුදෙනු සඳහා, 'සහභාගීකරු විසින් ජනනය කරන ලද යොමු අංකය' ('Participant Generated Reference Number' -PGRN) එක සමාන විය යුතුය (අවශ්‍ය නම්, අවසාන ඉලක්කම/ඉලක්කම් සඳහා අනුක්‍රමණයන්[1] භාවිතා කළ හැකිය).

උදා. ස්වයංක්‍රීය ආපසු හැරවීමේ උපදෙස් මත වාර්තා කරනු ලබන ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු සඳහා ද මෙම ගනුදෙනු යොමු අංක ආකෘතිය අනුගමනය කළ යුතු අතර, ආපසු හැරවීම් ගනුදෙනුව ලෙස දක්වන ගනුදෙනු යොමු අංකයෙහි (SWIFT ක්ෂේත්‍රය :20C::SECO//) දෙවන ඉලක්කම (පහතින් දක්වා ඇති පරිදි X2හි අගය) "V" විය යුතු අතර මුල් ගනුදෙනුව සඳහා භාවිතා කරන ලද සහභාගීකරු විසින් ජනනය කරන ලද යොමු අංකයම (PGRN) මෙහිදී ද භාවිතා කළ යුතු වේ.

ගනුදෙනුව වර්ගීකරනය කිරීම සඳහා විශේෂයෙන් වෙන් කර ඇත				**සහභාගීකරු විසින් ජනනය කරන ලද යොමු අංකය (PGRN)**											
X1	**X2**	**X3**	**X4**	Z	Z	Z	Z	Z	Z	Z	Z	Z	Z	Z	Z
1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16

හිමිකම් මත සිදුවන / ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු සඳහා

	විස්තරය	**කේතය**	**කේතය පිළිබඳ විස්තරය**
X1	ගනුදෙනු වර්ගීකරණය	A / B / C	A - හිමිකාරත්ව ගනුදෙනු * (ප්‍රධාන ක්‍රියාව) B - වගකීමෙන් නිදහස් පාරිභෝගික ගනුදෙනු **(නියෝජිත ක්‍රියාව - වගකීම් රහිත) C - වගකීම් සහිත පාරිභෝගික ගනුදෙනු *** (නියෝජිත ක්‍රියාව - වගකීම් සහිත)
X2	ගනුදෙනු වර්ගය	O / R / V / P	O - හිමිකම් මත සිදුවන | R - ප්‍රතිමිලදී ගැනුම් | V - ප්‍රතිමිලදී ගැනුම් ආපසු හැරවීම | P - ඔඩපනය
X3	පරිපූරක සුරැකුම්පත් සංචලනය	L / S / N	L - ප්‍රතිෂ්ඨාපනය (වෙළඳපොළ වටිනාකමට මිල තැබීම අනුව ගැලපීම) S - ආදේශනය | N - කිසිවක් නැත
X4	සුරැකුම්පත් සංචලන වාරය	1, 2, ... 9, a, b, c, d, ..., y, z (අක්ෂර 35ක් දක්වා භාවිතා කළ හැක)	එක් ගනුදෙනුවක් සඳහා ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක (ISIN) කිහිපයක් භාවිතා කර ඇති විට (X3 = N විට) සුරැකුම්පත් චලන වාරයන් දැක්වීමට අනුක්‍රමික අංකයක්
			එක් ගනුදෙනුවක් සුරැකුම්පත් චලනයන් දාමයක් ලෙස සම්පූර්ණ වූ විට (X3 = N විට) සුරැකුම්පත් චලන වාරයන් දැක්වීමට අනුක්‍රමික අංකයක්
			ප්‍රතිමිලදී ගැනුම් වලට අදාළ පරිපූරක සංචලනයන්හි චලන වාරයන් දැක්වීමට අනුක්‍රමික අංකයක් (X3 = L හෝ S විට)

* - හිමිකාරත්ව ගනුදෙනු - සහභාගිකරුගේ ආයෝජන, වෙළඳාම හෝ අරමුදල් සම්පාදනය කිරීමේ අරමුණු සඳහා සහභාගිකරුගේ සුරැකුම්පත් ගිණුමට බලපාන සංචලනයන්

** - වගකීම් රහිත පාරිභෝගික ගනුදෙනු - සහභාගිකරුගේ ආයෝජන, වෙළඳාම හෝ අරමුදල් සම්පාදනය සඳහා නොවන, එහෙත් සහභාගීකරු විසින් ගනුදෙනුකරුවන් වෙනුවෙන් සිදුකරනු ලබන සුරැකුම්පත් සංචලනයන් (මෙම කාණ්ඩය යටතේ සහභාගීකරු විසින් ගනුදෙනුකරුවන්ට ලබාදෙන නියෝජිත සේවාවන් හෝ සහභාගීකරුගේ භාරකාර භූමිකාව ආවරණය වේ).

එක් එක් ප්‍රති-පාර්ශවයන් ගනුදෙනුව පියවීම සඳහා වූ වගකීම සපුරාලිය යුතු අතර, ගනුදෙනුව පියවීම සඳහා සහභාගීකරු **කිසිදු වගකීමක්** නොගනී.

*** - වගකීම් සහිත පාරිභෝගික ගනුදෙනු - සහභාගිකරුගේ ආයෝජන, වෙළඳාම හෝ අරමුදල් සම්පාදනය සඳහා නොවන, එහෙත් සහභාගීකරු විසින් ගනුදෙනුකරුවන් වෙනුවෙන් සිදුකරනු ලබන සුරැකුම්පත් සංචලනයන් (මෙම කාණ්ඩය යටතේ සහභාගීකරු විසින් ගනුදෙනුකරුවන්ට ලබාදෙන නියෝජිත සේවාවන් හෝ සහභාගීකරුගේ භාරකාර භූමිකාව ආවරණය වේ).

1. සහභාගිකරුවන්ගේ මනාපය ලෙස අනුක්‍රමණය කිරීම සඳහා අවසාන ඉලක්කම (ම) භාවිතා කළ හැකි නමුත් ගනුදෙනුව සහ ඒ හා සම්බන්ධ අනෙක් ගනුදෙනු හඳුනාගැනීම සඳහා යොමු අංකයෙහි පළමු කොටස සමාන විය යුතුය.

උදා. PGRN = AAABBBCCC-01, AAABBBCCC-02, ආදී වශයෙන්

එක් එක් ප්‍රති-පාර්ශවයන් ගනුදෙනුව පියවීම සඳහා වූ වගකීම සපුරාලීමට අසමත් වුවහොත්, භාරකරු ලෙස සහභාගීකරු විසින් ගනුදෙනුව පියවා අවසන් කිරීමේ **වගකීම** ගනු ලබයි.

ගනුදෙනු යොමු අංක සඳහා උදාහරණ

1. සහභාගීකරුවන් දෙදෙනෙකු අතර ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව - ස්වයංක්‍රීය ආපසු හැරවීම සමඟ

:20C::SEME//	ARNO	CB1125P-REPO
:20C::SECO//	AVNO	CB1125P-REPO

2. ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු, සහභාගීකරු ගනුදෙනුව පියවා අවසන් කිරීම සම්බන්ධයෙන් වගකීම දරන්නේ නැත - ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව ආරම්භය සහ අවසන් කිරීම සඳහා වෙන වෙනම උපදෙස් (SWIFT පණිවිඩ යැවීම

- පළමු පාදය	:20C::SEME//	BRNO	CB1126C-R
- දෙවන පාදය	:20C::SEME//	BVNO	CB1126C-R

3. සහභාගීකරුවෙකු හා ගනුදෙනුකරුවෙකු අතර ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව - 3 වන වරට සුරැකුම්පත් ප්‍රතිෂ්ඨාපනය

:20C::SEME//	ARL3	CB1127C

4. සහභාගීකරුවෙකු හා ගනුදෙනුකරුවෙකු අතර ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව - 11 වන වතාවට සුරැකුම්පත් ආදේශනය

:20C::SEME//	ARSb	CB1128C-11

5. ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර ඔඩපන ගනුදෙනුව - ඔඩපන ගනුදෙනුව සඳහා සුරැකුම්පත් කිහිපයක් භාවිතා කර ඇත. (3 වන සුරැකුම්පත (ISIN) සඳහා)

:20C::SEME//	BPN3	CB1129PLDG

6. ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර හිමිකම් මත සිදුවන ගනුදෙනුව (පළමු ගනුදෙනුකරුගෙන් දෙවන ගනුදෙනුකරුට) - සුරැකුම්පත් වලනයන් දාමයක් ලෙස ගනුදෙනුව සම්පූර්ණ වන විටදී සහ සහභාගීකරු ගනුදෙනුව පියවා අවසන් කිරීම සම්බන්ධයෙන් වගකීම දරන විටදී

- අ. පළමු ගනුදෙනුකරුගෙන් පළමු සහභාගීකරුට

:20C::SEME//	CON0	CB1130-OR-CP

- ආ. පළමු සහභාගීකරුගෙන් දෙවන සහභාගීකරුට

:20C::SEME//	CON1	CB1130-OR-PP

- ඇ. දෙවන සහභාගීකරුගෙන් දෙවන ගණුදෙණුකරුට

:20C::SEME//	CON2	CB1130-OR-PC

ඇමුණුම 02

MT 542 SWIFT ආකෘතිය - මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීමේ පණිවිඩය

SWIFT ආකෘතිය	විස්තරය	මුල් ගනුදෙනු සඳහා අමතර උපදෙස්	ප්‍රතිෂ්ඨාපනය/ආදේශන සඳහා විශේෂ උපදෙස්
:16R:GENL			
:20C::SEME//	යවන්නාගේ පණිවිඩ යොමුව	ගනුදෙනු යොමුව සඳහා මාර්ගෝපදේශ (ඇමුණුම 01) බලන්න	
:23G:NEWM	NEW/CANC	නව උපදෙස්/අවලංගු කිරීම සඳහා උපදෙස්	
:16S:GENL			
:16R:TRADDET			
:98A::SETT//	පියවීමේ දිනය	පියවීමේ දිනය	

:98A::TRAD//	වෙළඳ දිනය සපයා නොමැති නම් ආදාන දිනය නියමිත දිනය ලෙස මධ්‍යම සුරැකුම්පත් පද්ධතිය (CSS) සලකනු ලබයි	ප්‍රතිපාර්ශවයන් ගිවිසුමට එළඹෙන හෝ වත්කමක් මිලට ගැනීමට හෝ විකිණීමට කැපවන දිනය (මෙම දිනයේ දී මිලකරණයට එකඟ වී ඇති බැවින්, වෙළඳ දිනයට අනුරූප මිලකරණ විස්තර පහත 90:A: යටතේ වාර්තා කළ යුතුය)	සුරැකුම් ප්‍රමාණය/පියවීමේ වටිනාකම ගණනය කිරීම් එදින මිලකරණය මත පදනම් වන බැවින් පියවීමේ දිනය හා සමාන වේ
:35B:ISIN	පවරනු ලබන සුරැකුම්පතට අයත් ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය (ISIN)	ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය	
:16R:FIA			
:90A::INDC//PRCT/	මිල	සුරැකුම්පතෙහි පිරිසිදු මිල (Clean Price) **යොමුව : 2019.10.01 දින නිකුත් කරන ලද SSSS/02/2019 අංක දරණ චක්‍රලේඛය, ඍජු අලෙවි සහභාගිකරුවන් විසින් නිර්ලේඛිත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිමිලදී ගැනීම් ප්‍රතිවිකුණුම් ගනුදෙනු සම්බන්ධයෙන් 2019.12.20 දින නිකුත් කරන ලද විධානය**	මුල් ගනුදෙනුව සඳහා ලබා දී ඇති උපදෙස් ම අදාළ වේ.
:90A::EXER//YIEL/	ඵලදා අනුපාතිකය	හිමිකම් මිලදී ගැනීම: මිලදී ගැනීමේදී/විකිණීමේදී කල්පිරීම සඳහා වන ඵලදා අනුපාතය ප්‍රතිමිලදී ගැනීම : ප්‍රතිමිලදී ගැනීමේ වාර්ෂික අනුපාතය **යොමුව : 2019.10.01 දින නිකුත් කරන ලද SSSS/02/2019 අංක දරන චක්‍රලේඛය**	මුල් ගනුදෙනුවේ ඵලදා අනුපාතය
:16S:FIA			
:22F::PRIR//	ප්‍රමුඛතාවය	පෙළ ගැස්මේ ප්‍රමුඛතාවය	
:16S:TRADDET			
:16R:FIAC			
:36B::SETT//FAMT//	ප්‍රමාණය (මුහුණත අගය)	මුහුණත වටිනාකමින් පවතින සුරැකුම්පත් ප්‍රමාණය. අර්ධ කල්පිරීම් හෝ ප්‍රතිමිලදී ගැනීම් අගය වැඩි කිරීම්: සුරැකුම්පත් ප්‍රමාණය, ඵලදා අනුපාතය, මිල සහ පියවීම් වටිනාකම මත පදනම්ව ගණනය කරනු ලබන ප්‍රතිමිලදී ගැනීමේ අගය වෙනස්වීම නිරූපණය කරන්නක් විය යුතුය	
:97A::SAFE//	සුරැකුම්පත් යවනු ලබන ගිණුම	සුරැකුම්පත් යවනු ලබන ගිණුම, සුරැකුම්පත් යවනු ලබන ප්‍රතිලාභ හිමිකරු කේතය. **ලංකාසෙට්ල් පද්ධති රීතිවල 4.2 සහ 4.3 වගන්තිවලට** අනුව ගිණුම සහ හිමිකරු කේතය නිවැරදිව වාර්තා කිරීම අවශ්‍ය වේ	
:16S:FIAC			

:16R:REPO			
:98A::TERM//	ප්‍රතිමිලදී ගැනීමේ දිනය **(පාරිභෝගික ප්‍රතිමිලදී ගැනීම් උපදෙස් සඳහා)**	**ලංකාසෙට්ල් පද්ධති රීතිවල 5.13 වගන්තියට අනුව**	
:20C::SECO//	දෙවන අදියර (ආපසු ගැනීම) සඳහා භාවිතා කරන ගනුදෙනු යොමුව **(පාරිභෝගික ප්‍රතිමිලදී ගැනීම් උපදෙස් සඳහා)**	ගනුදෙනු යොමුව සඳහා මාර්ගෝපදේශ (ඇමුණුම 01) බලන්න	
:16S:REPO			
:16R:SETDET			
:22F::SETR//	වෙළඳ පියවීම	දී ඇති කේතකරණ සටහන අනුගමනය කරන්න; TRAD - හිමිකම් මත සිදුවන සහ-සහභාගිකරුවන් අතර සිදුවන ගනුදෙනු (සාමාන්‍ය ගනුදෙනුව) OWNI හිමිකම් මත සිදුවන සහ-සහභාගිකරු - පාරිභෝගික අතර සිදුවන ගනුදෙනු **(ප්‍රතිස්ථානගත කිරීමේ ගනුදෙනුව)**	
:16R:SETPRTY			
:95P ::REAG//	සුරැකුම්පත් ලබන්නා වූ සහභාගිකරුගේ බැංකු හඳුනාගැනීමේ කේතය	සුරැකුම්පත් ලබන්නා වූ සහභාගිකරුගේ බැංකු හඳුනාගැනීමේ කේතය	
:97A ::SAFE//	සුරැකුම්පත් ලබන්නා වූ ගිණුම **(ප්‍රතිස්ථානගත කිරීමේ ගනුදෙනු සඳහා)**	සුරැකුම්පත් ලබන්නා වූ ගිණුම, සුරැකුම්පත් ලබන්නා වූ ප්‍රතිලාභ හිමිකරු කේතය **ලංකාසෙට්ල් පද්ධති රීතිවල 4.2 සහ 4.3 වගන්තිවලට** අනුව ගිණුම සහ හිමිකරු කේතය නිවැරදිව වාර්තා කිරීම අවශ්‍ය වේ.	
:16S:SETPRTY			
:16R:SETPRTY			
:95P:: PSET//	පියවීමේ ස්ථානය. මධ්‍යම සුරැකුම්පත් පද්ධතියෙහි (CSS) බැංකු හඳුනාගැනීමේ කේතය	CBCELKLSXXX	
:16S:SETPRTY			
:16R:AMT			
:19A::SETT//	පියවීමේ අගය	ගනුදෙනුවේ නියමිත අගය හෝ යම් සුරැකුමක් වලනයට අදාළ ඵලදාව සහ මුහුණත වටිනාකම මත පදනම්ව ගණනය කරන ලද නිරූපිත අගය යොමුව : **2019.10.01** දින **නිකුත් කරන ලද SSSS/02/2019** අංක දරන **චක්‍රලේඛය**	මුල් ගනුදෙනුව සඳහා ලබා දී ඇති උපදෙස් ම අදාල වේ
:16S:AMT			
:16S :SETDET			

MT 543 SWIFT ආකෘතිය - ගෙවීමට එදිරිව මුදා හැරීමේ පණිවිඩය

SWIFT ආකෘතිය	විස්තරය	මුල් ගනුදෙනු සඳහා අමතර උපදෙස්	ප්‍රතිමිලදී ගැනීමේ අගය සංශෝධනයන් සඳහා විශේෂ උපදෙස්
:16R:GENL			
:20C::SEME//	යවන්නාගේ පණිවිඩ යොමුව	ගනුදෙනු යොමුව සඳහා මාර්ගෝපදේශ (ඇමුණුම 01) බලන්න	ප්‍රතිමිලදී ගැනීම් ඉහළ නැංවීම සඳහා - සම්බන්ධිත ප්‍රතිමිලදී ගැනීමට අදාළ ගනුදෙනු යොමු අංකයම වේ. අර්ධ කල්පිරීම සඳහා - සම්බන්ධිත අවසාන නැවත මිලදී ගැනීම ආපසු හැරවීමට අදාළ ගනුදෙනු යොමු අංකයම වේ.
:23G:NEWM	NEW/CANC	නව උපදෙස්/අවලංගු කිරීම සඳහා උපදෙස්	
:16S:GENL			
:16R:TRADDET			
:98A::SETT//	පියවීමේ දිනය	පියවීමේ දිනය	
:98A::TRAD//	වෙළඳ දිනය සපයා නොමැති නම් ආදාන දිනය නියමිත දිනය ලෙස මධ්‍යම සුරැකුම්පත් පද්ධතිය (CSS) සලකනු ලබයි	ප්‍රතිපාර්ශවයන් ගිවිසුමට එළඹෙන හෝ වත්කමක් මිලට ගැනීමට හෝ විකිණීමට කැපවන දිනය (මෙම දිනයේ දී මිලකරණයට එකඟ වී ඇති බැවින්, වෙළඳ දිනයට අනුරූප මිලකරණ විස්තර පහත 90:A: යටතේ වාර්තා කළ යුතුය)	සුරැකුම් ප්‍රමාණය/පියවීමේ වටිනාකම ගණනය කිරීම් එදින මිලකරණය මත පදනම් වන බැවින් පියවීමේ දිනය හා සමාන වේ.
:35B:**ISIN**	පවරනු ලබන සුරැකුම්පතට අයත් ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය (ISIN)	ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය	
:16R:FIA			
:90A::INDC//PRCT/	මිල	සුරැකුම්පතෙහි පිරිසිදු මිල (Clean Price) **යොමුව : 2019.10.01 දින නිකුත් කරන ලද SSSS/02/2019 අංක දරණ චක්‍රලේඛය, ඍජු අලෙවි සහභාගිකරුවන් විසින් නිර්ලේඛිත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිමිලදී ගැනීම් ප්‍රතිවිකුණුම් ගනුදෙනු සම්බන්ධයෙන් 2019.12.20 දින නිකුත් කරන ලද විධානය**	මුල් ගනුදෙනුව සඳහා ලබා දී ඇති උපදෙස් ම අදාළ වේ.
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය

1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල පළමු පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1300 පැය	ප්‍රාථමික වෙන්දේසියකට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1315 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමට ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1445 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත ගොනු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත ගොනු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත ගොනු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි හතරවන චක්‍රය
1500 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1515 පැය	නිත්‍ය පහසුකම් ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන සඳහා නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම 1515 පැයෙන් පසු ලබා ගත නොහැක
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1545 පැය	සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1545 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුයි
1600 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම

1615 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1630 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදු වේ.
1630 පැය සිට 1700 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා : වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1700 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම

සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මගින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේ දී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම්. ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2020 අප්‍රේල් 15

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 10/2020

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාලසටහන 2020 අප්‍රේල් 16 වැනි දින සිට නැවත දැනුම් දෙන තුරු අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම්වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය/ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම

0830 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනයේ) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනයේ) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනයේ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1000 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1000 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම (අදාළ අවස්ථාවේ දී)	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසිය	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල පළමු පාදයට අදාළ පියවීම් කටයුතු
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1245 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1245 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමට ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත ගොනු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1330 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත ගොනු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය

1330 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1345 පැය	නිත්‍ය පහසුකම් ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1345 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකම හා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත නොහැක
1355 පැය	සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1355 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම නොකළ යුතුය
1410 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1420 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1430 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1440 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදු වේ.
1440 පැය සිට 1450 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා : වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1500 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම

සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේ දී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම්. ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2020 අප්‍රේල් 19

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 11/2020

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාලසටහන 2020 අප්‍රේල් 20 සහ අප්‍රේල් 21 යන දිනවල දී අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම්වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු

0815 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය/ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාළ වන පරිදි) ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාළ වන පරිදි) ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනයේ) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනයේ) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනයේ)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනයේ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන දිනයේ)
1000 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1000 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම (අදාළ අවස්ථාවේ දී)	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසිය	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල පළමු පාදයට අදාළ පියවීම් කටයුතු
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1245 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු

1245 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමට ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1330 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1430 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් ගෙවීම් ක්‍රමයේ තෙවන චක්‍රය
1430 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1445 පැය	නිත්‍ය පහසුකම් ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1345 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකම හා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත නොහැක
1455 පැය	සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1355 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම නොකළ යුතුය
1510 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1520 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1530 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1540 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදු වේ.
1540 පැය සිට 1555 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා : වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1555 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම

සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේ දී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම්. ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 12/2020 2020 අප්‍රේල් 20

බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව

ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වය වැඩි කිරීම තුළින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රවර්ධනය සහ පහසුකම් සැලසීම සඳහා 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතෙහි 44 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා තම ගනුදෙනුකරුවන් විසින් සිදු කරන ගනුදෙනුවල දී පහත සඳහන් උපරිම සීමාවන්ට විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙකුම අනුකූල විය යුතුය.

2. ගනුදෙනුවක උපරිම වටිනාකම ;

2.1 පහත දැක්වෙන ගනුදෙනු කේතයන් යටතේ සිදු කෙරෙන ගනුදෙනු හැර අනෙකුත් කේතයන් හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් මිලියන 5 නොඉක්මවිය යුතුය.

(අ) ගනුදෙනු කේතය "58" හරහා ශ්‍රී ලංකා රේගුව සඳහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් බිලියන 20 නොඉක්මවිය යුතුය.

(ආ) ගනුදෙනු කේතය "62" හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් බිලියන 10 නොඉක්මවිය යුතුය.

3. ගනුදෙනුවක උපරිම ගාස්තුව ;

3.1 ගනුදෙනුවක් සඳහා අය කළ හැකි උපරිම ගාස්තුව පහත දැක්වෙන සීමාවන් නොඉක්මවිය යුතුය.

(අ) පහත සඳහන් ගෙවීම් මාධ්‍යයන් හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක දී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 50 නොඉක්මවිය යුතුය.

i. අන්තර්ජාලය පදනම් කර ගත් බැංකු කටයුතු මඟින් ;

ii. ජංගම දුරකථන පදනම් කර ගත් බැංකු කටයුතු මඟින් ; සහ

iii. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකුගේ ගනුදෙනුකරුවකු විසින් එම සාමාජිකයාගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මඟින්.

(ආ) බැංකු කවුන්ටරය වෙත පැමිණ සිදු කරන අරමුදල් පැවරීමක දී, එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

(ඇ) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි අනෙකුත් සාමාජිකයන්ගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක දී, එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

3.2 වෙළඳ කාණ්ඩය "4106" හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සිදු කරන බදු ගෙවීමක් සඳහා අය කරන උපරිම ගාස්තුව රුපියල් 50 නොඉක්මවිය යුතුය. වෙළඳ කාණ්ඩය "4107" (දඩ ගෙවීම්) සහ "4108" (දඩ පොලිය) හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සිදු කෙරෙන ගෙවීමක දී ගාස්තුවක් අය නොකළ යුතුය.

4. ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 08/2017 ප්‍රතිස්ථාපනය කරමින් නිකුත් කෙරෙන මෙම චක්‍රලේඛය 2020 අප්‍රේල් 27 වැනි දින සිට බලපැවැත්වේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

යොමු අංකය : 34/01/025/0038/002 2020 මැයි 14

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 13/2020

සියලුම බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් හට LANKAQR හා සම්බන්ධ වීම අනිවාර්ය කිරීම

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් හට LANKAQR හා සම්බන්ධ වීම අනිවාර්ය කිරීම සඳහා 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්, නිකුත් කරන්නන් සහ වෙළඳ අත්පත්කරුවන් ලෙස, LANKAQR වෙත සම්බන්ධ වී 2020 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර, LANKAQR මෙහෙයුම් මාර්ගෝපදේශ අනුවාදය 3/ජනවාරි 2020 හි අර්ථ දක්වා ඇති LANKAQR ගනුදෙනු වර්ග 4 සඳහා ම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙන් සහතික ලබා ගත යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අදාළ වන පරිදි, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් ඉහත LANKAQR හා සම්බන්ධ වීමට නියමිත ඉහත සඳහන් අවසන් දිනය පිළිපැදීම සම්බන්ධව අඛණ්ඩ ප්‍රගතිය නිරීක්ෂණය කරනු ඇත.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

පිටපත : අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය : 34/07/029/0001/002 2020 මැයි 25

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 14/2020

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාලසටහන සංශෝධනය කිරීම

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාලසටහන 2020 මැයි 26 දින සිට අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් /ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම්වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු

0815 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/ සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය/ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් /දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය /දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ප්‍රාථමික වෙන්දේසිය නිකුත් කිරීම (අදාළ වන අවස්ථාවේ දී)	ප්‍රාථමික වෙන්දේසිය නිකුත් කිරීම (අදාළ වන අවස්ථාවේ දී)
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1100 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1100 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල පළමු පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1300 පැය	ප්‍රාථමික වෙන්දේසියකට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය

1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1315 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1445 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1500 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1515 පැය	නිත්‍ය පහසුකම් ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන සඳහා නිත්‍ය තැන්පතු පහසුකම හා නිත්‍ය ණය පහසුකම 1515 පැයෙන් පසු ලබා ගත නොහැක
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1545 පැය	සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1545 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුය
1600 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1630 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදු වේ.
1630 පැය සිට 1700 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා : වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1700 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම

සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේ දී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්.ඉසඩ්.එම් ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

මාර්ගෝපදේශ අංක : 01/2020

ගෙවීම් පහසුකම් ලබාදෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ මාර්ගෝපදේශය

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතෙහි, වගන්ති අංක 44 ප්‍රකාරව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හෝ බලපත්‍රලාභී ජංගම දුරකථන ආශ්‍රිත විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් මෙහෙයවන හෝ ජංගම දුරකථන යෙදුම් මෘදුකාංග ආශ්‍රිත ගෙවීම් සපයන හෝ අදාළ ක්‍රියාවන්හි නිරත වන ඕනෑම ආයතනයක් (මින්මතු ගෙවීම් සේවා සපයන්නන් ලෙස සඳහන්) සඳහා අදාළ වන අවම අනුකූලතා ප්‍රමිතීන් නිර්දේශ කිරීමට මෙකී මාර්ගෝපදේශ නිකුත් කර ඇත.

මෙම මාර්ගෝපදේශ මඟින් ජංගම යෙදුම් මෘදුකාංග, වෙබ් සේවා, සේවාදායක තාක්ෂණික යටිතල පහසුකම් (serve-side infrastructure) හා සන්නිවේදන ජාල ආදියට පමණක් සීමා නොවී ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් මෘදුකාංග ආශ්‍රිත සමස්ථ පද්ධතියම ආවරණය වනු ඇත. මෙම මාර්ගෝපදේශයන්ට අනුකූල වීම සහතික කිරීමේ වගකීම ගෙවීම් සේවා සපයන ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැරිය යුතුය.

මෙම මාර්ගෝපදේශය මඟින් 2018 අංක 01 දරන ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ මාර්ගෝපදේශ සඳහා වන ගෙවීම් සහ පියවීම් පද්ධති මාර්ගෝපදේශය ප්‍රතිස්ථාපනය කරනු ලබන අතර එය 2020.06.01 දින සිට ක්‍රියාත්මක වේ.

2. නිර්වචන/අර්ථ දැක්වීම්

මෙම මාර්ගෝපදේශයෙහි භාවිතා කර ඇති ඕනෑම අවස්ථාවක දී පහත දැක්වෙන පද පහත සඳහන් අයුරින් අර්ථ දැක්විය යුතුවේ.

ගිණුම අවහිර කිරීම (Account Lockout)	මුරපදය අනුමාන කරමින් යම් ගිණුමකට අනවසරයෙන් පිවිසීමට දරන උත්සාහයේ දී නිශ්චිත අසාර්ථක වාර ගණනකට පසු එකී උත්සාහය වැළැක්වීම සඳහා ගිණුම අවහිර කර දැමීමේ ක්‍රමවේදය, ගිණුම අවහිර කිරීම ලෙස හඳුන්වනු ලැබේ.
සත්‍යාපනය (Authentication)	පරිශීලකයෙකුගේ අනන්‍යතාව තහවුරු කිරීම හා පරිගණකගත තොරතුරු ලබා ගැනීමට අදාළ පරිශීලකයා සතු සුදුසුකම් පරීක්ෂා කිරීම, සත්‍යාපනය ලෙස හඳුන්වනු ලැබේ.
බලය පැවරීම (Authorization)	පරිශීලකයාට හෝ සේවාදායකයාට පද්ධතියේ ඇති තොරතුරු හා සම්පත් වෙත ප්‍රවේශ වීමට ඇති වරප්‍රසාද හෝ කුමන මට්ටමේ තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසනවාද යන්න තීරණය කිරීමේ ආරක්ෂණ ක්‍රමවේදය බලය පැවරීම ලෙස හඳුන්වනු ලැබේ.
උපයෝජ්‍යතාවය (Availability)	කාලානුරූපීයව හා විශ්වසනීය ලෙස තොරතුරු වෙත පිවිසීමත් ඒවා භාවිතා කිරීමත් සහතික කිරීම උපයෝජ්‍යතාව වේ.
සහතික අධිකාරිය (Certificate Authority)	ඩිජිටල් ආයතනයක අන්තර්ජාලයේ ඇති අනන්‍යතාව සත්‍යාපනය කරමින් ඩිජිටල් සහතික නිකුත් කරන විශ්වසනීය ආයතනය, සහතික අධිකාරිය ලෙස හඳුන්වයි.
බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරු (Licensed Financial Acquirer)	බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරු යන්නෙන් ගෙවීම් මාර්ගයක් ලෙස කාඩ්පත් හිමියන්ගේ ගෙවීම් කාඩ්පත් ප්‍රතිග්‍රහණය කිරීම සහ කාඩ්පත් හිමියන් විසින් මිලදී ගත් භාණ්ඩ හා සේවාවන්වල අගයන් එම තුන්වන පාර්ශවයන් වෙත ප්‍රතිපූරණය කිරීම හා/හෝ කාඩ්පත් හිමියන් විසින් ලබාගත් මුදල් අත්තිකාරම් එම තුන්වන පාර්ශවයන් වෙත ප්‍රතිපූරණය කිරීම සඳහා කටයුතු කරන ඕනෑම අයෙකු හෝ ආයතනයක් අදහස් වේ.
සංක්ෂිප්තකරණය/අවම කිරීම (Minification)	මෘදුකාංගයට අදාළ මූලාශ්‍ර කේතයෙහි ක්‍රියාකාරිත්වය නොවෙනස්ව පවත්වා ගනිමින් එහි ඇති අනවශ්‍ය පද ඉවත් කිරීමේ ක්‍රියාවලිය, සංක්ෂිප්තකරණය/අවම කිරීම ලෙස අදහස් වේ.
සංක්ෂිප්ත ගුණනය/අඳුරු කිරීම (Obfuscation)	චේතනාන්විතව තේරුම් ගැනීමට අපහසු කේත නිර්මාණය කිරීම එනම්, මිනිසාට අවබෝධ කර ගැනීමට අපහසු වන මූලාශ්‍ර හෝ යන්ත්‍ර කේතයන් නිර්මාණය කිරීම සංකෂිප්ත ගුණනය/අඳුරු කිරීම ලෙස හැඳින්වේ.
වරප්‍රසාද උත්ක්‍රමණය (Privilege Escalation)	මෘදුකාංග යෙදුමක හෝ පරිගණක මෙහෙයුම් පද්ධතියක දෝෂයක්, නිමැවුම් පළුදුවීමක් හෝ ආකෘතියෙහි ප්‍රමාද දෝෂයක් උපයෝගී කර ගනිමින්, පරිශීලකයන් වෙත හෝ යෙදුමක් වෙත සාමාන්‍යයෙන් නිරාවරණය නොකරන දත්ත හා සම්පත් ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ සඳහා උත්සාහ දැරීම වරප්‍රසාද උත්ක්‍රමණය කිරීම වේ.
සංවේදී දත්ත (Sensitive Data)	පාරිභෝගික අක්ත පත්‍ර (Customer Credentials), බැංකු ගිණුම් අංක, ගෙවීම් කාඩ්පත් අංක හෝ ඒ හා සමාන තොරතුරු මෙම සන්දර්භය තුළ දී සංවේදී දත්ත ගණයට ඇතුළත් වේ.
කෙටිකාලීන ප්‍රවේශ ටෝකනය (Short-lived Access Token)	සේවාලාභියෙකු (Client) සේවාදායක (Server) පරිගණකය හා සම්බන්ධ වීමට ප්‍රවේශ ටෝකනයක් (Access Token) යොමු කරන අවස්ථාවක දී සේවා දායකය එම ප්‍රවේශ ටෝකනයෙහි ඇති තොරතුරු මත පදනම්ව සේවාලාභියාගේ අනන්‍යතාවය තහවුරු කර ගනී. මෙකී ප්‍රවේශ ටෝකන කෙටි ආයු කාලයකින් යුතු ඒවා වේ.

පාර්ශ්වකරුවන් (Stakeholders)	ගෙවීම් සේවා සපයන්නන්, මෘදුකාංග විකුණුම්කරුවන්, සේවා සපයන්නන්, ප්‍රතිලාභ ලබන වෙළෙඳුන් හා විගණකවරුන්, මෙම සන්දර්භය තුළ දී පාර්ශ්වකරුවන් ලෙස හඳුන්වනු ලැබේ.
URL සංචාලනය (Uniform Resource Locator-URL)	URL ලිපිනයෙහි පරාමිතීන් වෙනස් කිරීමේ (බොහෝවිට ස්වයංක්‍රීයව) ක්‍රියාවලිය URL සංචාලනය වේ.

3. ප්‍රතිපත්ති සම්පාදනය (Policy Formulation)

3.1 ගෙවීම් සේවා සපයන්නන් විසින් සියලුම ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග හැසිරවීම සඳහා ව්‍යාපාර අරමුණු, ප්‍රමිතීන්, අනුකූලතාවයන්, මාර්ගෝපදේශන, පාලන විධි, වගකීම් හා බැරකම් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කළ යුතුය. ඔවුන් විසින් මෙම ප්‍රතිපත්ති ලේඛනය වාර්ෂිකව සහ අවැසි අවස්ථාවල දී සංශෝධනය කළ යුතුය.

3.2 සියලුම ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග නිර්මාණය හා සංවර්ධන කටයුතුවල දී මෙම ප්‍රතිපත්ති ලේඛනයෙහි සඳහන් කරුණු රාමුවක් ලෙස යොදා ගත යුතු අතර ඒ පිළිබඳව සියලුම පාර්ශ්වකරුවන් පැහැදිලි ලෙස දැනුවත් කළ යුතුය.

3.3 මෙම ප්‍රතිපත්ති ලේඛනය ගෙවීම් සේවා සපයන ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය.

4. ප්‍රලේඛනය/ලේඛන සම්පාදනය (Documentation)

4.1 අදාළ සියලුම පාර්ශවයන් විසින්, සකසන හා නඩත්තු කරන නිර්මාණ ශිල්ප ක්‍රමවේද, පද්ධති අවශ්‍යතා පිරිවිතර (System Requirement Specification), තාක්ෂණික ලේඛන, සංශෝධන කළමනාකරණ ලේඛන, ක්‍රියාකාරී හා ක්‍රියාකාරී නොවන පරීක්ෂණ ප්‍රතිඵල, ආරක්ෂණ පරීක්ෂණ සහ පරිශීලක අත්සන් කිරීම් සහ අනෙක් පරිශීලක ලේඛන ආදී අවශ්‍ය සියලුම ලේඛන ඉහතින් ඇති 3 වන කොටසෙහි වගන්තිවලට අනුකූලව සකසා ඇති බවට, ගෙවීම් සේවා සපයන්නා විසින් සහතික කළ යුතුය.

5. උපාංග ලියාපදිංචි කිරීම (Device Registration)

5.1 පරිශීලක ගිණුම් සහ ජංගම උපාංග, ජංගම දුරකථන අංකය සහ උපාංගයට අනන්‍ය හඳුනා ගැනීමක් භාවිතා කරමින් ගෙවීම් සේවා සපයන්නා සමඟ ලියාපදිංචි කළ යුතුය.

5.2 අතිරේක උපාංග ලෙස ජංගම දුරකථන අංකයක් සහිත හෝ රහිත උපාංග ලියාපදිංචි වීමට ඉඩ දිය හැකි අතර මෙම උපාංග මූලික උපාංගය මඟින් හෝ ඇමතුම් මධ්‍යස්ථානයේ පුද්ගලයෙකු මඟින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතිය ලබා ගත් වෙනත් සත්‍යාපන ක්‍රමයක් මඟින් හෝ සත්‍යාපනය ලබා ගත යුතුය.

5.3 ගෙවීම් ආශ්‍රිතව සෑම යෙදුම් මෘදුකාංග පරිශීලක ගිණුමක්ම ගෙවීම් සේවා සපයන්නා සමඟ ලියාපදිංචි කර ඇති ජංගම උපාංගවල පමණක් භාවිතා කිරීමට අවසර ලබා දෙනු ලැබේ.

5.4 ගෙවීම් සම්බන්ධිත සෑම ජංගම යෙදුම් මෘදුකාංග පරිශීලක ගිණුමක් වෙනුවෙන්ම පිවිසුම් සත්‍යාපනය හා මූල්‍ය වටිනාකම මත පදනම් වූ ගනුදෙනු සත්‍යාපන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.

5.5 උපාංග කිහිපයක් මඟින් පරිශීලක ගිණුම එකවර භාවිතා කිරීමට ඉඩ නොදිය යුතුය.

6. සත්‍යාපනය සහ මුරපද ප්‍රතිපත්ති (Authentication and Password Policy)

සේවාදායක අන්තයෙන් සත්‍යාපනය කිරීම සඳහා පහත දැක්වෙන අවම පාලන උපක්‍රමයන් හා මුරපද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුවේ.

6.1 සත්‍යාපන ක්‍රියාවලිය, ජෛවමිතිකයන් (biometrics) හෝ චිප මත (chip-based) පදනම් වූ හෝ සත්‍යාපන ක්‍රමවලදී හැරුණු විට සේවාදායක අන්තයෙන් පමණක් සිදු කළ යුතුය.

6.2 ග්‍රාහක ඉල්ලීම් සත්‍යපන ක්‍රියාවලියේ දී පරිශීලකයන්ගේ තොරතුරු (User Credentials) සම්ප්‍රේෂණය නොකළ යුතු අතර ඒ සඳහා කෙටි කාලීන ප්‍රවේශ ටෝකනයක් ක්‍රියාත්මක කළ යුතුවේ.

6.3 ගෙවීම් සේවා සපයන්නාගේ ප්‍රතිපත්ති ලේඛනයට අනුකූලව සුදුසු මුරපද ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය.

6.4 ජංගම දුරකථන අංකය, උපාංග හඳුන්වනය, මුරපදය/PIN අංකය සහ ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුමට විශේෂිත වූ මෘදුකාංග හඳුන්වනයක් සමඟින් ක්‍රියාකරන බහු සාධක සත්‍යාපන ක්‍රමවේදයක් (Multi Factor Authentication) ක්‍රියාත්මක කළ යුතුය. ජංගම දුරකථන අංක නොමැති අතිරේක උපාංග සම්බන්ධයෙන් ජංගම දුරකථන අංකය වෙනුවට තවත් උපාංග හඳුනා ගැනීමක් භාවිතා කළ යුතුය.

6.5 යම් ගිණුමකට වලංගු නොවන ක්‍රමවේදයක් ඔස්සේ පිවිසීමට උත්සාහ දරන විට, එවැනි උත්සාහ වාර කිහිපයකට පසු ගිණුම අගුලු දැමීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතු අතර, එම ගිණුම් නැවත විවෘත කිරීමට අවශ්‍ය වූ විට අදාළ ගෙවීම් සේවා සපයන්නා විසින් ස්ථාපිත සම්මත ආරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුවේ.

6.6 ප්‍රවේශ අක්‍රමිකතා සහ සිදුවිය හැකි තත්කාලීන ආක්‍රමණ අනාවරණය කර ගැනීම පිණිස, සත්‍යාපන තැත් කිරීම් පිළිබඳ වාර්තා තබා ගැනීමත් අධීක්ෂණය කිරීමත් කළ යුතුය. සියලු ම ගනුදෙනු අක්‍රමිකතා හඳුනා ගැනීම සඳහා අධීක්ෂණය කළ යුතුය. අක්‍රමිකතා වර්ග දෙකම පරිශීලකයාට දැනුම් දිය යුතුය.

6.7 ඕනෑම අභ්‍යන්තර සම්පතකට පිවිසීම නිසි ලෙස සත්‍යාපනය කළ යුතුය.

7. බලය පැවරීම (Authorization)

බලය පැවරීම සම්බන්ධව පහත දැක්වෙන අවම පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය.

7.1 සෑම අවස්ථාවකදීම, අවම වරප්‍රසාදයේ මූලධර්මය (Principle of Least Privilege) අනුගමනය කළ යුතුය.

7.2 වරප්‍රසාද උත්ක්‍රමණය හා URL සංචාලනයට අදාළ වන පාලන විධිවිධාන ක්‍රියාත්මක කළ යුතුය.

8. සැසි මෙහෙයවීම (Session Handling)

සැසි මෙහෙයවීමේ දී පහත දැක්වෙන අවම පාලනයන් ක්‍රියාත්මක කළ යුතුය.

8.1 සැසි අනන්‍යතා අංකය සසම්භාවී ලෙස සකස් කළ යුතුය.

8.2 අක්‍රීය කාලසීමාවකට පසු ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුමට ස්වයංක්‍රීයව පරිශීලක ඉවත් කිරීමේ (Automatic User Log Off) හැකියාව තිබිය යුතුය.

8.3 පරිශීලකයාට පැහැදිලිව පෙනෙන හා පහසුවෙන් භාවිතා කළ හැකි ගිණුමෙන් ඉවත්වීමේ (Log off) ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය.

8.4 පරිශීලකයා ගිණුමෙන් ඉවත්වීමේ දී, අදාළ යෙදුම හා සම්බන්ධ කෙටිකාලීන හා ස්ථීර ලෙස ගබඩා කර ගත් සංවේදී දත්ත ඇත්නම් ඒවා සියල්ල මකා දැමීම හෝ කල් ඉකුත් වූ බව සලකුණු කිරීම හෝ කළ යුතුය.

8.5 එකවර පිවිසීමේ උත්සාහයන් හඳුනාගෙන, පරිශීලකයාට සන්නිවේදනය කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් සේවාදායක අන්තයේ ක්‍රියාත්මක කළ යුතුය.

8.6 ජංගම උපකරණයක් නැතිවී හෝ සොරාගෙන ඇති බවට වාර්තා වූ විට, එම උපකරණයෙන්, අදාළ ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම වෙත පිවිසීමට ඇති හැකියාව අක්‍රීය කර දැමිය හැකි මධ්‍යගත ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය.

9. දත්ත ඇතුළත් කිරීම සහ ගබඩා කිරීම (Entering and Storing Data)

9.1 බලපත්‍රලාභී මූල්‍ය අත්පත්කරුවෙකුගේ වසමක් තුළ හෝ ගෙවීම් ආශ්‍රිත යෙදුම් මෘදුකාංග දත්ත ආරක්ෂණ ප්‍රමිතීන් (PA-DSS) යටතේ හා ගෙවීම් කාඩ්පත් කර්මාන්තය හා සම්බන්ධ ආරක්ෂණ ප්‍රමිතීන් (PCI-DSS) යටතේ සහතිකලත් ජංගම යෙදුම් පද්ධතියක් තුළ දී පමණක් ගෙවීම් කාඩ්පත් ආශ්‍රිත දත්ත ග්‍රහණය කර ගැනීම හෝ ගබඩා කර ගැනීම හෝ සිදු කළ යුතුය.

9.2 ගෙවීම් කාඩ්පත් දත්ත හැරුණු විට සෙසු ගෙවීම් ආශ්‍රිත සංවේදී දත්තයන් ග්‍රහණය කිරීම/ගබඩා කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත හා නියාමනයන්ට අනුකූල සමස්ථ පද්ධතියක් තුළ පමණක් සිදු කළ යුතුය.

9.3 තාවකාලික ගබඩාවල පවතින (උදා: සසම්භාවී ප්‍රවේශ මතකය (RAM), තාවකාලික ලිපිගොනු (temp files), වාරක මතකය (cache)) ගිණුම් අංක සහ පාරිභෝගික අක්තපත්‍ර (customer credentials) වැනි සංවේදී තොරතුරු නිසි පරිදි සුරක්ෂිත කළ යුතුය.

9.4 සංවේදී තොරතුරු ඉහතින් ඇති 8.4 වන කොටසෙහි වගන්තියට යටත්ව ජංගම උපාංගය/උපාංගයන් තුළ ගබඩා නොකළ යුතුය.

9.5 දත්ත ගබඩා තුළ දත්ත ගබඩා කිරීමට පෙර එම දත්තවල වලංගු භාවය හා සුපිරිසිදු භාවය තහවුරු කළ යුතුය. ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග හා සම්බන්ධ වන දත්ත ගබඩා, සේවාදායක-සේවායෝජක යන දෙඅන්තයෙන් ම (Server side-Client side) නිසි උපක්‍රම යොදා ආරක්ෂාව දැඩි කළ යුතුය.

10. මංගත නොවන ගනුදෙනු (Offline Transactions)

10.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙන ලද අවස්ථාවක දී හැරුණු කොට, ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගයෙහි මංගත නොවන ගනුදෙනු සඳහා අවසර දීමක් සහ/හෝ පසුකාලීන සම්ප්‍රේෂණය කිරීමේ අරමුණින් ගනුදෙනුවට අදාළ දත්ත උපාංග තුළ ගබඩා කිරීමක් හෝ නොකළ යුතුය.

11. සංකේතනය (Cryptography)

ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග සංකේතන ඇල්ගෝරිතම සැලසුම් කිරීමේ දී හා භාවිතා කිරීමේ දී පහත දැක්වෙන ගුණාංග භාවිතා කළ යුතුය.

11.1 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග දැනට අවදානමට ලක් නොවූ, කර්මාන්ත පරීක්ෂාවට ලක් කර ඇති සහ ෆෙඩරල් මූල්‍ය ආයතන විභාග කවුන්සිලය (FFIEC), ඇමරිකානු ජාතික ප්‍රමිති ආයතනය (ANSI) සහ ජාතික ප්‍රමිති හා තාක්ෂණ ආයතනය (NIST) ඇතුළු ඒවාට පමණක් සීමා නොවූ ආයතන විසින් පිළිගත් සංකේතන ඇල්ගොරිතම (cryptographic algorithms) සහ පුනරාවර්තන ගණනය කිරීම් (iteration counts) භාවිතා කළ යුතුය.

11.2 සංවේදී දත්ත සම්ප්‍රේෂණයේ දී (in transit) හා භාවිතයේ නොයොදා පවතින අවස්ථාවන්හි දී ගුප්ත කේතනය (Encrypt) කර තිබිය යුතුය. තව ද, ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගවල මුරපද ආරක්ෂණ ක්‍රියාවලියේ දී පූරණය (Hashing) කිරීමට අමතරව තවත් කේත උපක්‍රමයක් (Salt) භාවිතා කළ යුතුවේ.

11.3 ගුප්ත කේතනයට අදාළ කේතයන් (Encryption Keys) නිසි ආරක්ෂණ පාලනයන්ට යටත් නොකොට ජංගම උපාංගයේ ගබඩා කර තැබීම නොකළ යුතුය.

12. ප්‍රවාහන ස්ථර ආරක්ෂණය (Transport Layer Protection)

12.1 සියලුම සන්නිවේදනයන් සඳහා ප්‍රවාහන ස්ථර ගුප්ත කේතනය (Encrypt) විය යුතුය.

12.2 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග සඳහා විශ්වසනීය සහතික අධිකාරියක් විසින් නිකුත් කරන ලද වලංගු (SSL) සහතික භාවිතා කළ යුතුය.

12.3 සහතික ඇමිණීම් (Certificate Pinning), යෝග්‍ය විශේෂ ප්‍රතිචාර දැක්වීම් උපක්‍රම (Exception Handling) සමඟ නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ භාවිතා කිරීම සිදු කළ යුතුය.

12.4 සහතික ඇමිණීමේ ක්‍රියාවලිය මඟ හැර යෑමට ඇති අවස්ථා අවම කිරීමට අදාළ පාලනයන් ස්ථාපිත කළ යුතුය.

12.5 SSL සහතිකකරණයේ දී දෝෂ පැන නැගුන විට ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්නා තෙක් ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග ක්‍රියාත්මක වීම නතර කළ යුතු අතර එවැනි දෝෂ සහිත අවස්ථා නොසලකා හැර ඉදිරි පියවර ගැනීම නොකළ යුතුවේ.

12.6 සංවේදී දත්ත සම්ප්‍රේෂණය කළ යුත්තේ ලිපි, යෙදුම තුළ දැනුම් දීම් (in-app notifications) හෝ විද්‍යුත් තැපෑල හරහා පමණි. එක් වරක් භාවිතා කරන මුරපදය (OTP) පමණක් USSD, SMS, MMS හෝ වෙනත් දැනුම්දීමේ ක්‍රම වැනි විකල්ප මාධ්‍යන් භාවිතා කරමින් සම්ප්‍රේෂණය කළ හැකිය.

13. ඉංජිනේරු ප්‍රතිවර්තනය හා නිදොස් කිරීමේ ක්‍රියාවලිය (Reverse Engineering & Debugging)

13.1 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය ක්‍රියාත්මකව පවතින අවස්ථාවන්හි දී එය නිදොස් කිරීමට හෝ දෝෂහරණ (debug) සඳහා කිසිදු තෙවන පාර්ශ්වයක් වෙත අවසර ලබා නොදිය යුතුය.

13.2 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගයෙහි සංක්ෂිප්තකරණය (Minification) සහ සංක්ෂිප්ත ගුණනය (Source Code Obfuscation) යන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කළ යුතුවේ.

14. අයුතු වෙනස් කිරීම් අනාවරණය (Tempering Detection)

14.1 සේවාදායක අන්තයෙහි (Server Side) අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහාත් සේවාලාභී යෙදුමෙහි යම් අනිසි හැසිරවීමක් ඇත්නම් එය හඳුනාගැනීම සඳහාත් පහත දැක්වෙන පරීක්ෂාවන් ස්ථාපනය කළ යුතුය. ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය ආරම්භයේ දී හෝ සුදුසු අවස්ථාවන්හි දී මෙම පරීක්ෂාවන් ක්‍රියාත්මක කළ හැකි අතර එක් පරීක්ෂණයක දී හෝ කිසියම් අක්‍රියතාවක් හෝ බිඳ වැටීමක් ඇති බවට වාර්තා වුවහොත් අදාළ යෙදුම අක්‍රීය කළ යුතුය.

14.1.1. කේත කට්ටලවල පූරණ අගයන් (Hash Values)/ ආවේක්ෂණ ඓක්‍යය (Checksum), කේත ආකෘතියේ කොටසක් හෝ සමස්ථ වැඩසටහන.

14.1.2. පද්ධති ගොනුවල ප්‍රමාණය/විශාලත්වය හෝ ගොනු වෙනස් කිරීමේ කාල මුද්‍රාවන් (Time Stamps) තහවුරු කිරීම.

14.1.3. ක්‍රියාත්මක වන කාලය තුළ දී පැකේජයෙහි අනන්‍යතාවය තහවුරු කිරීම.

14.2 මූලාශ්‍ර කේතයන් වෙත පරිශීලකයාට ප්‍රවේශ වීමට අවසර දී ඇති (Rooted / Jail broken) උපකරණ තුළ ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග ක්‍රියාත්මක වීමට අවසර ලබා නොදිය යුතුය.

14.3 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය ක්‍රියාත්මක වන්නේ නිදොස්කුරු අනාවරණ පසුබිමක (debugger) හෝ අනුගාමික පසුබිමක (emulator) හෝ ද යන වග අනාවරණය කර ගැනීමට ක්‍රමවේදයක් තිබිය යුතු අතර එවැනි පසුබිමක ජංගම යෙදුම් මෘදුකාංගය ක්‍රියාත්මක වීමට ඉඩ නොදිය යුතුය.

15. ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය සඳහා අදාළ මෙහෙයුම් පද්ධති අවසරයන් (Payment Related Mobile Applications Permissions)

15.1 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අවම මෙහෙයුම් පද්ධති (Operating System) අවසරයන් පමණක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

16. ආරක්ෂිත කේතනය (Secure Coding)

ගෙවීම් සේවා සපයන්නන් විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන බවට සහතික විය යුතුය.

16.1 ජංගම යෙදුම් මෘදුකාංග නිර්මාණය කරන පාර්ශව විසින් කේතකරණ භාෂාවට ආවේණික ආරක්ෂිත කේතකරණ භාවිතයන් හා ප්‍රමිතීන් පිළිපැදිය යුතුය.

16.2 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග සඳහා අවදානම් සහගත/අනහැර දමා ඇති සංරචක, නියමාවලි, පුස්තකාල, තාක්ෂණික පිටපත් ආදිය භාවිතා නොකළ යුතුය.

16.3 සංරචක/නියමාවලි/පුස්තකාල/තාක්ෂණික පිටපත් ඇතුළත් කිරීම මත ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය අවදානම් සහගත තත්ත්වයන් වෙත නිරාවරණය නොවිය යුතුය.

16.4 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගයෙහි කිසියම් තාක්ෂණික දුබලතාවක් හෝ අවදානමක් හෝ හඳුනාගතහොත් වහාම ඒවාට නිසි පිළියම් යෙදිය යුතුය.

16.5 පරිගණක කේතය තුළ වින්‍යාස විස්තර (configuration details) වැනි සංවේදී තොරතුරු ඍජු ක්‍රමවේදයක් ඔස්සේ ඇතුළත් කර නොතිබිය යුතුය.

17. ආදාන හා ප්‍රතිදාන හැසිරවීම (Input and Output Handling)

17.1 සියලුම ආදාන හා ප්‍රතිදාන දත්තවල වලංගුභාවය සහ සුපිරිසිදුභාවය සේවාදායක පරිගණක හා සේවාලාභී පරිගණක දෙඅන්තයෙන්ම තහවුරු කළ යුතුය.

17.2 මුරපදය/PIN අංක සඳහා ස්වයංක්‍රියව සම්පූර්ණ වීමේ පහසුකම අක්‍රීයව පැවතිය යුතුය.

18. දෝෂ සහ විශේෂ අවස්ථාවන් හැසිරවීම (Error and Exception Handling)

18.1 ජංගම යෙදුම් මෘදුකාංගයෙහි පූර්ණ ක්‍රියාකාරිත්වයම ආවරණය වන පරිදි, නිසි දෝෂ සහ විශේෂ අවස්ථා හැසිරවීමේ (exception handling) ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය.

18.2 ජංගම යෙදුම් මෘදුකාංගය පරීශීලනයේ දී දෝෂ සහගත තත්ත්වයන් පිළිබඳ හෝ අනතුරු ඇඟවීම පිළිබඳ ස්වයංක්‍රීය දැනුම්දීමේ පණිවිඩ තුළ සංවේදී තොරතුරු සහ/හෝ ඉඟි ඇතුළත් නොකළ යුතුය.

18.3 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගයෙහි පැන නගින සියලු දෝෂ සේවාදායක පරිගණක තුළ වාර්තා කර තැබිය යුතුය.

19. සේවාදායක පරිගණක ආශ්‍රිත යටිතල පහසුකම් (Server-side Infrastructure)

19.1 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය සමඟ සන්නිවේදනය කරනු ලබන සේවාදායක පරිගණක සහ වෙබ් සේවා නිසි ලෙස සුරක්ෂිත කළ යුතුය.

19.2 සේවාදායක පරිගණක වෙත ප්‍රවේශ පාලනය හා විගණනයන්ට අදාළ වාර්තා සේවාදායක පරිගණක මට්ටමින් පවත්වා ගත යුතුය.

19.3 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය මඟින් භාවිතා නොකරන දත්ත හුවමාරු දොරටු හා සේවාවන් සෑම විටම අක්‍රීය තත්ත්වයේ පැවතිය යුතුය.

20. ලොග් වාර්තා සහ දත්ත කාන්දු වීම/අන්සතු වීම (Logs and Data Leakage)

සවිස්තරාත්මක ගනුදෙනු පිළිබඳ ලොග් වාර්තා පහත දැක්වෙන පරිදි පවත්වාගෙන යා යුතුය.

20.1 ලොග් වාර්තාවන් ජංගම යෙදුම් මෘදුකාංගය හා සම්බන්ධ දත්ත සමුදායන්ට අදාළ සේවාදායක පරිගණකවලින් වෙන් කොට පවත්වාගෙන යන ලොග් සේවාදායක පරිගණක තුළ ගබඩා කළ යුතු අතර ඒවාට නිසි ප්‍රවේශ පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතුය.

20.2 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගයෙහි ඇතිවන බිඳබැටීම් පිළිබඳ දත්ත හා වාර්තා, ජංගම උපාංගය තුළ ස්ථිරව ගබඩා නොකළ යුතු අතර ගිණුමට පිවිසීමේ සහ/හෝ ගිණුමෙන් ඉවත්වීමේ ක්‍රියාවලීන් අතරතුර දී ඒවා ඉවත් කළ යුතුය.

20.3 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගයෙහි ලොග් වාර්තා තුළ කිසිදු සංවේදී දත්තයක් අඩංගු නොවිය යුතුය.

20.4 ලොග් වාර්තා වෙනස් කිරීම් හෝ විනාශ කිරීම්වලින් හෝ ආරක්ෂා කර ගැනීම සඳහා ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතු අතර ඒවා වෙත ප්‍රවේශ වීම අවසරලත් නිලධාරීන්ට පමණක් සීමා කළ යුතුය.

20.5 සේවාදායක පරිගණක සහ සමස්ථ පද්ධතියට අදාළ ලොග් වාර්තා විගණනය සඳහා ලබාදිය යුතුය.

20.6 පවත්නා නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව නිශ්චිත කාලයක් සඳහා ලොග් වාර්තා රඳවා තබා ගත යුතුය. කිසියම් වූ අලාභ හානියකට අදාළ තොරතුරු (transaction details) ආරක්ෂා කිරීම සඳහා සුදුසු හා ප්‍රමාණවත් පියවර ගත යුතුය.

21. ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග කේතය සනාථ කිරීමෙහි ඩිජිටල් අත්සන් ක්‍රමවේදය (Code Signing of Payment Related Mobile Application)

21.1 මෘදුකාංගයෙහි කතෘ සහතික කිරීම සඳහාත්, එහි කේතය සහතික කිරීමෙන් පසුව වෙනස් කර හෝ විකෘති කර හෝ නොමැති බවට සහතික කිරීම සඳහාත්, ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග වෙත ඩිජිටල් කේත අත්සන් ක්‍රමවේදයක් භාවිතා කරන බවට ගෙවීම් සේවා සපයන්නා විසින් තහවුරු කළ යුතුය.

21.2 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගයෙහි ඩිජිටල් කේත අත්සන සඳහා භාවිත කරන ආවේණික යතුරු කේතය උත්පාදනය කිරීම සුරක්ෂිතව ගබඩා කිරීම සහ උපස්ථානය යන කරුණුවලට අදාළ ක්‍රියාවන් ගෙවීම් සේවා සපයන්නා සහ/හෝ ජංගම යෙදුම් මෘදුකාංග හිමිකරු විසින් තහවුරු කළ යුතුය.

21.3 ඩිජිටල් කේත අත්සන් ක්‍රමවේදය සමඟ ප්‍රබල ආවේණික යතුරු කේතයක් (strong private key) සකස් කළ යුතුය.

22. ස්ථාපිත කිරීම (Hosting)

22.1 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග ස්ථාපිත කළ යුත්තේ අදාළ වේදිකාවේ සහ/හෝ Google Play Store, Apple App Store, Microsoft Store, Galaxy Store ආදි යෙදුම් ගබඩාවන්හි පමණි. ගෙවීම් සේවා සපයන්නාගේ හෝ විකුණුම්කරුගේ හෝ තුන්වන පාර්ශ්වයකගේ හෝ වෙබ් අඩවි තුළ ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග බාගත කර ගැනීම සඳහා ස්ථාපිත නොකළ යුතුය.

22.2 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංගය අදාළ වේදිකාවේ සහ/හෝ යෙදුම් ගබඩාවේ පමණක් ස්ථාපිත බව ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් හිමිකරු විසින් සියලුම වර්තමාන/ඉදිරියේ දී සම්බන්ධ විය හැකි පරිශීලකයින්ට දැනුම් දෙන බවට ගෙවීම් සේවා සපයන්නන් විසින් තහවුරු කළ යුතුය.

23. කාර්ය අඛණ්ඩතා සැලසුම්කරණය (Business Continuity Planning)

23.1 ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදුම් මෘදුකාංග පද්ධතිය ගොඩනැගීමේ දී තෙවන පාර්ශ්වීය මෘදුකාංග විකුණුම්කරුවෙකු හෝ මෘදුකාංගයක් හෝ භාවිතා කරන්නේ නම්, ගෙවීම් සේවා සපයන්නා හෝ ජංගම යෙදුම් හිමිකරු විසින් හෝ පරිගණක කේතයේ සියලුම අනුවාදයන් සඳහා ආරක්ෂිත විධිවිධානයක් හෝ පාර්ශ්වකරුවන් සමඟ අදාළ ගිවිසුමක් ඇති කර ගැනීමෙන් හෝ කාර්ය අඛණ්ඩතාව සහතික කළ යුතුය.

23.2 කාර්ය අඛණ්ඩතාවය පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ගෙවීම් සේවා සපයන්නා හට නිසි කාර්ය අඛණ්ඩතා සැලසුම් සහ ආපදා ප්‍රතිසාධන විධිවිධාන තිබිය යුතු අතර මේ සඳහා අදාළ පාර්ශ්වයන් සමඟ ගිවිසුම් ඇති කර ගත හැකිය.

23.3 සියලුම ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් සඳහා ප්‍රතිසාධන කාල අරමුණු (recovery time objectives) සහ ප්‍රතිසාධන කේන්ද්‍රීය අරමුණු (recovery point objectives) ගෙවීම් සේවා සපයන්නා විසින් පවත්වා ගෙන යා යුතු අතර, කාර්ය අඛණ්ඩතා සැලසුම්කරණ අභ්‍යාස අතරතුර මෙම ජංගම යෙදුම් පරීක්ෂා කිරීම/මෙහෙයවීම සිදු කළ යුතුය.

24. සංශෝධන කළමනාකරණය (Change Management)

24.1 මෘදුකාංග නිර්මාණ ජීවන චක්‍රය ද (Software Development Life Cycle) ඇතුළුව පද්ධතියේ විස්තර සංශෝධන කළමනාකරණය යටතේ නිසි ලෙස ලේඛනගත කළ යුතුය.

24.2 ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් මෘදුකාංගයෙහි අනුවාද පාලනය, නඩත්තු කිරීම සහ ලේඛනගත කිරීම කළ යුතුය.

24.3 ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් මෘදුකාංගයෙහි සියලු සංශෝධන සඳහා සංශෝධන ඉල්ලීම්/සංශෝධන කළමනාකරණ ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය.

25. අනුකූලතාවය (Compliance)

25.1 සෑම ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් මෘදුකාංගයක්ම මෙම මාර්ගෝපදේශයට අනුකූල බව ගෙවීම් සේවා සපයන ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සහතික කරන ලද අනුකූලතා වාර්තාවක් සහ ගෙවීම් සේවා සපයන්නකු විසින්ම ජංගම යෙදුම වාණිජමය වශයෙන් දියත් කිරීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. විදේශීය බැංකුවක් නම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට, ශ්‍රී ලංකාවේ කාර්යාල මෙහෙයුම් අධීක්ෂණ ප්‍රධානියා කටයුතු කළ යුතුය.

25.2 අනුකූලතාවය සහතික කිරීමට වෙබ් සේවා, සේවාදායක පරිගණක ආශ්‍රිත යටිතල පහසුකම් සහ සන්නිවේදන ජාල ඇතුළුව සමස්ත ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් පද්ධතිය සඳහා තොරතුරු පද්ධති විගණනයක් සහ තොරතුරු ආරක්ෂණ විගණනයක් සිදු කළ යුතුය. ප්‍රමාණවත් ශක්‍යතාවක් ඇති ස්වාධීන තෙවන පාර්ශ්වීය විගණකවරයකු විසින් තොරතුරු පද්ධති විගණනය සිදු කිරීමට තරයේ නිර්දේශ කරයි. ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් මෘදුකාංගය වාණිජමය වශයෙන් දියත් කිරීමට පෙර මෙම විගණනය සිදු කළ යුතු අතර ඉන් අනතුරුව අදාළ විගණනය ගෙවීම් සේවා සපයන ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සිදු කළ හැකිය.

25.3 ස්ථිතික හා ගතික ආරක්ෂක විශ්ලේෂණයන්, ආරක්ෂිත පාලනයන් සඳහා පරිගණක කේත සමාලෝචනය, අක්‍රමවත් පිවිසුම් (Backdoors), ඍජු ක්‍රමවේදයක් ඔස්සේ කේත කරන ලද සංවේදී තොරතුරු (hard coded sensitive data), පරස්පර විරෝධී පරිගණක කේත (contradictory code), සජීවී හා පරීක්ෂණ පරිසර සමාලෝචන (production and testing environment reviews), අවදානම් තක්සේරු කිරීම් (vulnerability assessments), සහ විනිවිද යාම් පරීක්ෂාව (penetration testing) ආදිය විගණනය සඳහා වන විෂය පථයට ඇතුළත් විය යුතු නමුත් ඒවාට පමණක් සීමා නොවිය යුතුය.

25.4 සෑම ගෙවීම් සේවා සපයන්නෙකු විසින් ම පෙර වර්ෂය සඳහා ගෙවීම් සේවා ලබා දී ඇති ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් මෘදුකාංගයන් පිළිබඳව වාර්තාවක් සෑම වර්ෂයක ම ජනවාරි 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. නව සංස්කරණ, පිළියම් හෝ යාවත්කාලීන කිරීම් මෙම වාර්තාවට ඇතුළත් කළ යුතු අතර ගෙවීම් සේවා සපයන ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. විදේශීය බැංකුවක් නම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට, ශ්‍රී ලංකාවේ කාර්යාල මෙහෙයුම් අධීක්ෂණ ප්‍රධානියා කටයුතු කළ යුතුය.

26. පරිශීලක දැනුම්වත්භාවය (User Awareness)

26.1 ගෙවීම් සේවා සපයන්නන් විසින් ගෙවීම් සම්බන්ධ ජංගම යෙදුම් මෘදුකාංගයෙහි පරිශීලකයන් හට, වීඩියෝ සහ මෙහෙයුම් පියවර රූප සටහන් ඇතුළත් වන පරිදි යෙදුමේ භාවිතය පිළිබඳ දැනුම්වත් කිරීමේ තොරතුරු සැපයිය යුතුය.

නියෝජ්‍ය අධිපති

යොමු අංකය : 34/07/029/0001/002 2020 ජූනි 02

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 15/2020

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2020 ජූනි 04 සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන

පහත සඳහන් විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන 2020 ජූනි 04 දින සඳහා අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම්වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය/ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1000 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1000 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ප්‍රාථමික වෙන්දේසියකට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1130 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය

1130 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1200 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1200 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1205 පැය	සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1205 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම නොකළ යුතුය
1205 පැය	නිත්‍ය පහසුකම් සඳහා පද්ධතිය වැසීම	සහභාගිත්ව ආයතන සඳහා 1205 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකමත් නිත්‍ය තැන්පතු පහසුකමත් ලබා ගත නොහැක
1220 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1225 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1230 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1240 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදු වේ.
1240 පැය සිට 1255 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා : වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1255 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම

සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේ දී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේත්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේත්, විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේත් තෙවන හා සිව්වන චක්‍ර පියවීම ඊළඟ ව්‍යාපාරික දිනයේ පෙ.ව. 8.30ට සිදු කරනු ලබයි. (2020 ජූනි 08)

2020 ජූනි 04 වන දිනට අදාළ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙ හි තෙවන චක්‍රය අවලංගු කරනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම්. ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 16/2020 2020 ජූනි 08

බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව

ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වය වැඩි කිරීම තුළින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රවර්ධනය සහ පහසුකම් සැලසීම සඳහා 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතෙහි 44 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතෙහි 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා තම ගනුදෙනුකරුවන් විසින් සිදු කරන ගනුදෙනුවල දී පහත සඳහන් උපරිම සීමාවන්ට විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙකු ම අනුකූල විය යුතුය.

2. ගනුදෙනුවක උපරිම වටිනාකම ;

2.1 රාජ්‍ය හා අනෙකුත් ආයතන සඳහා කෙරෙන මංගත ගෙවීම් සඳහා පහසුකම් සලසන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP) හරහා සිදු කෙරෙන පහත සඳහන් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනු හැර අනෙකුත් අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් මිලියන 5 නොඉක්මවිය යුතුය.

(අ) ගනුදෙනු කේතය "58" යටතේ ශ්‍රී ලංකා රේගුව සඳහා කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් බිලියන 20 නොඉක්මවිය යුතුය.

(ආ) ගනුදෙනු කේතය "62" හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් බිලියන 10 නොඉක්මවිය යුතුය.

(ඇ) ඉහත (අ) සහ (ආ) හි සඳහන් ගනුදෙනු කේත හැර ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව සමඟ ඒකාබද්ධ වන ආයතන සඳහා වෙන් කර ඇති අනෙකුත් කේත හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් මිලියන 250 නොඉක්මවිය යුතුය. ලංකාක්ලියර් (පුද්ගලික) ආයතනය විසින් එක් එක් ආයතන වෙත වෙන් කර ඇති ගනුදෙනු කේතයන් දැනුම් දෙනු ඇත. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ එක් එක් ආයතන විසින් ඉල්ලුම් කර ඇති පරිදි ගනුදෙනුවක උපරිම වටිනාකම රුපියල් මිලියන 250 යන එක් ගනුදෙනුවක උපරිම වටිනාකමට යටත්ව සකස් කෙරෙනු ඇත.

3. ගනුදෙනුවක උපරිම ගාස්තුව ;

3.1 ගනුදෙනුවක් සඳහා අය කළ හැකි උපරිම ගාස්තුව පහත දැක්වෙන සීමාවන් නොඉක්මවිය යුතුය.

(අ) පහත සඳහන් ගෙවීම් මාධ්‍යයන් හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක දී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 50 නොඉක්මවිය යුතුය.

i. අන්තර්ජාලය පදනම් කර ගත් බැංකු කටයුතු මඟින් ;

ii. ජංගම දුරකථන පදනම් කර ගත් බැංකු කටයුතු මඟින් ; සහ

iii. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකුගේ ගනුදෙනුකරුවකු විසින් එම සාමාජිකයාගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මඟින්.

(ආ) බැංකු කවුන්ටරය වෙත පැමිණ සිදු කරන අරමුදල් පැවරීමක දී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

(ඇ) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි අනෙකුත් සාමාජිකයන්ගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක දී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

3.2 වෙළඳ කාණ්ඩය "4106" හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සිදු කරන බදු ගෙවීමක් සඳහා අය කරන උපරිම ගාස්තුව රුපියල් 50 නොඉක්මවිය යුතුය. වෙළඳ කාණ්ඩය "4107" (දඩ ගෙවීම්) සහ "4108" (දඩ පොලිය) හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සිදු කෙරෙන ගෙවීමක දී ගාස්තුවක් අය නොකළ යුතුය.

4. ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ 12/2020 ප්‍රතිස්ථාපනය කරමින් නිකුත් කෙරෙන මෙම චක්‍රලේඛය 2020 ජූනි මස 15 වැනි දින සිට බලපැවැත්වේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

යොමු අංකය : 34/07/029/0001/002 2020 ජූනි 29

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 17/2020

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාලසටහන සංශෝධනය කිරීම

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාලසටහන 2020 ජූලි 06 වන දින සිට අනුගමනය කෙරේ.

ස්ථාවර පහසුකම් සඳහා වන අවසන් වේලාව 1530 පැය දක්වා වෙනස් කර ඇත.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම්වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය/ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් / දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය / දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ප්‍රාථමික වෙන්දේසිය නිකුත් කිරීම (අදාළ වන අවස්ථාවේ දී)	ප්‍රාථමික වෙන්දේසිය නිකුත් කිරීම (අදාළ වන අවස්ථාවේ දී)
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1100 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය

1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1300 පැය	ප්‍රාථමික වෙන්දේසියකට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම / කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම. කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත ගොනු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1315 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාල පියවීම් කටයුතු
1445 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙ හි තෙවන චක්‍රය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි හතරවන චක්‍රය
1500 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දිනය තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1530 පැය	නිත්‍ය පහසුකම් ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතනවලට නිත්‍ය ණය පහසුකම හා නිත්‍ය තැන්පතු පහසුකම 1530 පැයට වසනු ලැබේ
1600 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම

1630 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදු වේ.
1630 පැය සිට 1700 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා : වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1700 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම

සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මගින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේ දී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම්. ආසීම්
අධිකාරි, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2020 ජූලි 28

ගෙවීම් හා පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 17/2020

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2020 අගෝස්තු 05 වන දින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙ හි විශේෂිත දෛනික කාලසටහන

2020 මහ මැතිවරණය හේතුවෙන් පහත සඳහන් විශේෂිත වූ දෛනික මෙහෙයුම් කාලසටහන 2020 අගෝස්තු 05 වන දින අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම්වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය/ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම

0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් /දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය /දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0930 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
0930 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1030 පැය	ප්‍රාථමික වෙන්දේසියකට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම. කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1045 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙ හි දෙවන චක්‍රය
1130 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1130 පැය	තුන්වන පාර්ශ්ව ගණුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දිනය තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම.
1135 පැය	සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1135 පැයෙන් පසුව දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුය
1135 පැය	නිත්‍ය පහසුකම් ලබා ගැනීම අවසන් කිරීම	සහභාගිත්ව ආයතන විසින් 1135 පැයෙන් පසුව නිත්‍ය ණය පහසුකම හා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත නොහැක
1150 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1155 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1200 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1210 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදු වේ.

1210 පැය සිට 1225 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා : වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1225 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම

සහභාගිත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේ දී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේත් තෙවන හා සිව්වන චක්‍ර (2020 අගෝස්තු 05 වන දිනට අදාළ), පියවීම ඊළඟ ව්‍යාපාරික දිනයේ 0830 පැයට සිදු කරනු ලබයි (2020 අගෝස්තු 06).

2020 අගෝස්තු 05 දිනට අදාළ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙ හි තෙවන චක්‍රය අවලංගු කරනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම්. ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 18/2020 2020 සැප්තැම්බර් 17

ප්‍රධාන විධායක නිලධාරි, ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතනවල ප්‍රධානීන් වෙත,

ලංකාසෙට්ල් පද්ධති ගාස්තු සංශෝධනය කිරීම සහ පාරිභෝගික ගනුදෙනු භාරගන්නා අවසන් වේලාව දීර්ඝ කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු ගාස්තු සංශෝධනය කිරීම අනුමත කර ඇති බව දැනුම් දීමට කැමැත්තෙමු.

- ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්ව ආයතන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අය කරනු ලබන මෙහෙයුම් ගාස්තු රු. 450/- සිට රු. 200/- දක්වා අඩු කිරීම

- සහභාගිත්ව ආයතන විසින් ලංකාසෙට්ල් පද්ධතිය හරහා අරමුදල් හුවමාරු කිරීම සඳහා පාරිභෝගිකයන්ගෙන් අය කරනු ලැබූ රු. 1000/-ක් වූ උපරිම ගාස්තුව, රු. 400/- දක්වා අඩු කිරීම

ඒ අනුව, ඉහත ගාස්තු සංශෝධනය 2020 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙනු ලබන අතර, ගෙවීම් සහ පියවීම් චක්‍රලේඛ අංක 03/2015 මෙමඟින් ප්‍රතිස්ථාපනය වේ.

තව ද, ඇමුණුම් අංක 01ට අනුව ලංකාසෙට්ල් පද්ධති රීති 2.1 සංස්කරණයේ ඇමුණුම ආ සංශෝධනය කෙරේ.

මීට අමතරව, 2020 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සෑම ලංකාසෙට්ල් පද්ධති ව්‍යාපාරික දිනයකම (කෙටි ව්‍යාපාරික දිනයන් හි හැර) පාරිභෝගිකයන්ගේ ගනුදෙනු පිළිගැනීමේ කාලය 1230 පැය දක්වා දීර්ඝ කරන ලෙස අපි මෙයින් ඔබට උපදෙස් දෙමු.

මෙයට විශ්වාසි,
ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

පිටපත : අධිකාරී/රාජ්‍ය ණය - ශ්‍රී ලංකා මහ බැංකුව
අධ්‍යක්ෂ/දේශීය කටයුතු - ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම 1

ඇමුණුම ආ

ලංකාසෙට්ල් පද්ධති ගාස්තු හා වියදම් පිළිබඳ උපලේඛනය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, සියලුම ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතනවලින් ගනුදෙනුවක් සඳහා රු. 200/ක මුදලක් අය කරනු ලබයි.

ගාස්තු හා වියදම් සඳහා "ගනුදෙනුවක්" ලෙස අර්ථ දක්වෙන්නේ :

(1) පහත සඳහන් පණිවුඩ භාවිතයෙන් ලංකාසෙට්ල් පද්ධතිය තුළ සහභාගිවන්නන් විසින් ආරම්භ කරන ලද ඔවුන්ගේම පියවීම් ගිණුම් මඟින් කරන ලද බැර කිරීම් :

අ.	MT 102	-	බහු පාරිභෝගික හර හුවමාරුව
ආ.	MT 103	-	තනි පාරිභෝගික හර හුවමාරුව
ඇ.	MT 202	-	සාමාන්‍ය මූල්‍ය ආයතන හුවමාරුව
ඈ.	MT 205	-	මූල්‍ය ආයතන හුවමාරුව ක්‍රියාත්මක කිරීම
ඉ.	MT 541	-	ගෙවීමට එරෙහිව ලැබීම

(2) MT 540 භාවිත කරමින් ලංකාසෙට්ල් පද්ධතිය තුළ සහභාගිවන්නන් විසින් ආරම්භ කරන ලද ඕනෑම පියවන ලද සුරැකුම්පත් ගනුදෙනුවක් - ගෙවීමක් රහිතව මුදා හැරීම.

ඉහත සඳහන් කළ ගනුදෙනු ගාස්තුවලට අමතරව, සහභාගිවන්නන් SWIFT පණිවුඩ හා සම්බන්ධ ගාස්තු දරා ගත යුතුය. මේවා SWIFT මඟින් ස්වාධීනව අය කරනු ලබන අතර, සහභාගිවන්නන් විසින් SWIFT වෙත කෙලින් ම ගෙවිය යුතුය.

යොමු අංකය : 34/01/025/0038/001 2020 නොවැම්බර් 27

සියලුම බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2019 - දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම - අතිරේක 2

2019.03.11 දින නිකුත් කරන ලද 2019 අංක 02 දරන දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම සඳහා වන චක්‍රලේඛය සහ 2019.10.30 දින නිකුත් කරන ලද එහි අතිරේක 1 හා බැඳේ. මෙම චක්‍රලේඛය, ඉහත චක්‍රලේඛය සහ අතිරේකය සමඟ කියවිය යුතුය.

LANKAQR මඟින් ආරම්භ වන ගනුදෙනු සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු 2021 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ.

1. රාජ්‍ය ආයතනවලට කෙරෙන ගෙවීම් සඳහා වෙළඳ අත්පත්කරුවා හට වෙළඳ වට්ටම් අනුපාතය හෝ එයට සමාන ගාස්තුවක් ගෙවීමට අවසර ලබා දී නොමැති අවස්ථාවන්වල දී පමණක් පාරිභෝගිකයාගෙන් රු. 10.00ක උපරිම පහසුකම් ගාස්තුවක් අය කර ගත හැක.

2. පහසුකම් ගාස්තුව පහත දක්වෙන පරිදි අදාළ පාර්ශ්වකරුවන් අතර බෙදිය යුතුය.

වගුව 1 : රජයේ ආයතනයකට සිදු කරන ගනුදෙනු සඳහා රු. 10.00ක පහසුකම් ගාස්තුව බෙදා හැරීම (රුපියල්)

ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ ගාස්තුව	නිකුත් කරන්නාගේ ගාස්තුව	ගනුදෙනු අත්පත්කරුවාගේ ගාස්තුව	වෙළඳ අත්පත්කරුවාගේ ගාස්තුව
0.01	2.50	3.50	3.99

සම්පූර්ණ පහසුකම් ගාස්තුව පාරිභෝගිකයාගෙන් අය කළ යුතු ද, නැතිනම් පහසුකම් ගාස්තුව සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් තමන් විසින් දරන්නේ ද යන්න තීරණය කිරීමට නිකුත් කරන්නාට අවසර ඇත. කෙසේ වෙතත්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට, ගනුදෙනු අත්පත්කරුවාට හා වෙළඳ අත්පත්කරුවාට ඉහත වගුව 1 හි වෙන් කර ඇති ප්‍රමාණයන් වෙනස් කළ නොහැක.

වගුව 1 හි දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව ගනුදෙනු අත්පත්කරුවාගේ ගාස්තුව හා වෙළඳ අත්පත්කරුවාගේ ගාස්තුව, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් බෙදා හරිනු ලැබේ. නිකුත් කරන්නා විසින් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට ගෙවිය යුතු ගාස්තුව දැනට පවතින LANKPAY - CEFTS මාසික ඉන්වොයිසියට එකතු කරනු ඇත.

3. ආගමික ආයතනවලට කෙරෙන පරිත්‍යාග සඳහා, වෙළඳ වට්ටම් අනුපාත හෝ පාරිභෝගික පහසුකම් ගාස්තු අදාළ නොවනු ඇත. කෙසේ වෙතත්, වෙළඳ භාණ්ඩ විකිණීමේ නිරත වන ආගමික ආයතනවලට, වෙළඳ වට්ටම් අනුපාතය අදාළ වන වෙනත් LANKAQR කේතයක් නිකුත් කළ යුතුය.

4. LANKAQR ආරම්භක ගනුදෙනු සඳහා 2020.01.01 සිට 2020.12.31 දක්වා බලපැවැත්වුණු වෙළඳ වට්ටම් අනුපාතය 1% සිට 0.5% දක්වා අඩු කිරීම, තවත් මාස 6ක කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබේ. ඒ අනුව, 2021.01.01 දින සිට 2021.06.30 දිනෙන් අවසන් වන කාලය සඳහා උපරිම වෙළඳ වට්ටම් අනුපාතය 0.5%ක් ලෙස නොවෙනස්ව පවතී.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 19/2020 2020 නොවැම්බර් 27

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සියලුම ප්‍රාථමික සාමාජිකයන් සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත,

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි වගකීම් කළමනාකරණ සීමාවන්

1. 2018 ඔක්තෝබර් 23 වැනි දින නිකුත් කරන ලද 2018 අංක 07 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛයේ දක්වා ඇති වගකීම් කළමනාකරණ සීමාවන් සමාලෝචනය කිරීමෙන් අනතුරුව, එම චක්‍රලේඛයට අනුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා අර්ථ දක්වා ඇති වගකීම් කළමනාකරණ සීමාවන් පවත්වා ගැනීමටත් ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම ගෙවීම් සහ පියවීම් සේවාවන් සඳහා පහසුකම් සැලසීමට විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණ සඳහා වන වගකීම් කළමනාකරණ සීමාවන් සංශෝධනය කිරීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත. වගකීම් කළමනාකරණ සීමාවන් නිර්වචනය කිරීමට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ප්‍රාථමික සාමාජිකයින්ගේ සංශෝධිත වර්ගීකරණය ඇමුණුම I හි දක්වා ඇත.

2. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා අදාළ වන අවම වගකීම් කළමනාකරණ සීමාවන් පහත පරිදි වේ;

   i. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා වන අවම වගකීම් කළමනාකරණ සීමාවන් (රුපියල් මිලියන)

	'අ' කාණ්ඩය	'ආ' කාණ්ඩය	'ඇ' කාණ්ඩය
'අ' කාණ්ඩය	200	150	100
'ආ' කාණ්ඩය	150	150	100
'ඇ' කාණ්ඩය	100	100	100

   ii. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා වන අවම වගකීම් කළමනාකරණ සීමාවන් (රුපියල් මිලියන)

	'අ' කාණ්ඩය	'ආ' කාණ්ඩය	'ඇ' කාණ්ඩය
'අ' කාණ්ඩය	500	350	250
'ආ' කාණ්ඩය	350	350	250
'ඇ' කාණ්ඩය	250	250	250

3. ඕනෑම කාණ්ඩයක ඕනෑම ප්‍රාථමික සාමාජිකයෙකුට වෙනත් ප්‍රාථමික සාමාජිකයෙකු සමඟ ඇතිකරගන්නා අන්‍යෝන්‍ය එකඟතාවය මත, ශ්‍රී ලංකා මහ බැංකුව අර්ථ දක්වා ඇති අවම වගකීම් කළමනාකරණ සීමාවන්ට වඩා වැඩි වගකීම් කළමනාකරණ සීමාවන් ලබා දිය හැකිය.

4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් අර්ථ දක්වන ලද අවම වගකීම් කළමනාකරණ සීමාවන්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය යන පද්ධතිවල ක්‍රියාත්මක කර පවත්වා ගත යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ථ දක්වන ලද අවම සීමාවට වඩා ඉහළ සීමාවන් තීරණය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්වලට පහසුකම් සැලසීම ද සිදු කළ යුතුය.

5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් කාණ්ඩයකට හෝ සියලුම කාණ්ඩවලට හෝ අදාළ වන පරිදි තීරණය කරන ලද අවම සීමාවන් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වර්ගීකරණය වරින් වර සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය නම් සංශෝධනය කරනු ලැබේ.

6. අවම වගකීම් කළමනාකරණ සීමාවන් නිර්ණය කිරීම සඳහා පමණක් මෙම ආකාරයට බලපත්‍රලාභී වාණිජ බැංකු වර්ගීකරණය කර ඇති අතර, එය වෙනත් කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකළ යුතුය.

7. ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 07/2018 ප්‍රතිස්ථාපනය කරමින් නිකුත් කෙරෙන මෙම චක්‍රලේඛය 2020 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

ඇමුණුම 1

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහ/හෝ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකයන්

- **'අ' කාණ්ඩය**

ලංකා බැංකුව
මහජන බැංකුව
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී
සම්පත් බෑන්ක් පී.එල්.සී
හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී
සෙලාන් බෑන්ක් පී.එල්.සී
නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී

- **'ආ' කාණ්ඩය**

ඩී.එෆ්.සී.සී. බෑන්ක් පී.එල්.සී
නේෂන් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී
ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ්
පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී.එල්.සී
ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බෑන්ක්
අමානා බෑන්ක් පී.එල්.සී
යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී
කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ්

- **'ඇ' කාණ්ඩය**

ඩොයිෂ් බෑන්ක් ඒ.ජී.
සිටි බෑන්ක් එන්.ඒ.
එම්.සී.බී. බෑන්ක් ලිමිටඩ්
ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්දියා
හබීබ් බෑන්ක් ලිමිටඩ්
පබ්ලික් බෑන්ක් බර්හාඩ්
ඉන්දියන් බෑන්ක්
බෑන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
ඉන්දියන් ඕවර්සීස් බෑන්ක්

මෙම වර්ගීකරණය බහු ස්ථර වගකීම් කළමනාකරණ සීමාවන් ව්‍යුහය පැනවීම යන තනි කාර්යය සඳහා පමණක් වන අතර, වෙනත් කිසිදු කාර්යයක් සඳහා ප්‍රයෝජනයට නොගත යුතුය.

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 20/2020 2020 දෙසැම්බර් 11

බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව

ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වය වැඩි කිරීම තුළින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රවර්ධනය සහ පහසුකම් සැලසීම සඳහා 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතෙහි 44 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතෙහි 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා තම ගනුදෙනුකරුවන් විසින් සිදු කරන ගනුදෙනුවල දී පහත සඳහන් උපරිම සීමාවන්ට විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙකුම අනුකූල විය යුතුය.

2. ගනුදෙනුවක උපරිම වටිනාකම ;

2.1 රාජ්‍ය හා අනෙකුත් ආයතන සඳහා කෙරෙන මංගත ගෙවීම් සඳහා පහසුකම් සලසන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP) හරහා සිදු කෙරෙන පහත සඳහන් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනු හැර අනෙකුත් අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් මිලියන 5 නොඉක්මවිය යුතුය.

(අ) ගනුදෙනු කේතය "58" යටතේ ශ්‍රී ලංකා රේගුව සඳහා කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් බිලියන 20 නොඉක්මවිය යුතුය.

(ආ) ගනුදෙනු කේතය "62" හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් බිලියන 10 නොඉක්මවිය යුතුය.

(ඇ) ඉහත (අ) සහ (ආ) හි සඳහන් ගනුදෙනු කේත හැර ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව සමඟ ඒකාබද්ධ වන ආයතන සඳහා වෙන් කර ඇති අනෙකුත් කේත හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් මිලියන 250 නොඉක්මවිය යුතුය. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් එක් එක් ආයතන වෙත වෙන් කර ඇති ගනුදෙනු කේතයන් දැනුම් දෙනු ඇත. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ එක් එක් ආයතනය මඟින් ඉල්ලුම් කර ඇති පරිදි ගනුදෙනුවක උපරිම වටිනාකම රුපියල් මිලියන 250 යන එක් ගනුදෙනුවක උපරිම වටිනාකමට යටත්ව සකස් කෙරෙනු ඇත.

3. ගනුදෙනුවක උපරිම ගාස්තුව ;

3.1 ගනුදෙනුවක් සඳහා අය කළ හැකි උපරිම ගාස්තුව පහත දක්වෙන සීමාවන් නොඉක්මවිය යුතුය.

(අ) පහත සඳහන් ගෙවීම් මාධ්‍යයන් හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක දී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 50 නොඉක්මවිය යුතුය.

i. අන්තර්ජාලය පදනම් කර ගත් බැංකු කටයුතු මඟින් ;

ii. ජංගම දුරකථන පදනම් කර ගත් බැංකු කටයුතු මඟින් ; සහ

iii. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකුගේ ගනුදෙනුකරුවකු විසින් එම සාමාජිකයාගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මඟින්.

(ආ) බැංකු කවුන්ටරය වෙත පැමිණ සිදු කරන අරමුදල් පැවරීමක දී, එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

(ඇ) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි අනෙකුත් සාමාජිකයන්ගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක දී, එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

3.2 ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා සිදු කෙරෙන ගනුදෙනුවක් සඳහා අය කෙරෙන උපරිම ගාස්තුව රුපියල් 50 නොඉක්මවිය යුතුය.

3.2 වෙළඳ කාණ්ඩය "4106" හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සිදු කරන බදු ගෙවීමක් සඳහා අය කරන උපරිම ගාස්තුව රුපියල් 50 නොඉක්මවිය යුතුය. වෙළඳ කාණ්ඩය "4107" (දඩ ගෙවීම්) සහ "4108" (දඩ පොලිය) හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සිදු කෙරෙන ගෙවීමක දී ගාස්තුවක් අය නොකළ යුතුය.

4. ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ 16/2020 ප්‍රතිස්ථාපනය කරමින් නිකුත් කෙරෙන මෙම චක්‍රලේඛය 2021 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

මෙහෙයුම් උපදෙස් අංක : RDD/SEPI/2016/01(A.03)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො : 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.01.27

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරීන් සහ සාමාන්‍යාධිකාරීන් වෙත.

හිතවත් මහත්මයාණෙනි/මහත්මියනි,

ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය අදියර II හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම.

මෙහෙයුම් උපදෙස් අංක RDD/SEPI/2016/01 සහ 2017.03.01 දින සංශෝධනය කරන ලද මෙහෙයුම් උපදෙස් අමුණුම් **I** පරිදි තවදුරටත් සංශෝධනය කළ බව සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දන්වා සිටිමු.

මෙම ණය යෝජනා ක්‍රමයෙහි අනෙකුත් සියලුම නියමයන් හා කොන්දේසි නොවෙනස් වනු ඇත.

සංශෝධිත මෙහෙයුම් උපදෙස් 2020.01.27 දින සිට වලංගු වේ.

මෙම සංශෝධනයෙහි ඇතුලත් කරුණු පිළිබඳව, ඔබගේ බැංකු ශාඛාවන්හි අදාල නිලධාරීන් දැනුම්වත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

මෙයට විශ්වාසී,

එම්. එස් .කේ. ධර්මවර්ධන මයා
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත : ප්‍රතිමූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානී

ඇමුණුම I

වගුව I

වගන්ති සහ ලක්ෂණ	2016 අප්‍රේල් දිනැති මුල් මෙහෙයුම් උපදෙස්	2016 ජූනි මස 6 වන දිනැති පළමුවන වන සංශෝධනය	2017 මාර්තු මස 1 වන දිනැති දෙවන සංශෝධනය	2020 ජනවාරි 27 දින සිට තුන්වන සංශෝධනය ක්‍රියාත්මක වේ
වගන්තිය 1 හි : හැඳින්වීම යටතේ ණය මුදල	රුපියල් මිලියන 75 (රු. 75,000,000)		රුපියල් මිලියන 75 මෙයින් අවලංගු කර එය රුපියල් මිලියන 390 ක් ලෙස ආදේශ කෙරේ.	රුපියල් මිලියන 390 මෙයින් අවලංගු කර එය රුපියල් මිලියන 950 ක් ලෙස ආදේශ කෙරේ.
වගන්තිය 6 හි සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ලබාදීම සඳහා සුදුසුකම්ලත් උප ණය ගැනියන් යටතේ පළමුවන ඡේදයේ පළමු වාක්‍ය	"ඕනෑම වෘත්තීය පාඨමාලාවක් හෝ"		"ඕනෑම වෘත්තීය පාඨමාලාවක් හෝ" යන්න මෙයින් අවලංගු කරනු ඇත. ඒ අනුව, එම වාක්‍ය පහත පරිදි වනු ඇත. සහභාගීත්ව මූල්‍ය ආයතනයක් විසින් ණය ලබා දීම සඳහා සුදුසුකම්ලත් උප ණය ගැනියන් නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙහි ලියාපදිංචි වී ඇති පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක් යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහනක් සහ ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධන වැඩසටහනක් සම්පූර්ණ කර තිබිය යුතුය.	දෙවන සංශෝධනයට අනුව
වගන්තිය 10 යෙහි ණය කොන්දේසි යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා ණය ආපසු ගෙවීමේ කාලය	උපරිම කාලය අවුරුදු 4 ක්	ව්‍යාපෘතියේ අවශ්‍යතාව මත පදනම්ව මාස 6 ක සහන කාලයද ඇතුලත්ව උපරිම අවුරුදු 4 ක්	උපරිම කාලය වූ වසර 4 අවලංගු කර උපරිම කාලය වසර 5 ක් ලෙස ආදේශ කරනු ඇත.	දෙවන සංශෝධනයට අනුව
වගන්තිය 10 යෙහි ණය කොන්දේසි යටතේ උප ණය ගැනුම්කරුවන්ට අදාල ණය සීමාව	රුපියල් 500,000			උපරිම මුදල වූ රුපියල් 500,000 මෙයින් අවලංගුකර උපරිම මුදල රුපියල් 1,000,000 ලෙස ආදේශ කරනු ඇත.
15 වගන්තිය : ප්‍රතිමූල්‍ය මුදාහැරීම 15.1 විමසීම් අංකය	ඇමුණුම II	ඇමුණුම II නව ඇමුණුම II සමඟ ප්‍රතිස්ථාපනය වේ.		පළමු සංශෝධනයට අනුව

මෙහෙයුම් උපදෙස් අංක: RDD/CSS/WCL/CG/2020/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නොමේ 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.02.25

සියලුම බලපත්‍රලාභී බැංකු වෙත,

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

1. **හැඳින්වීම**

1.1 රටේ ආර්ථික වර්ධනය තවදුරටත් තීව්‍ර කිරීමේ අරමුණින් මූල්‍ය, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව එක්ව පෙර ණය අක්‍රීය ණය කාණ්ඩයට අයත් වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැනුම්කරුවන්ට (මෙතැන් සිට "ණය ගැනුම්කරුවන්" ලෙස හඳුන්වනු ලැබේ.) කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

1.2 ණය ගෙවීම පැහැර හරින ලද ණය ගැනුම්හිමියන්ට නව කාරක ප්‍රාග්ධන ණය සපයනු ලබන බලපත්‍රලාභී බැංකු සඳහා රජයේ ඇප ආවරණය ලබා දීම අරමුණු කරගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ බලපෑමට ලක් වූ ව්‍යාපාරිකයන් දිරිගැන්වීම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

1.3 ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද "ආර්ථික වර්ධනය තීව්‍ර කිරීම සඳහා ණය සහන" පිළිබඳ 2020.01.30 දිනැති 2020 අංක 2 චක්‍රලේඛයට අනුව බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය කෙටි කාලයක් තුල්දී පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති මූල්‍ය දිරිගැන්වීම් උදෙසා මෙම යෝජනා ක්‍රමය අනුපූරක සහයක් වනු ඇත.

1.4 දැනටමත් අක්‍රීය ණය කාණ්ඩයේ සීමිත ණය ගැනුම්කරුවන් සඳහා 2020 වර්ෂයේ ලබාදෙනු ලබන නව කාරක ප්‍රග්ධන ණය සඳහා සියයට 75 ක් දක්වා ණය ඇප ආවරණයක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ලබා දෙනු ඇත. කාරක ප්‍රාග්ධන ණයෙහි ණය අවදානම වූ ඉතිරි සියයට 25 බලපත්‍රලාභී බැංකු විසින් දරනු ඇත.

2. **ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

2.1 මූල්‍ය, ආර්ථික සහ ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ සහයෝගයෙන් (මෙයින් මතු "අමාත්‍යාංශය" ලෙස හඳුන්වන) සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහභාගීත්වයෙන් මෙම ණය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කරනු ලබයි. මෙතැන් සිට "පරිපාලක" ලෙස හඳුන්වන ලද අතර මෙහෙයුම් උපදෙස් හි 4.2.2 වගන්තිය ප්‍රකාරව සුදුසුකම් ලත් ණය හිමියන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කාරක ප්‍රාග්ධන ණය ලබාදිය යුතු අතර ණය යෝජනා ක්‍රමය යටතේ එම කාරක ප්‍රාග්ධනය සඳහා ණය ඇප ආවරණ පහසුකම ලබාදෙන ලෙස පරිපාලක ඉල්ලා සිටිය හැකිය.

3. **ණය යෝජනා ක්‍රමයෙහි අරමුණ**

ණය යෝජනා ක්‍රමයෙහි අරමුණ පහත පරිදි වේ.

3.1 රටේ ආර්ථික වර්ධනය තීව්‍ර කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් සඳහා දායක වීම.

3.2 පාලනය කළ නොහැකි අහිතකර ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ණය සේවාකරණය කිරීමේ දුෂ්කරතා වලට මුහුණ දී ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහය දැක්වීම.

3.3 අනාගත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම තුළින් ජාතික ආර්ථිකයට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දායකත්වය ඉහළ නැංවීම.

3.4 ණය අවදානම කළමණාකරනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට සහය වීම.

4. **නියමයන් සහ කොන්දේසි**

4.1 සාමාන්‍ය අවශ්‍යතාවයන්

4.1.1 වගන්ති 1 (i), 1 (ii), 1 (iii) ප්‍රකාරව බලපත්‍රලාභී බැංකු විසින් ණය හිමියන්ට නව කාරක ප්‍රාග්ධන ණය ලබාදෙන අතර චක්‍රලේඛය 3 වන වගන්තියට යටත්ව ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඇප ආවරණ සඳහා ණය හිමියන් සුදුසුකම් ලබයි.

4.1.2 ණය හිමියන් විසින් 2020.02.10 දිනට පෙර කරන ලද ලිඛිත ඉල්ලීමක් මත මෙහෙයුම් උපදෙස් හි 4.2.2 වගන්තිය ප්‍රකාරව සුදුසුකම් ලත් ණය හිමියන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කාරක ප්‍රාග්ධන ණය ලබාදිය යුතු අතර ණය යෝජනා ක්‍රමය යටතේ එම කාරක ප්‍රාග්ධනය සඳහා ණය ඇප ආවරණ පහසුකම ලබාදෙන ලෙස පරිපාලක ඉල්ලා සිටිය හැකිය.

4.2.2 වගන්තිය ප්‍රකාරව සුදුසුකම් ලද ණය හිමියන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කාරක ප්‍රාග්ධන ණය ලබා දිය යුතු අතර ණය යෝජනා ක්‍රමය යටතේ එම කාරක ප්‍රාග්ධන ණය සඳහා ණය ඇප ආවරණ පහසුකම ලබා දෙන ලෙස පරිපාලකයින්ගෙන් ඉල්ලා සිටිය හැකිය.

4.1.3 දැනට පවතින ණය පහසුකම් සඳහා නියමිත වෙලාවට ණය සේවාකරණය කිරීමට අපොහොසත් වන ණය ගැනුම්කරුවන්ට ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ හුක්ති විඳීම සඳහා සුදුසුකම් නොලබයි.

4.1.4 ණය නොගෙවා පැහැර හරින ලද කාණ්ඩයේ සිටින ණය ගැනුම්කරුවන්ගේ පෙර ණය පියවීම සඳහා එවැනි ණයහිමියන්ට ලබා දී ඇති කාරක ප්‍රාග්ධන ණය භාවිතා කිරීමට බලපත්‍රලාභී බැංකු අවසර ලබා නොදිය යුතුය.

4.2 සුදුසුකම් ලබන නිර්ණායක

4.2.1 1990 අංක 4 දරණ පනත මඟින් බලපත්‍රලාභී බැංකු විසින් ණය අයකර ගැනීමේ විධිවිධාන යටතේ ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම්දීම් ලබා දී ඇති අයද ඇතුළුව, 2019.12.31 දින වන විට ණය නොගෙවා පැහැර හැරීමේ කාණ්ඩයට අයත්වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය, එවැනි ණය ගැනුම්කරුවන්ගේ ලිඛිත ඉල්ලීමක් මත පහත දක්වා ඇති සහන ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

4.2.2 අදාල ව්‍යාපාර නැවත නගා සිටුවීම සඳහා දැනට ණය නොගෙවා පැහැර හැරීමේ කාණ්ඩයේ සිටින ණයහිමියන් සඳහා ණය ඇගයීමට යටත්ව බලපත්‍රලාභී බැංකු විසින් නව කාරක ප්‍රාග්ධන ණය පහත සඳහන් පරිදි ලබා දිය හැක.

4.2.2.1 ණය යෝජනා ක්‍රමය යටතේ උපරිම මාස 6 ක කාලයක් සහිතව ණයහිමියාගේ උපරිම මාස 3 ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබාදීමට බලපත්‍රලාභී බැංකු වලට සලකා බැලිය හැකිය.

4.2.2.2 අවශ්‍යතාවය මත පදනම්ව ණයෙහි ප්‍රාග්ධනය ආපසු ගෙවීම සඳහා මාස 3ක සහන කාලයක් ලබාදිය හැකිය. කෙසේ වෙතත්, ණය සඳහා වූ පොලිය කාලෝචිත ආකාරයෙන් ගණනය කිරීම අවශ්‍ය වේ.

4.2.2.3 කාරක ප්‍රාග්ධන ණය සඳහා පොලී අනුපාතය 2% + නිත්‍ය ණය පහසුකම් අනුපාතයට නොවැඩි විය යුතුය.

5. සුදුසුකම් ලබන මූල්‍ය ආයතන

රටේ සියලුම බලපත්‍රලාභී බැංකු හරහා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ.

6. ණය ඇප ආවරණ සඳහා ඉල්ලුම් කිරීම

6.1 ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත් වෙනමම ආකෘති පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. RDD/CSS/WCL/CG/ i (ඇමුණුම 1)

6.2 ණය ඇපකර සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කාරක ප්‍රාග්ධන ණය මුදාහැරීමෙන් පසු ණය යෝජනා ක්‍රමය යටතේ ණය හිමියන් ලියාපදිංචි කිරීමටත් සහ ණය හිමියා සඳහා අනුමැතිය ලබා ගැනීමටත් 2020.03.20 දින වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

6.3 අයදුම්පත් විධිමත් ලෙස භාරගත් පසු, පරිපාලක විසින් ඇප ආවරණ සටහන RDD/CSS/WCL/CG/ii (ඇමුණුම ii) බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරනු ලබයි.

6.4 චක්‍රලේඛයට අනුකූල නොවන ඕනෑම අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට පරිපාලකට බලය ඇත.

7. ණය ඇපකරයේ ප්‍රමාණය

7.1 නව කාරක ප්‍රාග්ධන ණයෙහි අලාභයේ ඉතිරිව ඇති මුදලින් සියයට 75ක් දක්වා පමණක් මෙම ණය යෝජනා ක්‍රමය මඟින් ඇප ආවරණයක් ලබා දෙනු ඇත.

8. ණය ඇප ආවරණ පියවීම

8.1 මුදල් නීති පනතේ 108 A(i) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ණය ලබාදෙන ආයතන විසින් සුළු පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දී ඇති ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ණය ඇපකර නිකුත් කළ හැකිය.

ඇපකර අරමුදල් ලබාගැනීම, වාරික එකතු කිරීමට, හිමිකම් ගෙවීමට සහ හිමිකම් හා ඒ හා බැඳුණු කරුණු නිරාකරණය කිරීමෙන් පසු අයකර ගැනීම් ඉල්ලා සිටිය හැකිය.

9. ඇප ආවරණ

9.1 ඇප ආවරණ වාරිකය බලපත්‍රලාභී බැංකු විසින් පරිපාලක වෙත ගෙවා ඇත්නම්, නව කාරක ප්‍රාග්ධන ණයෙහි පළමු වාරිකය බලපත්‍රලාභී බැංකු විසින් මුදා හරින ලද දින සිට ඇප ආවරණ බලපැවැත්වේ.

9.2 සුපරීක්ෂණ හා විචක්ෂණභාවය නිරීක්ෂණය කිරීමට බලපත්‍රලාභී බැංකු අපොහොසත් වී ඇත්නම් සහ ඵලදායී ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලියන්/ක්‍රියාමාර්ගයකින් තොරව ණය මුදා හැරීමේ දී සහ ගිණුම් නිරීක්ෂණය කිරීමේදී නොසැලකිලිමත් ලෙස ක්‍රියාකර ඇත්නම් පරිපාලකගේ තීරණය මත ඇප ආවරණ ක්‍රියාත්මක වීම නවත්වනු ඇත.

10. ඇප වාරික ගෙවීම

10.1 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කාරක ප්‍රාග්ධන ණයෙහි ඇප ආවරණ ලබාදෙන මුදලෙහි වටිනාකම කාරක ප්‍රාග්ධන ණයෙහි ආපසු ගෙවීමේ කාලය සඳහා වාරිකය වසරකට සියයට 1 බැගින් පරිපාලකයාට ගෙවිය යුතුය.

උදා: කාරක ප්‍රාග්ධන ණය රු.100ක් සහ ණය ආපසු ගෙවීමේ කාලය මාස 6ක් නම් වාරිකය

රු. 100 x 0.01 (1%) x 0.75 x 0.5 = රු. 0.375

(වාරිකය) (ඇප ආවරණ) (වසරෙහි ණය ආපසු ගෙවීමේ කාලය)

10.2 ඇප වාරිකය ගෙවීමට අපොහොසත් වීමෙන් ඇප ආවරණ ලැබීමට බලපත්‍රලාභී බැංකු නුසුදුසු වේ.

10.3 පහත 10.5 වගන්තිය ප්‍රකාරව, ආරම්භක කාල සීමාව ඉකුත්වීමට පෙර, කාරක ප්‍රාග්ධන ණයෙහි ඉතිරි ශේෂයෙහි ඇප ආවරණ ලබාදෙන මුදලින් වසරකට සියයට එක බැගින් අතිරේක කාල සීමාව සඳහා අදාල වාරිකය ගෙවීමෙන් කාරක ප්‍රාග්ධන ණය වෙත ලබා දී ඇති ණය ඇපකර පහසුකම තවත් මාස 6ක් දක්වා දීර්ඝ කළ හැකිය.

උදා: කාරක ප්‍රාග්ධන ණයෙහි ඉතිරි ශේෂයෙහි වටිනාකම රු.50ක් සහ දීර්ඝ කරන ලද කාලය මාස 6ක් නම් වාරිකය රු.50 x 0.01 (1%) වාරිකය) x 0.75 (ඇප ආවරණ) x 0.5 (වර්ෂයෙහි දීර්ඝ කරන ලද කාලය) = රු. 0.1875

10.4 දීර්ඝ නොකළහොත් ආරම්භක කාල සීමාව අවසානයේ ණය ඇපකරය ක්‍රියාත්මක වීම නවත්වනු ඇත.

10.5 බලපත්‍රලාභී බැංකු සඳහා ණය ඇප ආවරණ දීර්ඝ කිරීමට කාරක ප්‍රාග්ධන ණය මුදලින් අවම වශයෙන් සියයට 25ක් ආරම්භක කාල සීමාව තුළ අයකර ගත යුතුය.

10.6 වාරික ප්‍රකාශනය සහ ඒ සඳහා ගෙවිය යුතු වාරිකය "අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 වෙත එවිය යුතුය.

10.7 වාරික ප්‍රේෂණ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත චෙක්පතක් මගින් එවිය යුතුය.

10.8 ණය ඇපකර සඳහා වන වාරිකයේ පිරිවැය බලපත්‍රලාභී බැංකු විසින් දරනු ලබන අතර එම ණය හිමියා වෙත නොපැවරිය යුතුය.

11. බලපත්‍රලාභී බැංකුවල වගකීම්

11.1 ණය මුදාහැරීමට පෙර බලපෑමට ලක් වූ ව්‍යාපාර පුනර්ජීවනය කිරීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා සියලුම බලපත්‍රලාභී බැංකු විසින් සියලුම සාධාරණ පියවරයන් ගත යුතුය.

11.2 ණය ගැනුම්කරුට ණය ලබාදීමේ දී බලපත්‍රලාභී බැංකු සෑම විටම නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලීව කටයුතු කළ යුතු අතර ණය ලබාදී ඇති කාර්යය සඳහා යොදා ගන්නා බවට සහතික විය යුතුය.

11.3 බලපත්‍රලාභී බැංකු විසින් ගිණුම්වල තත්ත්වය සහ මෙහෙයුම් පිළිබඳව අධීක්ෂණය කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවල්දී කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

11.4 ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති කාරක ප්‍රාග්ධන ණය නැවත අයකර ගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් අවශ්‍ය සහ ප්‍රමාණවත් පියවරයන් ගත යුතුය.

11.5 මෙහෙයුම් උපදෙස් හි 10 වන වගන්තිය විස්තර කර ඇති පරිදි බලපත්‍රලාභී බැංකු විසින් වාරිකය පරිදි බලපත්‍රලාභී බැංකු විසින් වාරිකය පරිපාලක වෙත ගෙවිය යුතුය.

11.6 බලපත්‍රලාභී බැංකු විසින් වාර්තා තබා ගත යුතු අතර සෑම ණය මුදලකටම අදාල දත්ත සහ තොරතුරු පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතුය.

11.7 පරිපාලකගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති කිසිඳු ණයක් කපා හැරීමට බලපත්‍රලාභී බැංකුවලට අවසර නැත.

11.8 ණය ගැනුම්කරුවන් විසින් ලබා ගන්නා ලද කාරක ප්‍රාග්ධන ණය ව්‍යාපාරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා යොදා ගන්නා බවට සහතික විය යුතු අතර නොපියවූ ණය කාණ්ඩයේ තිබෙන පෙර ණය පියවීමට හෝ කිසිඳු අරමුණක් සඳහා එම ණය භාවිතා නොකරන බවට බලපත්‍රලාභී බැංකු සහතික විය යුතුය.

12. පරිපාලකගේ වගකීම

12.1 මෙම ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කළ යුතු අතර අවශ්‍ය විටෙක මෙහෙයුම් උපදෙස් සංශෝධන කිරීමට යටත්ය.

12.2 ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සුදුසුකම්ලත් ණයගැතියන් සඳහා බලපත්‍රලාභී බැංකු වෙත ඇප ආවරණ නිකුත් කිරීම.

12.3 මෙහෙයුම් උපදෙස් හි විස්තර කර ඇති පරිදි බලපත්‍රලාභී බැංකු වලින් වාරික එකතු කිරීම.

12.4 ශ්‍රී ලංකා රජය වෙනුවෙන් යෝජනා ක්‍රමයේ අධීක්ෂණය සහ ඇගයීම් ක්‍රියාවලිය සිදුකිරීම හා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

12.5 නව කාරක ප්‍රාග්ධන ණය ලබා දීමේදී බලපත්‍රලාභී බැංකු යෝජනා ක්‍රමයේ අවශ්‍යතා/නියමයන් සහ කොන්දේසි හෝ දුරදර්ශී බැංකු භාවිතයන් උල්ලංඝනය කර ඇති බවට අනාවරණය වුවහොත් නිකුත් කරන ලද ණය ඇපකර අවලංගු කිරීමේ අයිතිය පරිපාලක සතුය.

13. පැහැර හැරීම් සහ කල් ඉකුත්වීම් වාර්තා කිරීම

13.1 ණය හෝ එහි යම් වාරිකයක් නියමිත දිනට ආපසු ගෙවන්නේ නම් එවැනි හිඟ මුදල් ණය ගැතියාගෙන් අයකර ගැනීමට බලපත්‍රලාභී බැංකු විසින් කඩිනම් සහ ඵලදායී පියවරයන් ගතයුතුය.

13.2 ණය වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම සහ ප්‍රතිපාදන සැපයීම පිළිබඳව 2008 අංක 3 සහ අංක 04 යන බැංකු පනතේ නියමයන්ට අනුකූලව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ලද නව කාරක ප්‍රාග්ධන ණය නොපියවූ ණය ලෙස වර්ගීකරණය කර ඇතිවිටද, ණයගැනුම්කරුගේ තත්ත්වය පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් බලපත්‍රලාභී බැංකු විසින් පරිපාලක වෙත වාර්තාවක් ලබාදිය යුතුවේ. වාර්තාවට පහත තොරතුරු ඇතුළත් වේ.

13.2.1 ණයගැනුම්කරු මුහුණ දෙන ගැටළු තක්සේරු කිරීම

13.2.2 ණය ආපසු ගෙවීමට ණය ගැනුම්කරුවාට ඇති හැකියාව තක්සේරු කිරීම.

13.2.3 ණය ආපසු අයකර ගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ගනු ලබන පියවරයන් සහ සලකා බලනු ලබන අනාගත පියවරයන්

13.2.4 නැවත නඟා සිටුවීම/ නැවත ණය අයකරගැනීම පිළිබඳ බලපත්‍රලාභී බැංකු වල මතය

13.2.5 පරිපාලකයාට අවශ්‍ය විය හැකි වෙනත් තොරතුරු

14. හිමිකම් පෑමේ ක්‍රියාවලිය

14.1 නව කාරක ප්‍රාග්ධන ණයෙහි ගෙවා ගැනීමට නොහැකි වූ කිසියම් ප්‍රමාණයක් හෝ ණය හිමියාට චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ නොහැකි වූ විට හෝ අදාල ණය මුදල අක්‍රීය ණය කාණ්ඩයට මාරු කල දින සිට මාසයක් ඇතුළත බලපත්‍රලාභී බැංකු විසින් ණය ගැනුම්කරු වෙත දන්වා යැවිය යුතුය.

14.2 පසුව බලපත්‍රලාභී බැංකු විසින් මාස 1ක් කල් ඉකුත් වූ පසු RDD/CSS/WCL/CG/111 (ඇමුණුම ii) මඟින් අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එන්තරවාසි ඉදිරිපත් කළ හැකි අතර නමුත් එය ගැනුම්කරුට දැන්වූ දින සිට මාස දෙකකට නොඅඩු විය යුතුය.

14.3 ඉහත 14.1 වගන්තියෙ අරමුණු සඳහා පැහැර හරින ලද ණය ගැනුම්කරු වෙත ඉල්ලීම් ලිපියක් මඟින් එන්තරවාසි ලබාදිය හැකිය.

14.4 ණය ගැනුම්කරුට නිකුත් කරන ලද එන්තරවාසි සහතික කළ පිටපත් සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා භාරගත් බවට සාක්ෂි හිමිකම් ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

14.5 පැහැර හරින ලද ණය මුදල, ඇපකරයේ ආවරණය වන මුල් මුදල ලෙස සැලකේ.

14.6 හිමිකම්පෑමේ පෝරමය ලැබීමෙන් පසු පරිපාලක විසින් 14.7 සහ 14.8 යන වගන්ති ප්‍රකාරව කාරක ප්‍රාග්ධන ණයෙහි හිඟ මුදලින් සියයට හැත්තෑ පහක් වාරික දෙකකදී ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මෙම මෙහෙයුම් උපදෙස් යටතේ, අවශ්‍ය පරිදි අවශ්‍ය අධීක්ෂණ සහ ක්‍රියාමාර්ග ගැනීමට බලපත්‍රලාභී බැංකු අසමත් වී නම් හෝ නොසැලකිලිමත් වී ඇති බව පරිපාලකයා විසින් සොයාගනු ලැබුවහොත්, ගෙවන ලද මුදල ඉල්ලා සිටීමේ අයිතිය පරිපාලක සතුය.

14.7 RDD/CSS/WCL/CG/iii (ඇමුණුම iii) හි දක්වා ඇති පරිදි හිමිකම් ඉල්ලුම් පත්‍රය ලැබීමෙන් පසු පරිපාලක විසින් කාරක ප්‍රාග්ධන ණයෙහි හිඟ මුදලින් සියයට පනහක් ගෙවනු ලබන්නේ 7.1 වගන්තිය දක්වා ඇති සීමාවන්ට යටත්වය. බලපත්‍රලාභී බැංකු විසින් ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තර වාර්තාවක් සහ අදාල සියලුම ලේඛන සාක්ෂි පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතුය.

14.8 ඉහත 14.7 වගන්තිය සඳහන් පළමු ගෙවීමෙන් මාස නවයක් ඇතුළත නීතිමය ක්‍රියාමාර්ගයන්ගෙන් පැන නඟින සිද්ධි අංක සමඟ පළමු ගෙවීමෙන් පසු ඉතිරි ශේෂය එනම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාරක ප්‍රාග්ධන ණයෙහි හිඟ මුදලින් සහතික කරන ලද හිමිකම් වලින් සියයට පනහක් ගෙවනු ලබන්නේ RDD/CSS/WCL/CG/iv (ඇමුණුම iv) ආකෘති පත්‍රය පරිපාලක වෙත ලබා දීමෙන් පසුවය.

14.9 බලපත්‍රලාභී බැංකු විසින් සැලකිය යුතු ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම සහ පරිපාලක විසින් ව්‍යාපාර පරීක්ෂා කිරීමට යටත්ව ඉහත 14.8 හි සඳහන් කර ඇති පරිදි සිද්ධි අංක නොමැතිව පරිපාලක විසින් එක් එක් සිද්ධි පදනම මත ඇප ඉල්ලීම භාරගත හැකිය.

15. පැහැර හරින ලද ණය

15.1 ණය වර්ගීකරණය, ආදායම් හඳුනා ගැනීම සහ ණය වර්ගීකරණයට අදාළව ප්‍රතිපාදන සැපයීම සහ ඒ මත ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2008 බැංකු පනත් අංක 03 සහ 04 යන විධිවිධාන බලපත්‍රලාභී බැංකු විසින් පිළිපැදිය යුතු වේ.

15.2 හිමිකම් පෑමත් නිරාකරණය කර ඇති සෑම විටක දීම අදාළ ණය සඳහා ණය ඇපකරයට අදාළව යෝජිත ක්‍රමය යටතේ ලබා දී ඇති අංශ වල නොපියවූ ණය ශේෂයන් බලපත්‍රලාභී බැංකු විසින් නියම කළ හැකිය.

16. ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග

16.1 ණය ඇපකර තිබුණ ද, ණය යෝජනා ක්‍රමය යටතේ ණය අයකර ගැනීම අධීක්ෂණය කිරීම සඳහා නිසි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් බලපත්‍රලාභී බැංකු සතුව තිබිය යුතුය.

16.2 ඕනෑම කල් ඉකුත් වූ මුදලක් නැවත අයකර ගැනීමට ක්ෂණික සහ ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට බලපත්‍රලාභී බැංකු උත්සහ කළ යුතු අතර වරින් වර ව්‍යාපෘතියේ ක්‍රියාමාර්ග හා ප්‍රගතිය පිළිබඳව පරිපාලකවරය දැනුම්වත් කළ යුතුය.

16.3 පැහැර හරින ලද ණය ගැනුම්කරුට එරෙහිව ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා පරිපාලක විසින් යෝජනා කරනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් බලපත්‍රලාභී බැංකු විසින් ගත යුතුය. මෙම ඇපකර යෝජනා ක්‍රමය යටතේ හිමිකම් පෑවත් සමථයට පත් කිරීමෙන් පසුව පවා එවැනි ණය ගැනුම්කරුවන්ට එරෙහිව දැනටමත් ගෙන ඇති කිසිඳු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් බලපත්‍රලාභී බැංකු විසින් අත්හිටවනු නොලැබේ.

17. පශ්චාත් හිමිකම් නිරවුල් කිරීම

17.1 ඇපකර හිමිකම් ගෙවීමෙන් පසු ණය ගැනුම්කරුගෙන් අයකර ගන්නා ලද සියලුම මුදල් පිළිවෙලින් 75:25 අනුපාතයට පරිපාලක සහ බලපත්‍රලාභී බැංකු අතර බෙදාගත යුතු අතර එයින් ණය අලාභය බෙදාගනු ලබයි. මෙම අරමුණ සඳහා පරිපාලක විසින් නිකුත් කරන ලද RDD/CSS/WCL/CG/v (ඇමුණුම v) ආකෘතිය භාවිතා කරනු ලැබේ.

17.2 ඉහත ආකෘති පත්‍රය වාර්ෂිකව ජනවාරි සිට ජූනි දක්වා සහ ජූලි සිට දෙසැම්බර් දක්වා බලපත්‍රලාභී බැංකු විසින් ඉදිරිපත් කළ යුතුය. ණය අයකර ගැනීම් සෑම වසරකම ජූනි 30 සිට දෙසැම්බර් 31 දක්වා දින 30ක් ඇතුළත පරිපාලක වෙත ලබාදිය යුතුය.

17.3 පරිපාලකගෙන් ලැබුණු මුළු ඇපකර මුදල සහ ණය අයකර ගැනීම් ආදිය සඳහන් කරන ලේඛනයක් බලපත්‍රලාභී බැංකු විසින් පවත්වාගෙන යා යුතු අතර, පරීක්ෂණ කාල සීමාව තුළ ලේඛනය පරිපාලකට හෝ පරිපාලක විසින් බලය පවරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරියෙකුට ලබාදිය යුතුය.

17.4 කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය යටතේ දෛනික පිරිවැය ඇතුළුව ණය අයකර ගැනීම් සඳහා වන වියදම් සඳහා ණය හිමියාගෙන් අයකර ගන්නා මුදල සඳහා පළමු ගාස්තුව අය කෙරේ. අයකරගත් ඉතිරි ණය මුදල 17.1 වගන්තියේ දක්වා ඇති අනුපාතයට බෙදා ගත යුතුය. අනෙක් සියලුම ගාස්තු පියවිය යුත්තේ පරිපාලකගේ කොටස ප්‍රතිපූරණය කිරීමෙන් පසුවය.

18. පරීක්ෂණ පැවැත්වීම

18.1 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ අවශ්‍ය ඕනෑම ණය මුදලකට අදාල ගිණුම් පොත් සහ බලපත්‍රලාභී බැංකුවල අනෙකුත් වාර්තා පරීක්ෂා කිරීමට පරිපාලකයාට අයිතිය තිබිය යුතුය.

18.2 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය සම්පාදනය කරන ලද ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන ගිණුම් පොත්, ණය ගැනුම්කරු පරිපාලක සහ/හෝ ශ්‍රී ලංකා රජය වෙත ඉදිරිපත් කළ යුතු වේ. එමෙන්ම පරිපාලක සහ හෝ ශ්‍රී ලංකා රජය විසින් බලය පවරන ලද නිලධාරියාට අවශ්‍ය වූ විටදී ව්‍යාපෘතිය පරීක්ෂා කිරීමට අවසර ලබාදිය යුතු අතර එක් එක් ණය මුදලෙහි කොන්දේසියක් බවට පත් කළ යුතුය.

18.3 බලපත්‍රලාභී බැංකු විසින් යෝජනා ක්‍රමයේ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කර ඇති බව අනාවරණය වුවහොත් ඇප ආවරණ අවලංගු කිරීමේ අයිතිය හෝ හිමිකම් පියවීම් සඳහා ගෙවනු ලබන ඕනෑම ගෙවීමක් පරිපාලක සතුය.

19. ප්‍රතිලාභ සහ තොරතුරු සැපයීම

19.1 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහතික කර ඇති ඕනෑම ණයක් සම්බන්ධයෙන් පරිපාලක විසින් තොරතුරු ඉල්ලා සිටින විට බලපත්‍රලාභී බැංකු විසින් එවැනි ප්‍රතිලාභ ඉදිරිපත් කර එවැනි තොරතුරු සැපයිය යුතුය.

19.2 ඉල්ලන අවස්ථාවේදී පරිපාලක විසින් අමාත්‍යාංශයට වාර්තා ඉදිරිපත් කළ යුතුය.

20. වෙනස් කිරීම් සහ අතිරේක ප්‍රතිපාදන

20.1 යෝජනා ක්‍රමය යටතේ නිකුත් කර ඇති කිසියම් ඇපකරයන්ට පැන නගින අයිතිවාසිකම් හෝ බැඳීම් වලට බලපෑම් නොකර යෝජනා ක්‍රමය වෙනස් කිරීමට හෝ නැවැත්වීමේ අයිතිය පරිපාලක සතුය.

20.2 යෝජනා ක්‍රමයේ නිශ්චිතව දක්වා නොමැති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් පරිපාලක විසින් යෝජනා ක්‍රමයේ අරමුණ සඳහා අවශ්‍ය විය හැකි අතිරේක හෝ අමතර ප්‍රතිපාදන ලබාදිය යුතුය.

ණය යෝජනා ක්‍රමයේ වලංගු දිනය 2020 පෙබරවාරි 26 වේ.

දිනය : 2020.02.25

අධ්‍යක්ෂ

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR/COVID19/2020/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.04.01

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම හඳුන්වා දීම සඳහා වූ මෙහෙයුම් උපදෙස් හා සබැඳි පරිශිෂ්ඨය.

("සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම)

COVID-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ණය සහන ලබා දීම සඳහා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද 2010.03.22 දිනැති RDD/PR/2010/03 දරණ සංශෝධිත මෙහෙයුම් උපදෙස් හි පරිශිෂ්ඨයකි.

1. **හැඳින්වීම**

1.1 සමස්ථයක් ලෙස, ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වයට සහ රටේ ආර්ථික වර්ධනයට සිදුවිය හැකි බාධාවන් සැලකිල්ලට ගෙන COVID-19 වසංගතයෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන් නැවත නඟා සිටුවීමේ ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියා ඇතුළුව ව්‍යාපාර සඳහා රුපියල් බිලියන 50ක අර්ධ වාර්ෂික (මාස 6ක) ප්‍රතිමූල්‍යකරණ පහසුකම සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජයේ උපදෙස් පරිදි සහන මාලාවක් 2020.03.27 දිනැති 2020 අංක 05 දරණ මූල්‍ය මණ්ඩල චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇත.

1.2 මෙම මෙහෙයුම් උපදෙස් සඳහා වන පරිශිෂ්ඨයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන දැනට ක්‍රියාත්මක වන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ වෙනමම ප්‍රතිමූල්‍යකරණ සංරචකයක් ලෙස COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන සැපයීමයි. ඒ අනුව, COVID-19 හේතුවෙන් දැඩි බලපෑමට පත් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් නව ණය සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ හඳුන්වා දී ඇති මෙම නව ප්‍රතිමූල්‍යකරණ සංරචකය හරහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වලට හැකියාවක් පවතී.

1.3 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන ණය සංරචකයන්ගෙන් වෙන්කර හඳුනාගැනීම සඳහා මෙම නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම ලෙස හඳුන්වනු ලැබේ.

1.4 තවද, මෙමඟින් 2010.03.22 දිනැති RDD/PR/2010/03 (සංශෝධිත) දරන මෙහෙයුම් උපදෙස් මඟින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සඳහා දක්වා ඇති නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතින බවත් මෙම නව පරිශිෂ්ඨය නිකුත් කිරීමෙන් 2010.03.22 දිනැති RDD/PR/2010/03 (සංශෝධිත) දරණ මෙහෙයුම් උපදෙස් මඟින් එම ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන බවත් දන්වනු ලබයි.

2. **මෙහෙයුම් ප්‍රදේශ : දිවයිනේ සියලුම ප්‍රදේශ**

3. **අරමුදල්**

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ හඳුන්වා දී ඇති නව ප්‍රතිමූල්‍යකරණ සංරචකය වන සෞභාග්‍යා COVID-19 පුනරුද සහන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අරමුදල් සපයනු ඇත.

4. **සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ක්‍රියාත්මක කිරීම**

4.1 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ නව ණය සංරචකයක් ලෙස "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ක්‍රියාත්මක වනු ඇත.

4.2 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ මෙන්ම සෞභාග්‍යා COVID-19 පුනරුද සහන හි ද ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ඇත.

5. බලාත්මක දිනය

2010.03.22 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 දරන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ ඇති මෙහෙයුම් උපදෙස් සඳහා වූ මෙම පරිශිෂ්ඨය 2020.04.01 දින සිට බලාත්මක වනු ඇත.

6. සහභාගීත්ව මූල්‍ය ආයතන

6.1 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම්ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන සියල්ලම "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම ක්‍රියාත්මක කිරීමට සුදුසුකම්ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස ද සළකනු ලැබේ.

6.2 තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ නිර්දේශය මත ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ඉහත සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ණය පහසුකම ලබාදීමේ සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස සුදුසුකම් ලබයි. මෙම සහන ණය යෝජනා ක්‍රමය යටතේ, එසේ සහභාගි වීමට කැමති බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බලපත්‍රලාභී විශේෂ බැංකු 2020.04.15 දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ වෙත සිය කැමැත්ත ප්‍රකාශ කළ යුතුය. එසේ වූවද, ඉහත ආකාරයට කැමැත්ත ප්‍රකාශ කරන ලද බැංකු, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස සළකනු නොලැබේ.

6.3 එක් එක් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා අදාළ ප්‍රතිමූල්‍යකරණ සීමාවන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තීරණය කර දැනුම් දෙනු ඇත.

7. සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් හා ණය අයදුම්කරුවන්

7.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ දෙවන පරිච්ඡේදයට අනුව කඩඉණ19 වසංගත තත්ත්වයට පෙර සිට ක්‍රියාත්මකව පැවති ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ක්‍රියාත්මක කළ ඕනෑම ආදායම් උත්පාදන ක්‍රියාවලියක් හෝ ආර්ථික ක්‍රියාදාමයක් එකී කටයුතු යලි සක්‍රීය කිරීම උදෙසා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබයි. මෙකී අරමුණ උදෙසා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙනු ලබන ණය සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

7.2 "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ණය" පහසුකම යටතේ, දැනට පවතින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යනය කිරීම පිණිස ණය ලබා දෙනු ලැබේ.

7.3 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ මීට පෙර හෝ දැනටමත් COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති ණය ගැණුම්කරුවන් ද මෙම පරිශිෂ්ඨය යටතේ ණය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

8. "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි මූලික ලක්ෂණ

8.1 උපරිම ණය මුදල	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෙකුට/උප ණය ගැනුම්කරුවෙකුට රුපියල් මිලියන 25කට යටත්ව මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයට සරිලන ණය මුදලක්
8.2 ණය ගැනුම්කරු විසින් සහභාගීත්ව මූල්‍ය අයතන වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය	අ) වසරකට සියයට 4කි ආ) සහභාගීත්ව මූල්‍ය ආයතන කිසිඳු අයුරකින් සියයට 4ක් ඉක්ම වූ පොලී අනුපාතයක් අය නොකළ යුතුය.
8.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය	වසරකට සියයට 1කි
8.4 සහන කාලය	අ) ව්‍යාපාර කටයුත්තේ ස්වභාවය මත පදනම්ව, මාස 6ක උපරිම සහන කාලයක් ආ) මෙකී සහන කාලය තුළ ණය ගැනුම්කරුවන් ප්‍රාග්ධනය හෝ පොලිය ගෙවීම අවශ්‍ය නොවේ.
8.5 ණය ආපසු ගෙවීමේ කාලය	සහන කාල සීමාව ද ඇතුලත්ව උපරිම කාලය මාස 24කි.
8.6 ඇප සුරැකුම්	ආර්ථික කටයුත්තේ ශක්‍යතාවය කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. එසේ වුවත් "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම යටතේ ලබාදෙනු ලබන ණය සඳහා, අවදානම අවම කිරීමේ උපක්‍රමයක් ලෙස සුදුසු පරිදි ඇප සුරැකුම් ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වලට හැකියාව ඇත.

9. ණය ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම

9.1 තම ශාඛා මට්ටමින් COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වූ අයදුම්කරුවන් හෝ/ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීමට හා 2020.04.30 දිනට පෙර එකී අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාල මඟින් අදාළ මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය.

9.2 "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම යටතේ ණය ලබා ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් පිළිබඳ විස්තර මෙම පරිශිෂ්ඨය සහභාගීත්ව මූල්‍ය ආයතන ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ණය ලියාපදිංචි අයදුම්පත් භාරදීමේ අවසාන දිනය 2020.05.22 වේ.

9.3 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා දත්ත ඇමුණුම් 1 (ආ) මෘදු පිටපත, උප ණය අයදුම්පත් ලැබී දින 10ක් තුල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙනු ලබන ලිපිනයන්ට විද්‍යුත් තැපෑලෙන් යොමු කළ යුතුය.

9.4 ඇමුණුම (අ) සහ (ආ) යටතේ ලබාදෙනු ලබන තොරතුරු වල අනුකූලතාවය සහ නිවැරදි භාවය සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතුය.

9.5 අදාල සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණයට යටත්ව, වැඩ කරන දින 5ක් තුළ දී ඇමුණුම (ආ) හි සඳහන් තොරතුරු මත පදනම්ව අයදුම්පත් ලද අනුපිළිවෙලට අනුව උප ණය අයදුම්කරුවන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරනු ලැබේ. කෙසේ වූවද, ඇමුණුම (අ) සහ ඇමුණම (ආ) හි දාම අයදුම්පත් ලැබීමෙන් පසුව එම ඇමුණුම් වල යම් වෙනසක් නිරීක්ෂණය වුවහොත්, සහභාගීත්ව මූල්‍ය ආයතනයට පූර්ව දැනුම් දීමකින් තොරව අදාල උප ණය ගැනුම්කරුගේ ණය ලියාපදිංචිය අවලංගු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

9.6 යම් හෙයකින් අමතර තොරතුරු අවශ්‍ය විටෙක හෝ අමතර පැහැදිලි කිරීම් අවශ්‍ය වන අවස්ථාවක කිසියම් අයදුම්පතක් නැවත සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

9.7 උප ණය අයදුම්කරුවන් ලියා පදිංචි කිරීමෙන් අනතුරුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කළ ණය සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කොට එම අංකය සහභාගීත්ව මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දෙනු ලැබේ. කිසියම් ණය අයදුම්කරුවෙකු සම්බන්ධ ඉදිරි කටයුතු වලදී මෙකී ලියාපදිංචි අංකය භාවිතා කළ යුතුය.

10. උප ණය මුදා හැරීම

10.1 කිසියම් ණය අයදුම්කරුවෙකු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කර සති 1ක් තුළ ඊට අදාළ ණය මුදල සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මුදා හැරිය යුතුය.

10.2 යම් හෙයකින් කිසියම් ණය මුදලක් සති 1ක් තුළ මුදා හැරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන අපොහොසත් වේ නම් ඊට අදාළ හේතු දක්වමින් ඒ පිළිබඳව නොපමාව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතු අතර එහි ලා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සුදුසු පරිදි අවශ්‍ය තීරණ/ක්‍රියාමාර්ග වෙත එළඹෙනු ඇත.

10.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කිසියම් ණය මුදලක් දින 30ක් තුළ මුදා නොහැරීම හා ඒ පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පිළිගත හැකි හේතූන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකී ණය ලියාපදිංචිය සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු වේ.

10.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ හේතූන් නිසා මුදා හැරීමට නොහැකි වූ ලියාපදිංචි වී ඇති ණය පිළිබඳ වාර්තාවක් 2020.06.15 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

11. ප්‍රතිමූල්‍ය ක්‍රමවේදය

11.1 මෙම පරිශිෂ්ඨයෙහි සඳහන් නියමයන් සහ කොන්දේසි වලට අදාළව උප ණය සඳහා 100%ක ප්‍රතිමූල්‍ය පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත සැපයෙනු ඇත.

11.2 ලියාපදිංචි ණයකරුවන් වෙත ණය මුදල් මුදා හැරීමෙන් පසු ප්‍රතිමූල්‍ය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. සෑම ප්‍රතිමූල්‍ය අයදුම්පතක් සමඟ පහත ලේඛන ලැබීමට සැලැස්විය යුතුය.

i. ප්‍රතිමූල්‍ය සඳහා වන අයදුම්පත ඇමුණුම II
ii. ප්‍රතිමූල්‍ය සඳහා ණය මුදා හරින ලද ණය සඳහා අදාල වන ප්‍රකාශනය ඇමුණුම III
iii. ඉල්ලුම් පොරොන්දු පත්‍රය ඇමුණුම IV
iv. භාරදීමේ කුවිතාන්සිය ඇමුණුම V
v. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහතික වන ආකාරයේ පැවරුම ඇමුණුම VI
vi. ණය මුදා හැරීමේ ලිපිය ඇමුණුම VI

11.3 අදාළ සියළු ලිපි ලේඛන සහ තොරතුරු සහිතව සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය අයදුම්පත් ලැබීමෙන් අනතුරුව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිවැරදි අයදුම්පත් ලැබී වැඩකරන දින 14ක් ඇතුලත ලැබූ අනුපිළිවෙල අනුව සහ අදාල මූල්‍ය ආයතනයට වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණය සලකා ප්‍රතිමූල්‍ය මුදා හැරීම සිදු කෙරේ.

11.4 ප්‍රතිමූල්‍ය සඳහා හිමිකම් පෑම් අදාළ මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාලය හරහා ණය මුදා හැරීමෙන් දින 30ක් ඇතුලත ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය. මූල්‍ය ආයතන ශාඛා වලින් ලැබෙන එවැනි අයදුම්පත් පිළිබඳ සළකා ලබනු නොලැබේ.

11.5 සෑම උප ණය ගැනුම්කරුවෙකුගේම ණය ආපසු ගෙවීමේ ලේඛනය මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නැවත ගෙවීම සම්බන්ධයෙන් සකසන ලද ලේඛනය අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් අර්ධ වාර්ෂිකව සිදු කල යුතුය.

12. **ණය ආපසු ලබා ගැනීම**

12.1 එක් එක් ණය සඳහා අදාල කොන්දේසි අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාග්ධන මුදල සහ පොලිය ණයකරුවන්ගෙන් අයකර ගත යුතුය.

12.2 සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මුදා හරින ලද ප්‍රාග්ධනය සහ පොලිය නැවත අයකර ගැනීම අර්ධ වාර්ෂිකව, එනම් සෑම වසරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 සිදු කරන අතර 2020.12.31 දින සිට ප්‍රතිමූල්‍ය ලබා දුන් දිනය පදනම් කර ගනිමින් සිදු කරයි.

13. **ලිපි ලේඛන වල ආරක්ෂාව**

13.1 අයදුම්කරුගේ යම් අලාභ සම්බන්ධයෙන් තක්සේරු කිරීමේ දී සියලු සාක්ෂි ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය යටත් විය යුතුය. එවැනි ලියකියවිලි පරීක්ෂා කිරීමට හෝ වෙනත් අවශ්‍යතාවයක් සඳහා අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

13.2 ණය මුදා හැරීම සම්බන්ධ වෙනත් අදාළ ලියකියවිලි බැංකු ශාඛා මට්ටමින් හෝ ප්‍රධාන කාර්යාලය සන්තකයේ අහිමත පරිදි තබා ගත හැකිය.

14. **ගිණුම් විගණනය කිරීම**

14.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෑම ප්‍රතිමූල්‍ය සංරචකයක් යටතේ ම වාර්ෂික ගිණුම් ප්‍රකාශන සකස් කරන අතර, එවැනි ගිණුම් ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

14.2 තවදුරටත්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ අභ්‍යන්තර විගණන සිදු කිරීමෙන් උප අලාභ සම්බන්ධයෙන් සිදු කරන තක්සේරු තහවුරු කර ගත යුතුය.

15. **සහභාගීත්ව මූල්‍ය ආයතන වල කාර්යභාරය සහ වගකීම්**

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන වල ක්‍රියාකාරී සහභාගීත්වය අපේක්ෂා කෙරේ. මෙම පරිශිෂ්ඨයෙහි ඇතුලත් අවශ්‍යතා වලට අමතරව පහත සඳහන් කාර්යභාරයන් හා වගකීම් සම්බන්ධයෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන අනුගත විය යුතුය.

15.1 මෙම ණය යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත කාල සීමාවක් තුළදී ප්‍රමාණවත් වන සේවක පිරිසක් ප්‍රධාන කාර්යාලය සහ ශාඛා මට්ටමින් යෙදවීම.

15.2 මෙම ණය යෝජනා ක්‍රමයේ සම්බන්ධීකරණ කටයුතු සඳහා වෙන් වූ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලයෙහි පත් කල යුතුය.

15.3 මෙම ණය යෝජනා ක්‍රමයෙහි අරමුණු මත පමණක්ම ණය අයදුම්කරුවන් ණය ලබා ගන්නා බව තහවුරු කර ගනිමින් ණය මුදා හැරීමට විචක්ෂණශීලි විය යුතුය.

15.4 ණය ලබාදීම සහ නැවත අයකර ගැනීම සම්බන්ධ සම්පූර්ණ වගකීම දැරීම

15.5 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙන අවස්ථා වල කිසිදු හේතුවක් මත, පරිශිෂ්ඨයෙහි සඳහන් අගයට වැඩි පොලී අනුපාතිකයක් යටතේ ණය ලබා නොදිය යුතුය.

15.6 සෑම නව උප ණය ප්‍රමාණයක්ම මුදා හැරීමට පෙර ණය ගැනුම්කරු COVID-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත්ව ඇති බවට තහවුරු කර ගත යුතුය.

15.7 ණය ගිණුම් සම්බන්ධයෙන් ගිණුම් පොත්වල තත්ත්වය පිළිබඳ නිරන්තරයෙන් පරීක්ෂාකාරී වෙමින් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත සිදුවිය හැකි අලාභ අවම කර ගැනීමට හැකි සෑම විටම කටයුතු කල යුතුය.

15.8 ගිණුම් පවත්වා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන

i. බැංකු විසින් ණය තක්සේරු, අනුමත කිරීම, ණය මුදා හැරීම, නැවත අයකර ගැනීම සහ වෙනත් කරුණු පිළිබඳ වාර්තා සුදුසු පරිදි ලෙජර් ගිණුම් මඟින් පවත්වා ගත යුතුය.

ii. ණය ලබා දීමේ ක්‍රියාපටිපාටිය සහ ප්‍රතිමූල්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් වෙනම ගිණුම් පවත්වා ගත යුතුය.

iii. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව සහ විමර්ශනය සඳහා ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය ඕනෑම විටක ඉදිරිපත් කල යුතු අතර මෙම ණය යෝජනා ක්‍රමය සම්බන්ධව ඕනෑම තොරතුරක් ලබා දීමට බැංකු බැඳී සිටී.

15.9 මෙහෙයුම් උපදෙස් හි සඳහන් පරිද්දෙන් සියලු ලියාපදිංචි සහ ප්‍රතිමූල්‍ය කටයුතු සිදුවිය යුතුය.

16. වෙනත්

මෙම පරිශිෂ්ඨයෙහි මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 හි අඩංගු නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය හෝ සහභාගීත්ව මූල්‍ය ආයතන ණය යෝජනා ක්‍රමය තුලින් ඉවත් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

මෙයට විශ්වාසී,

එම්. එස්. කේ ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/02

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.04.06

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි නොවූ බලපත්‍රලාභී බැංකු වෙත

COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම හඳුන්වා දීම සඳහා වූ මෙහෙයුම් උපදෙස්

('සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම)

COVID-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට සහය දැක්වීම සඳහා තවමත් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස ලියාපදිංචි නොවූ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයෙහි නව ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ එම බැංකු වලට සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක වීම සඳහා බලාත්මක කරමින්, මෙම මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

1. හැඳින්වීම

1.1 සමස්ථයක් ලෙස, ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වයට සහ රටේ ආර්ථික වර්ධනයට සිදුවිය හැකි බාධාවන් සැලකිල්ලට ගෙන COVID-19 වසංගතයෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන් නැවත නඟා සිටුවීමේ ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියා ඇතුළුව ව්‍යාපාර සඳහා රුපියල් බිලියන 50ක අර්ධ වාර්ෂික (මාස 6ක) ප්‍රතිමූල්‍යකරණ පහසුකම සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජයේ උපදෙස් පරිදි සහන මාලාවක් 2020.03.27 දිනැති 2020 අංක 05 දරණ මූල්‍ය මණ්ඩල චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇත.

1.2 මෙම මෙහෙයුම් උපදෙස් වල පරමාර්ථය වනුයේ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස ලියාපදිංචි කර නොමැති බලපත්‍රලාභී බැංකු සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ හඳුන්වා දී ඇති වන ප්‍රතිමූල්‍ය පහසුකමෙහි සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස කටයුතු කිරීමට ප්‍රතිපාදන සැලසීමයි.

1.3 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන ණය සංරචකයන්ගෙන් වෙන්කර හඳුනාගැනීම සඳහා මෙම නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම 'සෞභාග්‍යා කඩඩෂ19 පුනරුද සහන' ණය පහසුකම ලෙස හඳුන්වනු ලැබේ.

1.4 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකමෙහි අරමුණ වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන දැනට ක්‍රියාත්මක වන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ වෙනමම ප්‍රතිමූල්‍යකරණ සංරචකයක් ලෙස COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන සැපයීමයි. ඒ අනුව, COVID-19 හේතුවෙන් දැඩි බලපෑමට පත් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් නව ණය සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ හඳුන්වා දී ඇති මෙම නව ප්‍රතිමූල්‍යකරණ සංරචකය හරහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වලට හැකියාවක් පවතී.

1.5 තවද, මෙමඟින් 2010.03.22 දිනැති RDD/PR/2010/03 (සංශෝධිත) දරන මෙහෙයුම් උපදෙස් මඟින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සඳහා දක්වා ඇති නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතින බවත් මෙම නව පරිශිෂ්ඨය නිකුත් කිරීමෙන් 2010.03.22 දිනැති RDD/PR/2010/03 (සංශෝධිත) දරණ මෙහෙයුම් උපදෙස් මඟින් එම ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන බවත් දන්වනු ලබයි.

2. **මෙහෙයුම් ප්‍රදේශ : දිවයිනේ සියලුම ප්‍රදේශ**

3. **අරමුදල්**

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ හඳුන්වා දී ඇති නව ප්‍රතිමූල්‍යකරණ සංරචකය වන සෞභාග්‍යා කඩඉෂ19 පුනරුද සහන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අරමුදල් සපයනු ඇත.

4. **සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ක්‍රියාත්මක කිරීම**

4.1 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ නව ණය සංරචකයක් ලෙස 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ක්‍රියාත්මක වනු ඇත.
4.2 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ මෙන්ම සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ගි ද ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ඇත.

5. බලාත්මක දිනය

මෙම මෙහෙයුම් උපදෙස් වල බලාත්මක දිනය 2020.04.06 දින වේ.

6. **සහභාගීත්ව මූල්‍ය ආයතන**

6.1 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම්ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන සියල්ලම 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම ක්‍රියාත්මක කිරීමට සුදුසුකම්ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස ද සළකනු ලැබේ.

6.2 තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ නිර්දේශය මත ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ඉහත සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ණය පහසුකම ලබාදීමේ සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස සුදුසුකම් ලබයි. මෙම සහන ණය යෝජනා ක්‍රමය යටතේ, එසේ සහභාගි වීමට කැමති බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බලපත්‍රලාභී විශේෂ බැංකු 2020.04.15 දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ වෙත සිය කැමැත්ත ප්‍රකාශ කළ යුතුය. එසේ වූවද, ඉහත ආකාරයට කැමැත්ත ප්‍රකාශ කරන ලද බැංකු, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස සළකනු නොලැබේ.

6.3 එක් එක් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා අදාළ ප්‍රතිමූල්‍යකරණ සීමාවන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තීරණය කර දැනුම් දෙනු ඇත.

7. **සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් හා ණය අයදුම්කරුවන්**

7.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ දෙවන පරිච්ඡේදයට අනුව COVID-19 වසංගත තත්ත්වයට පෙර සිට ක්‍රියාත්මකව පැවති ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ක්‍රියාත්මක කළ ඕනෑම ආදායම් උත්පාදන ක්‍රියාවලියක් හෝ ආර්ථික ක්‍රියාදාමයක් එකී කටයුතු යලි සක්‍රීය කිරීම උදෙසා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබයි. මෙකී අරමුණ උදෙසා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙනු ලබන ණය සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

7.2 'සෞභාග්‍යා කඩඉෂ19 පුනරුද සහන ණය' පහසුකම යටතේ, දැනට පවතින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යනය කිරීම පිණිස ණය ලබා දෙනු ලැබේ.

7.3 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ මීට පෙර හෝ දැනටමත් COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති ණය ගැණුම්කරුවන් ද මෙම පරිශිෂ්ඨය යටතේ ණය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

8. **'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකමෙහි මූලික ලක්ෂණ**

8.1 උපරිම ණය මුදල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෙකුට/උප ණය ගැනුම්කරුවෙකුට රුපියල් මිලියන 25කට යටත්ව මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයට සරිලන ණය මුදලක්
8.2 ණය ගැනුම්කරු විසින් සහභාගීත්ව මූල්‍ය අයතන වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය අ) වසරකට සියයට 4කි
ආ) සහභාගීත්ව මූල්‍ය ආයතන කිසිදු අයුරකින් සියයට 4ක් ඉක්ම වූ පොලී අනුපාතයක් අය නොකළ යුතුය.
8.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය වසරකට සියයට 1කි
8.4 සහන කාලය අ) ව්‍යාපාර කටයුත්තේ ස්වභාවය මත පදනම්ව, මාස 6ක උපරිම සහන කාලයක්
ආ) මෙකී සහන කාලය තුළ ණය ගැනුම්කරුවන් ප්‍රාග්ධනය හෝ පොලිය ගෙවීම අවශ්‍ය නොවේ.
8.5 ණය ආපසු ගෙවීමේ කාලය සහන කාල සීමාව ද ඇතුලත්ව උපරිම කාලය මාස 24කි.
8.6 ඇප සුරැකුම් ආර්ථික කටයුත්තේ ශක්‍යතාවය කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. එසේ වුවත් 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම යටතේ ලබාදෙනු ලබන ණය සඳහා, අවදානම අවම කිරීමේ උපක්‍රමයක් ලෙස සුදුසු පරිදි ඇප සුරැකුම් ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වලට හැකියාව ඇත.

9. ණය ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම

9.1 තම ශාඛා මට්ටමින් COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වූ අයදුම්කරුවන් හෝ/ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීමට හා 2020.04.30 දිනට පෙර එකී අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාල මඟින් අදාළ මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය.

9.2 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම යටතේ ණය ලබා ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් පිළිබඳ විස්තර මෙම පරිශිෂ්ඨය සහභාගීත්ව මූල්‍ය ආයතන ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ණය ලියාපදිංචි අයදුම්පත් භාරදීමේ අවසාන දිනය 2020.05.22 වේ.

9.3 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා දත්ත ඇමුණුම් 1 (ආ) මෘදු පිටපත, උප ණය අයදුම්පත් ලැබී දින 10ක් තුල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙනු ලබන ලිපිනයන්ට විද්‍යුත් තැපෑලෙන් යොමු කළ යුතුය.

9.4 ඇමුණුම (අ) සහ (ආ) යටතේ ලබාදෙනු ලබන තොරතුරු වල අනුකූලතාවය සහ නිවැරදි භාවය සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතුය.

9.5 අදාල සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණයට යටත්ව, වැඩ කරන දින 5ක් තුළ දී ඇමුණුම (ආ) හි සඳහන් තොරතුරු මත පදනම්ව අයදුම්පත් ලද අනුපිළිවෙලට අනුව උප ණය අයදුම්කරුවන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරනු ලැබේ. කෙසේ වූවද, ඇමුණුම (අ) සහ ඇමුණම (ආ) හි දාම අයදුම්පත් ලැබීමෙන් පසුව එම ඇමුණුම් වල යම් වෙනසක් නිරීක්ෂණය වුවහොත්, සහභාගීත්ව මූල්‍ය ආයතනයට පූර්ව දැනුම් දීමකින් තොරව අදාල උප ණය ගැනුම්කරුගේ ණය ලියාපදිංචිය අවලංගු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

9.6 යම් හෙයකින් අමතර තොරතුරු අවශ්‍ය විටෙක හෝ අමතර පැහැදිලි කිරීම් අවශ්‍ය වන අවස්ථාවක කිසියම් අයදුම්පතක් නැවත සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

9.7 උප ණය අයදුම්කරුවන් ලියා පදිංචි කිරීමෙන් අනතුරුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කළ ණය සඳහා ලියා පදිංචි අංකයක් නිකුත් කොට එම අංකය සහභාගීත්ව මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දෙනු ලැබේ. කිසියම් ණය අයදුම්කරුවෙකු සම්බන්ධ ඉදිරි කටයුතු වලදී මෙකී ලියාපදිංචි අංකය භාවිතා කළ යුතුය.

10. උප ණය මුදා හැරීම

10.1 කිසියම් ණය අයදුම්කරුවෙකු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කර සති 1ක් තුළ ඊට අදාළ ණය මුදල සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මුදා හැරිය යුතුය.

10.2 යම් හෙයකින් කිසියම් ණය මුදලක් සති 1ක් තුළ මුදා හැරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන අපොහොසත් වේ නම් ඊට අදාළ හේතු දක්වමින් ඒ පිළිබඳව නොපමාව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතු අතර එහි ලා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සුදුසු පරිදි අවශ්‍ය තීරණ/ක්‍රියාමාර්ග වෙත එළඹෙනු ඇත.

10.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කිසියම් ණය මුදලක් දින 30ක් තුළ මුදා නොහැරීම හා ඒ පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පිළිගත හැකි හේතූන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකී ණය ලියාපදිංචිය සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු වේ.

10.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ හේතූන් නිසා මුදා හැරීමට නොහැකි වූ ලියාපදිංචි වී ඇති ණය පිළිබඳ වාර්තාවක් 2020.06.15 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

11. ප්‍රතිමූල්‍ය ක්‍රමවේදය

11.1 මෙම පරිශ්ෂ්ඨයෙහි සඳහන් නියමයන් සහ කොන්දේසි වලට අදාළව උප ණය සඳහා 100%ක ප්‍රතිමූල්‍ය පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත සැපයෙනු ඇත.

11.2 ලියාපදිංචි ණයකරුවන් වෙත ණය මුදල් මුදා හැරීමෙන් පසු ප්‍රතිමූල්‍ය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. සෑම ප්‍රතිමූල්‍ය අයදුම්පතක් සමඟ පහත ලේඛන ලැබීමට සැලැස්විය යුතුය.

i. ප්‍රතිමූල්‍ය සඳහා වන අයදුම්පත ඇමුණුම II
ii. ප්‍රතිමූල්‍ය සඳහා ණය මුදා හරින ලද ණය සඳහා අදාල වන ප්‍රකාශනය ඇමුණුම III
iii. ඉල්ලුම් පොරොන්දු පත්‍රය ඇමුණුම IV
iv. භාරදීමේ කුවිතාන්සිය ඇමුණුම V
v. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහතික වන ආකාරයේ පැවරුම ඇමුණුම VI
vi. ණය මුදා හැරීමේ ලිපිය ඇමුණුම VI

11.3 අදාළ සියළු ලිපි ලේඛන සහ තොරතුරු සහිතව සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය අයදුම්පත් ලැබීමෙන් අනතුරුව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිවැරදි අයදුම්පත් ලැබී වැඩකරන දින 14ක් ඇතුලත ලැබූ අනුපිළිවෙල අනුව සහ අදාල මූල්‍ය ආයතනයට වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණය සලකා ප්‍රතිමූල්‍ය මුදා හැරීම සිදු කෙරේ.

11.4 ප්‍රතිමූල්‍ය සඳහා හිමිකම් පෑම් අදාළ මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාලය හරහා ණය මුදා හැරීමෙන් දින 30ක් ඇතුලත ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය. මූල්‍ය ආයතන ශාඛා වලින් ලැබෙන එවැනි අයදුම්පත් පිළිබඳ සළකා ලබනු නොලැබේ.

11.5 සෑම උප ණය ගැනුම්කරුවෙකුගේම ණය ආපසු ගෙවීමේ ලේඛනය මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නැවත ගෙවීම සම්බන්ධයෙන් සකසන ලද ලේඛනය අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් අර්ධ වාර්ෂිකව සිදු කල යුතුය.

12. ණය ආපසු ලබා ගැනීම

12.1 එක් එක් ණය සඳහා අදාල කොන්දේසි අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාග්ධන මුදල සහ පොලිය ණයකරුවන්ගෙන් අයකර ගත යුතුය.

12.2 සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මුදා හරින ලද ප්‍රාග්ධනය සහ පොලිය නැවත අයකර ගැනීම අර්ධ වාර්ෂිකව, එනම් සෑම සවරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 සිදු කරන අතර 2020.12.31 දින සිට ප්‍රතිමූල්‍ය ලබා දුන් දිනය පදනම් කර ගනිමින් සිදු කරයි.

13. ලිපි ලේඛන වල ආරක්ෂාව

13.1 අයදුම්කරුගේ යම් අලාභ සම්බන්ධයෙන් තක්සේරු කිරීමේ දී සියලු සාක්ෂි ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය යටත් විය යුතුය. එවැනි ලියකියවිලි පරීක්ෂා කිරීමට හෝ වෙනත් අවශ්‍යතාවයක් සඳහා අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

13.2 ණය මුදා හැරීම සම්බන්ධ වෙනත් අදාළ ලියකියවිලි බැංකු ශාඛා මට්ටමින් හෝ ප්‍රධාන කාර්යාලය සන්තකයේ අහිමත පරිදි තබා ගත හැකිය.

14. ගිණුම් විගණනය කිරීම

14.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෑම ප්‍රතිමූල්‍ය සංරචකයක් යටතේ ම වාර්ෂික ගිණුම් ප්‍රකාශන සකස් කරන අතර, එවැනි ගිණුම් ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

14.2 තවදුරටත්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ අභ්‍යන්තර විගණන සිදු කිරීමෙන් උප අලාභ සම්බන්ධයෙන් සිදු කරන තක්සේරු තහවුරු කර ගත යුතුය.

15. සහභාගීත්ව මූල්‍ය ආයතන වල කාර්යභාරය සහ වගකීම්

'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන වල ක්‍රියාකාරී සහභාගීත්වය අපේක්ෂා කෙරේ. මෙම පරිශිෂ්ඨයෙහි ඇතුලත් අවශ්‍යතා වලට අමතරව පහත සඳහන් කාර්යභාරයන් හා වගකීම් සම්බන්ධයෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන අනුගත විය යුතුය.

15.1 මෙම ණය යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත කාල සීමාවක් තුළදී ප්‍රමාණවත් වන සේවක පිරිසක් ප්‍රධාන කාර්යාලය සහ ශාඛා මට්ටමින් යෙදවීම.

15.2 මෙම ණය යෝජනා ක්‍රමයේ සම්බන්ධීකරණ කටයුතු සඳහා වෙන් වූ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලයෙ හි පත් කල යුතුය.

15.3 මෙම ණය යෝජනා ක්‍රමයෙහි අරමුණු මත පමණක්ම ණය අයදුම්කරුවන් ණය ලබා ගන්නා බව තහවුරු කර ගනිමින් ණය මුදා හැරීමට විචක්ෂණශීලි විය යුතුය.

15.4 ණය ලබාදීම සහ නැවත අයකර ගැනීම සම්බන්ධ සම්පූර්ණ වගකීම දැරීම

15.5 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙන අවස්ථා වල කිසිදු හේතුවක් මත, පරිශිෂ්ඨයෙහි සඳහන් අගයට වැඩි පොලී අනුපාතිකයක් යටතේ ණය ලබා නොදිය යුතුය.

15.6 සෑම නව උප ණය ප්‍රමාණයක්ම මුදා හැරීමට පෙර ණය ගැනුම්කරු කඩඇෂෘ19 වසංගතය හේතුවෙන් පීඩාවට පත්ව ඇති බවට තහවුරු කර ගත යුතුය.

15.7 ණය ගිණුම් සම්බන්ධයෙන් ගිණුම් පොත්වල තත්ත්වය පිළිබඳ නිරන්තරයෙන් පරීක්ෂාකාරී වෙමින් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත සිදුවිය හැකි අලාභ අවම කර ගැනීමට හැකි සෑම විටම කටයුතු කල යුතුය.

15.8 ගිණුම් පවත්වා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන

i. බැංකු විසින් ණය තක්සේරු, අනුමත කිරීම, ණය මුදා හැරීම, නැවත අයකර ගැනීම සහ වෙනත් කරුණු පිළිබඳ වාර්තා සුදුසු පරිදි ලෙජර් ගිණුම් මඟින් පවත්වා ගත යුතුය.

ii. ණය ලබා දීමේ ක්‍රියාපටිපාටිය සහ ප්‍රතිමූල්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් වෙනම ගිණුම් පවත්වා ගත යුතුය.
iii. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව සහ විමර්ශනය සඳහා ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය ඕනෑම විටක ඉදිරිපත් කල යුතු අතර මෙම ණය යෝජනා ක්‍රමය සම්බන්ධව ඕනෑම තොරතුරක් ලබා දීමට බැංකු බැඳී සිටී.

15.9 මෙහෙයුම් උපදෙස් හි සඳහන් පරිද්දෙන් සියලු ලියාපදිංචි සහ ප්‍රතිමූල්‍ය කටයුතු සිදුවිය යුතුය.

16. වෙනත්

මෙම පරිශිෂ්ඨයෙහි මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 හි අඩංගු නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය හෝ සහභාගීත්ව මූල්‍ය ආයතන ණය යෝජනා ක්‍රමය තුලින් ඉවත් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

මෙයට විශ්වාසී,

එම්. එස්. කේ ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/NCRCS/2011 2020 අප්‍රේල් 08

සියළුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත,
මහත්මියනි/මහත්මයාණෙනි,

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වූ සංශෝධනය

2016 ජනවාරි මස 10 දිනල 2014 ජුනි මස 06 වන දිනල 2015 ජූලි මස 06 වන දින සහ 2016 අගෝස්තු මස 22 වන දින සංශෝධනය කරන ලද, 2011 සැප්තැම්බර් මස 23 වන දිනැති RDD/NCRCS/2011 අංක දරන මෙහෙයුම් උපදෙස් මෙසේ සංශෝධනය වන බව සියළුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත දන්වා සිටිමු.

1 පොලී අනුපාතය

ශ්‍රී ලංකා රජය මගින් ගෙවන ලද පොලී සහනාධාරය	අවසන් ණය හිමියා සඳහා වන පොලී අනුපාතය	සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා බලපැවැත්වෙන පොලී අනුපාතය
වාර්ෂික පොලී අනුපාතය සියයට 5	වාර්ෂික පොලී අනුපාතය සියයට 4	වාර්ෂික පොලී අනුපාතය සියයට 9

2. ණය මුදහැරීම සඳහා යෝග්‍ය නිර්ණායක

ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ''සෞභාග්‍යා ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන'' සඳහා පහත දැක්වෙන කොන්දේසි වලට අනුව නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යාධාර ලබාදීමට සුදුසුකම් ලබයි.

(අ) සුදුසුකම් ලබන බෝග සඳහා යෝග්‍ය නිර්ණායකයක් ලෙස එම බෝගය සඳහා වූ අවම භූමි ඒකක ප්‍රමාණය නොසලකනු ලැබේ.

(ආ) මෙම වැඩසටහන මඟින් සුදුසුකම් ලබන බෝග සඳහා ලබාදෙන උපරිම ණය මුදල රුපියල් 40000 ට වැඩි නොවිය යුතුය.

ඉහත සඳහන් සංශෝධන 2020 අප්‍රේල් මස 09 වන දින පටන් බල පැවැත්වෙන අතර නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයට අදාල මෙහෙයුම් උපදෙස් හි සඳහන් කර ඇති අනෙකුත් කොන්දේසි හා නියමයන් නොවෙනස්ව පවතී.

කරුණාකර මෙම සංශෝධන චක්‍රලේකයේ අන්තර්ගතය ඔබගේ බැංකුවේ අදාල දෙපාර්තමේන්තු/ ශාඛා නිලධාරීන්ගේ අවධානය සඳහා යොමු කරන්න.

එම් එස් කේ ධර්මවර්ධන
අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/01 (A-01)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.04.13

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/මහත්මියනි,

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකමට අදාල මෙහෙයුම් උපදෙස් සංශෝධනය

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ, COVID-19 ව්‍යාප්තියත් සමඟ ව්‍යාපාර කටයුතු වලට සිදු වූ අහිතකර බලපෑම නිසා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යාපාර (MSMEs) ක්ෂේත්‍රයන් යලි නඟා සිටුවීම සඳහා හඳුන්වා දුන් (සෞභාග්‍යා COVID-19 පුනරුද සහන) නව ප්‍රතිමූල්‍ය පහසුකම සඳහා වූ 2020.04.01 දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා වූ පරිශිෂ්ඨය පහත ආකාරයෙන් දැක්වේ.

ඉහත ණය යෝජනා ක්‍රමය තුළින් ආවරණය වන කාර්යයන් පුළුල් කිරීමේ සහ COVID-19 ව්‍යසනයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර වැඩි ප්‍රමාණයකට සහය දීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත තීරණ ගෙන ඇත.

අ) "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ව්‍යාපෘතියේ උපරිම ණය සීමාව, මෙතෙක් පැවති රුපියල් මිලියන 25 වෙනුවට මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය ලෙස සංශෝධනය කිරීම.

ආ) අංක 05/2020 දරන මුදල් මණ්ඩල චක්‍ර ලේඛනයේ කාණ්ඩ අංක 2 (1) හි සඳහන් පරිදි COVID-19 ව්‍යාප්තියෙන් බලපෑමට ලක් වූ ඕනෑම ව්‍යාපාරයකට එහි පරිමාව නොසලකා, මෙම ව්‍යාපෘතිය යටතේ පහසුකම් සැපයීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම සඳහා නිකුත් කරන ලද 2020.04.01 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID 19/2020/01 (මින් මතු "ප්‍රධාන මෙහෙයුම් උපදෙස්" ලෙස හඳුන්වනු ලබන) හි පරිශිෂ්ඨය පහතින් දැක්වේ.

1. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් මාලාවේ මාතෘකාව වෙනුවට පහත සඳහන් මාතෘකාව ආදේශ කරනු ලැබේ.
   "සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය, COVID-19 ව්‍යාප්තිය මඟින් අහිතකර අයුරින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා නව ප්‍රතිමූල්‍ය පහසුකම (සෞභාග්‍යා COVID-19 පුනරුද සහන)"
2. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් මාලාවෙහි 1 වන ඡේදය අවලංගු කර ඒ සඳහා පහත ඡේදය ආදේශ කෙරේ.
   "සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2010.03.22 දින (සංශෝධිත) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධනය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කර ඇති අංක RDD/PR/2010/03 දරණ මෙහෙයුම් උපදෙස් වලට අනුව කටයුතු කරනු ලබන සහභාගීත්ව මූල්‍ය ආයතන වලට COVID-19 ව්‍යසනය හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර ආයතන වලට සහන සැලසීමට මේ තුලින් අවස්ථාව ලබා දී ඇත.
3. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි අංක 1.1, 1.2, 7.1, 7.2 සහ 9.1 යන වගන්ති වල දක්වා ඇත "ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර" යන වචන කාණ්ඩය වෙනුවට "ව්‍යාපාර" යන වචනය ආදේශ කෙරේ.
4. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි අංක 8.1 දරණ වගන්තිය වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

8.1	උපරිම ණය සීමාව	එක් ව්‍යාපාරයක් සඳහා මාස 2ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය

මෙම පරිශිෂ්ඨය 2020.04.13 දින සිට ක්‍රියාත්මක වන අතර, ප්‍රධාන මෙහෙයුම් උපදෙස් මාලාවෙහි සඳහන් අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

මෙම මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයෙහි දක්වා ඇති අන්තර්ගතයන් ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛා වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

මෙයට විශ්වාසී,

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/02 (A-01)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.04.13

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි නොවූ බලපත්‍රලාභී බැංකු වෙත

මහත්මයාණෙනි/මහත්මියනි,

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ, COVID-19 ව්‍යාප්තිය මගින් අහිතකර බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යාපාර (MSMEs) සඳහා හඳුන්වා දෙන 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' නව ප්‍රතිමූල්‍ය පහසුකම සඳහා වූ මෙහෙයුම් උපදෙස් සංශෝධනය

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ, COVID-19 ව්‍යාප්තිය මගින් අහිතකර බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යාපාර (MSMEs) සඳහා හඳුන්වා දුන් 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' නව ප්‍රතිමූල්‍ය පහසුකම සඳහා 2020.04.06 දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා අදාළ වේ.

මෙම ණය යෝජනා ක්‍රමය ආවරණය වන වපසරිය පුළුල් කිරීමේ සහ බලපෑමට ලක්වූ ආර්ථික ක්‍රියාකාරකම් වැඩි ප්‍රමාණයකට සහය වීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත තීරණ ගෙන ඇත.

අ) 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ව්‍යාපෘතියේ උපරිම ණය සීමාව, මෙතෙක් පැවති රුපියල් මිලියන 25 වෙනුවට මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය ලෙස සංශෝධනය කිරීම.

ආ) අංක 05/2020 දරන මුදල් මණ්ඩල චක්‍ර ලේඛනයේ, කාණ්ඩ 2 (i) හි සඳහන් COVID-19 ව්‍යාප්තියේ බලපෑමට ලක් වූ ඕනෑම ව්‍යාපාරයකට එහි විශාලත්වය නොසලකා, මෙම ව්‍යාපෘතිය යටතේ ණය පහසුකම් සපයනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ක්‍රමය සඳහා නිකුත් කරන ලද 2020.04.06 දිනැති මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID 19/2020/02 (මින් මතු 'ප්‍රධාන මෙහෙයුම් උපදෙස්' ලෙස හඳුන්වනු ලබන) මෙයින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් මාතෘකාව අවලංගු කර පහත මාතෘකාව ඒ සඳහා ආදේශ කිරීම.
සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ, "COVID-19 ව්‍යාප්තිය මගින් අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා නව ප්‍රතිමූල්‍ය පහසුකම (සෞභාග්‍යා COVID-19 පුනරුද සහන) හඳුන්වා දීම සඳහා වන මෙහෙයුම් උපදෙස්".

2. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි 1 වන ඡේදය මෙයින් අවලංගු කර පහත ඡේදය ඒ සඳහා ආදේශ කෙරේ.
'සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන (ස.මූ.ආ.) ලෙස මෙතෙක් ලියාපදිංචි නොවූ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (බලපත්‍රලාභී බැංකු) සඳහා මෙම සෞභාග්‍යා නව ප්‍රතිමූල්‍ය පහසුකම ක්‍රියාත්මක කිරීමේ ස.මූ.ආ. ලෙස, COVID-19 ව්‍යාප්තිය මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා සහන සැලසීමේ අවස්ථාව ලබා දීමට මෙම මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම.

3. ප්‍රධන මෙහෙයුම් උපදෙස් හි වගන්ති අංක 1.1, 1.4, 7.1, 7.2 සහ 9.1 හි සඳහන් 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යන වචන කාණ්ඩය වෙනුවට 'ව්‍යාපාර' යන වචනය ආදේශ කිරීම.

4. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි වගන්ති අංක 8.1 මෙයින් අවලංගු කොට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

8.1 උපරිම ණය සීමාව	එක් ව්‍යාපාරයක් සඳහා මාස 2ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය

මෙම සංශෝධන 2020.04.13 දින සිට ක්‍රියාත්මක වන අතර, ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි සඳහන්ව ඇති අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

මෙම මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයෙහි අන්තර්ගතයන් අදාළ දෙපාර්තමේන්තු/ශාඛා වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව දැනුම්දෙමි.

මෙයට විශ්වාසී,

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2020.04.20
යොමු අංක : 32/04/011/0001/002

වෙත : ප්‍රධාන විධායක නිලධාරි/කළමනාකාර අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන

මහත්මයාණෙනි/මහත්මියනි

'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන'

මෙහෙයුම් මාර්ගෝපදේශනය : 01

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද 2020.04.01 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID19/2020/01 සහ පසුව නිකුත් කරන ලද 2020.04.13 දිනැති සංශෝධිත අංක : RDD/PR-COVID19/2020/01 (A-01) හා බැඳේ.

'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' වැඩසටහන විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් වඩාත් පැහැදිලි කිරීමේ අරමුණින් පහත සඳහන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ.

1. **සුදුසුකම් :**

(අ) මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 05/2020 අංක දරණ චක්‍රලේඛයෙහි 2 (i) වගන්තියෙහි සඳහන් පරිදි මෙහෙයුම් උපදෙස් සහ පසුව කරන ලද සංශෝධනයට අනුව නිෂ්පාදන, සේවා, කෘෂිකර්මාන්තය, ඉදිකිරීම්, ස්වයං රැකියා සහ තනි පුද්ගලයින් සහ සංචාරක, අපනයන සහ ඒ ආශ්‍රිත ප්‍රවර්ධන සැපයුම්කරුවන් ඇතුලූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මෙම පහසුකම සඳහා සුදුසුකම් ලබයි.

(ආ) ණයගැතියෙකු බැංකු කිහිපයකින් බැංකු පහසුකම් ලබා ගත්තද එක ණය ගැනුම්කරුවෙකු (ව්‍යාපාරයක්) සුදුසුකම් ලබන්නේ එක් ණය මුදලකට පමණි. එම නිසා, එකම යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීම සඳහා ණය ගැනුම්කරුවා වෙනත් බැංකු වෙත ළඟා වී නොමැති බවට ණය ගැනුම්කරුවාගෙන් ලිඛිත තහවුරු කිරීමක් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා ගත යුතුය.

(ඇ) තවද, විදේශ මුදල් ගිණුම් සහ සපයා ඇති ඇපකර ඇතුළුව පවත්වාගෙන යන බැංකු ගිණුම් මත පදනම්ව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවාගේ සැබෑ සුදුසුකම් තක්සේරු කිරීම සිදු කල යුතුය.

2. **ණය ප්‍රමාණය**

(අ) සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවෙකු (ව්‍යාපාරයක්) සඳහා වන උපරිම ණය මුදල අදාළ ව්‍යාපාරයේ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයට සමාන විය යුතුය.

(ආ) ණය ගැනුම්කරුගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා නිසි ලෙස තක්සේරු කිරීම සහ ලබා දී ඇති නිර්ණායක මත පදනම්ව ණය ප්‍රමාණයට එකඟ වීම සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සිදු කල යුතුය.

(ඇ) ණය මුදලේ අවශ්‍යතාවය තක්සේරු කිරීමේ දී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් වැටුප්/වේතන වැනි මාස දෙකක කාලය තුල දැරීමට සිදුවන අනිවාර්ය වියදම් පමණක් සලකා බැලිය යුතුය.

(ඈ) ව්‍යාපාරය ක්‍රියාත්මක නොවන්නේ නම් කාරක ප්‍රාග්ධනයේ සාමාන්‍ය සංරචක වන අමුද්‍රව්‍ය සඳහා මුදල් ලබා ගැනීම බැහැර කල යුතුය.

3. **ප්‍රමුඛතාවය**

(අ) සේවා නියුක්තිය සහ නිෂ්පාදනය ආරක්ෂා කිරීම සඳහා වැදගත් වන ව්‍යාපාර සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් හි අයදුම්පත් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

(ආ) මේ සම්බන්ධයෙන් රුපියල් මිලියන 10ට අඩු කාරක ප්‍රාග්ධනයක් මඟින් කළමනාකරණය කල හැකි ක්ෂුද්‍ර හා කුඩා ප්‍රමාණයේ ව්‍යාපාර සඳහා පළමු ප්‍රමුඛතාවත්, රුපියල් මිලියන 10ත් රුපියල් මිලියන 25ත් අතර කාරක ප්‍රාග්ධනයක් මඟින් කළමනාකරණය කල හැකි මධ්‍යම හා ඉහල මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර සඳහා දෙවන ප්‍රමුඛතාවත් ලබා දිය යුතුය.

(ඇ) කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් මිලියන 25ට වඩා වැඩි ව්‍යාපාර සහ වෙනත් සුදුසුකම් ලත් ව්‍යාපාර වලින් ලැබෙන අයදුම්පත්, එම ව්‍යාපාර වල රැකියා හා නිෂ්පාදන සඳහා ඇති වැදගත්කම මත පදනම්ව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගනිමින් එක් එක් සිද්ධියෙන් සිද්ධියට සලකා බැලිය යුතුය.

(ඈ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති අනෙකුත් මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම් මඟින් ලබා ගත හැකි අතිරේක ද්‍රවශීලතාවය භාවිතා කරමින් සහභාගීත්ව මූල්‍ය ආයතන මඟින් විශාල ව්‍යාපාරයන් හි මූලාරම්භය මත පදනම්ව කාරක ප්‍රාග්ධන ණය ලබා දිය හැකිය.

4. **වෙනත් අවශ්‍යතා**

(අ) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය දීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට පෙර, කාරක ප්‍රාග්ධනයේ ප්‍රමාණය තක්සේරු කිරීමට අවශ්‍ය වන සියලුම අවශ්‍ය ලියකියවිලි, සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවාගෙන් ලබා ගත යුතුය.

(ආ) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍යකරණ පහසුකම භාවිතා කරමින්, ව්‍යාපාර වලින් ඔවුන්ගේ සේවාදායකයන් සේවයෙන් ඉවත් නොකරන බවටත්, ඔවුන්ගේ රැකියා සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ඇතුළු සුදුසු වේතන මඟින් සුරක්ෂිත කරන බවටත් ලිඛිත සහතිකයක් ලබා ගත යුතුය.

(ඇ) අමුණා ඇති ආකෘතියට අනුව 2020.04.24 දින පටන් සතිපතා වාර්තාවක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට විද්‍යුත් තැපෑලෙන්, vijitha@cbsl.lk සහ anuruddika@cbsl.lk යන ලිපින ඔස්සේ ඉදිරිපත් කල යුතුය.

මෙම මාර්ගෝපදේශයේ අන්තර්ගතය ඔබේ බැංකුවේ අදාල දෙපාර්තමේන්තු/ශාඛා නිලධාරීන්ගේ අවධානයට යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක :- RDD/PR-COVID19/2020/03

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො 30, ජනාධිපති මාවත,
කොළඹ 01

2020.06.19

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ ලියාපදිංචි වී ඇති සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකමට අදාල මෙහෙයුම් උපදෙස් සංශෝධනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2020.04.06 දින නිකුත් කරන ලද (සංශෝධිත) මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID19/2020/02 ට වැඩිමනත්ව නිකුත් කරන ලද මෙම පරිශිෂ්ඨය මඟින් COVID-19 වසංගත සමය තුල බලපෑමට ලක් වූ ව්‍යාපාර නැවත ගොඩනැගීමට අවශ්‍ය පහසුකම් සැපයීමට, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බලතල සැපයේ.

1. හැඳින්වීම

මෙම පරිශිෂ්ඨයේ අරමුණ වන්නේ COVID-19 වසංගතයෙහි බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා ප්‍රතිපාදන සැලසීම වන අතර මේ සම්බන්ධව පෙර නිකුත් කරන ලද උපදෙස් වලට අමතරව මෙම උපදෙස් ඇතුලත් වේ.

2. සුදුසුකම් ලත් මූල්‍ය ආයතන

මේ වන විටත් "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු, මෙම පරිශිෂ්ඨයේ අරමුණු සඳහා සුදුසු වේ.

3. සුදුසුකම් ලත් ව්‍යාපාර/ණය ගැනුම්කරුවන්

3.1 මුදල් මණ්ඩලයේ 2020.03.27 දිනැති අංක 05 දරණ චක්‍රලේඛයෙහි 02 කොටස අනුව, COVID-19 වසංගතයෙහි බලපෑමට ලක් වූ ව්‍යාපාර

3.2 දැනටමත් COVID-19 පුනරුද පහසුකම යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ඇති ණය ගැනුම්කරුවන් මේ යටතේ නැවත ණය මුදලක් ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

4. අරමුදල්

මෙම පරිශිෂ්ඨය යටතේ ලබාදෙන ණය ප්‍රමාණය රු. බිලියන 120ක උපරිමයක් දක්වා වේ. පළමු අදියර ඇතුලත් ව යොදවා ඇති මුළු අරමුදල් ප්‍රමාණය රු. බිලියන 150 ක් වේ.

5. ක්‍රියාත්මක වන දිනය

මෙම පරිශිෂ්ඨය 2020.06.19 දින සිට ක්‍රියාත්මක වේ.

6. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය ගැනුම්කරුවන්ගේ තොරතුරු ලබා දීම.

6.1 බලපත්‍රලාභී වාණිජ බැංකු වල ප්‍රධාන ශාඛාව මඟින් ණය මුදල් ලබා ගැනීමට අපේක්ෂිත ණය ගැනුම්කරුවන්ගේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලැයිස්තුවෙහි දෘඩ පිටපත්, බලය ලත් නිලධාරී විසින් අත්සන් කරන ලදුව (ඇමුණුම i පරිදි) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කල යුතුය. එම අවස්ථාවේදීම ඇමුණුම i හි මෘදු පිටපතක්ද ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලබා දී ඇති ඊමේල් ලිපිනය වෙත යොමු කල යුතුය.

6.2 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පහත කරුණු පිළිබඳව සහතික විය යුතුය.

a. ඇමුණුම I අඩංගු තොරතුරු වල නිවැරදිභාවය හා අනුකූලතාව.
b. ණය යෝජනා ක්‍රමය යටතේ ණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිබඳව තක්සේරුව.
c. අවශ්‍ය සියලු තොරතුරු හා ලේඛන එක් රැස් කර ඇති බව සහ
d. ණයකරු විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වෙනත් කිසිදු සහභාගීත්ව මූල්‍ය ආයතනයකින් ණය අයදුම්කර නොමැති බවට අයදුම්කරුගෙන් ලිඛිතව සහතික කිරීමක් ලබා ගැනීම.

6.3 සහභාගීත්ව මූල්‍ය ආයතනයක් හරහා ඇමුණුම I ලැබීමෙන් පසුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් එහි සඳහන් තොරතුරු නිවරදි බව තහවුරු කිරීමෙන් පසුව ණය මුදල මුදා හැරීම සඳහා ණයකරුගේ සුදුසුකම සහ ණය මුදල තහවුරු කෙරේ.

6.4 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ණය අයදුම්පත් ලැයිස්තු යොමුකිරීමේ අවසන් දිනය 2020.08.31 දින වේ.

7. බැංකු වෙත අරමුදල් මුදා හැරීම.

7.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඇමුණුම I ට අදාලව සුදුසුකම් තහවුරු කර ණය මුදල් ප්‍රමාණය අනුමත කිරීමෙන් පසුව, බැංකු විසින් ඉහත 6.3 හි සඳහන් ආකාරයට අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයට අදාල පොරොන්දු පත්‍රය ඇමුණුම 2 අනුව සකස් කොට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.

7.2 බැංකු විසින් ඉදිරිපත් කරන පොරොන්දු පත්‍ර පහත අයිතම මඟින් සුරක්ෂිත වී තිබිය යුතුය.

a. ගණුදෙනු කල හැකි භාණ්ඩාගාර බිල්පත්, පොරොන්දු පත්‍ර, ණයකර, සුරකුම් පත්, ඇප පත්‍ර, හෝ වෙනත් ගනුදෙනු කල හැකි රජයේ සුරුකුම්පත්
b. රන් කාසි හෝ ගන රන්
c. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර තීරණය කරන පරිදි වෙනත් ණය පත්‍ර

7.3 සුරුකුම් අයිතම සඳහා අදාල වන සීමාව (Haircut) 10% ක් වේ. වරින් වර මෙම සීමාව වෙන් කිරීවේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ. සුරුකුම් අයිතම වල සීමාවෙහි අඩුවක් සිදුවූ විට එය වහා පිරිමසා ගත යුතුය.

7.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන පොරොන්දුපත්‍ර වල පිළිගත හැකි බව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් තීරණය කරන අතර, ඒ අනුව මුළු ණය මුදල මුදා හැරීම තීරණය වේ.

7.5 ඉහත 7.4 හි මුදාහරින ණය ප්‍රමාණය දින 180 ක කාල සීමාවක් සඳහා වන අතර වාර්ෂිකව 1% ක පොලී අනුපාතිකයකට යටත් වේ. කල් පිරීමේදී ඒ සමාන නව පොරොන්දු පත්‍රයක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නව පොරොන්දු පත්‍රයේ වලංගුතාවය දන්වනු ඇත.

7.6 ඉහත කරුණු වලට අමතරව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද දින 270 කට නොවැඩි වට්ටම ලබා දීම තුළින් බැංකු වලට නිෂ්පාදන, ශිල්පීය නිෂ්පාදන, කෘෂිකාර්මික නිෂ්පාදන, සත්ත්ව නිෂ්පාදන, ඛණිජ හෝ වෙනත් කාර්මික නිෂ්පාදන යන අංශ වලට ණය ලබා දීමට කටයුතු සැලසේ .

7.7 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල ණය ප්‍රමාණය මුදා හැරීමෙන් පසු සතියක් ඇතුලත අදාල මෙම පරිශිෂ්ඨය යටතේ සුදුසුකම් ලත් එක් එක් ණය අයදුම්කරුවන්ට හිමි ණය මුදල ලබා දීම බැංකු සතු වගකීමක් වේ.

7.8 ණය ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව මාස 24ක් දක්වා වන අතර මාස 06 ක සහන කාලයක්ද ඊට ඇතුලත් වන අතර ණය අයදුම්කරුවන් විසින් සහන කාලය තුල පොලිය ගෙවිය යුතුය .

8. වාර්තාකරණය

ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම පරිශිෂ්ඨය යටතේ අරමුදල් යොදවා ඇති ආකාරය පිළිබඳ වාර්තාවක් සෑම දින 14කට වරක්ම එනම් සෑම මසකම 15 සහ 30 යන දෙදින සිට කාර්යාල දින 03 ඇතුලත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතුය.

9. **අධීක්ෂණය**

මෙම පරිශිෂ්ඨයට අදාල ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බැංකු අධීක්ෂන දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධව සිදු කෙරේ.

10. **වෙනත්**

අවශ්‍ය විටදී මෙම පරිශිෂ්ඨයෙහි අඩංගු නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ හෝ සංශෝධන කිරීමේ බලතල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේතුවේ අධ්‍යක්ෂ සතුවේ.

මෙයට විශ්වාසී

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : **RDD/PR-COVID19/2020/01 - (A-02)** සහ
RDD/PR-COVID19/2020/02 – (A-02)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.06.24

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකමට අදාල ලියාපදිංචි සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත

මහත්මයාණෙනි/මහත්මියනි,

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය

COVID-19 ව්‍යසනය හමුවේ දැඩි ලෙස හානියට පත් වූ ව්‍යාපාර සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා කලින් කලට සංශෝධනය කරන ලද උපදෙස් මාලාවන් ද ඇතුලත්ව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් නිකුත් කරන ලද 2020 අංක 04, 05 සහ 06 සැලකිල්ලට ගනිමින් නිකුත් කරන ලද 2020.04.01 දින හා 2020.04.06 දින දරණ මෙහෙයුම් උපදෙස් සඳහා වූ පරිශිෂ්ඨයන් හා බැඳේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද 2020.04.01 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID19/2020/01 හා 2020.04.06 දිනැති මෙහෙයුම් උපදෙස් සංශෝධන අංක RDD/PR-COVID19/2020/02 හා එහි කලින් කලට නිකුත් කරන ලද පරිශිෂ්ඨයන් ද (මින් මතු "මෙහෙයුම් උපදෙස්" ලෙස හඳුන්වනු ලබන) ඇතුලත්ව මෙම මෙහෙයුම් උපදෙස් මාලාව බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා පමණක් අදාළ වන පරිදි පහත ආකාරයෙන් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන මෙහෙයුම් උපදෙස් මාලාවේ 9 වන කොටස පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

9.2 බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ලබා දී තිබූ කාල සීමාව 2020.08.31 දක්වා දීර්ඝ කරන ලදී.

ඒ අනුව, යෝග්‍ය ණය අයදුම්කරුවන්ගේ ණය අයදුම්පත්, ලියාපදිංචි කිරීමේ ණය අයදුම්පත් භාරගන්නා අවසාන දිනය තෙක් බැංකු වලට භාරගත හැකිය.

අංක 9 යෙහි දක්වා ඇති අනෙකුත් නියමයන් නොවෙනස්ව පවතී.

මෙම පරිශිෂ්ඨයෙහි අන්තර්ගතයන් ඔබගේ බැංකුවේ හෝ ශාඛාවේ අදාළ නිලධාරීන් වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

මෙයට විශ්වාසී,

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක :- RDD/CGIS/WCL/2020/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො 30, ජනාධිපති මාවත
කොළඹ 01

30.06.2020

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා

COVID-19 ව්‍යවසනය නිසා බලපෑමට පත් ව්‍යාපාර සඳහා හඳුන්වා දෙන ණය ඇප ආවරණ සහ පොලී සහන යෝජනා ක්‍රමය සඳහා වන මෙහෙයුම් උපදෙස් මාලාව

COVID-19 ව්‍යවසන තත්වය හමුවේ බලපෑමට පත් ව්‍යාපාර සඳහා ලබා දෙන ණය හා පොලී සහන ක්‍රියාවලිය කඩිනම් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත 30.06.2020 දින නිකුත් කරන ලද අංක : RDD/CGIS/WCL/2020/01 දරණ මෙහෙයුම් උපදෙස් මාලාව.

1. **හැඳින්වීම**

1.1 COVID-19 ව්‍යවසනයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර නැවත නඟා සිටුවීම ජාතික අවශ්‍යතාවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුනාගෙන ඇති අතර, එම ව්‍යාපාර සඳහා මූල්‍ය ආයතන විසින් ණය මුදා හැරීම කඩිනම් කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දීමට තීරණය කර ඇත. මෙම නව යෝජනා ක්‍රමය මුදල් නීති පනතේ 83 වගන්තිය ප්‍රකාරව මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව 'සෞභාග්‍යා COVID-19 පුනරුදා සහන' යෝජනා ක්‍රමය හා සමගාමීව මුදල් මණ්ඩලය අනුමත දැනට ප්‍රකාශයට පත් කර ඇති රුපියල් බිලියන 150 තුල ක්‍රියාවට නංවනු ඇත.

1.2 සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන තම අරමුදල් යොදා ගනිමින් බලපෑමට පත් ව්‍යාපාර සඳහා සහනදායී පොලී අනුපාත යටතේ ණය ලබා දීම කාරක ප්‍රාග්ධන අපේක්ෂා කෙරේ. මූල්‍ය පිරිවැය ආවරණය කිරීම සඳහා පොලී සහනාධාර ලබා දීම සහ ණය අවධානම මහ හැරීම සඳහා ඇප සුරකුම් ලබා දීම මෙම යෝජනා ක්‍රමය හරහා සිදු කෙරෙනු ඇත.

1.3 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ උප ණය ඉල්ලුම්කරුවන් සඳහා ලබා දෙනු ලබන ණය සඳහා පොලී සහනාධාර සහ ණය ඇපකර ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ඉල්ලුම් කිරීමට සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන හිමිකම් ලබනු ඇත.

1.4 මෙම ණය යෝජනා ක්‍රමයේ සියලු මෙහෙයුම් කටයුතු සඳහා අධිකාරී බලය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වේ.

2. **අරමුදල්**

මෙම ණය යෝජනා ක්‍රමය සඳහා අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය විසින් සපයනු ලබයි.

3. **සහභාගීත්ව මූල්‍ය ආයතන**

'සෞභාග්‍යා COVID-19 පුනරුදා සහන' යෝජනා ක්‍රමය යටතේ දැනටමත් සහභාගීවන සියලුම මූල්‍ය ආයතන, මෙම යෝජනා ක්‍රමය සඳහා ද සුදුසුකම් ලබයි.

4. **යෝජනා ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ**

4.1 සුදුසුකම් ලබන ව්‍යාපාර	(i) මුදල් මණ්ඩල චක්‍රලේඛ අංක 052020 වගන්ති 2 අනුව COVID-19 ව්‍යවසනය පැතිර යාම හමුවේ බලපෑමට පත් ඕනෑම ව්‍යාපාරයක් මේ සඳහා සුදුසුකම් ලබයි. ඒ අනුව සුදුසුකම් ලත් ව්‍යාපාරවල වාර්ෂික පිරිවැටුම රු. බිලියන 1ට වඩා අඩු විය යුතුය. කෙසේ වූවත්, වාර්ෂික පිරිවැටුම රු. බිලියන 1ට වඩා අඩු විය යුතු වීම සංචාරක, අපනයන හා ඒ ආශ්‍රිත සැපයුම් යන අංශ සඳහා බල නොපායි. (ii) මෙම පහසුකම යටතේ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව පමණක් සලකා බැලේ.
4.2 උපරිම ණය සීමාව	එක් ණය ඉල්ලුම්කරුවෙකුට හෝ ව්‍යාපාරයකට උපරිමය රුපියල් මිලියන විසි පහකි. (රු.මිලියන 25)

4.3 ණය ඉල්ලුම්කරුවන් සඳහා වන පොලී අනුපාතය	(i) වාර්ෂික පොලී අනුපාතය 4% (ii) සහභාගීත්ව මූල්‍ය ආයතන කුමන වාතාවරණයක් යටතේ වුවත් මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය 4% වඩා වැඩියෙන් අය නොකල යුතුය.
4.4 පොලී සහනාධාරය	සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙන එක් එක් උප ණය මුදල සඳහා වාර්ෂිකව සියයට පහක (5%) පොලියක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙනු ඇත.
4.5 සහන කාලය	(i) ව්‍යාපාරයේ ස්වභාවය මත පදනම්ව උපරිම සහන කාලය මාස 06කි. (ii) සහන කාලය තුළ ණය ගැනුම්කරු විසින් අදාළ පොලිය ගෙවිය යුතුය.
4.6 ණය ආපසු අයකර ගැනීමේ කාලය	සහන කාලයද ඇතුලත්ව උපරිම ණය ආපසු ගෙවීමේ කාල සීමාව මාස 24කි.
4.7 ඇප ආවරණය	ණය මුදලේ ප්‍රමාණය මත ඇප ආවරණය පහත පරිදි වේ. 80% රු. මිලියන 0.5ට වඩා අඩු 70% රු. මිලියන 0.5ත් රු.මිලියන 1ත් අතර 60% රු. මිලියන 1ත් රු.මිලියන 10ත් අතර 50% රු. මිලියන 10ත් රු. මිලියන 25ත් අතර
4.8 ඇප වාරිකය	මුළු ණය මුදලින් සියයට දශම පහකි (0.5%)
4.9 සුරැකුම්	ණය ප්‍රදානය කිරීමේදී සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඇප සුරැකුම වෙනුවට ව්‍යාපාරයේ ශක්‍යතාවය හා මුදල් ප්‍රවාහය පිළිබඳව සලකා බලා ණය ප්‍රදානය කිරීම අපේක්ෂා කෙරේ.

5. ණය ගැණුම්කරුවන් ලියාපදිංචි කිරීම

5.1 සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය අයදුම්පත්‍රය මත එය භාරගන්නා දිනයට අදාල දින මුද්‍රාව සටහන් කළ යුතු අතර විධිමත් ආකෘතියකින් යුතු කුවිතාන්සියක් ණය අයදුම්කරුට එදිනම ලබා දිය යුතුය.

5.2 සහභාගීත්ව මූල්‍ය ආයතනයක් අයදුම්පත්‍රය භාරගත් දිනයේ සිට දින 7ක් ඇතුළත ණය අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කල යුතු අතර යෝග්‍යතාවය හෝ එසේ නොවන බව දැනුවත් කල යුතුය.

5.3 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ යෝග්‍ය ණය ඉල්ලුම්කරුවන්ගේ විස්තර ඇතුලත් ලියාපදිංචිය කිරීමේ ලැයිස්තුව (ඇමුණුම I) මූල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාව හරහා බලයලත් නිලධාරියකුගේ අත්සනින් යුක්තව ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. මෘදු පිටපත ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරනු ලබන ඊ තැපෑල වෙත යොමු කල යුතු අතර ඊට සමගාමීව දෘඩ පිටපතද ලැබීමට සැලැස්විය යුතුය.

5.4 සහභාගීත්ව මූල්‍ය ආයතන සහතික විය යුතු කරුණු :

i. ඇමුණුම I මඟින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු වල නිවරදිභාවය සහ සම්පූර්ණභාවය
ii. යෝජනා ක්‍රමයට අනුව ණය ගැණුම්කරුවන්ගේ යෝග්‍යතාවය නියමිත පරිදි තක්සේරු වී ඇති බව
iii. තක්සේරු කිරීමට අදාල සියලුම ලේඛණ ලබා ගෙන ඇති බව

ඡේදයට අනුව වැඩිදුර තොරතුරු විමසීමකදී හෝ නිවරදිභාවය තහවුරු කර ගැනීමක් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන අදාල සියලුම ලියකියවිලි සහ සටහන් පවත්වා ගත යුතුය.

5.5 මූල්‍ය ආයතනවලින් ඇමුණුම I ලැබුණු පසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි ඇතුලත් වන තොරතුරු සහ ණය ඉල්ලුම්කරුගේ යෝග්‍යතාවය ණය ඉල්ලුම්කරුට ලබා දිය යුතු ණය මුදල් ප්‍රමාණය තහවුරු කරනු ලබයි. ඒ අනුව මහ බැංකුව විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ යෝග්‍ය ණය ඉල්ලුම් කරුවන් ලියාපදිංචි කරනු ඇත.

5.6 ණය ගැණුම්කරුවන්ගේ ලියාපදිංචිය අනුව එක් එක් ණය සඳහා ලියාපදිංචි අංකයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අතර එම ලියාපදිංචි අංකය අදාල සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාව වෙත දැනුම්දෙනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව අදාල ණය ගැණුම්කරු සම්බන්ධයෙන් ඉදිරියේදී සිදුවන සියලුම ලිපි ලේඛන මෙම ලියාපදිංචි අංකය හා බැඳේ.

5.7. ඇමුණුම I මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇති තොරතුරුවල කිසියම් වෙනසක් හෝ සාවද්‍ය බවක් ඇති නම්, කිසිදු පෙර දැනුම් දීමකින් තොරව එම ණය ඉල්ලුම්කරුගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ හිමිකම මහ බැංකුව සතුය.

5.8 ණය අයදුම්පත් ලියාපදිංචි කිරීමේදී වැඩිදුරටත් කරුණු පැහැදිලි කර ගැනීමේ අවශ්‍යතාවක් ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති වුවහොත්, එම අයදුම්පත් නැවත අදාළ සහභාගීත්ව ආයතනවලට හරවා යැවීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

5.9 ඉහත 5.5 ඡේදයට අනුව වැඩිදුර තොරතුරු විමසීමකදී හෝ නිවරදිභාවය තහවුරු කර ගැනීමක් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන අදාල සියලුම ලියකියවිලි සහ සටහන් පවත්වා ගත යුතුය.

5.10 ඇමුණුම අංක I ට අනුව ණය ලියාපදිංචි කිරීමේ ලැයිස්තුව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට භාර දීමේ අවසාන දිනය 31.08.2020 වේ.

6. ණය මුදා හැරීම

6.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ලියාපදිංචි අංක ලැබුණු පසු සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඇමුණුම I ට අනුව යෝග්‍ය ණය ඉල්ලුම්කරුවන් සඳහා වැඩ කරන දින 7ක් ඇතුලත ණය මුදා හැරිය යුතුය.

6.2 6.1 වගන්තිය පරිදි කිසියම් මූල්‍ය ආයතනයකට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වූ ණය ඉල්ලුම්කරුවකුට අදාල කාල වකවානුව තුල ණය මුදා හැරීමට නොහැකි වුවේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් පිලිගත හැකි හේතු දින 7 ක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද හේතූන් පිළිබඳව විමසා බැලීමක් සිදු කරනු ලබන අතර ඒ අනුව, සුදුසු තීරණ/ක්‍රියාමාර්ග ගනු ඇත.

6.3 යම් හේතුවක් නිසා ණය මුදාහැරීමට නොහැකි වීම හෝ ඒ පිළිබඳ පිළිගත හැකි හේතුවක් ලියාපදිංචි දිනයේ සිට දින 30 ක් ඇතුලත ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත්, අදාල සහභාගීත්ව මූල්‍ය ආයතනයට පෙර දැනුම් දීමකින් තොරව අදාල ණය ඉල්ලුම්කරුගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ හිමිකම මහ බැංකුව සතුවේ.

7. පොළී සහනාධාරය ගෙවීම

7.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් වලට අදාල නියමයන් හා කොන්දේසීන්ට යටත්ව හා අනුකූලව ගිවිසුම් ගතව ලබා දුන් ණය සඳහා වාර්ෂිකව 5% පොළී සහනාධාරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙනු ඇත.

7.2 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය සහනාධාරය සඳහා සුදුසුකම් ලබා ගැනීමට නම් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සෑම අවස්ථාවකම 4.3 වගන්තියෙහි සඳහන් කර ඇති පොළී අනුපාතය යටතේ සුදුසුකම් සපුරා ඇති ණය ඉල්ලුම්කරුවන්ට මෙහෙයුම් උපදෙස් මාලාවේ 4.8 වගන්තිය හා අනුකූලව ණය ලබා දිය යුතුය.

7.3 මෙම මෙහෙයුම් උපදෙස් හි කිසිදු කොන්දේසියක් හො සමඟ අනුගත නොවන විටදී යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා මහ බැංකුවෙන් ලබා දෙන පොළී සහනාධාරය හෝ ණය ඇප වාරිකය ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන සුදුසුකම් නොලබනු ඇත.

7.4 පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පොළී සහනාධාරය ලබා දෙනු ඇත.

7.4.1 අංක 6.1 වගන්තිය අනුව මහ බැංකුවේ ලියාපදිංචි ණය ගැණුම්කරුවන්ට සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය මුදා හැරිය යුතුය. සම්පූර්ණ කරන ලද ඇමුණුම II සහ එක් එක් ණය මුදලට අදාල 0.5 ක ඇප වාරිකයත්, ණය මුදාහැර දින 30 ක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබීමට සැලැස්විය යුතුය.

7.4.2 සහභාගීත්ව මූල්‍ය ආයතන තම ප්‍රධාන ශාඛාව මඟින් අර්ධ වාර්ෂිකව ඇමුණුම III සම්පූර්ණ කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවිය යුතු අතර මෙහෙයුම් උපදෙස් මාලාවේ අංක 7.4.4 වගන්තියෙහි සඳහන් පරිදි නියමිත කාලයන්ට අනුකූලව විය යුතුය. එම අයදුම්පත් හි මෘදු පිටපත හා දෘඩ පිටපත ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබීමට සැලැස්විය යුතුය.

7.4.3. අර්ධ වාර්ෂිකව ලබා දෙන පොළී සහනාධාරය දින 365 මත පදනම්ව, හීනවන ශේෂ ක්‍රමය ඔස්සේ මාසිකව ගණනය කරනු ලබයි. එක් එක් ණය ඉල්ලුම්කරු සඳහා වන පොළී සහනාධාරය ණය ආපසු ගෙවීමේ ලේඛනය මඟින් ගණනය කරනු ලබන ප්‍රාග්ධන (දැනට පවතින) මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරනු ලබයි.

7.4.4 ණය යෝජනා ක්‍රමය යටතේ පොළී සහනාධාරය ඉල්ලුම් කිරීම සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම III එක් එක් වර්ෂයෙන් හි ජනවාරි සහ ජුලි යන මාසයන් හි 15 වන දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවිය යුතුය.

7.4.5. ඇමුණුම III දෘඩ පිටපත 'අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නො 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතු අතර, මෘදු පිටපත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන විද්‍යුත් තැපෑල වෙත එවිය යුතුය.

7.4.6 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම III ලැබීමෙන් දින 30 ක් ඇතුලත මහ බැංකුව විසින් 4.4 වගන්තියෙහි සඳහන් වන පරිදි පොළී සහනාධාර නිදහස් කරනු ඇත.

7.4.7 වැඩි විස්තර අවශ්‍ය අවස්ථා වලදී, ඕනෑම සහභාගීත්ව මූල්‍ය ආයතනයක පොළී සහනාධාර අයදුම්පත් අත්හිටුවීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. තවද, ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් වලට අනුකූල නොවන පොළී සහනාධාර අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ද ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

7.4.8 ඉදිරියේදී ගෙවීමට නියමිත පොළී සහනාධාර ගෙවීම් වලින්, පෙර ගෙවිය යුතු ගෙවීම් වැඩි/අඩු පියවීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

7.4.9 පොළී සහනාධාරය ලබා දෙනු ලබන්නේ එක් එක් උප ණය මුදලක් සඳහා උපරිමය මාස 24ක කාලයක් සඳහා පමණි.

7.4.10 මාස 24ක ණය ආපසු ගෙවීමේ කාල සීමාව ඇතුලත, යම් සහභාගීත්ව මූල්‍ය ආයතනයක් උප ණය ගැනුම්කරුවකු සඳහා අදාළ ණය ඇප ආවරණ අයදුම් කලහොත්, පොළී සහනාධාර ගෙවනු ලබන්නේ ඇප ආවරණ අයදුම් කල දිනය දක්වා පමණි.

8. ණය ඇපකරය

8.1 ඇප ආවරණය

අ) සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඇපකර වාරිකය ගෙවන ලද දින සිට, ණය ඇප ආවරණය බල පැවැත්වේ.

ආ) නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලිව කටයුතු කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය අපොහොසත් වී තිබේ නම් හෝ ණය ලබා දීමේදී නොසැලකිලිමත් වී ඇත්නම්, සහ/හෝ නැවත අයකර ගැනීමේ සාධනීය ක්‍රියා පිළිවෙලක් අනුගමනය නොකරමින් ණය ගිණුම අධීක්ෂණය කර ඇත්නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණය අනුව ඇප ආවරණය නවතා දැමීමේ හැකියාව ඇත.

8.2 ඇපකර වාරික ගෙවීම

අ) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු ඇප ණය ආවරණ වාරිකය, ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් ඕනෑම උප ණය ගැනුම්කරුවෙකුට නිකුත් කරන ලද උප ණය මුදලේ වටිනාකමින් සියයට දශම පහක් (0.5%) ලෙස ගණනය කෙරේ.

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය ඇප ආවරණ වාරිකය ගෙවීමට අපොහොසත් වීම, අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනය ණය ඇප ආවරණ ලබා ගැනීම සඳහා නුසුදුස්සෙකු සේ සළකනු ලබයි.

ඇ) නැවත ආපසු ගෙවීමේ කාලය දීර්ඝ නොකළ හොත්, ණය ඇප ආවරණය මාස විසි හතරක (24) ආපසු ගෙවීමේ කාලය අවසානයේ දී, ක්‍රියාත්මක වීම නවතිනු ඇත.

ඈ) ඇප වාරික ප්‍රකාශය (Premium Statement) (ඇමුණුම II) ඒ සඳහා ගෙවිය යුතු වාරිකය සමඟ අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය.

ඉ) ඇප වාරික ගෙවීම අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව නමට චෙක්පතක් මඟින් තත්කාලීන දළ ගෙවීම්/පියවීම් පද්ධතිය (RTGS) හරහා අංක 254518 දරණ ප්‍රාදේශීය සංවර්ධනය දෙපාර්තමේන්තුවේ ගිණුම වෙත බැර කල යුතුය.

ඊ) ණය ඇප වාරික සඳහා අදාළ පිරිවැය, අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් දරා ගත යුතු අතර, ණය ගැනුම්කරුවන් වෙත එය පැවරීම නොකළ යුතුය.

9. සහභාගීත්ව මූල්‍ය ආයතන වල වගකීම්

9.1 ණය ලියාපදිංචි කිරීමට/ණය මුදාහැරීමට පෙර සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් පීඩාවට පත් ව්‍යාපාරය නැවත නගා සිටුවීමට ඇති හැකියාව පිළිබඳ තක්සේරු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ගයන් ගත යුතුය.

9.2 සහභාගීත්ව මූල්‍ය ආයතන සෑම විටම උප ණය ගැනුම්කරුවන් සඳහා ණය මුදල් මුදා හැරීමේ දී වඩාත් සැලකිල්ලෙන් හා විචක්ෂණශීලීව කටයුතු කල යුතු අතර, ණය මුදල මුදා හරින ලද අරමුණ සඳහා ම එය භාවිත කරන බව තහවුරු කර ගත යුතුය.

9.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් උප ණය ගැනුම්කරුවන්ගේ ගිණුමේ තත්ත්වය සහ මෙහෙයුම් අධීක්ෂණය කළ යුතු අතර, සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත සිදුවන පාඩු අවම කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී කඩිනම් පියවර ගත යුතුය.

9.4 ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු අයකර ගැනීම සඳහා අවශ්‍ය සහ ප්‍රමාණවත් පියවර සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ගත යුතුය.

9.5 මෙහෙයුම් උපදෙස් වල ඇතුලත් 8.2 වගන්තිය ප්‍රකාරව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය ඇප වාරික ගෙවීම සිදු කල යුතුය.

9.6 ණය යෝජනා ක්‍රමයට අදාළ දත්ත සහ තොරතුරු සහභාගීත්ව මූල්‍ය ආයතනය සතුව පවත්වා ගත යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති ආකෘති පදනම් කර ගනිමින් හෝ වෙනත් ආකාරයකින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා ඉල්ලා සිටින දත්ත හා තොරතුරු ලබා දිය යුතුය.

9.7 ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව, ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති කිසිදු උප ණයක් කපා හැරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන හට අවසර නොමැත.

10. ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්

10.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය යෝජනා ක්‍රමය සඳහා අදාළ මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන අතර අවශ්‍ය විටෙක සංශෝධන සිදු කරනු ලැබේ.

10.2 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ධ වාර්ෂිකව අදාළ පොලී සහනාධාර සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවීම සිදු කරනු ලබයි.

10.3 මෙහෙයුම් උපදෙස් හි 8.2 වගන්තිය ප්‍රකාරව සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය ඇප වාරික ගෙවා ඇති සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන් සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත ණය ඇප ආවරණ නිකුත් කරයි.

10.4 ශ්‍රී ලංකා මහ බැංකුව, ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය අධීක්ෂණය/ඇගයීම සහ අවශ්‍ය විටෙක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවනු ලබයි.

10.5 සහභාගීත්ව මූල්‍ය ආයතනය ණය යෝජනා ක්‍රමයේ නියමයන් හා කොන්දේසි උල්ලංඝනය කරයි නම්, ඒවාට අනුකූල වීමට අසමත් වේ නම්, නොසලකා හරියි නම් හෝ විචක්ෂණ නොවන ක්‍රියාවන් හෙළිදරව් වේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලද ඕනෑම ණය ඇප ආවරණයක් අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

11. ණය පැහැර හැරීම් වාර්තා කිරීම

11.1 කිසියම් උප ණයක් හෝ වාරිකයක්, උප ණයගැතියා විසින් නියමිත දිනට ආපසු නොගෙවන්නේ නම්, උප ණය ගැනුම්කරුවාගෙන්/ණයකරුවන්ගෙන් එම හිඟ ණය මුදල් අයකර ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් කඩිනම් හා ඵලදායි පියවර ගත යුතුය.

11.2 ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය, අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කල විට, ණය වර්ගීකරණය, ආදායම් හඳුනා ගැනීම සහ ප්‍රතිපාදන සැපයීම පිළිබඳ 2008 අංක 03 සහ 04 බැංකු පනත අනුව සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක් එක් උප ණය ගැනුම්කරුගේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබා දිය යුතුය. මෙම වාර්තාව පහත විස්තර ඇතුලත් විය යුතුය.

11.2.1 උප ණය ගැනුම්කරු මුහුණ පා ඇති ගැටළු පිළිබඳ ඇගයීම් වාර්තාවක්

11.2.2 උප ණය ගැනුම්කරුගේ නැවත ගෙවීමේ හැකියාව පිළිබඳ තක්සේරු වාර්තාවක්

11.2.3 ණය මුදල් නැවත අයකර ගැනීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ගන්නා ලද පියවර සහ ඉදිරි ක්‍රියාමාර්ග.

11.2.4 නැවත අයකර ගැනීමට/නැවත යථා තත්ත්වයට පත් කිරීමට ඇති හැකියාව සම්බන්ධව සහභාගීත්ව මූල්‍ය ආයතනයේ අදහස

11.2.5 ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි අවශ්‍ය වන අනෙකුත් තොරතුරු

12. හිමිකම් පෑමේ ක්‍රියාපටිපාටිය

12.1 කිසියම් ණය මුදලක් පැහැර හැරීමක් සහ/හෝ ණය ගැනුම්කරුට මෙහෙයුම් උපදෙස් හි 11 වන වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වීමට නොහැකි වුවහොත්, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අදාළ ණය අක්‍රීය ණය කාණ්ඩයට ඇතුලත් කල දින සිට දින 30ක් ඇතුලත ණය ගැනුම්කරු වෙත ඉල්ලුම් පොරොන්දු පත්‍රිකාවක් යැවිය යුතුය.

12.2 පසුව, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය ගැනුම්කරුට ඉල්ලුම් පොරොන්දු පත්‍රිකාවක් ලබා දුන් දින සිට මාසයක් ඉකුත් වීමෙන් පසු නමුත් මාස දෙකකට නොඅඩු කාලසීමාවක දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත හිමිකම් පෑමක් ඉදිරිපත් කල යුතුය.

12.3 ණය ගැනුම්කරුට නිකුත් කරන ලද ඉල්ලුම් පොරොන්දු පත්‍රිකාවක් (Demand Notice) සහතික කල පිටපත් සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා භාරගෙන ඇති බවට ලද සාක්ෂි ද සහිතව හිමිකම් ඉල්ලුම් පත්‍රය (ඇමුණුම IV) යැවිය යුතුය.

12.4 මෙහෙයුම් උපදෙස් හි 12.5 සහ 12.8 වගන්තියට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාරික දෙකකින් අදාළ සහතික කළ ණය ඇප ආවරණ පියවනු ලැබේ.

12.5 ඇමුණුම IV ලැබීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළමු වාරිකය ගෙවනු ලැබේ. එනම්, ණය මුදලේ පවතින හිඟ මුදල මත පදනම්ව සහතික කළ ඇප මුදලින් සියයට පනහකි (50%).

12.6 ණය පැහැර හරින ලද සියලුම ණය ගැනුම්කරුවන්ට එරෙහිව සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ගත යුතුය. පැහැර හරින ලද රුපියල් ලක්ෂ පහ (500,000) ට අඩු ණය සමඵ මණ්ඩලයට යොමු කරන අතර, රුපියල් ලක්ෂ පහ (500,000) ට වැඩි ණය සඳහා සුදුසු පරිදි නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

12.7 මෙහෙයුම් උපදෙස් යටතේ අවශ්‍ය අධීක්ෂණ හා ක්‍රියාමාර්ග ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය සමත් වී හෝ ඒ පිළිබඳ නොසැලකිලිමත් වී ඇති බව තහවුරු වුවහොත්, දැනටමත් ගෙවා ඇති ණය ඇප ආවරණ මුදල නැවත ඉල්ලා සිටීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

12.8 පළමු වාරිකය ගෙවීමෙන් පසු, අවසාන වාරිකය ගෙවීම සඳහා නෛතික/ප්‍රතිසාධන ක්‍රියාමාර්ගයන්ගෙන් පැන නඟින නඩු අංක සමඟ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම V, ඉහත 12.5 වගන්තියේ සඳහන් කර ඇති පරිදි පළමු වාරිකය ගෙවීමෙන් මාස හයක් (06) ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

13. නැවත අයකර ගැනීමේ ක්‍රියාපටිපාටිය

13.1 ණය ඇප ආවරණ ලබා ගැනීමට ඇති හැකියාව නොසළකා, ණය යෝජනා ක්‍රමය යටතේ උප ණය අයකර, ගැනීම අධීක්ෂණය කිරීම සඳහා නිසි අභ්‍යන්තර යාන්ත්‍රණයක් සහභාගීත්ව මූල්‍ය ආයතනය සතුව තිබිය යුතුය.

13.2 කිසියම් කල් ඉකුත් වූ ණය මුදලක් ආපසු අයකර ගැනීමට කඩිනම් හා ඵලදායී පියවර සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ගතයුතු අතර, ගන්නා ලද පියවරයන් සහ ව්‍යාපාරයේ ප්‍රගතිය පිළිබඳව අවශ්‍ය අවස්ථාවක දී ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කළ යුතුය.

13.3 පැහැර හරින ලද උප ණය ගැනුම්කරුවන්ට එරෙහිව ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කරනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ගත යුතුය. ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඇප ආවරණය ලබා ගැනීමෙන් පසුව වුවද, එවැනි උප ණය ගැනුම්කරුවන්ට එරෙහිව දැනටමත් ගෙන ඇති අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අත්හිටුවිය නොහැක.

14. පසු හිමිකම් අයකර ගැනීම

14.1 ණය ඇප ආවරණ ලබා ගැනීමෙන් පසු, උප ණය ගැනුම්කරුවන්ගෙන් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ආපසු අයකර ගැනීම් තිබේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගීත්ව මූල්‍ය ආයතනය අතර 80:20, 70:30, 60:40 සහ 50:50 යන අනුපාතයන්ට බෙදා ගත යුතුය. මේ සඳහා 'ඇමුණුම VI'ආකෘතිය භාවිතා කළ හැකිය. සෑම වසරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 යන දින සිට දින 30ක් ඇතුලත, නිසි පරිදි සම්පූර්ණ කරන ලද 'ඇමුණුම VI' ආකෘතිය සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අර්ධවාර්ෂිකව ලැබීමට සැලැස්විය යුතුය.

14.2 ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ලබා ගත් මුළු ඇප ආවරණ මුදල සහ අයකර ගැනීම් ආදිය සඳහන් ලේඛනයක් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් පවත්වා ගත යුතු අතර, එම ලේඛනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය පවරන ලද ඕනෑම නිළධාරියෙකුට ලබා දිය යුතුය.

14.3 පැහැර හරින ලද උප ණය අයකර ගැනීම සඳහා වන නෛතික වියදම්, උපණය ගැනුම්කරුවන්ගෙන් අයකර ගන්නා මුදලින් පළමුව අය කර ගත යුතු අතර ඉතිරි මුදල ඉහත 14.1 වගන්තියේ දක්වා ඇති අනුපාතයට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ බෙදා ගත යුතුය.

15. පරීක්ෂා කිරීම

15.1 ණය යෝජනා ක්‍රමයේ අරමුණු සඳහා අවශ්‍ය පරිදි, යෝජනා ක්‍රමය යටතේ සහතික කර ඇති ඕනෑම ණයක් සඳහා අදාළ ගිණුම් පොත් සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ වෙනත් වාර්තා පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව හට අයිතිය ඇත.

15.2 ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යාකරණය කර ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන ලියකියවිලි හා ගිණුම් පොත් අවශ්‍ය විටෙක ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දීමට සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් නිළධාරීන්ට ව්‍යාපාරය පරීක්ෂා කිරීමට අවසර දිය යුතු බවට, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් උප ණය ගැනුම්කරුට ණය ලබා දීමේ දී කොන්දේසියක් පැනවිය යුතුය.

15.3 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය යෝජනා ක්‍රමයේ නියමයන් හා කොන්දේසි උල්ලංඝනය කර ඇති බව පෙනී යන්නේ නම්, ඇප ආවරණ සහ/හෝ හිමිකම් පියවීම සඳහා කරන ලද ගෙවීමක් අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

16. තොරතුරු සැපයීම

සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය යෝජනා ක්‍රමය යටතේ සහතික කර ඇති ඕනෑම ණයක් සම්බන්ධයෙන් අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය පරිදි ලබා දිය යුතුය.

17. වෙනස් කිරීම් සහ පරිපුරක විධිවිධාන

17.1 ණය යෝජනා ක්‍රමය යටතේ නිකුත් කර ඇති කිසියම් ණය ඇප ආවරණයක් මඟින් පැන නගින අයිතිවාසිකම් හෝ බැඳීම් වලට බලපෑම් නොකර, යෝජනා ක්‍රමය වෙනස් කිරීමට හෝ ඉවත් කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අයිතිය ඇත.

17.2 ණය යෝජනා ක්‍රමයේ නිශ්චිතව දක්වා නොමැති ඕනෑම කරුණක් සම්බන්ධයෙන් වුවද, යෝජනා ක්‍රමයේ අරමුණු සඳහා අවශ්‍ය පරිදි පරිපූරක හෝ අතිරේක විධිවිධාන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලැබේ.

මෙම ණය යෝජනා ක්‍රමය 2020 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR/2010/03 (A-05)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.06.30

සියළුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

"සෞභාග්‍යා" ණය යොජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය උප ණය සඳහා වන පොළී අනුපාත අඩු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය සඳහා නිකුත් කරන ලද 2010.03.22 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 (සංශෝධිත) හා බැඳේ.

වෙළඳපොල පොළී අනුපාත අඩු කිරීම සැලකිල්ලට ගනිමින් 2010.03.22 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 (සංශෝධිත) හි අංක 3.6 සහ 3.7 වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරන ලදී.

3.6 3.6.1 ප්‍රතිමූල්‍ය ණය සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත පවතින පොළී අනුපාතය සියයට 3ක වාර්ෂික පොලියක්

3.6.2 සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා පොළී ආන්තිකය සියයට 3ක වාර්ෂික පොලියක්

3.7 උප ණය සඳහා පොළී අනුපාතය සියයට 6ක වාර්ෂික පොලියක්

මෙහෙයුම් උපදෙස් මාලාවෙහි පවතින අනෙකුත් සියලුම නියමයන් නොවෙනස්ව පවතී.

මෙම පරිශිෂ්ඨය 2020.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

මෙම මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයෙහි අන්තර්ගතයන් ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු වෙත/ශාඛාවල නිලධාරීන්ට දැනුම් දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙයට **විශ්වාසි**

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.07.01

විධායක නිලධාරි/කළමනාකරණ අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරිඃ "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ ලියාපදිංචි සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත

මහත්මයාණෙනි/මහත්මියනි,

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යොජනා ක්‍රමය

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ මූල්‍ය පහසුකම් සැලසීමට මුදල් නීති පනතෙහි 83(1) වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව, වාණිජ බැංකු සඳහා අත්තිකාරම් ලබා දීමේ විධිවිධාන වලට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද 2020.06.19 දිනැති අංක : RDD/PR-COVID19/2020/03 සහ RDD/PR-COVID19/2020/04 යන මෙහෙයුම් උපදෙස් හා බැඳේ.

2. මුදල් නීති පනතේ 83(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, පොරොන්දු පත්‍ර මත "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු වලට අදාළ පහසුකම ලබා ගැනීම සඳහා පහත ප්‍රකාරයෙන් සුරැකුම්පත් තැබීමට මුදල් මණ්ඩලය විසින් අවසරය ලබා දී ඇත.

   රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රන් සහ ගන රන් ශ්‍රී ලංකා මූල්‍යකරණ ව්‍යාපාරකරණ ප්‍රමිත අංක 9ට අනුකූලව උකස් කළඹ ද ඇතුලත්ව අදාල බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අදියර 1 යටතේ වර්ගීකරණය කර ඇති ක්‍රියාකාරී ණය අයවීම්.

3. ණය මුදල් කඩිනමින් ගලා යාමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ණයලාභීන් ඇතුළත් කර ගැනීමේ නිර්ණායක සහ අනුමත ණය ප්‍රමාණයන් තහවුරු කර ගැනීමෙන් අනතුරුව, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉහත සඳහන් ණය පහසුකම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍ය ලබා ගැනීමට පෙර වුවද අනුමත ණය මුදල් ණයලාභීන් වෙත සියයට 4 පොලී අනුපාතිකය යටතේ මුදා හැරිය හැකිය.

මෙම ලිපියේ අන්තර්ගතයන් ඔබ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛාවල නිලධාරීන් වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

මෙයට **විශ්වාසි**

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/03 සහ **04 (A-01)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.07.08

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම යටතේ, ලියාපදිංචි සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි 2020.06.19 දින දරණ අංක : RDD/PR-COVID19/2020/03 සහ 04 ට අදාළ මෙහෙයුම් උපදෙස් හා බැඳේ.

ඉහත ණය යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හා බලපත්‍රලාභී වාණිජ බැංකු මඟින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, පොරොන්දු පත්‍රිකා (Promissory Notes) සුරක්ෂිත කිරීම සඳහා ඉදිරිපත් කරන ඇප සුරැකුම් පිළිබඳ විධිවිධාන තවදුරටත් විශ්ලේෂණය කෙරේ.

ඒ අනුව, 2020.06.19 දිනැතිව නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/03 හා 04 හි වගන්ති අංක 7.1 සිට 7.4 දක්වා පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. මෙහෙයුම් උපදෙස් හි 7.1 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතුය.

   7.1 උප ණය ගැනුම්කරුවන්ගේ යෝග්‍යතාව හා මුදා හැරීමට නියමිත ණය මුදලට අදාළ අනුමැතීන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් පසු, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින්, නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ණය ගිවිසුම (ඇමුණුම A-01-I) පහත පත්‍රිකා සමඟ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය.

   අ) උප ණය ගැනුම්කරුවන් වෙත මුදා හැර ඇති/මුදා හැරීමට නියමිත ණය පිළිබඳ විස්තර (උපලේඛනය I)

   ආ) ඉහත 7.1 (අ) හි දක්වා ඇති මුළු ණය මුදලෙහි අනුමත වටිනාකමට අදාළ පොරොන්දු පත්‍රිකාව (Promissory Note) (උපලේඛනය II)

2. මෙහෙයුම් උපදෙස් හි 7.2 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතුය.

7.2.1 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ණය ගිවිසුම සමඟ ඉදිරිපත් කරනු ලබන පොරොන්දු පත්‍රිකාව (Promissory Note) පහත දැ මඟින් සුරක්ෂිත කළ යුතුය.

අ) රාජ්‍ය සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර-SLDB)

ආ) රන් සහ ගන රන්

ඉ) ශ්‍රී ලංකා මූල්‍යකරණ ව්‍යාපාරකරණ ප්‍රමිත අංක 9ට අනුකූලව උකස් කළඹ ද ඇතුලත්ව අදාල බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අදියර 1 යටතේ වර්ගීකරණය කර ඇති ක්‍රියාකාරී ණය අයවීම්.

7.2.2. "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි අදියර II යටතේ ණය ගිවිසුම සමඟ භාරදෙන සෑම පොරොන්දු පත්‍රිකාවක්ම ඉහත 7.2.1 යටතේ දක්වන ලද සුරැකුම් මඟින් සුරක්ෂිත කළ යුතු අතර, මෙහි විස්තර කර ඇති උපලේඛන සහිත ණය ගිවිසුම හා සමඟ විය යුතුය. එක් එක් පොරොන්දු පත්‍රය සඳහා තබන සුරැකුම් මත පදනම්ව පහත සඳහන් උකස් ගිවිසුම/ගිවිසුම් තිබිය යුතුය.

අ) භාණ්ඩාගාර බිල්පත් සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-II)

ආ) භාණ්ඩාගාර බැඳුම්කර සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-III)

ඉ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A- 01-IV)

ඊ) රන් සහ ගන රන් (Bullion) සඳහා සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-V)

උ) උකස් කළඹ ඇතුළු ණය ලැබීම් සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-VI)

7.2.3 ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඇමුණුම A-01-VII හි පරිදි, ණය ගිවිසුම සමඟ භාරදෙන සෑම පොරොන්දු පත්‍රිකාවක් වෙනුවෙන් උකස් තැබීමට බලාපොරොත්තු වන මෙවලම් පිළිබඳ තොරතුරු, පොරොන්දු පත්‍රිකාව ලබා දීමට පෙර බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විද්‍යුත් තැපෑල ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතුය.

7.2.4 ණය ගිවිසුමේ සහ උකස් ගිවිසුමේ සඳහන් ක්‍රියාපටිපාටීන්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පිළිපැදිය යුතුය.

3. මෙහෙයුම් උපදෙස් හි 7.3 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතුය.

7.3.1 රාජ්‍ය සුරැකුම්පත් වල මිලකරණය කිරීමට ඔවුන්ගේ කෙටි කාලීන/දිගු කාලීන වටිනාකම ගණනය කිරීම මත පදනම්ව ණය හිමියා විසින් උකස් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වල මුහුණත් අගය ණයගැතියා වෙත දන්වනු ලබයි.

7.3.2 උකස් කරනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල මුහුණත් අගය පහත සඳහන් සූත්‍රය මඟින් තීරණය කළ යුතුය.

මුහුණත් අගය (ඇ.ඩො.) = ණය මුදල x 1.05 / එතැන් (SPOT) විනිමය අනුපාතිකය
(ශ්‍රී ලංකා රුපියල්/ඇ.ඩො.)

7.3.3. රාජ්‍ය සුරැකුම්පත් හැර, සුරැකුම් මෙවලම/මෙවලම් සඳහා සුදුසු සීමාව (Haircut) සියයට දහයක් (10%) විය යුතුය.

7.3.4 වරින්වර, එවැනි සීමාවන් (Haircut) වෙනස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. සුරැකුම් මෙවලම/මෙවලම් හි සීමාවන් (Haircut) හි කිසියම් හිඟයක් ඇති වුවහොත් වහාම නැවත පිරවිය යුතුය.

7.3.5 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර, ඇප තැබීමට අවශ්‍ය වූ විට, ඔවුන් විසින් එම භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වල විස්තර විද්‍යුත් මාධ්‍යක් වන, මාර්ගගත විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතිය (OEBS) හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතු අතර, ඇප සුරැකුම් කල් පිරීමට ඉතිරි දින ගණන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදා හරින ලද ණය මුදලේ කල් පිරීමේ කාලසීමාවට වඩා අඩු නොවිය යුතුය.

4. මෙහෙයුම් උපදෙස් හි 7.4 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතුය.

7.4 නිසි පරිදි සම්පූර්ණ කරන ලද උපලේඛන හා ණය ගිවිසුමේ දෘඩ පිටපත් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ලැබීමෙන් පසු, උකස් ගිවිසුමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව, අදාළ ණය මුදල බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් වෙත මුදා හැරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. කෙසේ වෙතත්, අදාළ දිනයේ මධ්‍යහන 12.00 ට පෙර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද උපලේඛන හා ණය ගිවිසුමේ දෘඩ පිටපත් නොලැබුණහොත් ණය මුදල් එදිනම මුදා හැරීම සිදු නොකරයි.

මෙහෙයුම් උපදෙස් හි අනෙකුත් සියලු වගන්ති සංශෝධනය නොවේ.

මෙම මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයෙහි අන්තර්ගතය, ඔබ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවල/ශාඛාවල නිලධාරින්ගේ අවධානයට යොමු කරන මෙන් ඉල්ලමි.

මෙයට විශ්වාසි

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/03 - 04 (A-02)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.07.10

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ ලියාපදිංචි සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සඳහා වූ පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම යටතේ නිකුත් කරන ලද 2020.06.19 දිනැති අංක : RDD/PP-COVID19/2020/03 සහ 04 සංශෝධිත මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨ හා බැඳේ.

ඉහත ණය යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් 2020.06.19 (සංශෝධිත) දිනැතිව නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/03 සහ 04 හි 3.2 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

මෙහෙයුම් උපදෙස් හි අංක 3.2 දරණ වගන්තියේ දක්වා ඇති "සුදුසුකම්ලත් ව්‍යාපාර/උප ණයගැතියන්" යන වගන්ති වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

3.2 "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" (අදියර I) පහසුකම යටතේ දැනටමත් ණය මුදල් ලබාගෙන ඇති, සුදුසුකම් ලත් ව්‍යාපාර/උප ණයගැතියන් මෙම යෝජනා ක්‍රමය යටතේ ද සුදුසුකම් ලැබිය හැකිය. නමුත් ඔවුන්ගේ මුළු ණය මුදල් ප්‍රමාණය මාස 2කට අදාළ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය හෝ රුපියල් මිලියන 25ට වඩා අඩු වීම යන කොන්දේසි වලින් එකකට යටත් විය යුතුය.

මෙහෙයුම් උපදෙස් හි අනෙකුත් සියලු වගන්ති සංශෝධනය නොවේ.

මෙම මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයේ අන්තර්ගතයන් ඔබ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛාවල නිලධාරින් වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

මෙයට විශ්වාසි

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/SWASHAKTHI/2017/01 (A-02)

ප්‍රා.සං.දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01
2020. ජූලි. 16.

සියලුම සහභාගීත්ව මූල්‍යායතන වෙත

මහත්මයාණනි/ මහත්මියනි,

''ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක්'' කාරක ණය යෝජනා ක්‍රමය මෙහෙයුම් උපදෙස් සංශෝධනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2017 පෙබරවාරි 09 දින නිකුත් කළ මෙහෙයුම් උපදෙස් අංක RDD/SWASHAKTHI/2017/01 අංක දරණ ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් (මීන්මතු ප්‍රධාන මෙහෙයුම් උපදෙස් ලෙස හැඳින්වෙන) සංශෝධනය කළ බව සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දන්වා සිටිමු.

01. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 1 වගන්තිය මෙයින් අවලංගු වන අතර පහත වගන්තිය ආදේශ වේ.

1. හැඳින්වීම.
ස්වශක්ති ණය යෝජනා ක්‍රමය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ප්‍රවර්ධනය හා රැකියා උත්පාදනය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය එක්ව නිර්මාණය කර හඳුන්වා දී ඇත.

නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මෙම ණය යෝජනා ක්‍රමයේ මූලික අරමුණවන අතර, කෘෂිකර්මාන්ත, පශු සම්පත්, කර්මාන්ත හා සේවා යන අංශවල ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල යෙදෙන නව ව්‍යවසායකයින්ට හා දැනට ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරිකයන්ට මූල්‍ය පහසුකම් ලබා දීම මේ තුලින් අපේක්ෂා කෙරේ.මෙම යෝජනා ක්‍රමය යටතේ නව තරුණ ව්‍යාවසායක යන්ට විශේෂ අවධානය යොමු කර ඇත.

2. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 4.3.1. (අ) සහ (ආ) වගන්ති මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශනය කරනු ලැබේ.

4.3.1 (අ) නව තරුණ ව්‍යවසායකයන් සඳහා
උපරිම ණය මුදල රු 450,000 සහ
උපරිම ප්‍රදානය රු 50,000

(ආ) නව ව්‍යවසායකයෙක් සඳහා
උපරිම ණය මුදල රු 200,000 සහ
උපරිම ප්‍රදානය රු 50,000

(ඇ) දැනට පවත්නා ව්‍යාපාර සහිත ව්‍යවසායකයන් සඳහා
උපරිම ණය මුදල රු 250,000 සහ
ප්‍රදානයක් නැත.

3. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 4.4.1 වගන්තිය මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශනය කරනු ලැබේ.

ව්‍යාපෘතියේ මූලික වියදම් පියවා ගැනීම සඳහා ණය මුදල/ පළමු වාරිකය ආරම්භක ව්‍යාපාර/නව ව්‍යවසායකයින් සඳහා පමණක් මූල්‍ය ප්‍රදානය ලබා දෙනු ලැබේ.

ආරම්භයේදී මෙම මුදල සහභාගී වන මූල්‍ය ආයතන මඟින් උප ණය ගැනුම්කරුට සපයනු ලබන අතර මහ බැංකුව මෙම ගෙවීම් සහභාගී වන මූල්‍ය ආයතන සඳහා ප්‍රතිපූර්ණය කරනු ඇත.

ප්‍රදාන මුදල
(අ) රු 200,000 සහ ඊට වැඩි ණය සඳහා මූල්‍ය ප්‍රදානය රු 50,000
(ආ) රු 200,000 ට අඩු ණය සඳහා මූල්‍ය ප්‍රදානය ණය මුදලෙන් 25 ට සමාන මුදලකි.

4. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි 4.6 වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.
ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි 4.7 වගන්තිය මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශනය කරනු ලැබේ.

4.7 ඉලක්කගත කණ්ඩායම්

4.7.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල නියැලෙමින් ඒ හා සබැඳි අවදානම් වලට මුහුණ දීමට කැමැත්ත සහ ශක්‍යතාවය ඇති නව ව්‍යාවසායකයන්

4.7.2. තොරතුරු තාක්ෂණය මුලික කරගත් නිෂ්පාදන සහ ආර්ථික ක්‍රියාකාරකම් යටතට වැටෙන නව ව්‍යාපාර

4.7.3. තම පවත්නා ශක්‍යතාවයන් හා හැකියාවන් , නව ව්‍යාපාර සඳහා යෙදවීමට කැමති තරුණ ව්‍යවසායකයන් (වයස 1840 අතර) සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

5. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි 4.7 වන වගන්තිය මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.
4.7 ඉලක්කගත කණ්ඩායම

4.7.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නියැලෙමින් ඒ හා සබැඳි අවදානම් වලට මුහුණ දීමට කැමැත්ත සහ ශක්‍යතාවය ඇති නව ව්‍යවසායකයන්

4.7.2 ග්‍රාමීය සම්පත් මත පදනම් වූ නව ව්‍යාපාර අදහස් තොරතුරු තාක්ෂණය මුලික කරගත් නිෂ්පාදන සහ ආර්ථික ක්‍රියාකරකම් යටතට වැටෙන නව ව්‍යාපාර

6. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි 8 වන වගන්තිය කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
- පරිච්ඡේදය (ඌ) මෙයින් අවලංගු කරනු ලැබේ.

7. ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි 8 වන වගන්තිය සහභාගීත්ව මූල්‍ය ආයතන
- පරිච්ඡේදය (ඊ) (**i**) මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශනය කරනු ලැබේ.

(ii) සෑම සුදුසුකම් ලැබූ අයදුම්කරුවකුම (නව ව්‍යාවසායකයන්) ණය හා ප්‍රදානයක් ලෙස ලබාදෙන මුදල ලබා ගැනීම සඳහා ඇමුණුම V (A) සහ ,
- පරිච්ඡේදය (උ) මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශනය කරනු ලැබේ.

ණය මුදල හා/හෝ ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදල පිලිබඳ ලියාපදිංචිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේතුව මඟින් තහවුරු කල පසු සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සඳහා උපණය මුදල හා/හෝ ප්‍රදානය මුදා හැරීම.

- පරිච්ඡේදය (එ) මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශනය කරනු ලැබේ.

සහභාගීත්වය මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල හරහා ප්‍රදායනක් ලෙස ලබා දෙන මුදල් මුදාහැර දින 30ක් ඇතුලත , එම මුදල් ප්‍රතිමූල්‍යනය සඳහා වන අයදුම් පත, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අනුමැතිය සහිතව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. එම ප්‍රතිමූල්‍ය අයදුම්පත්‍රයට පහත දැක්වෙන ලියවිලි ඇතුලත් විය යුතුය.

අ) ප්‍රදානය ලබා ගැනීම සඳහා වන අයදුම්පත (ඇමුණුම **) (සංශෝධිතය අමුණා ඇත.)
ආ) ප්‍රදානය ලබා ගැනිම සඳහා වන අයදුම්පත ප්‍රදානය මුදාහැරීමේ ප්‍රකාශය (ඇමුණුම) (සංශෝධිතය අමුණා ඇත.)

- පරිච්ඡේදය (ඒ) මෙයින් අවලංගු කෙරෙන අතර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශනය කරනු ලැබේ.

ප්‍රදානය ලබා ගැනීම සඳහා වන ප්‍රතිමූල්‍ය අයදුම්පත උපණය මුදල සඳහා වන ප්‍රතිමූලය යන අයදුම්පත් දෙකම එකවර , එක් අයදුම්පත් ගොනුවක් ලෙස භාර දිය යුතුය.

- පරිච්ඡේදය (ක) සහ (ග) මෙයින් අවලංගු කරනු ලැබේ.

  - ස්වශක්ති ණය යොජනා ක්‍රමය සඳහා වන මෙම මෙහෙයුම් උපදෙස් සංශෝධනය 2020.07.16 දින පටන් බල පැවැත්වේ.
  - මෙම ණය යොජනා ක්‍රමය සඳහා වන මෙම මෙහෙයුම් උපදෙස් සංශොධන 2020.07.16 දින පටන් බල පැවැත්වේ.
  - මෙම ණය යොජනා ක්‍රමයේ උපදෙස්වල අඩංගු මූලික මෙහෙයුම් අනෙකුත් නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.

2017.10.09 දින දිනැති සංශොධන අංක RDD/SWASHAKTHI/2017/01 සංශෝධනය 2020.07.15 දින සිට අහෝසි වේ.

කරුණාකර මෙම සංශෝධනයේ අඩංගු මෙහෙයුම් උපදෙස් පිළිබඳව අදාල සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

මෙයට විශ්වාසි

එම්.එස්.කේ.ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය සංවර්ධන

හදිසි දැනගැනීම පිණිස
යොමුව : 32/04/011/0001/002
2020 ජූලි 30

ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි : සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන

මහත්මයාණෙනී/මහත්මියනි

පොදු මගී ප්‍රවාහන සේවයේ නියුතු පුද්ගලික බස් රථ හිමියන්ගේ නඩත්තු වියදම් පූරණය කිරීම සඳහා 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම අදියර III (ණය ඇප ආවරණ හා පොලී සහන ණය යෝජනා ක්‍රමය) යටතේ ණය සහන ලබා දීම.

COVID-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර සඳහා ණය ඇප ආවරණ සහ පොලී සහන ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2020 ජූලි 30 දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අංක : RDD/CIGS/WCL/2020/01 හි 4.1 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

මෙහෙයුම් උපදෙස් අංක : RDD/CIGS/WCL/2020/01 හි 4.1 වගන්තිය යටතේ පොදු මගී ප්‍රවාහන සේවයේ නියුතු පුද්ගලික බස් රථ හිමියන් සුදුසුකම් ලත් ව්‍යාපාරයක් වශයෙන් සළකනු ලබයි. මෙම මෙහෙයුම් උපදෙස් හි කාරක ප්‍රාග්ධනය වශයෙන් සඳහන් අයිතමයන් යටතට බස් රථ නඩත්තු පිරිවැය ද ඇතුළත් කෙරේ.

ඒ අනුව 'සෞභාග්‍යා COVID-19 පුනරුද සහන' ණය පහසුකම අදියර III (ණය ඇප ආවරණ හා පොලී සහන ණය යෝජනා ක්‍රමය) යටතේ පොදු මගී ප්‍රවාහන සේවයේ නියුතු පුද්ගලික බස් රථ හිමියන්ගේ නඩත්තු වියදම් පූරණය කිරීම සඳහා වන ණය ඉල්ලීම් සළකා බලන ලෙස උපදෙස් නිකුත් කෙරේ.

මේ සම්බන්ධයෙන් ඔබගේ කඩිනම් අවධානය යොමු කිරීම අතිශයින් අගය කෙරේ.

මෙයට විශ්වාසී,

එම්. එස්. කේ ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID-19/2020/01-02 (A-03)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.08.25

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන යටතේ ලියාපදිංචි සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත,

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක්වූ ව්‍යාපාර යළි නඟා සිටුවීම සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ නව ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දීමේ මෙහෙයුම් උපදෙස් සඳහා වන පරිශිෂ්ඨය (සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම) කාලානුරූපීව කරන ලද යම් යම් සංශෝධනයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2020 අංක 04, 05 සහ 06 දරණ චක්‍රලේඛ ඇතුලූව 2020.04.01 දින සහ 2020.04.06 දින නිකුත් කරන ලද සෞභාග්‍යා පුනරුද සහන ණය පහසුකම හා බැඳේ.

2020.04.01 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID19/2020/01 සහ 2020.04.06 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID/7/2020/02 සහ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කාලානුරූපීව කරන ලද යම් යම් සංශෝධනයන් ඇතුලූව (මෙයින් මතු මෙහෙයුම් උපදෙස් නමින් හැඳින්වෙන) සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම මෙහෙයුම් උපදෙස් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා පමණක් බලපැවැත්වෙන පරිදි පහත ලෙස සංශෝධනය කරනු ඇත.

ප්‍රධාන මෙහෙයුම් උපදෙස් හි 9 වන වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

9.2 බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2020.09.30 දක්වා දීර්ඝ කර ඇත.

ඒ අනුව ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසාන දිනය දක්වා සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන්ගෙන් ණය අයදුම්පත් බැංකුවට භාරගත හැකිය.

9 වන කාණ්ඩයෙහි අනෙකුත් වගන්තීන් නොවෙනස්ව පවති.

කරුණාකර මෙම සංශෝධනයේ අන්තර්ගතය ඔබේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛා නිලධාරීන්ගේ අවධානයට යොමු කරන්න.

මෙයට විශ්වාසී

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : **RDD/PR-COVID19/2020/03-04 (A-03)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.08.25

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන යටතේ ලියාපදිංචි සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධනය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද 2020.06.19 දිනැති (සංශෝධනය කළ පරිදි) මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID19/2020/03-04 සඳහා වන පරිශිෂ්ඨය හා බැඳේ.

2020.06.19 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID19/2020/03 සහ අංක 4 මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කාලානුරූපීව කරන ලද යම් යම් සංශෝධනයන් (මින් මතු මෙහෙයුම් උපදෙස් ලෙස හඳුන්වන) ඇතුලුව සෞභාග්‍යා කොවිඩ්19 පුනරුද ණය සහන පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පමණක් පහත පරිදි සංශෝධනය කෙරෙනු ඇත.

ප්‍රධාන මෙහෙයුම් උපදෙස් 6 වන වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

6.4 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2020.09.30 දක්වා දීර්ඝ කර ඇත.

ඒ අනුව ණය ලියාපදිංචි ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසාන දිනය දක්වා සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන්ගෙන් ණය අයදුම්පත් බැංකුවට භාරගත හැකිය.

6 වන කාණ්ඩය අනෙකුත් වගන්තීන් නොවෙනස්ව පවති.

කරුණාකර මෙම සංශෝධනයේ අන්තර්ගතය ඔබේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛා නිලධාරින්ග් අවධානයට යොමු කරන්න.

මෙයට විශ්වාසී

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/SAPP/4P/2019/01 (සංශෝධනය 01)

2020.11.03

වෙත : කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනට ඇතුළත් සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන

මහත්මයාණෙනි/මහත්මියනි,

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක 4P ණය යෝජනා ක්‍රමයන් හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක 4P ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කරනු ලබන සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත, 2018.04.10 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/SAPP/4P/2018/01 (2018.12.05 දින සංශෝධිත පරිදි* සඳහා තවදුරටත් නිකුත් කරනු ලැබූ 2019.08.06 දිනැති RDD/SAPP/4P/2019/01 අංක දරන මෙහෙයුම් උපදෙස් ඇමුණුම I පරිදි සංශෝධනය කළ බව මෙයින් දන්වා සිටිමු.

සංශෝධිත මෙහෙයුම් උපදෙස් 2020.11.03 දින සිට වලංගු වේ.

මෙම සංශෝධනයෙහි ඇතුළත් කරුණු පිළිබඳව ඔබගේ බැංකු ශාඛාවන් හි අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමු.

මෙයට විශ්වාසි

එම්. එස්. කේ. ධර්මවර්ධන

අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත : ආචාර්ය යසන්තා මාපටුන මිය

වැඩසටහන් අධ්‍යක්ෂ

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක 4P ණය යෝජනා ක්‍රමයන් හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම (මෙහෙයුම් උපදෙස් අංක : RDD/SAPP/4P/2019/01 - සංශෝධනය 01)

01. හැඳින්වීම

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලෙහි (IFAD) 2020 ජූනි 29 සිට අගෝස්තු 15 දක්වා පැවති මධ්‍ය සමාලෝචන මෙහෙයුම් නිර්දේශයන්, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි (SAPP) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මඟින් සිදු කරන ලද ඉල්ලීම් සහ ඒ අනුව ශ්‍රී ලංකා රජය සහ මුදල් මණ්ඩලය අතර පරිපාලන ගිවිසුම සංශෝධනය කිරීම යන කරුණු සැලකිල්ලට ගනිමින්, SAPP ණය සංරචකය (Credit Component of SAPP) යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා තීරණය කර ඇත. SAPP ණය යෝජනා ක්‍රමයන් හි මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙම ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අරමුණු වේ.

ඒ අනුව 4P ප්‍රවර්ධක ණය යෝජනා ක්‍රමය, 4P ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය සහ 4P චක්‍රීය මූල්‍ය අතරමැදි තොග ණය යෝජනා ක්‍රමය යන නව ණය යෝජනා ක්‍රමයන් හඳුන්වා දීමේ මූලික අරමුණින් මෙහෙයුම් උපදෙස් අංක RDD/SAPP/4P/2019/01 සඳහා පහත සංශෝධනයන් සිදු කරනු ලැබේ. ඒ අනුව SAPP දෙවැනි සංරචකය : ග්‍රාමීය මූල්‍ය ප්‍රවේශය (Component 2: Access to Rural Finance) සහ 2.1 වැනි උප සංරචකය : රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදන හවුල්කාරිත්වයන් (4P) මූල්‍යනය කිරීම (Sub component 2.1 Financing of 4Ps) යටතේ 4P කෘෂිව්‍යාපාර, 4P තුරුණු, 4P ප්‍රවර්ධක, 4P ප්‍රවර්ධක තොග සහ 4P මූල්‍ය අතරමැදි තොග (4P ණය යෝජනා ක්‍රම) ණය යෝජනා ක්‍රම මූල්‍යනය කිරීම, සඳහා IFAD මඟින් සපයනු ලබන ණය සඳහා ප්‍රතිපාදන භාවිතා වනු ඇත.

1. 4P ණය යෝජනා ක්‍රමයන්ට අදාළ මෙහෙයුම් උපදෙස් හි අරමුණු දක්වා ඇති 2 වන කාණ්ඩයේ "ජේ" යන යෙදුමෙන් පසු පහත සඳහන් නව අරමුණු (කේ සහ එල්) හඳුන්වා දෙනු ලැබේ.

   (කේ) කෘෂිකාර්මික අගයදාමයන් හි ප්‍රවර්ධකයන්ගේ, සහභාගීත්වය සහ 4P හවුල්කාරිත්වයේ නිරත වීම ඉහළ නැංවීම.

   (එල්) ප්‍රජා පාදක මූල්‍ය අතරමැදියන් හරහා ග්‍රාමීය කුඩා පරිමාණ ගම්මාන පදනම් කරගත් සිල්ලර ගොවි ජාලය ආකර්ෂණය කර ගැනීම.

2. මෙහෙයුම් උපදෙස් හි 4 වන කාණ්ඩයේ දක්වා ඇති "සුදුසුකම් ලබන ක්‍රියාකාරකම්" අවලංගු කර ඒ වෙනුවට ආදේශ කළ යුතුය;

(4) සුදුසුකම් ලබන ක්‍රියාකාරකම්

(අ) 4P සබඳතාවයක හවුල්කරුවන් සේ කටයුතු කරන ගොවීන්, ගොවි කණ්ඩායම්, ගොවි සංවිධාන සහ නිෂ්පාදන සංවිධාන විසින් සිදු කරන ඕනෑම කෘෂිව්‍යාපාර ක්‍රියාකාරකමක්.

(ආ) ඕනෑම කෘෂි අගයදාමයකට සම්බන්ධ තරුණ තරුණියන් විසින් සිදු කරන ව්‍යවසායක ක්‍රියාකාරකම්.

(ඇ) SAPP හි 4P සබඳතාවයක් සමඟ නිල වශයෙන් හවුල් වූ ප්‍රවර්ධකයන් විසින් සිදු කරන කෘෂි අගයදාම සංවර්ධනයට අදාළ ව්‍යාපාර කටයුතු.

(ඈ) SAPP හි ජාතික මෙහෙයුම් කමිටුව විසින් අනුමත කරන ලද ගම්මානය පදනම් කරගත් ගොවි ජාලය සමඟ ප්‍රජා පාදක මූල්‍ය අතරමැදිය.

3. මෙහෙයුම් උපදෙස් හි 5 වන කාණ්ඩයේ දක්වා ඇති "උප ණය වර්ග" අවලංගු කර ඒ වෙනුවට ආදේශ කළ යුතුය;

(5) උපණය වර්ග

ණය සඳහා ප්‍රතිපාදන ලබා දෙන උප ණය වර්ග පහත පරිදි වේ.

(අ) 4P කෘෂිව්‍යාපාර ණය (4P Agribusiness Loan)

(ආ) 4P තරුණ ණය (4P Youth Loan)

(ඇ) 4P ආදායම් උත්පාදන ණය (4P Income Generation Loan)

(ඈ) 4P ප්‍රවර්ධක ණය (4P Promoter Loan)

(ඉ) 4P ප්‍රවර්ධක තොග ණය (4P Promotor Bulk Loan)

(ඊ) 4P මූල්‍ය අතරමැදි තොග ණය (4P Financial Intermediary Loan)

4. මෙහෙයුම් උපදෙස් හි 7 වන කාණ්ඩයේ දක්වා ඇති "සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්" අවලංගු කර ඒ වෙනුවට ආදේශ කළ යුතුය;

(7) සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්

පහත දක්වා ඇති සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින්, තමන් ක්‍රියාත්මක කරනු ලබන යෝජිත ව්‍යාපෘතිය මඟින් ධනාත්මක මුදල් ප්‍රවාහයක් ජනිත කරන බවට සහ ප්‍රමාණවත් ආපසු ගෙවීමේ හැකියාවකින් යුතු බවට සහභාගීත්ව මූල්‍ය ආයතනය සෑහීමකට පත් කිරීමට සමත් විය යුතුය.

(අ) 4P සබඳතාවයක හවුල්කරුවන් සේ කටයුතු කරන ගොවීන්, ගොවි කණ්ඩායම්, ගොවි සංවිධාන/නිෂ්පාදන සංවිධාන

(ආ) ඕනෑම කෘෂි අගයදාමයකට සම්බන්ධ වයස අවුරුදු 18-40ත් අතර වයස් කාණ්ඩයට අයත් තරුණ ව්‍යවසායකයින්

(ඇ) SAPP හි 4P සබඳතාවයක් සමඟ නිල වශයෙන් හවුල් වන ප්‍රවර්ධකයන්.

(ඈ) ජාතික මෙහෙයුම් කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රජා පාදක මූල්‍ය අතරමැදියන් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති සමූපකාර ග්‍රාමීය බැංකු, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති ගොවිජන බැංකු, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති සමෘද්ධි බැංකු සහ සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති මහා සංගමය යටතේ ලියාපදිංචි කර ඇති ස.ණ.ස. සමිති මෙම මූල්‍ය අතරමැදියන් වේ.

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන, කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, වියළි කලාපීය ජීවනෝපාය සඳහා සහයවීමේ සහ හවුල් වීමේ වැඩසටහන චක්‍රීය අරමුදල වැනි IFAD ආයතනය විසින් අරමුදල් සපයනු ලැබූ වැඩසටහන්වල ප්‍රතිලාභීන් ද ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් ලෙස සුදුසුකම් ලබයි.

5. මෙහෙයුම් උපදෙස් හි 8 වන කාණ්ඩයේ දක්වා ඇති "4P ණය යෝජනා ක්‍රමයන් හි ප්‍රධාන ලක්ෂණ" අවලංගු කර ඒ වෙනුවට ආදේශ කළ යුතුය;

8 4P ණය යෝජනා ක්‍රමයන් හි ප්‍රධාන ලක්ෂණ

4P ණය යෝජනා ක්‍රමයන් හි ප්‍රධාන ලක්ෂණ පහත වගුව පරිදි වේ.

ලක්ෂණය	4P කෘෂිව්‍යාපාර ණය යෝජනා ක්‍රමය	තුරුණු ණය යෝජනා ක්‍රමය	ප්‍රවර්ධක ණය යෝජනා ක්‍රමය	ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය	මූල්‍ය අතරමැදි තොග ණය යෝජනා ක්‍රමය
අ) උපරිම ණය සීමාව	4P ණය යෝජනා ක්‍රම යටතේ ණය ලබාගන්නා ගිවිසුම්ගත ගොවීන් සඳහා රු.500,000. ගොවි කණ්ඩායම්, ගොවි සංවිධාන/ නිෂ්පාදන සංවිධාන සඳහා සමුච්චිත සාමාජිකයන්ගේ ණය හෝ සංවිධාන ණය සීමාව ජාතික මෙහෙයුම් කමිටුවේ (National Steering Committee) අනුමැතියට යටත්ව SAPP හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් තීරණය කරනු ලැබේ.	රු.මිලියන 2	එක් එක් ව්‍යාපෘතියට ජාතික මෙහෙයුම් කමිටුවේ අනුමැතියට යටත්ව රු. 18,000,000 හෝ USD 100,000 ට සමාන මුදලක්	ජාතික මෙහෙයුම් කමිටුවේ (National Steering Committee) අනුමැතියට යටත්ව 4P ව්‍යාපෘති ආයෝජන සැලැස්ම දක්වා ඇති පරිදි සහ SAPP හි ව්‍යාපාර කළමනාකරණ ඒකකය විසින් සිදුකරනු ලබන තක්සේරුව සහ අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන හා ව්‍යාපාර කළමනාකරණ ඒකකයේ මාර්ගෝපදේශ අනුව එක් එක් ව්‍යාපෘතියට අනුරූපව ණය මුදල තීරණය කරනු ලැබේ.	ජාතික මෙහෙයුම් කමිටුවේ (National Steering Committee) අනුමැතියට යටත්ව 4P ව්‍යාපෘති ආයෝජන සැලැස්ම දක්වා ඇති පරිදි සහ SAPP හි ව්‍යාපාර කළමනාකරණ ඒකකය විසින් සිදුකරනු ලබන තක්සේරුව සහ අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන හා ව්‍යාපාර කළමනාකරණ ඒකකයේ මාර්ගෝපදේශ අනුව එක් එක් ව්‍යාපෘතියට අනුරූපව ණය මුදල තීරණය කරනු ලැබේ.
ආ) සුදුසුකම්ලත් උපණය ගැනුම්ක රුවන් සහ උපණය ක්‍රියාකාරකම්	SAPP හි 4P සබඳතාවයක හවුල්කරුවන් සේ කටයුතු කරන ගොවීන්, ගොවි කණ්ඩායම්, ගොවි සංවිධාන සහ නිෂ්පාදන සංවිධාන සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් එකඟ වූ සහ කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිර්දේශ කරන ලද ප්‍රාග්ධන ආයෝජන සහ/හෝ කාරක ප්‍රාග්ධනය ලෙස භාවිතා කිරීමට	ඕනෑම කෘෂිකාර්මික අගයදාමයකට සම්බන්ධ වයස අවුරුදු 1840ත් අතර වයස් කාණ්ඩයට අයත් තරුණ ව්‍යවසායකයින් සහ/හෝ තරුණ ව්‍යවසායක කණ්ඩායම්. සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් එකඟ වූ සහ කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිර්දේශ කරන ලද ව්‍යාපාරික යෝජනාව අනුව ප්‍රාග්ධන ආයෝජනය සහ/හෝ කාරක ප්‍රාග්ධනය ලෙස භාවිතා කිරීමට	SAPP හි 4P සබඳතාවයක නිල හවුල්කරුවන් සේ කටයුතු කරන ප්‍රවර්ධකයන් ප්‍රාග්ධන ආයෝජන සහ/හෝ උපකරන මිලදී ගැනීම සඳහා භාවිතා කිරීමට.	SAPP හි කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින්ට ණය ලබා දෙන, 4P සබඳතාවයක හවුල්කරුවන් සේ කටයුතු කරන ප්‍රවර්ධකයන්	SAPP හි කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින්ට ණය ලබාදෙන මූල්‍ය අතරමැදියන්
ඇ) උප ණය ගැනුම්කරුවන් විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය [1]	වාර්ෂිකව 6.5%	වාර්ෂිකව 6.5%	වාර්ෂිකව 6.5%	වාර්ෂිකව 6.5%	වාර්ෂිකව 3.75% (මූල්‍ය අතරමැදියන් විසින් SAPP හි කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින්ට වාර්ෂිකව 6.5%ක පොලී අනුපාතිකයට ණය ලබා දිය යුතුය.)
ඈ) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය	වාර්ෂිකව 3.0%	වාර්ෂිකව 3.0%	වාර්ෂිකව 3.0%	වාර්ෂිකව 3.0%	වාර්ෂිකව 2.25%

4.1.2 සක්‍රීය ණය යනු විධාන අංක 4.1.4 ප්‍රකාරව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කරන ලද ණය පහසුකම් හැර අනෙකුත් සියලු ණය පහසුකම් වේ.

4.1.3 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් නිර්ණායකයන් දෙකක් මත පදනම්ව ණය පහසුකම් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කළ යුතුය. එනම් ණය ගෙවීම පැහැර හැර ඇති කාල සීමාව සහ/හෝ විභව අවදානම මත පදනම්ව වේ.

4.1.4 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් සියලුම ණය පහසුකම් අවම වශයෙන් උපලේඛන (අ) යටතේ ලබා දී ඇති වගු අංක 01 සහ 02 හි සඳහන් කර ඇති ණය ගෙවීම පැහැර හැර ඇති කාල සීමාව සහ/හෝ විභව අවදානම මත පදනම්ව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කළ යුතුය.

4.2 ණය පහසුකම් ප්‍රතිලේඛනගත කිරීම

4.2.1 ණය පහසුකම් ප්‍රතිලේඛනගත කිරීමේ දී, ණය වර්ගීකරණය කිරීම සඳහා ණය පහසුකම ප්‍රතිලේඛනගත කිරීමට පෙර සහ පසු හිඟ හිටි කාල සීමාව ඇතුළත් සමුච්චිත කාල සීමාව සලකා බැලිය යුතුය.

4.2.2 ණය පහසුකම අක්‍රීය ණයක් ලෙස වර්ගීකරණය කිරීමට පෙර ප්‍රතිලේඛනගත කරනු ලැබුවේ නම්, උපලේඛන (අ) හි විශේෂයෙන් සඳහන් ලෙස දක්වා ඇති කාණ්ඩයෙහි 03 වන වගුවේ දක්වා ඇති ආකාරයට අදාළ කාලසීමාව තුළ ණය ගැනුම්කරු විසින් අඛණ්ඩව ගෙවීම් කරන්නේ නම්; විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමට ණය පහසුකමේ හිඟ හිටි සම්පූර්ණ කාලසීමාව සමුච්චිත කිරීම නොසලකා හැරීමට හැකිය.

4.2.3 ණය පහසුකම අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කිරීමෙන් පසු ප්‍රතිලේඛනගත කරනු ලැබුවේ නම්, ණය පහසුකම ප්‍රතිලේඛනගත කිරීමට පෙර සහ පසු හිඟ හිටි කාලයේ සමුච්චිත සම්පූර්ණ කාලසීමාවල උපලේඛන (අ) හි වගු අංක 01 හි දක්වා ඇති කාල සීමාවන් ඉක්මවා ඇති නම්; එම ප්‍රතිලේඛනගත කරන ලද ණය පහසුකම අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කළ යුතුය.

4.3 ණය පහසුකම් නැවත වර්ගීකරණය කිරීම

4.3.1 පහත නිර්ණායකයන් සපුරන්නේ නම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් සක්‍රීය ණයක් ලෙස නැවත වර්ගීකරණය කළ යුතුය;

(i) අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකමක ණය ගැනුම්කරු විසින් හිඟ මුල් මුදල සහ පොලිය සම්පූර්ණයෙන් ගෙවීම හෝ අක්‍රීය ණයක් ලෙස වර්ගීකරණය කරන ලද ණය පහසුකම් විභව අවදානම යටතේ වුව ද සතුටුදායක ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කිරීම සහ ඉතිරි මුල් මුදල සහ පොලිය ණය ගැනුම්කරු විසින් නියමයන් හා කොන්දේසි වලට අනුකූලව ආපසු ගෙවීම සහතික කිරීම.

(ii) අක්‍රීය ණයක් සක්‍රීය ණයක් ලෙස වර්ගීකරණයට පෙර පහත සඳහන් විධාන 5 ට අනුකූලව ණය නැවත ගෙවීමේ හැකියාව පිළිබඳ තක්සේරුවක්, මුදල් ප්‍රවාහ තක්සේරුව සහ ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තක්සේරුව සැලකිය යුතුය.

4.3.2 ප්‍රතිලේඛනගත කරන ලද අක්‍රීය ණය සක්‍රීය ණය ලෙස නැවත වර්ගීකරණය කිරීම

(i) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට ප්‍රතිලේඛනගත කළ ණය පහසුකම සක්‍රීය ණය පහසුකමක් ලෙස නැවත වර්ගීකරණය කළ හැකි වන්නේ ණය ගැනුම්කරු ප්‍රතිලේඛනගත නියමයන්ට සම්පූර්ණයෙන්ම අනුකූල වේ නම් සහ අනාගතයේ දී ප්‍රතිලේඛනගත ණය පහසුකමේ නියමයන්ට හා කොන්දේසි වලට අනුකූලව ආපසු ගෙවීමේ හැකියාව පෙන්නුම් කරයි නම් පමණි.

(ii) ප්‍රතිලේඛනගත කරන ලද අක්‍රීය ණය සක්‍රීය ණය ලෙස උසස් කිරීමට හැකි වන්නේ සතුටුදායක කාර්යසාධනය සහතික කිරීමෙන් පසුව සහ අදාළ ණය පහසුකම උපලේඛන (අ) හි වගු අංක 03 හි දක්වා කාලසීමාවට යටත්ව පමණි.

4.4 බහු ණය පහසුකම්

ණය ගැනුම්කරුගේ ණය තක්සේරුව මත පදනම්ව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් ණය පහසුකම් වර්ගීකරණය කළ යුතුය.

4.5 නව ණය පහසුකම්

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අක්‍රීය ණය නැවත ගෙවීම සඳහා එම ණය ගැනුම්කරුගේ නමින් හෝ වෙනත් ඕනෑම ආශ්‍රිත පාර්ශවයකට අලුත්/නව ණය පහසුකම් ලබා නොදිය යුතු අතර එසේ නව ණය පහසුකම් ප්‍රදානය කළහොත් ණය පහසුකම අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කළ යුතු අතර පිය වූ ණය පහසුකමට අදාළ ණය ශ්‍රේණිගත කිරීමට ඇතුළත් කළ යුතුය. එවැනි අක්‍රීය ණය සක්‍රීය ණය ලෙස නැවත වර්ගීකරණය කිරීම විධාන අංක 4.3 ට යටත් වේ.

5. අක්‍රීය ණය පහසුකම් වර්ගීකරණය

5.1 උපලේඛන (අ) හි වගු අංක 01 හි සඳහන් පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ණය පහසුකම් විශේෂයෙන් සඳහන් කරන ලද, අවප්‍රමාණ ණය, අඩමාණ ණය, බොල් ණය ලෙස අවම වශයෙන් ණය ශ්‍රේණි හතරකට වර්ග කළ යුතුය.

6. අපේක්ෂිත ණය අලාභ සඳහා මිනුම්

6.1 ශ්‍රී.ලං.ගි.ප්‍ර. 9: මූල්‍ය උපකරණ (සංශෝධන පරිදි) අනුව සියලුම ණය පහසුකම් සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා වන හානිකරණ අලාභ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් හඳුනා ගත යුතුය.

6.2 බහු ණය පහසුකම්

6.2.1 නිශ්චිත සැලකිය යුතු සීමාවකට යටත්ව සමජාතීය ණය නිරාවරණ (උදා: නිවාස ණය, පාරිභෝගික ණය, ණය කාඩ් පත් ලැබීම්) හැර, ණය ගැනුම්කරුවන්ගේ ණය තක්සේරුව මත පදනම්ව යම් සැලකිය යුතු සීමාවකට වඩා වැඩි ණය පහසුකම් සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් වෙන් කිරීමක් කළ යුතුය.

6.2.2 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් ඉහත 6.2.1 හි ණය පහසුකම් හැර සියලුම සමජාතීය ණය නිරාවරණයන් එක්ව ගෙන ණය අවදානම් මත පදනම්ව සාමූහිකව වෙන් කිරීමක් කළ යුතුය.

6.2.3 ණය ගැනුම්කරුවන්ගේ ණය තක්සේරුව මත පදනම්ව ඉහත 6.2.1 සහ 6.2.2 සම්බන්ධ කරමින් අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමක් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් සංවර්ධනය කළ යුතුය.

7. නියාමන අවශ්‍යතාවයන්

7.1 නියාමන වෙන්කිරීම්

7.1.1 උපලේඛන (අ) හි වගු අංක 01 සහ 02 හි ණය පහසුකම් වර්ගීකරණය අනුව ණය පහසුකමේ පිටහිටි ශේෂය, උපලේඛන (ආ) හි දක්වා ඇති පරිදි සුරැකුමේ ශුද්ධ උපලබ්ධි අගය සහ විධාන අංක 7.2 හි දක්වා ඇති අක්‍රීය ණයෙහි උපචිත පොලිය සඳහා නිශ්චිත වෙන් කිරීම් පහත පරිදි පවත්වා ගත යුතුය.

අක්‍රීය ණය පහසුකම්වල වර්ගීකරණය	අවම නිශ්චිත වෙන්කිරීම් අවශ්‍යතාවය
විශේෂයෙන් සඳහන් කරන ලද	5%
අවප්‍රමාණ ණය	20%
අඩමාණ ණය	50%
බොල් ණය	100%

7.1.2 අදාළ කාණ්ඩවල ප්‍රතිලේඛනගත කරන ලද අක්‍රීය ණය සඳහා මීන් පෙර වෙන් කරන ලද නිශ්චිත වෙන්කිරීම් ප්‍රමාණය ප්‍රතිවර්ත කළ හැකි වන්නේ උපග්‍රන්ථ (අ) හි 03 වන වගුවේ දක්වා ඇති කාල පරිච්ඡේදයෙන් පසුව පමණි.

7.1.3 ණය ගැනුම්කරුවන්ගේ ණය තක්සේරුව මත පදනම්ව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් බහු ණය පහසුකම් සඳහා වෙන් කළ යුතුය.

7.2 අක්‍රීය ණය පහසුකම් වල උපචිත පොලිය

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් සටහන් කිරීමේ පදනම මත උපචිත පොලිය වාර්තා කළ යුතු අතර ණය පහසුකම අක්‍රීය ණයක් ලෙස වර්ගීකරණය කළ දිනයේ සිට එය එක් කිරීම නොකළ යුතුය.

7.3 අක්‍රීය ණය පහසුකම් කපා හැරීම / සටහන් කිරීම

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මනාව සැලසුම් කරන ලද අක්‍රීය ණය කපා හැරීම / සටහන් කළ වටිනාකම අඩු කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කළ යුතුය.

8.	සංක්‍රාමී ප්‍රතිපාදනයන්	8.1 විශේෂයෙන් සඳහන් කල වර්ගයෙහි වර්ගීකරණය කිරීම සඳහා සංක්‍රාමී ප්‍රතිපාදනයක් ලෙස, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 2021.04.01 දින සිට මාස 12 ක් යන තුරු කල් ඉකුත් වූ දිනය ලෙස දින 120 භාවිතා කළ යුතු අතර 2022.04.01 දින සිට වර්ගීකරණය සඳහා කල් ඉකුත් වූ දිනය ලෙස දින 90 භාවිතා කළ යුතුය.
9.	අර්ථ දැක්වීම්	9.1 අධ්‍යක්ෂවරයා යන්නෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හැඳින්වේ.
10.	පෙර විධානය අවලංගු කිරීම	2006 අංක 02 දරන කල්බදු මූල්‍යකරණ (බොල් සහ අඩමාණ ණය වෙන්කිරීම් සහ 2005 අංක 05 දරන කල්බදු මූල්‍යකරණ (උපචිත පොලිය) විධාන මෙම විධානය ක්‍රියාත්මක වන දින සිට අවලංගු වේ.

අත්සන් කළේ

ජේ පී ගමලත්
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන
අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පාද සටහන : මෙම විධානයේ අ, ආ සහ ඇ උපලේඛනයන් සඳහා පහත දැක්වෙන අන්තර්ජාල සබැඳිය වෙත යොමු වන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Finance_Leasing_Act_Direction_No_01_of_2020_e.pdf

2020 අංක 01 දරන චක්‍රලේඛය 2020 මාර්තු 10

ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය සහන ලබාදීම

රටෙහි ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැනුම්කරුවන් සඳහා විශේෂ ණය සහන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට බැංකු අංශය කටයුතු කරන ලදී. ඒ අනුව මූල්‍ය අංශයේ නියෝජිතයින් හා ජනාධිපති ලේකම්තුමා අතර ජනාධිපති කාර්යාලයේ පැවැති සාකච්ඡාවේ දී බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ණය ගැනුම්කරුවන්ට ද ඒ හා සමාන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම පිළිබඳ අවධාරණය කරනු ලැබීය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතනවල නියෝජිතයන් සමඟ පැවති සාකච්ඡා වලට අනුව මෙම යෝජනා ක්‍රමය බැංකු නොවන මූල්‍ය ආයතන අංශය තුල ඒකාකාරී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා මාර්ගෝපදේශයන් මෙම චක්‍රලේඛය මඟින් නිකුත් කරනු ලැබේ.

1. පොදු කොන්දේසි හා නියමයන්
   i. සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් : 2019 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ලෙස දැනටමත් වර්ගීකරණය කර ඇති හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අධිකාරියක තම ව්‍යාපාරය ලියාපදිංචි කර ඇති ආදායම් උපදවන ක්‍රියාකාරකම් වල නිරත පුද්ගලයන් හා ආයතන සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් විශේෂ ණය සහන ප්‍රදානය කරනු ලබයි.
   ii. ගිවිසුම අවසන් කළ සහ නැවත අත්පත් කරගත් හෝ ගිවිසුම අවසන් කර උසාවියේ නීති කටයුතු අරඹා ඇති ගිවිසුම් සඳහා මෙම ණය සහන යෝජනා ක්‍රමය අදාළ නොවේ.
   iii. 2020 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ලිඛිතව ඉල්ලුම් කරන සියලුම සුදුසුකම් ලබා ඇති ණය ගැනුම්කරුවන්ට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් මෙම සහනය ලබා දිය යුතුය.
   iv. චක්‍රලේඛයේ පහත සඳහන් අංක 2 හා 3 යන ඡේදයන්හි සඳහන් පරිදි ප්‍රතිලේඛනගත කරන ලද ණය පහසුකම් හි වාරික ගෙවීමට අපොහොසත් වන ණය ගැනුම්කරුවන් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් නොලබන අතර මෙම යෝජනා ක්‍රමයට සහභාගි නොවන්නන් ලෙස සලකනු ලබයි.
   v. මෙම යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් තොරතුරු මෙම චක්‍රලේඛයෙහි 2 සිට 5 දක්වා අංශවල දක්වා ඇත.

2. කල්බදු හා කුලී සින්නක්කර පහසුකම්
   i. උපචිත හා නොගෙවන ලද මුළු දඩ පොලිය කපා හැරීම කරනු ලබන අතර ගෙවීම් පැහැර හරින ලද වාරිකයන්හි සමුච්චිත හා නොගෙවූ පොලියෙන් (දඩ පොලී කපා හැරීමෙන් පසු) සියයට 10 ක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් මෙම යෝජනා ක්‍රමය ලබාදීමට සලකා බලනු ලබන අවස්ථාවේ දී ඉදිරියට ගෙන යනු ලබයි. චක්‍රලේඛයේ 2 (ii) ඡේදයේ ප්‍රකාරව ණය ගැනුම්කරු විසින් ප්‍රතිලේඛනගත කරන ලද ණය මුදල පියවීමෙන් පසු බලපත්‍රලාභී මුදල් සමාගම් /විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ඉදිරියට ගෙන යන ලද පොලිය කපා හරිනු ලබයි.

ii. කල්බදු හා කුලී සින්නක්කර පහසුකම් ප්‍රතිලේඛනගත කිරීම පහත පරිදි වේ.
ප්‍රාග්ධනයේ ගෙවීමට ඇති ශේෂය ගෙවීම පැහැර හැර ඇති වාරිකවලට අදාළ නොගෙවූ පොලී ශේෂය ප්‍රතිලේඛනගත කළ යුතුය.

(අ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් 50% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා ගෙවීම පැහැර හැර ඇති වාරිකවල එකතු වී ඇති පොලිය, නොගෙවූ පොලිය සහ ප්‍රාග්ධනයේ ගෙවීමට ඇති ශේෂය ප්‍රතිලේඛනගත කළ යුතු අතර මූලික ණය මුදලේ ගෙවීමට ඉතිරිව ඇති වාරික ප්‍රමාණයට දෙගුණයක කාලසීමාවක් හෝ අවුරුදු හතරක කාලය යන දෙකෙන් අඩු කාලසීමාව තුළ දී ආපසු ගෙවිය යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් සියයට 50 කට අඩු ප්‍රමාණයක් සහ අවම වශයෙන් සියයට 25 ක ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා ගෙවීම පැහැර හැර ඇති වාරික වල එකතු වී ඇති පොලිය, නොගෙවූ පොලිය සහ ප්‍රාග්ධනයේ ගෙවීමට ඇති ශේෂය ප්‍රතිලේඛනගත කළ යුතු අතර මූලික ණය මුදලේ ගෙවීමට ඉතිරි වී ඇති වාරික ප්‍රමාණයේ දෙගුණයක් හෝ අවුරුදු පහක කාලය යන දෙකෙන් අඩු කාල සීමාව තුළ දී ආපසු ගෙවිය යුතුය.

3. කල්බදු පහසුකම් හා කුලී සින්නක්කර පහසුකම් හැර අනෙකුත් ණය පහසුකම්

i. ණය පහසුකම් සඳහා ප්‍රාග්ධන සහන කාලයන් පහත පරිදි වේ.

(අ) ලීසිං / කුලී පිට ගැනුම් පහසුකම් ලබාගත් ණයගැතියන් හැර වෙනත් සුදුසුකම්ලත් ණයගැතියන් අංශ 3 හි සඳහන් ණය ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා මාස 6 ක සහන කාලයක් සඳහා සුදුසුකම් ලබයි.

(ආ) ණය සහන යෝජනා ක්‍රමයේ කාල සීමාව තුළ මෙම යෝජනා ක්‍රමය සඳහා සැලකිල්ලට ගනු ලබන ණය පහසුකම් සඳහා ගෙවිය යුතු ණය පොලිය ණය ගැනුම්කරුවන් විසින් මෙම යෝජනා ක්‍රමයට අදාළ වන කොන්දේසි වලට අනුකූලව අඛණ්ඩව ගෙවිය යුතුය.

ii. උපචිත සහ නොගෙවා ඇති මුළු දඩ පොලිය ඉවත් කළ යුතු අතර මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම / විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් සලකා බලනු ලබන දිනය දක්වා නොගෙවා පැහැර හරින ලද වාරික වල සමුච්චිත සහ නොගෙවූ පොලියෙහි සියයට 10 ක ප්‍රතිශතයක් (දඩ පොලිය ඉවත් කිරීමෙන් පසු) ආපසු ගෙවීම කල් දැමිය යුතුය. ණය ගැනුම්කරු විසින් පහත 3 (iii) ඡේද ප්‍රකාරව ප්‍රතිලේඛනගත කළ ණය ගෙවා අවසන් කළ පසු කල්දැමූ පොලිය කපා හැරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් කටයුතු කළ යුතුය.

iii. ණය පහසුකම් ප්‍රතිලේඛනගත කිරීම පහත පරිදි වේ: හිඟ ප්‍රාග්ධනය ගෙවීම පැහැර හැර ඇති වාරික වලට අදාළ නොගෙවූ පොලී ශේෂය සහ අනාගතයෙහි ගෙවිය යුතු පොලිය ප්‍රතිලේඛනගත කළ යුතුය.

(අ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රග්ධන ප්‍රමාණයෙන් සියයට 50 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා ගෙවීම පැහැර හැර ඇති වාරික වලට අදාළ නොගෙවූ පොලී ශේෂය, අනාගතයෙහි ගෙවිය යුතු පොලිය සහ හිඟ ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධනයේ ගෙවීමට ඇති ශේෂය ප්‍රතිලේඛනගත කළ යුතු අතර මාස හයක සහන කාල පරිච්ඡේදය අවසානයේ දී මුල් ණය මුදලේ ඉතිරි කල්පිරීමේ කාලය මෙන් දෙගුණයක කාලසීමාවක් හෝ අවුරුදු හතරක කාලය යන දෙකෙන් අඩු කාලසීමාව තුළ දී ආපසු ගෙවිය යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මූලික ප්‍රාග්ධන ප්‍රමාණයෙන් සියයට 50 කට අඩු නමුත් සියයට 25 කට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති ණය සඳහා ගෙවීම පැහැර හැර ඇති වාරික වලට අදාළ නොගෙවූ පොලී ශේෂය, අනාගතයෙහි ගෙවිය යුතු පොලිය සහ හිඟ ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධනයේ ගෙවීමට ඇති ශේෂය ප්‍රතිලේඛනගත කළ යුතු අතර මාස හයක සහන කාල පරිච්ඡේදය අවසානයේ දී මුල් ණය මුදලේ ගෙවීමට ඉතිරිව ඇති වාරික ප්‍රමාණයට දෙගුණයක් හෝ අවුරුදු පහක කාලය යන දෙකෙන් අඩු කාල සීමාව තුළ දී ආපසු ගෙවිය යුතුය.

4. එවැනි ණය සහන යෝජනා ක්‍රමයක් ලබාදීම සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන බලපත්‍රලාභී මුදල් සමාගම / විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් පවත්වා ගත යුතුය.

5. 2020.04.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සෑම මසකම 15 සහ 30 දිනයන්ට පවතින ණය ගැනුම්කරුවන් වෙත ලබා දී ඇති ණය සහන සම්බන්ධ තොරතුරු එම දිනවල සිට වැඩ කරන දින 05 ක් තුළ ඇමුණුම (I) හි ආකෘතියට අනුව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කළ යුතුය.

අත්සන් කළේ

ජේ. පී. ගමලත්
අධ්‍යක්ෂ
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ
දෙපාර්තමේන්තුව

2020 අංක 04 දරන චක්‍රලේඛය 2020 මාර්තු 24

කොවිඩ්-19 මඟින් බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග

දැනට පැතිර යන කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා අගතියට පත් පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහය වීම සඳහා සහන සැපයීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් නිකුත් කරන ලද නියෝගයට අනුව, 2020.03.20 වන දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී කැබිනට් ඇමතිවරුන් විසින් ගන්නා ලද තීරණයන්ට සමගාමීව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, මෙයින් මතුවට මූල්‍යායතන ලෙස සඳහන් කෙරෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලීසිං සමාගම් සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1. පෙර සඳහන් සියලු මූල්‍යායතන විසින් ප්‍රාග්ධනය හා පොලිය ඇතුළත් ව ණය ගෙවීම් සඳහා සහන කාලයක් පහත පරිදි ලබා දිය යුතුය.
   - අ. ස්වයං රැකියා ලෙස සේවයේ නිරත සියලු ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා කුඩා රථ සහ බස් රථ වල ලීසිං වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක්;
   - ආ. පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින් විසින් ලබා ගත් පුද්ගල ණය සඳහා 2020.05.30 දක්වා සහන කාලයක්;
   - ඇ. රුපියල් මිලියනයට අඩු මුළු ණය වටිනාකමකින් යුතු සියලුම පුද්ගල ණය සහ ලීසිං වාරික සඳහා මාස තුනක සහන කාලයක්; සහ
   - ඈ. අගතියට පත් ව්‍යාපාරික අංශයන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට, සංචාරක, ඇඟළුම්, වැවිලි, තොරතුරු තාක්ෂණ සහ සහසම්බන්ධිත කාර්යය සම්පාදන සේවා සපයන්නන් (logistic service providers) සඳහා මාස හයක ණය සහන කාලයක්.
2. මූල්‍යායතන විසින් ඉහත 1 (ඈ) හි සඳහන් ක්ෂේත්‍රයන් හට 4% පොලී අනුපාතිකයකට කාරක ප්‍රාග්ධන පහසුකම් සහ අවම වශයෙන් මාස හයක කාල සීමාවක් සඳහා පොලී ගෙවීම් කපා හැරීමක් ලබා දිය යුතු අතර ප්‍රතිමූල්‍යනයේ දී පොලී සහනාධාරයක් හිමි වනු ඇත.
3. ඉහත 1 හා 2 සඳහන් කාරණා සඳහා ගනුදෙනුකරුවන් හට 2020.04.30 වන දින තෙක් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මූල්‍යායතන විසින් ඉඩ ලබා දිය යුතු අතර මූල්‍යායතන විසින් ඒ පිළිබඳ කටයුතු දින 45 ක් තුළ දී සිදුකර අවසන් කළ යුතුය.
4. මූල්‍යායතන විසින් රුපියල් 50,000 දක්වා දේශීය ණයපත් ගනුදෙනු සඳහා අයකරනු ලබන පොලිය 15% ක උපරිමයකට යටත් කළ යුතු අතර ණයපත් සඳහා මාසිකව ගෙවිය යුතු අවම මුදල 50% කින් අඩු කළ යුතුය. එමෙන්ම, ණය සීමාව රුපියල් 50,000 දක්වා වන ණයපත් ආපසු ගෙවීමේ කාලය 2020.04.30 දක්වා දීර්ඝ කළ යුතුය.
5. බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් 500,000 ට අඩු වටිනාකමකින් යුතු චෙක්පත් වල වලංගු කාලය 2020.04.30 දක්වා දීර්ඝ කළ යුතුය.
6. බලපත්‍රලාභී බැංකු වල සියලුම ශාඛා ඇදිරි නීතිය නොපවතිනා දිනයන් හිදී පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා අවම සේවක ප්‍රමාණයක් සහිතව විවෘතව තැබිය යුතු අතර ආහාර, ඖෂධ, සංචාරක සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ගේ අත්තර්ජාතික ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම සඳහා ආයතනික ශාඛාවන් ඇදිරි නීතිය පවත්නා දිනයන් හිදී ද විවෘතව පැවතිය යුතුය.
7. ඉහත සඳහන් කරුණු පිළිබඳ විස්තරාත්මක උපදෙස් 2020.03.27 වැනි දින නිකුත් කරනු ඇත.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2020 අංක 01 දරන විස්තර සටහන

ශ්‍රී ලංකා මහ බැංකුව
2020 මාර්තු 25

කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යන මැයෙන් නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්වීම

කොවිඩ්-19 වසංගතය මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීමට 2020 මාර්තු 24 දින නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්වීම පහත පරිදි වේ.

1. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කැබිනට් මණ්ඩල තීරණයට සමගාමීව බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුලුව ලීසිං සමාගම් වෙත ඉහත චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2. ඉහත චක්‍රලේඛයේ අයිතම අංක 01 සහ 02 සඳහා වන ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට මූල්‍ය සමාගම් විසින් ගනුදෙනුකරුවන් හට 2020.04.30 දින දක්වා කාලය ලබා දිය යුතු අතර එම ඉල්ලීම් සඳහා සමාගමේ අවසාන තීරණය දින 45 ක් ඇතුලත ගනුදෙනුකරු වෙත දැනුම් දිය යුතුය.
3. ඇදිරි නීතිය නොමැති දින වල දී මූල්‍ය සමාගම්වල සියලුම ශාඛා අවම සේවක සංඛ්‍යාවක් සහිතව පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා විවෘතව තැබිය යුතුය.

2020 අංක 05 දරන චක්‍රලේඛය 2020 මාර්තු 27

කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං-රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50 ක සය-මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම

1. හැඳින්වීම

(i) කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියා ඇතුළු ව්‍යාපාර සඳහා පුළුල් ෆිස්කල් හා මූල්‍ය සහන සැපයීමේ අරමුණින් කැබිනට් මණ්ඩලය විසින් 2020.03.20 වැනි දින ගන්නා ලද තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත ප්‍රතිමූල්‍ය පහසුකම ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම සහන අතරට ණය සහන කාලයක් (ප්‍රාග්ධනය හා පොලිය) සහ සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සඳහා 4% පොලී අනුපාතයකට කාරක ප්‍රාග්ධන පහසුකම් සැපයීම අයත් වේ.

(ii) 2020.03.25 වන දින සිට ක්‍රියාත්මක වන මෙම කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට ලබා දෙනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකමට සහභාගීවීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) සුදුසුකම් ලබනු ඇත.

(iii) මෙම චක්‍රලේඛය, 2020.03.24 වන දින නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛයට අතිරේකයක් වන අතර මෙමඟින් ඉහත ප්‍රතිමූල්‍ය පහසුකම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මෙහෙයුම් මාර්ගෝපදේශ සපයනු ලැබේ.

2. මූල්‍ය පහසුකම් සඳහා අදාළ පොදු කොන්දේසි හා නියමයන්

(i) සුදුසුකම් ලබන ව්‍යාපාර/ක්ෂේත්‍ර

(අ) සංචාරක, කොවිඩ්-19 නිසා වැඩ කටයුතු අඩාල වූ සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් (lockdowns) නිසා අගතියට පත් ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි හා මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) ඇතුළු අපනයන ආශ්‍රිත සෘජු හා වක්‍ර ව්‍යාපාර.

(ආ) රුපියල් බිලියනයට අඩු පිරිවැටුම් සහිත නිෂ්පාදන, සේවා, කෘෂිකාර්මික (සැකැසුම් කර්මාන්ත ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතුකිරීම් හා අවසරලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්.

(ඇ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම රැකියා හෝ ආදායම් අහිමි වූ ස්වයං රැකියා ව්‍යාපාර හෝ පුද්ගලයන්.

(ඈ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම ආදායම හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බලපෑම් එල්ල වූ, විදේශ මුදලින් ණය ගෙවීමට ඇති විදේශ විනිමය උපයන පුද්ගලයින් හා ව්‍යාපාර.

(ii) මෙම ප්‍රතිමූල්‍ය පහසුකම ඖෂධ, වෛද්‍යෝපකරණ, ආහාර, පොහොර, අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ හැරුනුකොට වෙනත් කිසිදු ආනයන ණය පහසුකමක් සඳහා යොදගත නොහැකි බව සැක හැර දැනගත යුතුය.

(iii) දී ඇති කොන්දේසි අවශ්‍යතාවයන්ට යටත් ව රුපියල් හා විදේශ මුදලින් ලබාගත් කාලීන ණය, කල් බදු, රන් භාණ්ඩ උකස් ණය පහසුකම් සහ වෙළඳ මූල්‍ය පහසුකම් සඳහා මෙම මූල්‍ය ක්‍රමය යටතේ පහසුකම් ලැබෙනු ඇත.

(iv) අන්තර්ජාල පහසුකම් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ සහන අපේක්ෂා කරන බවට 2020.04.30 දිනට ප්‍රථම ඉල්ලීම් කළ, කොවිඩ්-19 ව්‍යසනය නිසා වැඩ කටයුතු අඩාල වූ සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් නිසා අගතියට පත්, සියලු ණය ගැනුම්කරුවන් සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ අදාළ සහන ලබාදීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය. ගනුදෙනුකරුවන් මෙවැනි ඉල්ලීමක් සිදු කළ දින සිට දින 45 ක් තුළ දී අදාළ ඉල්ලීම ඇගයීමට ලක් කිරීම සම්පූර්ණ කිරීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතු අතර, එසේ ඇගයීම සිදුකර අවසන් කරන තෙක් අදාළ අයදුම්කරුවන්ගේ ණය පහසුකම් නැවත අයකර ගැනීම නැවැත්විය යුතුය.

3. **2020.03.25 දින වන විට සක්‍රීයව පැවති ණය සඳහා ලැබෙන සහන**

(i) 2020.04.30 වන දින හෝ ඊට ප්‍රථම මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ඉල්ලා සිටින ණය ගැනුම්කරුවන්ගේ සුදුසුකම් ලබන සියලු රුපියල් හා විදේශ මුදල් කාලීන ණය සඳහා පහත සඳහන් කාල සීමාවන් සඳහා ණය ගෙවීමේ සහන කාලයක් මූල්‍ය ආයතන විසින් ලබා දිය යුතුය.

(අ) ස්වයං රැකියා නියුක්තිකයන්/ හිමිකරුවන් විසින් ක්‍රියාත්මක කරන සියලු ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන වෑන් රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගන්නා කුඩා රථ, බස් රථ සහ අනෙකුත් වත්කම් වන යතුරුපැදි හා කුලී රථ වල කල්බදු වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක්.

(ආ) පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින් විසින් ලබා ගත් පුද්ගල ණය ගෙවීම සඳහා 2020.05.30 දක්වා සහන කාලයක්.

(ඇ) රුපියල් මිලියනයට අඩු වටිනාකමකින් ප්‍රදානය කළ සියලුම පුද්ගල ණය සහ කල්බදු වාරික සඳහා මාස තුනක සහන කාලයක්.

(ඈ) අගතියට පත් ව්‍යාපාරික අංශයන්ගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට, සංචාරක, ඇඟළුම්, වැවිලි, තොරතුරු තාක්ෂණ සහ සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) සඳහා මාස හයක ණය සහන කාලයක්.

(ඉ) ඉහත 2(i) යටතේ සඳහන් අනෙකුත් සියලුම සුදුසුකම්ලත් ව්‍යාපාර/ක්ෂේත්‍ර සඳහා මාස හයක ණය සහන කාලයක්.

(ii) මූල්‍ය ආයතන විසින් ණය සහන සඳහා සුදුසුකම් ලබන ණය පහසුකම්වල ආපසු ගෙවීමේ කාලසීමාව අදාළ ණය සහන කාලසීමාවෙන් දීර්ඝ කළ යුතුය.

(iii) 2020.03.25 දක්වා කාලසීමාව තුළ පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන ස්ථාවර අයිරා පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කරනු ඇත. කෙසේ නමුත්, සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන්ගේ, 2020.03.25 දින වන විට පැවැති තාවකාලික අයිරා පහසුකම් වල කල් පිරීම් මාස දෙකකින් දීර්ඝ කෙරෙන අතර එකී පහසුකම් සඳහා දීර්ඝ කරන ලද කාලසීමාව තුළ අයකළ හැකි පොලී අනුපාතය 13% ක උපරිමයකට සීමා කෙරේ.

(iv) 2020.03.25 දක්වා කාලසීමාව තුළ පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන සුදුසුකම් ලත් වෙළඳ ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කෙරේ.

(v) 2020.03.25 දක්වා කාලසීමාව තුළ පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන උකස් ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කෙරේ.

4. 2020.03.25 දින වන විට අක්‍රීයව පැවති ණය සඳහා ලැබෙන සහන

(i) 2020.03.25 දක්වා අයවිය යුතු දඩ පොලී අදාළ මූල්‍ය ආයතනය විසින් අහෝසි කළ යුතුය.

(ii) ණය සහ අත්තිකාරම් ප්‍රතිලේඛනගත කිරීම පහත පරිදි සිදු කළ යුතුය:

(අ) මුල් ණය මුදලින් 50% ක් හෝ ඊට වැඩි මුදලක් ණය ගැනුම්කරු විසින් ආපසු ගෙවා ඇති අවස්ථාවක දී මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ අදාළ මූල්‍ය ආයතනය විසින් සලකා බලන දිනය දක්වා වන හිඟ පැවැති වාරික සඳහා අදාළ නොගෙවූ හා එකතු වූ පොලියෙන් (ඉහත සඳහන් කළ පරිදි දඩ පොලී අහෝසි කිරීමෙන් පසු) 50% ක් කල් දැමීම කළ හැක. ගෙවිය යුතු ප්‍රාග්ධන මුදලෙහි ශේෂය ද පැහැර හරින ලද වාරික සඳහා ගෙවිය යුතු පොලියේ ඉතිරිව ඇති ශේෂය සහ ඉදිරියට ගෙවීමට ඇති පොලිය වසර තුනක කාලයකින් දීර්ඝ කර ප්‍රතිලේඛනගත කළ යුතුය. එලෙස ප්‍රතිලේඛනගත කළ ණය මුදල් ණය ගැනුම්කරු විසින් පහත සඳහන් ඡේද (ඇ) සහ (ඈ) හි සඳහන් ආකාරයට ගෙවීමෙන් අනතුරුව මූල්‍ය ආයතනය මගින් කල් තබන ලද පොලී මුදල් අහෝසි කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) ණය ගැනුම්කරු විසින් මුළු ණය මුදලින් 50% කට අඩුවෙන් ආපසු ගෙවා ඇති අවස්ථාවක දී මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ අදාළ මූල්‍ය ආයතනය විසින් සලකා බලන දිනය දක්වා වන හිඟ පැවැති වාරික සඳහා අදාළ නොගෙවූ හා එකතු වූ පොලියෙන් (ඉහත සඳහන් කළ පරිදි දඩ පොලී අහෝසි කිරීමෙන් පසු) 25% ක් කල් දැමීම කළ හැක. ගෙවිය යුතු ප්‍රාග්ධන මුදලෙහි ශේෂය ද පැහැර හරින ලද වාරික සඳහා ගෙවිය යුතු පොලියේ ශේෂය සහ ඉදිරියට ගෙවීමට ඇති පොලිය වසර තුනක කාලයකින් දීර්ඝ කර ප්‍රතිලේඛනගත කළ යුතුය. එලෙස ප්‍රතිලේඛනගත කරන ලද ණය මුදල් ණය ගැනුම්කරු විසින් පහත සඳහන් ඡේද (ඇ) සහ (ඈ) හි සඳහන් ආකාරයට ගෙවීමෙන් අනතුරුව මූල්‍ය ආයතනය මගින් කල් තබන ලද පොලී මුදල් ද අහෝසි කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) ඉහත ඡේද (අ) සහ (ආ) සඳහන් ආකාරයට ගෙවිය යුතු ප්‍රාග්ධන ශේෂය යලි සකසා වසර තුනක් තුළ දී ආපසු ගෙවිය යුතුය.

(ඈ) ඉහත (අ) හා (ආ) හි සඳහන් කළ පැහැර හැරි ණය වාරික වලට අදාළ ඉතිරි පොලිය හා ඉදිරියට ගෙවිය යුතු පොලිය අවිනිශ්චිත ගිණුමකට මාරු කළ යුතු අතර එය අවුරුදු 3ක් තුළ ආපසු ගෙවිය යුතුය.

(ඉ) 2020.09.30 දින දක්වා ණය ආපසු ගෙවීමට සහන කාලයක් ලබා දිය යුතුය.

(ඊ) ණය ආපසු ගෙවීමේ සහන කාලය තුළ ණය ගැනුම්කරු විසින් අඛණ්ඩව මාස 6 ක් පොලිය ගෙවා ඇති විටෙක, අවශ්‍ය නම්, බලපත්‍රලාභී බැංකු හට මෙම යෝජනා ක්‍රමය යටතේ අක්‍රීය ලෙස සලකා ඇති ණය, සක්‍රීය ණය හා අත්තිකාරම් ලෙස නැවත වර්ගීකරණය කළ හැක. කෙසේ වෙතත්, අදාළ අක්‍රීය ණය පහසුකම ප්‍රතිලේඛනගත කිරීමට සැලකීමට පෙර හිඟ පැවැති වාරික ගණන මාස හයට අඩු නම්, එම හිඟ පැවැති වාරික ගණනේ පොලියට සමාන ප්‍රමාණයක් ණය ගැනුම්කරු විසින් ගෙවූ පසු පමණක් අදාළ ණය පහසුකම සක්‍රීය කාණ්ඩයට වර්ගීකරණය කළ හැක.

(iii) ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම

(අ) මෙම චක්‍රලේඛය නිකුත් වන දිනය වන විට අක්‍රීය කාණ්ඩයේ පැවැති, සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන විසින් 1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අය කරගැනීමේ (විශේෂ ප්‍රතිපාදන) පනත, 1949 අංක 6 දරන සංශෝධිත උකස් පනත හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ අත්පත් කරගැනීමේ ක්‍රියාමාර්ග අරඹා හෝ ඒ පිළිබඳ නිවේදන නිකුත් කර ඇති නම්, එම අත්පත් කරගැනීමේ ක්‍රියාමාර්ග, එකී ගනුදෙනුකරු විසින් අදාළ මූල්‍ය ආයතනය හා ණය ආපසු ගෙවීම පිළිබඳ එකඟතාවයකට පැමිණීමේ කොන්දේසිය මත අත්හිටුවනු ඇත.

(ආ) මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනත් ප්‍රකාරව වත්කම් අත්පත් කරගැනීම සඳහා නව යෝජනා සම්මත කරගැනීම කල් දැමිය යුතුය. එසේ අත්පත් කරගැනීම් සඳහා මේ වන විටත් යෝජනා සම්මත වී ඇති, මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන ණය ගනුදෙනුකරුවන්ගේ වත්කම් වෙන්දේසි කිරීම 2020.09.30 දක්වා අත්හිටුවිය යුතුය.

(ඇ) ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් අධිකරණ ක්‍රියාමාර්ග ගනිමින් පවතින ණය ගැනුම්කරුවන් හට මෙම යෝජනා ක්‍රමයේ සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් එකඟවන බවට දිවුරුම් ප්‍රකාශයක් අධිකරණයට ඉදිරිපත් කර ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීමට අවසර ඇත.

(ඈ) මෙම යෝජනා ක්‍රමය යටතේ පිළිගෙන ඇති අක්‍රීය කාණ්ඩයේ සිටින ණය ගැනුම්කරුවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සියලුම මූල්‍ය ආයතන විසින් අත්හිටුවිය යුතුය.

5. නව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන කටයුතු සඳහා ලබා දෙන ණය

(i) ණය ගැනුම්කරුවන් විසින් පිළිගත හැකි ව්‍යාපාර සැලැස්මක් ලබා දෙන්නේ නම්, පහත කොන්දේසි වලට යටත්ව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන කටයුතු සඳහා දේශීය මුදලින් අමතර ණයක් හෝ නව ණය පහසුකමක් ලබා දීමට මූල්‍යායතන හට හැකියාව ඇත.

(අ) සුදුසුකම් ලබන සක්‍රීය හා අක්‍රීය කාණ්ඩයේ ගනුදෙනුකරුවන් හට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එක් ගනුදෙනුකරුවෙකු හට එක් බැංකුවකින් රුපියල් මිලියන 25 ක් හෝ අනෙකුත් මූල්‍ය ආයතන සඳහා එක් ගනුදෙනුකරුවෙකුට එක් ආයතනයකින් රුපියල් මිලියන 10 හෝ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය යන දෙකෙන් වැඩි අගය නොඉක්මවන වටිනාකමක රුපියල් ණය මුදලක්, ඒවායේ කාරක ප්‍රාග්ධන චක්‍රයන්ගේ අවශ්‍යතාව සලකා බලා ලබා දිය හැක. මෙකී ණය මුදල් 4% කට සමාන වාර්ෂික පොළී අනුපාතිකයකින් වසර දෙකක් තුළ ගෙවෙන ලෙස ලබාදිය යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා 4% දක්වාත් අනෙකුත් මූල්‍ය ආයතන සඳහා 7% දක්වාත් පොළී පිරිවැය ප්‍රතිදානය (rebate) කරනු ඇත.

(ආ) ආයෝජන කටයුතු සඳහා ණය පහසුකම් ලබා දිය හැක්කේ බලපත්‍රලාභී බැංකු මඟින් පමණක් වන අතර සක්‍රීය කාණ්ඩයේ ගනුදෙනුකරුවන් සඳහා පමණක් එක් ගනුදෙනුකරුවෙකුට එක් බැංකුවකින් තම ව්‍යාපාර කටයුතු පුළුල් කරගැනීම සඳහා රුපියල් මිලියන 300 කට නොවැඩි වටිනාකමක රුපියල් ණය මුදලක් ලබා දිය හැක. එවැනි ණය පහසුකම් වසර පහක කාලයක් තුළ දී ගෙවියන සේ ලබාදිය යුතු අතර අය කළ හැකි උපරිම පොළී අනුපාතය බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය (AWPLR) + 1.5% නොඉක්මවිය යුතුය.

(ii) මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන්ගේ අරමුදල් අවශ්‍යතාව මනාව ඇගයීමෙන් අනතුරුව ප්‍රදානය කරන ණය මුදලේ ප්‍රමාණය පිළිබඳව එකඟතාවයකට පැමිණිය යුතුය.

(iii) කාරක ප්‍රාග්ධන හා ආයෝජන ණය යන දෙවර්ගයේම ණය සඳහා 2020.03.25 සිට 2020.09.30 දක්වා කාල සීමාව තුළ ආපසු ගෙවීම් සඳහා සහන කාලයක් හිමිවේ.

(iv) මූල්‍ය ආයතන විසින් මෙම ප්‍රතිමූල්‍ය පහසුකම යටතේ ලබා දෙනු ලබන කිසියම් හෝ අමතර ණය පහසුකම් වලට අදාළ අවදානම මගහරවා ගැනීම සඳහා සුදුසු ඇපකරයක් ලබාගත හැක.

6. බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම

බලපත්‍රලාභී බැංකු වෙත ලබා දී ඇති ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයන්ගේ 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා අය වීමට නියමිත ප්‍රාග්ධන ආපසු ගෙවීම් කල් දැමීමට රජය විසින් කැමැත්ත පලකර ඇති අතර එවැනි දිගුවන් අවශ්‍ය බැංකු හට ඒ සඳහා ඉල්ලීමක් කළ යුතු අතර අදාළ රාජ්‍ය ආයතන සමඟ අතිරේක ගිවිසුම් වලට එළඹීමට ද අවශ්‍ය වේ.

7. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්

(i) මූල්‍ය ආයතන විසින් හුදෙක් අසතුටුදායක ණය වාර්තා මත පමණක් පදනම්ව ණය අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් පවත්වා ගත යුතුය.

(ii) මූල්‍ය ආයතන විසින් ණය තොරතුරු කාර්යාංශයේ උපදෙස් ද ලබා ගනිමින්, මෙම යෝජනා ක්‍රමය යටතේ සක්‍රීය ණය ගැනුම්කරුවන් විසින් ප්‍රාග්ධන ගෙවීම් කල්දැමීම සම්බන්ධව වාර්තා කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර, එමඟින් මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධවන සක්‍රීය ණය ගැනුම්කරුවන්ට ඉදිරියේ දී ඔවුන්ගේ ණය ශ්‍රේණියේ හෝ ණය තොරතුරු කාර්යාංශ වාර්තාවන්ට අහිතකර ලෙස බලපෑමක් සිදුවීම වැලැක්විය යුතුය.

8. මූල්‍ය ආයතන විසින් චෙක්පත් අගරු වීම්, ගෙවීම් නැවැත්වීම් සඳහා අයකිරීම්, සියලු ණය කාඩ්පත් හා අනෙකුත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම් 2020.09.30 දක්වා කාලසීමාව තුළ අත්හිටු විය යුතුය.

9. වාර්තාකරණ අවශ්‍යතාවයන්

මූල්‍ය ආයතන විසින් සිය ණය ගැනුම්කරුවන් විසින් ලබා ගන්නා ලද ණය සහන කාලයන් පිළිබඳ තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට/බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2020.05.01 දින සිට සෑම මසකම 15 සහ 30 වැනි දින වන විට පැවැති තත්ත්වය වැඩකරන දින 5 ක් තුළ දී වාර්තා කළ යුතුය.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 02 දරන විධානය 2020 මාර්තු 31

ද්‍රවශීලතා වත්කම් විධානය සංශෝධනය කිරීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

වර්තමාන වෙළඳපොල තත්ත්වය මන්දගාමී වීම සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වා ගත යුතු ද්‍රවශීල වත්කම් පිළිබඳ මුදල් මණ්ඩලය විසින් පහත විධානයන් නිකුත් කෙරේ.

ඒ අනුව, 2013 අංක 04 දරන මුදල් සමාගම් (ද්‍රවශීලතා වත්කම්) විධානය පහත දැක්වෙන විධාන මඟින් ප්‍රතිස්ථාපනය විය යුතුය.

2. කාලීන තැන්පතු, ඉතුරුම් තැන්පතු සහ පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා වන ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය	i. සියයට හයක (6) ප්‍රතිශතයක්: (අ) මුදල් සමාගමට එකී දිනයේ ව්‍යාපාර කටයුතු අවසානය වන විට ලැබුණු තැන්පතු වල ගෙවිය යුතුව පවතින වටිනාකම හා ගෙවිය යුතු උපචිත පොලිය; සහ (ආ) එම මුදල් සමාගම විසින් එකී දිනයේ ව්‍යාපාර කටයුතු අවසානය වන විට නිකුත් කර ඇති පැවරිය නොහැකි තැන්පතු සහතික වල මුහුණත වටිනාකම හා ගෙවිය යුතු උපචිත පොලිය; සහ ii. එකී දිනයේ ව්‍යාපාර කටයුතු අවසාන වන විට එම මුදල් සමාගම බාරගෙන ඇති ඉතිරි කිරීමේ තැන්පතු වලින් ආපසු නොගෙවා ඇති ශේෂයන් සහ ගෙවිය යුතු උපචිත පොලියෙන් සියයට දහයක් (10)
3. ණය ගැනීම සඳහා වන ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය	2 වන වගන්තියේ අවශ්‍යතාවයට අමතරව, සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක්ම 2011 අංක 42 දරන මුදල් සමාගම් පනතේ 74 වන වගන්තියෙහි අර්ථකථනය කර ඇති පරිදි අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යා යුතු අතර; එම ප්‍රමාණය ඕනෑම දිනක ව්‍යාපාර කටයුතු අවසන් කරන අවස්ථාවේ දී, මුදල් සමාගමේ ප්‍රාග්ධන අරමුදලෙහි ඇතුළත් කර ඇති ණය ගැනීම් සහ සමාගමේ ඕනෑම වත්කමක්, එහි වෙළඳපොළ අගයට වඩා අඩු ණය වටිනාකමක් වෙනුවෙන් උකසකින් සුරක්ෂිත කරන ලද ණය ගැනීම් හැර අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන මුළු පිටහිටි ණය ගැනීම් සහ වෙනත් ඕනෑම ගෙවිය යුතු වටිනාකමකින් සියයට පහකට (5) අඩු නොවිය යුතුය.
4.1 ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් අවශ්‍යතාවයන්	සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක්ම සෑම විටම, පෙර මුදල් වර්ෂයේ මාස දොළහේ එක් එක් මාසය අවසානයට පැවති ස්වකීය තැන්පතු වගකීම් සහ ණය ගැනීම්වල එකතුවේ සාමාන්‍යයෙන් සියයට පහකට (5) සමාන වත්කම්, ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් වශයෙන් පවත්වා ගත යුතුය. එසේ පවත්වා ගන්නා ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් ආයෝජන අරමුදල් ගිණුම භාවිතයේ ගණනය කිරීම සඳහා යොදා නොගත යුතුය.

කොවිඩ්-19 ව්‍යසනයෙන් ඇති වූ තත්ත්වයෙන් මිදීමට බලපත්‍රලාභී මුදල් සමාගම්වලට පහසුකම් සැලසීම සඳහා මෙම විධානයේ දිනයේ සිට මාස හයක කාලසීමාවක් සඳහා මෙම විධානය බල පැවැත්වේ.

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 02 දරන විධානය 2020 මාර්තු 31

ද්‍රවශීලතා වත්කම් විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නිකුත් කර ඇති 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශීල වත්කම්) විධානයට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් පහත සංශෝධන නිකුත් කරනු ලැබේ.

ඒ අනුව 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශීලතා වත්කම්) විධානයේ 1 වන කොටස පහත විධාන මඟින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කරන ලදී.

1. සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම, ඕනෑම දිනයක ව්‍යාපාර කටයුතු අවසාන කරන අවස්ථාවේ දී අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යා යුතු අතර, එම ප්‍රමාණය කොටස් හිමියන්ට ඇති වගකීම්, සුරැකුම්කරණය සහ වත්කම් වලින් සුරක්ෂිත දිගුකාලීන (අවුරුදු 1 ට වැඩි) ණය ගැනීම් හැර මුළු වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමන්ගේ ප්‍රමාණයෙන් සියයට පහට නොඅඩු විය යුතුය.

2. කොවිඩ්-19 ව්‍යසනයෙන් ඇති වූ තත්ත්වයෙන් මිදීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට පහසුකම් සැලසීම සඳහා මෙම විධානයේ දිනයේ සිට මාස හයක කාලසීමාවක් සඳහා මෙම විධානය බල පැවැත්වේ.

ජේ පී ගමලත්
වැඩබලන අධ්‍යක්ෂ
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ
දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 අංක 02 දරන විස්තර සටහන

ශ්‍රී ලංකා මහ බැංකුව
2020 අප්‍රේල් 24

කොවිඩ් -19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග යන මැයෙන් නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සහ

කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහය වීමට රුපියල් බිලියන 50 ක සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් වන අර්ථ දැක්වීම

විවිධ මූල්‍ය ආයතන විසින් සපයනු ලබන කාලීන ණය, කල්බදු මූල්‍යකරණ පහසුකම් ආදී ණය පහසුකම් සඳහා විවිධ ණය කාණ්ඩ හෝ විවිධ වූ නම් භාවිත කරන බව නිරීක්ෂණය වූ අතර එවැනි පහසුකම් ලබාදෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් එකී පහසුකම් සඳහා සහන ලබාදීම ප්‍රතික්ෂේප කරන බවට ගනුදෙනුකරුවන්ගෙන් පැමිණිලි කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ කලමණාකාරීත්වයට හා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද චක්‍රලේඛයන් හි ඉහතින් දැක් වූ පරිදි ආයතන විසින් ණය පහසුකම් සඳහා භාවිත කරන විවිධ නම් සඳහන් කර නොමැති බව දැනුම් දෙන අතර 2020 අංක 05 දරන චක්‍රලේඛයේ 02 වන වගන්තියේ සඳහන් අංශ සඳහා යම් ගනුදෙනුකරුවෙකු ණය පහසුකම් ලබාගෙන ඇත්නම් සහ කොවිඩ්-19 මඟින් බලපෑමට ලක්ව ඇති බව තහවුරු කිරීමට ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කරන්නේ නම් එම පුද්ගලයන් / ව්‍යාපාර මෙම ණය සහනය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

උදාහරණයක් ලෙස යම් ගනුදෙනුකරුවෙකු සංචාරක කර්මාන්තයට අදාළ කටයුතු සඳහා ණය පහසුකම් ලබා ගෙන ඇති නමුත් එම ණය පහසුකමේ නම චක්‍රලේඛයේ සඳහන් නොමැති වුව ද, ණය පහසුකම ලබාගෙන ඇත්තේ සංචාරක කර්මාන්තයට අදාළ කටයුතු සඳහා සහ ඔහුගේ ආදායම දැනට පවතින තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති බව තහවුරු කර ගත හැකි නම්, ඔහු මෙම සහනය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 03 දරන විධානය

2020 අප්‍රේල් 24

මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිත කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් මඟින් ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත ක්‍රියාවට නැංවීමට අදාළ විධානයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබේ.

1. මුදල් ව්‍යාපාර පනතේ 2019 අංක 02 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානයේ විධාන 1(i) පහත දැක්වෙන විධාන මඟින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

   i) මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිත කිරීමේ අරමුණ සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් මඟින් ලබාදෙන ණය පහසුකම්, එම වාහනවල වෙළඳපල වටිනාකමෙන් පහත සඳහන් ප්‍රතිශත නොඉක්මවිය යුතුය.

      (අ) ලියාපදිංචි නොකළ වාහන සහ පළමු ලියාපදිංචියෙන් වසරකට නොවැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා;

වගු අංක 01 - වටිනාකම් මත ණය අනුපාත

වාහන වර්ගය	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය	විද්‍යුත් වාහන	වෙනත්
වාණිජ වාහන	C1, C, CE, D1, D, DE, G1, G, J	90%	90%
මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ	B [සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (Single Cab) කැබ් රථ හැර]	90%	50%

දේශීයව එකලස් කළ මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ	B [සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (Single Cab) කැබ් රථ හැර]	90%	70%
ත්‍රී රෝද රථ	B1	90%	25%
සැහැල්ලු ට්‍රක් රථ	B	90%	90%
වෙනත් ඕනෑම වාහන	A1, A සහ B පන්තිය යටතේ වර්ගීකරණය කර ඇති තනි ආසන කැබ් රථ (Single Cab)	90%	70%
දෙමුහුම් මෝටර් කාර්, වෑන් සහ ක්‍රීඩා උපයෝගී වාහන (SUV)	B [සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (Single Cab) කැබ් රථ හැර]	50%	

ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිත කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 70 ක් විය යුතුය.

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 03 දරන විධානය 2020 අප්‍රේල් 24

මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිත කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන මඟින් ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත ක්‍රියාවට නැංවීමට අදාළ විධානයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබේ.

1. කල්බදු මූල්‍යකරණ පනතේ 2019 අංක 01 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානයේ විධාන 1(i) පහත දැක්වෙන විධාන මඟින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

i) නැවත දැනුම්දෙන තුරු මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිත කිරීමේ අරමුණ සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මඟින් ලබාදෙන ණය පහසුකම්, එම වාහනවල වෙළඳපල වටිනාකමෙන් පහත සඳහන් ප්‍රතිශත නොඉක්මවිය යුතුය.

(අ) ලියාපදිංචි නොකළ වාහන හා පළමු ලියාපදිංචියෙන් වසරකට නොවැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිත කළ ලියාපදිංචි වාහන සඳහා;

වගු අංක 01 - වටිනාකම් මත ණය අනුපාතය

වාහන වර්ගය	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය	විද්‍යුත් වාහන	වෙනත්
වාණිජ වාහන	C1, C, CE, D1, D, DE, G1, G, J	90%	90%
මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ	B [සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (Single Cab) කැබ් රථ හැර]	90%	50%
දේශීයව එකලස් කළ මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ	B [සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (Single Cab) කැබ් රථ හැර]	90%	70%
ත්‍රී රෝද රථ	B1	90%	25%
සැහැල්ලු ට්‍රක් රථ	B	90%	90%
වෙනත් ඕනෑම වාහන	A1, A සහ B පන්තිය යටතේ වර්ගීකරණය කර ඇති තනි ආසන කැබ් රථ (Single Cab)	90%	90%
දෙමුහුම් මෝටර් කාර්, වෑන් සහ ක්‍රීඩා උපයෝගී වාහන (SUV)	B (සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (Single Cab) කැබ් රථ හැර)	50%	

(ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි කළ වාහන සඳහා අනුපාතය සියයට 70 ක් විය යුතුය.

ජේ පී ගමලත්
වැඩබලන අධ්‍යක්ෂ
බැංකු නොවන මූල්‍ය ආයත අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 04 දරන විධානය 2020 අප්‍රේල් 24

තැන්පතු හා ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානය සංශෝධනය කිරීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී මුදල් සමාගම් තැන්පතු හා ණය උපකරණ මත ගෙවිය යුතු උපරිම පොලී අනුපාත, මුදල් මණ්ඩලය විසින් මෙයින් නියම කරනු ලබයි.

1. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 01 දරන තැන්පතු හා ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයේ 1.1 (i) හා 1.2 දරන විධාන පහත දැක්වෙන විධාන මඟින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

1.1 බලපත්‍රලාභී මුදල් සමාගම් ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සඳහා ලබාදෙන හෝ ගෙවන උපරිම පොලී අනුපාතය;

i) පහතින් දක්වා ඇති වගු අංක 01 හි පොලී අනුපාතයන් නොඉක්මවිය යුතුය.

වගු අංක 01

බලපත්‍රලාභී මුදල් සමාගම් හි පවත්වාගෙන යන තැන්පතු කල් පිරීමෙන් පසු ගෙවන උපරිම පොලී අනුපාත

තැන්පතුවේ කාල සීමාව	උපරිම වාර්ෂික පොලී අනුපාතය
තැන්පතු කාල සීමාව මසකට අඩු හෝ කල් පිරීමේ කාල සීමාව විශේෂයෙන් දක්වා නොමැති ඉතිරි කිරීම් හා වෙනත් තැන්පතු	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත (SDFR)
කාලීන තැන්පතු	
මාස 01 සහ මාස 03 ට අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය
මාස 03 සහ මාස 06 ට අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 0.25%
මාස 06 සහ අවුරුදු 01 ට අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 0.50%
අවුරුදු 01 සහ අවුරුදු 02 ට අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 2.00%
අවුරුදු 02 සහ අවුරුදු 03 ට අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 2.75%
අවුරුදු 03 සහ අවුරුදු 05 ට අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 3.25%
අවුරුදු 05	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 3.75%

1.2 බලපත්‍රලාභී මුදල් සමාගම් ණය උපකරණ සඳහා ලබාදෙන හෝ ගෙවන උපරිම පොලී අනුපාත පහතින් දක්වා ඇති වගු අංක 02 හි අනුපාතයන් නොඉක්ම විය යුතුය.

වගු අංක 02

බලපත්‍රලාභී මුදල් සමාගම් නිකුත් කරන ණය උපකරණ කල් පිරීමෙන් පසු ගෙවන උපරිම පොලී අනුපාත

ණය උපකරණ වල කාල සීමාව	උපරිම පොලී අනුපාතය
අවුරුදු 01 ට වඩා අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 0.50%
අවුරුදු 01 සහ අවුරුදු 02 ට වඩා අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 2.75%
අවුරුදු 02 සහ අවුරුදු 03 ට වඩා අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 3.25%
අවුරුදු 03 සහ අවුරුදු 05 ට වඩා අඩු	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 3.75%
අවුරුදු 05	භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 4.25%

1. 2019.10.18 දින මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 03 දරන තැන්පතු හා ණය උපකරණ මත ගෙවන උපරිම පොලී අනුපාත සංශෝධන විධානය මෙම විධානය බලාත්මක වන දිනයේ සිට අවලංගු වේ.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ණය සහන කාලසීමාවට අදාළ උපචිත පොලිය සඳහා වන 2020 අංක 03 දරන විස්තර සටහන

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2020 මැයි 04

කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැපයීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග දැක්වෙන 2020 අංක 04 දරන චක්‍රලේඛය

සහ

කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහයවීමට රුපියල් බිලියන 50 ක සයමාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛයේ අර්ථ දැක්වීම

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ලබාදෙන ණය සහන කාලසීමාවට අදාළ උපචිත පොලිය සම්බන්ධ වන පැහැදිලි කිරීම් පහතින් සඳහන් කර ඇත.

1. සහන කාලසීමාව තුළ සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය මුදල සඳහා වන පොලිය අය කර ගැනීමට හැකියාව ඇති අතර, එම උපචිත පොලිය පොලී රහිත නව කාලීන ණයකට පරිවර්තනය කර ණය ගැනුම්කරුගෙන් නැවත අය කර ගත යුතුය.

උදාහරණ : මාසික ණය පොලිය ගණනය කිරීම

$$\text{2020 අප්‍රේල් මාසය සඳහා පොලිය අය කිරීම} = \text{ණය සහන කාලසීමාව ආරම්භ වන අවස්ථාවේ දී පැවති ණය පහසුකමේ ගෙවීමට ඇති ශේෂය (2020 අප්‍රේල් මාසය ආරම්භයේ දී)} \times \frac{\text{සහනදායී පොලී අනුපාතිකය}}{12}$$

2. ණය සහන කාලසීමාව ලබා ගැනීමට සුදුසුකම් ලැබූ ණය ගැනුම්කරුගේ කැමැත්ත අනුව පහත සඳහන් විකල්ප ක්‍රම දෙකෙන් එක් ආකාරයකට පොලී රහිත ණය පහසුකම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අය කර ගත යුතුය.

   විකල්ප 1 : බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් පොලී රහිත කාලීන ණය පහසුකම ණය සහන කාලසීමාව අවසන් වීමෙන් පසු සමාන වාරික වලින් අය කර ගත යුතු අතර ආපසු ගෙවීමේ කාල සීමාව අවුරුදු 2 හෝ ණය පහසුකමේ ඉතිරිව ඇති කල් පිරීමේ කාල සීමාව යන දෙකෙන් අවම කාල සීමාව වේ. විකල්ප 1 සඳහා වන සහන පොලී අනුපාතිකය සියයට 6.5 උපරිමයකට යටත්ව ගිවිසුම් පොලී අනුපාතයෙන් තුනෙන් එකක් විය යුතුය.

   විකල්ප 2 : බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට පොලී රහිත කාලීන ණය පහසුකම, මුල් ණය ගිවිසුමේ මාසික වාරිකයේ වටිනාකම නොඉක්ම වූ වාරික වලින් ගිවිසුම් කාල සීමාව අවසානයේ දී (ණය සහන කාල සීමාව සලකමින් දීර්ඝ කරන ලද ගිවිසුම් කාලය) අයකර ගත යුතුය. විකල්ප 2 හි සහන පොලී අනුපාතිකය ගිවිසුම් පොලී අනුපාතිකයෙ හි අගයෙන් තුනෙන් එකක අගයට සියයට 1 ක ප්‍රතිශතයක් එකතු කර අය කළ හැකි අතර සියයට 7.5 ක උපරිමයකට යටත් විය යුතුය.

3. ගෙවිය යුතු මුළු පොලිය සහ මුදලේ කාල අගය ඇතුළුව එක් එක් විකල්පයන් හි වෙනස්කම් පැහැදිලි කර දීමෙන් අනතුරුව, ණය ගැනුම්කරු විසින් තෝරා ගන්නා ලද විකල්පය සඳහා කැමැත්ත ලබා ගත යුතුය.

උදාහරණය 1, විකල්ප 1

ණය පහසුකම ලබා දුන් දිනය	2019 අප්‍රේල් 01
ණය මුදලේ වටිනාකම	රු. 2,000,000
ණය කාලසීමාව (මුල්)	මාස 24
පොලී අනුපාතය	වාර්ෂිකව සියයට 16
මාසික වාරිකය	රු. 97,926
2020 මාර්තු මස අවසානයට පැවති කල් පිරීමේ කාල සීමාව (මුල් කල් පිරීමේ කාල සීමාව + ණය සහන කාල සීමාව)	මාස 18
2020 සැප්තැම්බර් මස සහන කාල සීමාව අවසානයේ පවතින කල් පිරීමේ කාල සීමාව	මාස 12

   (අ) 2020 අප්‍රේල් මස සිට 2020 සැප්තැම්බර් මස දක්වා වන ණය වාරික සඳහා සහන කාලසීමාව අදාළ වේ. ගනුදෙනුකරු විසින් 2020 ඔක්තෝබර් මස සිට නැවත රු. 97,926 බැගින් වූ වාරික ගෙවීම ආරම්භ කළ යුතු අතර 2021 සැප්තැම්බර් මස අවසානය දක්වා ගෙවීම් කළ යුතුය.

(ආ) සහන කාලසීමාවට අදාළ උපචිත පොලිය වන රු. 29,104 ක මුදල (මාස 06 ක කාලසීමාවක් සඳහා සියයට 16 ක පොලී ප්‍රතිශතයෙන් තුනෙන් එකක්) මාස 12 ක කාලසීමාවක් සඳහා පොලී රහිත කාලීන ණයක් බවට පරිවර්තනය කළ යුතුය. එකී ණය මුදල සමාන වාරික මඟින් රු. 2,425 බැගින් මාස 12 ක කාල සීමාවක දී (එනම් මාස 24 කින් හෝ ණය සහන කාලසීමාව අවසානයේ පවතින කල් පිරීමේ කාල සීමාවෙන් අවම අගය) ගනුදෙනුකරුවන්ගෙන් අයකර ගත යුතුය.

උදාහරණය 2, විකල්ප 01

ණය පහසුකම ලබා දුන් දිනය	2019 අප්‍රේල් 01
ණය මුදලේ වටිනාකම	රු. 2,000,000
ණය කාලසීමාව (මුල්)	මාස 60
පොලී අනුපාතය	වාර්ෂිකව සියයට 24
මාසික වාරිකය	රු. 57,536
2020 මාර්තු මස අවසානයට පැවති කල් පිරීමේ කාල සීමාව (මුල් කල් පිරීමේ කාල සීමාව + ණය සහන කාල සීමාව)	මාස 54
2020 සැප්තැම්බර් මස සහන කාල සීමාව අවසානයේ පවතින කල් පිරීමේ කාල සීමාව	මාස 48

(අ) 2020 අප්‍රේල් මස සිට 2020 සැප්තැම්බර් මස දක්වා වන ණය වාරික සඳහා සහන කාලසීමාව අදාළ වේ. ගනුදෙනුකරු විසින් 2020 ඔක්තෝබර් මස සිට නැවත රු. 57,536 බැගින් වූ වාරික ගෙවීම ආරම්භ කළ යුතු අතර 2024 සැප්තැම්බර් මස අවසානය දක්වා ගෙවීම් කළ යුතුය.

(ආ) සහන කාලසීමාවට අදාළ උපචිත පොලිය වන රු. 58,139 ක මුදල (මාස 06 ක කාලසීමාවක් සඳහා සියයට 6.5 ක උපරිම පොලී අනුපාතයක්) මාස 24 ක කාලසීමාවක් සඳහා පොලී රහිත කාලීන ණයක් බවට පරිවර්තනය කළ යුතුය. එකී ණය මුදල සමාන වාරික මඟින් රු. 2,422 බැගින් මාස 24 ක කාල සීමාවක දී (එනම් මාස 24 කින් හෝ ණය සහන කාලසීමාව අවසානයේ පවතින කල් පිරීමේ කාල සීමාවෙන් අවම අගය) ගනුදෙනුකරුවන්ගෙන් අයකර ගත යුතුය.

උදාහරණය 3, විකල්ප 02

ණය පහසුකම ලබා දුන් දිනය	2019 අප්‍රේල් 01
ණය මුදලේ වටිනාකම	රු. 2,000,000
ණය කාලසීමාව (මුල්)	මාස 60
පොලී අනුපාතය	වාර්ෂිකව සියයට 24
මාසික වාරිකය	රු. 57,536
2020 මාර්තු මස අවසානයට පැවති කල් පිරීමේ කාල සීමාව (මුල් කල් පිරීමේ කාල සීමාව + ණය සහන කාල සීමාව)	මාස 54
2020 සැප්තැම්බර් මස සහන කාල සීමාව අවසානයේ පවතින කල් පිරීමේ කාල සීමාව	මාස 48

(අ) 2020 අප්‍රේල් මස සිට 2020 සැප්තැම්බර් මස දක්වා වන ණය වාරික සඳහා සහන කාලසීමාව අදාළ වේ. ගනුදෙනුකරු විසින් 2020 ඔක්තෝබර් මස සිට නැවත රු. 57,536 බැගින් වූ වාරික ගෙවීම ආරම්භ කළ යුතු අතර 2024 සැප්තැම්බර් මස අවසානය දක්වා ගෙවීම් කළ යුතුය.

(ආ) සහන කාලසීමාවට අදාළ උපචිත පොලිය වන රු. 67,223 ක මුදල (මාස 06 ක කාලසීමාවක් සඳහා සියයට 7.5 ක උපරිම පොලී අනුපාතයක්) පොලී රහිත කාලීන ණයක් බවට පරිවර්තනය කර, 2024 සැප්තැම්බර් මස අවසානයෙන් පසු වාරිකයක වටිනාකම, මුල් වාරිකයේ වටිනාකම වන රු. 57,536 ක අගය නොඉක්මවන පරිදි වාරික දෙකක් මඟින් ගනුදෙනුකරුගෙන් අය කර ගත යුතුය.

උදාහරණය 01

මුල් ණය මුදල	රු. 2,000,000
පොලී අනුපාතය (අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය)	සියයට 16
කල් ඉකුත්වීමේ දිනය	2021 මාර්තු
වාරිකය	රු. 97,926.22
ණය පහසුකමේ කාලසීමාව	මාස 24
සහන කාලසීමාව සඳහා මුළු උපචිත පොලිය	රු. 29,103.15
සහන කාලසීමාව අවසානයේ ඉතිරිව ඇති පරිණත කාලය	මාස 12
නව කාලීන ණය සඳහා සමාන වාරිකයේ වටිනාකම	රු. 2,425.26

	මුල් මුදලේ දැනට පවතින ශේෂය	පොලිය	වාරිකය	ඉදිරියට ගෙන යන ශේෂය
අප්‍රේල් 2019	2,000,000	26,667	(97,926)	1,928,740
මැයි 2019	1,928,740	25,717	(97,926)	1,856,531
ජූනි 2019	1,856,531	24,754	(97,926)	1,783,358
ජූලි 2019	1,783,358	23,778	(97,926)	1,709,210
අගෝස්තු 2019	1,709,210	22,789	(97,926)	1,634,073
සැප්තැම්බර් 2019	1,634,073	21,788	(97,926)	1,557,935
ඔක්තෝම්බර් 2019	1,557,935	20,772	(97,926)	1,480,781
නොවැම්බර් 2019	1,480,781	19,744	(97,926)	1,402,599
දෙසැම්බර් 2019	1,402,599	18,701	(97,926)	1,323,374
ජනවාරි 2020	1,323,374	17,645	(97,926)	1,243,092
පෙබරවාරි 2020	1,243,092	16,575	(97,926)	1,161,741
මාර්තු 2020	1,161,741	15,490	(97,926)	**1,079,304**
අප්‍රේල් 2020	1,079,304	4,797		1,084,101
මැයි 2020	1,084,101	4,818		1,088,920
ජූනි 2020	1,088,920	4,840		1,093,759
ජූලි 2020	1,093,759	4,861		1,098,620
අගෝස්තු 2020	1,098,620	4,883		1,103,503
සැප්තැම්බර් 2020	1,103,503	4,904		1,108,408
ඔක්තෝම්බර් 2020	**1,079,304**	14,391	(97,926)	995,769
නොවැම්බර් 2020	995,769	13,277	(97,926)	911,120
දෙසැම්බර් 2020	911,120	12,148	(97,926)	825,34
ජනවාරි 2021	825,342	11,005	(97,926)	738,420
පෙබරවාරි 2021	738,420	9,846	(97,926)	650,339
මාර්තු 2021	650,339	8,671	(97,926)	561,084
අප්‍රේල් 2021	561,084	7,481	(97,926)	470,639
මැයි 2021	470,639	6,275	(97,926)	378,988
ජූනි 2021	378,988	5,053	(97,926)	286,115
ජූලි 2021	286,115	3,815	(97,926)	192,004
අගෝස්තු 2021	192,004	2,560	(97,926)	96,638
සැප්තැම්බර් 2021	96,638	1,289	(97,926)	0

උදාහරණය 02

මුල් ණය මුදල	රු. 2,000,000
පොලී අනුපාතය (අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය)	සියයට 24
කල් ඉකුත්වීමේ දිනය	2024 මාර්තු
වාරිකය	රු. 57,535.93
ණය පහසුකමේ කාලසීමාව	මාස 60
සහන කාලසීමාව සඳහා මුළු උපචිත පොලිය	රු. 58,139.00
සහන කාලසීමාව අවසානයේ ඉතිරිව ඇති පරිණත කාලය	මාස 48
නව කාලීන ණය සඳහා සමාන වාරිකයේ වටිනාකම	රු. 2,422.44

	මුල් මුදලේ දැනට පවතින ශේෂය	පොලිය	වාරිකය	ඉදිරියට ගෙන යන ශේෂය
අප්‍රේල් 2019	2,000,000	40,000	(57,536)	1,982,464
මැයි 2019	1,982,464	39,649	(57,536)	1,964,577
ජූනි 2019	1,964,577	39,292	(57,536)	1,946,333
ජූලි 2019	1,946,333	38,927	(57,536)	1,927,724
අගෝස්තු 2019	1,927,724	38,554	(57,536)	1,908,742
සැප්තැම්බර් 2019	1,908,742	38,175	(57,536)	1,889,381
ඔක්තෝම්බර් 2019	1,889,381	37,788	(57,536)	1,869,633
නොවැම්බර් 2019	1,869,633	37,393	(57,536)	1,849,490
දෙසැම්බර් 2019	1,849,490	36,990	(57,536)	1,828,944
ජනවාරි 2020	1,828,944	36,579	(57,536)	1,807,986
පෙබරවාරි 2020	1,807,986	36,160	(57,536)	1,786,610
මාර්තු 2020	1,786,610	35,732	(57,536)	**1,764,807**
අප්‍රේල් 2020	1,764,807	9,559		1,774,366
මැයි 2020	1,774,366	9,611		1,783,977
ජූනි 2020	1,783,977	9,663		1,793,640
ජූලි 2020	1,793,640	9,716		1,803,356
අගෝස්තු 2020	1,803,356	9,768		1,813,124
සැප්තැම්බර් 2020	1,813,124	9,821		1,822,945
ඔක්තෝම්බර් 2020	**1,764,807**	35,296	(57,536)	1,742,567
නොවැම්බර් 2020	1,742,567	34,851	(57,536)	1,719,882
දෙසැම්බර් 2020	1,719,882	34,398	(57,536)	1,696,744
ජනවාරි 2021	1,696,744	33,935	(57,536)	1,673,143
පෙබරවාරි 2021	1,673,143	33,463	(57,536)	1,649,070
මාර්තු 2021	1,649,070	32,981	(57,536)	1,624,515
අප්‍රේල් 2021	1,624,515	32,490	(57,536)	1,599,470
මැයි 2021	1,599,470	31,989	(57,536)	1,573,923
ජූනි 2021	1,573,923	31,478	(57,536)	1,547,866
ජූලි 2021	1,547,866	30,957	(57,536)	1,521,287
අගෝස්තු 2021	1,521,287	30,426	(57,536)	1,494,177
සැප්තැම්බර් 2021	1,494,177	29,884	(57,536)	1,466,524
ඔක්තෝම්බර් 2021	1,466,524	29,330	(57,536)	1,438,319
නොවැම්බර් 2021	1,438,319	28,766	(57,536)	1,409,549
දෙසැම්බර් 2021	1,409,549	28,191	(57,536)	1,380,204
ජනවාරි 2022	1,380,204	27,604	(57,536)	1,350,273
පෙබරවාරි 2022	1,350,273	27,005	(57,536)	1,319,742
මාර්තු 2022	1,319,742	26,395	(57,536)	1,288,601
අප්‍රේල් 2022	1,288,601	25,772	(57,536)	1,256,837
මැයි 2022	1,256,837	25,137	(57,536)	1,224,438
ජූනි 2022	1,224,438	24,489	(57,536)	1,191,391
ජූලි 2022	1,191,391	23,828	(57,536)	1,157,683

අගෝස්තු 2022	1,157,683	23,154	(57,536)	1,123,300
සැප්තැම්බර් 2022	1,123,300	22,466	(57,536)	1,088,230
ඔක්තෝම්බර් 2022	1,088,230	21,765	(57,536)	1,052,459
නොවැම්බර් 2022	1,052,459	21,049	(57,536)	1,015,972
දෙසැම්බර් 2022	1,015,972	20,319	(57,536)	978,756
ජනවාරි 2023	978,756	19,575	(57,536)	940,795
පෙබරවාරි 2023	940,795	18,816	(57,536)	902,075
මාර්තු 2023	902,075	18,041	(57,536)	862,580
අප්‍රේල් 2023	862,580	17,252	(57,536)	822,296
මැයි 2023	822,296	16,446	(57,536)	781,206
ජූනි 2023	781,206	15,624	(57,536)	739,294
ජූලි 2023	739,294	14,786	(57,536)	696,544
අගෝස්තු 2023	696,544	13,931	(57,536)	652,939
සැප්තැම්බර් 2023	652,939	13,059	(57,536)	608,462
ඔක්තෝම්බර් 2023	608,462	12,169	(57,536)	563,095
නොවැම්බර් 2023	563,095	11,262	(57,536)	516,821
දෙසැම්බර් 2023	516,821	10,336	(57,536)	469,622
ජනවාරි 2024	469,622	9,392	(57,536)	421,478
පෙබරවාරි 2024	421,478	8,430	(57,536)	372,372
මාර්තු 2024	372,372	7,447	(57,536)	322,284
අප්‍රේල් 2024	322,284	6,446	(57,536)	271,193
මැයි 2024	271,193	5,424	(57,536)	219,081
ජූනි 2024	219,081	4,382	(57,536)	165,927
ජූලි 2024	165,927	3,319	(57,536)	111,710
අගෝස්තු 2024	111,710	2,234	(57,536)	56,408
සැප්තැම්බර් 2024	56,408	1,128	(57,536)	(0)

උදාහරණය 03

මුල් ණය මුදල	රු. 2,000,000
පොලී අනුපාතය (අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය)	සියයට 24
කල් ඉකුත්වීමේ දිනය	2024 මාර්තු
වාරිකය	රු. 57,535.93
ණය පහසුකමේ කාලසීමාව	මාස 60
සහන කාලසීමාව සඳහා මුළු උපචිත පොලිය	රු. 67,223
සහන කාලසීමාව අවසානයේ ඉතිරිව ඇති පරිණත කාලය	මාස 48
ගිවිසුම අවසානයේ දී අයකර ගත යුතු පොලිය වාරික 1 වාරික 2	 රු. 57,535.93 රු. 9,687.04

	මුල් මුදලේ දැනට පවතින ශේෂය	පොලිය	වාරිකය	ඉදිරියට ගෙන යන ශේෂය
අප්‍රේල් 2019	2,000,000	40,000	(57,536)	1,982,464
මැයි 2019	1,982,464	39,649	(57,536)	1,964,577

ජුනි 2019	1,964,577	39,292	(57,536)	1,946,333
ජුලි 2019	1,946,333	38,927	(57,536)	1,927,724
අගෝස්තු 2019	1,927,724	38,554	(57,536)	1,908,742
සැප්තැම්බර් 2019	1,908,742	38,175	(57,536)	1,889,381
ඔක්තෝබර් 2019	1,889,381	37,788	(57,536)	1,869,633
නොවැම්බර් 2019	1,869,633	37,393	(57,536)	1,849,490
දෙසැම්බර් 2019	1,849,490	36,990	(57,536)	1,828,944
ජනවාරි 2020	1,828,944	36,579	(57,536)	1,807,986
පෙබරවාරි 2020	1,807,986	36,160	(57,536)	1,786,610
මාර්තු 2020	1,786,610	35,732	(57,536)	**1,764,807**
අප්‍රේල් 2020	1,764,807	11,030		1,775,837
මැයි 2020	1,775,837	11,099		1,786,936
ජුනි 2020	1,786,936	11,168		1,798,104
ජුලි 2020	1,798,104	11,238		1,809,342
අගෝස්තු 2020	1,809,342	11,308		1,820,650
සැප්තැම්බර් 2020	1,820,650	11,379		1,832,029
ඔක්තෝම්බර් 2020	**1,764,807**	35,296	(57,536)	1,742,567
නොවැම්බර් 2020	1,742,567	34,851	(57,536)	1,719,882
දෙසැම්බර් 2020	1,719,882	34,398	(57,536)	1,696,744
ජනවාරි 2021	1,696,744	33,935	(57,536)	1,673,143
පෙබරවාරි 2021	1,673,143	33,463	(57,536)	1,649,070
මාර්තු 2021	1,649,070	32,981	(57,536)	1,624,515
අප්‍රේල් 2021	1,624,515	32,490	(57,536)	1,599,470
මැයි 2021	1,599,470	31,989	(57,536)	1,573,923
ජුනි 2021	1,573,923	31,478	(57,536)	1,547,866
ජුලි 2021	1,547,866	30,957	(57,536)	1,521,287
අගෝස්තු 2021	1,521,287	30,426	(57,536)	1,494,177
සැප්තැම්බර් 2021	1,494,177	29,884	(57,536)	1,466,524
ඔක්තෝම්බර් 2021	1,466,524	29,330	(57,536)	1,438,319
නොවැම්බර් 2021	1,438,319	28,766	(57,536)	1,409,549
දෙසැම්බර් 2021	1,409,549	28,191	(57,536)	1,380,204
ජනවාරි 2022	1,380,204	27,604	(57,536)	1,350,273
පෙබරවාරි 2022	1,350,273	27,005	(57,536)	1,319,742
මාර්තු 2022	1,319,742	26,395	(57,536)	1,288,601
අප්‍රේල් 2022	1,288,601	25,772	(57,536)	1,256,837
මැයි 2022	1,256,837	25,137	(57,536)	1,224,438
ජුනි 2022	1,224,438	24,489	(57,536)	1,191,391
ජුලි 2022	1,191,391	23,828	(57,536)	1,157,683
අගෝස්තු 2022	1,157,683	23,154	(57,536)	1,123,300
සැප්තැම්බර් 2022	1,123,300	22,466	(57,536)	1,088,230
ඔක්තෝම්බර් 2022	1,088,230	21,765	(57,536)	1,052,459

නොවැම්බර් 2022	1,052,459	21,049	(57,536)	1,015,972
දෙසැම්බර් 2022	1,015,972	20,319	(57,536)	978,756
ජනවාරි 2023	978,756	19,575	(57,536)	940,795
පෙබරවාරි 2023	940,795	18,816	(57,536)	902,075
මාර්තු 2023	902,075	18,041	(57,536)	862,580
අප්‍රේල් 2023	862,580	17,252	(57,536)	822,296
මැයි 2023	822,296	16,446	(57,536)	781,206
ජූනි 2023	781,206	15,624	(57,536)	739,294
ජූලි 2023	739,294	14,786	(57,536)	696,544
අගෝස්තු 2023	696,544	13,931	(57,536)	652,939
සැප්තැම්බර් 2023	652,939	13,059	(57,536)	608,462
ඔක්තෝම්බර් 2023	608,462	12,169	(57,536)	563,095
නොවැම්බර් 2023	563,095	11,262	(57,536)	516,821
දෙසැම්බර් 2023	516,821	10,336	(57,536)	469,622
ජනවාරි 2024	469,622	9,392	(57,536)	421,478
පෙබරවාරි 2024	421,478	8,430	(57,536)	372,372
මාර්තු 2024	372,372	7,447	(57,536)	322,284
අප්‍රේල් 2024	322,284	6,446	(57,536)	271,193
මැයි 2024	271,193	5,424	(57,536)	219,081
ජූනි 2024	219,081	4,382	(57,536)	165,927
ජූලි 2024	165,927	3,319	(57,536)	111,710
අගෝස්තු 2024	111,710	2,234	(57,536)	56,408
සැප්තැම්බර් 2024	56,408	1,128	(57,536)	(0)
ඔක්තෝම්බර් 2024	67,223	0	(57,536)	9,687
නොවැම්බර් 2024	9,687	0	(9,687)	(0)

ණය සහන කාලසීමාවට අදාළ උපචිත පොලිය සංශෝධනය සඳහා වන 2020 අංක 04 දරන විස්තර සටහන

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2020 ජූනි 09

කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැපයීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග දැක්වෙන 2020 අංක 04 දරන චක්‍රලේඛය

සහ

කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහයවීමට රුපියල් බිලියන 50 ක සයමාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම දැක්වෙන 2020 අංක 05 දරන චක්‍රලේඛය සඳහා නිකුත් කරන ලද 2020 අංක 03 දරන විස්තර සටහන සඳහා වන සංශෝධන

කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 04 දරන චක්‍රලේඛය සහ කොවිඩ්-19 මඟින් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියාවන් ඇතුළු ව්‍යාපාර සඳහා සහයවීමට රුපියල් බිලියන 50 ක සහ සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වාදීම සඳහා නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛය සඳහා නිකුත් කරන ලද 2020 අංක 03 දරන විස්තර සටහන සඳහා පහත සංශෝධනයන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබයි.

2020 අංක 03 දරන විස්තර සටහනේ 02 වන පරිච්ඡේදයේ සඳහන් සහන කාලසීමාව තුළ උපචිත පොලිය පහත පරිදි සංශෝධනය වේ.

විකල්ප 1 : බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් පොළී රහිත කාලීන ණය පහසුකම ණය සහන කාලසීමාව අවසන් වීමෙන් පසු සමාන වාරික වලින් අය කර ගත යුතු අතර ආපසු ගෙවීමේ කාල සීමාව අවුරුදු 2 හෝ ණය පහසුකමේ ඉතිරිව ඇති කල් පිරීමේ කාල සීමාව යන දෙකෙන් අවම කාල සීමාව වේ.

විකල්ප 2 : බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට පොලී රහිත කාලීන ණය පහසුකම, මුල් ණය ගිවිසුමේ මාසික වාරිකයේ වටිනාකම නොඉක්ම වූ වාරික වලින් ගිවිසුම් කාල සීමාව අවසානයේ දී (ණය සහන කාල සීමාව සලකමින් දීර්ඝ කරන ලද ගිවිසුම් කාලය) අයකර ගත යුතුය.

ඉහත විකල්ප 1 සහ 2 සඳහා වාර්ෂිකව සියයට 11.5 ක උපරිමයකට යටත්ව සහන ණය පොලී අනුපාතයක් අය කළ හැකිය. තවදුරටත් ගෙවිය යුතු මුළු පොලී පිරිවැය සහ මුදලේ කාල වටිනාකම ඇතුළුව එක් එක් විකල්පයන්හි වෙනස්කම් පැහැදිලි කර දීමෙන් අනතුරුව ණය ගැනුම්කරු විසින් තෝරා ගන්නා ලද විකල්පය සඳහා වන කැමැත්ත ලබා ගත යුතුය.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 05 දරන විධානය 2020 ජූනි 18

ආයතනික යහපාලන විධානය සංශෝධනය කිරීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලද 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන) විධානයට පහත සඳහන් සංශෝධනය නිකුත් කරනු ලබයි.

විශේෂයෙන් වර්තමානයේ පවතින අභියෝගාත්මක පරිසරය තුළ මනා සේවා වාර්තා සහිත පළපුරුදු පුද්ගලයින්, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයන්ට ආකර්ෂණය කර ගැනීමට පවත්නා වූ සීමිත හැකියාව සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලයන්හි යම් මට්ටමක අඛණ්ඩතාවයක් පවත්වා ගැනීම විචක්ෂණශීලී බවත්, එවැනි අඛණ්ඩ පැවැත්මක්, අරමුණුගත දෘෂ්ටිකෝණයකින්, බලපත්‍රලාභී මුදල් සමාගම්වල යහපත උදෙසාම විය යුතු බවත් මුදල් මණ්ඩලය විසින් සලකනු ලැබේ.

1. අදාළත්වය සහ විෂය පථය	2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන) විධානයේ 5 (i) විධානයේ ප්‍රතිපාදන වලට යටත්ව, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිතව බලපත්‍රලාභී මුදල් සමාගමක දැනටමත් අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරන සහ මෙම විධානය ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසු දිනක දී වයස අවුරුදු 70 ලබන අධ්‍යක්ෂවරයෙකුට අධ්‍යක්ෂ ධූරයේ නොකඩවා කටයුතු කිරීමට, මෙම විධානයේ සහ ඊට සම්බන්ධ මාර්ගෝපදේශයන් හි සඳහන් අවශ්‍යතා හා කොන්දේසි දැඩිව පිළිපැදීමට යටත්ව, බලපත්‍රලාභී මුදල් සමාගමකට අවසර ලබා දිය හැක.
2. මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීම	මේවායින් ඕනෑම සේවා දිගුවක්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත් වේ.
3. නියමයන් හා කොන්දේසි	අනුගමනය කළ යුතු නියමයන් සහ කොන්දේසි සහ ක්‍රියාපටිපාටිය මෙම විධානය සමඟ අමුණා ඇති මාර්ගෝපදේශයන්හි දක්වා ඇත.
4. බලපැවැත්වෙන දිනය සහ වලංගු කාලය	මෙම විධානය නිකුත් කළ මොහොතේ සිට වසර තුනක කාලසීමාවක් දක්වා බලාත්මක වන අතර වසර තුනක කාලසීමාව අවසන් වූ පසු යළි ක්‍රියාවට නැංවීම මුදල් මණ්ඩලයේ අභිමතයට යටත් වේ.

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

වයස අවුරුදු 70 ඉක්ම වූ සහ උපරිම වයස අවුරුදු 75 දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය

1. අදාළත්වය

1.1. විධානය නිකුත් කළ දිනය වන විට බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන සහ අනාගතයේ දී වයස අවුරුදු 70 ඉක්මවා සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම තීරණය කරන අවස්ථාවේ දී එවැනි අධ්‍යක්ෂවරුන් සඳහා පමණක් මෙම මාර්ගෝපදේශයේ විධිවිධාන අදාළ වේ.

2. තක්සේරු නිර්ණායක

2.1. අධ්‍යක්ෂකවරුන්ගේ යෝග්‍යතාවය අරමුණු ගතව තක්සේරු කිරීම සඳහා සකස් කර ඇති නිර්ණායක මෙන්ම එම අධ්‍යක්ෂකවරුන් මූල්‍ය ආයතනයට ලබා දුන් දායකත්වය සහ එම මූල්‍ය ආයතනයේ නියාමන අනුකූලතා මට්ටම මත පදනම්ව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් වයස අවුරුදු 70 ළඟා වූ අධ්‍යක්ෂවරුන් තක්සේරු කරනු ලබයි.

2.2. බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් වයස අවුරුදු 70 ඉක්මවා අධ්‍යක්ෂකවරයෙකුගේ සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, සේවා දිගුව අනුමත කිරීමේ යෝග්‍යතාවය මුදල් මණ්ඩලය විසින් තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ලියවිලි යොමු කළ යුතුය. මෙම යෝග්‍යතාව තක්සේරු කිරීම මුදල් මණ්ඩලය විසින් (වෙන් වෙන් වශයෙන් /තනි තනිව සලකා බැලීමේ පදනමින්) සිදු කරනු ලැබේ. කෙසේ නමුත්, කිසිදු අවස්ථාවක අධ්‍යක්ෂකවරයෙකු ට වයස අවුරුදු 75 ඉක්මවා කටයුතු කිරීමට අවසර හිමි නොවේ.

2.3. යෝග්‍යතාවය සහ හිමිකම

වයස අවුරුදු 70 ඉක්මවා සේවයේ රඳවා ගැනීමට යෝජනා කර ඇති අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂවරයෙකුගේ රාජකාරී සහ කාර්යයන් ඉටු කිරීමට යෝග්‍ය පුද්ගලයෙකු බවට මුදල් මණ්ඩලයට තහවුරු කිරීමේ වගකීම බලපත්‍රලාභී මුදල් සමාගම වෙත පැවරේ:

i. 2011 අංක 03 දරන මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයෙහි ඇමුණුම I හි සහ II හි දක්වා ඇති පරිදි සහ වරින් වර සිදුවන එම විධානයේ සංශෝධනයන්ට අනුව දිවුරුම් ප්‍රකාශය සහ ප්‍රකාශය. අදාළ අවස්ථාවේ කටයුතු කරන සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින් (තක්සේරු කිරීමට ලක් වන අධ්‍යක්ෂවරයා හැර) මෙම දිවුරුම් ප්‍රකාශය සහ ප්‍රකාශය සහතික කළ යුතුය.

ii. බලපත්‍රලාභී මුදල් සමාගමෙහි එම අවස්ථාවේ අධ්‍යක්ෂක ධූරයේ සිටින සේවා දිගුවක් අපේක්ෂා කරන අධ්‍යක්ෂවරයා හැර සියලුම අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කර ගත යුතුය. එම අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙහි එවැනි සේවා දිගුවක් අපේක්ෂා කරන අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂක ධූරයේ අඛණ්ඩව කටයුතු කර ගෙනයාම මඟින් ආයතනයට ලැබෙන ප්‍රතිලාභ නිසා සේවා දිගුව ලබා දීම යෝග්‍ය බව සහ මුදල් මණ්ඩලයට සේවා දිගුවක් ලබාදීම පිළිබඳව සලකා බැලීමට නිර්දේශ කිරීම් ඇතුලත් විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අදාළ සේවා දිගුව බලාත්මක වන දින සිට මාස හයකට පෙර සම්මත වුවක් නොවිය යුතුය.

iii. මේ සම්බන්ධයෙන් දැනුවත්ව තීරණයක් ගැනීමට මුදල් මණ්ඩලයට ඉඩ සැලසීම සඳහා එවැනි යෝජනාවක දක්වා ඇති හේතු විස්තරාත්මකව හා ප්‍රමාණවත්ව තිබිය යුතු අතර හැකිතාක් ලියවිලි මඟින් සනාථ කර තිබිය යුතුය. මුදල් මණ්ඩලයට සේවා දිගුවක් සඳහා වන ඉල්ලීම සලකා බැලීම සඳහා තවදුරටත් ලියවිලි අවශ්‍ය වුවහොත්, අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම විසින් මුදල් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අදාළ ලියවිලි නිසි පරිදි ඉදිරිපත් කළ යුතුය.

iv. අදාළ විධානයන්හි නිශ්චිතව දක්වා ඇති පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතියට සම්බන්ධ අනෙකුත් සියලුම අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට සහ අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය පවතින බවට ප්‍රධාන අනුකූලතා නිලධාරී, සමාගම් ලේකම් හා ප්‍රධාන විධායක නිලධාරී විසින් ඒකාබද්ධව අත්සන් කරන ලද ලිඛිත සහතිකයක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

v 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 වන වගන්තියට අනුව, වයස අවුරුදු 70 ඉක්මවා අධ්‍යක්ෂවරයා /අධ්‍යක්ෂවරුන්ගේ සේවය දීර්ඝ කිරීම පිළිබඳව, මහා සභා රැස්වීමක දී යෝජනාවක් සම්මත කර ගැනීමෙන් නිසි පරිදි අනුමත කර ගත් බවට බලපත්‍රලාභී මුදල් සමාගමේ සමාගම් ලේකම් විසින් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හිමිකාරීත්වය හෝ හිමිකම් කොටස් සලකා බැලීමෙන් තොරව සහ ඉවත් කොට එවැනි යෝජනාවක් සම්මත කර ගත යුතුය. අදාළ අධ්‍යක්ෂවරයාගේ සමීපතම ඥාතීන් සහ හිමිකාරීත්ව කොටස් දරන පොදු අධ්‍යක්ෂකවරුන් යෝජනාව සම්මත කර ගැනීම සඳහා ඡන්දය ලබාදීමෙන් ඉවත් කළ යුතුය. සමීප ඥාතීන් යන්න 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තියෙහි නිර්වචනය කර ඇත.

vi. උපරිම වයස අවුරුදු 75 දක්වා දීර්ඝ කිරීමක් අපේක්ෂා කරන සෑම වසරකදීම, ඉහත දැක්වූ පරිදි නව යෝජනාවක් නිසි පරිදි සම්මත කළ යුතුය.

vii. වයස අවුරුදු 70 ඉක්මවා ඇති අධ්‍යක්ෂවරයෙකුගේ සේවය අඛණ්ඩව පවත්වා ගෙනයාම අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මඟින් තහනම් කර නොමැති බවට ලිඛිත සහතිකයක් සමාගම් ලේකම් විසින් ලබා දිය යුතුය.

2.4. අතීත වාර්තා / මූල්‍ය ආයතනය සඳහා දැක් වූ දායකත්වය:

අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහුගේ / ඇයගේ ධූර කාලය තුළ/කාර්යසාධනය නියමිත පරිදි තක්සේරු කිරීමට පහසුකම් සැලසීම සඳහා, බලපත්‍රලාභී මුදල් සමාගම විසින් පහත සඳහන් ලියවිලි භාරදිය යුතුය :

i. 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන) විධානයේ 2(8) වන වගන්තිය හා එහි සංශෝධන වලට අනුකූලව, වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂවරුන්ගේ පළමු වසර සඳහා යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා පෙර වසර පහ තුළ අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරන ලද වාර්ෂික ස්වයං තක්සේරුවල සහතික කළ පිටපත්, සහ ඉන්පසුව වාර්ෂික ස්වයං තක්සේරු ආකෘති පත්‍රය.

ii. අයදුම්කරුවෙකු සිය සේවා කාලය තුළ මූල්‍ය කාර්යසාධනය වැඩි දියුණු කිරීම, විශේෂ ඇගයීම් පිළිබඳ විස්තර, ඔහුගේ / ඇයගේ නායකත්වය යටතේ පවත්වාගෙන යන ලද විශේෂ ව්‍යාපෘති, මුදල් සමාගමේ වටිනාකම වැඩි දියුණු කිරීම සඳහා ඔහුගේ/ඇයගේ අනාගත සැලසුම් යනාදිය ඇතුළත් අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ස්වයං ප්‍රකාශයක්.

2.5. වර්තමාන නියාමන අනුකූලතාවය :

මුදල් මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුගේ සේවා අඛණ්ඩතාවය තක්සේරු කිරීමේ දී, අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමෙහි නියාමන අනුකූලතා මට්ටම පහත දැක්වෙන පරිදි ඇගයීමට ලක් කරනු ලැබේ. මුදල් මණ්ඩලය වෙත පහත දැක්වෙන විධානයන් සමඟ වෙනත් ඕනෑම විධානයක් හෝ මුදල් මණ්ඩලය විසින් අදාළ බවට සලකන ඕනෑම නියමයක් හෝ කොන්දේසියක් සමඟ ඇති අනුකූලතා මට්ටම පිළිබඳව, විතැන් පරීක්ෂණ සිදු කරන නිලධාරියා සහ අවසාන ව්‍යවස්ථාපිත පරීක්ෂණයේ ප්‍රධාන නිලධාරියා විසින් ලබා දෙන තක්සේරු වාර්තා සහ ඒ සමඟ මුදල් මණ්ඩලය විසින් සලකා බැලිය යුතු අදාළ වෙනත් කරුණු ඇත්නම් ඒවා ද පදනම් කොටගෙන වාර්තාවක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරනු ලැබේ.

i. 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන) විධානය සහ එහි සංශෝධන

ii. 2017 අංක 02 දරන මුදල් සමාගම් (අවම මූලික ප්‍රාග්ධනය) විධානය සහ එහි සංශෝධන

iii. 2018 අංක 03 දරන මුදල් ව්‍යාපාර පනත (ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා) විධානය සහ එහි සංශෝධන

iv. 2013 අංක 04 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය සහ එහි සංශෝධන

v. අයදුම්කරුගේ කාර්යය සාධනය සඳහා ඍජුවම සම්බන්ධ වන වෙනත් ඕනෑම අධීක්ෂණයේ දී හඳුනා ගත් ගැටලු

vi. නවතම ව්‍යවස්ථාපිත පරීක්ෂණයේ නියාමන සහ අධීක්ෂණ සොයාගැනීම්

vii. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා විසින් පනවන ලද කාලරාමුව තුළ නිවැරදි

කිරීමේ සැලසුම් ද ඇතුළත්ව ඒවාට සීමා නොවී, අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අනුකූලතාවය සහ/හෝ අනුකූල මට්ටම මෙන්ම අදාළ අධ්‍යක්ෂවරයා සිය තනතුරෙහි කටයුතු කළ කාලසීමාවේ දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම් සහ/ හෝ නොහැකි වීමේ මට්ටම පිළිබඳ වාර්තා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා මඟින් කැඳවීමට මුදල් මණ්ඩලයට හැකියාව ඇත. මෙම වාර්තා කැඳවීමේ අරමුණු වනුයේ අදාළ අධ්‍යක්ෂවරයාගේ වරදිකාරීභාවය (වරදේ තරම) තක්සේරු කිරීමට හෝ සුදුසු පියවර ප්‍රමාණාත්මකව ක්‍රියාත්මක කර ඇත්තේ ද යන්න සොයා බැලීමට ය.

3. අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය

3.1. සේවා දිගුවක් අවශ්‍ය වන දිනට අවම වශයෙන් මාස 3 කට පෙර බලපත්‍රලාභී මුදල් සමාගමෙහි සමාගම් ලේකම් විසින් ඉහත 2.3 සහ 2.4 හි දක්වා ඇති සියලුම ලියවිලි සහ සහතික කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

3.2. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ලද ලේඛන සහ සහතික කිරීම් පිළිගත හැකි බවට සෑහීමකට පත් වූ පසු, අධ්‍යක්ෂවරයා අවශ්‍ය නම් ලබා දී ඇති නිරූපණයන් සහ සහතික කිරීම් වලංගු කරනු ඇති අතර, සේවා දිගුවක් ඉල්ලා සිටින අධ්‍යක්ෂවරයා විසින් ලබා දී ඇති දායකත්වය පිළිබඳ ඉහත සඳහන් නිර්ණායක මත පදනම්ව තක්සේරුවක් සිදු කරනු ලැබේ.

3.3. තක්සේරු කිරීම අවසන් වූ පසු සහ සේවා දිගුවක් සඳහා අයදුම්පත ලැබී දින 30 ක් ඇතුළත, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් සේවා දිගුව ලබාදීම පිළිබඳ ඔහුගේ නිර්දේශය සමඟ ඉහත 2.5 හි සඳහන් කරුණු ද ඇතුළුව වාර්තාවක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

3.4. ඉන් පසුව මුදල් මණ්ඩලය විසින් සේවා දිගුව ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හෝ සේවා දිගුව අනුමත කිරීම සිදුවේ. එම තීරණයට එළඹීමේ දී, සේවා දිගුව ප්‍රදානය කිරීම බලපත්‍රලාභී මුදල් සමාගමේ යහපත උදෙසා සහ සේවා දිගුව ප්‍රතික්ෂේප කිරීම බලපත්‍රලාභී මුදල් සමාගමේ අබණ්ඩතාවයට සහ ස්ථායීතාවයට අහිතකර වේ ද යන්න පිළිබඳව මුදල් මණ්ඩලය විසින් මූලික වශයෙන් සළකා බලනු ලැබේ.

3.5. එහි තීරණය අතරතුර, මුදල් මණ්ඩලය විසින් ඕනෑම කොන්දේසියකට යටත්ව එය නිකුත් කළ හැකි අතර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වහාම මුදල් මණ්ඩලයෙහි තීරණය බලපත්‍රලාභී මුදල් සමාගම වෙත සන්නිවේදනය කළ යුතු අතර මුදල් මණ්ඩලය විසින් පනවන ඕනෑම කොන්දේසියක් තදින් පිළිපැදීමේ වැදගත්කම අවධාරණය කළ යුතුය. එවැනි කොදේසි නිසි ලෙස පිළිපැදීමට අපොහොසත් වීම, මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද සේවා දිගුව ආපසු හැරවීමට හේතු විය හැකි බවද දැනුම් දිය යුතුය.

4. අන්තර්කාලීන විධිවිධාන

4.1. මෙම විධානය බලාත්මක වන දිනය වන විට අධ්‍යක්ෂ ධූරයෙහි සිටින අධ්‍යක්ෂවරයෙකු මෙහි දැක්වෙන පරිදි සේවා දිගුවක් ලබා ගැනීමට අපේක්ෂා කරන මුත් 2008 අංක දරන 03 විධානයෙහි 5(1) විධානය අනුව 2020 සැප්තැම්බර් 15 හෝ ඊට පෙර සේවා කාලය අවසන් වීම නිසා ඉහත 3.1 හි දක්වා ඇති කාලවකවානු වලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්, එවැනි අධ්‍යක්ෂවරයෙකුට හා අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමට මෙහි දැක්වෙන දින සිට දින 45 ක් ඇතුළත අවශ්‍යතා සම්පූර්ණ කළ හැක.

4.2. ඉහත 4.1 හි සඳහන් බලපත්‍රලාභී මුදල් සමාගමෙ හි එවැනි අධ්‍යක්ෂවරයෙකුට, ඔහුගේ අයදුම්පත සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයෙහි විධිමත් තීරණය දැනුම් දෙන තෙක් අධ්‍යක්ෂවරයෙකු ලෙස දිගටම කටයුතු කළ හැකි අතර, මෙම විධානය යටතේ නිසි පරිදි සේවා දිගුව ප්‍රදානය කර ඇත්නම්, තවදුරටත් අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ හැක.

4.3. කෙසේ වෙතත්, මුදල් මණ්ඩලය විසින් ඉල්ලීම ප්‍රතික්ෂේප කළහොත් අධ්‍යක්ෂවරයා වහාම බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමෙන් ඉවත් විය යුතු අතර, අදාළ අධ්‍යක්ෂවරයා නිසි ලෙස ඉවත් වූ බවට බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් මණ්ඩලය වෙත සාමූහිකව වගකිව යුතු අතර, අප්‍රමාදීව වෙනත් ආදේශක අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට ද කටයුතු කළ යුතුය.

5. වාර්ෂික ඇගයීම

5.1. වයස අවුරුදු 70 න් ඔබ්බට මුදල් මණ්ඩලය විසින් කරනු ලබන සියලුම අනුමත කිරීම්, උපරිම වයස අවුරුදු 75 දක්වා සීමාවකට යටත්ව, වාර්ෂිකව නැවත ඇගයීමකට යටත් වේ. කිසිදු අවස්ථාවක, අධ්‍යක්ෂවරයෙකුට එවැනි දීර්ඝ කිරීමේ පදනමක් මත, වයස අවුරුදු 75 ඉක්මවා අධ්‍යක්ෂ ධුරයෙහි කටයුතු කිරීමට අවසර දෙනු නොලැබේ.

5.2. වාර්ෂික දීර්ඝ කිරීම් සඳහා ඉල්ලුම් කරන පුද්ගලයන්, අවම වශයෙන් අනුමත කාලසීමාව අවසන් වීමට දින 45 කට පෙර ඉහත 2.3 සහ 2.4 හි සඳහන් කර ඇති සියලු අවශ්‍ය ලියවිලි සමඟ අයදුම් කළ යුතුය. කෙසේ වෙතත්, දීර්ඝ කිරීම සඳහා වන අයදුම්පත් ඉතා ඉක්මණින් සකසා ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් දිරිමත් කරනු ලැබේ. කෙසේ වෙතත්, අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු සිදු වී ඇති නුසුදුසුකම් පිළිබඳ හෝ මුදල් මණ්ඩලයේ මතය අනුව වසර 70 ඉක්මවා ක්‍රියා කිරීමට එවැනි අධ්‍යක්ෂවරයෙකු නුසුදුසු බවත් පත් කරන වෙනත් කරුණු කාරණා පිළිබඳව සලකා බැලීමට මුදල් මණ්ඩලයට මෙය බාධාවක් නොවේ.

6. කොන්දේසි

මුදල් මණ්ඩලය සිදු කරනු ලබන සියලුම අනුමත කිරීම් පහත සඳහන් කොන්දේසි වලට යටත් වන නමුත් ඒවාට සීමා නොවේ.

6.1. සේවා දිගුව අවශ්‍ය වන පළමු අවස්ථාව අදාළ වන දිනට අදාළ අධ්‍යක්ෂවරයා අවම වශයෙන් අඛණ්ඩව වසර 3 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

6.2. ඕනෑම අවස්ථාවක දී බලපත්‍රලාභී මුදල් සමාගමක වයස අවුරුදු 70 ට වැඩි අධ්‍යක්ෂවරුන්ගේ අනුපාතය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ උපරිමයකට සීමා විය යුතුය. කෙසේ වෙතත්, යම් අවස්ථාවක දී අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 7 ක් හෝ ඊට අඩු නම්, උපරිම වශයෙන් වයස අවුරුදු 70 ඉක්මවූ එක් අධ්‍යක්ෂවරයෙකුට සේවය කිරීමට අවසර දෙනු ලැබේ.

6.3. සේවා දිගුවක් අපේක්ෂා කරන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන්, 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන) විධානයේ 4(2) වගන්තිය තවදුරටත් අදාළ වේ.

6.4. ඉහත 5 වන වගන්තියේ සඳහන් පරිදි, සියලුම අනුමත කිරීම් වාර්ෂික නැවත ඇගයීමකට යටත් වන අතර එහි අවසාන තීරණය මුදල් මණ්ඩලය විසින් ගනු ලැබේ.

6.5. ඕනෑම අවස්ථාවක දී වයස අවුරුදු 70 ඉක්මවූ පුද්ගලයෙකු අඛණ්ඩව අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා යෝග්‍ය නොවන බවට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා සෑහීමකට පත් වන්නේ නම්, එවැනි පුද්ගලයෙකු අවුරුදු 70 ඉක්මවා සේවා දිගුව ක්‍රියාත්මක කාලසීමාවේ දී බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමට නුසුදුසු ද යන්න පිළිබඳව අවසාන වශයෙන් තීරණය කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත සහය වීමට හේතු දැක්වීමට අවශ්‍ය ලියවිලි ද සමඟ වාර්තාවක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6.6. ඕනෑම අධ්‍යක්ෂවරයෙකු බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අදාළ ධූරය දැරීමට යෝග්‍ය නොවන බවට පැන නැගුණු සාධාරණ සැකයක් හෝ සොයා ගැනීමක් පිළිබඳව එසේ දැනුවත් වූ දිනයේ සිට දින දාහතරක් ඇතුළත බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින්ම වහාම දැනුම් දිය යුතුය.

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 04 දරන විධානය 2020 ජූනි 26

ආයතනික යහපාලන විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ශ්‍රී ලංකාවේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලද 2009 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ආයතනික යහපාලන) විධානයට පහත සඳහන් සංශෝධනයන් නිකුත් කරනු ලබයි.

විශේෂයෙන් වර්තමානයේ පවතින අභියෝගාත්මක පරිසරය තුළ මනා සේවා වාර්තා සහිත පළපුරුදු පුද්ගලයන්, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයන්ට ආකර්ෂණය කර ගැනීමට පවත්නා වූ සීමිත හැකියාව සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලයන්හි යම් මට්ටමක අඛණ්ඩතාවයක් පවත්වා ගැනීම විචක්ෂණශීලී බවත්, එවැනි අඛණ්ඩ පැවැත්මක්, අරමුණුගත දෘෂ්ටිකෝණයකින්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල යහපත උදෙසාම විය යුතු බවත් මුදල් මණ්ඩලය විසින් සලකනු ලැබේ.

1. අදාළත්වය සහ විෂය පථය	2009 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ආයතනික යහපාලන) විධානයේ 5 (i) විධානයේ ප්‍රතිපාදනවලට යටත්ව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය සහිතව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක දැනටමත් අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරන සහ මෙම විධානය ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසු දිනක දී වයස අවුරුදු 70 ලබන අධ්‍යක්ෂවරයෙකුට අධ්‍යක්ෂ ධූරයේ නොකඩවා කටයුතු කිරීමට, මෙම විධානයේ සහ ඊට සම්බන්ධ මාර්ගෝපදේශයන්හි සඳහන් අවශ්‍යතා හා කොන්දේසි දැඩිව පිළිපැදීමට යටත්ව, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමකට අවසර ලබා දිය හැක.
2. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම	මේවායින් ඕනෑම සේවා දිගුවක්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ සහ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත් වේ.
3. නියමයන් හා කොන්දේසි	අනුගමනය කළ යුතු නියමයන් සහ කොන්දේසි සහ ක්‍රියාපටිපාටිය මෙම විධානය සමඟ අමුණා ඇති මාර්ගෝපදේශයන්හි දක්වා ඇත.
4. බලපැවැත්වෙන දිනය සහ වලංගු කාලය	මෙම විධානය නිකුත් කළ මොහොතේ සිට වසර තුනක කාලසීමාවක් දක්වා බලාත්මක වන අතර වසර තුනක කාලසීමාව අවසන් වූ පසු යළි ක්‍රියාවට නැංවීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ අභිමතයට යටත් වේ.

ජේ පී ගමලත්
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන
අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වයස අවුරුදු 70 ඉක්ම වූ සහ උපරිම වයස අවුරුදු 75 දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය

1. **අදාළත්වය**

1.1. විධානය නිකුත් කළ දිනය වන විට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන සහ අනාගතයේදී වයස අවුරුදු 70 ඉක්මවා සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට අදාළ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම තීරණය කරන අවස්ථාවේ දී එවැනි අධ්‍යක්ෂවරුන් සඳහා පමණක් මෙම මාර්ගෝපදේශයේ විධිවිධාන අදාළ වේ.

2. තක්සේරු නිර්ණායක

2.1. අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය අරමුණු ගතව තක්සේරු කිරීම සඳහා සකස් කර ඇති නිර්ණායක මෙන්ම එම අධ්‍යක්ෂවරුන් මූල්‍ය ආයතනයට ලබාදුන් දායකත්වය සහ එම මූල්‍ය ආයතනයේ නියාමන අනුකූලතා මට්ටම මත පදනම්ව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් වයස අවුරුදු 70 ළඟා වූ අධ්‍යක්ෂවරුන් තක්සේරු කරනු ලබයි.

2.2. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින් වයස අවුරුදු 70 ඉක්මවා අධ්‍යක්ෂවරයෙකුගේ සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, සේවා දිගුව අනුමත කිරීමේ යෝග්‍යතාවය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ලියවිලි යොමු කළ යුතුය. මෙම යෝග්‍යතාව තක්සේරු කිරීම මුදල් මණ්ඩලයේ එකඟතාව මත බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් (වෙන් වෙන් වශයෙන් /තනි තනිව සලකා බැලීමේ පදනමින්) සිදු කරනු ලැබේ. කෙසේ නමුත්, කිසිඳු අවස්ථාවක අධ්‍යක්ෂවරයෙකු ට වයස අවුරුදු 75 ඉක්මවා කටයුතු කිරීමට අවසර හිමි නොවේ.

2.3. යෝග්‍යතාවය සහ හිමිකම

වයස අවුරුදු 70 ඉක්මවා සේවයේ රඳවා ගැනීමට යෝජනා කර ඇති අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂවරයෙකුගේ රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමට යෝග්‍ය පුද්ගලයෙකු බවට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට තහවුරු කිරීමේ වගකීම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම වෙත පැවරේ:

i 2012 අංක 03 දරන කල්බදු මූල්‍යකරණ (අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයෙහි ඇමුණුම I හි සහ II හි දක්වා ඇති පරිදි සහ වරින් වර සිදුවන එම විධානයේ සංශෝධනයන්ට අනුව දිවුරුම් ප්‍රකාශය සහ ප්‍රකාශය. අදාළ අවස්ථාවේ කටයුතු කරන සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින් (තක්සේරු කිරීමට ලක් වන අධ්‍යක්ෂවරයා හැර) මෙම දිවුරුම් ප්‍රකාශය සහ ප්‍රකාශය සහතික කළ යුතුය.

ii විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි එම අවස්ථාවේ අධ්‍යක්ෂක ධූරයේ සිටින සේවා දිගුවක් අපේක්ෂා කරන අධ්‍යක්ෂවරයා හැර සියලුම අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කර ගත යුතුය. එම අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙහි එවැනි සේවා දිගුවක් අපේක්ෂා කරන අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ ධූරයේ අඛණ්ඩව කටයුතු කරගෙන යාම මඟින් ආයතනයට ලැබෙන ප්‍රතිලාභ නිසා සේවා දිගුව ලබා දීම යෝග්‍ය බව සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට සේවා දිගුවක් ලබාදීම පිළිබඳව සළකා බැලීමට නිර්දේශ කිරීම් ඇතුළත් විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අදාළ සේවා දිගුව බලාත්මක වන දින සිට මාස හයකට පෙර සම්මත වූවක් නොවිය යුතුය.

iii මේ සම්බන්ධයෙන් දැනුවත්ව තීරණයක් ගැනීමට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ඉඩ සැලසීම සඳහා එවැනි යෝජනාවක දක්වා ඇති හේතු විස්තරාත්මකව හා ප්‍රමාණවත්ව තිබිය යුතු අතර හැකිතාක් ලියවිලි මඟින් සනාථ කර තිබිය යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට සේවා දිගුවක් සඳහා වන ඉල්ලීම සලකා බැලීම සඳහා තවදුරටත් ලියවිලි අවශ්‍ය වුවහොත්, අදාළ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අදාළ ලියවිලි නිසි පරිදි ඉදිරිපත් කළ යුතුය.

iv අදාළ විධානයන්හි නිශ්චිතව දක්වා ඇති පරිදි විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතියට සම්බන්ධ අනෙකුත් සියලුම අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට සහ අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය පවතින බවට ප්‍රධාන අනුකූලතා නිලධාරී, සමාගම් ලේකම් හා ප්‍රධාන විධායක නිලධාරී විසින් ඒකාබද්ධව අත්සන් කරන ලද ලිඛිත සහතිකයක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

v 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 වන වගන්තියට අනුව, වයස අවුරුදු 70 ඉක්මවා අධ්‍යක්ෂවරයා /අධ්‍යක්ෂවරුන්ගේ සේවය දීර්ඝ කිරීම පිළිබඳව, මහා සභා රැස්වීමක දී යෝජනාවක් සම්මත කර ගැනීමෙන් නිසි පරිදි අනුමත කර ගත් බවට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ සමාගම් ලේකම් විසින් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හිමිකාරීත්වය හෝ හිමිකම් කොටස් සලකා බැලීමෙන් තොරව සහ ඉවත් කොට එවැනි යෝජනාවක් සම්මත කර ගත යුතුය. අදාළ අධ්‍යක්ෂවරයාගේ සමීපතම ඥාතීන් සහ හිමිකාරීත්ව කොටස් දරන පොදු අධ්‍යක්ෂවරුන් යෝජනාව සම්මත කර ගැනීම සඳහා ඡන්දය ලබාදීමෙන් ඉවත් කළ යුතුය. සමීප ඥාතීන් යන්න 2009 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ආයතනික යහපාලන) විධානයේ නිර්වචනය කර ඇත.

vi උපරිම වයස අවුරුදු 75 දක්වා දීර්ඝ කිරීමක් අපේක්ෂා කරන සෑම වසරකදීම, ඉහත දැක්වූ පරිදි නව යෝජනාවක් නිසි පරිදි සම්මත කළ යුතුය.

vii වයස අවුරුදු 70 ඉක්මවා ඇති අධ්‍යක්ෂවරයෙකුගේ සේවය අඛණ්ඩව පවත්වා ගෙනයාම අදාළ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මඟින් තහනම් කර නොමැති බවට ලිඛිත සහතිකයක් සමාගම් ලේකම් විසින් ලබා දිය යුතුය.

2.4. අතීත වාර්තා / මූල්‍ය ආයතනය සඳහා දැක්වූ දායකත්වය:

අදාළ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහුගේ /ඇයගේ ධූර කාලය තුළ/කාර්යසාධනය නියමිත පරිදි තක්සේරු කිරීමට පහසුකම් සැලසීම සඳහා, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් පහත සඳහන් ලියකියවිලි භාරදිය යුතුය :

i 2009 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ආයතනික යහපාලන) විධානයේ 2(8) වන වගන්තිය හා එහි සංශෝධන වලට අනුකූලව, වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂවරුන්ගේ පළමු වසර සඳහා යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා පෙර වසර පහ තුළ අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරන ලද වාර්ෂික ස්වයං තක්සේරුවල සහතික කළ පිටපත්, සහ ඉන්පසුව වාර්ෂික ස්වයං තක්සේරු ආකෘති පත්‍රය.

ii අයදුම්කරුවෙකු සිය සේවා කාලය තුළ මූල්‍ය කාර්යසාධනය වැඩි දියුණු කිරීම, විශේෂ ඇගයීම් පිළිබඳ විස්තර, ඔහුගේ / ඇයගේ නායකත්වය යටතේ පවත්වාගෙන යන ලද විශේෂ ව්‍යාපෘති, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ වටිනාකම වැඩි දියුණු කිරීම සඳහා ඔහුගේ/ඇයගේ අනාගත සැලසුම් යනාදිය ඇතුළත් අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ස්වයං ප්‍රකාශයක්.

2.5. වර්තමාන නියාමන අනුකූලතාවය :

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුගේ සේවා අඛණ්ඩතාවය තක්සේරු කිරීමේ දී, අදාළ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි නියාමන අනුකූලතා මට්ටම පහත දැක්වෙන පරිදි ඇගයීමට ලක් කරනු ලැබේ. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත පහත දැක්වෙන විධානයන් සමඟ වෙනත් ඕනෑම විධානයක් හෝ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් අදාළ බවට සලකන ඕනෑම නියමයක් හෝ කොන්දේසියක් සමඟ ඇති අනුකූලතා මට්ටම පිළිබඳව, විතැන් පරීක්ෂණ සිදු කරන නිලධාරියා සහ අවසාන ව්‍යවස්ථාපිත පරීක්ෂණයේ ප්‍රධාන නිලධාරියා විසින් ලබා දෙන තක්සේරු වාර්තා සහ ඒ සමඟ සලකා බැලිය යුතු අදාළ වෙනත් කරුණු ඇත්නම් ඒවා ද පදනම් කොටගෙන වාර්තාවක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරනු ලැබේ.

i 2009 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ආයතනික යහපාලන) විධානය සහ එහි සංශෝධන

ii 2012 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ (අවම මූලික ප්‍රාග්ධනය) විධානය සහ එහි සංශෝධන

iii 2018 අංක 03 දරන කල්බදු මූල්‍යකරණ (ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා) විධානය සහ එහි සංශෝධන

iv 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශීල වත්කම්) විධානය සහ එහි සංශෝධන

v අයදුම්කරුගේ කාර්යය සාධනය සඳහා සෘජුවම සම්බන්ධ වන වෙනත් ඕනෑම අධීක්ෂණයේ දී හඳුනා ගත් ගැටලු

vi නවතම ව්‍යවස්ථාපිත පරීක්ෂණයේ නියාමන සහ අධීක්ෂණ සොයාගැනීම්

vii බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා විසින් පනවන ලද කාලරාමුව තුළ නිවැරදි කිරීමේ සැලසුම් ද ඇතුළත්ව ඒවාට සීමා නොවී, අදාළ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි අනුකූලතාවය සහ/හෝ අනුකූල මට්ටම මෙන්ම අදාළ අධ්‍යක්ෂවරයා සිය තනතුරෙහි කටයුතු කළ කාලසීමාවේ දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම් සහ/ හෝ නොහැකි වීමේ මට්ටම පිළිබඳ වාර්තා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයාට කැඳවීමට හැකියාව ඇත. මෙම වාර්තා කැඳවීමේ අරමුණු වනුයේ අදාළ අධ්‍යක්ෂවරයාගේ වරදිකාරිභාවය (වරදේ තරම) තක්සේරු කිරීමට හෝ සුදුසු පියවර ප්‍රමාණාත්මකව ක්‍රියාත්මක කර ඇත්තේ ද යන්න සොයා බැලීමටය.

3. අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය

3.1. සේවා දිගුවක් අවශ්‍ය වන දිනට අවම වශයෙන් මාස 3 කට පෙර විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි සමාගම් ලේකම් විසින් ඉහත 2.3 සහ 2.4 හි දක්වා ඇති සියලුම ලියවිලි සහ සහතික කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

3.2. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ලද ලේඛන සහ සහතික කිරීම් පිළිගත හැකි බවට සෑහීමකට පත් වූ පසු, අධ්‍යක්ෂවරයා අවශ්‍ය නම් ලබා දී ඇති නිරූපණයන් සහ සහතික කිරීම් වලංගු කරනු ඇති අතර, සේවා දිගුවක් ඉල්ලා සිටින අධ්‍යක්ෂවරයා විසින් ලබා දී ඇති දායකත්වය පිළිබඳ ඉහත සඳහන් නිර්ණායක මත පදනම්ව තක්සේරුවක් සිදු කරනු ලැබේ.

3.3. තක්සේරු කිරීම අවසන් වූ පසු සහ සේවා දිගුවක් සඳහා අයදුම්පත ලැබී දින 30 ක් ඇතුළත, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් සේවා දිගුව ලබාදීම පිළිබඳ ඔහුගේ නිර්දේශය සමඟ ඉහත 2.5 හි සඳහන් කරුණු ද ඇතුළුව වාර්තාවක් මුදල් මණ්ඩලයේ එකඟතාවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. ඉන්පසු මුදල් මණ්ඩලය විසින් ඉල්ලීමට අනුව සේවා දිගුවක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ සේවා දිගුවක් සඳහා අවසර දීම සිදු කරනු ලබයි.

3.4. එහි තීරණය අතරතුර, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ඕනෑම කොන්දේසියකට යටත්ව එය නිකුත් කළ හැකි අතර වහාම තීරණය විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම වෙත සන්නිවේදනය කළ යුතු අතර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පනවන ඕනෑම කොන්දේසියක් තදින් පිළිපැදීමේ වැදගත්කම අවධාරණය කළ යුතුය. එවැනි කොන්දේසි නිසි ලෙස පිළිපැදීමට අපොහොසත් වීම, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ප්‍රදානය කරන ලද සේවා දිගුව ආපසු හැරවීමට හේතු විය හැකි බව ද දැනුම් දිය යුතුය.

4. අන්තර්කාලීන විධිවිධාන

4.1. මෙම විධානය බලාත්මක වන දිනය වනවිට අධ්‍යක්ෂ ධූරයෙහි සිටින අධ්‍යක්ෂවරයෙකු මෙහි දැක්වෙන පරිදි සේවා දිගුවක් ලබා ගැනීමට අපේක්ෂා කරන මුත් 2009 අංක 04 දරන විධානයෙහි 5(1) විධානය අනුව 2020 සැප්තැම්බර් 15 හෝ ඊට පෙර සේවා කාලය අවසන් වීම නිසා ඉහත 3.1 හි දක්වා ඇති කාලවකවානු වලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්,

එවැනි අධ්‍යක්ෂවරයෙකුට හා අදාළ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමට මෙහි දැක්වෙන දින සිට දින 45 ක් ඇතුළත අවශ්‍යතා සම්පූර්ණ කළ හැක.

4.2. ඉහත 4.1 හි සඳහන් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි එවැනි අධ්‍යක්ෂවරයෙකුට, ඔහුගේ අයදුම්පත සම්බන්ධයෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් විධිමත් තීරණය දැනුම් දෙන තෙක් අධ්‍යක්ෂවරයෙකු ලෙස දිගටම කටයුතු කළ හැකි අතර, මෙම විධානය යටතේ නිසි පරිදි සේවා දිගුව ප්‍රදානය කර ඇත්නම්, තවදුරටත් අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ හැක.

4.3. කෙසේ වෙතත්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීම ප්‍රතික්ෂේප කළහොත් අධ්‍යක්ෂවරයා වහාම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමෙන් ඉවත් විය යුතු අතර, අදාළ අධ්‍යක්ෂවරයා නිසි ලෙස ඉවත් වූ බවට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත සාමූහිකව වගකිව යුතු අතර, අප්‍රමාදීව වෙනත් ආදේශක අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට ද කටයුතු කළ යුතුය.

5. වාර්ෂික ඇගයීම

5.1. වයස අවුරුදු 70 න් ඔබ්බට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන සියලුම අනුමත කිරීම්, උපරිම වයස අවුරුදු 75 දක්වා සීමාවකට යටත්ව, වාර්ෂිකව නැවත ඇගයීමකට යටත් වේ. කිසිඳු අවස්ථාවක, අධ්‍යක්ෂවරයෙකුට එවැනි දීර්ඝ කිරීමේ පදනමක් මත, වයස අවුරුදු 75 ඉක්මවා අධ්‍යක්ෂ ධුරයෙහි කටයුතු කිරීමට අවසර දෙනු නොලැබේ.

5.2. වාර්ෂික දීර්ඝ කිරීම් සඳහා ඉල්ලුම් කරන පුද්ගලයන්, අවම වශයෙන් අනුමත කාලසීමාව අවසන් වීමට දින 45 කට පෙර ඉහත 2.3 සහ 2.4 හි සඳහන් කර ඇති සියලු අවශ්‍ය ලියවිලි සමඟ අයදුම් කළ යුතුය. කෙසේ වෙතත්, දීර්ඝ කිරීම සඳහා වන අයදුම්පත් ඉතා ඉක්මණින් සකසා ඉදිරිපත් කිරීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් දිරිමත් කරනු ලැබේ. කෙසේ වෙතත්, අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු සිදු වී ඇති නුසුදුසුකම් පිළිබඳ හෝ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ මතය අනුව වයස වසර 70 ක් ඉක්මවා ක්‍රියා කිරීමට එවැනි අධ්‍යක්ෂවරයෙකු නුසුදුසු බවත් පත් කරන වෙනත් කරුණු කාරණා පිළිබඳව සලකා බැලීමට මෙය බාධාවක් නොවේ.

6. කොන්දේසි

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සිදු කරනු ලබන සියලුම අනුමත කිරීම් පහත සඳහන් කොන්දේසි වලට යටත් වන නමුත් ඒවාට සීමා නොවේ.

6.1. සේවා දිගුව අවශ්‍ය වන පළමු අවස්ථාව අදාළ වන දිනට අදාළ අධ්‍යක්ෂවරයා අවම වශයෙන් අඛණ්ඩව වසර 3 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

6.2. ඕනෑම අවස්ථාවක දී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක වයස අවුරුදු 70 ට වැඩි අධ්‍යක්ෂවරුන්ගේ අනුපාතය අධ්‍යක්ෂවරයෙකුට සීමා විය යුතුය.

6.3. සේවා දිගුවක් අපේක්ෂා කරන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන්, 2009 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ආයතනික යහපාලන) විධානයේ 4(2) වගන්තිය තවදුරටත් අදාළ වේ.

6.4. ඉහත 5 වන වගන්තියේ සඳහන් පරිදි, සියලුම අනුමත කිරීම් වාර්ෂික නැවත ඇගයීමකට යටත් වන අතර එහි අවසාන තීරණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබේ.

6.5. ඕනෑම අවස්ථාවකදී වයස අවුරුදු 70 ඉක්මවූ පුද්ගලයෙකු අඛණ්ඩව අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා යෝග්‍ය නොවන බවට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා සෑහීමකට පත් වන්නේ නම්, එවැනි පුද්ගලයෙකු අවුරුදු 70 ඉක්මවා සේවා දිගුව ක්‍රියාත්මක කාලසීමාවේ දී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීමට නුසුදුසු ද යන්න පිළිබඳව අවසාන වශයෙන් තීරණය කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත සහය වීමට හේතු දැක්වීමට අවශ්‍ය ලියවිලි ද සමඟ වාර්තාවක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6.6. ඕනෑම අධ්‍යක්ෂවරයෙකු විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමෙහි අදාළ ධුරය දැරීමට යෝග්‍ය නොවන බවට පැන නැගුණු සාධාරණ සැකයක් හෝ සොයා ගැනීමක් පිළිබඳව එසේ දැනුවත් වූ දිනයේ සිට දින දාහතරක් ඇතුළත බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින්ම වහාම දැනුම් දිය යුතුය.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 06 දරන විධානය 2020 ජූලි 16

ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව බලපත්‍රලාභී මුදල් සමාගම් වල ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු සඳහා මුදල් මණ්ඩලය විසින් පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1. විධානයේ අදාළත්වය

1.1 කිසිදු බලපත්‍රලාභී මුදල් සමාගමකට පූර්ණ ශාඛාවක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක්/මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයක්/ මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍රයක් හැර වෙනත් ව්‍යාපාරික ස්ථාන ආරම්භ කිරීමට අවසර නොමැත. බලපත්‍රලාභී මුදල් සමාගම් වලට ජංගම බැංකු ඒකක ක්‍රියාත්මක කළ හැකි අතර එම ජංගම බැංකු ඒකක එම සමාගමේ ශාඛාවකට අනුබද්ධ විය යුතුය. ව්‍යාපාරික ස්ථාන ආරම්භ කිරීම, වසා දැමීම සහ වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම සහ ජංගම බැංකු ඒකක පවත්වාගෙන යාම සඳහා උපලේඛන (අ) හි දක්වා ඇති මාර්ගෝපදේශ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අනුගමනය කළ යුතුය.

1.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම හෝ දැනට පවත්නා ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීම හෝ යම් ව්‍යාපාරයක ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීම සහ ජංගම බැංකු ඒකක ස්ථාපිත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින 10 කට පෙර අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

1.3 මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම, වසා දැමීම හෝ ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීම සිදු නොකළ යුතුය.

2. නව ශාඛා විවෘත කිරීම සඳහා අවශ්‍ය අවම නිර්ණායකයන්

2.1 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නව ශාඛාවක් විවෘත කිරීමේ දී අවම වශයෙන් පහත සඳහන් කර ඇති අවශ්‍යතාවන්ට අනුකූල විම සහතික කළ යුතුය.

i. 2018 අංක 03 දරන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවයෙහි හෝ එහි සංශෝධනයන්හි දක්වා ඇති පරිදි අවම ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයට අනුකූල වීම.

ii. 2017 අංක 02 දරන අවම මූලික ප්‍රාග්ධනය විධානයෙහි හෝ එහි සංශෝධනයන්හි දක්වා ඇති පරිදි අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූල විම.

iii. 2013 අංක 04 දරන මුදල් සමාගම් හි ද්‍රවශීලතා වත්කම් විධානයෙහි හෝ එහි සංශෝධනයන්හි දක්වා ඇති පරිදි අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවයට අනුකූල වීම.

iv. අක්‍රීය ණය අනුපාතය කලමනාකරණය කළ හැකි මට්ටමකින් පවත්වා ගෙන යාම.

v. තැන්පතු හෝ ණය දීම සඳහා උපරිම අවම සීමාවන් පනවා නැති වීම.

3. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතීන්

3.1 නව ශාඛා වල ව්‍යාපාර කටයුතු සඳහා ඇති විභවතාවය, ශාඛාවන්ට ප්‍රමාණවත් සම්පත් සැපයීමේ හැකියාව (භෞතික වත්කම්, මානව සම්පත් ආදිය), අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාව, ශාඛා මෙහෙයුම් සහ සේවාදායකයන්ට කඩිනම් සහ ලාභදායී පාරිභෝගික සේවාවක් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රධාන නිලධාරීන්ට ඇති වගකීම නියම කිරීම යනාදිය සලකා බලා සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින්ම ව්‍යාපාර පුළුල් කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විවක්ෂණශීලී ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය.

3.2 නව ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර විවෘත කිරීම, ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීම හෝ ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට බලපත්‍රලාභී මුදල් සමාගම් කටයුතු කළ යුතුය.

4. වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්ම

4.1 සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉදිරි වසර සඳහා වූ වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්ම සෑම වසරකම දෙසැම්බර් මස 31 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

4.2 බලපත්‍රලාභී මුදල් සමාගම විසින් උපලේඛන (අ) හි දක්වා ඇති පරිදි ඉදිරි වසර තුළ විවෘත කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථාන, වසා දැමීමට හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථාන පිළිබඳ විස්තර වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්මේ සඳහන් කළ යුතුය.

4.3 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්මෙහි අන්තර්ගත නොවන කිසිදු ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම, වසා දැමීම හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීම නොකළ යුතුය.

4.4 අනුමත කරන ලද වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්ම වලංගු වන්නේ වසරක කාලයක් (ලිත් වර්ෂයක්) සඳහා පමණක් වන අතර ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම, වසා දැමීම හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීම සඳහා අනුමැතීන් එම වසර තුළ අදාළ කාර්යය සම්පූර්ණ කර නොමැති නම් අහෝසි වේ.

5. අවදානම් කලමනාකරණය

5.1 අධ්‍යක්ෂ මණ්ඩලය පහත කරුණු සඳහා වගකීමට බැඳේ.

i. ශාඛා මෙහෙයුම් අධීක්ෂණය සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම.

ii. තොරතුරු, සන්නිවේදන සහ තාක්ෂණ පද්ධති හා දත්ත අභ්‍යන්තර සහ බාහිර තර්ජන වලින් ආරක්ෂා කර ගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලනයන් පවත්වා ගැනීම.

iii. තම පාරිභෝගිකයන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීම සහතික කිරීම සඳහා ශාඛාවේ නිලධාරීන්ට මෙහෙයුම් අත්පොතක් ලබාදීම.

iv. ශාඛා මෙහෙයුම් කටයුතු වලදී ඇති විය හැකි අවදානම් වලක්වා ගැනීම හඳුනා ගැනීම සහ කලමනාකරණය කිරීම සඳහා ශාඛා සේවකයින් දැනුවත් කිරීම සහ හොඳින් පුහුණු කිරීම සහතික කිරීම.

v. ශාඛා සහ අනෙකුත් ව්‍යාපාරික ස්ථානවල සිදු කරන මෙහෙයුම් කටයුතු වලදී ඇතිවිය හැකි සැලකිය යුතු බාධා හෝ අතපසුවීම අවම කිරීම සඳහා අඛණ්ඩ ව්‍යාපාරික සැලැස්මක් පවත්වාගෙන යාම.

5.2 අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව යන දෙපාර්ශවයෙන් අදාළ වන පාර්ශවය විසින් සමස්ත හා තනි ශාඛා මට්ටමින් අවදානම් වාර්තා අවම වශයෙන් කාර්තුමය පදනමක් මත සමාලෝචනය කළ යුතුය.

6. පවත්වාගෙන යන වෙනත් සේවා ස්ථාන ප්‍රමිතිගත කිරීම

6.1 සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින්ම දැනට පවත්නා වෙනත් සේවා ස්ථාන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද වෙනත් සේවා ස්ථාන ප්‍රමිතිගත කිරීමේ සැලැස්ම 2020.09.30 දිනට පෙර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම සැලැස්ම 2022.12.31 දින හෝ ඊට පෙර ක්‍රියාත්මක කළ යුතුය.

6.2 කිසිදු බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් දැනට පවත්නා වෙනත් සේවා ස්ථාන වල තැන්පතු රැස්කිරීම සිදු නොකළ යුතුය.

6.3 දැනට පවත්වාගෙන යන වෙනත් සේවා ස්ථාන ප්‍රමිතිගත කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් තුළ ඒ පිළිබඳ බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

7. අධ්‍යක්ෂවරයා සතු බලතල

7.1 ඕනෑම ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම, වසාදැමීම හා පවත්නා ස්ථානය වෙනස් කිරීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම වෙත නිශ්චිත හේතු ලිඛිතව දන්වා විරෝධය පල කිරීමට අධ්‍යක්ෂවරයාට බලය පවතී.

7.2 තවද ඕනෑම අවස්ථාවක තවදුරටත් බලපත්‍රලාභී මුදල් සමාගමක ව්‍යාපාර තවදුරටත් පුළුල් කිරීම සීමා කිරීමට අධ්‍යක්ෂවරයාට බලය පවතී.

8. ව්‍යාපාරික ස්ථාන ව්‍යාපාරික කටයුතු සඳහා විවෘත නොකිරීම

8.1 ලංකා වාණිජ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද නිවාඩු දිනයක හැර, සඳුදා සිට සිකුරාදා දක්වා සතියේ කිසිදු දිනයක කිසිදු ව්‍යාපාරික ස්ථානයක් ව්‍යාපාරික කටයුතු සඳහා විවෘත නොකිරීම සිදු නොකළ යුතුය.

8.2 ඉහත 8.1 විධානයේ දක්වා ඇති නිවාඩු දින හැර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය සහිතව, අතිරේක දින දෙකක් නිවාඩු වශයෙන් ලබා ගැනීමට බලපත්‍රලාභී මුදල් සමාගම් වලට හැකියාව ඇත. එවැනි අනුමැතියක් ලබාදීමේ දී අධ්‍යක්ෂවරයාට අවශ්‍ය යැයි හැඟෙන කොන්දේසි පැනවීමට හැකියාව ඇත.

8.3 කෙසේ වෙතත්, ලංකා වාණිජ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද නිවාඩු දින සහ අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද අතිරේක නිවාඩු දින ද ඇතුළුව අඛණ්ඩව දින පහක් ව්‍යාපාර කටයුතු සඳහා කිසිදු ව්‍යාපාරික ස්ථානයක් වසා තැබීම බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නොකළ යුතුය.

8.4 එවැනි අවස්ථාවක දී ව්‍යාපාරික ස්ථාන වසා තැබීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් සිය ගනුදෙනුකරුවන්ට දැනුම් දිය යුතුය.

8.5 ගංවතුර, කෝලාහල හෝ වෙනත් අසාමාන්‍ය සිදුවීමක් වැනි අවස්ථාවක දී ශාඛාවක් හෝ ව්‍යාපාරික ස්ථානය වසා තැබීමට අවශ්‍ය වන විට බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අදාළ අභ්‍යන්තර අධිකාරියේ අනුමැතිය සහිතව එම ස්ථානය වසා තැබීමට තීරණය කළ හැකි අතර ප්‍රමාදයකින් තොරව ඒ පිළිබඳ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.

9. වාර්තාකරණ අවශ්‍යතා

9.1 සෑම කාර්තුවක්ම අවසාන වී ඉදිරි මාසයේ පහළොස් (15) වන දිනය වන විට මෙම විධානයේ අවශ්‍යතාවයන්ට සම්පූර්ණයෙන් අනුකූල වූ බව තහවුරු කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම් කාර්තුමය පදනමින් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

9.2 සෑම කාර්තුවක්ම අවසාන වී ඉදිරි මාසයේ පහළොස්වන දිනය (15) වන විට ජාලගත සම්ප්‍රේෂණ පද්ධතියේ ව්‍යාපාර ස්ථාන සඳහා ආකෘතීන් ඉදිරිපත් කළ යුතුය.

10. විධාන සඳහා අනුකූල නොවන අවස්ථාවේදී ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග

බලපත්‍රලාභී මුදල් සමාගමක් ඉහත සඳහන් විධානයන්ට අනුකූල නොවන අවස්ථාවල දී අධ්‍යක්ෂවරයා විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග අතරින් එකක් හෝ කිහිපයක් ගනු ලැබේ.

i. ශාඛා මෙහෙයුම් / පුළුල් කිරීම් සඳහා සීමාවන් පැනවීම
ii. මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි මූල්‍ය දඩ පැනවීම
iii. විධාන සඳහා අනුකූල නොවීම් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා පැනවීම
iv. වගකිව යුතු ප්‍රධාන කලමනාකරණ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් එම තනතුරු සඳහා යෝග්‍ය හා උචිත නොවන බව වහාම තීරණය කිරීම

11. අර්ථ නිරූපණයන්

මෙම විධානයන්හි,

i. ''ව්‍යාපාරික ස්ථානය'' යනු ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර වේ.
ii. ''අධ්‍යක්ෂවරයා'' යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.
iii. ''ප්‍රධාන කලමනාකරණ කාර්යය මණ්ඩලය, යන්නට 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය) විධානය හෝ එහි සංශෝධනයන්හි ලබා දී ඇති අර්ථ නිරූපණය අදාළ විය යුතුය.
iv. වෙනත් සේවා ස්ථාන යන්නෙන් සේවා මධ්‍යස්ථාන, උකස් මධ්‍යස්ථාන, රන් ණය මධ්‍යස්ථාන, එකතු කිරීමේ මධ්‍යස්ථාන, පාසල් ඉතිරි කිරීමේ මධ්‍යස්ථාන, සේවා කවුළු හෝ දැනට ක්‍රියාත්මක වෙනත් සේවා ස්ථාන හැඳින්වේ.

12. පෙර විධානයන් අවලංගු කිරීම

මුදල් ව්‍යාපාර පනතේ 2016 අංක 01 දරන විවෘත කිරීම, වසා දැමීම සහ නැවත ස්ථානගත කිරීම විධානය සහ 2005 අංක 04 දරන මුදල් සමාගම් (ව්‍යාපාර සඳහා කාර්යාලය / කාර්යාල වසා තැබීම) විධානය මෙයින් අහෝසි කෙරේ.

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

උපලේඛන (අ)

ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම, වසා දැමීම සහ පවත්නා ස්ථානය වෙනස් කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වූ මාර්ගෝපදේශය

1. නව ශාඛා/ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර විවෘත කිරීම

1.1. නව ශාඛා හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/ මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර/ මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර විවෘත කිරීම පිළිබඳ තොරතුරු එවැනි විවෘත කිරීමකට අවම වශයෙන් ව්‍යාපාරික දින දහයකට (10) පෙර බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. නව ශාඛාවන් පිළිබඳ තොරතුරු උපලේඛන (ඇ) හි දක්වා ඇති ආකෘතියට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.

1.2. බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ශාඛා විවෘත කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශය තුළ මූල්‍ය සේවාවන් සඳහා පවතින අවශ්‍යතාවය විශ්ලේෂණය කරමින් විවෘත කිරීමට බලාපොරොත්තු වන එක් එක් ශාඛාව සඳහා ආර්ථික ශක්‍යතා අධ්‍යයනයක් සකස් කළ යුතුය. එවන් අධ්‍යයනයක අවම වශයෙන් පහත සඳහන් කරුණු ආවරණය විය යුතුය.

(අ) මූල්‍ය ආයතනවල ඝනත්වය මත පදනම්ව යෝජිත ප්‍රදේශයට මූල්‍ය සේවා සඳහා පවතින අවශ්‍යතාවය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු ජනගහනය එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවතින මූල්‍ය ආයතනවල ශාඛා ගණනින් බෙදීමෙන්)

(ආ) සේවා සැපයිය යුතු භූගෝලීය හා ආර්ථික සේවා ක්ෂේත්‍ර සහ සේවා සැපයිය යුතු වෙළඳපොල පිළිබඳ දළ විශ්ලේෂණය

(ඇ) එම ප්‍රදේශ තුළ මූල්‍ය සේවාවන් සඳහා ඇති ඉල්ලුමෙහි අපේක්ෂිත වර්ධනය සහ ශාඛාවේ කටයුතු ලාභදායී වීමට ගතවන කාලය

(ඈ) එම ශාඛාවේ අපේක්ෂිත ව්‍යාපාර පරිමාව, ව්‍යාපාර වර්ධනය, සංස්ථාපන හා මෙහෙයුම් පිරිවැය සහ වසර තුනකට නොඅඩු ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක ප්‍රතිඵල පදනම් කරගෙන අයදුම් කරන ශාඛාව සඳහා මූල්‍ය උපකල්පනයන්

1.3. නව ශාඛා හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර විවෘත කිරීමට පෙර බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාළ රජයේ අධිකාරී ආයතනයන්ගෙන් සහ පොලිස් ස්ථානයෙන් ලබා ගන්නා අනුමැතීන් / සහතික ලබාගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය.

1.4. විවෘත කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර බලපත්‍රලාභී මුදල් සමාගමේ විශේෂිත ශාඛාවකට අනුබද්ධ විය යුතුය.

1.5. බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නව ශාඛාවක් හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයක් / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍රයක් විවෘත කළ දින සිට ව්‍යාපාරික දින දහයක් (10) තුළ එය විවෘත කළ දිනය අධ්‍යක්ෂවරයාට දැනුම් දීමට කටයුතු කළ යුතුය.

2. ව්‍යාපාරික ස්ථාන වසා දැමීම

2.1. බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවතින ව්‍යාපාරික ස්ථාන වසා දැමීමට අවම වශයෙන් ව්‍යාපාර දින 10 කට පෙර ඒ පිළිබඳව උපලේඛන (ඇ) හි දක්වා ඇති ආකෘතියට අනුකූලව අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.

2.2. ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට පෙර එම ව්‍යාපාරික ස්ථානයෙන් සාමාන්‍යයෙන් සේවය ලබාගන්නා ගනුදෙනුකරුවන්ට සහ මහජනතාවට එම ස්ථානය වසා දැමීම පිළිබඳ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් කටයුතු කළ යුතුය.

2.3. බලපත්‍රලාභී මුදල් සමාගමක් ව්‍යාපාරික ස්ථානය වසා දැමීමෙන් පසු එම ව්‍යාපාරය පැවති ස්ථානයේ තවදුරටත් මූල්‍ය ව්‍යාපාර කටයුතු සිදු නොවන බව සහතික කළ යුතුය.

2.4. බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ව්‍යාපාරික ස්ථානය වසා දැමීමෙන් පසු ව්‍යාපාරික දින දහයක් (10) ඇතුළත එම ව්‍යාපාරික ස්ථානය වසා දැමූ දිනය පිළිබඳව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීම සහතික කළ යුතුය.

3. ව්‍යාපාරික ස්ථානවල පවත්නා ස්ථානය වෙනස් කිරීම

3.1. එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ ව්‍යාපාරික ස්ථානයේ පවත්නා ස්ථානය වෙනස් කිරීම, ව්‍යාපාරික ස්ථානවල පවත්නා ස්ථානය වෙනස් කිරීම ලෙස සැලකේ.

3.2. බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් දැනට පවතින ඕනෑම ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට අවම වශයෙන් ව්‍යාපාරික දින දහයකට (10) පෙර උපලේඛන (ඉ) හි දක්වා ඇති ආකෘතියට අනුකූලව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

3.3. බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට පෙර රජයේ අදාළ අධිකාරී ආයතනයන්ගෙන් සහ පොලිස් ස්ථානයෙන් ලබා ගන්නා අනුමැතීන් / සහතික ලබාගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.

3.4. ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට පෙර එම ව්‍යාපාරික ස්ථානයෙන් සේවය ලබාගන්නා ගනුදෙනුකරුවන්ට සහ මහජනතාවට ඒ පිළිබඳ දැනුම් දීම සඳහා දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම විසින් කටයුතු කළ යුතුය.

3.5. බලපත්‍රලාභී මුදල් සමාගමක් ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමෙන් පසු එම ව්‍යාපාරය පැවති ස්ථානයේ තවදුරටත් මූල්‍ය ව්‍යාපාර කටයුතු සිදු නොවන බව බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සහතික කළ යුතුය.

3.6. ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් දිරිමත් නොකෙරේ. අවම වශයෙන් අවුරුදු තුනක (3) අඛණ්ඩ කාලයක් සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් එක් ස්ථානයක ස්ථාපිත කළ යුතුය.

4. ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත මාර්ගෝපදේශ

4.1. ජංගම බැංකු ඒකක සහ එහි මෙහෙයුම් බලපත්‍රලාභී මුදල් සමාගම්වල විශේෂිත ශාඛාවකට අනුබද්ධ විය යුතුය.

4.2. ජංගම බැංකු ඒකකවල මෙහෙයුම් සිදු කළ යුත්තේ බලපත්‍රලාභී මුදල් සමාගම්වල සේවකයින් විසිනි.

4.3. ජංගම බැංකු ඒකක පාරිභෝගිකයින්ට ක්‍රමවත්ව සැලසුම් කරන ලද ස්ථානවල නියමිත දින වලදී/පැයවලදී හෝ විවිධ වේලාවන් වලදී සහ විවිධ ස්ථානවල විවෘත කර සේවය සැලසිය හැකිය. කෙසේ වෙතත්, පාරිභෝගිකයින්ගේ පහසුව සහතික කිරීම සඳහා නිශ්චිත දින සහ රාජකාරී වේලාවන් ඇතුළු විස්තර තම පාරිභෝගිකයින්ට සුදුසු පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් දැනුම් දිය යුතුය.

4.4. ජංගම බැංකු ඒකක මූලික පද්ධතිය හා විද්‍යුත් මාර්ගයෙන් සම්බන්ධ වී තිබිය යුතු අතර ජංගම බැංකු ඒකක හරහා සිදු කෙරෙන ඕනෑම ගනුදෙනුවක් තත්කාලීනව යාවත්කාලීන විය යුතුය.

4.5. ජංගම බැංකු ඒකක හරහා ගනුදෙනු කරන ගනුදෙනුකරුවන්ට ගනුදෙනුව පිළිබඳ විශ්වාසදායක සාක්ෂියක් ලබාදිය යුතු අතර වඩාත් සුදුසු වන්නේ බලපත්‍රලාභී මුදල් සමාගමේ මධ්‍යම පද්ධතිය හරහා කෙටි පණිවුඩ සේවාවක් වැනි තත්කාලීන දැනුම් දීමකි.

4.6. පාරිභෝගිකයාගේ රහස්‍ය තොරතුරු හා එකතු කරන ලද මුදල් අනුබද්ධ ශාඛාව වෙත ප්‍රවාහනය කිරීමේදී හෝ සම්ප්‍රේෂණය කිරීමේදී ඒවායේ ආරක්ෂාව සඳහා ජංගම බැංකු ඒකකවලට ප්‍රමාණවත් භෞතික සහ තොරතුරු ආරක්ෂණ පියවරයන් තිබිය යුතුය.

උපලේඛන (අ)

වාර්ෂික ව්‍යාපාරික පුළුල් කිරීමේ සැලැස්ම

1	**සාමාන්‍ය:**	
1.1	බලපත්‍රලාභී මුදල් සමාගමේ නම:	
1.2	වාර්ෂික ව්‍යාපාරික පුළුල් කිරීමේ සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත් දිනය:	
2	**පවත්නා ශාඛාවල සහ වෙනත් සේවා ස්ථාන ගණන (වසර අවසානය වන විට)**	
2.1	**ශාඛා**	
	(අ) මුළු ශාඛා	
	(ආ) මුළු අලාභ උපයන ශාඛා ගණන	
2.2	**ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර**	
	(අ) ශාඛා පරිශ්‍රයෙහි පිහිටා ඇති	
	(ආ) වෙනත් ස්ථානවල පිහිටා ඇති	
2.3	**වෙනත් සේවා ස්ථාන (තිබේ නම්)**	
	(අ) සේවා ස්ථාන	
	(ආ) උකස් මධ්‍යස්ථාන	
	(ඇ) එකතු කිරීමේ මධ්‍යස්ථාන	
	(ඈ) වෙනත් (සේවා කවුළු, පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන , වාහන අංගන යනාදිය)	

3	**පසුගිය වසරේ වාර්ෂික ශාඛා පුළුල් කිරීමේ සැලැස්මේ අනුමත කරන ලද හා යෝජිත අයුරින් සම්පූර්ණ කර නොමැති විවෘත කිරීම්, වසා දැමීම් සහ පවත්නා ස්ථානය වෙනස් කිරීම් පිළිබඳ විස්තර:**
3.1	සම්පූර්ණ කර නොමැති ශාඛා හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර විවෘත කිරීම්:

	ස්ථාන:	හේතු:
3.2	**සම්පූර්ණ කර නොමැති ව්‍යාපාරික ස්ථාන වසා දැමීම්:**	
	ස්ථාන:	හේතු:
3.3	**සම්පූර්ණ කර නොමැති ව්‍යාපාරික ස්ථාන පවත්නා ස්ථානවල වෙනස් කිරීම්:**	
	ස්ථාන:	හේතු:

4	**අලුතින් විවෘත කිරීමට යෝජිත නව ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර පිළිබඳ විස්තර:**				
4.1	**ශාඛා :**				
		පරිපාලන දිස්ත්‍රික්කය	**නගරයේ නම**	**පළාත් පාලන අධිකාරිය**	**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
	1				
	2				
	3				
	4				
	5				
	6				
	7				
	8				
	9				
	10				
	(තවත් පේලි එක් කරන්න)				

4.2	**මූල්‍ය තොරතුරු ප්‍රක්ෂේපනයන් :** කරුණාකර යෝජිත ශාඛා ද ඇතුළුව සමාගම් මෙහෙයුම් කටයුතු වල ඉදිරි වසර තුනක කාලය සඳහා මූල්‍ය ප්‍රක්ෂේපනයන් ඉදිරිපත් කරන්න.			
		වසර 1	වසර 2	වසර 3
4.2.1	ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය, %			
4.2.2	මුළු ප්‍රාග්ධන අනුපාතය, %			
4.2.3	දළ අක්‍රීය ණය අනුපාතය, %			

4.2.4	ශුද්ධ අක්‍රිය ණය අනුපාතය, %			
4.2.5	සමස්ත තැන්පතු, රු. බිලියන			
4.2.6	සමස්ත ණය සහ අත්තිකාරම්, රු. බිලියන			
4.2.7	මූලික ප්‍රාග්ධනය, රු. බිලියන			
4.2.8	සමස්ත ප්‍රාග්ධන පදනම, රු. බිලියන			
4.2.9	ලාභ/අලාභ, රු. බිලියන			

4.3	**ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර:**		
		ස්ථානය	**අනුබද්ධිත ශාඛාව**
	1		
	2		
	3		
	4		
	5		
	6		
	7		
	8		
	9		
	10		
	(තවත් පේළි එක් කරන්න)		

5	**වසා දැමීමට යෝජිත ව්‍යාපාරික ස්ථානවල විස්තර:**							
		ව්‍යාපාරික ස්ථානයේ වර්ගය	**වසා දැමීමට හේතුව**	**පරිපාලන දිස්ත්‍රික්කය**	**නගරය**	**පළාත් පාලන අධිකාරිය**	**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**	**තැපැල් ලිපිනය**
	1							
	2							
	3							
	4							
	5							
	(තවත් පේළි එක් කරන්න)							

6	**පවත්නා ස්ථානය වෙනස් කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථානවල විස්තර:**						
		ව්‍යාපාරික ස්ථානයේ වර්ගය	**පරිපාලන දිස්ත්‍රික්කය**	**නගරය**	**පළාත් පාලන අධිකාරිය**	**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**	**වර්තමානයේ පිහිටා ඇති ස්ථානයේ තැපැල් ලිපිනය**
	1						
	2						
	3						
	4						
	5						
	(තවත් පේළි එක් කරන්න)						

7	**සහතික කිරීම**	
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.	
	නම :	නම :
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරී	තනතුර : අනුකූලතා නිලධාරී
	අත්සන :	අත්සන :
	දිනය :	දිනය :

උපලේඛන (ඇ)

පෝරම I: නව ශාඛා / ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර විවෘත කිරීම

1	**සාමාන්‍ය**				
1.1	බලපත්‍රලාභී මුදල් සමාගමේ නම:				
1.2	යෝජිත නව ශාඛාව විවෘත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත් දිනය:				
2	**නව ශාඛාවේ විස්තර : (එක් එක් ශාඛාව සඳහා වෙන වෙනම විස්තර වාර්තා ඉදිරිපත් කරන්න)**				
2.1	ශාඛාව විසින් භාවිත කළ යුතු නිල නාමය				
2.2	ස්ථානය				
	(අ) පරිපාලන දිස්ත්‍රික්කය				
	(ආ) නගරය				
	(ඇ) පළාත් පාලන අධිකාරිය				
	(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය				
	(ඉ) තැපැල් ලිපිනය				
2.3	ශාඛාව විවෘත කිරීම සඳහා ආර්ථික ශක්‍යතා අධ්‍යයනයක් කර ලේඛනගත කර පවතීද?				ඔව්/නැත
2.4	යෝජිත ස්ථානයේ ශාඛාව විවෘත කිරීම සඳහා අදාළ රජයේ අධිකාරී ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතීන්/අවසරයන් සහ පොලිස් ස්ථානයේ අනුමැතිය සහිත සහතිකය ලබා ගත්තේද?				ඔව්/නැත
2.5	මූල්‍ය තොරතුරු ප්‍රක්ෂේපනයන් : කරුණාකර ශාඛාවේ මෙහෙයුම් කටයුතුවල ඉදිරි වසර තුනක කාලය සඳහා ප්‍රක්ෂේපනයන් ඉදිරිපත් කරන්න.				
		වසර 1	වසර 2	වසර 3	
2.5.1	ලාභ /අලාභ, රු. බිලියන				
2.5.2	ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතයට ඇති බලපෑම %				
2.5.3	සමස්ත ප්‍රාග්ධන අනුපාතයට ඇති බලපෑම %				
2.6	**කාර්ය මණ්ඩල අවශ්‍යතා**				
	මාණ්ඩලික පන්තිය	ලිපිකරු පන්තිය	සුළු සේවක	ආරක්ෂක	මුළු ගණන
	යෝජිත ශාඛාවේ සේවකයින් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ සුදුසුකම්, අත්දැකීම් සහ රැකියා විස්තරය ඇතුලත් කරමින් ඉදිරිපත් කරන්න (මෙම තොරතුරු වෙනත් ඇමුණුමක් මඟින් ඉදිරිපත් කරන්න)				

3	**නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිළිබඳ විස්තර (ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර) :**		
3.1	යෝජිත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර ගණන :		
3.2	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර ස්ථානගත කිරීමට යෝජිත ස්ථානය සහ අනුබද්ධිත ශාඛාව: 1. 2. 3. (තවත් පේළි එක් කරන්න)		
4	**සහතික කිරීම**		
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.		
	නම :	නම :	
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරී	තනතුර : අනුකූලතා නිලධාරී	
	අත්සන :	අත්සන :	
	දිනය :	දිනය :	

උපලේඛන (ඈ)

පෝරම 2 : ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීම

1	**සාමාන්‍ය**					
1.1	බලපත්‍රලාභී මුදල් සමාගමේ නම:					
1.2	වසා දැමීමට යෝජිත ව්‍යාපාරික ස්ථානයේ වර්ගය (X):					
	ශාඛාව		ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර		වෙනත් (විස්තර කරන්න)	
1.3	යෝජිත වසා දැමීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත් දිනය:					
1.4	ව්‍යාපාරික ස්ථානය වසා දැමීමට හේතු:					
2	**ස්ථානය**					
2.1	පරිපාලන දිස්ත්‍රික්කය					
2.2	නගරය					
2.3	පළාත් පාලන අධිකාරිය					
2.4	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය					
2.5	තැපැල් ලිපිනය					
3	**යෝජිත වසා දැමීම සම්බන්ධ ප්‍රධාන තොරතුරු (රු. මිලියන)**					
3.1	මුළු වත්කම්					
3.2	ණය සහ අත්තිකාරම්					
3.3	වෙනත් වත්කම්					
3.4	තැන්පතු					
3.5	මුළු ණය ගැනීම්					

3.6	වෙනත් වගකීම්	
3.7	තැන්පත්කරුවන් ගණන	
3.8	මුළු ණය ගැනුම්කරුවන් ගණන	
3.9	මුළු සේවක ගණන	
4	යෝජිත ව්‍යාපාරික ස්ථානය වසා දැමීමෙන් පසු වත්කම්, වගකීම් සහ සේවකයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න:	
5	**සහතික කිරීම**	
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.	
	නම :	නම :
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරී	තනතුර : අනුකූලතා නිලධාරී
	අත්සන :	අත්සන :
	දිනය :	දිනය :

උපලේඛන (ඉ)

පෝරම 3 : ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීම

1	**සාමාන්‍ය**					
1.1	බලපත්‍රලාභී මුදල් සමාගමේ නම:					
1.2	පවත්නා ස්ථානය වෙනස් කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථානයේ වර්ගය (X):					
	ශාඛාව		ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර / මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර		වෙනත් (විස්තර කරන්න)	
1.3	යෝජිත ස්ථානය වෙනස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත් දිනය:					
1.4	පවත්නා ස්ථානය වෙනස් කිරීමට හේතු:					
2	**ස්ථානය**					
2.1	**පවතින ස්ථානය**					
	(අ) පරිපාලන දිස්ත්‍රික්කය					
	(ආ) නගරය					
	(ඇ) පළාත් පාලන අධිකාරිය					
	(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය					
	(ඉ) තැපැල් ලිපිනය					

2.2	**නව (යෝජිත)**		
	(අ) පරිපාලන දිස්ත්‍රික්කය		
	(ආ) නගරය		
	(ඇ) පළාත් පාලන අධිකාරිය		
	(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය		
	(ඉ) තැපැල් ලිපිනය		
3	පවතින ස්ථානය වෙනස් කිරීම සඳහා ආර්ථික ශක්‍යතා අධ්‍යයනයක් කර ලේඛන ගත කර පවතීද?		ඔව් /නැත
4	යෝජිත ස්ථානය වෙනස් කිරීම සඳහා අදාළ රජයේ අධිකාරි ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතීන් / අවසරයන් සහ පොලිස් ස්ථානයේ අනුමැතිය සහිත සහතිකය ලබා ගත්තේද?		ඔව් /නැත
5	**සහතික කිරීම**		
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.		
	නම :	නම :	
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරි	තනතුර : අනුකූලතා නිලධාරී	
	අත්සන :	අත්සන :	
	දිනය :	දිනය :	

2020 අංක 07 දරන චක්‍රලේඛය 2020 ජූලි 16

කොවිඩ්-19 මඟින් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග

සංචාරක කර්මාන්තයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් හට කොවිඩ්-19 ව්‍යසනය හේතුවෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) මඟින් පහත සඳහන් සහන සැලසීමේ ක්‍රියාමාර්ග සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් වෙත ලබාදෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලා සිටී.

1. 2020 මාර්තු 27 දින නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛයේ අංක 02 සහ 03 ඡේදයන්ට අනුව, සංචාරක කර්මාන්තයට අදාළ රථ වාහන සඳහා ලබා දී ඇති මූල්‍ය කල්බදු පහසුකම්වල මුල් මුදලේ පිටහිටි ශේෂය සඳහා ලබා දුන් මාස 06 ක සහන කාල සීමාව මාස 12 ක් දක්වා දීර්ඝ කිරීම මූල්‍ය ආයතන විසින් සිදු කළ යුතුය.

2. සුදුසුකම් ලත් ණය ගැනුම්කරුගෙන් එම ණය ගැනුම්කරුට අපහසුවක් නොවන අයුරින් ඉහත පළමු ඡේදයේ සඳහන් ණය සහන කාල සීමාවට අයත් පොලිය අය කර ගැනීමට මූල්‍ය ආයතනවලට හැකියාව පවතී.

3. සංචාරක කර්මාන්තයට අදාල රථ වාහන සඳහා ලබා දුන් මූල්‍ය කල්බදු පහසුකම් වලට අදාළ උපචිත දඩ පොලිය මූල්‍ය ආයතන විසින් කපා හැරිය යුතුය.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 05 දරන විධානය 2020 අගෝස්තු 20

ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ විධානය නිකුත් කරනු ලබයි.

1. විධානයේ අදාළත්වය

1.1 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට, කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු සිදු කළ හැකි වන්නේ පූර්ණ ශාඛා සහ එකතු කිරීමේ මධ්‍යස්ථාන යන ව්‍යාපාරික ස්ථාන තුළ පමණි. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට ජංගම බැංකු ඒකක ක්‍රියාත්මක කළ හැකි අතර එම ජංගම බැංකු ඒකක එම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ ශාඛාවකට අනුබද්ධ විය යුතුය. ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම, වසා දැමීම සහ පවත්නා ස්ථානය වෙනස් කිරීම සහ ජංගම බැංකු ඒකක ක්‍රියාත්මක කිරීම සඳහා උපලේඛන (අ) හි දක්වා ඇති මාර්ගෝපදේශ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අනුගමනය කළ යුතුය.

1.2 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම හෝ දැනට පවත්නා ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීම හෝ ඕනෑම ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට සහ ජංගම බැංකු ඒකක ස්ථාපිත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින 10 කට පෙර අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

1.3 මුදල් මණ්ඩලයේ එකඟතාවය මත අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමකට ශ්‍රී ලංකාවෙන් පිටතදී ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම, වසා දැමීම හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීම සිදු නොකළ යුතුය.

2. නව ශාඛාවක් විවෘත කිරීම සඳහා අවශ්‍ය අවම නිර්ණායකයන්

2.1 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් නව ශාඛාවක් විවෘත කිරීමේ දී පහත සඳහන් කර ඇති අවම අවශ්‍යතාවයන්ට අනුකූල විම සහතික කළ යුතුය.

i. 2018 අංක 03 දරන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවය විධානයෙහි හෝ එහි සංශෝධනයන්හි දක්වා ඇති පරිදි අවම ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයට අනුකූල වීම.

ii. 2012 අංක 01 දරන අවම මූලික ප්‍රාග්ධනය විධානයෙහි හෝ එහි සංශෝධනයන්හි දක්වා ඇති පරිදි අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූල විම.

iii. 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශීල වත්කම්) විධානයෙහි හෝ එහි සංශෝධනයන්හි දක්වා ඇති පරිදි අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවයට අනුකූල වීම.

iv. අක්‍රීය ණය අනුපාතය කලමනාකාරණය කළ හැකි මට්ටමකින් පවත්වා ගෙන යාම.

v. තැන්පතු හෝ ණය ලබාදීම සඳහා උපරිම අවම සීමාවන් පැනවීමට යටත් වී නොමැති වීම.

3. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතීන්

3.1 නව ශාඛා වල ව්‍යාපාර කටයුතු සඳහා ඇති විභවතාවය, ශාඛාවන්ට ප්‍රමාණවත් සම්පත් සැපයීමේ හැකියාව (භෞතික වත්කම්, මානව සම්පත් ආදිය), අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාව, ශාඛා මෙහෙයුම් සහ සේවාදායකයන්ට කඩිනම් සහ ලාභදායී පාරිභෝගික සේවාවක් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රධාන නිලධාරීන්ට ඇති වගකීම නියම කිරීම යනාදිය සලකා බලා සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින්ම ව්‍යාපාර පුළුල් කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විවක්ෂණශීලී ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය.

3.2 ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම, වසා දැමීම හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් කටයුතු කළ යුතුය.

4. වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්ම

4.1 සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉදිරි වසර සඳහා වූ වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්ම සෑම වසරකම දෙසැම්බර් මස 31 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

4.2 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් උපලේඛන (ආ) හි දක්වා ඇති පරිදි ඉදිරි වසර තුළ, විවෘත කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථාන, වසා දැමීමට හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථාන පිළිබඳ විස්තර වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්මේ සඳහන් කළ යුතුය.

4.3 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්මෙහි අන්තර්ගත නොවන කිසිදු ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම, වසා දැමීම හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීම නොකළ යුතුය.

4.4 අනුමත කරන ලද වාර්ෂික ව්‍යාපාර පුළුල් කිරීමේ සැලැස්ම වලංගු වන්නේ වසරක කාලයක් (ලිත් වර්ෂයක්) සඳහා පමණක් වන අතර ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම, වසා දැමීම හෝ පවත්නා ස්ථානය වෙනස් කිරීම සඳහා අනුමැතීන් එම වසර තුළ අදාළ කාර්යය සම්පූර්ණ කර නොමැති නම් අහෝසි වේ.

5. අවදානම් කලමනාකරණය

5.1 අධ්‍යක්ෂ මණ්ඩලය පහත කරුණු සඳහා වගකීමට බැඳේ.

i. ව්‍යාපාරික ස්ථානයේ මෙහෙයුම් අධීක්ෂණය සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම.

ii. තොරතුරු, සන්නිවේදන සහ තාක්ෂණ පද්ධති හා දත්ත අභ්‍යන්තර සහ බාහිර තර්ජන වලින් ආරක්ෂා කර ගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලනයන් පවත්වා ගැනීම.

iii. තම පාරිභෝගිකයන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීම සහතික කිරීම සඳහා ව්‍යාපාරික ස්ථානයේ නිලධාරීන්ට මෙහෙයුම් අත්පොතක් ලබාදීම.

iv. ව්‍යාපාරික ස්ථානයේ මෙහෙයුම් කටයුතු වලදී ඇති විය හැකි අවදානම් වලක්වා ගැනීම හඳුනා ගැනීම සහ කලමනාකරණය කිරීම සඳහා ශාඛා සේවකයින් දැනුවත් කිරීම සහ හොඳින් පුහුණු කිරීම සහතික කිරීම.

v. ව්‍යාපාරික ස්ථානයේ සිදු කරන මෙහෙයුම් කටයුතු වලදී ඇතිවිය හැකි සැලකිය යුතු බාධා හෝ අතපසුවීම අවම කිරීම සඳහා අඛණ්ඩ ව්‍යාපාරික සැලැස්මක් පවත්වාගෙන යාම.

5.2 අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුව යන දෙපාර්ශවයෙන් අදාළ වන පාර්ශවය විසින් සමස්ත හා තනි ව්‍යාපාරික ස්ථාන මට්ටමින් අවදානම් වාර්තා අවම වශයෙන් කාර්තුමය පදනමක් මත සමාලෝචනය කළ යුතුය.

6. පවත්වාගෙන යන වෙනත් සේවා ස්ථාන ප්‍රමිතිගත කිරීම

6.1 සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින්ම දැනට පවත්නා වෙනත් සේවා ස්ථාන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද වෙනත් සේවා ස්ථාන ප්‍රමිතිගත කිරීමේ සැලැස්ම 2020.09.30 දිනට පෙර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම සැලැස්ම 2021.12.31 දින හෝ ඊට පෙර ක්‍රියාත්මක කළ යුතුය.

6.2 දැනට පවත්වාගෙන යන වෙනත් සේවා ස්ථාන ප්‍රමිතිගත කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් තුළ ඒ පිළිබඳ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

7. ව්‍යාපාරික ස්ථාන ව්‍යාපාරික කටයුතු

7.1 ඕනෑම ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම, වසාදැමීම හා පවත්නා ස්ථානය වෙනස් කිරීම පිළිබඳව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම වෙත නිශ්චිතව හේතු ලිඛිතව දන්වා විරෝධය පල කිරීමට අධ්‍යක්ෂවරයාට බලය පවතී.

7.2 තවද ඕනෑම අවස්ථාවක තවදුරටත් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක ව්‍යාපාර තවදුරටත් පුළුල් කිරීම සීමා කිරීමට අධ්‍යක්ෂවරයාට බලය පවතී.

8. ව්‍යාපාරික ස්ථාන ව්‍යාපාරික කටයුතු සඳහා විවෘත නොකිරීම

8.1 ලංකා වාණිජ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද නිවාඩු දිනයක හැර, සඳුදා සිට සිකුරාදා දක්වා සතියේ කිසිදු දිනයක කිසිදු ව්‍යාපාරික ස්ථානයක් ව්‍යාපාරික කටයුතු සඳහා විවෘත නොකිරීම සිදු නොකළ යුතුය.

8.2 ඉහත 8.1 විධානයේ දක්වා ඇති නිවාඩු දින හැර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය සහිතව, අතිරේක දින දෙකක් නිවාඩු වශයෙන් ලබා ගැනීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට හැකියාව ඇත. එවැනි අනුමැතියක් ලබාදීමේ දී අධ්‍යක්ෂවරයාට අවශ්‍ය යැයි හැඟෙන කොන්දේසි පැනවීමට හැකියාව ඇත.

8.3 කෙසේ වෙතත්, ලංකා වාණිජ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද නිවාඩු දින සහ අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද අතිරේක නිවාඩු දින ද ඇතුළුව අඛණ්ඩව දින පහක් ව්‍යාපාර කටයුතු සඳහා කිසිදු ව්‍යාපාරික ස්ථානයක් වසා තැබීම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් නොකළ යුතුය.

8.4 එවැනි අවස්ථාවකදී ව්‍යාපාරික ස්ථාන වසා තැබීම පිළිබඳව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සිය ගනුදෙනුකරුවන්ට දැනුම් දිය යුතුය.

8.5 ගංවතුර, කෝලාහල හෝ වෙනත් අසාමාන්‍ය සිදුවීමක් වැනි අවස්ථාවකදී ව්‍යාපාරික ස්ථාන වසා තැබීමට අවශ්‍ය වන විට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් අදාළ අභ්‍යන්තර අධිකාරයේ අනුමැතිය සහිතව එම ස්ථානය වසා තැබීමට තීරණය කළ හැකි අතර ප්‍රමාදයකින් තොරව ඒ පිළිබඳ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.

9. වාර්තාකරණ අවශ්‍යතා

9.1 සෑම කාර්තුවක්ම අවසාන වී ඉදිරි මාසයේ පහලොස් (15) වන දිනය වන විට මෙම විධානයේ අවශ්‍යතාවයන්ට සම්පූර්ණයෙන් අනුකූල වූ බව තහවුරු කරමින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් කාර්තුමය පදනමින් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

9.2 සෑම කාර්තුවක්ම අවසාන වී ඉදිරි මාසයේ පහලොස්වන දිනය (15) වන විට ජාලගත සම්ප්‍රේෂණ පද්ධතියේ ව්‍යාපාර ස්ථාන සඳහා ආකෘතීන් ඉදිරිපත් කළ යුතුය.

10. විධාන සඳහා අනුකූල නොවන අවස්ථාවේදී ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් ඉහත සඳහන් විධානයන්ට අනුකූල නොවන අවස්ථාවල දී අධ්‍යක්ෂවරයා විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග අතරින් එකක් හෝ කිහිපයක් ගනු ලැබේ.

i. ව්‍යාපාරික ස්ථාන මෙහෙයුම්/පුළුල් කිරීම් සඳහා සීමාවන් පැනවීම
ii. අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන පරිදි මූල්‍ය දඩ පැනවීම
iii. විධාන සඳහා අනුකූල නොවීම් හෙලිදරව් කිරීමේ අවශ්‍යතා පැනවීම
iv. වගකිව යුතු ප්‍රධාන කලමනාකරණ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් එම තනතුරු සඳහා යෝග්‍ය හා උචිත නොවන බව වහාම තීරණය කිරීම.

11. අර්ථ නිරූපණයන්

මෙම විධානයන්හි,

i. ''ව්‍යාපාරික ස්ථානය'' යනු ශාඛා සහ එකතු කිරීමේ මධ්‍යස්ථාන වේ.
ii. ''අධ්‍යක්ෂවරයා'' යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.
iii. ''ප්‍රධාන කලමනාකරණ කාර්යය මණ්ඩලය'' යන්නට 2009 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ආයතනික යහපාලනය) විධානය හෝ එහි සංශෝධනයන්හි ලබා දී ඇති අර්ථ නිරූපණය අදාළ විය යුතුය.
iv. වෙනත් සේවා ස්ථාන යන්නෙන් කවුළු කාර්යාල, සේවා මධ්‍යස්ථාන, සේවා කවුළු හෝ දැනට ක්‍රියාත්මක වෙනත් සේවා ස්ථාන හැඳින්වේ.
v. එකතු කිරීමේ මධ්‍යස්ථාන යන්නෙන් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වල ගනුදෙනුකරුවන්ගෙන් මූල්‍ය කල්බදු වාරික සහ ණය වාරික එකතු කිරීම සඳහා පිහිටුවා ගත් මධ්‍යස්ථාන වේ.

12. පෙර විධානයන් අවලංගු කිරීම

කල්බදු මූල්‍යකරණ පනතේ 2016 අංක 01 දරන ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම, වසා දැමීම සහ පවත්නා ස්ථානය වෙනස් කිරීම විධානය මෙයින් අහෝසි කෙරේ.

ජේ ඩී එස් ජේ නානායක්කාර
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන
අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

උපලේඛන (අ)

ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම, වසා දැමීම සහ පවත්නා ස්ථානය වෙනස් කිරීම සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා වූ මාර්ගෝපදේශය

1. නව ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම

1.1. නව ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම පිළිබඳ තොරතුරු එවැනි විවෘත කිරීමකට අවම වශයෙන් ව්‍යාපාරික දින දහයකට (10) පෙර විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. නව ව්‍යාපාරික ස්ථාන පිළිබඳ තොරතුරු උපලේඛන (ඇ) හි දක්වා ඇති ආකෘතියට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.

1.2. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශය තුළ මූල්‍ය සේවාවන් සඳහා පවතින අවශ්‍යතාවය විශ්ලේෂණය කරමින් විවෘත කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරික ස්ථානය සඳහා ආර්ථික ශක්‍යතා අධ්‍යයනයක් සකස් කළ යුතුය. එවන් අධ්‍යයනයක අවම වශයෙන් පහත සඳහන් කරුණු ආවරණය විය යුතුය.

(අ) මූල්‍ය ආයතනවල ඝනත්වය මත පදනම්ව යෝජිත ප්‍රදේශයට මූල්‍ය සේවා සඳහා පවතින අවශ්‍යතාවය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු ජනගහනය එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවතින මූල්‍ය ආයතනවල ව්‍යාපාරික ස්ථාන ගණනින් බෙදීමෙන්)

(ආ) සේවා සැපයිය යුතු භූගෝලීය හා ආර්ථික සේවා ක්ෂේත්‍ර සහ සේවා සැපයිය යුතු වෙළඳපොල පිළිබඳ දළ විශ්ලේෂණය

(ඇ) එම ප්‍රදේශ තුළ මූල්‍ය සේවාවන් සඳහා ඇති ඉල්ලුමෙහි අපේක්ෂිත වර්ධනය සහ ව්‍යාපාරික ස්ථානයේ කටයුතු ලාභදායී වීමට ගතවන කාලය

(ඈ) එම ව්‍යාපාරික ස්ථානයේ අපේක්ෂිත ව්‍යාපාර පරිමාව, ව්‍යාපාර වර්ධනය, සංස්ථාපන හා මෙහෙයුම් පිරිවැය සහ වසර තුනකට නොඅඩු ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක ප්‍රතිඵල පදනම් කරගෙන අයදුම් කරන ව්‍යාපාරික ස්ථානය සඳහා මූල්‍ය උපකල්පනයන්

1.3. නව ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීමට පෙර විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අදාළ රජයේ අධිකාරී ආයතනයන්ගෙන් සහ පොලිස් ස්ථානයෙන් ලබා ගන්නා අනුමැතීන් / සහතික ලබාගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය.

1.4. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් නව ව්‍යාපාරික ස්ථානයක් විවෘත කළ දින සිට ව්‍යාපාරික දින දහයක් (10) තුළ එය විවෘත කළ දිනය අධ්‍යක්ෂවරයාට දැනුම් දීමට කටයුතු කළ යුතුය.

2. ව්‍යාපාරික ස්ථාන වසා දැමීම

2.1. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් පවතින ව්‍යාපාරික ස්ථාන වසා දැමීමට අවම වශයෙන් ව්‍යාපාර දින 10 කට පෙර ඒ පිළිබඳව උපලේඛන (ඈ) හි දක්වා ඇති ආකෘතියට අනුකූලව අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.

2.2. ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට පෙර එම ව්‍යාපාරික ස්ථානයෙන් සාමාන්‍යයෙන් සේවය ලබාගන්නා ගනුදෙනුකරුවන්ට සහ මහජනතාවට එම ස්ථානය වසා දැමීම පිළිබඳ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් කටයුතු කළ යුතුය.

2.3. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් ව්‍යාපාරික ස්ථානය වසා දැමීමෙන් පසු එම ව්‍යාපාරය පැවති ස්ථානයේ තවදුරටත් මූල්‍ය ව්‍යාපාර කටයුතු සිදු නොවන බව සහතික කළ යුතුය.

2.4. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ව්‍යාපාරික ස්ථානය වසා දැමීමෙන් පසු ව්‍යාපාරික දින දහයක් (10) ඇතුළත එම ව්‍යාපාරික ස්ථානය වසා දැමූ දිනය පිළිබඳව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීම සහතික කළ යුතුය.

3. ව්‍යාපාරික ස්ථානවල පවත්නා ස්ථානය වෙනස් කිරීම

3.1. එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ ව්‍යාපාරික ස්ථානයේ පවත්නා ස්ථානය වෙනස් කිරීම ව්‍යාපාරික ස්ථානවල පවත්නා ස්ථානය වෙනස් කිරීම ලෙස සැලකේ.

3.2. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් දැනට පවතින ඕනෑම ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට අවම වශයෙන් ව්‍යාපාරික දින දහයකට (10) පෙර උපලේඛන (ඉ) හි දක්වා ඇති ආකෘතියට අනුකූලව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

3.3. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට පෙර රජයේ අදාළ අධිකාරී ආයතනයන්ගෙන් සහ පොලිස් ස්ථානයෙන් ලබා ගන්නා අනුමැතීන්/ සහතික ලබාගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.

3.4. ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට පෙර එම ව්‍යාපාරික ස්ථානයෙන් සේවය ලබාගන්නා ගනුදෙනුකරුවන්ට සහ මහජනතාවට ඒ පිළිබඳ දැනුම් දීම සඳහා දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම විසින් කටයුතු කළ යුතුය.

3.5. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින් ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමෙන් පසු එම ව්‍යාපාරය පැවති ස්ථානයේ තවදුරටත් මූල්‍ය ව්‍යාපාර කටයුතු සිදු නොවන බව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් සහතික කළ යුතුය.

3.6. ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් දිරිමත් නොකෙරේ. අවම වශයෙන් අවුරුදු තුනක (3) අඛණ්ඩ කාලයක් සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් එක් ස්ථානයක ස්ථාපිත කළ යුතුය.

4. ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත මාර්ගෝපදේශ

4.1. ජංගම බැංකු ඒකක සහ එහි මෙහෙයුම් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල විශේෂිත ශාඛාවකට අනුබද්ධ විය යුතුය.

4.2. ජංගම බැංකු ඒකකවල මෙහෙයුම් සිදු කළ යුත්තේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සේවකයින් විසිනි.

4.3. ජංගම බැංකු ඒකක පාරිභෝගිකයින්ට ක්‍රමවත්ව සැලසුම් කරන ලද ස්ථානවල නියමිත දින වලදී/පැයවලදී හෝ විවිධ වේලාවන් වලදී සහ විවිධ ස්ථානවල විවෘත කර සේවය සැලසිය හැකිය. කෙසේ වෙතත්, පාරිභෝගිකයින්ගේ පහසුව සහතික කිරීම සඳහා නිශ්චිත දින සහ රාජකාරී වේලාවන් ඇතුළු විස්තර තම පාරිභෝගිකයින්ට සුදුසු පරිදි විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් දැනුම් දිය යුතුය.

4.4. ජංගම බැංකු ඒකක මූලික පද්ධතිය හා විද්‍යුත් මාර්ගයෙන් සම්බන්ධ වී තිබිය යුතු අතර ජංගම බැංකු ඒකක හරහා සිදු කෙරෙන ඕනෑම ගනුදෙනුවක් තත්කාලීනව යාවත්කාලීන විය යුතුය.

4.5. ජංගම බැංකු ඒකක හරහා ගනුදෙනු කරන ගනුදෙනුකරුවන්ට ගනුදෙනුව පිළිබඳ විශ්වාසදායක සාක්ෂියක් ලබාදිය යුතු අතර වඩාත් සුදුසු වන්නේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ මධ්‍යම පද්ධතිය හරහා කෙටි පණිවුඩ සේවාවක් වැනි තත්කාලීන දැනුම් දීමකි.

4.6. පාරිභෝගිකයාගේ රහස්‍ය තොරතුරු හා එකතු කරන ලද මුදල් අනුබද්ධ ශාඛාව වෙත ප්‍රවාහනය කිරීමේ දී හෝ සම්ප්‍රේෂණය කිරීමේ දී ඒවායේ ආරක්ෂාව සඳහා ජංගම බැංකු ඒකකවලට ප්‍රමාණවත් භෞතික සහ තොරතුරු ආරක්ෂණ පියවරයන් තිබිය යුතුය.

උපලේඛන (ආ)

වාර්ෂික ව්‍යාපාරික පුළුල් කිරීමේ සැලැස්ම

1	**සාමාන්‍ය**		
1.1	විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නම:		
1.2	වාර්ෂික ව්‍යාපාරික පුළුල් කිරීමේ සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත් දිනය:		
2	**පවත්නා ශාඛාවල එකතු කිරීමේ මධ්‍යස්ථාන සහ වෙනත් සේවා ස්ථාන ගණන (වසර අවසානය වන විට)**		
2.1	ශාඛා		
	(අ) මුළු ශාඛා		
	(ආ) මුළු අලාභ උපයන ශාඛා ගණන		
2.2	එකතු කිරීමේ මධ්‍යස්ථාන		
2.3	වෙනත් සේවා ස්ථාන (නිබේ නම්)		

3	**පසුගිය වසරේ වාර්ෂික ශාඛා පුළුල් කිරීමේ සැලැස්මේ අනුමත කරන ලද හා යෝජිත අයුරින් සම්පූර්ණ කර නොමැති විවෘත කිරීම්, වසා දැමීම් සහ පවත්නා ස්ථානය වෙනස් කිරීම් පිළිබඳ විස්තර:**	
3.1	සම්පූර්ණ කර නොමැති ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම්:	
	ස්ථාන:	හේතු:
3.2	සම්පූර්ණ කර නොමැති ව්‍යාපාරික ස්ථාන වසා දැමීම්:	
	ස්ථාන:	හේතු:
3.3	සම්පූර්ණ කර නොමැති ව්‍යාපාරික ස්ථානවල පවත්නා ස්ථානය වෙනස් කිරීම්:	
	ස්ථාන:	හේතු:

4	**අලුතින් විවෘත කිරීමට යෝජිත නව ව්‍යාපාරික ස්ථාන පිළිබඳ විස්තර:**				
4.1	ශාඛා:				
		පරිපාලන දිස්ත්‍රික්කය	**නගරයේ නම**	**පළාත් පාලන අධිකාරිය**	**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
	1				
	2				
	3				
	4				
	5				
	6				
	7				
	8				
	9				
	10				
	(තවත් පේළි එක් කරන්න)				

4.2	**එකතු කිරීමේ මධ්‍යස්ථාන**				
		පරිපාලන දිස්ත්‍රික්කය	**නගරයේ නම**	**පළාත් පාලන අධිකාරිය**	**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
	1				
	2				
	3				
	4				
	5				
	(තවත් පේළි එක් කරන්න)				

4.3	**මූල්‍ය තොරතුරු ප්‍රක්ෂේපනයන් : කරුණාකර යෝජිත ව්‍යාපාරික ස්ථාන ද ඇතුළුව සමාගම් මෙහෙයුම් කටයුතුවල ඉදිරි වසර තුනක කාලය සඳහා මූල්‍ය ප්‍රක්ෂේපනයන් ඉදිරිපත් කරන්න.**			
		වසර 1	වසර 2	වසර 3
4.3.1	ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය %			
4.3.2	මුළු ප්‍රාග්ධන අනුපාතය %			
4.3.3	දළ අක්‍රීය ණය අනුපාතය %			
4.3.4	ශුද්ධ අක්‍රීය ණය අනුපාතය %			
4.3.5	මුළු ණය ගැනීම්, රු. බිලියන			
4.3.6	මුළු ණය සහ අත්තිකාරම්, රු. බිලියන			
4.3.7	මූලික ප්‍රාග්ධනය, රු. බිලියන			
4.3.8	සමස්ත ප්‍රාග්ධන පදනම, රු. බිලියන			
4.3.9	ලාභ/අලාභ, රු. බිලියන			

5	**වසා දැමීමට යෝජිත ව්‍යාපාරික ස්ථානවල විස්තර:**							
		ව්‍යාපාරික ස්ථානයේ වර්ගය	වසා දැමීමට හේතුව	පරිපාලන දිස්ත්‍රික්කය	නගරය	පළාත් පාලන අධිකාරිය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	තැපැල් ලිපිනය
	1							
	2							
	3							
	4							
	5							
	(තවත් පේළි එක් කරන්න)							

6	**පවත්නා ස්ථානය වෙනස් කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථානවල විස්තර:**						
		ව්‍යාපාරික ස්ථානයේ වර්ගය	පරිපාලන දිස්ත්‍රික්කය	නගරය	පළාත් පාලන අධිකාරිය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	වර්තමානයේ පිහිටා ඇති ස්ථානයේ තැපැල් ලිපිනය
	1						
	2						
	3						
	4						
	5						
	(තවත් පේළි එක් කරන්න)						

7	**සහතික කිරීම**	
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.	
	නම :	නම :
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරී	තනතුර : අනුකූලතා නිලධාරී
	අත්සන :	අත්සන :
	දිනය :	දිනය :

උපලේඛන (ඇ)

පෝරම I: නව ව්‍යාපාරික ස්ථානයක් විවෘත කිරීම

1	**සාමාන්‍ය**				
1.1	විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නම:				
1.2	යෝජිත නව ව්‍යාපාරික ස්ථානය විවෘත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත් දිනය:				
2	**නව ව්‍යාපාරික ස්ථානයේ විස්තර : (එක් එක් ව්‍යාපාරික ස්ථානය සඳහා වෙන වෙනම විස්තර වාර්තා ඉදිරිපත් කරන්න)**				
2.1	ව්‍යාපාරික ස්ථානය විසින් භාවිත කළ යුතු නිල නාමය				
2.2	ස්ථානය				
	(අ) පරිපාලන දිස්ත්‍රික්කය				
	(ආ) නගරය				
	(ඇ) පළාත් පාලන අධිකාරිය				
	(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය				
	(ඉ) තැපැල් ලිපිනය				
2.3	ව්‍යාපාරික ස්ථානය විවෘත කිරීම සඳහා ආර්ථික ශක්‍යතා අධ්‍යයනයක් කර ලේඛනගත කර පවතීද?				ඔව්/නැත
2.4	යෝජිත ස්ථානයේ ව්‍යාපාරික ස්ථානය විවෘත කිරීම සඳහා අදාළ රජයේ අධිකාරී ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතීන්/අවසරයන් සහ පොලිස් ස්ථානයේ අනුමැතිය සහිත සහතිකය ලබා ගත්තේද?				ඔව්/නැත
2.5	**මූල්‍ය තොරතුරු ප්‍රක්ෂේපනයන් :** කරුණාකර ශාඛාවේ මෙහෙයුම් කටයුතුවල ඉදිරි වසර තුනක කාලය සඳහා ප්‍රක්ෂේපනයන් ඉදිරිපත් කරන්න.				
			වසර 1	වසර 2	වසර 3
2.5.1	ලාභ /අලාභ, රු. බිලියන				
2.5.2	ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතයට ඇති බලපෑම %				
2.5.3	සමස්ත ප්‍රාග්ධන අනුපාතයට ඇති බලපෑම %				
2.6	**කාර්ය මණ්ඩල අවශ්‍යතා**				
	මාණ්ඩලික පන්තිය	ලිපිකරු පන්තිය	සුළු සේවක	ආරක්ෂක	මුළු ගණන
	යෝජිත ව්‍යාපාරික ස්ථානයේ සේවකයින් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ සුදුසුකම්, අත්දැකීම් සහ රැකියා විස්තරය ඇතුළත් කරමින් ඉදිරිපත් කරන්න. (මෙම තොරතුරු වෙනත් ඇමුණුමක් මඟින් ඉදිරිපත් කරන්න)				
3	**සහතික කිරීම**				
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.				
	නම :		නම :		
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරී		තනතුර : අනුකූලතා නිලධාරී		
	අත්සන :		අත්සන :		
	දිනය :		දිනය :		

උපලේඛන (ඈ)

පෝරම 2 : ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීම

1	**සාමාන්‍ය**						
1.1	විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නම:						
1.2	වසා දැමීමට යෝජිත ව්‍යාපාරික ස්ථානයේ වර්ගය (X):						
	ශාඛාව		එකතු කිරීමේ මධ්‍යස්ථානය		වෙනත් (විස්තර කරන්න)		
1.3	යෝජිත වසා දැමීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත් දිනය:						
1.4	ව්‍යාපාරික ස්ථානය වසා දැමීමට හේතු:						
2	**ස්ථානය**						
2.1	පරිපාලන දිස්ත්‍රික්කය						
2.2	නගරය						
2.3	පළාත් පාලන අධිකාරිය						
2.4	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය						
2.5	තැපැල් ලිපිනය						
3	**යෝජිත වසා දැමීම සම්බන්ධ ප්‍රධාන තොරතුරු (රු. මිලියන)**						
3.1	මුළු වත්කම්						
3.2	ණය සහ අත්තිකාරම්						
3.3	වෙනත් වත්කම්						
3.4	මුළු ණය ගැනීම්						
3.5	වෙනත් වගකීම්						
3.6	මුළු ණය ගැනුම්කරුවන් ගණන						
3.9	මුළු සේවක ගණන						
4	**යෝජිත ව්‍යාපාරික ස්ථානය වසා දැමීමෙන් පසු වත්කම්, වගකීම් සහ සේවකයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරන්න.**						
5	**සහතික කිරීම**						
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.						
	නම :			නම :			
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරී			තනතුර : අනුකූලතා නිලධාරී			
	අත්සන :			අත්සන :			
	දිනය :			දිනය :			

උපලේඛන (ඉ)

පෝරම 3 : ව්‍යාපාරික ස්ථානයක පවත්නා ස්ථානය වෙනස් කිරීම

1	**සාමාන්‍ය**					
1.1	විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නම:					
1.2	පවත්නා ස්ථානය වෙනස් කිරීමට යෝජිත ව්‍යාපාරික ස්ථානයේ වර්ගය (X):					
	ශාඛාව		එකතු කිරීමේ මධ්‍යස්ථානය		වෙනත් (විස්තර කරන්න)	
1.3	යෝජිත ස්ථානය වෙනස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත් දිනය:					
1.4	පවත්නා ස්ථානය වෙනස් කිරීමට හේතු:					
2	**ස්ථානය**					
2.1	**පවතින**					
	(අ) පරිපාලන දිස්ත්‍රික්කය					
	(ආ) නගරය					
	(ඇ) පළාත් පාලන අධිකාරිය					
	(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය					
	(ඉ) තැපැල් ලිපිනය					
2.2	**නව (යෝජිත)**					
	(අ) පරිපාලන දිස්ත්‍රික්කය					
	(ආ) නගරය					
	(ඇ) පළාත් පාලන අධිකාරිය					
	(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය					
	(ඉ) තැපැල් ලිපිනය					
3	පවතින ස්ථානය වෙනස් කිරීම සඳහා ආර්ථික ශක්‍යතා අධ්‍යයනයක් කර ලේඛන ගත කර පවතීද?					ඔව් /නැත
4	යෝජිත ස්ථානය වෙනස් කිරීම සඳහා අදාළ රජයේ අධිකාරි ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතීන්/අවසරයන් සහ පොලිස් ස්ථානයේ අනුමැතිය සහිත සහතිකය ලබා ගත්තේද?					ඔව් /නැත
5	**සහතික කිරීම**					
	සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ.					
	නම :			නම :		
	තනතුර : ප්‍රධාන විධායක නිලධාරී			තනතුර : අනුකූලතා නිලධාරී		
	අත්සන :			අත්සන :		
	දිනය :			දිනය :		

2020 අංක 09 දරන චක්‍රලේඛය 2020 සැප්තැම්බර් 30

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන කාලය දීර්ඝ කිරීම

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සහ කොවිඩ්-19 ව්‍යසනය නිසා සංචාරක ක්ෂේත්‍රයට සිදු වූ බලපෑම සැලකිල්ලට ගනිමින් සංචාරක ක්ෂේත්‍රය සඳහා 2019 අප්‍රේල් මස සිට ණය සහන යෝජනා ක්‍රම ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කර ඇත. දැනට පවත්නා සංචාරක සීමා කිරීම්, ආර්ථික කටයුතුවල සිදුවී ඇති බාධාවන් සහ සංචාරක අමාත්‍යාංශය සහ අනෙකුත් සම්බන්ධිත නියෝජිත ආයතන විසින් කරන ලද කරුණු දැක්වීම් සැලකිල්ලට ගනිමින් කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 වන දින දක්වා තවත් මාස හයක කාලයකට දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙත දන්වා සිටී.

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සංචාරක ක්ෂේත්‍රය වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය අඩු මට්ටමක පැවතීම සහ සංචාරක ක්ෂේත්‍රය යළි නගා සිටුවීම සඳහා සංචාරක අමාත්‍යාංශය විසින් යෝජනා කර ඇති වැඩ පිළිවෙල සැලකීමේ දී ඉහත යෝජනා ක්‍රමය මඟින් බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ ස්ථායීතාවයට අහිතකර බලපෑමක් හෝ අනිසි පීඩනයක් ඇති නොවන බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. මේ අනුව, මෙම චක්‍රලේඛය ඉහත ණය සහන යෝජනා ක්‍රමය සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන වෙතින් එක සමානව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා නිකුත් කරන ලද්දක් වන අතර මෙම චක්‍රලේඛය මඟින් ලබාදෙන සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන ලෙස ගනුදෙනුකරුවන් වෙත අමතර ණය සහන ලබාදීමට බැංකු නොවන මූල්‍ය ආයතන වෙත හැකියාව ඇත.

1. පොදු කොන්දේසි හා නියමයන්

   i. සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්

   (අ) කොවිඩ්-19 නිසා බලපෑමට පත් සහ පහත ආයතන සමඟ ලියාපදිංචි වී ඇති පුද්ගලයන් හා ව්‍යාපාර:

      i) සංචාරක අමාත්‍යාංශය

      ii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

      iii) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජිතායතන

      iv) ප්‍රාදේශීය සභා, නගර සභා හෝ මහ නගර සභා වැනි පළාත් පාලන ආයතන (කෙසේ නමුත් මෙම ආයතන එවැනි ව්‍යාපාර ණය සහන ලබාගැනීමේ දී ඉහත i), ii), සහ iii) හි සඳහන් සංචාරක කටයුතු පිළිබඳ ආයතනයන් හා ලියාපදිංචි විය යුතුය.)

      v) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

      vi) ශ්‍රී ලංකා හෝටල්කරුවන්ගේ සංගමය

   (ආ) කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර වල සේවා නියුක්තිකයන්. මෙහිදී, අදාළ සේවා නියුක්තිකයා ඉහත (අ) හි සඳහන් ආයතනයක ලියාපදිංචි ව්‍යාපාරයක සේවයේ නිරත වීම ප්‍රමාණවත් ලෙස සැලකිය යුතුය.

   ii. 2019 අප්‍රේල් 18 දින හෝ ඉන් පසු දිනක් වන විට සක්‍රීය කාණ්ඩයේ පැවති සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන් වෙත ලබා දුන් ණය සහ 2020 මාර්තු 27 වන දින නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛය අනුව ප්‍රතිලේඛනගත කළ අක්‍රීය කාණ්ඩයේ ණය පහසුකම් මෙම යෝජනා ක්‍රමය මගින් සහන ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත.

   iii. ණය සහන කාලය යන්නට 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා තවදුරටත් මාස හයක කාලසීමාවකට මූලික ණය මුදල සහ පොලිය කල් තැබීම අදහස් වේ.

   iv. මෙම ණය සහනය ලබා ගැනීමට අපේක්ෂා කරන, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් 2020 ඔක්තෝබර් 25 දින හෝ ඊට පෙර අදාළ බැංකු නොවන මූල්‍ය ආයතන වෙත ඉල්ලීමක් කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතනය විසින් ගිවිසුමේ නියමයන් හා කොන්දේසි සකස් කර අවසන් වීමෙන් පසු 2020 නොවැම්බර් 30 දිනට පෙර සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් සමඟ නව ගිවිසුමකට එළඹිය යුතුය.

   v. මෙම ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලබන, එහෙත් තම ණය ආපසු ගෙවීම සඳහා හැකියාවක් ඇති ගනුදෙනුකරුවන් මෙම ණය සහන කාලය දීර්ඝ කිරීමට අයදුම් නොකොට, සිය ණය පහසුකම් ආපසු ගෙවීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

   vi. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අදාළ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සලකා බලා එම ඉල්ලීම් සපුරාලීමට කටයුතු කළ යුතු වේ.

vii. 2020 අංක 03 සහ 2020 අංක 04 දරන විස්තර සටහන්වල සඳහන් වන පරිදි පොලී රහිත කාලීන ණය සඳහා ගෙවිය යුතු වාරිකය (එනම් මීට පෙර ණය සහනය සඳහා එනම්, 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා කාලය සඳහා උපචිත පොලිය) සුදුසුකම් ලැබූ ගනුදෙනුකරුවන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් 2021 අප්‍රේල් 01 දින සිට ආරම්භ කර අයකර ගැනීමේ හැකියාව පවතී.

2. ණය සහනයන් හි සැකැස්ම

i. 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා ණය සහන කාල සීමාව තුළ අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය කාලීන ණයකට පරිවර්තනය කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

ii. මෙලෙස පරිවර්තනය කරන ලද ණය යලි අයකර ගැනීම ආරම්භ කිරීම 2021 ජූලි 01 දිනෙන් පසුව සිදු කළ යුතුය.

iii. මෙලෙස පරිවර්තනය කරන ලද ණය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනක දී පවත්වන දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොලී අනුපාතයට සියයට 5.5 ක් එකතු කළ වාර්ෂික පොලියට නොවැඩි පොලී අනුපාතයක් අය කළ හැකි අතර එම වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

iv. මෙම ණය ආපසු අය කරගැනීමේ අවම කාලය වසර දෙකක් වනු ඇත. කෙසේ නමුත්, ණය ගනුදෙනුකරු විසින් අදාළ ණය ඊට අඩු කාලයක් තුළ දී පියවීමට අදහස් කරන්නේ නම් හෝ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ආපසු පියවීමට වසර දෙකට වඩා වැඩි කාලයක් ලබා දීමට සූදානම් අවස්ථාවන් හිදී එවැනි ඉල්ලීම් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පහසුකම් සැලසිය හැක. මෙලෙස, ආපසු ගෙවීමේ කාලය වසර දෙකට වඩා වෙනස් වන විට ඒ සඳහා සුදුසු පොලී අනුපාතයක් ගනුදෙනුකරු හා බැංකු නොවන මූල්‍ය ආයතනය විසින් ගිවිසගත යුතුවේ.

v. මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන සක්‍රීය සහ අක්‍රීය ණය සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2020 ඔක්තෝබර් 01 දින වන විට එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොලී කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුළ දී දඩ පොලී එකතු කිරීම හෝ අය කිරීම නොකළ යුතුවේ.

3. වාර්තාකරණ අවශ්‍යතා

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන යෝජනා ක්‍රමය යටතේ ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් සෑම මසකම 30 වැනි දින වන විට පවතින තොරතුරු, 2020 දෙසැම්බර් 01 දින සිට සෑම මසකම වැඩ කරන දින 15 තුළ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය. මේ පිළිබඳ වාර්තාකරණ ආකෘතියක් ඇමුණුම් I හා II හි දක්වා ඇත.

4. අවලංගු කිරීම්

කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට සහන සැපයීමේ ක්‍රියාමාර්ග මැයෙන් 2020 ජූලි 16 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 07 දරන චක්‍රලේඛය මෙමගින් අවලංගු කෙරේ.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ඇමුණුම I

2020 අංක 09 දරන චක්‍රලේඛය

සංචාරක කර්මාන්තයට ලබා දුන් ණය සහනය ලබා ගත් ණය ගැනුම්කරුවන්ගේ විස්තර

අයදුම් කරන ලද/ණය සහන ලබා දුන් ගිවිසුම්

බලපත්‍රලාභී මුදල් සමාගම/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නම : ..... අවසානයේ දී

			2019 අංක 01 දරන චක්‍රලේඛය		2020 අංක 04 සහ 05 දරන චක්‍රලේඛය		2020 අංක 09 දරන චක්‍රලේඛය									
අනුක්‍රමික අංකය	ගිවිසුම් අංකය	ණය ගැනුම්කරුගේ නම	ණය සහන ලබා දෙන අවස්ථාවේ ගෙවිය යුතු ණය මුදල (රු. '000)	ණය සහන සඳහා සලකා බලනු ලැබූ ප්‍රමාණය (රු.'000)	ණය සහන ලබා දෙන අවස්ථාවේ ගෙවිය යුතු ණය මුදල (රු. '000)	ණය සහන සඳහා සලකා බලනු ලැබූ ප්‍රමාණය (රු.'000)	ණය සහන ලබා දෙන අවස්ථාවේ ගෙවිය යුතු ණය මුදල (රු. '000)	ණය සහන සඳහා සලකා බලනු ලැබූ ප්‍රමාණය (රු.'000)	2019.04.18 දින සිට අනුමත කරන ලද ණය සහන ගණන	ණය සහන සඳහා මුළු කාලසීමාව (මාස)	ණය සහන සඳහා සලකා බලනු ලැබූ මුළු ප්‍රමාණය (රු.'000)	2020 අංක 03 සහ 2020 අංක 04 යන පැහැදිලි කිරීමේ සටහන් යටතේ උපචිත පොලී සඳහා නව කාලීන ණය පහසුකම		2020 අංක 09 චක්‍රලේඛය යටතේ නව කාලීන ණය පහසුකම		ණය සහන යෝජනා ක්‍රමයේ නත්ත්වය (අනුමැතිය අපේක්ෂිත/ප්‍රදානය කරන ලද)
												ආපසු ගෙවීමේ කාලය (මාස)	පොලී අනුපාතය (%)	ආපසු ගෙවීමේ කාලය (මාස)	පොලී අනුපාතය (%)	
1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17
											=5+7+9					

5,7,9 තීරුව: කල් දැමූ මුළු වාරික ප්‍රමාණය
10 වන තීරුව: ණය සහන ලබා ගත්තේ 1,2 සහ 3 වතාවන් හිඳී යන්න සඳහන් කරන්න
11 වන තීරුව: 2019.04.18 දින සිට ලබා දී ඇති ණය සහන ලබා දී ඇති මුළු මාස ගණන

කරුණාකර ඊළඟ මාසයේ 15 වන දිනට විද්‍යුත් තැපෑලෙන් dsnbfi@cbsl.lk වෙත ලැබීමට සලස්වන්න.

ඇමුණුම II

2020 අංක 09 දරන චක්‍රලේඛය

සංචාරක කර්මාන්තයට ලබා දුන් ණය සහනය ලබා ගත් ණය ගැනුම්කරුවන්ගේ විස්තර

ප්‍රතික්ෂේපිත ගිවිසුම්

බලපත්‍රලාභී මුදල් සමාගම/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නම : ..... අවසානයේ දී

අනුක්‍රමික අංකය	ගිවිසුම් අංකය	ණය ගැනුම්කරුගේ නම	ණය සහන ලබා දෙන අවස්ථාවේ ගෙවිය යුතු ණය මුදල (රු. '000)	ණය සහන ලබා නොදීම සඳහා හේතු	අදහස්

කරුණාකර ඊළඟ මාසයේ 15 වන දිනට විද්‍යුත් තැපෑලෙන් dsnbfi@cbsl.lk වෙත ලැබීමට සලස්වන්න.

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 06 දරන විධානය 2020 සැප්තැම්බර් 30

ද්‍රවශීලතා වත්කම් විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව, කොවිඩ්-19 ව්‍යසනය හේතුවෙන් ඇති වී තිබෙන වර්තමාන අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වය සළකා බලමින්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නිකුත් කර ඇති 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශීල වත්කම්) විධානයට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් පහත සංශෝධනයන් නිකුත් කෙරේ.

ඒ අනුව 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශිල වත්කම්) විධානයේ විධාන අංක 01 පහත විධාන මඟින් ප්‍රතිස්ථාපනය කරනු ලබයි.

1. රඳවාගත යුතු අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය

සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම, ඕනෑම දිනයක ව්‍යාපාර කටයුතු අවසාන කරන අවස්ථාවේ දී අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යා යුතු අතර, එම ප්‍රමාණය කොටස් හිමියන්ට ඇති වගකීම්, සුරැකුම්කරණය සහ වත්කම් වලින් සුරක්ෂිත දිගුකාලීන (අවුරුදු 1ට වැඩි) ණය ගැනීම් හැර මුළු වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමන්ගේ ප්‍රමාණයෙන් සියයට පහට නොඅඩු විය යුතුය.

2. වලංගු කාලය

වර්තමාන අභියෝගාත්මක පරිසරය හේතුවෙන් ද්‍රවශීලතාවයෙන් පීඩාවට පත්වී සිටින විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලට පහසුකම් සැලසීම සඳහා මෙම විධානයන් 2021 මාර්තු 31 දක්වා මාස හය (6) ක කාලයක් සඳහා වලංගු වේ.

අත්සන් කළේ

ජේ. ඩී. එස්. ජේ. නානායක්කාර
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 07 දරන විධානය 2020 සැප්තැම්බර් 30

ද්‍රවශීලතා වත්කම් විධානය සංශෝධනය කිරීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

කොවිඩ්-19 ව්‍යසනය හේතුවෙන් ඇති වී තිබෙන අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වය සළකා බලමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වා ගත යුතු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය පිළිබඳව මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති විධානයන්ට පහත සංශෝධන නිකුත් කෙරේ.

ඒ අනුව, 2013 අංක 04 දරන මුදල් සමාගම් (ද්‍රවශීලතා වත්කම්) විධානයේ විධාන අංක 2, 3 සහ 4.1 පහත විධාන මඟින් ප්‍රතිස්ථාපනය කෙරේ.

2. කාලීන තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු සහ පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා වන ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය

2011 අංක 42 දරන මුදල් සමාගම් පනතේ 74 වන වගන්තිය අනුව බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ඕනෑම දිනයක ව්‍යාපාර කටයුතු අවසාන කරන අවස්ථාවේ දී අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වා ගත යුතු අතර එය,

i. සීයයට හයක (6) ප්‍රතිශතයක්:
   (අ) බලපත්‍රලාභී මුදල් සමාගම එකී දිනයේ ව්‍යාපාර කටයුතු අවසාන වන විට ලැබුණු කාලීන තැන්පතු වල ගෙවිය යුතුව පවතින වටිනාකම හා ගෙවිය යුතු උපචිත පොලිය; සහ

   (ආ) එම බලපත්‍රලාභී මුදල් සමාගම විසින් එකී දිනයේ ව්‍යාපාර කටයුතු අවසාන වන විට නිකුත් කරන ඇති පැවරිය නොහැකි තැන්පතු සහතික වල මුහුණත වටිනාකම හා ගෙවිය යුතු උපචිත පොලිය; සහ

ii. එකී දිනයේ ව්‍යාපාර කටයුතු අවසාන වන විට එම බලපත්‍රලාභී මුදල් සමාගම බාරගෙන ඇති ඉතිරි කිරීමේ තැන්පතු වලින් ආපසු නොගෙවා ඇති ශේෂයන් සහ ගෙවිය යුතු උපචිත පොලියෙන් සියයට දහයක් (10)

3. ණය ගැනීම සඳහා වන ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය

2 වන වගන්තියේ අවශ්‍යතාවයට අමතරව, සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක්ම 2011 අංක 42 දරන මුදල් සමාගම් පනතේ 74 වන වගන්තියෙහි අර්ථකථනය කර ඇති පරිදි අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යා යුතු අතර, එම ප්‍රමාණය ඕනෑම දිනක ව්‍යාපාර කටයුතු අවසන් කරන අවස්ථාවේ දී, බලපත්‍රලාභී මුදල් සමාගමේ ප්‍රාග්ධන අරමුදලෙහි ඇතුළත් කර ඇති ණය ගැනීම් සහ සමාගමේ ඕනෑම වත්කමක්, එහි වෙළඳපොළ අගයට වඩා අඩු ණය වටිනාකමක් වෙනුවෙන් උකසකින් සුරක්ෂිත කරන ලද ණය ගැනීම් හැර අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන මුළු පිටහිටි ණය ගැනීම් වල වටිනාකම සහ වෙනත් ඕනෑම ගෙවිය යුතු වටිනාකමකින් සියයට පහකට (5) නොඅඩු විය යුතු අතර, එම වටිනාකම වත්කම් හා සුරැකුම් නොකළ විදේශ විනිමය ණය ගැනීම්වල වෙළෙඳපොළ වටිනාකම නොඉක්ම විය යුතුය.

4. ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් අවශ්‍යතාවයන්

4.1 බලපත්‍රලාභී මුදල් සමාගම් සෑම විටම, පෙර මුදල් වර්ෂයේ මාස දොළහේ එක් එක් මාසය අවසානයට පැවති ස්වකීය තැන්පතු වගකීම් සහ ණය ගැනීම්වල එකතුවේ සාමාන්‍යයෙන් සියයට පහකට (5) සමාන වත්කම්, ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, රජයේ භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වශයෙන් පවත්වා ගත යුතුය.

5. වලංගු කාලපරිච්ඡේදය

වර්තමාන අභියෝගාත්මක තත්ත්වය මත ද්‍රවශීලතාව පිළිබඳව අපහසුතාවයන්ට පත්ව සිටින බලපත්‍රලාභී මුදල් සමාගම් වලට පහසුකම් සැලසීම සඳහා විධාන අංක 2, 3 සහ 4.1, 2021 මාර්තු 31 දක්වා මාස හයක (6) කාල සීමාවක් සඳහා බල පැවැත්වේ.

6. පසුගිය විධානයන් අහෝසි වීම

2020 අංක 02 දරන මුදල් ව්‍යාපාර පනත (ද්‍රවශීල වත්කම් සඳහා සංශෝධන) විධානය, 2020 ඔක්තෝබර් 01 සිට බලපැවැත්වෙන පරිදි අහෝසි වේ.

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්

මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2020 අංක 11 දරන චක්‍රලේඛය 2020 නොවැම්බර් 09

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම

කොවිඩ්-19 ව්‍යසනයේ දෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණපා ඇති ගැටළු සලකා බලමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) විසින් කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන්හට ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) 2020 ඔක්තෝබර් 01 දින සිට පහතින් සඳහන් කර ඇති පරිදි තවත් මාස හයක කාලයකට දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන වෙත දන්වා සිටී.

මේ අනුව, සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඉහත යෝජනා ක්‍රමය ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කරවීම තහවුරු කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත. එසේ වුවද, ගනුදෙනුකරුට ලැබෙන සමස්ත ප්‍රතිලාභය මෙම චක්‍රලේඛය මඟින් පිරිනැමෙන සහනයන්ට වඩා අඩු නොවන සේ යම්කිසි බැංකු නොවන මූල්‍ය ආයතනයකට ගනුදෙනුකරුවන් වෙත අමතර ණය සහන ලබාදීමට හැකියාව ඇත.

1. ණය සහන කාල සීමාව සහ එය බලපැවැත්වෙන අයුරු

(අ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් හට ඔවුන් විසින් මුහුණපා ඇති මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 2020 ඔක්තෝම්බර් මස 01 දින සිට ඇරඹෙන පරිදි මාස හයකට නොවැඩි කාලයක් හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාල සීමාවක් සඳහා ණය සහන කාල සීමාවක් බැංකු නොවන මූල්‍ය ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් බලය පවරා ඇති අධිකාරියක් විසින් ලබා දී ඇති අභ්‍යන්තර මාර්ගෝපදේශ වලට අනුකූලව ලබා දිය යුතුය.

(ආ) දුෂ්කරතා වලට මුහුණපා ඇති ගනුදෙනුකරුවන් විසින් කර ඇති ඉල්ලීම අනුව මුල් ණය මුදල සහ පොලිය යන කොටස් දෙක සඳහාම ණය සහනය පිරිනැමිය යුතුය.

2. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය

සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් විසින් 2020 නොවැම්බර් 25 දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් ඉල්ලුම් කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් දුෂ්කරතා වලට මුහුණපා ඇති ගනුදෙනුකරුවන් හට ණය සහනය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට සහ ලබා දෙනු ලබන සහන, අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම් කළ යුතු ආකාරය ආදී තොරතුරු ඇතුළත් සරල ආකෘතියක් විද්‍යුත් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුළත්ව) සහ/හෝ මුද්‍රිත මාධ්‍යයෙන් ලබා දීමට කටයුතු කළ යුතුය.

3. සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන්

(අ) සංචාරක, ඇඟලුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි, සහ සම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic suppliers) අපනයන ක්ෂේත්‍රයේ සෘජු හා වක්‍ර ව්‍යාපාර ඇතුළු කොවිඩ්-19 නිසා වැඩ කටයුතු අඩාල වූ සහ දේශීය සහ විදේශයන්හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් (lockdowns) නිසා අගතියට පත් ව්‍යාපාර, ව්‍යාපාර හිමිකරුවන් සහ පුද්ගලයන්.

(ආ) නිෂ්පාදන, මූල්‍ය නොවන සේවා, කෘෂිකාර්මික (සැකසුම් කර්මාන්තය ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතු කිරීම් හා අවසර ලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයන් (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යන්න මෙහිදී රුපියල් බිලියන 1 ට අඩු පිරිවැටුම් සහිත ව්‍යාපාර වේ).

(ඇ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම රැකියා හෝ ආදායම් අහිමි වූ ස්වයං රැකියා ව්‍යාපාර සහ පුද්ගලයන්.

4. සුදුසුකම් ලබන ණය පහසුකම්

(අ) 2020 මාර්තු 31 දින වන විට හෝ ඊට පසු දිනක දී සක්‍රීය කාණ්ඩයේ පැවති කාලීන ණය, කල්බදු මුල්‍යකරණ පහසුකම්, උකස්, අයිරා වැනි ණය පහසුකම්, වෙළඳ මුල්‍යන හෝ වෙනත් ණය පහසුකම්.

(ආ) ණය කාඩ්පත් පහසුකම් ලබා ගෙන ඇති සහන ලැබීමට සුදුසුකම්ලත් ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීම් කරන්නේ නම්, ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන සුදුසු ව්‍යාපාර තීරණ ගත යුතුය.

5. ණය සහන කාලයේ සැකැස්ම

(අ) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා ණය සහන කාල සීමාව තුළ අයවීමට නියමිත මුල් ණය මුදල සහ පොලිය කාලීන ණයකට පරිවර්තනය කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

(ආ) ණය ගනුදෙනුකරු විසින් කාලීනව පොලිය ගෙවිය යුතු අයිරා පහසුකම් වලට සමාන ණය පහසුකම් සඳහා, 2020 ඔක්තෝම්බර් 01 සිට 2021 මාර්තු 31 හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා අයවීමට ඇති පොලිය කාලීන ණයකට පරිවර්තනය කළ යුතුය.

(ඇ) උකස් පහසුකම් වල ගෙවිය යුතු දිනය සහන කාල සීමාව තුළ යෙදී ඇත්නම් එම පහසුකම් සඳහා ගෙවිය යුතු දිනය 2021 අප්‍රේල් 01 දින දක්වා දීර්ඝ කළ යුතුය.

(ඈ) මෙලෙස පරිවර්තනය කරන ලද ණය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනකදී පවත්වන දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොලී අනුපාතයට සියයට 5.5 ක් එකතු කළ වාර්ෂික පොලියට නොවැඩි පොලී අනුපාතයක් අය කළ හැකි අතර එම වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

(ඉ) මෙම ණය ආපසු අය කර ගැනීමේ අවම කාලය වසර දෙකක් වන අතර එම ණය අය කර ගැනීම 2021 අප්‍රේල් 01 දින සිට ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, ගනුදෙනුකරු විසින් ඉහත කාලීන ණයකට හරවන ලද මුදල වසර දෙකකට වඩා අඩු කාලයකින් ගෙවා දැමීමට අදහස් කරන්නේ නම් හෝ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අවුරුදු දෙකකට වඩා වැඩි කාල සීමාවක් ණය ගෙවීම සඳහා ලබා දීමට අපේක්ෂා කරන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතනයන්ට එම ඉල්ලීම් සඳහා පහසුකම් සැලසිය හැකිය. මෙලෙස, ආපසු ගෙවීමේ කාලය වසර දෙකට වඩා වෙනස් වන විට ඒ සඳහා සුදුසු පොලී අනුපාතයක් ගනුදෙනුකරු හා බැංකු නොවන මූල්‍ය ආයතනය විසින් ගිවිසගත යුතුවේ.

(ඊ) 2020 ඔක්තෝබර් 01 දින වන විට ණය සඳහා, එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොලී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුළ දී දඩ පොලී එකතු කිරීම හෝ අය කිරීම නොකළ යුතුවේ.

(උ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන අනුමත කිරීමට ප්‍රථම ඒවායේ සැකැස්ම පිළිබඳව සුදුසුකම්ලත් ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

6. ණය සහන සඳහා ගිණුම්කරණය

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාලසීමාවට අදාළව ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ කොවිඩ්-19 ව්‍යසනය සම්බන්ධව මූල්‍ය වාර්තාකරණයේ දී සැලකිය යුතු දෑ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් යම් මාර්ගෝපදේශ සපයන්නේ නම් ඒවා හා අනුගතව කටයුතු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන හට මේ සම්බන්ධව අමතර මගපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

7. වාර්තාකරණ අවශ්‍යතා

2020 දෙසැම්බර් 15 දින සිට සෑම මසකම 15 සහ 30 වැනිදා වන විට තම ආයතනයෙන් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු අදාළ දිනයේ සිට වැඩ කරන දින 5 ක් තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කළයුතු ආකෘතිය ඉදිරියේදී යොමු කරනු ලැබේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2020 අංක 12 දරන චක්‍රලේඛය 2020 නොවැම්බර් 27

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම සඳහා නිකුත් කළ 2020 අංක 11 දරන චක්‍රලේඛය සඳහා වන සංශෝධන

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා ණය සහන කාලයක් ලබාදීම සඳහා නිකුත් කළ 2020 අංක 11 දරන චක්‍රලේඛය සඳහා පහත සංශෝධනයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබයි.

2020 අංක 11 දරන චක්‍රලේඛයේ 2 වන පරිච්ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබයි.

2. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය :

2.1. සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට ණය සහන ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් භාර දීමේ අවසන් දිනය 2020 දෙසැම්බර් මස 10 දක්වා දීර්ඝ කරන ලදී. බැංකු නොවන මූල්‍ය ආයතනයේ අවසන් තීරණය (ණය සහන ලබා දීම/ ප්‍රතික්ෂේප කිරීම) ඉල්ලුම්පත් භාර දී දින 45 ක් තුළ ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. මෙම පරිච්ඡේදයේ අනෙකුත් වගන්ති නොවෙනස්ව පවතී.

2.1 ඡේදය අවසන් වීමෙන් පසු පහත වගන්තිය 2 වන පරිච්ඡේදයට එකතු කරන ලදී.

2.2. සහන ලබා දීමට අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සැකසීම සහ ඒ සම්බන්ධයෙන් ශාඛා මට්ටමේ කාර්යය මණ්ඩලයට උපදෙස් ලබා දීම සියලුම ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ අනුකූලතා නිලධාරීන්ගේ වගකීම වේ.

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ 2020 අංක 01 2020 නොවැම්බර් 30

බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වන කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව

වඩා හොඳ අවදානම් කලමනාකරණ ප්‍රතිපත්ති සහ පරිචයන් තුළින් මූල්‍යමය ස්ථාවරභාවය සහතික කිරීම, තැන්පත්කරුවන්ගේ යහපත සහ මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය පවත්වා ගැනීම සඳහා පාලන ව්‍යුහය වැඩි දියුණු කිරීම යන කරුණු අරමුණු කර ගනිමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 13 වන වගන්තිය මඟින් පවරා ඇති බලතල අනුව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව පිළිබඳ පහත සඳහන් මාර්ගෝපදේශ නිකුත් කරයි.

මුදල් ව්‍යාපාර පනතෙහි 60 (2) වගන්තියට අනුව, 12 (5) වගන්තිය සහ 25 (1) වගන්තිය සමඟ කියවිය යුතු 12 (1) වගන්තිය ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවන්හි දී, පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට මුදල් මණ්ඩලය විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අධ්‍යක්ෂ) වෙත මෙයින් බලය පවරනු ලැබේ. මේ අනුව මුදල් ව්‍යාපාර පනතෙහි 31 සහ 37 වගන්ති යටතේ පහත සඳහන් නියාමන ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇත.

1. මාර්ගෝපදේශ වල අදාළත්වය

1.1 කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් වලට අදාළ වන අතර ඇතැම් ප්‍රාග්ධන පාදක ප්‍රේරක සපුරා නැති විට අදාළ වන අවම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග දක්වයි.

1.2 මෙම මාර්ගෝපදේශය 2022 ජූලි 01 දින සිට බලපැවැත්වේ.

2. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුවෙහි ප්‍රාග්ධන කාණ්ඩ

2.1 2018 අංක 03 දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා පිළිබඳ විධානය අනුව අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත වල අවශ්‍යතා මත පදනම්ව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩ පහක් ස්ථාපිත කර ඇත. (i) හොඳින් ප්‍රාග්ධනීකරණය වී ඇති; (ii) ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති ; (iii) ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති; (iv) සැලකිය යුතු ලෙස ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති; හෝ (v) අවදානම් සහගත ලෙස ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති.

2.2 රුපියල් බිලියන 100 ට අඩු වත්කම් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් සහ රුපියල් බිලියන 100 හෝ ඊට වැඩි වත්කම් සහිත ප්‍රාග්ධන කාණ්ඩයක් සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ වන කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන සීමාවන් පහත පරිදි වේ:

කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය	**රුපියල් බිලියන 100 ට වඩා අඩු වත්කම් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම්**	**රුපියල් බිලියන 100 ක හෝ ඊට වැඩි වත්කම් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම්**
	මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR)	
හොඳින් ප්‍රාග්ධනීකරණය වී ඇති	CAR ≥14%	CAR ≥16%
ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති	12.5% ≤ CAR <14%	14% ≤ CAR < 16%
ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති	9.5 % ≤ CAR <12.5%	10% ≤ CAR < 14%
සැලකිය යුතු ලෙස ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති	6.5% ≤ CAR < 9.5%	7% ≤ CAR <10%
අවදානම් සහගත ලෙස ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති	CAR <6.5%	CAR <7%

2.3 බලපත්‍රලාභී මුදල් සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ප්‍රාග්ධන මට්ටම් අධීක්ෂණය කළ යුතු අතර බලපත්‍රලාභී මුදල් සමාගමෙහි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය පිළිබඳව දැනුවත් විය යුතුය. නියාමන අවමය හෝ ඊට ආසන්න ප්‍රාග්ධන මට්ටම් සහිතව ක්‍රියාත්මක වන බලපත්‍රලාභී මුදල් සමාගම් වල කළමනාකාරිත්වය, බලපත්‍රලාභී මුදල් සමගමේ මෙහෙයුම් වලින් ප්‍රාග්ධන අනුපාත කෙරෙහි වන බලපෑම කෙරෙහි ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති, සැලකිය යුතු අයුරින් ඌණ ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති හා අවදානම් සහගත ලෙස ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ වන සීමා කිරීම් හා අවශ්‍යතා වලට යටත්වීම වලක්වා ගැනීම බලපත්‍රලාභී මුදල් සමාගම් අවධානය යොමු කළ යුතුය.

3. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුවෙහි ප්‍රතිපාදන

3.1 සෑම කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය නියම කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාවලියකට යටත් වේ. එක් එක් කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය හරහා බලපත්‍රලාභී මුදල් සමාගම පහළට ගමන් කරන විට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වඩ වඩාත් දැඩි වේ.

කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය අනුව අදාළ වන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පහත පරිදි වේ:

(අ) හොඳින් ප්‍රාග්ධනීකරණය වී ඇති -

(i) බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ලාභාංශ බෙදීමෙන් පසුව ඌණ ලෙස ප්‍රාග්ධනීකරණය වේ නම් හෝ අඩු ප්‍රාග්ධන කාණ්ඩයක් දක්වා පහත වැටේ නම් ලාභාංශ බෙදා හැරීම අවහිර කිරීම.

(ආ) ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති -

(i) හොඳින් ප්‍රාග්ධනීකරණය වී ඇති කාණ්ඩයට අදාළ පියවර ගැනීම;
(ii) ආතති පරීක්ෂණ සඳහා සහභාගී වීම.

(ඇ) **ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති** -

(i) ආතති පරීක්ෂණ සඳහා සහභාගී වීම.

(ii) ලාභාංශ බෙදා හැරීම අවහිර කිරීම හෝ ලාභ නැවත මෙරටට ගෙන්වා ගැනීම;

(iii) වත්කම් වර්ධන සීමාවන්ට යටත්ව ප්‍රාග්ධන තත්ත්වය තවදුරටත් පිරිහීමට ලක්වන/මුදල් ආපසු ගෙවීමේ ණය හැර නව ණය ලබා දීම අවහිර කිරීම/ මාර්ගෝපදේශ 8 ට යටත්ව සංවේදී/අධි අවදානම් අංශවලට, එනම් දේපල වෙළඳාම්, ව්‍යාපාර ප්‍රාග්ධනය ආදිය සඳහා නව ණය ලබා දීම අවහිර කිරීම;

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියකින් තොරව ශාඛා විවෘත කිරීම ඇතුළු ව්‍යාපාර පුළුල් කිරීම හා නව ව්‍යාපාරික මාර්ග අවහිර කිරීම;

(v) එනම්, තැන්පතු රැස් කිරීම සීමා කිරීම මාර්ගෝපදේශ 9 ට අනුව තැන්පතු සඳහා ගෙවිය යුතු පොලී අනුපාත පිළිබඳව සීමා පැනවීම සහ උපරිම තැන්පතු ප්‍රමාණ නියම කිරීම;

(vi) රක්ෂිත තැන්පතු සීමාව ඉක්මවමින් පුද්ගලයන්ගෙන් නව තැන්පතු ලබා ගැනීම යොදවාගැනීම අවහිර කිරීම/රක්ෂිත තැන්පතු සීමාවට වඩා වැඩි ප්‍රමාණයක් තැන්පත් කර ඇති තැන්පත්කරුවන්ට තැන්පතු නැවත ගෙවීමට පියවර ගැනීම;

(vii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙනත් කාල රාමුවක් නියම නොකරන්නේ නම්, එහි ප්‍රාග්ධනීකරණ තත්ත්වය පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දුන් දින සිට දින 30 ක් ඇතුළත මාර්ගෝපදේශ 7 ට අනුව පිළිගත හැකි ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්මක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ;

(viii) මූල්‍ය පාලිත සමාගම් වල හිමිකම් අඩු කිරීම;

(ix) සාක්ෂාත් කරගත හැකි වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු රැස් කිරීම;

(x) අවශ්‍ය නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද පරිදි වෝහාරික විගණනයක් සිදු කර වගකිව යුතු පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

(ඈ) **සැලකිය යුතු ලෙස ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති** -

(i) ඌණ ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති කාණ්ඩයට පනවා ඇති පියවර ගැනීම සහ එයට අමතරව;

(ii) අධ්‍යක්ෂවරුන්ට සහ නිලධාරීන්ට වන්දි, ප්‍රසාද දීමනා සහ ප්‍රතිලාභ ගෙවීම අවහිර කිරීම/සීමා කිරීම;

(iii) නව තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ/හෝ තැන්පතු අලුත් කිරීම තහනම් කිරීම;

(iv) බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අනෙකුත් ක්‍රියාකාරකම් වෙනස් කිරීම, අඩු කිරීම හෝ අවසන් කිරීම සඳහා නියම කිරීම;

(v) බලපත්‍රලාභී මුදල් සමාගම වෙනත් ආයතනයක් විසින් අත්පත් කර ගැනීම් හෝ වෙනත් ආයතනයක් සමඟ ඒකාබද්ධ කිරීම නියම කිරීම;

(vi) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්ව නව අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම, අධ්‍යක්ෂවරුන් හෝ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සේවයෙන් පහ කිරීම මඟින් කලමනාකරණ කණ්ඩායම / අධ්‍යක්ෂ මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නියම කිරීම;

(vii) ඕනෑම ආයෝජනයක්, පුළුල් කිරීමක්, අත්පත් කරගැනීමක්, වත්කම් අලෙවියක් හෝ වෙනත් සමාන ක්‍රියාවක් ඇතුළත්ව සුපුරුදු ව්‍යාපාර කටයුතු වලදී හැර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරය රහිතව වෙනත් වැදගත් ගනුදෙනුවකට (අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම් වල මූලික ප්‍රාග්ධනයෙන් සියයට 10 කට වඩා වටිනාකමින් යුත් වත්කම් මිලට ගැනීම, ආයෝජනය කිරීම හෝ විකිණීම ලෙස අර්ථ දක්වා ඇත) එළඹීම අවහිර කිරීම.

(viii) නව ණය ලබා දීම තහනම් කිරීම;

(ix) අවශ්‍යතාවය මත කලමනාකරණ මණ්ඩලයක් පත් කිරීම;

(x) අවශ්‍යතාවය මත මුදල් ව්‍යාපාර පනතෙ හි 31 වන වගන්තිය යටතේ ව්‍යාපාරය අත්හිටුවීම.

(ඉ) **අවදානම් සහගත ලෙස ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති**

(i) බලපත්‍රලාභී මුදල් සමාගම අවදානම් සහගත ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති තීරණය කිරීමෙන් දින තිහක් (30) ඇතුළත මුදල් ව්‍යාපාර පනතෙහි 37 වන වගන්තියට අනුකූලව ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.

4. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුවෙහි ප්‍රාග්ධන කාණ්ඩයෙහි වෙනස් වීමක් පිළිබඳව දැනුම් දීම

4.1 සාමාන්‍ය අධීක්ෂණ ක්‍රියාවලියේ කොටසක් ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් වල ප්‍රාග්ධන මට්ටම් තක්සේරු කෙරේ. අනුප්‍රාප්තික කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාණ්ඩයකට ස්ථානගත කිරීම සඳහා ප්‍රාග්ධන මට්ටම් පිරිහී ගියහොත් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දැනුම් දෙනු ලැබේ.

4.2 බලපත්‍රලාභී මුදල් සමාගමෙහි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය වෙනස් වී ඇති බව අධ්‍යක්ෂ විසින් විමර්ශණයක් මඟින් හෝ වෙනත් ආකාරයකින් තීරණය කළ විට, ඒ අනුව, අධ්‍යක්ෂ විසින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දැනුම් දිය යුතුය.

4.3 දැනුම් දීමේ ලිපිය ලැබී වැඩ කරන දින දහයක් (10) ඇතුළත කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රග්ධන කාණ්ඩයේ වෙනස සාධාරණීකරණය කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම වෙත අවස්ථාවක් ලබා දෙනු ඇත.

4.4 තවද, වාර්තාකරණ කාල පරිච්ඡේදයන් අතර අඩු කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩයකට බලපත්‍රලාභී මුදල් සමාගමක් ස්ථානගත කිරීමට හේතු වන සැළකිය යුතු සිදුවීමක් සිදුවුවහොත්, බලපත්‍රලාභී මුදල් සමාගමෙහි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන අනුපාත වෙනස් වී ඇති (එනම් බාහිර විගණනයක ප්‍රතිඵලයක් ලෙස ගිණුම් වෙනස් කිරීම් හේතුවෙන්) බව බලපත්‍රලාභී මුදල් සමාගම විසින්, අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය. සැලකිය යුතු සිදුවීමෙන් වැඩ කරන දින දහයක් (10) ඇතුළත බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලිඛිතව වෙනස් කිරීම පිළිබඳ විස්තර සැපයිය යුතුය.

4.5 ඉහළ කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩයක් සඳහා අවම අවශ්‍යතා සපුරාලන බවට ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම්, වාර්තා කිරීමේ කාලයන් අතර බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ඔවුන්ගේ කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය සමාලෝචනය කරන ලෙස ඉල්ලා සිටිය හැකිය. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ ඇති අභියාචනා කමිටුවක් අභියාචනය සඳහා වන ඉල්ලීම සමාලෝචනය කරන අතර වැඩකරන දින හතක් (7) ඇතුළත අභියාචනය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ඇත.

5. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය තීරණය කිරීමේ දී අධීක්ෂණ අභිමතය

5.1 අධ්‍යක්ෂ විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ශක්තිමත් අධීක්ෂණ රාමුවක් පවත්වා ගෙන යන අතර ශක්තිමත් ස්ථානීය හා දුරස්ථ සමාලෝචන ක්‍රියාවලියක් හරහා ප්‍රාග්ධනය, වත්කම්වල ගුණාත්මකභාවය, ද්‍රවශීලතාවය, මෙහෙයුම් නිරවද්‍යතාවය යනාදිය නිරන්තරයෙන් ඇගයීමට ලක් කරයි. අධ්‍යක්ෂවරයා හට බලපත්‍රලාභී මුදල් සමාගම් වල මූල්‍යමය වශයෙන් ඇති විය හැකි පිරිහීම හඳුනා ගැනීමටත්, අවදානම් ආකෘතිය තක්සේරු කිරීමටත් සුදුසු අධීක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමටත් මෙම ක්‍රියාමාර්ග උපකාරී වේ. බලපත්‍රලාභී මුදල් සමාගමක් අගතිගාමී හෝ දුර්වල තත්ත්වයක සිටින බව හෝ අනාරක්ෂිත ක්‍රියාවක නිරත වෙන බව තීරණය කර ඇති නම්, යම් යම් තත්ත්වයන් යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම අනුප්‍රාප්තික කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩයට නැවත වර්ගීකරණය කිරීම අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ හැකිය. නැවත වර්ගීකරණය කිරීමෙන් පසු, බලපත්‍රලාභී මුදල් සමාගම කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය යටතේ එම කාණ්ඩයට අදාළ සීමාවන්, අවශ්‍යතා සහ සීමාවන්ට හෝ වැඩි ගණනකට යටත් විය හැකිය.

5.2 බලපත්‍රලාභී මුදල් සමාගම අගතිගාමී හෝ දුර්වල තත්ත්වයෙන් ක්‍රියාත්මක වන බවට තීරණය කිරීමේ සාක්ෂි උපුටා දක්වමින් අධ්‍යක්ෂ විසින් එහි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය වෙනස් කිරීම මුදල් මණ්ඩලය වෙත නිර්දේශ කරනු ඇත. මුදල් මණ්ඩලය සොයාගැනීම් සමඟ එකඟ වන්නේ නම්, යෝජිත තත්ත්වය වෙනස් කිරීම පිළිබඳව දැනුම් දීමක් සහ සංශෝධිත කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩයට ඇතුළත් කිරීමට හේතු දක්වමින් සහ එම කාණ්ඩය සම්බන්ධ අමතර අවශ්‍යතා දක්වමින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත යවනු ලැබේ.

5.3 තත්ත්වය වෙනස් කිරීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දින දහයක (10) කාලයක් ලැබෙනු ඇත. ඉහත අභියාචනය සමාලෝචනය කිරීමෙන් පසු, නව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය සුදුසු බව මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත්, බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දැනුම් දීමක් කරනු ලබන අතර කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය බලාත්මක කෙරෙනු ඇත.

6. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග තත්ත්වය අනාවරණය කිරීම

6.1 බලපත්‍රලාභී මුදල් සමාගම ප්‍රමාණවත් ප්‍රාග්ධනීකරණය නොවීම සහ අනුප්‍රාප්තික සෑම කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩයක් සඳහාම, එම අනුකූල නොවීමට අදාළ යෝජිත වරද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය ද සමඟින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය අධ්‍යක්ෂවරයා විසින් මහජනයාට හෙළි කරනු ඇත. ආයතනය තවදුරටත් කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන තත්ත්වයට පත් ව ඇති බවට තීරණය කළ පසු, අධ්‍යක්ෂ විසින් නිසි පරිදි මහජනයා දැනුම්වත් කරනු ඇත.

6.2 අධ්‍යක්ෂ විසින් අවසර දෙන ලද හෝ යම් විධානයක දී නියම කරන ලද අවස්ථාවක දී හැර බලපත්‍රලාභී මුදල් සමාගම් තමන් අයත්වන කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය වෙළඳ දැන්වීම් හෝ ප්‍රවර්ධන ද්‍රව්‍ය හරහා අනාවරණය කිරීම තහනම් වේ.

7. ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්ම

7.1 ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති බව දැනුම් දීමෙන් දින තිහක් (30) ඇතුළත පිළිගත හැකි ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්මක් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

7.2 **ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්මේ:**

(අ) බලපත්‍රලාභී මුදල් සමාගම සඳහා උපායමාර්ගික සැලැස්මක්;
(ආ) වත්මන් සහ නාමමාත්‍ර මූල්‍ය ප්‍රකාශන;
(ඇ) වත්මන් හා දිගු කාලීන අයවැය;
(ඈ) අනාගත ප්‍රාග්ධන ප්‍රභවයන් විශ්ලේෂණය කිරීම;
(ඉ) අදාළ කරගන්නා උපකල්පනවල ලැයිස්තුවක්;
(ඊ) ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වීමට බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ගනු ලබන පියවර;
(උ) සැලැස්ම ක්‍රියාත්මක වන සෑම වර්ෂයකම අත්කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රාග්ධන මට්ටම්;
(ඌ) කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග යටතේ බලපැවැත්වෙන විධිවිධාන වලට බලපත්‍රලාභී මුදල් සමාගම අනුකූල වන්නේ කෙසේද යන්න;
(එ) බලපත්‍රලාභී මුදල් සමාගම විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් වර්ග සහ මට්ටම් කවරේද යන වග;
(ඒ) ශ්‍රී ලංකා මහ බැංකුවට ඉල්ලා සිටින අමතර තොරතුරු/ලේඛන; ඇතුළත් විය යුතුය.

7.3 අධ්‍යක්ෂ විසින් ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්ම එහි ශක්‍යතාව සඳහා සමාලෝචනය කරනු ලබන අතර බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ප්‍රාග්ධනය යථා තත්ත්වයට පත්කිරීමේ සැලසුම සාර්ථක වනු ඇති බවට සහ බලපත්‍රලාභී මුදල් සමාගම වෙත අවදානම සැලකිය යුතු ලෙස වැඩි නොකරනු ඇති බවට තහවුරු කරගනු ඇති අතර බලපත්‍රලාභී මුදල් සමාගම අඛණ්ඩව දින දර්ශන කාර්තු හතරක කාලයේ (4) සාමාන්‍ය වශයෙන් ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති තත්ත්වයට පත් වන තෙක් බලපත්‍රලාභී මුදල් සමාගම සැලැස්මට අනුකූල වන බවට දිවුරුම් ප්‍රකාශ ද ඇතුළත් වේ.

7.4 අධ්‍යක්ෂ විසින් සැලැස්ම ඉදිරිපත් කිරීමෙන් පසු වැඩකරන දින දහයක් (10) ඇතුළත ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්ම සමාලෝචනය කර එම සැලැස්ම පිළිගැනීම / ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දැනුම් දෙනු ඇත.

7.5 අධ්‍යක්ෂවරයා විසින් මාසිකව බලපත්‍රලාභී මුදල් සමාගමෙහි මූල්‍ය තත්ත්වය සමීපව අධීක්ෂණය කරනු ඇති අතර ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්මට එරෙහි ප්‍රගතිය සහ අදාළ විධිවිධාන වලට අනුකූල වීම ඇගයීම සිදු කෙරේ. ප්‍රකෘතිමත් වීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්ම, සීමාවන් හෝ අවශ්‍යතා ප්‍රමාණවත් නොවන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගමෙහි කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය පහත හෙලනු ඇති අතර (මාර්ගෝපදේශ 3 ට අනුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුවෙහි විධිවිධාන නොතකා), අවශ්‍ය පරිදි වඩාත් දැඩි නියාමන ක්‍රියාමාර්ග පැනවීම හෝ නව ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්මක් ලබා දීමට නියම කිරීම සිදු කරනු ඇත.

7.6 තනි පුද්ගල/ආයෝජන ආයතනයකට, ආයෝජන ආයතනයේ ආශ්‍රිත හෝ අදාළ සමාගම් සහ ඔවුන්ගේ අවසාන ප්‍රතිලාභී හිමිකරුවන්ට අදාළ ලියකියවිලි හෝ තොරතුරු (ඇමුණුම I) ඇතුළුව සියලුම අදාළ ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ විසින් බලපත්‍රලාභී මුදල් සමාගමකට නියම කරනු ලැබිය හැක.

8. ඌණ ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගම්වල වත්කම් වර්ධන අවහිර කිරීම්

8.1 ඕනෑම දින දර්ශන කාර්තුවක් තුළ ඌණ ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගමක සාමාන්‍ය මුළු වත්කම් පහත අවස්ථාවල දී හැර පෙර කාර්තුවේ දී එහි සාමාන්‍ය මුළු වත්කම් නොඉක්මවිය යුතුය:

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්ම අනුමත කර ඇති නම්;
(ආ) මුළු වත්කම්වල වැඩිවීම අනුමත ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාපන සැලැස්මට අනුකූල නම්; හා
(ඇ) සාධාරණ කාලයක් තුළ ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වීමට හැකි වන පරිදි බලපත්‍රලාභී මුදල් සමාගමෙහි සමස්ත අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන අනුපාතය දින දර්ශන කාර්තුව තුළ වැඩි වී ඇති නම්.

9.	ඌණ ලෙස ප්‍රාග්ධනීකරණය වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් තැන්පතු සඳහා ගෙවිය යුතු පොලී අනුපාත සීමා කිරීම	9.1	අවශ්‍යතාවය පරිදි ඌණ ප්‍රාග්ධනීකරණය වී ඇති බලපත්‍රලාභී මුදල් සමාගම්, පහත සඳහන් ලෙස සංසන්දනාත්මක වටිනාකමින් හා කල්පිරීමේ කාලසීමා වලින් යුත් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතයන්ට වඩා පොලී අනුපාත ගෙවීමෙන් අවහිර කරනු ලැබේ; (අ) විධානයට අනුව ගෙවිය යුතු උපරිම පොලී අනුපාතයට වඩා පදනම් ලකුණු 100 කින් අඩු පොලී අනුපාතයක්
10.	කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රාග්ධන කාණ්ඩය වැඩිදියුණු කිරීමේ කාල රාමුව	10.1	අනුකූල නොවන බලපත්‍රලාභී මුදල් සමාගම් වල (ඌණ ප්‍රාග්ධනීකරණයට ලක් වූ හෝ සැලකිය යුතු ලෙස ප්‍රාග්ධනීකරණයට ලක් නොවූ බලපත්‍රලාභී මුදල් සමාගම්) තත්ත්වය ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණයට ලක් වූ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත වසරක (1) උපරිම කාල සීමාවක් ලබා දෙනු ලැබේ. එවැනි බලපත්‍රලාභී මුදල් සමාගම් ඉහත කරුණු වලට අනුකූල වීමට අපොහොසත් වූ විට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත සැලැස්මට අනුව ඒවා ඒකාබද්ධ කිරීම/ මුදල් ව්‍යාපාර කටයුතු වලින් ඉවත්වීම සිදු කළ යුතුය.
11.	සංක්‍රාන්ති ප්‍රතිපාදන	11.1	වර්තමානයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත අවශ්‍යතාවය සමඟ අනුකූල නොවන බලපත්‍රලාභී මුදල් සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග විධිවිධානයකට යටත් විය යුතුය.
12.	වාර්තාකරණ අවශ්‍යතා	12.1	ගන්නා ලද නියාමන ක්‍රියාමාර්ගවල ප්‍රගතිය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලයට වාර්තා කළ යුතුය.

ඇමුණුම I

මෙම ප්‍රතිපත්ති ලේඛනය මඟින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල පාලන කොටසක් (ප්‍රධාන කොටස් හිමියන්)[1] අත්පත් කර ගැනීමට යෝජනා කරන නව ආයෝජකයින් විසින් අනුගමනය කළ යුතු ආයෝජකයින්ගේ යෝග්‍යතා අවශ්‍යතා දක්වා ඇත.

1. සාමාන්‍ය අවශ්‍යතා

1.1. ආයෝජකයෙකු පහත සඳහන් පරිදි ආයෝජකයාගේ යෝග්‍යතා අවශ්‍යතාවයට අඛණ්ඩව අනුකූල විය යුතු අතර බලපත්‍රලාභී ආයතනයේ ආරක්ෂාවට හා ස්ථාවරභාවයට අහිතකර වන අයුරින් ක්‍රියා නොකළ යුතුය.

1.2. ආයෝජන අස්තිත්වයක (entity) යෝග්‍යතාවය තක්සේරු කිරීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය ආයෝජකයාගේ නිශ්චිත ස්වභාවයන්, එවැනි ස්වභාවයන්හි වැදගත්කම සහ මූල්‍ය ආයතනයට ඇති විය හැකි අවදානම් සලකා බලනු ඇත. ආයෝජකයෙකු මෙම ලේඛනයේ ඇති අවශ්‍යතාවයන්ට අනුකූල ද යන්න පිළිබඳව අවිනිශ්චිතතාවයක් ඇති විට, එය තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පූර්ණ අභිමතය ඇත.

2. ආයෝජකයින්ගේ යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා නීතිමය අවශ්‍යතා

2.1. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 15 වන වගන්තියට අනුව, තනි පුද්ගලයෙකුට/ ආයෝජන අස්තිත්වයකට සහ/හෝ ආයෝජන අස්තිත්වයේ ආශ්‍රිත හෝ සම්බන්ධ සමාගම් සහ ඔවුන්ගේ අවසාන ප්‍රතිලාභ හිමිකරුවන්ට අදාළ සියලු අදාළ ලියකියවිලි හෝ තොරතුරු බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. (ඇමුණුම I (අ)).

3. අමතර තොරතුරු සඳහා ඉල්ලුම් කිරීම්

3.1. අයදුම්පතක් අසම්පූර්ණ බව ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරන්නේ නම් හෝ එහි තීරණය ඉදිරිපත් කිරීමට පෙර අමතර තොරතුරු අවශ්‍ය යැයි හැඟේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත ලිපියක් මඟින් ආයෝජනය කරන පාර්ශවය පිළිබඳ අමතර තොරතුරු ඉල්ලා සිටීමින් ප්‍රතිචාර දැක්වීමට අවසාන දිනයක් ලබා දෙනු ඇත. ඉල්ලා සිටි කාල රාමුව තුළ තොරතුරු ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම අපොහොසත් වීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අයදුම්පත අසම්පූර්ණ යැයි සැලකීමට හේතු විය හැකි අතර වැඩිදුර සලකා බැලීමකින් තොරව එය ප්‍රතික්ෂේප කරනු ඇත. ආයෝජන ආයතනය තක්සේරු කිරීම සඳහා අදාළ කාල රාමුව ඇමුණුම I (අා) හි දක්වා ඇත.

4. ඇගයීමේ ක්‍රියාවලිය

4.1. සුදුසුකම් හා යෝග්‍යතාවය තක්සේරු කිරීම

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පසුබිම් පරීක්ෂාවන් සිදු කිරීම සඳහා බලය ඇති අතර, ඉදිරිපත් කරන ලද අයදුම්පතක් සම්බන්ධයෙන් අමතර ලියකියවිලි හා තොරතුරු කැඳවීම සිදු කළ හැකිය. ආයෝජන අස්තිත්වයේ (විදේශීය/දේශීය) අධ්‍යක්ෂවරුන්/ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගෙන් සහ ඉලක්කගත මුදල් සමාගම අත්පත් කර ගැනීමෙන්/ආයෝජනයෙන් පසුව යෝජිත අධ්‍යක්ෂවරුන්/ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ සිදුවන වෙනස්කම් සඳහා සුදුසුකම් හා යෝග්‍යතාවය පිළිබඳ ප්‍රකාශ ලබා ගත යුතු ය.

1 ප්‍රධාන කොටස් හිමියන් යන්න පිටු අංක 19 හි දක්වා ඇත.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් කරුණු හරහා සම්මත පසුබිම් පරීක්ෂාවන් සිදු කරයි:

(i) ණය කාර්යාංශ;

(ii) නිර්දේශ පරීක්ෂාව

(iii) ප්‍රසිද්ධියේ ලබා ගත හැකි මාර්ගගත සම්පත්. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නෛතික, ප්‍රවෘත්ති සහ ව්‍යාපාරික තොරතුරු සම්පාදනය කරන මාර්ගගත සේවාවන් භාවිතා කරනු ලබයි. ඉදිරිපත් කරන ලද "ආයතනික පසුබිම සහ මූල්‍ය වාර්තාව" සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා ගත හැකි මාර්ගගත සම්පත් අතර නොගැලපීම් සඳහා අමතර තොරතුරු, පැහැදිලි කිරීමක් හෝ විවරණය කිරීමක් අවශ්‍ය විය හැකි අතර ගොනු කිරීම සමාලෝචනය කිරීම හා සැකසීම ප්‍රමාද කළ හැකිය;

(iv) අවශ්‍ය පරිදි වෙනත් ක්‍රම

(ඇ) අධ්‍යක්ෂවරුන්ගේ / යෝජිත අධ්‍යක්ෂවරුන්ගේ හා විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ/ යෝජිත විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ සුදුසුකම් සංශෝධිත 2011 අංක 03 දරන මුදල් සමාගම් සඳහා විධාන (අධ්‍යක්ෂවරුන්ගේ/ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාවය පිළිබඳ තක්සේරු කිරීම) පරිදි සුදුසුකම් හා යෝග්‍යතා අවශ්‍යතා සමඟ අනුකූල වීම සලකා බැලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

4.2. ව්‍යාපාර යෝජනාව/සැලැස්ම සමාලෝචනය

(අ) ව්‍යාපාර උපායමාර්ගය, ආයතනික ව්‍යුහය සහ මූල්‍ය ආයතනයේ කලමනාකරණය පිළිබඳ කවර හෝ සැලසුම් කරන වෙනස් කිරීමක් පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් සමඟ ආයෝජන ආයතනයේ විධිමත් ව්‍යාපාර යෝජනාවක් / සැලැස්මක් බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාර සැලැස්ම හෝ යෝජනාව උපායමාර්ගික සැලසුම් සහ වර්ධන උපායමාර්ග, අවම ප්‍රාග්ධන අවශ්‍යතා සහ අදාළ අවදානම් මිනුම්, අධීක්ෂණ සහ පාලන ක්‍රියාවලීන් ඇතුළුව මූල්‍ය හා අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් ප්‍රමාණවත් ලෙස ආවරණය කළ යුතුය. ව්‍යාපාර සැලැස්මට භූගෝලීය වෙළඳපොළේ හෝ ඉලක්කගත පාරිභෝගික පදනමේ කිසියම් සැලසුම් සහගත වෙනස්කම්; ආයතනයේ අරමුදල් ආකෘතියෙහි අපේක්ෂිත වෙනස්කම්; සහ පවත්නා ව්‍යාපාර කටයුතු වලට අදාළ වන ඕනෑම වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ඇතුළත් විය යුතුය. සැලකිය යුතු වෙනස්කම් අපේක්ෂා කරන විට, ආයෝජන ආයතනය එම ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම සහ මෙම වෙනස්කම් වලින් මතුවන අවදානම කලමනාකරණය සඳහා ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන පද්ධති, උපාය මාර්ග හෝ අභ්‍යන්තර පාලනයන් දැක්විය යුතුය.

(ආ) ආයෝජකයින් / තක්සේරු කිරීම සහ තෝරා ගැනීම සඳහා අභ්‍යන්තර ඇගයීම් කමිටුවක් පිහිටුවිය යුතුය. අභ්‍යන්තර ඇගයීම් කමිටුව නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම භාරව සිටින එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු), ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු සහ අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම භාර නිලධාරියාගෙන් සමන්විත වේ.

5. අනුමත කිරීම සහ කොන්දේසි සහගත වීම

5.1. මෙම ඡේදය යටතේ ඉදිරිපත් කර ඇති ඕනෑම අයදුම්පතක් අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් මණ්ඩලයට බලය ඇත. එම අනුමැතිය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සුදුසු යැයි සිතිය හැකි යම් යම් නියමයන් හා කොන්දේසි වලට යටත් විය හැකිය. බැංකු නොවන මූල්‍ය ආයතනයේ අනාගත තත්ත්වය සමඟ වඩාත් පුළුල් ලෙස සම්බන්ධ විය හැකි කොන්දේසි හෝ ආරක්ෂාව සහ නිරවද්‍යතාවය, නියාමන අනුකූලතාවය පිළිබඳ කොන්දේසි මෙයට ඇතුළත් විය හැකිය. ඉලක්කගත ආයතනයේ ව්‍යාපාරය සුවිශේෂී ලෙස වෙනස් කිරීමට අත්පත් කර ගන්නා පුද්ගලයාට / ආයෝජකයාට ඇති හැකියාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සීමා කළ හැකිය, නැතහොත් එම ආයතනය ආරක්ෂිත හා ශක්තිමත් තත්ත්වයට ගෙන එන තෙක් එම ආයතනය සඳහා තෝරාගත් ඉහළ ප්‍රාග්ධන අනුපාත පැනවිය හැකිය.

5.2. පහත සඳහන් තත්ත්වයන් එකක් හෝ වැඩි ගණනක් අදාළ බව තීරණය කරන්නේ නම්, ඉහත ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද කිසිදු අයදුම්පතක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය අනුමැතිය ලබා නොදිය යුතුය:

(අ) අයදුම්කරු, තනි පුද්ගලයෙක් ව, සුදුසු සහ යෝග්‍ය පුද්ගලයෙක් නොවීම;

(ආ) අයදුම්කරු, සංස්ථාගත මණ්ඩලයක්ව සුදුසු සහ යෝග්‍ය නොවන අධ්‍යක්ෂවරයෙක්/ අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායකයෙකුව සිටීම;

(ඇ) අයදුම්කරු සංස්ථාගත මණ්ඩලයක්ව ස්ථාපිත කළ නොහැකි අර්ථදායී අයිතිකරුවන් සිටීම;

(ඈ) ඉලක්කගත ආයතනය සඳහා විධායක කාර්යයන් ඉටු කිරීමට යෝජිත අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන් යෝග්‍යතාව පිළිබඳ මාර්ගෝපදේශ සපුරා නොමැති වීම;

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනටමත් වංචනික තොරතුරු ඉදිරිපත් කර ඇති පුද්ගලයින් වැනි කළු ලැයිස්තුගත ආයෝජකයින්;

(ඊ) ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාව මඟින් සුරක්ෂිතභාවය සහ නිරවද්‍යතාවය පිළිබඳ සහතික නොවීම හෝ අස්තිත්වයක් නියාමන ප්‍රමිතීන්ට පූර්ණ වශයෙන් අනුකූල වීමට හේතු නොවීම;

(උ) බලපත්‍රලාභී මුදල් සමාගමෙහි මූල්‍ය ස්ථායිතාවයට තර්ජනයක් විය හැකි හෝ එහි තැන්පත්කරුවන්ගේ අවශ්‍යතාවන්ට අගතියක් විය හැකි ආයතනයේ අනාගත අපේක්ෂාවන්;

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුව හට ආයෝජනය / අත්පත් කර ගැනීම සම්බන්ධ මූල්‍ය ප්‍රභවයන් සොයාගත නොහැකි වීම හෝ ඒවා නීත්‍යානුකූල නොවන බව පෙනී යාම;

(එ) සම්බන්ධතාවයක් දක්වන ආයෝජකයා හෝ ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය සියලු තොරතුරු ලබා දීම නොසලකා හැරීම, අසමත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම; හා

(ඒ) අනුමැතිය ලබා දීමෙන් බලපතලාභී මුදල් සමාගමේ හෝ සමස්තයක් ලෙස පද්ධතියේ ආරක්ෂාව සහ ස්ථාවර බව අඩුවිය හැකි බවට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විශ්වාස කරන වෙනත් කාරණා.

6. අභියාචනා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දැනුම් දෙන ලද තීරණයෙහි ආයෝජන ආයතනය හෝ අදාළ පාර්ශවයන් පිළිබඳව අහිතකර තොරතුරු ඇතුළත් වන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද කාල රාමුව තුළ ගැටළුව මඟහැරවා ගැනීමට අවශ්‍ය සාක්ෂි ද සමඟ අභියාචනයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ආයෝජන ආයතනයට අවස්ථාව ලබා දෙනු ලැබේ.

ඇමුණුම 1 (අ)

ආයතනික පසුබිම සහ මූල්‍ය වාර්තා ආකෘතිය

I. **ආයෝජකයාගේ / අත්පත් කර ගත් අයගේ ආයතනික තොරතුරු**

(අ) පුද්ගලයාගේ / ආයතනයේ නම:

(ආ) තැපැල් ලිපිනය:

(ඇ) දුරකථන අංකය, ෆැක්ස් අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය:

(ඈ) ආයෝජන පාර්ශවය තනි පුද්ගලයෙක් නම්,

(i) ව්‍යාපාරයේ ස්වභාවය:

(ii) වෙනත්:

(ඉ) ආයෝජන පාර්ශවය ආයතනයක් නම්

(i) ස්ථාපිත දිනය:

(ii) සංස්ථාපිත ස්ථානය හෝ ක්‍රියාත්මක වන නගරය / ප්‍රදේශය:

(iii) ව්‍යාපාරයේ ස්වභාවය:

(ඊ) වෙළඳ නාම සහ / හෝ ලබා දී ඇති නම වෙනුවට භාවිතා කරන වෙනත් නම්, භාවිතා කළ කාලය සහ එයට හේතුව.

නම	භාවිතා කළ කාලය	භාවිතයට හේතු

(උ) සමාගමේ පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් ලැයිස්තුව. (නාමයන් සහ මව් සමාගමට ඇති සම්බන්ධතා සඳහා සංවිධාන සටහනක් ලබා දිය හැකිය).

නම	පිහිටීම (ලිපිනය)	සමාගමට ඇති සම්බන්ධතාවය	සමාගම සතු ප්‍රතිශතය	ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

(ඌ) ඡන්ද හිමි සුරැකුම්වලින් සියයට 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඡන්දය ප්‍රකාශ කිරීමට සමාගමට බලය ඇති වෙනත් ආයතන (සමාගමේ පාලිත සහ අනුබද්ධ සමාගම් හැර)

නම	පිහිටීම (ලිපිනය)	සමාගමට සම්බන්ධතාවයක් තිබේ නම් එම සම්බන්ධතාවය	සමාගම සතු ප්‍රතිශතය	ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

II. **බලපත්‍ර**

සමාගම, එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම් සතුව දැනට ඇති හෝ කලින් සතුව පැවතුණු එක් එක් වෘත්තීය බලපත්‍රයක් හෝ ඒ හා සමාන සහතිකයක් (නිදසුනක් ලෙස තැරැව්කාර, විශ්වස්ත, දේපළ වෙළඳාම් හෝ රක්ෂණ බලපත්‍රය, උකස් කිරීම, මුදල් මාරු කිරීම, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීම) දක්වමින් පහත සඳහන් දෑ සම්පූර්ණ කරන්න:

නම	බලපත්‍රය	බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරි	නිකුත් කළ දිනය	කල් ඉකුත් වීමේ දිනය

III. **ව්‍යාපාර සහ බැංකු සම්බන්ධතා**

එක් එක් ආයෝජකයා සඳහා, ඔවුන් දැනට වෙනත් ඕනෑම තැන්පතු ආයතනයක හෝ පාලක සමාගමක (අධ්‍යක්ෂ, නිලධාරී හෝ සේවක) දරණ තනතුරු දක්වන්න. එසේම, කිසියම් ආයෝජකයෙකු /අත්පත් කර ගන්නෙකු සෘජුව හෝ වක්‍රව (පුද්ගලික භාර, සංස්ථා හෝ ඒ හා සමාන සැකසුම් හරහා) ඕනෑම තැන්පතු ආයතනයක හෝ පාලිත සමාගමක ඕනෑම ඡන්ද සුරැකුම්පත් හෝ කොටස් සමූහයකින් සියයට 10 ක් හෝ ඊට වැඩි ඡන්දය ප්‍රකාශ කිරීමේ බලයක් නතු කරගන්නේ ද, පාලනය කරන්නේ ද හෝ යන්න දක්වන්න.

එක් එක් ආයෝජකයාගේ හෝ පැවරුම්කරුගේ සම්පූර්ණ නම	එක් එක් තැන්පතු ආයතනයක හෝ පාලක සමාගමේ නම සහ ලිපිනය	තනතුර සහ පත් කරන ලද දිනය	ආයතන හිමිකාරීත්වයේ ප්‍රතිශතය

IV. **ආයෝජනය/අත්පත් කර ගැනීම පිළිබඳ විස්තර**

(අ) පහත සඳහන් කරුණු දක්වන්න

අ. අත්පත් කර ගැනීමට යෝජිත කොටස්, කොටසක මිලදී ගැනීමේ මිල : රු._____

ආ. යෝජිත ගනුදෙනුව සඳහා මුළු මිලදී ගැනීමේ මිල : රු._____

ඇ. වර්තමාන පොත් අගය / කොටසක මිලදී ගැනීමේ මිල : රු._____

ඈ. කොටසක වර්තමාන වෙළඳපල වටිනාකම : රු._____

(ආ) පහත සඳහන් තොරතුරු සපයන්න:

එක් එක් ආයෝජකයාගේ හෝ පැවරුම්කරුගේ සම්පූර්ණ නම	මුළු මිලදී ගැනීමේ මිල	ප්‍රභවය සහ අරමුදල් ප්‍රමාණය
එකතුව		

V. **අරමුදල් සනාථ කිරීම**

අ. බැංකු වාර්තා මඟින් තහවුරු කිරීම/බැංකු ඇපකර/අභ්‍යන්තර ආයෝජන ගිණුම හරහා විදේශීය ප්‍රභවයන් සැපයීම.

ආ. ආයෝජනය / අත්පත් කර ගැනීම සඳහා වන අරමුදල් වලින් යම් කොටසක් (හෝ වෙනත් ගෙවීමක්) ණයට ගනු ලැබුවහොත්, එක් එක් ණය ගැනුම්කරුගේ නම, එක් එක් ණය දෙන්නාගේ නම සහ ලිපිනය, සම්පාදනය කර ගත් මුදල, ඇපයට තැබිය යුතු ඇපකරය සහ ගනුදෙනුවේ නියමයන්, පොලිය ඇතුළුව ගාස්තු, ක්‍රමක්ෂය අවශ්‍යතා, ඇපකරුවන්, අනුමත කරන්නන්, සමසම්පාදකයින් සහ පාර්ශව අතර සහ තුළ වෙනත් ඕනෑම විධිවිධාන, ගිවිසුම් සහ අවබෝධතා ආදිය සඳහන් කරන්න. අදාළ නම්, අදාළ ණය ඇපවීමේ ලිපිවල පිටපතක් ද ඉදිරිපත් කරන්න.

ඇ. ණයට ගත් අරමුදල් ආපසු ගෙවීමේ මාධ්‍යයන් දක්වන්න. ආයෝජකයා/අත්පත් කර ගන්නා තැනැත්තා අත්පත් කර ගැනීමට යෝජිත තැන්පතු ආයතනයෙන් හෝ පාලක සමාගමෙන් ලැබෙන වැටුප්, ලාභාංශ, ගාස්තු හෝ වෙනත් අරමුදල් මත යැපේ නම් අදාළ විස්තර සපයන්න.

VI. **අදාළ නම් පහත සඳහන් තොරතුරු සපයන්න (පුද්ගලික ස්ථානගත කිරීම):**

එක් එක් විකුණුම්කරුගේ හෝ පැවරුම්කරුගේ නම	දැනට හිමි, පාලනය කරන හෝ රඳවා තබාගෙන ඇති එක් එක් සුරුකුම්පත් සමූහයට අයත් කොටස් ගණන	එක් එක් සුරුකුම්පත් සමූහයට අයත් විකිණීමට හෝ පැවරීමට ඇති කොටස් ගණන	අත්පත් කර ගැනීම අවසන් වූ පසු එක් එක් සුරුකුම්පත් සමූහයට අයත් කොටස් ගණන
එකතුව			
එකතුව ඡන්ද හිමි සුරුකුම්පත් සමූහයකට ඉතිරිව ඇති කොටස් වලින් ප්‍රතිශතයක් ලෙස			

VII. **ව්‍යාපාර යෝජනා /සැලැස්ම**

(අ) ආයෝජන ආයතනය විසින් ව්‍යාපාර යෝජනාව / සැලැස්ම ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කරන ලද යෝජනාව / සැලැස්ම උපායමාර්ගික සැලසුම්, වර්ධන උපායමාර්ග, අවම ප්‍රාග්ධන අවශ්‍යතා, අවදානම් කලමනාකරණ ක්‍රම සහ පාලන ක්‍රියාවලීන් ප්‍රමාණවත් ලෙස ඇතුලත් විය යුතු ය.

(ආ) ඕනෑම ආයෝජකයෙකුට කළ හැකි සැලසුම් හෝ යෝජනා (අ) තැන්පතු ආයතනය හෝ අත්පත් කර ගත යුතු පාලක සමාගමක් ඈවර කිරීම, (ආ) එහි වත්කම් විකිණීම, (ඇ) එය ඕනෑම සමාගමක් සමඟ ඒකාබද්ධ කිරීම හෝ (ඈ) එහි ව්‍යාපාර උපායමාර්ගයේ හෝ ආයතනික ව්‍යුහයේ වෙනත් සැලකිය යුතු වෙනසක් සිදු කිරීම විස්තර සහිතව පැහැදිලි කරන්න.

(ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පවත්නා සහ අනාගත රෙගුලාසි වලට අනුකූල වීම සඳහා ආයෝජන ආයතනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් සිදු කළ යුතුය.

(ඈ) ආයතනයේ පසුගිය වසර 3 ක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් අමුණන්න (විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන විදේශ මුදල් වලින් තිබේ නම්, වාර්තා රුපියල් වලින් ඉදිරිපත් කළ යුතුය)

(තවද, මෙම ආයෝජනය සඳහාම ආයතනය සංස්ථාගත කර ඇත්නම් (SPV), එම ආයතනයේ පාලක ආයතනයේ/ පාලිත ආයතන වල විගණනය කරන ලද ගිණුම්)

VIII **නෛතික හා සම්බන්ධිත කරුණු**

(පහත දැක්වෙන (අ)-(ඊ) දක්වා කිසියම් අයිතමයකට පිළිතුර ඔව් නම්, ආයතනය, ව්‍යාපාරය, හෝ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ නම සහ පිහිටීම, දිනය, චෝදනාවේ/ නිශ්‍රයේ/පටිපාටියේ ස්වභාවය, සම්බන්ධ අධිකරණයේ නම, ලිපිනය සහ අවසන් තීන්දුව ඇතුළු තත්ත්වය විස්තර සහිතව පැහැදිලි කරන්න).

(අ) පුද්ගලයා, සංස්ථාව, එහි පාලිත සමාගම් හෝ අනුබද්ධ සමාගම් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් හා අවසන් වශයෙන් ගොනු කරන ලද අයදුම්පතකට හෝ දැන්වීමකට කෙදිනක හෝ විෂය වී තිබේද?

ඔව් /නැත

"ඔව්" නම්, එවැනි අයදුම්පතක් හෝ දැන්වීමක් පසුව ප්‍රතික්ෂේප කිරීම, ඉල්ලා අස්කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් සතුටුදායක ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වීම සිදු වූයේ ද?

ඔව්/ නැත

(ආ) පසුගිය වසර පහ තුළ පුද්ගලයා, සංස්ථාව, එහි පාලිත සමාගම් හෝ අනුබද්ධ සමාගම්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලීසිය, කිසියම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් ආයතනයක් විසින් මෙහෙයවන ලද වංචාවක්, රැවටීමක්, වංකකමක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාකාරකමක් හා සම්බන්ධ ක්‍රියාවක් සඳහා විමර්ශනයකට හෝ පරීක්ෂණයකට පෙර හෝ දැනට ලක් වී සිටී ද?

ඔව්/ නැත

(ඇ) පුද්ගලයා, සංස්ථාව, එහි අනුබද්ධ සමාගම්, හෝ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්, අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කොටස් හිමියන් (හිමිකම් පාලනය කරන) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලීසිය, කිසියම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් ආයතනයක්, විසින්

මෙහෙයවන ලද වංචාවක්, රැවටීමක්, වංකකමක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාකාරකමක් හා සම්බන්ධ ක්‍රියාවක් සඳහා විමර්ශනයකට හෝ පරීක්ෂණයකට භාජනය වී තිබේද?

ඔව්/ නැත

"ඔව්" නම් පහත සඳහන් දෑ සම්පූර්ණ කරන්න

ව්‍යාපාරයේ නම/ ස්වභාවය	සම්බන්ධතාවය/කොටස් හිමිකාරීත්වය	චෝදනාවේ ස්වභාවය/ පටිපාටිය	චෝදනා ලත් දිනය	අධිකරණ බල සීමාව	අවසන් තීන්දුව ලබා දුන් දිනය

(ඈ) පුද්ගලයා හෝ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු, අධ්‍යක්ෂවරයෙකු හෝ සංස්ථාවේ ප්‍රධාන කොටස් හිමියෙකු, එහි පාලිත සමාගම් හෝ උප සමාගම්, කවදා හෝ 2010 අංක 01 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ (1) අසාර්ථක වූ; (2) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙන් මූල්‍යාධාර ලැබූ හෝ (3) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙන් මූල්‍ය ආධාර ලබාගත් රක්ෂිත තැන්පතු ආයතනයක් සමඟ සම්බන්ධ වී තිබේද?

ඔව්/ නැත

(ඉ) පුද්ගලයා, සංස්ථාව, එහි පාලිත සමාගම් හෝ අනුබද්ධ සමාගම් බංකොලොත්භාවය හෝ අත්පත් කර ගත් දේපල සඳහා නඩු ගොනු කර තිබේද?

ඔව්/ නැත

(ඊ) පුද්ගලයා, සංස්ථාව, එහි පාලිත සමාගම් හෝ අනුබද්ධ සමාගම් විසින් ඇපකරුවෙකු වූ ණයක් කවදා හෝ පැහැර හැර තිබේද?

ඔව්/ නැත

ඔව් නම් සෘජු හා වක්‍ර ණය කොන්දේසි, පැහැර හරින ලද මුදල සහ ණය සැපයුම්කරු ඇතුළු තොරතුරු සපයන්න.

IX. අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන් 2011 අංක 03 දරන මුදල් සමාගම් විධාන (අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාවය තක්සේරු කිරීම) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති ආකෘතියට අනුව දිවුරුම් ප්‍රකාශයක් සහ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. තැන්පතු ආයතනයේ හෝ අත්පත් කර ගත යුතු පාලක සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරීන්ගේ වෙනස්කම් සලකා බලන්නේ නම්, විශ්ලේෂණය සඳහා ඉහත දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරන්න.

X. **අමතර තොරතුරු**

ගොනු කිරීම ඇගයීමට වැදගත් යැයි විශ්වාස කරන වෙනත් තොරතුරු ඉදිරිපත් කරන්න. නව ආයතනයක් සංවිධානය කිරීමට සම්බන්ධ නම්, සංස්ථාවේ යෝජිත කාර්යභාරය සාකච්ඡා කරන්න.

ප්‍රකාශය

..... වන ..... සහ එහි පාලිත සමාගම් හා අනුබද්ධ සමාගම් පිළිබඳ පසුබිම, පළපුරුද්ද සහ අදාළ කරුණු පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂා කළ හැකි බව තේරුම් ගතිමි. එහි උප සමාගම් සහ අනුබද්ධයන් අපගේ අයදුම්පතට සමගාමීව අමුණා ඇති (චරිතාපදාන වාර්තාව, මූල්‍ය ප්‍රකාශය සහ / හෝ විදේශීය සහතික කිරීම) තොරතුරු සමාගම වෙනුවෙන් මා විසින් හොඳින් පරීක්ෂා කර ඇති අතර එය නිවැරදි, සම්පූර්ණ හා යහපත් චේතනාවකින් යුතුව සකස් කර ඇති බව මම සහතික කරමි. මෙම ඕනෑම ලියවිල්ලක කිසියම් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කිරීම හෝ තොරතුරු ඉදිරිපත් නොකිරීම සාපරාධී වරදක් බව මම පිළිගනිමි.

20..... දින දී අත්සන් කරන ලදී.

.....

අත්සන

.....

මුද්‍රිත හෝ යතුරුලියනය කළ

.....

පදවිය (අදාළ නම්)

ඇමුණුම I (ආ)

උනන්දුව ප්‍රකාශ කිරීම තක්සේරු කිරීම සඳහා අදාළ කාල රේඛාව

ක්‍රියාකාරකම්	කාල රාමු
උනන්දුව ප්‍රකාශ කිරීම් (EOI) සඳහා කැඳවීම	සති 2 යි
ඇමුණුම I හි දක්වා ඇති ලේඛන/තොරතුරු ඇතුළුව අනාගත ආයෝජකයින්ගෙන් යෝජනා (RFP) සඳහා ඉල්ලීම	සති 2 යි
මූලික ඇගයීම	දින 3 කි
ඇමුණුම I මත පදනම්ව ඉල්ලූ තොරතුරු ප්‍රමාණවත් නොවේ නම්, අපේක්ෂිත තොරතුරු ඉදිරිපත් කිරීමට ඉල්ලීම	සති 1
පහත දෑ ඇතුළුව ලබාගත් තොරතුරු මත පදනම්ව සවිස්තරාත්මක කරන ලද ඇගයීම (i) ආයතනික පසුබිම සහ මූල්‍ය තොරතුරු වාර්තාව (ii) සුදුසුකම් හා යෝග්‍යතා පරීක්ෂණය (iii) විස්තීර්ණ ව්‍යාපාර සැලැස්ම (iv) නියාමන අවශ්‍යතා සහ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා අපේක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීම (v) අරමුදල් සනාථ කිරීම (vi) සමුද්දේශ සෝදිසි කිරීම් (අවශ්‍ය නම්) (vii) ඉල්ලා ඇති අමතර තොරතුරු	සති 2 යි
විමර්ශනවල ප්‍රතිඵල සම්බන්ධව මුදල් මණ්ඩලය වෙත ලබා දෙන වාර්තාව සහ ඉදිරිපත් කළ ලියකියවිලි වල අභ්‍යන්තර සමාලෝචනය සහ මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය	සති 1
තීරණය ආයෝජකයාට දැන්වීම	වහාම
අභියාචනා ක්‍රියාවලිය	ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසාන තීරණය ලැබීමෙන් දින 3ක් ඇතුළත

''**ප්‍රධාන කොටස් හිමියා**'' යන්නෙන් පුද්ගලයෙකු හෝ ආයතනයක් හෝ සංස්ථාපිත නොවන ආයතනයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු, ආයතනයක් හෝ සංස්ථාපිත නොවන ආයතනයක් හෝ කණ්ඩායමක් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් හෝ බලපත්‍රලාභී මුදල් සමාගමෙහි නිකුත් කරන ලද ප්‍රාග්ධනයෙන් 25% ක් සඳහා සෘජුවම හෝ වක්‍රව බලපත්‍රලාභී මුදල් සමාගමේ ඡන්ද අයිතිය දරන්නෙකු අදහස් කරයි.

''**සහයෝගයෙන් කටයුතු කිරීම**'' යන්නෙන් අදහස් වන්නේ බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ඡන්ද අයිතිය ඇති කොටස් අත්පත් කර ගැනීමේ දී ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අවබෝධයකට (විධිමත් හෝ අවිධිමත්) අනුව ක්‍රියා කිරීමයි.

''**කොටස් හිමියෙකු විසින් සෘජුව හා වක්‍රව රඳවා තබා ගැනීම්**'' යන්නෙන් අදහස් කරන්නේ සමාගමක්, සංස්ථාපිත ආයතනයක් හෝ පුද්ගලයකු විසින් ඡන්ද අයිතිය දරන කොටස් හෝ සමස්ථයක් ලෙස.

අ. සමාගමක් සහ පහත සඳහන් එකක් හෝ කිහිපයක්:

(i) එහි පාලිත සමාගම්;

(ii) එහි පාලක සමාගම;

(iii) එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; හෝ

(iv) එම සමාගම හෝ එහි පාලිත සමාගමක් හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමෙහි පාලිත සමාගමක් හෝ සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්; හෝ

ආ. තනි පුද්ගලයෙක් සහ පහත සඳහන් එකක් හෝ කිහිපයක්:

(i) ඔහුගේ ඥාතීන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තියේ "ඥාතියා" සඳහා වන අර්ථ දැක්වීම අදාළ විය යුතුය;

(ii) ඔහුට හෝ ඔහුගේ ඥාතියෙකුට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්; එම සමාගමේ පාලිත සමාගමක්; හෝ පාලක සමාගම; එම සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක්; එවැනි සමාගමක්, හෝ එහි පාලිත හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගම හෝ පාලිත සමාගමක් සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්; හෝ

(iii) එවැනි පුද්ගලයකට හෝ ඔහුගේ ඥාතියෙකුට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක් හැර වෙනත් සංස්ථාපිත ආයතනයක්

ඇ. පුද්ගලයකු හෝ සමාගමක් අදාළ අවස්ථාව අනුව සෘජුව, වක්‍රව හෝ ප්‍රතිලාභ වශයෙන් සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ සැලකිය යුතු කලමනාකරණ සම්බන්ධතාවයක් ඇති සමාගම් වල; කොටස් තබා ගැනීම වේ.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2020 අංක 08 දරන විධානය 2020 නොවැම්බර් 30

බලපත්‍රලාභී මුදල් සමාගම්වල කොටස් හිමිකම සඳහා වන උපරිම ප්‍රතිශත සීමාවන්

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල උපරිම කොටස් හිමිකාරිත්ව සීමා පහත පරිදි නිකුත් කරනු ලැබේ.

1. බලාත්මකවීම

1.1 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12(1) (ග) වගන්තියේ විධානයන්ට අනුව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් වලට හෝ ඕනෑම මුදල් සමාගම් සමූහයකට හෝ කාණ්ඩයකට එවැනි මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු පවත්වාගෙන යනු ලබන ආකාරය සහ විශේෂයෙන්ම මුදල් සමාගමක් විසින් අන්‍යෝන්‍ය වශයෙන් රඳවා ගත හැකි කොටස් ප්‍රාග්ධනයේ උපරිම ප්‍රතිශතය පිළිබඳව විධානයන් නිකුත් කරනු ලබන අතර එය,

i. සමාගමක් විසින්, සංස්ථාගත කරන ලද මණ්ඩලයක් හෝ පුද්ගලයෙක් විසින්; සහ

ii. එකතුවක් වශයෙන්

(අ) සමාගමක් සහ පහත දැක්වෙන ඒවායින් එකක් හෝ වැඩි ගණනක් විසින්;

(අඅ) එහි පාලිත සමාගම්;

(ආආ) එහි පාලක සමාගම;

(ඇඇ) එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; හෝ

(ඈඈ) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවක් දරන සමාගමක්; හෝ

(ආ) තනි පුද්ගලයෙකු සහ පහතින් සඳහන් කර ඇති අය අතරින් එක් අයෙකු හෝ ඊට වැඩි පිරිසක් ;

(අඅ) ඔහුගේ ඥාතියෙක්;

(ආආ) ඔහුගේ සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ ඔහුගේ ඥාතියෙකුට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්;

(ඇඇ) එවැනි සමාගමක පාලිත සමාගමක්;

(ඈඈ) එවැනි සමාගමක පාලක සමාගම;

(ඉඉ) එවැනි සමාගමක පාලක සමාගමේ පාලිත සමාගමක්;

(ඊඊ) එවැනි සමාගමක් හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගමේ හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවයක් දරන සමාගමක්; හෝ

(උඋ) එවැනි පුද්ගලයෙකුට හෝ ඔහුගේ ඥාතියෙකුට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති, සමාගමක් වෙනත් සංස්ථාපිත ආයතනයක්: හෝ

(ඇ) අවස්ථානෝචිත පරිදි, පුද්ගලයෙකු නොවන්නා වූ හෝ සමාගමකට සෘජුවම හෝ වක්‍රව හෝ වාසිදායකව, එක් එක් සමාගමේ සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ වැදගත් කලමනාකාරණ සම්බන්ධතාවයක් ඇති සමාගම්

2. විධානයේ අදාළත්වය

2.1 බලපත්‍රලාභී බැංකුවක පාලිත සාමාගමක් වන බලපත්‍රලාභී මුදල් සමාගමක් හෝ මුදල් මණ්ඩලය විසින් මෙහි දක්වා ඇති සීමාවන් ඉක්මවා ඡන්ද අයිතිය සහිත කොටස් තබා ගැනීම නිදහස් කිරීම සඳහා විශේෂ අනුමැතියක් ලබා දී ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් හැර සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා මෙම විධානයේ ප්‍රතිපාදන අදාළ වේ.

2.2 පහත දැක්වෙන විශේෂ තත්ත්ව යටතේ පහත 4.1 විධානයෙහි දක්වා ඇති සීමාවන් ඉක්මවා බලපත්‍රලාභී මුදල් සමාගමක ඡන්ද අයිතිය ඇති කොටස් රඳවා තබා ගැනීම සඳහා මුදල් මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබා දිය හැකි අතර, එම කොටස් හිමිකම මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සීමාවන්ට දීර්ඝ කාලයක් පුරාවට කොටස් වශයෙන් අඩු කිරීම සඳහා ශක්‍ය සැලැස්මක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව බලපත්‍රලාභී මුදල් සමාගමට ලබා දිය හැක.

i දුර්වල/ගැටළුකාරී තත්ත්වයන් පවතින බලපත්‍රලාභී මුදල් සමාගමක් ප්‍රතිව්‍යුහගත කිරීම
ii බලපත්‍රලාභී මුදල් සමාගම් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියකට භාජනය වී සිටීම
iii බලපත්‍රලාභී මුදල් සමාගමේ හෝ සමස්තයක් ලෙස මෙම අංශයේ ස්ථාවරත්වය සැලකිල්ලට ගෙන

3. බලාත්මක දිනය

මෙම විධානය 2022 ජනවාරි 01 දින සිට බලාත්මක වේ.

4. උපරිම කොටස් හිමිකාරීත්ව සීමාවන්

4.1 2033.12.31 දින වන විට, බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ඡන්ද අයිතිය සහිත නිකුතු ප්‍රාග්ධනයෙන් සියයට පනහ (50%) ක උපරිම සීමාවක් දක්වා බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ඕනෑම කොටස් හිමියෙකු විසින් සෘජුව හෝ වක්‍රව ඡන්ද අයිතිය දරන (සහිත) කොටස් රඳවා තබා ගැනීම පහත දැමිය යුතුය.

4.2 විධාන 4.1 හි සඳහන් ආකාරයට ඡන්ද අයිතිය සහිත කොටස් වල උපරිම සීමාවන් අදියර දෙකකින් සාක්ෂාත් කර ගත හැකි අතර ඒ අනුව බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා කර ඇති පරිදි, බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ඡන්ද අයිතිය සහිත කොටස් රඳවා තබා ගැනීම, සියයට හැත්තෑ පහක (75%) ක උපරිම සීමාවකට 2029.12.31 දින වන විට හා ඉන්පසුව සියයට පනහක (50%) උපරිම සීමාවකට 2033.12.31 දින වන විට, කොටස් වශයෙන් අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය සහිතව අඩු කළ යුතුය.

4.3 ඉහත 4.1 සහ 4.2 විධාන නොතකා, බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන කොටස් හිමියෙකු විසින් රඳවා තබා ගෙන ඇති ඡන්ද අයිතිය දරන කොටස් පහත දැක්වෙන හේතූන් මත මුදල් මණ්ඩලයට බලපත්‍රලාභී මුදල් සමාගමක ඡන්ද අයිතිය හිමි නිකුතු ප්‍රාග්ධනයෙන් සියයට පනහ (50%) ට අඩු සීමාවක් දක්වා සීමා කළ හැක.

i තනි පුද්ගල ප්‍රධාන කොටස් හිමියෙකු, මුදල් මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය නොවන පුද්ගලයෙකු ලෙසට තීරණය කරනු ලැබීම.
ii එවැනි ප්‍රධාන කොටස් හිමියෙකු වන සමාගමක, සංස්ථාපිත ආයතනයක හෝ සංස්ථාපිත නොවන ආයතනයක එක් අධ්‍යක්ෂවරයෙකු හෝ ඊට වැඩි ගණනක් හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු සිටීම හෝ මුදල් මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය නොවන බවට තීරණය කරනු ලැබීම
iii මුදල් මණ්ඩලයේ මතය අනුව එවැනි ප්‍රධාන කොටස් හිමියෙකු විසින් බලපත්‍රලාභී මුදල් සමාගමේ මනා, විචක්ෂණශීලී කලමනාකරණයට තර්ජනයක් විය හැකි පරිදි සැලකිය යුතු බලපෑමක් හෝ අධික බලයක් බලපත්‍රලාභී මුදල් සමාගමේ මෙහෙයුම් සහ තීරණ ගැනීම් වලට යෙදීම.

5. අනුකූල නොවීම් සඳහා නියාමන ක්‍රියාමාර්ග

5.1 මෙම විධානයෙන් පනවා ඇති ඕනෑම ප්‍රතිපාදනයක් හෝ එමඟින් නියම කර ඇති අවශ්‍යතාවයන් හා අනුකූල වීමට අපොහොසත් වුවහොත් හෝ ඒවා උල්ලංඝනය කළහොත් අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් සලකා බැලීමෙන් අනතුරුව, මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු ඇතුළුව යම් පියවරක් ගත හැකිය.

i අවශ්‍ය වූ විටක දී එවැනි බලපත්‍රලාභී මුදල් සමාගමක ලාභාංශ බෙදා හැරීම හෝ ලාභ විදේශ රටකට යැවීම අත්හිටුවීම;
ii 2030.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි, නිශ්චිත සීමාව ඉක්මවා ඕනෑම කොටස් හිමියෙකු සතු කොටස් සඳහා ඡන්ද අයිතිය සීමා කිරීම;
iii ඡන්ද අයිතිය සහිත තවත් කොටස් නිකුත් කිරීම අත්හිටුවීම හෝ නිශ්චිත සීමාවන් ඉක්මවා එවැනි කොටස් රඳවා තබාගෙන සිටින කොටස් හිමියන්ට කරන ඕනෑම ඉල්ලීමක් අත්හිටුවීම;
iv එවැනි බලපත්‍රලාභී මුදල් සමාගමක ව්‍යාපාර මෙහෙයුම් පුළුල් කිරීම සීමා කිරීම;
v මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මූල්‍යමය දඩ පැනවීම; හෝ
vi අනුකූල නොවීම් පිළිබඳ අනාවරණය කිරීමේ අවශ්‍යතා පැනවීම.

6. අර්ථ නිරූපණ

මෙම විධානයේ,

'**අධ්‍යක්ෂවරයා** යන්නට 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තියේ සඳහන් එකම අර්ථය තිබිය යුතුය.

'**ප්‍රධාන කොටස්හිමියා**' යන්නෙන් අදහස් කරනුයේ බලපත්‍රලාභී මුදල් සමාගමක ඡන්ද අයිතිය දරන නිකුතු ප්‍රාග්ධනයෙන් සෘජුවම හෝ වක්‍රව 25% ක් දරන වෙනත් ඕනෑම පුද්ගලයෙකු, සංස්ථාපිත ආයතනයක් හෝ සංස්ථාපිත නොවන ආයතනයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු, සංස්ථාපිත ආයතනයක් හෝ සංස්ථාපිත නොවන ආයතනයක් හෝ සමූහයකි.

'**එකඟ ලෙස ක්‍රියාකිරීම**' යන්නෙන් අදහස් කරනුයේ, බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ඡන්ද අයිතිය දරන කොටස් අත්පත් කර ගැනීමේදී විධිමත් හෝ අවිධිමත් ලෙස ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා ක්‍රියාකිරීමයි.

'**කොටස් හිමියකු විසින් සෘජුවම හෝ වක්‍රව රඳවා තබාගැනීම**' යන්නෙන් අදහස් කරනුයේ සමාගමක්, සංස්ථාපිත ආයතනයක් හෝ පුද්ගලයෙකු විසින් හෝ සාමූහික ව ඡන්ද අයිතිය ඇති කොටස් පහත අයුරින් රඳවා තබා ගැනීමයි.

(අ) සමාගමක් සහ පහත සඳහන් එකක් හෝ කිහිපයක්:

i එහි පාලිත සමාගම්;

ii එහි පාලක සමාගම;

iii එහි පාලක සමාගමේ පාලිත සමාගමක්;

හෝ

iv එවැනි සමාගමක් හෝ එහි පාලිත සමාගමක් හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් සඳහා සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්; හෝ

(ආ) පුද්ගලයෙකු සහ පහත සඳහන් එක් අයෙකු හෝ ඊට වැඩි පිරිසක්

i ඔහුගේ ඥාතීන් '**ඥාතියෙකු**' යන්නට 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වගන්තියේ සඳහන් එකම අර්ථය තිබිය යුතුය;

ii ඔහු ගේ සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ ඔහුගේ ඥාතියෙකුට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්; එවැනි සමාගමක පාලිත සමාගමක්; එවැනි සමාගමක පාලක සමාගම; එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; එවැනි සමාගමක් හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගමේ හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවයක් දරන සමාගමක්; හෝ

iii එවැනි පුද්ගලයෙකුට හෝ ඔහුගේ ඥාතියෙකුට සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති, සමාගමක් වෙනත් සංස්ථාපිත ආයතනයක්: හෝ

(ඇ) අවස්ථානෝචිත පරිදි, පුද්ගලයෙකු නොවන්නා වූ හෝ සමාගමකට සෘජුවම හෝ වක්‍රව හෝ වාසිදායකව, එක් එක් සමාගමේ සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ වැදගත් කලමනාකාරණ සම්බන්ධතාවයක් ඇති සමාගම්

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්

මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති